# Proceedings of the International Conference on Intangible Cultural Heritage

## ICICH 2019

## Fostering Folklore Research

***"Enriching Global Citizens through Traditional Insights"***

26th September 2019

Department of Anthropology
Faculty of Humanities and Social Sciences
University of Sri Jayewardenepura

Proceedings of International Conference on Intangible Cultural Heritage

202 Pages

ISSN: 2550-2360

Copyright© Department of Anthropology

All rights are reserved according to the Code of Intellectual Property Act of Sri Lanka, 2003

Published by: Department of Anthropology, Faculty of Humanities and Social Sciences (FHSS), University of Sri Jayewardenepura, Sri Lanka

Tel/Fax: +94 (0) 11 2803196

**Disclaimer**

The responsibility for opinions expressed, in articles, studies and other contributions in this publication rests solely with their authors, and this publication does not constitute an endorsement by Multi-Disciplinary Research Center or Faculty of Humanities and Social Sciences of the opinions so expressed in them.

Official Website of the Conference: http://fhss.sjp.ac.lk/icich

**Published By** : Department of Anthropology,
University of Sri Jayewardenepura, Sri Lanka

**Printed By** : Cybergate Services (Pvt.) Ltd.
57 A, Soratha Mawatha, Ganodawila,
Nugegoda, Sri Lanka

**Cover Design by** : Sajith Madusanka Bansayake
Web Team,
University of Sri Jayewardenepura

# ORGANIZING COMMITTEE – ICICH 2019

Dr. Praneeth Abeysundara

Prof. Charmalie Nahallage

Prof. Yasanjali Jayathilake

Dr. Nelum Kanthilatha

Dr. Jayantha Jayasiri

Dr. Sepala Samarasekara

Dr. Tharaka Ananda

Dr. K. B. Deepal Gunasena

Ms. Yeshanthika Jayarathne

Ms. Bhagya Dilhani

Mr. Charith Mudalige

Mr. Dinindu Dewapura

Mr. Kanishka Wijayarathna

Mr. Sri Shan

# MESSAGE FROM THE ORGANIZERS

It is indeed a great pleasure to write this message to the International Research Conference on Intangible Cultural Heritage (ICICH) - 2019 abstract proceeding on behalf of the organizing committee of ICICH-2019.

A research conference is a premier forum for academics and professionals from around the world to come together to share their research on a particular discipline. In this regard, the Department of Anthropology, Faculty of Humanities and Social Sciences of the University of Sri Jayewardenepura has made an outstanding contribution to the dissemination of knowledge by providing an excellent forum for the academics and researchers to come together and share their views in the sphere of humanities and social sciences. The number of abstracts received by the organizing committee exceeding 550 show the spirit and enthusiasm of academics, students and researchers to participate in this mutual critical discussion. The conference being the first event hosting from this year by the Department of Anthropology, speaks for its success and that it has already been established as a promising tradition of FHSS.

However, the organization of an international research conference involves diverse stakeholders. We take this opportunity to thank them and express our gratitude to them. First, we thank the Vice-Chancellor, Prof. Sampath Amaratunge of the University of Sri Jayewardenepura for his unstinting support and cooperation, advice and guidance, and the keen interest taken in the organization of this event. Second, we extend our deepest gratitude to the Dean of the Faculty of Humanities and Social Sciences, Prof. Shirantha Heenkenda for his constant support. Also, we deeply appreciate the paper presenters, reviewers, chairpersons and all the people whose contributions to make this event a success.

**Conference Organizing Committee**

# MESSAGE OF THE VICE-CHANCELLOR

I am very happy to send this message on the occasion of the International Research Conference on Intangible Cultural Heritage (ICICH) - 2019 organized by the Department of Anthropology, Faculty of Humanities and Social Sciences of the University of Sri Jayewardenepura. This conference is a brilliant effort on the part of Department of Anthropology to showcase its capabilities and potential to engage in research and thus initiate a critical discussion on topics related to intangible cultural heritage in humanities and social sciences through a scholarly endeavor of this nature. It provides opportunity for distinguished scholars from local and abroad to share their insights on topics related to these areas.

As reflected in its theme, ***"Enriching Global Citizens through Traditional Insights"***, this conference focuses on both the present and the future thereby capturing the urgency of contribution of the traditional insight to national development through research and through collaborative effort. I am sure that the national and international scholars presenting their research findings will address diverse issues related to humanities and social sciences and thus come out with new insights to benefit humanity.

I thank the organizers for their untiring efforts to host this event and send my best wishes for a very successful conference.

**Senior Professor Sampath Amaratunge**
Vice Chancellor,
University of Sri Jayewardenepura,
Nugegoda,
Sri Lanka.

# MESSAGE OF THE DEAN

It is indeed a pleasure to send this message to the International Conference on Intangible Cultural Heritage (ICICH) - 2019 organized by the Department of Anthropology, Faculty of Humanities and Social Sciences (FHSS) of the University of Sri Jayewardenepura.

This conference which is organized for the first time highlights the tremendous significance attached to research and dissemination of knowledge by Department of Anthropology and the Faculty of Humanities and Social Sciences enabling scholars and researchers from around the world to showcase their novel perspectives on diverse issues related to the respective cultural heritage. The FHSS, being constantly in pursuit of innovation and enhancement has always upheld this kind of research forum which by now has been established as a tradition within the faculty. This also marks a salient milestone in the faculty which highlights the vibrant enthusiasm of its faculty members and students to engage in research and mutual critical discussion.

The success of a conference very much depends on the untiring efforts of the conference committee and other stakeholders who have patronized this event in diverse ways. I thank all of them for their commitment and contribution to make this event a success.

Let me also congratulate the researchers who are presenting their research findings at this International Conference to make it truly an inspiring academic event.

**Prof. Shirantha Heenkenda**
Dean,
Faculty of Humanities and Social Sciences,
University of Sri Jayewardenepura,
Sri Lanka.

# Table of Contents


Organizing Committee of the ICICH 2019 iii
Message from the Organizers iv
Message of the Vice-Chancellor v
Message of the Dean vi

## FOLK ARTS

වත්තේගම රජ මහ විහාරයේ ඉපැරණි සිතුවමෙන් පිළිබිඹු වන පැරණි ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ජන සමාජ හා සංස්කෘතික ලක්ෂණ පිළිබඳ විශ්ලේෂණාත්මක අධ්‍යයනයක්
කේ. ඩී. කේ. කේ. තන්ත්‍රිගේ, ඒ. ජේ. රජිත්, කේ. ජී. එච්. චන්දිමාල්, පී. ඒ. පී. රොද්‍රිගෝ 19

ශ්‍රී ලාංකේය වෙස්මුහුණු කලාවේ ප්‍රභවය හා විකාශනය තුළින් හෙළිවන දෘශ්‍ය සන්නිවේදනාත්මක ප්‍රකාශනය පිළිබඳ ඓතිහාසික අධ්‍යයනයක්
ටී. එස්. මාටින් 20

ශ්‍රී ලංකාවේ බලි ශාන්තිකර්මයේ සෞන්දර්යාත්මක පැතිකඩ
එල්. එන්. ඒ. ඩී. පී. නිශ්ශංක 21

අභිලේඛන තුළින් හෙළිවන අනුරාධපුර යුගයේ ප්‍රාසාංගික කලාව පිළිබඳ අධ්‍යයනයක්
පිටබැද්දර විමල සුධීර හිමි 22

Medicolegal and Cultural Anthropological Aspects of Tattooing: a Qualitative Atudy
S. R. Hulathduwa, H. T.D. W. Ariyarathna 23

18 හා 19 සියවස්වල ශ්‍රී ලාංකේය බෞද්ධ කලාවේ නිරූපිත යක්ෂ රූපය පිළිබඳ අධ්‍යයනයක්
එන්. එච්. එස්. උදයංගනී 24

උඩරට සිංහල මනාලියගේ වස්ත්‍රාභරණ කට්ටලය හා බැඳුණු සංස්කෘතික පසුබිම පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්
ආර්. එම්. එස්. ඒ රත්නායක 25

Cultural Memory and Identity: Folk Life Associated with the Rush and Reed Industry in Sri Lanka
W. M. D. A. L. B. Tilakaratna, I. S. Weerakkody, G. A. C. Sri Palitha 26

පුරාණ මැටි බඳුන් නිර්මාණයේ හැඩය සහ භාවිතය අතර සම්බන්ධය පිළිබඳ අධ්‍යයනයක්
කේ. එල්. ඒ. කොතලාවල 27

## FOLK DANCE & DRAMA

A Sociological Investigation of ‘Kovalankooththu’, Tamil Folk Drama in Contemporary Tamil society
L. Kunaratnam, A. Linganathan 31

ශ්‍රී ලාංකේය සංචාරක කර්මාන්ත ප්‍රවර්ධන විභවයක් ලෙස ජන නාට්‍ය කලාව (චීනය සහ ශ්‍රී ලංකාව ආශ්‍රිත අධ්‍යයනයකි)
මධුෂාණී විජේවීර ගුණරත්න, එච්. එම්. ආර්. පී. විජේරත්න 32

ශ්‍රී ලංකාවේ වෙරළබඩ කළාපය ආශ්‍රිත අස්පර්ශිත සංස්කෘතික උරුමයෙහි ලා යුරෝපා ජාතීන්ගේ බලපෑම (මීගමුව, දූව ප්‍රදේශයට අනන්‍යය වූ පාස්කු නාට්‍ය ඇසුරෙන්)
පී. ජේ. ඩබ්. එන් නෝනිස්, ඊ. එම්. එන්. ඒදිරිනායක 33

සිංහල ජනනාටකයෙන් පිළිබිඹු වන සමාජ ස්ථරායනය (සිංහල කෝලම් නාටක ඇසුරෙන්)
ඩී. ඩී. එච්. එන්. රාජපක්ෂ, සේපාල සමරසේකර 34

ගැමි නැටුම් හා ගැමි නාටක තුළ අන්තර්ගත ගැමි ජනතාවගේ ජීවන තොරතුරු පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්
ඩබ්. එච්. එස්. එච් කරුණාතිලක ........ 35
ඉතා රහසිගත අස්පර්ශනීය උරුමයක් වූ ආලත්ති පූජාවේ වර්තමාන තත්ත්වය පිළිබඳ අධ්‍යයනයක්
එස්. ඩී. වයි. ජයරත්න, වයි. ඩී. ජයතිලක, එන්. එල්. කේ. සඳුනිකා ........ 36
සිංහල නර්තන කලාව හා සබැඳි දොළහ දෙවි සංකල්පය
ඩබ්. බී. ඒ. විතාරණ ........ 37
Ethnography of Kowil: a Ceremonial Dance performed by Henanigala Vedda People
D. T. H. Ananda, C. A. D. ANahallage ........ 38

## FOLK LANGUAGE

රුහුණු ප්‍රාදේශීය භාෂා උච්ඡාරණාකෘතීන්හි අවකාශීය විෂමතාවය පිළිබඳ සංස්කෘතික භූගෝල විද්‍යාත්මක අධ්‍යයනයක්
ජී. එච්. එම්. ශ්‍රීමාලි, අර්. එන්. ගමාච්චිගේ ........ 41
සක්කාරං සිංහල චිත්‍රපටයෙන් ඉස්මතු කෙරෙන බෙරවා කුලයේ සන්නිවේදන භාවිතයන්
ආර්. ජේ. සඳුනිකා රත්නායක ........ 42
Comparative Study of Sri Lankan and French Proverbs
C. Liyanage, I. Chandrasekere ........ 43
සිංහල උපදේශාත්මක කාව්‍ය කෙරෙහි දෙමළ උපදේශාත්මක සාහිත්‍ය බලපා තිබේද?
ඒ. ජී. රුවන් ප්‍රදීප් කුමාර ........ 44
ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික මැණික් පතල් කර්මාන්තය ආශ්‍රිත බස් වහර පිළිබඳව අධ්‍යයනය කිරීම
එච්. එම්. අයි. ඊ. බණ්ඩාර ........ 45
රුහුණු ජන වහර පිළිබඳ පර්යේෂණාත්මක අධ්‍යයනයක්
මුරුන්ගස්යායේ සාරද හිමි, අම්බාවේ ධම්මානන්ද හිමි, බදුල්ලේ සමිත හිමි, පෝද්දිවල ගෝතම හිමි ........ 46
පන්දම් දොළහ ශාන්ති කර්මයේ ආවේශයෙන් හෙළිවන රූපාක්ෂර අභිචාරය
එල්. බී. එස්. ගුණවර්ධන, පී. නාරංගොඩ ........ 47
අල්ල ජනපදයෙහි ව්‍යවහාර වන කමත් බස් වහරත් ඒ හා බැඳුණු අභිචාර විධි පිළිබඳ අධ්‍යයනයක්
බදුල්ලේ සමිත හිමි, නීලපොල ධම්මතිලක හිමි, පෝද්දිවල ගෝතම හිමි ........ 48
Folk Art as an Alternative Communication Method: A Comparative Analysis with Mass Media
S. Raguram ........ 49

## FOLK LIFE & CULTURE

Social Geographical Study on Linguistic Conversion and Cultural Identity of Indigenous Community with Special Reference To Dambana Vedda Community
P. L. S. D. Polwatta, G. A. Isurika ........ 53
පුරාණයේ සිංහල ගැමි ජනයා තුළ පැවති දිවුරුම් ක්‍රම පිළිබඳ අධ්‍යයනයක්
නීලපොල ධම්මතිලක හිමි ........ 54
Temporal Changes of Traditional Practices in Beach Seine Industry of Southern Sri Lanka
S. H. S. M. Siriwardana and Ven. P. Sangasumana ........ 55
කෘෂිකර්මාන්තයේ දී උපයෝගී කරගත් පැරණි කෙම් ක්‍රම හා විශ්වාසයන් පිළිබඳ අධ්‍යනයක් (හුරුළු ගම් පලාත ඇසුරින්)
ආර්. එම්. එස්. පී. විජේරත්න, ආර්.ඩබ්. එස්. එස්. විමලරත්න, ඩී. එම්. එස්. එච්. ආර්. දිසානායක, ඩබ්. එම්. එන්. ඩී. රණසිංහ, එච්. ඩබ්. එස්. එස්. ධර්මසේන ........ 56
දක්ෂිණ ධීවර ජන සංස්කෘතිය පිළිබඳව මානව විද්‍යාත්මක අධ්‍යයනයක් (ගාල්ල දිස්ත්‍රික්කයේ රත්ගම ප්‍රදේශය ආශ්‍රයෙන්)
එම්. ඩී. ආර්. ඒ. මෙන්ඩිස්, එම්. ඩී. එස්. ඒ. මෙන්ඩිස් ........ 57
නාගරීකරණය හමුවේ වෙනස් වූ ශ්‍රී ලංකාවේ කුල ක්‍රමය

යූ. ඒ. එම්. සඳමිණි, පී. කේ. බී. ඉසුරු ප්‍රේමරත්න ........................................ 58

ශ්‍රී ලංකාවේ ඓතිහාසික යුගයේ ධීවර කර්මාන්තය පිළිබඳ අධ්‍යයනයක්

එච්. පී. ඩී අචිනි ලක්මාලි, එම්. ටී. එන් තිලකරත්න ........................................ 59

මහාවංසයෙන් ගිලිහී ගිය සාමාන්‍ය ජන ජීවිතයට සද්ධර්මාලංකාරයෙන් ඌණපූරණයක්

එම්. කේ. එල්. අයිරාංගනී, එන්. ජී. අයි. එම්. වික්‍රමසිංහ ........................................ 60

බුද්ධකාලීන භාරතීය සමාජයෙහි පැවැති ජන ක්‍රීඩා පිළිබඳ පෙළ සාහිත්‍යය ඇසුරින් විමර්ශනාත්මක අධ්‍යනයක්

ගිරාඹේ ධම්මරුචි හිමි ........................................ 61

එදිනෙදා ජන ජීවිතයේ විවිධ අවශ්‍යතාවයන් සඳහා භාවිතා කළ සන්නිවේදන ක්‍රම පිළිබඳ අධ්‍යනයක් (ජනවහරේ භාවිත හූව පිළිබඳ තෝරා ගත් කලාප කිහිපයක් ඇසුරින්)

ඩබ්. මධුභාෂිණී චන්ද්‍රපාල ........................................ 62

පානම් පත්තුවේ ජන ජීවිතය කෙරෙහි බලපානු ලබන ආගම හා බැඳුණු ජන සංස්කෘතිය පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක්

එන්. වී. පී. මධුශානි , ආර්. එම්. එන්. පූර්ණිමා ........................................ 63

ලාංකේය ජන සමාජයේ නඩු විභාග සඳහා භාවිත සාම්ප්‍රදායික විධාන ක්‍රම පිළිබඳව අධ්‍යයනයක්

පූජ්‍ය ගම්මහේගේ වැව අමිත හිමි ........................................ 64

මී මුරේ ගම්මානයේ ජන ජීවිතයේ මූලික අංගයක් වන සම්ප්‍රදායික වී ගොවිතැන පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

කේ. ඒ. අයි. චතුරංගි, ටී. රාජපක්ෂ ........................................ 65

අම්බලම් හා බැඳි ජන සාහිත්‍යය පිළිබඳ විමර්ශනයක්

ඒ. ඩී. ඒ. එල්. ඩී.සෙනෙවිරත්න, අයි. ජේ. සී. කේ. ඉහළගෙදර ........................................ 66

ශ්‍රී ලංකාවේ සංස්කෘත අභිලේඛනවලින් හෙළිවන සමාජ හා සංස්කෘතික තොරතුරු පිළිබඳව විමර්ශනාත්මක අධ්‍යයනයක්

සුරියවැව පඤ්ඤාසිරි හිමි, කුරුවිට විජයශාන්ත හිමි, ලුණුඅටුලැවේ සුසීම සෝභන හිමි, ඉරුදෙණියේ සිරිරතන හිමි ........................................ 67

පැදුර තුළින් සංකේතවත්වන සැමියා සහ බිරිඳ අතර පවතින ආකල්ප පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් (පැල් කවි ඇසුරින්)

ඩබ්. එම්. ජී. කේ. වාසල, ඩබ්ලිව්. එච්. ඩී. එන්. ජයවර්ධන ........................................ 68

වාර්ෂික අංකෙළි උත්සව කාලසීමාවේ ජන ජීවිතයේ සිදුවන විපර්යාසයන් (පානම්පත්තුව ග්‍රාමය ඇසුරෙන්)

ඒ. අයි. සඳමාලි, එම්. පී. සී. මල්ලිකා, එච්. ඒ. සී. එස්. හතුරුසිංහ, කේ. ඒ. එල්. පී. පෙරේරා ........................................ 69

දේශීය සටන් කලාව ඍකගැනීමෙහිලා සංස්කෘතික සංචාරණයෙහි කාර්යභාරය පිළිබඳ විමසුමක් (අංගම්පොර සටන් කලාව ඇසුරින්)

ජී. ඇම්. එස්. වී. අපෝන්සු, මහේෂි සමරවික්‍රම ........................................ 70

උඩ අළුපොද්දෙනිය ග්‍රාමයේ සාම්ප්‍රදායික කිතුල් කර්මාන්තය පිළිබඳ අධ්‍යයනයක්

කේ. පී. ලක්මාලි ........................................ 71

සිංහල ජන ජීවිතයේ හා සංස්කෘතියේ එන අලුත් සහල් මංගල්‍යය නම් මහා ගොවි පිළිවෙත පිළිබඳ විශ්ලේෂණාත්මක අධ්‍යයනයක්

එන්. සී. මධුෂානි ........................................ 72

Folk Economics in Sri Lanka

H. K. Liyanage ........................................ 73

The Traditional Military Knowledge of Sri Lanka is disclosed through Randeniwela Battle (The Concept of “Core Functions of War”)

Major T. Witharana ........................................ 74

ගිං ගඟ ආශ්‍රිත ජන ජීවිතය හා බැඳුණු සාම්ප්‍රදායික ධීවර සංස්කෘතිය වෙනස් වී ඇති ආකාරය පිළිබඳ මානවවිද්‍යාත්මක අධ්‍යනයක්

ඔ. කේ. එන්. දමයන්ති , එන්. එම්. කේ. තක්ෂිලා ........................................ 75

සමාජ විපර්යාසයේ සංක්‍රාන්තික අවධියක පසුවන කටුපොත පාරම්පරික කුඹල් ග්‍රාමීය සමාජ ව්‍යුහය පිළිබඳ අධ්‍යනයක්

එන්. එස්. යු. නැලිගම, පි. එන්. එම්. සමරතුංග ........................................ 76

සිලප්පදිකාරම් කතුවරයාගේ මූලික අරමුණ හුදු දේව විශ්වාසයක් සමාජයේ පතළ කිරීමද? සිලප්පදිකාරම් ඇසුරෙනි

එම්. බී. දිල්හානි ........................................ 77

ගිහි ජීවිතය සාර්ථක කරගැනීම විෂයෙහි සේඛියා ධර්මයන්ගේ උපයෝගීතාවය පිළිබඳ අධ්‍යයනයක්
එච්. ඩී. යූ. පී මධුෂානි ........ 78
සිංහල විවාහ ක්‍රමයන්හි වත්මන් තත්වය (පුල්එළිය ගම්මානය ඇසුරින්)
කේ. පි. මදුශංඛ, එල්. එච්. එච්. කුමුදුමලී, එස්. සමරසේකර ........ 79
සාම්ප්‍රදායික, මල්වර තහංචි හා විශ්වාසයන්හි වත්මන් තත්ත්වය අධ්‍යයනය (නාකුළුගමුව ප්‍රදේශය ආශ්‍රයෙන්)
එල්. එච්. එච්. කුමුදුමලී, එස්. සමරසේකර ........ 80
නේපාලයේ තරයි තැනිතලාවේ කපිලවස්තු දිස්ත්‍රික්කයේ තාරු ජනයාගේ සාම්ප්‍රදායික නිවාස හෙවත් ඝර් පිළිබඳ අධ්‍යයනයක්
ඩී. එස්. ඒ. මුණසිංහ, එන්. ඒ. ඩී. එම්. නිස්සංක ........ 81
සංස්කෘතික දෙමුහුන්භාවය : මාර්ටින් වික්‍රමසිංහගේ විරාගය නවකතාව ආශ්‍රිත විමර්ශනයක්
කේ. ඒ. ජේ. පී. කේ. මැදවත්ත ........ 82
කුඹුක් ගස හා බැඳුණු ගැමි සංස්කෘතික පසුබිම පිළිබඳ අධ්‍යයනයක්
බී. එම්. ඩී. එම්. දර්ශනී, ජේ. පී. සී. ප්‍රබෝදිනී, එම්. ඒ. එන්. විරාජණී, පී. ඊ. ජී. ඒ. කල්‍යාණි ........ 83
මල්වල සංකේතාත්මක අර්ථයන් පිළිබඳ මානව විද්‍යාත්මක අධ්‍යයනයක්
පී. අබේසුන්දර, ඩී. දේවපුර ........ 84
මහවැලි ගංගාව මුල්කරගත් සමාජ හා සංස්කෘතික උපයෝජනයන් පිළිබඳ අධ්‍යයනයක් (උලපනේ සිට ඇත්ගාල දක්වා වූ ප්‍රදේශය ආශ්‍රයෙන්)
යූ. එස්. මීගහකොටුව ........ 85
ගන්නෑව කෝරළය හා බැඳුණු අස්පර්ශිත සංස්කෘතික උරුමයන්
පී. එම්. ඇඹුල්දෙනිය, කේ. ජී. එම්. කරුණාරත්න ........ 86
බුලත් පිළිබඳ සංකල්පයන්හි සමාරම්භය හා ඓතිහාසික විකාශනය පිළිබඳ අධ්‍යයනයක්
කේ. පඤ්ඤානන්ද හිමි ........ 87
ග්‍රාමීය ජන ජීවිතය කෙරෙහි ග්‍රාමයේ භූ විෂමතාවය සිදු කරන බලපෑම පිළිබඳ මානව විද්‍යාත්මක අධ්‍යයනයක්, කොහොනාවල ග්‍රාමය ඇසුරින්
ටී. බී. ඩී. හෙට්ටිආරච්චි ........ 88
වතු කම්කරු ජනතාවගේ සංස්කෘතියේ පවතින ජන ක්‍රීඩා මඟින් නිරූපිත වතු ජීවන රටාව පිළිබඳ විමර්ශනාත්මක විග්‍රහයක්
තනුජා දිල්හානි, ඩබ්ලිව්. ජී. ඩී. පෙරේරා, එච්. එම්. කේ. ජී. දුෂ්මන්ත ........ 89
'ලංකා ගීතය' චිත්‍රපටයෙන් නිරූපිත සමාජ සංස්කෘතික පැතිකඩ
රවීන්ද්‍ර ප්‍රියන්ත ලාල් ........ 90
පොරපොල් ක්‍රීඩාව මඟින් ප්‍රකට වන ග්‍රාමීය සංහිඳියාව සහ ජනශ්‍රැතිය (මාතර-මිරිස්ස ග්‍රාමය ඇසුරෙනි)
ඉරංගා සමින්දනී වීරක්කොඩි ........ 91
පැරණි ලාංකීය සමාජයේ පැවති කුල ක්‍රමය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්
එල්. එම්. සී. එස්. පී. ලන්දේකුඹුර ........ 92
Shaping Statesmen and Rulers via Animal-Lore by Niccolo Machiavelli in his Political Treatise, the Prince
Desmond Mallikarachchi ........ 93
Animal-lore of Sri Lanka
A. A. Jayantha Jayasiri, A. A. R. Thamodi ........ 94
A Study on Cultural Impact on Criminal Victimization in Sri Lanka with Special Reference to "Human Trafficking"
K. G. N. U. Ranaweera, M. P. A. A. Buddhadasa, R. B. N. Sunil ........ 95
මහනුවර යුගයෙහි මාතලේ දිසාවේ, හමුදාවේ ලේකම්මිටියෙන් හෙළිවන තත්කාලීන ජන සංස්කෘතියෙහි භාවිත හමුදා නිලනාම සහ ආයුධ පිළිබඳ අධ්‍යයනයක්
කුසුමලතා ලංකාමුල්ල, චන්ද්‍රාණි ලංකාමුල්ල ........ 96
සාම්ප්‍රදායික කුල විභජනය මත පදනම් ව ආර්ථිකය ශක්තිමත් කළ හැකි ද? යන්න අධ්‍යයනයක් (මහනුවර යුගයෙහි පැවති කුල ක්‍රමය ආශ්‍රයෙන්)
නීලපොල ධම්මතිලක හිමි ........ 97
Impact of resettlement on Vedda's Folklife: Based on Hennanigala Village
T. B. D. Hettiarachchi, T. S. S. Dayarathna, S. R Hettimulla ........ 98

Changing Upcountry Tamil Caste System: A Study with Special Reference to Gonamottawa Estate
B. F. Sabrina ........ 99
Stake Net Fishery in Negombo and Chilaw: Status of Traditional Fishing Rights and Cultural heritage
M. T. N. Thilakarathna, H. P. D. A. Lakmali, M. M. A. S. Maheepala, K. H. M. L. Amaralal ........ 100

## FOLK MEDICINE

විද්‍යාව හා තාක්ෂණය ප්‍රමුඛ කොටගත් සමාජයක් තුළ හෙළ වෙදකමෙහි වැදගත්කම පිළිබඳ විශ්ලේෂණාත්මක අධ්‍යයනයක්
බී. ජී. ඉමේෂා මධුවන්ති ........ 103
දියවැඩියාව දේශීය වෛද්‍ය ක්‍රම මගින් සම්පූර්ණයෙන්ම සුව කරගැනීම පිළිබඳව ගෝලීය පුරවැසියන්ට ලබා දිය හැකි අවබෝධය
එන්. එච්. එල්. කවීශා තත්සරණී ........ 104
ශාන්තිකර්මයන්හි අන්තර්ගත වර්ණ සංයෝජනය තුළින් සිදුවන රෝගනිවාරණ මනෝචිකිත්සාව පිළිබඳ අධ්‍යයනයක්
එල්. එන්. අනුපමා ........ 105
Sri Lankan Folk Medicine for the Treatment of Eye Diseases
J. I. D. Diddeniya ........ 106
ලාංකීය සංස්කෘතික සන්ධර්භය තුළ දෙවියන්ගේ ලෙඩ ලෙස හඳුන්වනු ලබන පැපොල රෝගය නිවාරණය උදෙසා ජනවෙදකමෙහි උපයෝගීතාවය
කේ. ඩී පියුමාලි ........ 107
පහතරට ජන වෙදකමඃ දේශීය චිකිත්සාවේ දී යොදා ගන්නා පුවක් මල් ප්‍රතිකාරය පිළිබඳ අධ්‍යයනයක්
පී. එස්. ජී. ආරච්චිගේ ........ 108
බලි ශාන්තිකර්මයේ භාවිත නව කොළ අත්ත හා එහි ඇති දේශීය වෛද්‍ය විද්‍යාත්මක වටිනාකම
ඩබ්. ජී. එච්. එම්. වෙද්දෙනිය, ජේ. ඒ. ටී. සී. ජයසිංහ ........ 109
පැරණි ලංකාවේ ග්‍රාමීය සෞඛ්‍යය සංරක්ෂණ විධි පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්
ඒ. පී. සු. ලක්මාලි, ඩී. ඒ. අයි. එස්. එස්. ධර්මපාල, පී. පී. අයි. සෙව්වන්දි ........ 110
කුඩැල්ලන් ඇඟ කැවීමේ සාම්ප්‍රදායික ක්‍රමවේදය තුළින් රෝග නිවාරණය කිරීම
උල්පතගම අමිතරතන හිමි, කේ. එම්. ඩිලන්ත රසන්ජන් ........ 111
පාරම්පරික ඇදහිල්ලක් වන වෙහෙරගල ''කෝවිල් දානය'' පිළිබඳ අධ්‍යනයක්
කේ. ඩී. එම්. එස්. එම්. දිසානායක, එස්. ආර්. ටී. සඳමාලී ........ 112
නිදන්ගත වකුගඩු රෝගය හා බැඳි ජන වෙදකම පිළිබඳ සමාජවිද්‍යාත්මක අධ්‍යයනයක්
කේ. පී. ආර්. සුජානි අසංගිකා ........ 113

## FOLK MUSIC, POEM & TALES

"පන්නම් කතුර" පැදි පෙළින් හෙළිවන පන් කර්මාන්තය හා ඒ ආශ්‍රිත තාක්ෂණය පිළිබඳ අධ්‍යයනයක්
යූ. ඩී. ආර්. ෂෙහාන් තිලකරත්න ........ 117
ජනකවියෙන් නිරූපිත ග්‍රහචාරය පිළිබඳ විමසුමක්
එල්. ටී. ටී. ද. සිල්වා, එල්. ඩී. අයි ද සිල්වා ........ 118
පානම අම්පිටිය දේවාලය පිළිබඳ පුරාවෘත්ත මගින් ජන ජීවිතයට එල්ල කරන බලපෑම් පිළිබඳ මානව විද්‍යාත්මක අධ්‍යයනයක්
එන්. එම්. කේ. තක්ෂිලා නදීශානි ........ 119
ජනකවියෙන් ගම්‍ය වන ලාංකේය ජන ජීවිතයේ තහනම් ලේ ඥාතීන් අතර වූ කාම විහරණය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්
ආර්. එම්. ඒ. පී. රත්නායක, ආර්. එන්. එම්. රණවීර ........ 120
ජන ගායනාවන් ආරක්ෂණය පිණිස ශ්‍රී ලංකාවේ බුද්ධිමය දේපළ නීතියේ දායකත්වය පිළිබඳ විශ්ලේෂණාත්මක විග්‍රහයක්

ආර්. පී. එස්. එස්. රාජපක්ෂ 121
ජන කවියෙන් හෙළිවන කුරගල පුදබිමේ ඓතිහාසික බෞද්ධ උරුමය පිළිබඳ අධ්‍යයනයක්
පූජ්‍ය මොරවක දීපානන්ද හිමි 122
උඩරට මංගල හේරි වාදනයෙහි ශුභා'ශුභ භාවය
ආර්. බී. රණවීර, එල්. එම්. ආරියරත්න, එච්. පී. එම්. ඩී. චමින්ද 123
Rajasthan Folk Music and Hindustani Classical Music (Raga system)
W. H. A. N. Weerasinghe 124
ජනකවියෙන් විද්‍යමාන වන ලාංකේය වලව් සමාජය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්
එච්. ඒ. ජී. කේ. කුලතිලක 125
සිංහල නැළවිලි ගීයෙන් නිරූපිත සමාජ පාලනය
එච්. පී. කේ. එන්. හේවාවසම් 126
ඇමරිකානු කිවියර රොබට් ෆ්‍රොස්ට්ගේ කාව්‍යවල විද්‍යමාන ජනකාව්‍ය ලක්ෂණ, සිංහල ජනකවි හා සසඳමින් කැරෙන අධ්‍යයනයක්
කේ. ලංකාමුල්ල, ඩී. එම්. එස්. එන්. වීරසූරිය, ආර්. එම්. එස්. කේ. රණසිංහ 127
සමාජ පාලනයෙහිලා ජන කවියෙන් ලැබුණු දායකත්වය පිළිබඳ අධ්‍යයනයක්
ගනේගමගේ අසංකා මධුහංසි 128
වතුකරයේ ජන කවිය මගින් ඉස්මතු වන ජීවන ශෛලීන් පිළිබඳ විමර්ශනාත්මක විග්‍රහයක්
එච්. එම්. කේ. ජී. දුෂ්මන්ත, ඩබ්ලිව්. ජී. ඩී. පෙරේරා, ආර්. අනුෂාරි 129
වතුකරයේ ජනශ්‍රැතිය තුළ පවතින ජන කතා තුලින් ගම්‍යවන ආගමික විශ්වාසයන්, සමාජ පර්යායන් පිළිබඳ අධ්‍යයනයක්
ඩබ්ලිව්. ජී. ඩී. පෙරේරා, එච්. එම්. කේ. ජී. දුෂ්මන්ත, ටී. දිල්හානි 130
ගැමිජනයා දුටු ඉගෙනීමේ අගය ජනකවි ආශ්‍රයෙන් විමර්ශනාත්මක අධ්‍යයනයක්
ජී. ජී. ඒ. මධුහංසි, කේ. ඩී. එම්. සඳරුවන් 131
ජන කවියෙහි සංවාද කවි භාවිතය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්
ජේ. ඩී. අයි. ශෂිකලා, අයි. එම්. ජේ.දහනායක, ආර්. කේ. කේ. ටී. පී පත්මතුංග, එම්. යසින්ත දිල්ශාන් 132
සමාජ පාලනයෙහිලා ජන කවියෙන් ලැබුණු දායකත්වය පිළිබඳ අධ්‍යයනයක්
ජී. ජී. ඒ. මධුහංසි 133
අතීත ජනකවිය හා වර්තමාන ගීතය මිනිසුන්ගේ මානසික සංවර්ධනය හා පිරිහීමේහිලා බලපාන ආකාරය පිළිබඳ තුලනාත්මක විග්‍රහය
ටී. ආර්. එස්. එස්. දයාරත්න, යූ. ජී. එස්. දිල්ශානි, කේ. පී. සී. පී. කුමාර 134
Healing Through Music; with reference to *Saraswathi Sangeetha Mandapaya* in Peradeniya Academic Tradition in Sri Lanka
I. Wanniarachchi 135
ජන කවියෙන් ප්‍රතීයමාන සඳ
එම්. මනම්පේරී 136

## FOLK RELIGION

බංඩාර දෙවියන් හෙවත් රාවණා රජතුමා ප්‍රමුඛ කොටගෙන දෙවියන් හා යකුන් අදහන ලග්ගල ප්‍රදේශයේ ජනතාව පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්
ආර්. එම්. අයි. ජී. ඩී. කේ. රත්නායක, කේ. ඩී. ජී කරුණාතිලක, එච්. ආර්. එස්. ටී. එල් හපුවිට 139
මාදූව දූපතෙහි ඉපැරණි පත්තිනි දෙවොල ආශ්‍රිත පූජා චාරිත්‍ර විධි පිළිබඳ අධ්‍යයනයක්
කේ. උදාරි අනුපමා 140
මිහින්තලේ කටුසැය හා බැඳුණු අභිචාර විධි
එම්.කේ. එල්. අයිරාංගනී, එම්. ඩී. අයි. කේ. අබේනායක, ගාමිණී සමරනායක, එන්. ජී. අයි. එම්. වික්‍රමසිංහ 141
ගල්ගමුව, නාහෙට්ටිකුලම ග්‍රාමයේ වැදි කඩවර පිදීම හෙවත් පිටිය පිදිල්ල ශාන්ති කර්මය
සී. එම්. අධිපත්තු 142
ශ්‍රී ලාංකේය බෞද්ධාගමික අවමංගල්‍යය චාරිත්‍ර වාරිත්‍ර හා බැඳි "මළ බෙර" වාදනයෙහි සුවිශේෂිතාවය පිළිබඳව අධ්‍යයනයක්

ආර්. එම්. පී. එස්. වීරසූරිය 143
මුරගල හා බැඳි ජන ඇදහිලි තුළින් දරු සම්පත් ලබාගැනීම පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් (අභයගිරි ස්තූපය ඇසුරෙන්)
ඩබ්ලිව්. එච්. ඩී. එන් ජයවර්ධන, ඩබ්ලිව්. එම්. කේ. වාසල 144
කුඹල්මුල්ල පත්තිනි දේවාලය පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක්
ඩී. ටී. සිරිවර්ධන 145
පහතරට ශාන්තිකර්මවල අභිචාරමය ප්‍රවණතා පිළිබඳ සමාජ විද්‍යාත්මක විමසුමක් (රටයකුම හා සන්නියකුම ඇසුරෙන්)
එච්. එස්. එන්. සිල්වා 146
Articulating Beingness: "Orality" as Integral to the Buddhist Heritage
Amrita Singh 147
කැලණි ගං මිටියාවතෙහි පවතින රංවල දේව සංකල්පය
ටී. වයි. ඩී. වික්‍රමනායක, එස්. සමරසේකර 148
බෙන්තර ගලපාන රජමහා විහාරයේ මහා කාශ්‍යප දළඳ පූජාවේ චාරිත්‍ර විධි
ඩබ්. ඩබ්. එස්. දමයන්ති 149
ශ්‍රී ලාංකීය ගැමි සමාජයේ විශ්වාස පද්ධතියක් වන නිමිතිවල සමාජ භාවිතය හා වර්තමාන තත්ත්වය පිළිබඳ අධ්‍යයනය (පන්නිල ග්‍රාමය ඇසුරෙන්)
එන්. එල්. කරුණාරත්න, එච්. ඩී. එල්. ආර්. හපුතන්ත්‍රී 150
ශ්‍රී පාදස්ථානය ආශ්‍රිත ව ගොඩනැගුණු ප්‍රාදේශීය පිළිවෙත්හි වත්මන් ස්වරූපය (කුරුවිට ප්‍රදේශය ඇසුරින්)
බී. ජී. ඒ. ටී. එන්. වික්‍රමරත්න, එස්. සමරසේකර 151
ජන ශාන්තිකර්මයක් ලෙස සන්නියකුම ශාන්තිකර්මය විවරණය කිරීම (සාහිත්‍යමය මූලාශ්‍ර ඇසුරින්)
එච්. එම්. එච්. එම්. හේරත්, එස්. සමරසේකර 152
කාලි මාතා දෙවඟන ආශ්‍රිත යාතු කර්ම හා පුදපූජා (මුන්නේෂ්වරම් හා මෝදර කාලි කෝවිල් ඇසුරෙන්)
ඒ. ඒ. ජේ. ජයසිරි, ඩබ්. එම්. සී. එල්. මධුශංඛ 153
ශ්‍රී ලාංකීය ගැමි සමාජයේ විශ්වාස පද්ධතියක් වන කෙම් ක්‍රම, අත්බෙහෙත් හා බැඳී අතීත සමාජ භාවිතයන් හා වර්තමාන තත්වය පිළිබඳ අධ්‍යයනය (දීගන්දල ප්‍රදේශය ආශ්‍රයෙන්)
එම්. එල්. පී. එන්. ලියනගේ 154
Impacts of Religion to Peasants' Life Style
J. A. P. K. Senavirathna 155
ජනශ්‍රැතිකාංගයක් ලෙස උඩුනුවර ප්‍රදේශය තුළ පවතින හෙණකඳ බිසෝ බණ්ඩාර දේවිය පිළිබඳ සටහන් වන මූලාශ්‍ර හා සම්බන්ධ විශ්වාස පිළිබඳ අධ්‍යනයක්
ඩී. එම්. කේ. ජී. කේ. දිසානායක, ඩබ්. කේ. එම්. විජයරත්න, පී. ඒ. ඒ. එන්. ශ්‍රී ශාන් 156
ඓතිහාසික කැබිලිත්ත පුදබිම හා බැඳුණු ඇදහිලි, විශ්වාස, පුදපූජා හා චාරිත්‍ර විධි පිළිබඳ මානව විද්‍යාත්මක අධ්‍යයනයක්
ජී. ඒ. ඒ. එන්. ශ්‍රී ශාන්, එච්. එම්. කේ. ජී. දුෂ්මන්ත, ඩබ්ලිව්. කේ. එම්. විජයරත්න 157
වලගම්බාහුව ග්‍රාමය ආශ්‍රිතව පවතින සම්ප්‍රදායික කිරි ඉතුරුම් මංගල්‍යය පිළිබඳව අධ්‍යයනයක්
කේ. කේ. පී. එම්. ජයතිලක 158
පාරම්පරික විශ්වාස සහ කෙම් ක්‍රම පිළිබඳ අධ්‍යයනයක් (කළුතර දිස්ත්‍රික්කයේ, මිල්ලනිය ප්‍රාදේශීය කොට්ඨාශයේ, පැල්පොල ග්‍රාමය ආශ්‍රයෙනි)
පී. ඒ. පී. රුද්‍රිගෝ , කේ. ටී. ඩී. කේ. ඒ. කේ. තන්ත්‍රිගේ, ඒ. ජේ. රජිත් 159
මෝහිනියඃ පුනර්කථනාත්මක ප්‍රත්‍යාවේක්ෂණයක්
එම්. කේ. සී. කේ. රණවීර 160
අවුරුදු ජන ක්‍රීඩා හා බැඳි පත්තිනි දේව ඇදහිල්ල පිළිබඳ අධ්‍යයනයක්
කේ. කේ. පී. එම්. ජයතිලක, එස්. ඩී. බොතේජුල ජේ. ඒ. අයි. සංදීපනී, එස්. එම්. හෙට්ටිආරච්චි 161
වැදි ජන ශාන්තිකර්මයක් වන කිරිකොරහ නැටීමෙහි කාලානුරූප විචල්‍යතා පිළිබඳ මානව විද්‍යාත්මක අධ්‍යයනයක් (ඌව පළාතේ දඹාන වැදි ජන සමාජය ඇසුරින්)
එස්. ඩබ්ලිව්. පී. කුමාර 162
නානුමුර මංගල්‍යය පිළිබඳව මානව විද්‍යාත්මක අධ්‍යයනයක්
කේ. ඒ. සී. සී. ආනන්ද, එම්. ආර්. ගුණරත්න 163
ශ්‍රී ලාංකේය සංස්කෘතිය හා බැඳුණු මෝහිනී සංකල්පය

ඩබ්ලිව්. වී. පී.එච් රණවීර, එච්. පී. ඒ. සුලෝචනා 164
සම්ප්‍රදායික ගැමි සමාජයේ හේන් ගොවිතැන හා බැඳුනු ඇදහිලි හා විශ්වාස පිළිබඳ මානව විද්‍යාත්මක අධ්‍යයනයක්
ජී. ආර්. එස්. එච්. රණසිංහ, එච්. ජී. එච්. එස්. හද්දැල, ආර්. එම්. සී. එම්. රත්නායක 165
ජනශැතිය, සූනියම් යාගය හා එහි සමාජ මානව විද්‍යාත්මකභාවය
එස්. ඒ. ඩී. එස්. අමරසිංහ, වයි. එම්. එස්. පි. යාපා, ජී. ජී. ඩී. එස්. බංඩාර, ටැම්පිටියේ පාලිත හිමි 166
සූනියම් ඇදහිල්ල තුළ නිරූපණය වන්නේ යක්ෂයෙක් ද, දේවතාවෙක් ද යන්න පිළිබඳව මානව විද්‍යාත්මක අධ්‍යයනයක්
කේ. ඒ. සී. සී. ආනන්ද, එම්. හිත්තැටියගේ, ඕ. වී. ඒ. ජයනන්ද, පී. ආර්. පී රණසිංහ 167
කිරි ඉතිරවීමේ මංගල්‍යය පිළිබඳ ජනශ්‍රැති විද්‍යාත්මක අධ්‍යයනයක් (පොළොන්නරු පුරවරයේ කොටුවෙල ග්‍රාමය ඇසුරෙන්)
එම්. සී. හෙරත්, ඒ. එම්. දසනායක, එන්. කාන්තිලතා 168
Analysis of the Strategies Used In the Rituals of Ratayakuma by Using Prosperity as a Reflection in the Folk Magic
P. N. Hansani 169
A study of Folk Religious Conditions in Pre-Buddhist Ceylon
Rev. M. Deepananda, Rev. G. Dhammadinna, Rev. U. Wimalakiththi, Rev. M. Chandarathana, Rev. A. Dhammananda 170

## FOOD CULTURE

සංස්කෘතික උත්සව හා සබැඳි ආහාර රටාවනගේ විවිධත්වය (චීනය හා ශ්‍රී ලංකාව අතර තුළනාත්මක සංසංදනයක්)
එච්. එම්. ආර්. පී. විජේරත්න, පී. එම්. එන්. ටී. සමරනායක 173
දකුණ ආසියානු රටවල ආහාර සම්ප්‍රදායන් තුළ දක්නට ලැබෙන විවිධත්වය පිළිබඳ විමර්ශණාත්මක අධ්‍යයනයක්
ඩී. ඩී. ඉන්ද්‍රචාපා 174
උඩරට, මන්දාරම්නුවර සාම්ප්‍රදායික ගැමි ජීවිතය හා සබැඳි ආහාර සංස්කෘතිය
එම්. පි හංසමාලි, මන්දාරම්නුවර සුමංගල හිමි, ඒ. ඒ. එස්. වර්ණකුලසූරිය 175
බටහිරකරණයේ ආගමනයත් සමඟ වියැකී යන දේශීය ආහාර සංස්කෘතිය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් (මාතලේ දිස්ත්‍රික්කයේ රත්තොට ග්‍රාමය ඇසුරිනි)
කේ. එල්. ජී. ඩී. එන්. මහේෂිකා, ඩබ්ලිව්. ජී. එස්. ඉමේෂිකා, එස්. ඒ. චතුර මදුෂංක 176
ඌව සහ සබරගමු පළාත්වල සම්ප්‍රදායික ආහාර සංස්කෘතිය හා සබැඳි ඇදහිලි විශ්වාස සහ සිරිත් විරිත් පිළිබඳ අධ්‍යයනයක්
ඩී. එස්. බණ්ඩාර 177
Jaffna ‘Odiyal Koozh’ a Hidden Treasure of Palmyrah
M. Sivakaran 178
ජපානයට ම ආවේණික වූ ආහාර සංස්කෘතියේ සුවිශේෂීතාව පිළිබඳ අධ්‍යයනයක්
හිඹිලියාකඩ පදුම හිමි 179
A Case Study of Food Preservation Methods as an Indigenous Food Security Practice in Rural Setting of Sri Lanka
P. D. Wijesekara, A. A. R. Thamodi, C. S. Manage, N. D. Kaggodaarachchi, T. M. S. P. K. Thennakoon 180
ජන සම්මතයේ බත් ගස නමන් ව්‍යවහාර වන කොස් ගස ආශ්‍රිතව මෙරට නිර්මාණය වී ඇති ආහාර සංස්කෘතිය
දී. ආර්. පී. නයනතරා, ආර්. දී. වින්ඩ්සර්, දී. එම්. කේ. ජී. කේ. දිසානායක 181
සබරගමුවේ සාම්ප්‍රදායික ආහාර රටාවේ එන “හත්මාලුව” පිළිබඳ අධ්‍යයනයක් (ඇහැලියගොඩ ප්‍රදේශය ඇසුරින්)
යූ. ආර්. ඒ. පී. රංජිත්, එස්. ටී. පී. රුවන්තිකා 182
සාම්ප්‍රදායික ග්‍රාමීය ජන සමාජයෙන් වියැකී යන විකල්ප ආහාර සංස්කෘතිය පිළිබඳ අධ්‍යයනයක් (රිදීමාලියද්ද ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයට අයත් ගම්මාන කිහිපයක් ඇසුරින්)
කේ. එච්. එම්. ආර්. ඩී. මල්කාන්ති 183

සාහිත්‍ය හා පුරාවිද්‍යාත්මක මූලාශ්‍රයවලින් හෙළිවන පැරණි ලාංකිකයාගේ ආහාර රටාව පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්
ඩබ්ලිව්. ඒ. එල්. පී. දිල්හාරා ........ 184

Traditional Food Behavior of Sinhalese: A Study With Reference to Pandeniya Village
P. D. Wickramage ........ 185

ජනප්‍රවාද වල සඳහන් වන හෙළයන් සතුව පැවති විමාන තාක්ෂණය පිළිබඳව විමර්ශනාත්මක අධ්‍යයනයක්
සූරියවැව පඤ්ඤාසිරි හිමි ........ 186


## TAMIL ABSTRACTS


தமிழர்களின் கோலாட்டமும் முஸ்லிம்களின் களிகம்பும் ஓர் ஒப்பீட்டு நோக்கு
திருமதி துயந்தி யூலியன் ஜெயப்பிரகர் ........ 189

சிலம்பு கூறும் பதினோராடலும், தற்கால வழக்கில் உள்ள கிராமிய நடனங்களும் - ஓர் ஒப்பீடு
C. S. Ranjithkumar ........ 190

தமிழர் பண்பாட்டில் தேனின் வகிபங்கு ஒரு சமூகவியல் பார்வை
இராமையா அழகுராஜா, மோகன்ராஜ் மனோஜ், ராமசாமி விஜயகுமார் ........ 191

தமிழர்களுடைய மரணச்சடங்குகளில் வழக்கிழந்து வரும் ஒப்பாரிப்பாடல்கள் (யாழ்ப்பாணத்தை அடிப்படையாகக் கொண்ட ஆய்வு)
அனித்தா சசிகரன் ........ 192

இலங்கையில் தமிழ்க் கத்தோலிக்க நாட்டாரியல் : ஓர் ஆய்வு
J. Harosana ........ 193

நாட்டார் மரபில் பெரிய எழுத்து நூல்கள்: ஒரு சமூக வரலாற்றியல் ஆய்வு
Mr. M. M. Jayaseelan ........ 194

மீள்குடியேற்றப்பட்ட மக்களின் சமூக பண்பாட்டு மாற்றங்களும் அதன் தாக்கங்களும்: முசலி பிரதேசத்தின் பண்டாவளிக் கிராமத்தினை மையமாகக் கொண்ட ஒரு சமூகவியல் ஆய்வு
எம். எப். பமீஸ் ........ 195

சமூகப் பண்பாட்டியல் நோக்கில் பழமொழிகள்: மரபும் மாற்றமும்
A. Vinothini ........ 196

உடப்புப் பிரதேச நாட்டார் மருத்துவம்
S. R. Devakumari ........ 197

ஆகமம்சாரா வழிபாட்டில் பலியிடுதல் - மட்டக்களப்பு தேசத்தை அடிப்படையாகக் கொண்ட ஆய்வு
மேகலா சிவகுமாரன் ........ 198

சூழலியல் நோக்கில் மலையக நாட்டார் வழிபாடுகள்
திரு. சு. தவச்செல்வன் ........ 199

யாழ்ப்பாண அரசு காலத்தில் சித்தஆயுர்வேத மருத்துவம் ஓர் வரலாற்றுநோக்கு
க. ஜெயதீஸ்வரன் ........ 200

தமிழ் அரச உருவாக்கத்தில் உக்கிரசிங்கமன்னன், மாருதப்புரவீகவல்லி பற்றிய வரலாற்றுக்கதையின் செல்வாக்கு
திருமதி. சிவரூபி சயிதரன் ........ 201

‘பொன்னர் சங்கர் கூத்து ஒரு பெண்ணிலை நோக்கு’
N. Sudarshini ........ 202

# FOLK ARTS

# වත්තේගම රජ මහ විහාරයේ ඉපැරණි සිතුවමෙන් පිළිබිඹු වන පැරණි ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ජන සමාජ හා සංස්කෘතික ලක්ෂණ පිළිබඳ විශ්ලේෂණාත්මක අධ්‍යයනයක්

කේ. ඩී. කේ. කේ. තන්ත්‍රිගේ, ඒ. ජේ. රජිත්, කේ. ජී. එච්. චන්දිමාල්, පී. ඒ. පී. රොද්‍රිගෝ

මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය, රුහුණ විශ්වවිද්‍යාලය

*kawumiapsara@gmai.com*

ශ්‍රී ලංකාවේ කලා සම්ප්‍රදායන් අතුරින් මහනුවර යුගයේ සිතුවම් සම්ප්‍රදාය, ශ්‍රී ලාංකේය ජන සමාජයේ කලා සම්ප්‍රදායන් ඉස්මතු කර දැක්වීමටත්, ජනයාගේ ජන ජීවිතත්වල ලක්ෂණ හුවාදැක්වීමටත් වැඩි අවධානයක් යොමු කර ඇත. මෙම යුගයට නෑකම් කියන්නා වූ තවත් එක් සිතුවමක් වශයෙන් වත්තේගම පුරාණ රජමහා විහාරයේ ඇති පැතිකඩ සිතුවම හඳුන්වාදිය හැකිය. සිතියම් ලක්ෂණ සහිතව නිර්මාණය වී ඇති මෙම පැතිකඩ සිතුවම හරහා ද ගම්‍යමාන වන්නේ ලාංකේය ග්‍රාමීය ජන සමාජයත්, එහි පැවතියා වූ සංස්කෘතික ලක්ෂණයන් පිළිබඳවයි.  මෙකී සිතුවම තුළින් දක්වා ඇති රූප සහ එහි ඇති භාෂාව මගින් හෙළිවන ඉපැරණි ගැමි සමාජයත්, සංස්කෘතියත් කෙබඳුද යන ගැටලුවට පිළිතුරු සාධනය කර ගැනීම මෙම පත්‍රිකාවෙන් සිදු කර ඇත. අතීත ග්‍රාමීය සංස්කෘතික දෘෂ්ටිය වත්තේගම සිතුවම ඇසුරින් ලෝකයට විවර කිරීමත්, තත්කාලීන සමාජයේ ගැමි විඥානය සහ සමාජ පසුබිම පැහැදිලි කිරීමටත් මෙම සිතුවම භාවිත කිරීම පර්යේෂණයේ අරමුණයි. තවද සිතුවමෙන් හෙළිවන ඉපැරණි ග්‍රාමීය සංස්කෘතිය, භාෂා භාවිතය, ආගමික පසුබිම, කලා සම්ප්‍රදායන්, ගැමි විඥානය මෙන්ම සංකේත භාවිතයෙහි ලා අදහස් පිළිබිඹු කිරීම පිළිබඳව අතීත ජන සමාජය තුළ පැවති කාරණා පැහැදිලි කර ගැනීමට ද මෙම සිතුවම මනා පිටිවහලක් වේ. ඒ සඳහා ක්ෂේත්‍ර අධ්‍යයනයත්, මූලාශ්‍ර භාවිතයත් මඟින් දත්ත ගොනු කර ගනු ලැබීය. මෙම යුගය වන විට සංස්කෘතිය තුළ සිතුවම් කලාව යම් ප්‍රගමනයක් ලබා තිබූ බව මෙහි වස්තු නිරූපණය සහ වර්ණ ගැන්වීමෙන් හඳුනා ගත හැකිය. සිතියම්කරණය පිළිබඳ ප්‍රබුද්ධ දැනුමක් නොවූ එවැනි ඉතා පැරණි යුගයක වුවද භූමියේ වස්තූන්ගේ පිහිටීම පිළිබඳව අද දක්වාම දළ අවබෝධයක් ලබා ගත හැකි ලෙස මෙම සිතුවම නිර්මාණය කිරීමට ඉපැරණි ගැමියා සමත්වී ඇත. එමගින් එකල ගැමියාගේ බුද්ධිගෝචර භාවය සහ තාක්ෂණිකමය ඉදිරි පියවර පෙර ලකුණු සංස්කෘතිය තුළින් විදහා පා ඇති බව පෙනේ. සිතුවමේ චිත්‍රණය කර ඇති ස්තූපය, විහාර ගෙය, බෝධිය වැනි අංගවලට වැඩි ඉඩක් ලබා දී ඇත. වෘක්ෂ ගණනාවක් අතුරින් බෝධි රුක්ෂය විශේෂ ලෙස ඉස්මතු කර දැක්වීම ඒ සඳහා කදිම නිදසුනයි. එමඟින් පැහැදිලි වන්නේ එකල ගැමි සංස්කෘතිය තුළ බුදුදහමට ඉහළම ස්ථානයක් ලබා දී එය ප්‍රතීයමාන කිරීම සඳහා විහාරාරාම ඉදි කළ බවයි. විහාරය දුර බැහැර ජනයාගේ වන්දනයට පවා මෙම විහාරය පාත්‍ර වූ බව සිතිය හැක්කේ මෙවැනි සිතියම් ලක්ෂණ සහිත පෙතිකඩ සිතුවම් නිර්මාණය කිරීම සඳහා එකල ජනයා යොමු වූ හෙයිනි. මෙකල සමාජය තුළ සාක්ෂරතාවය යම් තරමක දියුණු මට්ටමක පැවති බව මෙම සිතුවමේ ඇති අක්ෂර තුළින් හඳුනාගත හැකිය. තවද ගැමි සමාජ ක්‍රමය තුළ මිනුම් ක්‍රම මෙන්ම සංඛ්‍යා භාවිතය ද පැවති බව සිතුවම් ඒ ඇති වැකි හරහා පැහැදිලි වේ. වර්තමානයේ මෙම සිතුවමෙන් නිරූපිත වස්තූන් විශාල වශයෙන් විනාශ වී ගොස් හඳුනාගැනීමට නොහැකි වුවත් එකල පැවැති ගැමි ජන සංස්කෘතියත්, භූමි ව්‍යාප්තිය පිළිබඳව තිබූ දැනුමත් ලෝකයට සනාථ කිරීම සඳහා  ප්‍රබල සාධකයක් වශයෙන් ද, ලාංකේය ගැමි සමාජයේ සහ සංස්කෘතික ලක්ෂණ ලෝකයට විදහා පාන්නාවූ වැදගත් මූලාශ්‍රයක් වශයෙන් වශයෙන් ද වත්තේගම විහාර සිතුවම වැදගත්වේ.

***ප්‍රමුඛ පදඃ*** *ගැමි සංස්කෘතිය, වත්තේගම විහාරය, චිත්‍ර කලාව, සමාජ තත්ත්වය, ගැමි සංස්කෘතිය*

# ශ්‍රී ලාංකේය වෙස්මුහුණු කලාවේ ප්‍රභවය හා විකාශනය තුළින් හෙළිවන දෘශ්‍ය සන්නිවේදනාත්මක ප්‍රකාශනය පිළිබඳ ඓතිහාසික අධ්‍යයනයක්

ටී. එස්. මාටින්

*thushanimartin47@gmail.com*

වෙස්මුහුණු කලාව කවදා කෙසේ ආරම්භ වූවාදැයි අපැහැදිලිය. සාම්ප්‍රදායික වෙස්මුහුණු නර්තන පරම්පරාවන්හි ඓතිහාසික සාධක මත එය ශතවර්ෂ දෙකකට අධික කාලයක් පුරා පහතරට මුහුදුබඩ පළාත්හි රඟ දැක්වේ. වෙස්මුහුණු ප්‍රබල සන්නිවේදන මෙවලමකි. සන්නිවේදන සංකල්ප හා ආකෘති ගොඩනැගීමේ දී වෙස්මුහුණු සන්නිවේදනයෙන් ලද ආභාසය සුවිශේෂීය. දේශීය වෙස්මුහුණු පුද්ගල සංජානනයට බලපෑ ප්‍රබල සංකේතාත්මක ප්‍රකාශනයකි. ඒවා මිනිසාගේ අභ්‍යන්තර චිත්තවේග සමඟ සන්නිවේදනය කෙරේ. වෙස්මුහුණු මඟින් ග්‍රාහකයා තුළ අන්වර්ති පුද්ගල සන්නිවේදනයකට ඉඩ සැලසේ. විශේෂයෙන් ලංකාවේ දහඅට සන්නි වෙස්මුහුණු ඉතා සූක්ෂම සන්නිවේදන ක්‍රමෝපායක් හා සංකීර්ණ සම්බන්ධතා සමුදායක් ගැබ් වූවකි. ඒ අනුව ශ්‍රී ලංකාවේ වෙස්මුහුණු කලාවේ ප්‍රභවය හා විකාශනය තුළින් හෙළිවන දෘශ්‍ය සන්නිවේදනාත්මක ප්‍රකාශනය පිළිබඳව ඉතිහාසය තුළින් විමර්ශනාත්මකව අධ්‍යයනය කිරීම වැදගත්ය. මෙහිදී ලාංකේය වෙස්මුහුණු නිර්මාණය කිරීමේ දී එහි අන්තර්ගතය හා ඉන් හෙළිවන දෘශ්‍ය සන්නිවේදනාත්මක ලක්ෂණ පිළිබඳවත්, වෙස්මුහුණු වර්ග කිරීම පිළිබඳවත් අධ්‍යයනය කිරීම අරමුණුය. මෙහිලා පර්යේෂණ ගැටලුව ශ්‍රී ලංකාවේ වෙස්මුහුණු කලාවේ ප්‍රභවය හා විකාශනය එහි දෘශ්‍ය සන්නිවේදනාත්මක ප්‍රකාශනය කෙරෙහි සිදුකරන බලපෑම කෙබඳු දැයි හඳුනා ගැනීමය. තවද  මෙම පර්යේෂණය සිදුකිරීමේ දී භාවිත පළමු ක්‍රමවේදය වූයේ ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ අන්තර්ගතවන පුස්තකාල සමීක්ෂණයයි. එහිදී සාහිත්‍ය කෘති, විචාරශීලි ග්‍රන්ථ, ලිපි ලේඛන, අන්තර්ජාල තොරතුරු, දෘශ්‍ය සන්නිවේදන ලක්ෂණ ඇතුලත් එම විෂයේ වැදගත් සංකල්ප හා විෂය ක්ෂේත්‍රය සම්බන්ධ ග්‍රන්ථ මෙන්ම ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ තැන්පත් පෞරාණික හා කාලීන ලේඛන ද අධ්‍යයන කළේය. එසේම දෙවනුව ක්ෂේත්‍ර පර්යේෂණ ක්‍රමවේදය යටතේ තෙමාසික ක්ෂේත්‍ර පර්යේෂණයක් අම්බලන්ගොඩ නගරය ඇසුරින් සිදුකළේය. එහිදී තෝරාගත් ඉලක්කගත පුද්ගලයන් හා කණ්ඩායම් සහභාගීත්වයෙන්, සහභාගීත්ව නිරීක්ෂණ ක්‍රමවේදය යටතේ කරුණු එක්තැන් කළේය. ඒ අනුව එම ප්‍රදේශ ආශ්‍රයෙන් එකිනෙකට වෙනස් වෙස්මුහුණු වර්ග කිහිපයක් පිළිබඳව මූලිකවම හඳුනා ගැනුණි. එහිදී ප්‍රධාන වශයෙන් ඇදහිලි, පුදසිරිත්, යාතුකර්ම, ගැමි නාට්‍ය හා විශේෂ උත්සව ආදී අවස්ථා ද එම අවස්ථාවන්හි දී භාවිත වෙස්මුහුණුවල ස්වාභවය ද හඳුනා ගැනිණි. තවද වෙස්මුහුණුවල නම්, හැඩය, වර්ණ හරහා දෘශ්‍ය සන්නිවේදනය පිළිබඳව අනාවරණය වේ. මෙහිලා වර්ණවලින් විවිධ පුද්ගල ස්වභාවයන් ඉස්මතු කරයි. ඒවා අතර පාරිශුද්ධත්වය, අධිමානසිකත්වය, මිථ්‍යා දෘෂ්ටිය ආදී තත්ත්වයන් පවතී. ඒ අනුව සමස්තයක් වශයෙන් සැලකූවිට ලංකාවේ වෙස්මුහුණු කලාවේ ප්‍රභවය හා විකාශනය තුළින් හෙළිවන දෘශ්‍ය සන්නිවේදනාත්මක බලපෑම කෙබඳු දැයි පැහැදිලිය. තවද මෙම පර්යේෂණය පවතින දැනුම් පද්ධතියට නව දැනුමක් ලබාදීම හා වෙස්මුහුණු කලාව පිළිබඳ දැඩි උනන්දුවක්, රුචියක් දක්වන පුද්ගලයින්ට වැදගත් වන බව ද නිගමනය කළ හැකිය. ඒ අනුව අග්‍රගණ්‍ය වෙස්මුහුණු කලාවේ ප්‍රභවය හා විකාශනය තුළින් හෙළිවන දෘශ්‍ය සන්නිවේදනාත්මක ප්‍රකාශනය ඓතිහාසික මෙන්ම කාලීන වශයෙන් ඉතා වැදගත් බව ප්‍රත්‍යක්ෂය.

***ප්‍රමුඛ පදඃ*** *වෙස්මුහුණු, දෘශ්‍ය සන්නිවේදනාත්මක, සාම්ප්‍රදායික, ප්‍රභවය හා විකාශනය, ඇදහිලි*

# ශ්‍රී ලංකාවේ බලි ශාන්තිකර්මයේ සෞන්දර්යාත්මක පැතිකඩ

එල්. එන්. ඒ. ඩී. පී. නිශ්ශංක

සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය

*darshana.nissanka@gmail.com*

සියවස් ගණනාවක් පුරා හෙළ ජනයා තම නීරෝගී භාවය සහ සෞභාග්‍යය ළඟා කරගැනීම සඳහා විවිධ වූ සිරිත් විරිත් සහ විවිධ වූ ක්‍රමෝපායයන් අනුගමනය කිරීමට හුරු වී සිටියහ. ඔවුන ට ඇතිවන ලෙඩ දුක්, විවිධ අතුරු ආන්තරා වන් මෙන්ම අමනුෂ්‍යය බලපෑම් වලින් මිදීම පිණිස දෙවියන් යැදීම, වැඳීම සහ පිදීම සිදු කළහ. ඔවුන්ගේ ප්‍රධානතම ගැලැවුම් කරුවා වූයේ දෙවියන් හෝ යක්ෂයින්ය. එමෙන්ම නව ග්‍රහයින්ගෙන් ඇතිවන්නා වූ අපල දුරු කරගැනීමටත් වැඳුම් පිදුම් සිදු කළහ. මෙම සියලු කාරණා හේතුකොටගෙන එකල මනුෂ්‍යයා ගස්, ගල්, ගිනි, මුහුදු, පොළොව, ඉර, හඳ ආදී වූ භෞතික වස්තුන්ට ද දේවත්වයක් ආරෝපණය කොට තම ගතේත් සිතේත් සැනසීම වෙනුවෙන් පූජා පැවැත්වූ හ. අතීත හෙළ ජනයා වදනින්, ගායනයෙන්, භේරී වාදනයෙන්, වැද වැටීමෙන්, ඇඹීමෙන්, ඇදීමෙන් සහ යැදීමෙන් දෙවියන් පිදිය හැකි යයි විශ්වාස කළහ. බලි ශාන්තිකර්මය වනාහි දෙවියන්, යකුන්, ග්‍රහයින් පිදීමෙහි ලා මිනිසා විසින් නිර්මාණය කොටගත්තා වූ විචිත්‍ර වූ ශාන්තිකර්මයක් වන අතරම එය ශ්‍රී ලාංකේය සංස්කෘතිකාංගයන් හි ප්‍රමුඛ ස්ථානයක් ගන්නා අංගයකි. මෙම පර්යේෂණයෙහි මූලික අරමුණ වනුයේ ශ්‍රී ලංකාවේ පවතින සාම්ප්‍රදායික බලි ශාන්තිකර්මයන් හි සෞන්දර්යාත්මක පසුබිම පිළිබඳ අධ්‍යයනය කිරීමයි. ප්‍රාථමික මූලාශ්‍ර, ද්විතීයික මූලාශ්‍ර, සාකච්ඡා ක්‍රමය සහ ප්‍රත්‍යෙක අධ්‍යයනයන්ද දත්ත රැස්කිරීම සඳහා උපයෝගී කරගන්නා ලදී. බලි ශාන්තියේ උපත භාරතයේ සිදු වූව ද එහි සෞන්දර්යාත්මක අගයන් වර්ධනය වූයේ ලක්දිවදී ය. උඩරට, පහතරට සහ සබරගමු යනුවෙන් ප්‍රධාන සම්ප්‍රදායයන් ත්‍රිත්වයක්ද නුවර කළාවියේ බලි සහ ඌව බලි වශයෙන් ද ලක්දිව බලි විකාශනය සිදුවිය. බලි ශාන්තිකර්මය යනු ගායනය, වාදනය, නර්තනය, ඇඹුම් ශිල්පය සහ චිත්‍ර ශිල්පය යනාදී සකල කලාවන්ගෙන්ම පරිපූර්ණ වූ සංස්කෘතිකාංගයකි. බලි ශාන්තිකර්මය මුලුමනින්ම ගායනාවන්ගෙන් සමන්විතය. ස්තෝත්‍ර, සන්න, සැහැළි සහ අෂ්ටක ආදියෙන් පරිපූර්ණ වූ එය මනා වූ නාද මාලාවන්ගෙන් ගායනා කෙරේ. මෙම ගායනාවන් බලි ශාන්තිකර්ම සම්ප්‍රදායයෙන් සම්ප්‍රදායයට විවිධ ස්වරූපයෙන් වේ. එමෙන්ම වාද්‍ය භාණ්ඩද සම්ප්‍රදායයෙන් සම්ප්‍රදායයට විවිධ වේ. උඩරට සම්ප්‍රදායයෙහි ගැටබෙරය මෙන්ම උඩැක්කියද, පහතරට සම්ප්‍රදායයෙහි දෙවොල් බෙරය මෙන්ම සබරගමු සම්ප්‍රදායයෙහි දවුල ද වාද්‍ය භාණ්ඩ ලෙස භාවිතා කෙරේ. එමෙන්ම වාග් විලාසයත්, නර්තන වින්‍යාසයත්, බලි ඇඹීමේ කලාවත් සම්ප්‍රදායයෙන් සම්ප්‍රදායයට වෙනස් වූ ස්වරූප ගනියි.

***ප්‍රමුඛ පදඃ*** *බලි ශාන්තිකර්ම, නව ග්‍රහයින්, හෙළ ජනයා, සංස්කෘතිය*

# අභිලේඛන තුළින් හෙළිවන අනුරාධපුර යුගයේ ප්‍රාසංගික කලාව පිළිබඳ අධ්‍යයනයක්

පිටබැද්දර විමල සුධීර හිමි

ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය

*wimalasudeera@gmail.com*

මානව ශිෂ්ටාචාරයේ ආරම්භයේ සිට ඔවුන්ට ආවේණික සංස්කෘතික ලක්ෂණයන් එම සමාජ රටාව නිවැරදි දිශානතියක් ඔස්සේ ගමන් කිරීමට හේතු වූ බව පැහැදිලිය. සමාජ සම්මතය මගින් ගොඩ නගාගන්නා ලද ආකල්ප වෙනසත්, මිනිස් මනෝභාවය එම සමාජය සෞන්දර්යාත්මක කරයි. ශ්‍රී ලංකාවේ ඉපැරණි සමාජ සන්දර්භය තුළ ප්‍රාසංගික කලාව කෙරෙහි දක් වූ සම්මතය විශිෂ්ටය. අනුරාධපුර යුගයේ අභිලේඛනගත සාධක මගින් මෙරට ප්‍රාසාංගික කලාව කෙරෙහි දැක් වූ ආකල්පය හඳුනාගත හැකිය. අභිලේඛන ගත සාධක අනුව අනුරාධපුර යුගයේ ප්‍රාසාංගික කලාව කෙබඳු ස්වරූපයක් ගෙන තිබුණිද යන්න අධ්‍යයනය යන්න මෙම පර්යේෂණයේ අරමුණ විය. ප්‍රාථමික මූලාශ්‍ර ලෙස අභිලේඛන ද ද්විතියික මූලාශ්‍ර ලෙස පොත් පත් ආදිය මත පදනම්ව දත්ත රැස්කිරීම සිදුකරන ලදි. තුඩි සහ සොළි යනුවෙන් වාදනය කරන ලද බෙර වර්ග පිළිබඳ සාධක ආන්තාණි ශිලා ලිපි පැහැදිලි කරයි. මෙම වාද්‍ය භාණ්ඩ වාදනය කරමින් අන්තාණි ප්‍රදානයට යටත් වූ භූමියට ඇතුල් නොවිය යුතු බව දක්වා ඇත. ''තුඩිය සොළිය නොගසනු ඉසා'' යනුවෙන් රනාව ශිලා ලිපියේ ද හඳුනාගත හැකිය. එසේම අල්ලායි ටැම් ලිපිය, ගොන්නෑව දේවාල ටැම් ලිපිය හා ඇල්ලේවැව ටැම් ලිපියේ ද මෙම සාධක දැකගත හැකිය. මෙරට ඉපැරණි ප්‍රසංගික කලාව පිළිබඳ සාධක සීගිරි කුරුටු ගී මගින් ද හඳුනාගත හැකිය. ''වෙණ'' යනුවෙන් සඳහන් වීණාව නම් වාද්‍ය භාණ්ඩය පිළිබඳ සාධක ද පෙන්නුම් කරයි. මෙරට ප්‍රාසංගික කලාවේ ඉහළ සංස්කෘතික ලක්‍ෂණ පෙන්නුම් කරන පෙරහර වල දී ගීත ගායනය පිළිබඳ සාධක මයිලගස්තොට ටැම් ලිපියේ සඳහන් වේ. ''දා වැඩීමෙහි මිසැ මහ හිමින් ඇතුළත සිට සී නොසෙනු සතුරින් නොගයනු'' යන පාඨයට අනුව ධාතු වැඩමවන අවස්ථාවේ දී පමණක් විහාරයේ මහා සීමාව තුළ දී ගී ගැයීමට අවසර දී තිබු බව පෙනේ. මලගණෙ, ගොන්නෑව, නෑගම යන ස්ථානවලින් හමු වූ අභිලේඛනවල පෙරෙනාට්ටු, පෙරෙනාට්ටියම් යන පද මගින් පැහැදිලි කරනුයේ අනුරාධපුර සමාජයේ නර්තන ශිල්පීන් පිළිබඳවයි. ඒ අනුව රැස් කළ දත්ත විශ්ලේෂණය කිරීමේ දී පැහැදිලි වන්නේ මානව සමාජයේ ආරම්භයේ සිට ගොඩනගා ගන්නා ලද ප්‍රාසංගිකත්වය සංස්කෘතික ගතිකයන් වශයෙන් සමාජ ස්තරයන් කෙරෙහි විවිධ වශයෙන් භාවිත වූ බවයි.

***ප්‍රමුඛ පද:*** *අභිලේඛන, ප්‍රාසංගික කලාව, අනුරාධපුර සමාජය, සංස්කෘතිය, සෞන්දර්යය*

# Medicolegal and Cultural Anthropological Aspects of Tattooing: a Qualitative Atudy

S. R. Hulathduwa, H. T.D. W. Ariyarathna

Department of Forensic Medicine, Faculty of Medical Sciences, University of Sri Jayewardenepura

*ariyaratna@sjp.ac.lk*

Mummified human skins and ancient art containing tattoos, tools used for tattooing etc. prove that tattooing had been in practice since at-least 4000 BC. Tattooing is a form of permanent body modification. Body modifications could be permanent or temporary. Body painting is the commonest form of temporary body modification. Permanent modifications include tattooing, piercing, branding and prosthesis. Branding is a disfiguring, incriminating practice usually not accepted cosmetically. Tattooing is a science and an art evolving with human culture. The account that the authors wish to discuss is based on the working experience of three countries Australia, UK and Sri Lanka during the past seven years. Some important points are summarized below accordingly. The nature of tattoos differs from culture to culture. It is dynamic and evolves in the same culture with time. Conventional tattoos (barb wire, snake and dagger, cross, "Amma Buduwewa", "Maruwa Samage Wase" etc.) are diminishing. The culture of tattooing is gaining rapid popularity and acceptance in all communities. Tattoos are still commoner among the lower socio-economic classes though this disparity is rapidly diminishing. Some are black while others are bi or tri-chromatic. Tattoos are becoming popular among females. There are gender differences in tattoos. Tattoos act as a rich source of information as to the barer's ethnicity, language, religious faiths, preferences (sexual or otherwise), personal data and socio-cultural background. Some such information is misleading at times. Forensically, tattoos help establishing specific identity of the living and the dead. Tattoos become prominent in early putrefaction. Historical forensic evidence that drug peddlers tend to tattoo No 13 in their lower lips and gays tattoo a blue-bird in the web between thumb and fore-finger are still valid. Some individuals bare extremely unusual tattoos. Others bare tattoos on unusual sites of their anatomy such as on the penis and around anal verge. Some use tattoos to hide old scars, moulds, previous ugly tattoos and recreational drug injecting sites. Crude attempts of removing tattoos are always obvious while laser quarterization is less disfiguring. Some tattoos become culturally unacceptable when the person grows old. Tattooing is generally considered as posing a risk of contracting blood-borne infections on the person.

***Key words:*** *body modifications, tattooing, identification, forensic (evidence)*

# 18 හා 19 සියවස්වල ශ්‍රී ලාංකේය බෞද්ධ කලාවේ නිරූපිත යක්ෂ රූපය පිළිබඳ අධ්‍යයනයක්

එන්. එච්. එස්. උදයංගනී

දෘශ්‍ය කලා පීඨය, සෞන්දර්ය කලා විශ්ව විද්‍යාලය

*sachithraudayangani111@gmail.com*

'යක්ෂ රූපය' ලොව බොහෝ ආගමික කලාවන්හි කේන්ද්‍රීය වස්තු විෂයක් වන අතර එය සුලභ ව නිරූපණය වී ඇත්තේ කෲර, භයානක, නපුරු, අධම ගති ලක්ෂණ අවධාරණය වන පරිදි ය. ශ්‍රී ලාංකේය බෞද්ධ කලාවේ නිරූපිත යක්ෂ රූප සැලකීමේ දී යට කී ලක්ෂණ පමණක් නොව, එයින් පරිබාහිර ව දේව, අර්ධ-දේව, ආරක්ෂක, නිර පාලක, මාර, ආදී විවිධ ස්වරූපවලින් දක්වා තිබේ. යක්ෂ රූපවල මෙකී විවිධත්වය 18 හා 19 වන සියවස්වල ශ්‍රී ලාංකේය බෞද්ධ විහාර කලාවෙන් නිරූපණය වූ ආකාරය මෙම අධ්‍යයනයෙන් පරීක්ෂා කෙරිණි. මෙහි ප්‍රධාන පර්යේෂණ ගැටලුව වූයේ බෞද්ධ කලාවේ යක්ෂ රූපය භාවිතා වී ඇති විවිධ ස්වරූප මොනවාද සහ ඒ සඳහා බල පෑ හේතු කවරේද ? යන්නයි. ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ කළ මෙහි දී දෘශ්‍ය කෘති ස්ථානීය නිරීක්ෂණය, ප්‍රත්‍යක්ෂ අධ්‍යයන, සම්මුඛ සාකච්ඡා, ද්විතීයික මූලාශ්‍ර අධ්‍යයන ආදී ක්‍රමවේද භාවිත විය. අධ්‍යයන දත්ත අනුව යක්ෂ රූපය ලාංකේය විහාර අවකාශයේ යෙදුනු ආකාර හතක් - එනම් අපාය තුළ යමපල්ලන්, ජාතක කතා තුළ මාංශ භක්ෂක යක්ෂයින්, ජලයේ සිටින දිය රකුසන්, මාරපරාජයේ මාරයන්, ද්වාර පාලක ආරක්ෂක යකුන්, දේවත්වය සමග බැඳුණු යකුන්, අසුරයින් ආදී වශයෙන් - හඳුනා ගත හැකි විය. එසේ ම මෙම යක්‍ෂ රූපවල ධූරාවලියක් මෙන්ම ස්ථානගත වන නිශ්චිත ස්ථාන ද විහාර අවකාශ ඇසුරෙන් හඳුනා ගත හැකි විය. මෙලෙස යක්‍ෂ රූපයේ විවිධත්වයක් ඇති වීමට බෞද්ධ සාහිත්‍යයික සංකල්පයන්ට අමතරව ඒ සමග හින්දු ආගමික සංකල්ප මිශ්‍රවීම, ප්‍රාදේශීය ජන ඇදහිලිවල බලපෑම, නක්‍ෂත්‍රය වැනි ක්ෂේත්‍රවල නියැලි පිරිස් සිත්තරු ලෙස එක්වීම, සමාජ සංශෝධනවල අවශ්‍යතාවය, විහාරාධිකාරියේ රුචිකත්වය වැනි කරුණු ගණනාවක් බල පා ඇත. මේ අනුව යක්‍ෂ රූපය හුදු සිතුවම් අතර චරිතයක් පමණක් නොව බෞද්ධාගම සමග ඒවා නිර්මාණය කළ සමාජ-දේශපාලනික මොහොත සමග සම්බන්ධිත ව ක්‍රියාත්මක වූ සුසමාදර්ශ, බල ව්‍යූහ, සංකථන ආදී  ගතිකයන් ගණනාවක නියෝජනයක් ලෙස හඳුනා ගැනීමට හැකි ය.

***ප්‍රමුඛ පද:*** *ශ්‍රී ලාංකේය කලාව, බෞද්ධ කලාව, විහාර සිතුවම්, යක්ෂ රුව, යටත්විජිත සමය*

# උඩරට සිංහල මනාලියගේ වස්ත්‍රාභරණ කට්ටලය හා බැඳුණු සංස්කෘතික පසුබිම පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්


ආර්. එම්. එස්. ඒ රත්නායක

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

*shashikaashangi@gmail.com*



කිසියම් රටක ජනතාවට ආවේණික වූ ඇඳුම් පැළඳුම් යනු සංස්කෘතිය පිළිබිඹු කරන එක් සුවිශේෂී පැතිකඩකි. උඩරට සිංහල මනාලිය ලාංකේය අනන්‍යතාව පිළිබිඹු කෙරෙන ප්‍රබල සංස්කෘතික මානයක් වී ඇත්තේ ඇයටම ආවේණික වූ වස්ත්‍රාභරණ හේතුවෙනි. දහ අට වන සියවසයේ දී උඩරට කුලවත් කාන්තාවන්ගේ ඇඳුම් පැළඳුම් තුළින් ප්‍රභවය වූ උඩරට මනාලියගේ ඔසරි විලාසිතාවත්, විදේශීය ප්‍රභවයක් සහිත වූ ද මෙරට ජනතාවගේ වන්දනාමානයට පාත්‍රවන පත්තිනි මෑණියන්ගේ ආභරණ කට්ටලයට ආදේශකයක් ලෙස නිර්මාණය වූ ආභරණ කට්ටලයෙනුත් උඩරට මනාලියක් හැඩවෙයි. ලාංකේය උඩරට සිංහල මනාලියගේ වස්ත්‍රාභරණ කට්ටලය හා බැඳී පවතින සංස්කෘතික පසුබිම පිළිබඳ අධ්‍යයනය කිරීම මෙහි ප්‍රධානතම අරමුණයි. වත්මන් භාවිතය තුළ මෙම වස්ත්‍රාභරණ කට්ටලයේ මූලික සංස්කෘතික හර පද්ධතීන් යටපත් වී තිබේ ද? යන්න අධ්‍යයන ගැටලුව විය. හෙළ සංස්කෘතික උරුමයක ඓතිහාසික හා වත්මන් තත්ත්වය අධ්‍යයනය කරමින් සිදු කැරුණු මෙම පර්යේෂණය සඳහා පුස්තකාල අධ්‍යයනයත්, ක්ෂේත්‍ර අධ්‍යයනය මඟින් උඩරට මනාලියගේ වස්ත්‍රාභරණ පිළිබඳ ඓතිහාසික පසුබිමට අදාළ දත්ත ලබා ගන්නා ලදී. වත්මන් සමාජ ආකල්ප හා භාවිතාවන් අධ්‍යයනය සඳහා මහනුවර හා මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන් ඇසුරින් සම්මුඛ සාකච්ඡා සඳහා අවශ්‍ය දත්ත දායකයින් තෝරා ගැනිණි. උක්ත මූලාශ්‍රයන් හරහා ලබා ගන්නා ලද දත්ත ගුණාත්මක පර්යේෂණයක් ලෙස විශ්ලේෂණය කරන ලදී. උඩරට මනාලියගේ වස්ත්‍රාභරණ කට්ටලය ආගමික හා සමාජීය පසුබිමක් මත නිර්මාණය වූවකි. ඒ සඳහා කුල ස්තරායණය විශේෂයෙන් ම පදනම් වී තිබේ. මෙම වස්ත්‍රාභරණ කට්ටලය පැළැඳීම තුළ කාන්තාව පතිනියක ලෙස සමාජයේ ප්‍රශංසා ලබන බවත් සෑම ආභරණ අංගයක්ම ඔත්තේ සංඛ්‍යා මත නිර්මාණය වීම හා අර්ථයක් සහිතව පැළඳීම තුළ කාන්තාවට සුබපල ගෙන එන බවත් මනාව පැහැදිලි විය. එහෙත් උඩරට ප්‍රදේශයේ සිංහල කුලවත් කාන්තාවන් පමණක් තම විවාහයේ දී පැළැඳි මෙම ඇඳුම් කට්ටලය දේශීය විදේශීය භේදයකින් තොරව නූතන විවාහ සම්ප්‍රදාය තුළ ජනප්‍රිය අංගයක් බවට පත්ව තිබේ. වර්තමානය වන විට මෙය ප්‍රදර්ශනාත්මක අංගයක් බවට පත්ව ඇති බවත්, වර්ණ භාවිතය, මෝස්තර භාවිතය අතීතයේදී අර්ථාන්විතව සිදුවන නමුත්, වර්තමානයේ දී මෙම ආභරණ විසිතුරු බව පදනම්ව නිර්මාණය වී ඇති බවත්, චාරිත්‍ර වාරිත්‍ර පිළිබඳව වත්මන් තරුණ පරපුර නොදැනුවත් හා නොවැදගත් ලෙස සලකන බව අධ්‍යයනයෙන් පැහැදිලි විය. තාක්ෂණයේ දියුණුවත් සමඟ සමාජ තත්ත්වය වෙනස්වීමෙන් පුද්ගල ආකල්ප වෙනස් වීම උඩරට මනාලියගේ වස්ත්‍රාභරණ භාවිතයට ද බලපා තිබේ. ආගමික සහ සමාජීය පසුබිමක් මත සම්භවය ලද උඩරට මනාලියගේ වස්ත්‍රාභරණ කට්ටලය වර්තමානය වන විට හෙළ සංස්කෘතික උරුවෙන් බැහැරව වාණිජත්වය මත පදනම්ව ව්‍යාපාරයක් ලෙස සමාජය තුළ ඉස්මතුව පවතින බව අධ්‍යයනයෙන් අනාවරණය විය.



***ප්‍රමුඛ පදඃ*** *පත්තිනි දෙවියන්, ස්තරායනය, ඔසරිය, හෙළ කලා*

# Cultural Memory and Identity: Folk Life Associated with the Rush and Reed Industry in Sri Lanka

W. M. D. A. L. B. Tilakaratna[1], I. S. Weerakkody[2], G. A. C Sri Palitha[3]

[1]University of Colombo, Sri Lanka, [2]University of the Visual and Performing Arts, Sri Lanka, [3]University of Kelaniya, Sri Lanka

*dasithasela@hotmail.com*

Among the rural industries in Sri Lanka, the rush and reed industry occupies a rather significant place due to the prominence it gives to making equipment and items related to village life, such as watti, petti, paduru (mats), gamanmalu (bags), hambili (small purses), paha (strainer) etc. The raw materials used to make these items are plant products such as potta, una, bata, wewal, kiriwal, kithul raen; rush and reed types such as hana, niyanda, thunhiriya, gallaha, borupan, wetakeyya, dunukeyya, elupan, hambu and the leaves of plants such as indi, pol, thal, thala. Here the rush and reed industry based on aquatic reed plants and Wetakeyya is taken into focus. The aim of the research is to study the folk life associated with this industry. This is a qualitative research and with purposive sampling, the research area was focused on the Bentara, Dombagawatta village in the Gonagalapura area in the Galle district. Four formal and nine informal interviews, participation observations, listening to folksongs and literary sources were the main data collection techniques used. Reeds, which are naturally found as a plant are subjected to a delicate and eco-friendly process to arrive at the end product. The said process is divided into three main parts; cutting and collecting reeds, drying the reeds in the sun at a time that dew is present in the atmosphere and applying colors to the reeds using plant based colors. The patterns used to decorate the reed products in the present are those which have been carried out for generations. Traditional methods and knowledge, as well as modern methods can be identified in these process. This industry faces difficulties such as the lack of raw materials, skilled labour and a proper market for the products. By giving proper recognition to those participating in this industry, the eco-friendly nature of the industry and getting aid from the Government will help in sustaining this traditional industry.

***Keywords:*** *Rush and Reed industry, Folklife, Folksongs, Padura, Eco-friendly products*

.

# පුරාණ මැටි බඳුන් නිර්මාණයේ හැඩය සහ භාවිතය අතර සම්බන්ධය පිළිබඳ අධ්‍යයනයක්

කේ. එල්. ඒ. කොතලාවල

ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානතාව, සාධාරණත්වය පිළිබඳ කේන්ද්‍රය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

*lochiapeksha6630@gmail.com*

නියොලිතික යුගයේ දී මිනිසා ලැබූ විශිෂ්ට ජයග්‍රහනයන් අතර මැටි බඳුන් නිර්මාණයට යොමුවීම සුවිශේෂ වේ. පුරාණ සභ්‍යත්වයන්හි සමාජ, සංස්කෘතික පරිසරය අධ්‍යයනයට ද මැටි බඳුන් බෙහෙවින් උපකාරී වේ. ලංකාවේ පුරාණ ආරාමික සංකීර්ණ, රාජකීය පරිශ්‍රය, වරාය, මෙගලිතික සුසාන ආදී ස්ථානවල සිදුකරන ලද පුරාවිද්‍යා කැණීම්වලින් මැටි බඳුන් සාධක විශාල වශයෙන් හමුව ඇත. එම මැටි බඳුන් සාධක විද්‍යාත්මකව විශ්ලේෂණය කිරීමේ දී විවිධ හැඩයන් හඳුනාගත හැකිය. විවිධ හැඩයෙන් යුත් මැටි බඳුන් පුරාණයේ දී එලෙස නිර්මාණය වීම සඳහා උපයෝගීතා සංකල්පය කෙතරම් දුරට බලපෑවේ ද යන්න අධ්‍යයනය මෙම පර්යේෂණ පත්‍රිකාවේ අරමුණ වේ. ක්ෂේත්‍ර අධ්‍යයනය ප්‍රධාන පර්යේෂණ ක්‍රමවේදය වූ අතර එහිදී කෞතුගාකාරවල (කොළඹ ජාතික කෞතුකාගාරය, අභයගිරිය කෞතුකාගාරය, ජේතවන කෞතුකාගාරයන්හි) ප්‍රදර්ශනයට තබා ඇති හා ගබඩාවල තැන්පත් කොට ඇති මැටි බඳුන් ප්‍රධාන වශයෙන් අධ්‍යයනයට යොදා ගනු ලැබීය. තවද මෙම ක්ෂේත්‍රය පිළිබඳ අධ්‍යයනය කළ ප්‍රාමාණික උගතුන් සමඟ පැවැත් වූ සම්මුඛ සාකච්ඡා තුළින් ද දත්ත ඒකරාශී කරන ලදී. මැටි බඳුනක හැඩය අධ්‍යයනයේ දී මූලික අංග තුනක් හඳුනාගත හැකිය. එනම් විවරය, ශරීරය හා පත්ලයි. මීට අමතරව අඬු, කෙමි, අඩි, ගෙල ආදී ලෙස ද්විතීයික අංග ද හැඩය හා සම්බන්ධව පවතී. මීට අමතරව මැටි බඳුන්වල හැඩය අධ්‍යයනයේ දී ජ්‍යාමිතික හැඩ පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් හෝ සුළු වශයෙන් හෝ ඇතැම්විට ජ්‍යාමිතික හැඩ කිහිපයක් සංයුක්තව හෝ නිර්මාණය වී ඇති බව ද නිරීක්ෂණය වේ. පුරාණ සමාජයේ දී මැටි බඳුන් විවිධ කාර්යයන් සඳහා භාවිත කොට ඇත. ආහාර පිසීම, පරිභෝජනය, ගබඩාකරණය, ප්‍රවාහනය, ආගමික හා අභිචාරමය ආදි අවශ්‍යතා ඒ අතර ප්‍රධාන වේ. මෙහිදී එකී අවශ්‍යතා සහ බඳුනේ හැඩය අතර සමීප සම්බන්ධතාවක් හඳුනාගත හැකිය. නිදර්ශන වශයෙන් ආහාර සැකසීම ගතහොත් මෙහිදී ඉවීම, තැම්බීම, බැදීම යන අවශ්‍යතාවන් සපුරා ගැනීම අරමුණ වී ඇත. එහිදී ආහාර පිසීමේ කාර්යය ඉක්මන් කර ගැනීමටත්, ඒකාකාරි පිසගැනීමක් සඳහාත් තාපය හොඳින් අවශෝෂණය වන පරිදි පත්ල පැතලි ස්වභාවයෙන් නිමවා තිබේ. ආහාර පිසින මුට්ටිවල උණුසුම රඳවාගත හැකි අයුරින් මුට්ටි ශරීරයට සාපේක්ෂව විවරය කුඩාවට නිර්මාණය දැකිය හැකිය. ගබඩාකිරීමේ දී ද්‍රව්‍යයේ ස්වභාවය (උණුසුම්, සිසිල්, ද්‍රව, ඝන, තෙත්, වියලි) ද සහ ඇතුළට හා පිටතට හුවමාරු වන වාර ගණන ද ගබඩාකර හෝ ඇසුරුම් කර තබන කාල පරාසය ද සැලකිල්ලට ලක් කොට ඇත. උණු ජලය පරිහරණය කිරීම සඳහා නිමවන ලද බඳුන්වල අඬු නිර්මාණය කිරීම සහ අඩි නිර්මාණය ද නිදර්ශන වශයෙන් පෙන්වා දිය හැකිය. තවද දියරමය පාන, ඖෂධ, බීර ගබඩාකර තබන බරණි වැනි බඳුන් දිගු ගෙලකින් හා කුඩා ප්‍රවේශයකින් යුතුව නිර්මාණය කර ඇත. ඉන් අපේක්ෂා කළේ ප්‍රවහනයේ දී සහ භාවිතයේ දී අපතේ යාම වළක්වා ගැනීමය. මෙකී ප්‍රස්තුතය තහවුරු කරන තවත් නිදර්ශනයක් වශයෙන් අවුරකපෝරාව ගත හැකිය. එහි පතුල කේතුකාකාරව නිර්මාණය කොට ඇත්තේ නෞකා මඟින් ප්‍රවහනය කරන විට ආධාරකයක් මත සිටුවා ගෙනයාමට හැකිවන ලෙසත්, ගොඩබිමකට ලඟා වූ විට මුහුදු වෙරළෙහි ගිල්වා තබා වෙළෙඳාම් කිරීමට පහසුවන ලෙසය. පූර්වෝක්ත සාධක අනුව පර්යේෂණයේ දී අධ්‍යයනය කරන ලද පාත්තර, බරණි, කළ, කොතල, කෝප්ප, ගුරුලේත්තු, අතල ආදී පුරාණ මැටි බඳුනවල් හැඩය සකස්කර ගැනීමේ දී ඒවායේ උපයෝගිතාව සමග අන්‍යෝන්‍ය සබඳතාවක් ඇති බව පෙන්වා දිය හැකිය.

**ප්‍රමුඛ පදඃ** *මැටි බඳුන්, හැඩය, භාවිතය, පැරණි සමාජය*

# FOLK DANCE & DRAMA

# A Sociological Investigation of 'Kovalankooththu', Tamil Folk Drama in Contemporary Tamil society

L. Kunaratnam[1], A. Linganathan[2]

[1]Department of Sociology, University of Colombo, [2]Department of Media Studies, University of Jaffna

*luxshekuna@gmail.com*

Folk performances are the most valuable and specific property for every culture. They give a special and unique identity to all. It reflects food culture, dress code, rituals, behaviors, cultural values, morals and tradition. Further, it expresses cultural identity by conveying shared community values and aesthetics. The NaadduKoothu of the Tamils of Sri Lanka has preserved the fundamental conception of drama as a dance, namely the representation a series of actions "through rhythmic motion". Kovalankooththu is a type of kooththu it is kind of folk drama. This study is based on Mullaitivu district's Kovalankooththu. The main objective of this study was to find out the problems faced by the kovalankooththu group and sub objective is to examine the socio-economic background of these artists. 10 case studies were conducted for this research. With the individuals who are practicing Kovalankooththu face social, economic, psychological and cultural problems. It has less important in the contemporary society now. People have moved from folk drama to electronic media. Kovalankooththu acts only in Vattappalai kannanki amman temple in its annual festival. Folk drama viewers suddenly decreased because of social media. Folk drama artist lost their opportunities. Most of them are elders that follow their folk drama tradition. Their younger generation doesn't like to involve the Kovalankooththu. They have individually, separate future plan for their occupation. They maintain kovalankooththu scripts and ready to teach the young generation but young are not interested. Kovalankooththu artists feel sad to see their identity slowly fading from the society. They earn money twice a year not every day. They spend more money for their costumes, makeup and instruments but earn less amount. It is not enough for their everyday life. They face migration, poverty, war conflict, stigmatization, discrimination, lack of human resources problems. It can be concluded that the Kovalankooththu is the traditional identity of the Tamil society. Senior citizens play the key role to practice this folk drama and try to transmit the tradition to next generation. Artists face many problems to act this kooththu. Society should give respect and socio-economic and cultural security to the Kovalankooththu artists. Organizing awareness programme in street, school and national level can be done for the protection of this folk drama for the future can be combined kooththu with media to give the priority to naaddukooththu to reintroduce to the society will strongly support their existence.

***Key words:*** *Kovalankooththu, folk drama, Tamil society, problems, awareness*

# ශ්‍රී ලාංකේය සංචාරක කර්මාන්ත ප්‍රවර්ධන විභවයක් ලෙස ජන නාට්‍ය කලාව (චීනය සහ ශ්‍රී ලංකාව ආශ්‍රිත අධ්‍යයනයකි)

මධුෂාණී විජේවීර ගුණරත්න[1], එච්. එම්. ආර්. පී. විජේරත්න[2]

[1]රුහුණ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව, [2]හාබින් විශ්වවිද්‍යාලය, චීනය

*rpwijerathna@gmail.com*

මානව පරිණාමය තරමට ම දීර්ඝ ඉතිහාසයක් හිමි, ලොව පළමු ප්‍රාසංගික කලාව යැයි සැලකෙන ජන නාට්‍ය කලාව මානව අනුභූතීන් චතුර්විධ අභිනයෙන් ප්‍රේක්ෂකයා වෙත සම්ප්‍රේෂණය කරන්නා වූ කලා මාධ්‍යයකි. 19 වන සියවස දක්වා දිවයිනේ උඩරට, පහතරට සහ උතුරු ප්‍රදේශවල ජනප්‍රිය කලාංගයක් ලෙස ප්‍රචලිත ව පැවති ජන නාට්‍ය සම්ප්‍රදාය වර්තමානයේ දී හුදු අධ්‍යයන විෂයකට පමණක් සීමා වී පවතින ආකාරයක් ප්‍රතීයමාන වෙයි. සොකරි, කෝලම්, රූකඩ, නාඩගම්, කුත්තු වැනි ජනනාට්‍ය වර්තමානය වන විට බෙහෙවින් අභාවිත වුවද දුර්ලභ වශයෙන් මිරිස්ස උඩුපිළ, රිදීමාලියද්ද, අම්බලන්ගොඩ හා උඩරට ඇතැම් ප්‍රදේශවල හා අනුරාධපුර, කුරුණෑගල වැනි ප්‍රත්‍යන්තයන්හි තවමත් ග්‍රාමීය මට්ටමින් ජන නාට්‍ය රඟ දැක්වෙයි. ලාංකේය ජන නාට්‍ය එහි කලාත්මක සහ රසවින්දනාත්මක අගය තුළින් සංචාරක ආකර්ෂණ මාධ්‍යයක් ලෙස භාවිත කිරීමේ විභවතාවක් පවත්නා බව පෙනෙයි. ජන නාට්‍ය සම්ප්‍රදාය ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරයේ වර්ධනය අරබයා භාවිත කරගන්නේ කෙසේද යන්න අධ්‍යයනය කිරීම මෙහි අරමුණ යි. දත්ත සම්පාදනයේ දී සම්මුඛ සාකච්ඡා, නිරීක්ෂණ හා ද්විතීයික දත්ත මූලාශ්‍රය භාවිත කරන ලදි. චීන ජන නාට්‍ය කලාව චීනයේ සංචාරක ව්‍යාපාරයෙහි ප්‍රබල සංචාරක ආකර්ෂණයකි. චීනයේ ෂැන්හයි, සිචුවාන්, හාර්බින් ආදී ප්‍රධාන නගර ආශ්‍රිත ව ජන නාට්‍ය රංග ශාලා සංචාරක කලාප ආශ්‍රිත ව පිහිටුවා ඇති අතර වාර්ෂික ව දහස් සංඛ්‍යාත විදේශීය සංචාරකයෝ මේවා නැරඹීමේ අදිටනින් ම චීනයට පැමිණෙති. ස්වකීය ඉතිහාසගත කතා, ජනප්‍රවාද, සටන් කලාව ආශ්‍රිත කතා වස්තූන් එම නෘත්‍ය ශාලාවලදී සංචාරකයින්ට විවර කරයි. සොකරි, කෝලම්, රූකඩ, නාඩගම්, කුත්තු, ජහුටා වැනි ලාංකේය ජන නාට්‍ය, සංචාරක කලාප ආශ්‍රිත ව රඟ දැක්වීමට අවස්ථා සම්පාදනය කරමින් සංචාරක හෝටල් ක්ෂේත්‍රයට මෙම ජන නාට්‍ය හඳුන්වා දීමෙන් නව රැකියා අවස්ථා ඇතිවීමත්, සංචාරක කර්මාන්තය ප්‍රවර්ධන වීම හා ලාංකේය ජන නාට්‍ය කලාව ජීවමාන ලෙස සංරක්ෂණය වීමත් සිදුවෙයි. පුද්ගලික ව්‍යවසායකයින් දිරිමත් කොට සංචාරක කලාප ආශ්‍රිත ව කුඩා රංග ශාලා (Mini Theater) සහ ජංගම නෘත්‍යාගාර (Mobile Theater) ආරම්භ කිරීමත්, සංචාරක හෝටල්වල කුඩා නෘත්‍යාගාර පිහිටුවීමත් මගින් සංචාරකයින්ට නාට්‍ය නැරඹීමේ අවස්ථා උදා කර දිය හැකි ය. සංස්කෘතික සංචරණයෙහි ලැදි සංචාරකයින් අප රටට අද්දවා ගැනීමේ උපක්‍රමයක් ලෙස මෙය ක්‍රමයෙන් දියුණු කළ යුතු ය. එසේ ම පාරම්පරික නාට්‍ය ශිල්පීන් යොදාගෙන ජන නාට්‍ය කණ්ඩායම් පුහුණු කිරීමත්, ඔවුන්ගේ සේවය සංචාරක කර්මාන්තයට යොදා ගැනීමත් කළ යුතු ය. චීනය ස්වකීය ජන නාට්‍ය කලාව සංචාරක ආකර්ෂණීය මාධ්‍යයක් ලෙස මෙහෙයවමින් සංචාරක ව්‍යාපාරය දියුණු කොට ඇත්තා සේ ම සංචාරක ව්‍යාපාරයේ අභිවෘද්ධිය සඳහා ජන නාට්‍ය කලාව යොදාගැනීමෙන් ශ්‍රී ලාංකේය ආර්ථිකයට විශාල දායකත්වයක් ලබාගැනීමට හැකි විභවතාවක් අප රට තුළ පවතින බව මෙම අධ්‍යයනයෙන් අනාවරණය වෙයි.

***ප්‍රමුඛ පද:*** *ජන නාට්‍ය, චීනය, සංචාරක ව්‍යාපාරය, ශ්‍රී ලංකාව, සංස්කෘතික සංචරණය*

# ශ්‍රී ලංකාවේ වෙරළබඩ කළාපය ආශ්‍රිත අස්පර්ශිත සංස්කෘතික උරුමයෙහි ලා යුරෝපා ජාතීන්ගේ බලපෑම (මීගමුව, දූව ප්‍රදේශයට අනන්‍ය වූ පාස්කු නාට්‍ය ඇසුරෙන්)

පී. ජේ. ඩබ්. එන් නෝනිස්, ඊ. එම්. එන්. එදිරිනායක

පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ

*janeenanonis2@gmail.com*

ඓතිහාසික මූලාශ්‍රගත තොරතුරු අනුව ක්‍රි.පූ. 3 වන සියවසයේදී ලක්දිවට හඳුන්වාදුන් බුදුදහම සමස්ත ශ්‍රී ලාංකේය සංස්කෘතිය හැඩගැසීමෙහිලා පදනම් සාධකය ලෙස ක්‍රියාත්මක වූ අතර පසුකාලීනව එල්ලවූ ද්‍රවිඩ බලපෑමත් සමඟ හින්දු ආගමික ආභාසයද මෙරට සංස්කෘතිය වෙත යොමුවිය. 16 වන සියවසයේ සිට සිදුවූ පෘතුගීසී, ලන්දේසි හා ඉංග්‍රීසි යනාදී විදේශීය ජාතීන්ගේ ආක්‍රමණ හා සංක්‍රමණ සමඟ සමකාලීනව යුරෝපයේ පැවති සංස්කෘතික ලක්ෂණද ලංකා සංස්කෘතියට මුහුවිය. ක්‍රි.ව. 1505 දී ලක්දිවට ගොඩබට පෘතුගීසීන්ගේ මුඛ්‍ය අරමුණු තුළ රෝමානු කතෝලික ආගම ව්‍යාප්ත කිරීමද පැවති අතර ඒ සඳහා ප්‍රධාන ලෙස වෙරළබඩ කළාපය නතුවිය. ආගම පතළ කිරීමේ මූලස්ථාන ලෙස දේවස්ථාන ඉදිකෙරුණු අතර මිෂනාරි පූජකවරුන් මඟින් එම කළාපයේ ජනතාවට ආගම ඉගැන්වීම සිදුකෙරිණි. එහිදී ශුද්ධවූ බයිබලයේ අන්තර්ගත කතෝලික ධර්මයේ හරය ජනතාව කරා ගෙනයෑම සඳහා පෘතුගීසීන් විසින් විවිධ ක්‍රමෝපායන් යොදාගෙන ඇති අතර විවිධ බුද්ධි මට්ටම් සහිත පුද්ගලයන් සැමට එක සේ කතෝලික ආගම අවබෝධ කරවීමෙහිලා උපකාරීවූ සුවිශේෂී අස්පර්ශිත සංස්කෘතික අංගයක් ලෙස පාස්කු නාට්‍ය කලාව හඳුන්වා දිය හැකිය. විදේශීය සම්භවයක් සහිත අස්පර්ශිත උරුමයක්වූ මෙය දේශීය සංස්කෘතික ලක්ෂණයන්ගෙන් පෝෂණය වෙමින් විශේෂ අනන්‍යතාවක් ගොඩනගාගෙන වර්තමානය දක්වා විකාශය වීමේ ස්වභාවය හඳුනාගැනීම මෙම පර්යේෂණය මඟින් අපේක්ෂා කෙරේ. මෙහිදී ක්ෂේත්‍ර නොවන ගවේෂණ යටතේ පුස්තකාල අධ්‍යයන මඟින්ද ක්ෂේත්‍ර ගවේෂණ යටතේ සහභාගීත්ව හා ස්ථානීය නිරීක්ෂණය, සම්මුඛ සාකච්ඡා මඟින්ද තොරතුරු රැස්කරන ලදි. පාස්කු නාට්‍ය යනු ක්‍රිස්තු ධර්මයේ ශාස්තෘවරයාණන්වූ ජේසුතුමන්ගේ දුක්ප්‍රාප්තිය නිරූපණය කරන ආගමික නාට්‍ය කලාවකි. එය යාච්ඤා භක්ති අභ්‍යාස ශාන්ති ක්‍රමයට අයත්වේ. මධ්‍යකාලීන යුරෝපා නාට්‍යමය ලක්ෂණ සහිතව උපත ලබන පාස්කු නාට්‍ය ශ්‍රී ලාංකේය සංස්කෘතියට අනුගතවීමේදී දකුණු ඉන්දීය නාඩගම් සම්ප්‍රදායේ ආභාසය ලැබීම සුවිශේෂී ලක්ෂණයකි. මුල්කාලීනව දැව සුරුවම් භාවිතකරමින් රූකඩ ආකාරයෙන් මෙම නාට්‍ය ඉදිරිපත්කිරීම දේශීය ජනතාවගේ ආකාර්ෂණය දිනා ගැනීමට පාදකවූ අතර බ්‍රිතාන්‍යය සමය වන විට සිංහල මෙන්ම ද්‍රවිඩ භාෂාවෙන්ද පාස්කු නාට්‍ය රඟදැක්වීම තුළින් එය ලංකා වෙරළබඩ කළාපයේ ශීඝ්‍රයෙන් ප්‍රචලිත විය. කාලයත් සමඟ මෙහි රංගභූමි සැකසීමේදී ක්‍රමක්‍රමයෙන් දේශීයකරණයට ලක්වෙමින් පොල්අතු, මැටි, දූව ආදිය යොදාගැනීමද සුවිශේෂීවේ. මෙලෙස පාස්කු නාට්‍ය විවිධ සංස්කරණයන්ට ලක්වෙමින් ජීවමාන ලක්ෂණ සහිතව වර්තමානය දක්වා පැවත එන අතර එය ශ්‍රී ලංකාවේ වෙරළබඩ කළාපය ආශ්‍රිත ජන ජීවිතයට විශාල බලපෑමක් එල්ල කර ඇති ආකාරය හඳුනාගතහැකිය.

***ප්‍රමුඛ පදඃ*** *පාස්කු නාට්‍ය, රෝමානු කතෝලික, මීගමුව*

# සිංහල ජනනාටකයෙන් පිළිබිඹු වන සමාජ ස්තරායණය (සිංහල කෝලම් නාටක ඇසුරෙන්)

ඩී. ඩී. එච්. එන්. රාජපක්ෂ, සේපාල සමරසේකර

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

*harshaninayanarajapaksha82004@gmail.com*

පහතරට ශාන්තිකර්මයක් ලෙස සළකන කෝලම් නාටකය සාම්ප්‍රදායික ජනයා ගර්හ ශාන්තිකර්මයක් ලෙසත් විවේකය විනෝදයෙන් ගතකිරීමටත් යොදාගත්හ. එමෙන් ම මේ හරහා සමාජ ඒකාබද්ධතාවක් ගොඩනැගීම හා සමාජ විෂමතාව සමාජය ඉදිරියේ ඉදිරිපත් කිරීම ද සිදු විය. මෙම අධ්‍යයනයේ මුඛ්‍ය අරමුණ වන්නේ සාම්ප්‍රදායික සමාජය හාස්‍ය හා උපහාසය යොදාගනිමින් සමාජ ස්තරායණයේ පරස්පරතා සමාජයට පෙන්වා දීමට ගැමි නාටකය යොදාගත් ආකාරය විග්‍රහ කිරීමයි. මේ අධ්‍යයනය සඳහා දිවයිනේ පහතරට ශාන්තිකර්මවල යෙදෙන ආචාර්යවරුන් දසදෙනෙක් සමඟ සම්මුඛ සාකච්ඡාවේ යෙදීම හා නිරීක්ෂණ මඟින් දත්ත රැස් කරන ලදී. එසේ ලබාගත් තොරතුරු අනුව පෙන්වා දිය හැක්කේ වැඩවසම් සමාජයේ ඉහළ පාන්තිකයින්  විසින් පහළ පාන්තිකයින් පීඩනයට ලක් කිරීම උපහාසාත්මක හාස්‍යයකින් යුතුව පීඩක පන්තිය ඉදිරියේ ගෙනහැරපාන බවයි. ඒ සඳහා තත්කාලීන සමාජයේ සමාජපාලක චරිත කෝලම්වලට ආදේශ කිරීම, ඔවුන්ගේ දුර්ගුණ හා බලය අයුතු ලෙස භාවිතය උපහාසයට ලක් කරයි. උදාහරණ ලෙස හේවා හා ආරච්චි යන කෝලම් දැක්විය හැකිය. වැඩවසම් සමාජයේ තමාට පැවරුණු කාර්යයන් අනිවාර්යයෙන් ම ඉටු කළ යුතු අතර වයස, රෝගවලට සහනයක් නොමැත.අණබෙර කෝලම ඊට නිදසුනකි. පාලක පන්තිය පිළිබඳ ගැමියා සතු බිය හා අකැමැත්ත නිරූපණයට එකී චරිතවල වෙස්මුහුණු අප්‍රසන්න අයුරින් සකස් කර ඇත. හේවා කෝලම ඊට නිසුනකි. කඩු පහරවලින් තුවාල වූ මුහුණේ කූඩැල්ලන්ද එල්ලී පැවතීම විශේෂයකි. ඉහළ පන්තියේ නොහික්මුණු ක්‍රියා උපහාසාත්මක ව හෙළාදැකීමට විවිධ චරිත යොදා ගනී. මුදලි කෝලම ජසයාගේ බිරිඳට ඉඟිබිඟිපෑම හා ආරච්චි කෝලමේ සහයකයා වන ලියනප්පු බීමතින් ගණන් සටහන් කිරීම උදාහරණ වේ. දෙබස් භාවිතයෙන් ද ඉහළපාන්තිකයින්ගේ බටහිරගැතිබව, පුහු මාන්නය ආදි ලක්ෂණ ප්‍රහසනයට ලක් කර ඇත. කාරිය කරවනරාළ පොලිස් කෝලම අතර වන සංවාදය ඊට නිදසුනකි. කාරියකරවන රාළ - මොකද රාළහාමිලා කලබලේ? පළමුවන පොලිස් කෝලම - ඒයි,තමුසෙ දන්නෑ අපේ සැර. දෙවන පොලිස් කෝලම - වට් ආ යූ ඩුයිං? කොට්ටාවට පයිං.තෙවන පොලිස් කෝලම කටිං බෑග් පොලිතින් බෑග්. උක්ත සියලු කරුණු අනුව සිංහල ගැමි නාටක හුදු විනෝදාස්වාදය සඳහා හෝ ශාන්තික්මයක් ලෙස පමණක් නොව තත්කාලීන සමාජ ස්තරායණය තුළ පාලක හා පාලිත ගැටුම උපහාසාත්මකව නිරූපණය කර ඇති බව පෙන්වා දිය හැකි ය.මේ අනුව පාලකයාට පාලිතයන් තමා කෙරෙහි දරණ අදහස අවබෝධ කර ගනිමින් තම අඩුලුහුඬුකම් මගහරවාගැනීමට අවස්ථාවක් ලබාදීමක් ලෙසත් පෙන්වා දිය හැකි ය. එමඟින් ගැමියා තමා පාලකයන් කෙරෙහි ඇති අප්‍රසාදය හාස්‍යයෙන් යුතුව පාලකයින් ඉදිරියේ ම මවාපෑම මඟින් ඔවුන්ගේ මනස ද සුවපත් වේ. මෙය වර්තමානයේ දකුණු පළාතේ ප්‍රදේශ සීමිත ප්‍රමාණයක පමණක් සිදු කරන අතර මෙමඟින් නිසර්ගයෙන් ම වත්මන් සමාජයේ පවතින දේශපාලන තත්ත්වය හා සමාජ ස්තරායණයත් හාස්‍යයට ලක් වන බව කිවමනා ය.

***මුඛ්‍ය පදඃ*** *කෝලම්, ඉහළ පාන්තිකයින්, පහළ පාන්තිකයින්*

# ගැමි නැටුම් හා ගැමි නාටක තුළ අන්තර්ගත ගැමි ජනතාවගේ ජීවන තොරතුරු පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

ඩබ්. එච්. එස්. එච්. කරුණාතිලක

සිංහල අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය

*sithara777sn@gmail.com*

ප්‍රාථමික ගැමි සමාජය තුළින් ප්‍රභවය ලබා ප්‍රවර්ධනය වූ ගැමි නැටුම් හා ගැමි නාටක කලාව තුළ නිතැතින්ම ගැමි ජනතාවගේ ජීවන තොරතුරු නිරූපණය වී තිබේ. ලෝකයේ සෑම ජනකොටසකට ම පාහේ ඔවුනට ආවේණික වූ විවිධ ගැමි නැටුම් හා ගැමි නාටක ප්‍රචලිතව පවතින බවත් ඒ ඒ ජාතීන්ගේ ආගමික හා සංස්කෘතික සාධක මෙන්ම විවිධ වෘත්තීමය ක්‍රියාවලීන් ද, සමාජ අවශ්‍යතා, ජීවන තොරතුරු හා නොයෙකුත් විශ්වාසයන් මේ සඳහා පාදක වී ඇත. දේශීය ගැමි නැටුම් ප්‍රධාන වශයෙන් විනෝදාස්වාදය හා වෘත්තීන් මත පදනම් ව බිහි වී ඇත. වර්තමාන සමාජයෙන් කෙමෙන් ගිලිහී යන ගැමි නැටුම් හා ගැමි නාටකවල සැබෑ ස්වරූපය ඉස්මතු කරමින් එම කලාංග හරහා මානව ජීවිතය නිරූපණය වූ ආකාරය පිළිබඳ අධ්‍යයනය කිරීම ප්‍රධාන අරමුණ වූ අතර ඒ සඳහා ගැමි නැටුම් හා ගැමි නාටක පිළිබඳ රචනා වූ කෘති ලිපි සංග්‍රහ තුළින් සාහිත්‍ය මූලාශ්‍රය මූලික කරගත් සම්මුඛ සාකච්ඡා ක්‍රමවේදය භාවිත කෙරුණි. එයට තෝරාගත් පුද්ගලයන් දෙදෙනෙකු සමග සම්මුඛ සාකච්ඡා පවත්වන ලදී. කළගෙඩි, කුලු, පන්, ලීකෙළි, පතුරු, චාමර, රබන්, මෝල්ගස්, ගොයම් ආදී ගැමි නැටුම් තුළ අන්තර්ගත ගැමි ජනතාවගේ ජීවන තොරතුරු ලෙස ගැමි ජනතාවගේ ආගමික විශ්වාසයන්, ජීවන වෘත්තීන් පිළිබඳ, ජීවන රටාව සහ සමාජ සම්බන්ධතා, සාමූහික සහභාගිත්වය හා සරල බව, විනෝදාස්වාදයන්, අව්‍යාජ බව, සහයෝගය, සහජීවනය, එකමුතුකම හා සුහදත්වය, සිරිත් විරිත් හා සමාජීය තොරතුරු ආදිය ගැමි නැටුම් තුළින් නිරූපණය වේ. එමෙන්ම සෑම ගැමි නැටුමක් දෙසම විමර්ශනාත්මකව බැලීමේ දී එය සරල තාල පද්ධතියක් මත ගොඩනැගී තිබීමත් සරල මාත්‍රා යොදා ගැනීමෙන් නිර්මාණය වී තිබීමෙන් ද ගැමි ජනයාගේ සරල ජීවන රටාව නිරූපණය වේ. එපමණක් නොව ඒ සඳහා උපයෝගී කරගෙන ඇති ගායනා, ඇඳුම් පැළඳුම් හා රංගභාණ්ඩ තුළින් ද එ බව පසක් වේ. දේශිය ගැමි නාටක අතර ප්‍රධාන තැනක් ගන්නා ගැමි නාටක ලෙස කෝළම් හා සොකරි නාටක හැඳින්විය හැකිය. මෙම නාටක දෙවර්ගයේ ම නිතැතින්ම ගැමි ජීවන තොරතුරු මනා සේ ගැබ් වී ඇති බව පෙනේ. ගැමි නාටක පැවැත්වීමේ අරමුණු ලෙස සශ්‍රීකත්වය, ලෙඩ රෝග නිවාරණය කර ගැනීම, විනෝදාස්වාදය ආදිය හැඳින්විය හැකිය. එම අරමුණු තුළින්ම පැහැදිලි වන්නේ ගැමි ජීවන තොරතුරුය.. ගැමි සමාජයේ සිටින බේබදු මිනිසුන්ගේ චරිත ස්වභාවයන් හා ජීවන තොරතුරු,සමාජයේ ඉහළ තනතුරු සහිත පුද්ගලයන් නූගත් මිනිසුන් රවටා මුදල් වංචා කිරීම තමාගේ වාසියට තීන්දු දීම, ඒ ඒ තරාතිරමේ සිටින පුද්ගල ජීවන තොරතුරු ගැමි නාටක තුළින් නිරූපණය කර තිබේ. ජසයා, ආරච්චි, නොංචි, ලෙන්චිනා, පුරංසිනා, වැනි කෝළම් නාටක චරිත ද සොකරි, ගුරුහාමි, පරයා, වෙදරාළ වැනි සොකරි නාටක චරිතයන්ගෙන් ද විවරණය කර ඇත්තේ ගැමි ජන දිවියේ සැබෑ තතුය. ගැමි නැටුම් හා ගැමි නාටක යන කලාංග ද්විත්වය තුළින් ම ගැමි ජන දිවිය මනා ලෙස විවරණය කර ඇත. එහි ඇතුළත් විවිධ අංග හා චරිත ජීවමාන සමාජයේ සුලභව දැකිය හැකිය. මෙම අධ්‍යයනයෙන් වර්තමාන ගැමි නැටුම් තුළින් ගැමි ජනතාවගේ සැබෑ ස්වරූපය ඉස්මතු නොවන බවත් වර්තමාන සමාජයේ සංකීර්ණත්වය පිළිබිඹු වන ආකාරයත් සාකච්ඡා කළ හැකිය. අතීත ගැමි සමාජයේ ස්වභාවයත් ගැමි ජන දිවියේ සෑම පැතිකඩක් ම ගැමි නැටුම් හා ගැමි නාටක තුළින් නිරූපණය කර තිබේ.

***ප්‍රමුඛ පද;*** *ගැමි, ජීවන, නාටක, නැටුම්, නිරූපණය*

# ඉතා රහසිගත අස්පර්ශනීය උරුමයක් වූ ආලත්ති පූජාවේ වර්තමාන තත්ත්වය පිළිබඳ අධ්‍යයනයක්

එස්. ඩී. වයි. ජයරත්න, වයි. ඩී. ජයතිලක, එන්. එල්. කේ. සඳුනිකා

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

*yeshani.jayarathna@gmail.com*

ශ්‍රී ලාංකේය ජන සමාජයේ ඉතා වටිනා වූ අස්පර්ශනීය උරුමයක් ලෙස එදා සිට අද දක්වා ඉතා රහසිගතව පැවත එන පූජාවක් ලෙස කතරගම මහා දේවාලයේ ආලත්ති පූජාව හඳුනා ගත හැකිය. වල්ලිඅම්මා කතරගම දෙවියන් විවාහ කරගන්නා අවස්ථාවේදී ඇයගේ ආවතේවයන් සඳහා පැමිණි මෙම ආලත්ති අම්මාවරුන් එදා පටන් අද දක්වා ඇය වෙනුවෙන් කතරගම දෙවියන් රටට ජාතියට හා රටවැසි ජනයාට සෙත් පතා දීර්ඝායුෂ පූජා පවත්වති. ආලත්ති අම්මාවරුන් 12ක් විසින් උදේ, සවස තේවාවන්හීදී පහන් දල්වීමෙන් ආලත්ති පූජාව පවත්වති. ආලත්ති අම්මලාගේ ඇඳුම නිසා ඔවුන් සෙසු තේවාවන් සිදු කරන පුද්ගලයන්ගෙන් කැපී පෙනේ. ආලත්ති අම්මලාගේ පපු පෙදෙස වැසෙනනේ කුඩා සලුවකිනි. ආලත්ති තනතුර සඳහා පත්වීම් ලැබෙන්නේ අම්මාගෙන් දියණියටය. එහෙමත් නැතිනම් ආලත්ති අම්මාගේ නැගණියට ඒ තනතුර යන්නේය. මස් මාංශ අනුභවයෙන් වැළකී කිළිකුණු වලින් වැළකී නා පේවී ඔවුහු දේවාලයට යති. මෙම නිළ රාජකාරිය ආලත්ති අම්මලා විසින් සිදුකරන අතර මාසයකට  දෙදෙනා බැගින්  බෙදී පූජාව සිදුකිරීමට කටයුතු කරති. මෙම ආලත්ති  අම්මාගේ පූජාව  අදටත් දැකිය හැක්කේ කතරගම පුද බිමේදී පමණි. ඉතාම රහසිගත හා පාරම්පරිකව පැවත එන මෙම පූජා වතාවත්වල වර්තමාන වටිනාකම් අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ විය. පරම්පරාගතව සම්ප්‍රේෂණය වන මෙම චාරිත්‍රය ඔවුහු තම සමාජයේ ප්‍රධාන සංස්කෘතික අංගයක් බවට පත්කරගෙන සිටිති. පූජාවේ පවත්නා යාතුකර්ම හා යාතිකාවන් ඉතා රහසිගතව පරම්පරාගතව පවත්වාගෙන යති. මෙලෙස ඉතාම රහසිගතව හා පිළිවෙලින් පැවතගෙන එන්නා වූ ආලත්ති පූජාව අද වන විට ක්‍රමයෙන් අභියෝගයට ලක් වෙමින් පවතී. එයට ප්‍රධාන හේතුව වන්නේ ආලත්ති අම්මාවරුන් සංඛ්‍යාව අද වන විට ක්‍රමයෙන් අඩු වෙමින් පැවතීමයි. වර්තමානය වන විට නූතන පරම්පරාව ක්‍රමයෙන් මෙම පූජාවන් සඳහා සහභාගීවීම අවම වී ඇති අතර ඔවුන් විසින් තමන්ගේ මෙම පරම්පරා චාරිත්‍රය ගැන කතා කිරීමට හෝ මැලි බවක් දක්වනු ලැබේ. තවදුරටත් ආලත්ති පූජාව පවත්වාගෙන යාමට නොහැකි මට්ටමේ ආර්ථික ගැටලු වලට මොවුහු මුහුණ දෙමින් සිටිති. අතීතයේ දේවාලයෙන් ලබාදුන් පඩුරු කොටස පවා අද වනවිට මොවුන්ට ලැබෙන්නේ කලාතුරකිනි. ආලත්ති අම්මාවරු අතීතයේ පටන් වැදි පරම්පරාවෙන් පැවතෙන්නෝ වූහ. නමුත් වර්තමානයේ ඔවුන් තමන්ගේ අනන්‍යතාව වසන් කිරීමට උත්සාහ ගන්නා බව පෙන්නුම් කෙරෙති. ඔවුන්ගේ ජන්ම පරම්පරාව හඳුනාගත නොහැකි ආකාරයට ඔවුහු අද වන විට වාසගම් වෙනස් කරගනිමින් සිටිති. මින් පෙනීයන්නේ ඉතා රහසිගත අස්පර්ශනීය උරුමයක් වූ ආලත්ති පූජාව වර්තමානය වන විට ක්‍රමයෙන් අභියෝගයට ලක්වී ඇති බවයි. මෙලෙස අභියෝගයට ලක් වීමෙන් ආලත්ති පූජාව ආරක්ෂා කර ගැනීමට ඔවුන්ට ලැබිය යුතු ලැබීම් නිසිකලට ලබා දීමට හා සමාජය තුළ ඔවුන්ගේ සමාජ තත්ත්වය තවදුරටත් ඉහළ නැංවීම දේවාල භාර නිලමේවරුන් වගබලා ගතයුතුය.

***ප්‍රමුඛ පද;*** *ජනශ්‍රැතිය, සංස්කෘතිය, මානව විද්‍යාව, යාතුකර්ම, අභිචාර*

# සිංහල නර්තන කලාව හා සබැඳි දොළහ දෙවි සංකල්පය

ඩබ්. බී. ඒ. විතාරණ

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

*wijayasri@sjp.ac.lk*

ශ්‍රී ලාංකේය සංස්කෘතියෙහි සිංහල නර්තන කලාවට හිමි වන්නේ සුවිශේෂ ස්ථානයකි. නර්තන කලාව සහ ඇදහිලි විශ්වාස හා බැඳි අභිචාරකර්මයන් අතර ඇත්තේ අවියෝජනය බැඳීමකි. සිංහල ශාන්තිකර්මවලට පදනම් වී ඇති ඇදහිලි විශ්වාස අතර දෙවියන් විෂයෙහි ගැනෙන සංකල්ප ඉතා වැදගත් වේ. ඒ අතුරින් දොළහ දෙවි සංකල්පය යනු විශේෂයෙන් පහතරට දෙවොල් මඩු ශාන්තිකර්මයෙහි පුද ලබන දේව සමූහයකි. දෙවොල් මඩුවේදී අවස්ථා කීපයකදී මෙම දොළහ දෙවියන් විෂයෙහි චාරිත්‍ර විධි හා නර්තන පෙළපාළි ඉදිරිපත් කෙරේ. තෙල්මේ නර්තනය හා දොළහ පෙළපාලිය නිදසුන් ලෙස් දැක්විය හැකි ය. දොළහ දෙවියන් යනු සිංහල දේව ධූරාවලියේ ප්‍රධාන දේව කොට්ඨාසවලට අයත් නොවන අවශේෂ දෙවිවරුන් දොළොස් දෙනෙකි. මෙම දෙවිවරුන්ගේ නාමාවලිය පිළිබඳ ප්‍රාදේශිය විවිධතා පවති. මෙම අධ්‍යයනයේ අරමුණ වන්නේ දොළහ දෙවි සංකල්පය සහ ඒ හා බැඳි ඇදහිලි විශ්වාස රටා පිළිබඳ අධ්‍යයනය කිරීම ය. එසේම මෙම දේව සමූහය හැඳින්වෙන නාමාවලි අතර ඇති ප්‍රාදේශීය විවිධතා හඳුනා ගනිමින් ඒ පිළිබඳ විමර්ශනාත්මක තොරතුරු ඉදිරිපත් කිරීම ද මෙහිදී සිදු වේ. මෙම අධ්‍යයනයට ගුණාත්මක පර්යේෂණ ප්‍රවේශය අනුගමනය කළ අතර, ලේඛන මූලාශ්‍රය, නිරීක්ෂණ, සම්මුඛ සාකච්ඡා සහ ප්‍රලේඛන මගින් දත්ත රැස් කෙරිණි. දත්ත විශ්ලේෂණය ප්‍රවර්ග සහ හර ප්‍රවර්ග අනුව සිදු කෙරිණ. පර්යේෂණ අනාවරණ අතර, දොළහ දෙවි සංකල්පය පිළිබඳ ශාස්ත්‍රීය තොරතුරු සොයා ගැනීමට හැකි විය. දොළහ දෙවියන් යනු පහතරට දෙවොල් මඩු ශාන්තිකර්මයෙහි පුද ලබන දේව සමූහයක් වුව ද ඔවුන්ගේ සම්භවය හා භාවිතය උඩරට ප්‍රදේශ ආශ්‍රිතව සිදුව ඇත. දොළහ දෙවියන් හැඳින්වෙන නාමාවලියෙන් එය අනාවරණ විය. මෙම දොළහ දෙවියන් පිරිසේ වැඩි දෙනෙකු උඩරට ප්‍රදේශවල ජනයා අතර හෝ කොහොඹා කංකාරිය, වලි යකුම ආදී ශාන්තිකර්මවල පුද ලබන දෙවිවරුන් ය.

***ප්‍රමුඛ පද:*** *දොළහ දෙවි, විශ්වාස, ශාන්තිකර්ම, දෙවොල් මඩු, පෙළපාළි*

# Ethnography of Kowil: a Ceremonial Dance Performed by Henanigala Vedda People

D. T. Ananda, C. A. D. Nahallage

Department of Anthropology, University of Sri Jayewardenepura
*tharakaananda@sjp.ac.lk*

Henanigala, which is situated in the Eastern Province, Ampara District is one of the current villages occupied by the descendants of indigenous people (IP) of the country: the Veddas. In 1982, IP lived in Dambana, Kotabakiniya and Kandeganwila were resettled in the Henanigala C Zone affected by the Mahaweli development project. One of the unique cultural traits included in their cultural system is ceremonial dances that are linked with their religious belief system. Hethma, Kirikoraha and Kowil are prominent. Kowil is among the unpopular cultural traits that belong to these remnant people which is primarily performed for the protection of the village and its people. This research was an ethnographical investigation of Kowil in which in-depth interviews were used as primary data collection method. Data analyzed using Content analysis method. Kowil is performed once a year in a selected place of the forest (The term kowil is used to refer fane). There are various types of Kowil such as Welan Pale Kowila, Seran Kowil and Dehigolla Kowila. However, offerings and incantations are done for the same Yakku that are offered in Hathma and Kiri Koraha. Before the Diya Kapeema (water cutting ceremony) in Mahiyangana procession, Kowil and Hathma rituals should be finished. If not protection of the village will be destroyed, and epidemics will entered the village. Before the selected day, exorcists and drummers are invited and all the men in the village go to the forest with necessary food and other requirements to perform Kowil. There are specific weapons for each of the Yakku and deities. Some of these weapons are symbolically drawn on a wooden spear and some that have iron heads are detained on wooden spears. After clearing the place and all arrangements are done oil lamp is light on a Yahana made of four props and covered with a red or white cloth. Exorcist invites deities and Yakku one after one chanting specific mantra dedicated for each of these deities and Na Yakku. There are specific weapon and incantation for each of Na Yakka and deity. For example, at first Manik Bandara deviyo is invited. While he is invited exorcist is holding the weapon of Manik Bandara deviyo. Then this deity enters to the exorcist's body and exorcist beginning to dance slowly and then speed increased bit by bit. This possession signifies the arrival of deity to the ceremonial ground through the body of the exorcist and attainment of his protection for the villagers from diseases and other crisis. Deities and Na Yakku offered in this Kowil are Manik Bandara, Kumara Yaka, Parakasa deity, Maralu Yaka, Kalubandara deity, Serangala Yaka, Mawaragala Yaka, Helamungala Yaka, and Kehelpotha Yaka. After dancing these Yakku and ditties, 14 Mahasen Yakku (Mahasen Demons) and 14 Yakku from Boo tree are invited. With the possession of these Yakku, exorcist becomes an oracle. Next Baththugala Yakku, Komali Yakku, Kadu Pahe Yakku, Kadawath Yakku, Indigolle Yakku, Bandara Yakku, Alle Yakku, Malwadam Yakku and remaining Na Yakku are danced one by one, chanting specific incantations until the dawn of the next day. At the end each Na Yakku dance, they are invited to leave exorcist's body and the village with the diseases and epidemics and other crisis. These ceremonial dances are no longer validated and performed affected by the mechanism of cultural change. Capturing this knowledge as much as we can and making documents, ethnographies etc., are the best methods to safeguard this invaluable indigenous heritage.

***Key Words:*** *Kowil, Vedda, Hennanigala, Ceremonial Dance*

# FOLK LANGUAGE

# රුහුණු ප්‍රාදේශීය භාෂා උච්චාරණාකෘතීන්හි අවකාශීය විෂමතාව පිළිබඳ සංස්කෘතික භූගෝල විද්‍යාත්මක අධ්‍යයනයක්


පී. එච්. එම්. ශ්‍රීමාලි, අර්. එන්. ගමාච්චිගේ

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

*madhushikasrimali1@gmail.com*



ඉන්දු යුරෝපියානු භාෂා පවුලෙහි ආදිකෘත ලක්ෂණ විද්‍යමාන කරන්නාවූ සිංහල භාෂාවෙහි උපත හා ව්‍යාප්තිය පිළිබඳ විග්‍රහ කරන්නාවූ වාග් විද්‍යාඥයින් පෙන්වන අන්දමට සිංහල භාෂාව වසර 3000ක් පමණ ඉපැරණි වේ. ශ්‍රී ලාංකේය ප්‍රධාන ව්‍යවහාරික භාෂාව ලෙස හඳුනාගන්නා සිංහල භාෂාව ප්‍රාදේශීය ව්‍යවහාරයේ දී (Regional Dialects) විෂම උච්චාරණාකෘතීන් අනුව සිදුවේ. මෙම අවකාශීය විෂම ලක්ෂණ පෙන්නුම් කරන්නාවූ භාෂා සංස්කෘතිය (Language Culture) දකුණු පළාත ආශ්‍රිතව දැඩි විවිධත්වයක් විද්‍යමාන කරනු ලබයි. මෙම විවිධත්වයෙහි වාග්විද්‍යාත්මක පැතිකඩ සංස්කෘතික භූගෝල විද්‍යාත්මකව අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ මූලික අරමුණයි. ඒ සඳහා භාෂා විසරණය (Language Diffusion) භාෂා හුදෙකලාබව (Language Isolation) හා භාෂා පරිණාමය (Language Evolution) යන සංකල්පයන් දකුණු පළාතෙහි භාෂාවෙහි විෂම ව්‍යාප්තිය කෙරෙහි සංස්කෘතිකමය වශයෙන් බලපා ඇති අන්දම මෙහිදී විශ්ලේෂණය කරයි. අධ්‍යයන ප්‍රදේශය ලෙස මාතර දිස්ත්‍රික්කය විශේෂායන විශ්ලේෂණයක් (Hotspot analysis) මගින් තෝරා ගන්නා ලද අතර හිම බෝල නියැදීම යටතේ ප්‍රාදේශීය ව්‍යවහාර හා උච්චාරණාකෘති සහිත කලාපයන් හඳුනා ගන්නා ලදි. පැහැදිලි විෂම උච්චාරණාකෘතීන් සහිත වයස 40ට වැඩි පුද්ගලයන් 44කගේ භාෂා ව්‍යවහාරය පටිගත කරන ලදි. භූගෝලීය තොරතුරු පද්ධතිය (GIS) සහ සංඛ්‍යාත විශ්ලේෂණ ක්‍රම උපයෝගීකොට ගෙන භාෂා සංස්කෘතික කලාපනය කිරිම හා ලක්ෂණ විශ්ලේෂණය කරන ලදි. මෙම පරීක්ෂණයේ මූලික දත්ත විශ්ලේෂණය තුළින් සංස්කෘතිකමය වශයෙන් භාෂාවෙහි විෂම ව්‍යාප්තියෙහි කලාපන සිතියමක් නිර්මාණය කරන ලද අතර එහිදී දෙණියාය, තලපලකන්ද, ඌරුබොක්ක, දම්පහල, අකුරැස්ස, හේනෙගම හා වැලිගම යන කලාපයන් හුදෙකලා භාෂා සංස්කෘතික කලාප ලෙසත් නාගරීකරණය හා විසරණය තුළින් භාෂාවේ උච්චාරණාකෘතීන් සංකේන්ද්‍රිත වාග් අනන්‍යතා කලාපවල සිට පර්යන්තයන් වෙත ක්‍රමිකව විසරණය වීමේ ලක්ෂණයක් පෙන්නුම් කරයි. එසේම සංස්කෘතික ඌරුව (Cultural Traits) හා සමාජ තත්ත්වය ඔස්සේ භාෂාමය උච්චාරණාකෘති කලාපනය වීමේ සම්භාවීතාවක් පෙන්නුම් කරනු ලබයි.



***ප්‍රමුඛ පදඃ*** *රුහුණු ප්‍රාදේශීය භාෂාව, උච්චාරණාකෘතිය, සංස්කෘතික භූගෝල විද්‍යාව*

# සක්කාරං සිංහල චිත්‍රපටයෙන් ඉස්මතු කෙරෙන බෙරවා කුලයේ සන්නිවේදන භාවිතයන්

ආර්. ජේ. සඳුනිකා රත්නායක

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

*udanisandunika12@gmail.com*

ජනසන්නිවේදන විෂය පථය තුළ අධ්‍යයනයට ලක්කෙරෙන ග්‍රාමීය සන්නිවේදන විධි ක්‍රම නම් වූ පෘථුල පරාසයට උප සමාජ සංදර්භ තුළ පවත්නා සන්නිවේදන විධික්‍රමයන් ද අදාළය. ලාංකේය උප සමාජ ප්‍රපංචයට අයත් වන බෙරවා කුලය, සාහිත්‍ය හා සන්නිවේදන නිර්මාණ සඳහා පාදක වී ඇති අවස්ථා දැකගත හැකිය. ධර්මසේන පතිරාජ සිනමාවට නැගූ සක්කාරං චිත්‍රපටය ද බෙරවා කුලය කේන්ද්‍ර කරගත්තකි. ඒ අනුව ධර්මසේන පතිරාජ විසින් අධ්‍යක්ෂණය කරන ලද සක්කාරං චිත්‍රපටයෙහි මූලික ප්‍රස්තුතය තුළ ඉස්මතු වන බෙරව කුලයේ සන්නිවේදන විධික්‍රම වාචික හා නිර්වාචික සන්නිවේදනයන් ඔස්සේ කෙසේ ප්‍රතිනිර්මාණය කර තිබෙන්නේ ද යන්න මෙම පර්යේෂණයේදී මතුවූ ගැටලුවයි. සක්කාරං චිත්‍රපටය තුළ බෙරව කුලයේ සන්නිවේදන විධික්‍රම වාචික හා නිර්වාචික සන්නිවේදයන් ඔස්සේ ප්‍රතිනිර්මාණය කර තිබේද යන්න අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ අරමුණ වේ. ධර්මසේන පතිරාජයන් විසින් අධ්‍යක්ෂණය කරන ලද සක්කාරං සිංහල චිත්‍රපටය මෙම අධ්‍යයනය සඳහා මූලික ප්‍රාථමික මූලාශ්‍රය ලෙස යොදාගැනුණි. මෙහිදී ද්විතීයික මූලාශ්‍රය වශයෙන් චම්මින්ද වෙලගෙදර විසින් රචනා කරන ලද සක්කාරං නවකතාව යොදා ගැනුණි. වර්ෂ 1820 න් පසු උඩරට පළාතේ ලග්ගල, පල්ලේගම හා මාලගම්මන යන ගම්මාන වල විසූ බෙරවා කුලයේ පිරිසක් වටා ගෙතෙන මෙම චිත්‍රපටය තුළින් බෙරව කුලයට සුවිශේෂ වූ නාම භාවිතය, ස්ථාන භාවිතය, භාණ්ඩ හා සේවා භාවිතය මෙන්ම වාචික-අවාචික භාෂා භාවිතය පිළිබඳ අධ්‍යයනය කිරීමත්, ඒවා මගින් සාර්ථක චිත්‍රපට ප්‍රතිනිර්මාණයක් සිදුවී තිබේදැයි අධ්‍යයනය කිරීමත් සිදුවිය. පතිරාජයන් බෙරවා කුලයට සුවිශේෂ වූ භාණ්ඩ, ඇඳුම් පැළඳුම්, රැකියා ආදියෙන් හා සෙසු සංස්කෘතික උප ලක්ෂණ ඔස්සේ ප්‍රබල නිර්වාචික සන්නිවේදනයක යෙදෙන අතර රතී සහ සුබේ යන චරිත මගින් සුබේගේ හා රතීගේ ආදරණීය කතාබහ වාචික සන්නිවේදනයෙන් ද, හැසිරීම් තුළින් ද ගොඩනංවා තිබේ. නර්තනය හා බෙරය, බෙරවා කුලයේ ප්‍රධාන සන්නිවේදනාංග වේ. යාතිකා ගායනයන්, මන්තර, ගුරුකම්, අඳ ගොවි සේවාව, සිරිත් විරිත් ආදි බෙරව කුලයේ උප සංස්කෘතික ලක්ෂණ හා කැටිවුණු ප්‍රබල සන්නිවේදනාංග එකී ප්‍රේම වෘත්තාන්තයට සජීවී බවක් එක් කර තිබේ. ඒ අනුව සක්කාරං චිත්‍රපටයෙහි මූලික ප්‍රස්තුතයෙන් ඉස්මතු වන බෙරව කුලයේ සන්නිවේදන විධික්‍රම වාචික හා නිර්වාචික සන්නිවේදන ඔස්සේ සාර්ථක ලෙසින් ප්‍රතිනිර්මාණය කර ඇති බව නිගමනය කළ හැකිය.

***ප්‍රමුඛ පදඃ*** *බෙරවා කුලය, සක්කාරං චිත්‍රපටය, සන්නිවේදනය, වාචික හා නිර්වාචික සන්නිවේදනය, කුලීන*

# Comparative Study of Sri Lankan and French Proverbs

C. Liyanage, I. Chandrasekere

Department of Languages, Cultural Studies & Performing Arts, University of Sri Jayawardenepura

*charitha.liyanage@sjp.ac.lk*

Proverbs as a form of verbal folklore genre, have been used to transmit wisdom, truth, morals & traditional views from generation to generation in every culture. Based on everyday experiences, they are not only melodic and witty, possessed with rich metaphors but also reflect the "patterns of thought" of a specific society. The Literature argues that the proverbs of a particular culture echo its values & traditions. However, human "thoughts" are universal & are reflections of a common human experience, not necessarily a culture's unique viewpoint. While it's obvious that there are analogous proverbs in different linguistic societies that have related cultural patterns, it would be interesting to analyze whether the same usage could be observed in distant cultures such as French & Sri Lankan, geographically and socio-culturally unrelated. This paper examines the cultural representations of the proverbs through a comparative analysis of French & Sri Lankan proverbs (ප්‍රස්තාව පිරුළු) in order to determine the proximity of "thought" in both societies. The ethno-linguistic theoretical frame work was used to determine the relationship of language & culture in respective societies. The metaphors used in Sinhala proverbs were mostly based on the village life in Sri Lanka & reflect the close rapport retained by the ancestors with the forest as a learning place. Fear, regret, courage & ambition were depicted through wild animals, food & religious rituals. In French context, metaphors were burrowed from their daily life such as domestic animals, food, drinks, seasons & clothes to express love, virtues & the relationship to money. However, there were some proverbs in both cultures conveying similar morals messages using different metaphors. While we observed a distinct dissimilarity of cultural representations, it was also noteworthy to highlight that some cultural metaphors are not on par with respective contemporary societies as they are no longer available in their immediate environment, therefore vanishing from the usage & should be considered as an endangered intangible linguistic heritage of human wisdom.

***Keywords:*** *Proverbs, Sinhalese proverbs, French proverbs, Cultural Metaphors*

# සිංහල උපදේශාත්මක කාව්‍ය කෙරෙහි දෙමළ උපදේශාත්මක සාහිත්‍ය බලපා තිබේද?

ඒ. ජී. රුවන් ප්‍රදීප් කුමාර

රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව

*agruwangamage@gmail.com*

සිංහල පද්‍ය සාහිත්‍යයට ස්වර්ණමය යුගයක් උදා කළ කෝට්ටේ යුගය (ක්‍රි.ව.1412-1580) බටහිර සංක්‍රමණ හා ආක්‍රමණික ක්‍රිස්තියානි ආගමික බලවේග හේතුවෙන් සිංහල බෞද්ධ සමාජය සෑම අංශයකින්ම පරිහානියට පත්වූ යුගයක් විය. සමාජ පරිහානියට පත් මිනිසුන් ගුණධර්ම, සාරධර්ම ආදියෙන් පරිපූර්ණ කිරීම සඳහා ඔවුන්ගේ චිත්ත චෛතසිකයන්ට ආමන්ත්‍රණය කළ හැකි සමීපතම ක්‍රමවේදය, උපදේශාත්මක පද්‍ය ලෙස හඳුනාගත් කවීහු, එය සමාජය වෙනස් කිරීමේ අරමුණින් යොදා ගත්හ. සීතාවක සමයේ (ක්‍රි.ව.1530-1592) අලගියවන්න මුකවැටිතුමා ද එමඟ යමින් සුභාෂිතය රචනා කළේ ය. පොදු ජනයා පාඨක පිරිස කර ගනිමින් රචිත කාව්‍යයක් ලෙස සලකන සුභාෂිතය, ජනශ්‍රැතිය හා ජීවාත්මක අදහස් ගරු කරමින් සමාජයේ තිබූ දුර්වලතා හඳුනාගෙන යහගුණ වර්ධනය කිරීම සඳහා උපදෙස් දීම අරමුණු කරගත් කෘතියකි. සුදන ගුණ, දුදන අගුණ, උඩඟු නොවීම කුසලයෙහි අගය යනාදී සදුපදේශයන් අන්තර්ගත මෙහි බොහෝ පද්‍යවල පළමු දෙපදයෙන් පැවසෙන කාරණය ඊළඟ පද දෙකේ දැක්වෙන උපමාවෙන් විස්තර කෙරේ. ලෝකෝපකාරය ද නීති ශාස්ත්‍ර ගණයේ ලා සැලකෙයි. ක්‍රි.ව. 1799 දී තොටගමු විහාරවාසී රනස්ගල්ලේ හිමියන් විසින් කරන ලදැයි සැලකෙන මෙහි අකුරු ඉගෙනීමේ අගය, මව්පිය අගය, සුරාපානයේ ආදීනව, සේවනය කළ යුත්තන් හා නොකළ යුත්තන් ආදී වශයෙන් සාර්ථක ජීවිතයකට උපදෙස් ලබා දෙයි. මෙම සාහිත්‍ය කෘතීන් නිර්මාණයේ දී (සුභාෂිතය ග්‍රන්ථාරම්භයෙහි දක්වා ඇති පරිදි "දෙමළ සකු මගද නො හසළ සතට දද") දෙමළ සාහිත්‍යයේ ද ආභාසය ලබා ගත් බවක් පෙනේ. මෙම පර්යේෂණයේ දී මෙවැනි සිංහල සහ දෙමළ උපදේශාත්මක කාව්‍යයන් කිහිපයක් ගෙන සංසන්දනාත්මක අධ්‍යයනයක් කිරීම අරමුණු කර ගන්නා අතර ග්‍රන්ථ සන්ධාර ක්‍රමවේදය භාවිත ය. දෙමළ උපදේශාත්මක සාහිත්‍ය කෘති අධ්‍යයනය කිරීමේ දී එම කෘතිවල දක්නට ලැබෙන උපදේශ හා බොහෝ විට උපමාරූපක ද ඒ අයුරින්ම සුභාෂිතයෙහි හා ලෝකෝපකාරයෙහි ද සනිදර්ශිත ය. 12වන සියවසේ දී රචිත **மூதுரை** (මූදුරෛ), **நல்வழி** (නල්වළි) යන කාව්‍යයන්හි ආභාසය සුභාෂිතය හා ලෝකෝපකාරය කෙරෙහි බලපා තිබේ. නිදසුනක් ලෙස සුභාෂිතය 44 වන පද්‍ය සහ ලෝකෝපකාරය 233 පද්‍ය, මූදුරෛ කෘතියෙහි පළමු පද්‍යයට සමාන ය. **நீதிவெண்பா** (නීදිවෙණ්බා) කාව්‍යයෙහි ආභාසය සුභාෂිතය කෙරෙහි ලැබී ඇති අතර **திருக்குறள்** (තිරුක්කුරළ්) කාව්‍යය ලෝකෝපකාරයට සදුපදේශ සපය යි. මෙසේ සිංහල සහ දෙමළ උපදේශාත්මක කාව්‍ය කෘතීන් අධ්‍යයනයේ දී දෙමළ උපදේශාත්මක කාව්‍ය මුල් කාලීනව රචනා වී ඇති බැවින් ද එහි ඇති උපදේශ හා උපමාරූපක ආදියෙහි ආභාසය සිංහල උපදේශාත්මක කාව්‍ය කෙරෙහි බලපා ඇති බැවින් ද සිංහල උපදේශාත්මක කාව්‍ය කෙරෙහි දෙමළ සාහිත්‍යය ද බලපා ඇති බව නිගමනය කළ හැකි ය යන්න මෙම පර්යේෂණ පත්‍රිකාව මගින් සාකච්ඡා කෙරේ.

***ප්‍රමුඛ පදඃ*** *උපදේශාත්මක කාව්‍ය, සුභාෂිතය, ලෝකෝපකාරය, දෙමළ උපදේශාත්මක කාව්‍ය*

# ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික මැණික් පතල් කර්මාන්තය ආශ්‍රිත බස් වහර පිළිබඳව අධ්‍යයනය කිරීම

එච්. එම්. අයි. ඊ. බණ්ඩාර

භූගෝල විද්‍යා දෙපාර්තමේන්තුව, පේරාදෙණිය විශ්වවිද්‍යාලය

*iebandara@gmail.com*

ශ්‍රී ලංකාවේ මැණික් පතල් කර්මාන්තය සහ මෙරට අගනා මැණික් ඛණිජ පිළිබඳව සියවස් ගණනාවක් අතීතයට දිවෙන උරුමයක් ඇත. රත්නපුර ප්‍රදේශය මැණික් සඳහා ඉහළම විභවතාව පෙන්වන අතර ඇලහැර සහ ඔක්කම්පිටිය ප්‍රදේශද ඒ සඳහා විභවතාව දක්වයි. සාම්ප්‍රදායික ක්‍රම හරහා මැණික් පතල් කැනීම ශ්‍රී ලංකාවේ බහුලවම සිදු කෙරෙන අතර ඒ හා බැඳුණු ආවේණික වචන මාලාවක්ද පවතී. මෙම අධ්‍යයනයේ මූලික අරමුණ වන්නේ එම බස් වහර මැණික් පතල් කැනීම් පිළිබඳ අධ්‍යයනයන්හිදී කෙතරම් වැදගත් වෙනවාද යන්න විමර්ශනය කිරීමයි. අධ්‍යයනය සඳහා මෙම කර්මාන්තයට ඉහළම විභවතාවක් පෙන්වන රත්නපුර දිස්ත්‍රික්කයේ පිහිටි කහවත්ත සහ පැල්මඩුල්ල අතර ප්‍රදේශයේ සාම්ප්‍රදායික ගැඹුරු පතල් කර්මාන්තයේ නියුතු කම්කරු ප්‍රජාවගෙන් සම්මුඛ සාකච්ඡා හරහා තොරතුරු ලබාගත් අතර ඒ සඳහා පතල් තිහක කම්කරුවන් සහභාගි කරගන්නා ලදී. තොරතුරු ලබාගැනීමේදී පතල් කැනීම සඳහා ප්‍රවේශ වීම සහ කැනීමේදී භාවිත වන වචන මාලාව පිළිබඳව අවධානය යොමු කරන ලදී. මෙහිදී පසක් වූ ප්‍රධානතම කරුණක් වූයේ පතල් කර්මාන්තය වැඩි වශයෙන් රඳා පවතින්නේ පාරම්පරික දැනුම සහ අත්දැකීම් මත බවයි. පතල් කම්කරුවන් සියල්ලෝම මැණික් සහිත දියලු තැන්පතු නිධිය හඳුන්වන්නේ ඉල්ලම යනුවෙනි. ඉල්ලම් පාර යනුවෙන් ඔවුන් පෙන්වන්නේ එම නිධිය ව්‍යාප්තව ඇති දිශාවයි. පතල් බහුලව කණිනු ලැබූ ප්‍රදේශයක පතලක් කැපීමට පෙර නත්තිරමක් තිබේදැයි විමසා බලන්නේ ඉතිරිව ඇති ඉල්ලම් තට්ටු සහිත ප්‍රදේශ පිළිබඳව විමසා බැලීම සඳහායි. කම්කරුවන් පතල් කැනීමේදී හමුවන පාංශු ස්තර සඳහා ආවේණික වචන භාවිත කරයි. ඔවුන් කොළ මැට්ට ලෙස හඳුන්වන්නේ අර්ධ ජීරණයට ලක්වූ ඓන්ද්‍රීය ද්‍රව්‍ය වලින් සමන්විත පාංශු කලාපයයි. එසේම වැලි මැට්ට, වැලි තීරුව, වැල්ල ලෙස කම්කරුවන් හඳුන්වන්නේ සියුම් අවසාදිත කණිකා තැන්පත්ව ඇති ස්තර වේ. භූ විද්‍යාව පිළිබඳ න්‍යායාත්මක දැනුමක් නොතිබුනද ප්‍රායෝගිකත්වය සහ අත්දැකීම් මත ඔවුන් භූමිය කැණීම පිළිබඳ විශේෂඥ දැනුමක් සහිත පිරිසකි. එයට ප්‍රබලතම උත්ප්‍රේරකය සපයන්නේ සාම්ප්‍රදායිකව ගෙන ආ වචන මාලාවයි. ඔවුනට අනුව පාරු ගල යනු භූ විද්‍යාඥයන් මව් පාෂාණය ලෙස හඳුනාගන්නා කලාපයයි. කණින ලද මැණික් පතල් යනු භූ විද්‍යාඥයකුට වුවද දියලු පාංශු ස්තර සහ මැණික් ඛණිජ පිහිටන ආකාර පිළිබඳව අනායාසයෙන්ම ප්‍රත්‍යක්ෂ අවබෝධයක් ලද හැකි අගනා මෙවලමකි. ඒ සඳහා මැණික් පතල් කැණීම හා සම්බන්ධ පාරම්පරික වචන මාලාව අත්තයන්තයෙන්ම උපකාරි වේ. මේ වචන මාලාව සැබවින්ම කෙටි යෙදුම් වල එකතුවකි. එය නවක කම්කරුවන් සහ මැණික් කර්මාන්තය හා සම්බන්ධ පිරිස් ඉතාම ඉක්මනින් ග්‍රහනය කරගන්නා අතර මැණික් පතල් කැණීම පිළිබඳව පොදු එකඟතාවන්ට උපකාරී වී ඇති බව පෙනී යයි.

***ප්‍රමුඛ පද:*** *මැණික් පතල් කර්මාන්තය, සාම්ප්‍රදායික, බස් වහර, පාංශු ස්තර, භූ විද්‍යාව*

# රුහුණු ජන වහර පිළිබඳ පර්යේෂණාත්මක අධ්‍යයනයක්

මුරුන්ගස්යායේ සාරද හිමි, අම්බාවේ ධම්මානන්ද හිමි, බදුල්ලේ සමිත හිමි, පෝද්දිවල ගෝතම හිමි

ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය

*murungasyayesarada@gmail.com*

ලෝකයේ අලංකාර භාෂාවන් අතර ප්‍රමුඛ භාෂාවක් වන සිංහල භාෂාව ජීවමාන භාෂාවක් ලෙස කලින් කලට වෙනස් වෙමින් ලංකාව පුරාම පැතිර ඇති බැව් ප්‍රාදේශීය ව්‍යවහාර නැතහොත් උප භාෂා ලක්ෂණ තුළින් ගම්‍ය වේ. එකම භාෂාවක් කතා කරන භාෂා සමාජය පුළුල් පරාසයක් දක්වා ව්‍යාප්ත වීමත් සමඟ උපභාෂා ලක්‍ෂණ පහළ වේ. සැතපුම් සිය දහස් ගණනක් විශාල භූමි ප්‍රදේශයක මෙසේ භාෂා සමාජයක් විහිදී ගිය විටෙක ප්‍රදේශයෙන් ප්‍රදේශයට හෝ සමාජයෙන් සමාජයට භාෂා ව්‍යවහාරයෙහි යම් යම් වෙනස්කම් ඇති වේ. එසේ ප්‍රාදේශීය වශයෙන් හෝ සමාජ කොටස් අතර භාෂාමය වශයෙන් ව්‍යවහාර විවිධත්වයක් ඇති වීමෙහිලා බලපෑ හැකි කාරණා කිහිපයකි. ගමනාගමන පහසුකම් අඩුවීම, සන්නිවේදන පහසුකම් වෙනස් වීම, භූගෝලීය දුරස්ථ බව සහ සංස්කෘතික සංස්පර්ශ යන්ගේ බලපෑම යන කරුණු මතය. රුහුණු රට හෙවත් රුණ ලෙස හැඳින්වෙන මෙම ප්‍රදේශයට එම නම ලැබීමට ප්‍රධානතම හේතුව වන්නේ හේන් ගොවිතැන ප්‍රධාන නිෂ්පාදන මාර්ගය බවට පත් කර ගත් වනාන්තර ආශ්‍රිත ප්‍රදේශයක් වීමයි. ලංකාව තුළ විහිදී තිබෙන ප්‍රදේශයෙන් ප්‍රදේශයට ද උපභාෂා ලක්ෂණ පවතින අතර එකම ප්‍රදේශයක් තුළ උප භාෂා ලක්ෂණ දෙකක් හෝ ඊට වැඩි ගණනක් දැකිය හැකි ය. එසේ ම කුල අතර ද ව්‍යවහාර වෙනස්කම් දැකිය හැකි අතර තවද රැකියාව මෙන් ම සමාජයේ තත්ත්වය මත පදනම් වෙමින් රුහුණු රටට ම අනන්‍ය වූ භාෂා ලක්ෂණ බිහි වී ඇත. රුහුණු ජන වහරෙහි සුවිශේෂතා සහ එම ප්‍රාදේශීය ව්‍යවහාර හේතුවෙන් ඇතිවන ගැටලු පිළිබඳ ව අධ්‍යයනය කිරීම පර්යේෂණ ගැටලුවයි. මෙම අධ්‍යයනයේ දී උපයෝගී කොට ගත් ක්‍රමවේද වන්නේ සම්මුඛ සාකච්ඡා හා මූලාශ්‍රය පරිශීලනය යි. රුහුණු බස් වහර ලෙස හඳුන්වන්නේ දකුණු බස් වහරම ය. ගිරුවාපත්තුවේ හා ගාලු දිස්ත්‍රික්කයේ ව්‍යවහාර අතර වෙනස්කම් දැකිය හැකි ය. මෙම ව්‍යවහාර ගිරුවාපත්තුව, මාගම්පත්තුව සහ මාතර වැල්ලබඩ හා කන්දබඩ පත්තුවල ගිරුවායට තදාසන්න ප්‍රදේශයන්හි වර්තමානයෙත් නොනැසී පවතී. එහෙත් වර්තමානය වනවිට රුහුණු ප්‍රාදේශීය ව්‍යවහාරයට එල්ලවී ඇති අභියෝග පිළිබඳ විමසීමේ දී නූතන හා පැරණි ජනවහර දෙකට අයත් වැසියන් දරණ අදහස්වල යම් වෙනසක් සිදුවී ඇත. විශේෂයෙන් පොදු ව්‍යවහාරයේ පවතින ස්වල්පයක් හෙවත් ටිකක් යන්න රුහුණ ජන වහර තුළ දී හින්නිකිතර සහ ඩිංගිත්තක් වශයෙන් භාවිතා වේ. රත්ගම හා බලපිටි ප්‍රදේශවල වහරේ අමුතු බවක් පවතින්නේ වචනවල නොව උච්චාරණ රටාව තුළය. පොදු වහරේ එන ඔයයි මමයි යන්න සඳහා ඔයැයිතුයි මමයි යනුවෙන් ද පොල්ලෙලි ගහනවා යන්න රුහුණු ජනවහර තුළ පොල් ඔයනවා යනුවෙන් භාවිතා වේ. මෙම අධ්‍යයනයෙන් තහවුරු වන මූලික සංකල්ප කිහිපයකි. එනම් රුහුණේ ජනවහර කෙරෙහි පවත්නා අභියෝග ලෙස නවීන තාක්ෂණයේ බලපෑම. නූතන පරපුර සාම්ප්‍රදායික බස්වහර සමඟ මුසුවීමට ඇති මැලිකම සහ වෙනත් ප්‍රදේශයන්හි ජනතාවගේ සංක්‍රමණය ආදී වු කරුණු හේතුවෙන් අදවන විට සාම්ප්‍රදායික බස් වහර වියැකී යන බවක් පෙන්නුම් කරයි.

***ප්‍රමුඛ පද:*** *රුහුණු බස් වහර, උපභාෂා, භාෂා ලක්‍ෂණ, සන්නිවේදනය*

# පන්දම් දොළහ ශාන්ති කර්මයේ ආවේශයෙන් හෙළිවන රූපාක්ෂර අභිචාරය

එල්. බී. එස්. ගුණවර්ධන, පී. නාරංගොඩ

ලලිතකලා අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය

*buddhikagunawardhana@gmail.com*

සත්කෝරළයට ආවේණික වූ පන්දම් දොළහ ශාන්තිකර්මය තුළ ආවේශ වන කපු මහතා දැල්වෙන පන්දමෙන් කරන අක්ෂර සටහන් කිරීම පුරාණ රූපාක්ෂර අභිචාරයන්හි වර්තමාන භාවිතාවක් බව ගෙනහැර දැක්වීම මේ පර්යේෂණයෙන් සිදු වේ. පුරාණ රූපාක්ෂර අභිචාර පිළිබඳ ලේඛනගත මූලාශ්‍රයන්, පන්දම් දොළහ ශාන්තිකර්මය පිළිබඳ සහභාගිත්ව නිරීක්ෂණ සාක්ෂි සහ ප්‍රත්‍යක්ෂ අධ්‍යයනය පදනම් කරගෙන දත්ත විශ්ලේෂණය මඟින් මේ පර්යේෂණය සිදු කෙරිණි. රූපාක්ෂර අභිචාර යනුවෙන් හැඳින්වෙනුයේ, අභිචාරාර්ථය පිණිස යම් භාෂාවකට අයත්වන හෝ අයත් නොවන අක්ෂර රූප භාවිතා කිරීමයි. පුරාණ ලෙන්වල ඉතා අසීරුවෙන් ළඟාවිය යුතු අඳුරු ස්ථානවල පවා රූපාක්ෂර දැක ගත හැකි වන අතර මේවා අභිචාරාර්ථයෙන් සටහන් කරන්නට ඇතැයි මානව විද්‍යාඥයෝ අදහස් කරති. වර්තමානයේ පවතින විවිධ අභිචාරයන්හිදී ද මෙවැනි රූපාක්ෂර භාවිතා වන බව නිරීක්ෂණය වේ. සත්කෝරළයට අයත් පන්දම් දොළහ ශාන්තිකර්මය, සශ්‍රීකත්වය, රෝග නිවාරණය හා ආරක්ෂාව අරමුණු කරගෙන සිදු කරන පත්තිනි ඇදහීමේ දේව ශාන්ති කර්මයකි. එහිදී දෙවියන් උදෙසා පන්දම් දොළසක් පුද කිරීම සිදුවන අතර රෝග නිවාරණයේදී සහ නිවෙස් හා භූමි ආරක්ෂා කිරීමේදී ශාන්ති කර්මයේ අපර කොටස තුළ මෙකී රූපාක්ෂර ඇඳීම සිදුවන බව නිරීක්ෂණය කළ හැකි ය. වරප්‍රසාදිත ආවේශයක් සහිත කපු මහතෙකු විසින් ආවේශයට පත්වී දැල්වෙන පන්දමට දුම්මල කීල ගසමින් ආතුර නිවසේ සියලු කාමර වෙත ගමන් කිරීමත් ඒ එක් එක් කාමරයට දුම්මල කීල ගසා අවසන්ව පිටත් වන විට කාමර දොරටුවේ උලුවස්සට ඉහළ බිත්තිය මත දැල්වෙන පන්දමේ දැලිවලින් යම් අක්ෂරයක් සටහන් කිරීම සිදු වේ. මෙසේ සියලු කාමරවල දොරටුවල හා නිවසේ ප්‍රධාන දොරටුවලට ඉහළින් මෙකී අක්ෂර සංකේතය පිහිටුවීම සිදුවේ. මේ අක්ෂර එකිනෙකට වෙනස් බවක් පළ කරන නමුත් ඒ තුළ යම් සමානරූපී බවක් දක්නට ලැබේ. අමනුෂ්‍ය බලවේග සමඟ කටයුතු කරන දේවාලවල හා නිවෙස්වල මේ චාරිත්‍රය සිදු නොවන අතර, අමනුෂ්‍ය බලපෑම් ඉවත් කර යළි ඒ බලපෑම්වලට ඇතුළු නොවීමට බලපෑමක් එල්ල කිරීමේ අරමුණින් මේ රූපාක්ෂර සටහන් කිරීම සිදුවන බව නිරීක්ෂණය විය. ආවේශය මඟින් මේ රූපාක්ෂර සටහන් යෙදීම සිදු කරන බැවින් එය දේවාක්ෂරයකින් ලැබෙන දේවාරක්ෂාවක් බව සාමාන්‍ය ජන මතය වන්නේ ය. ඒ අනුව ඉපැරණි මානව සමාජය ගල්ලෙන් තුළ ජීවත්ව සිටි අවදියේ අදෘෂ්‍යමාන වූ ආරක්ෂාවක් විශ්වාසයෙන් සිදු කළ රූපාක්ෂර අභිචාරකර්මයේ පරිනාමීය විකාශනයක් සත්කෝරළයේ පන්දම් දොළහ ශාන්තිකර්මයේ ආවේශයෙන් සිදු කරන රූපාක්ෂර සටහනින් පිළිබිඹු වන බව නිගමනය කළ හැකි ය.

***ප්‍රමුඛ පද:*** *සත්කෝරළය, පන්දම් දොළහ, ආවේශය, රූපාක්ෂර අභිචාරය*

# අල්ල ජනපදයෙහි ව්‍යවහාර වන කමත් බස් වහරත් ඒ හා බැඳුණු අභිචාර විධි පිළිබඳ අධ්‍යයනයක්

බදුල්ලේ සමිත හිමි[1], නීලපොල ධම්මතිලක හිමි[2], පෝද්දිවල ගෝතම හිමි[3]

[1,2]සිංහල අධ්‍යයනාංශය, [3]බෞද්ධ දර්ශනය අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය

*badullesamitha95@gmail.com*

කමත ගොවියාගේ පුණ්‍ය භූමියයි. එයින් ලක් දෙරණට ම බත සැපයූ අතර කමතට ගරු කළ ගොවියා කමතේ වැඩ ආරම්භ කරන ලද්දේ ඊට ආවේනික වූ සම්ප්‍රදායට අනුගතව ය. කුඹුර සීසෑමේ සිට අස්වැන්න නෙළා ගැනීම දක්වා වූ කාල පරාසය තුළ බැඳී පවතින භාෂා භාවිතයත්, චාරිත්‍ර වාරිත්‍රත් ගොවියන් අතර මනා සබැඳියාව සමඟිය සාමය තහවරු විය. නැගෙනහිර පළාතේ ත්‍රිකුණාමල දිස්ත්‍රිකයේ අල්ල ජනපදය පිහිටා ඇත. එම ප්‍රදේශයට අයත් කුඹුරු අක්කර දහ අට දාහකට අධික ප්‍රමාණයක් ගොවිතැන් කරන අතර සාම්ප්‍රදායික භාෂාවෙන් ඔබ්බට ගිය කමත් බස් වහර මෙන් ම අභිචාර විධි අල්ල ජනපදයේ ද දැකිය හැකි ය. එහි සුවිශේෂතාව වනුයේ ද්‍රවිඩ භාෂා සම්මිශ්‍රණයක් සමඟ අනුබද්ධ වීමයි. මෙහි පරියේෂණ ගැටලු ව  වනුයේ සාම්ප්‍රදායික කමත් බස් වහරෙන් ඔබ්බට ගිය අල්ල ජනපදයේ කමත් බසෙහි ඇති සුවිශේෂතා සහ අභිචාර විධි පිළිබඳ සොයා බැලීම යි. මෙහි පර්යේෂණ අරමුණ වන්නේ යාන්ත්‍රිකරණය සමඟ අල්ල ජනපද ගොවීන්ගෙන් වියැකී යන කමත් බස් වහර සහ අභිචාර විධි අනාගත පරපුර සඳහා දායාද කිරීම. මේ සඳහා පර්යේෂණ ක්‍රමවේදය වන්නේ නිරීක්ෂණය හා සාකච්ඡා ක්‍රමය යි. අල්ල ජනපද ගොවීන් ගොයම් කැපීමට ප්‍රථම කමත සුද්ධ කරයි. මෙහි විශේෂතාව වන්නේ ඒ සඳහා බොල් අත්ත භාවිත කිරීමත් කුඹුරේ අයිතිකරු කමතෙහි හරි මැද සූර්යා හා සමාන රූපයක් හුණුවලින් ඇඳ එහි පූජා ද්‍රව්‍යයන් (හඳුන්කූරු, කපුරු, මල් සහ පොල් ගෙඩියක්) ගෙන පොල් ගෙඩියේ ඉරි තුනක් අඳින අතර එයින් අපේක්ෂා කරනුයේ පුල්ලෙයාර් දෙවියන් සිහි කිරීමකි. ගොයම් කපා කමතට ගෙන එදින ම ගොයම් පාගන්නේ නම් ගොයම් අට්ටි ගැසීම ද නැතහොත් ගොයම් කොළය ද ගසයි. ගොයම් කුඩා ප්‍රමාණයක් නම් පොලු ගැසීමත් විශාල ප්‍රමාණයක් වේ නම් අම්බරුවන් ලවා ගොයම් පෑගීමත් සිදුකරයි. ඉන්පසු දැටිගහ ආධාරයෙන් මඩුහන් ඉවත් කිරීම සිදුකරයි. කාටුව සහ බොල් වී ඉවත් කිරීම සඳහා ජව සම්පන්න පිරිමියෙකු මූඩය මතට නැග සුළං හමන දිශාව බලා කුඩයෙන් ගත් බැත සුළඟට මුසුකරයි. මෙම මූඩය උඩට නගින පිරිමි පුද්ගලයා එයින් වැටුනේ නම් එම පුද්ගලයාට සරණපාවා ගැනීම සඳහා දියණියක් නොදෙන බව අල්ල ජනපදයේ මතයකි. ඒ සියල්ල හමාර කොට කන්න පටන් ගැනීමට පෙර මුල් ම අස්වනු කොටසත් පොල් ගෙඩියත් යොදා ගනිමින් පුල්ලයාර් දෙවියන් උදෙසා දෙව දනය වශයෙන් පූජා කරයි. ඉතුරු දන කොටස ප්‍රදේශවාසීන්ට ලබාදෙයි. අල්ල ජනපදයෙහි කමත් බස් වහර ද්‍රවිඩ භාෂාව හා මුසුවන්නේ කුඩය, මූඩය, මඩුහන්, ආදී ද්‍රවිඩ වචන භාවිතයත් ගොවිතැන හා සම්බන්ධ අභිචාර විධි ආදියෙහි පෙන්නුම් කරන ලද සම විෂමතා ලක්ෂණ හමු වන බව මෙමඟින් දැක්විය හැකි ය.

***ප්‍රමුඛ පද:*** *අල්ල ජනපදය, කමත, ගොවියා, අභිචාර*

# Folk Art as an Alternative Communication Method: A Comparative Analysis with Mass Media

S. Raguram

Department of Media Studies, Faculty of Arts, University of Jaffna

*ragunadu2003@yahoo.com*

Communication has a place, at each stage of every human being to be a member of society and to enable him/her to move around and stabilize him/her in the society; communication is the basis of meaningful existence. But, in the context of commercialized communication channels: particularly mass media that has become more profit-oriented, the need arises to find an alternate Communication which put forward as a medium for the people and by the people, to fill the gap and shortcomings that prevalent in the current mass media. The people who have been neglected/expelled by the mass media should get the opportunity to voice their needs through this alternative communication. Alternative media differ from mass-media that government and corporate interests and keep distant from the public. Thus, this study critically analyses the shortcomings and weaknesses of mass media and analyze the worth of folk-art as an alternate medium of communication which is expressed by way of entertainment, or as a ceremony, or a social function, where there is a space utilizes for communication. The field observation and examination on the selected local Tamil folk arts found that the how the space, time, and the participation of the people in a performance of folk-art make the communication reliable and closer and strengthen the relationship. Further, the study revealed that not only as creativity and aesthetics, but folk-arts also touch the emotions and sentiments of the grassroots and other dimensions as well, and absorb them. The study established that those who are engaged in folk communication how pass the 'I' state and reach the state of 'We' and achieving this 'We' is the uniqueness and specialty of folk communication. At the same time, the investigation emphasized the folk media which gives the opportunity to the people by mentioning their identity, having physical access to the message, culture-based, people-centered, supported by indigenous knowledge, socialized, participative, maintain an equal status to sender and receiver, transparent compared to the mass media forms.

***Keywords:*** *Alternative Communication, Folk Art, Mass Media, Grass Root People*

# FOLK LIFE & CULTURE

# Social Geographical Study on Linguistic Conversion and Cultural Identity of Indigenous Community with Special Reference to Dambana Vedda Community

P. L. S. D. Polwatta, G. A. Isurika

Department of Geography, University of Sri Jayawardenepura

*polwattasamara@gmail.com*

Vedda community is a minority ethnic group in Sri Lanka with a rich history and fabled folklore. Their lingual identity is unique to that of the mass languages in Sri Lanka with culture representing combinations of primitive and traditional essence. The study was undertaken to verify the gap of knowledge on indigenous cultural rituals and language transition over generations. Hence the main objective being to investigate the transition of language identity among generations and to review the temporal variation of culture and rituals. The research methodology involved a quantitative and qualitative assessment of 312 randomly selected individuals. Uru Warige clan composed 75% of the respondents with the other four Tala, Morane, Unapana and Herath Mudiyanselage 25%. Phonemic inventory of Vedda is very similar to Sinhalese yet in phonotactics it is very dissimilar to Sinhalese for instance, “issara” in Sinhalese and “iccara” in Vedda and is highlighted by the addition of inanimate suffixes such as “pojja”, “gejja” or “raacca”. Veddas have borrowed not only lexical stocks but also sounds, grammar, and meaning from colloquial Sinhalese.61% are fluent in Indigenous language.83% are also fluent in Sinhala. Younger generation is fluent in Sinhala with education and reluctance to show their Vedda inheritance. Indigenous language is an instrument at social necessities such as in the police, AG Office, School, Grama Niladhari Office and tourism. 28 people of the sample still carries axes on their shoulders and 30 can use bow and arrow. Only 9 women of the sample wore traditional dress who were elderly with 31 men exposing their bust. Present generation has modernized unaware of hunting, believing indigenous religion, awareness of indigenous medicine and rituals. Inherited cultural rituals during birth, marriage, hunting, health and puberty has modernized. It was observed that rituals such as “Kohomba Kankare” is now performed for the tourists and they have adopted Buddhist rituals such as “Aluth sahal mangalya” and Poruwa Ceremony. Indigenous life has been decaying its inheritances after close connections with non-indigenous people. Socioeconomic, language identity and culture has changed. The pure indigenous practices are difficult to find in their original places, although there are secured characteristics displayed.

***Key Words:*** *Indigenous, Vedda, Culture, Linguistics, Identity*

# පුරාණයේ සිංහල ගැමි ජනයා තුළ පැවති දිවුරුම් ක්‍රම පිළිබඳ අධ්‍යයනයක්

නීලපොල ධම්මතිලක හිමි

සිංහල අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය, හෝමාගම.

*chathuraprabuddhika1994@gmail.com*

ශ්‍රී ලංකාවේ පදිංචිකරුවන් ලෙස සැලකෙන ආර්ය ජනයාගේ අවංක බව යම් ක්‍රියාවක සත්‍යය සහතික වශයෙන් කියා සිටීම සිංහල දිවුරුම් ක්‍රමය යි. සියවස් ගණනාවක් මුළුල්ලෙහි විදේශ ආධිපත්‍යයට යටත් ව සිටීමේ ප්‍රතිඵලයක් වශයෙන් මෙරට ස්ථාපිත වූ නීති පද්ධතියට අනුව කුමන ස්වභාවයේ ආරවුලක් සමථයකට පත් කර ගැනීමට වුව ද අධිකරණයට යාමේ සිරිත වර්තමාන සමාජය තුළ මුල් බැස ගෙන තිබේ. මෙහි පර්යේෂණ අරමුණ එකල ගැමියා ගැටලු නිරාකරණය කර ගැනීමේ දී දිවුරුම් ක්‍රම භාවිත කළ ආකාරය අධ්‍යයනය කිරීම. හෙළ රජ දවස මෙරට වැසියන් දෛනික ජීවිතයේ මතු වූ ආරවුල් කුමන ආකාරයේ දිවුරුම් ක්‍රම මඟින් සමථයකට පත් කර ගත්තේ ද? යන්න විමර්ශනය කිරීම මෙහි පර්යේෂණ ගැටලුව යි. ඓතිහාසික මූලාශ්‍රය හා සම්මුඛ සාකච්ඡා (සේරුනුවර ප්‍රදේශය ආශ්‍රයෙන්) මෙහි පර්යේෂණ ක්‍රමවේදය වේ. අතීත ජනයා තම ගැටලු දිවුරීම තුළින් සමථයකට පත් කර ගැනීමට පුරුදු ව සිටියහ. ඒ තුළින් නඩු හබ සඳහා කාලයත් මුදලත් විනාශ වීම වළක්වාලූ සරල විසඳුම් ක්‍රමයක් සේ පිළිගැනීමට ඔවුහු පුරුදුව සිටියහ. මේ සඳහා රජතුමා විසින් පත් කරන ලද නිලධාරීහු එක් එක් පළාත භාරව සිටියහ. දිවුරීම දේවාලයක සිදු කරයි. ඒ සඳහා වෙන් කෙරුණු දේවාල එක් එක් පළාතට අනුව පිහිටා තිබුණි. කන්ද උඩරට මහනුවර සතර මහා දේවාලය ප්‍රධාන තැන ගත්තේ ය. එදා පැවති දිවුරුම් ක්‍රම නම් රත් කළ යවටයේ දිවුරීම, උණු තෙලේ දිවුරීම, නාග මල්ලේ දිවුරීම, වී ගැන දිවුරීම, කිතුල් ගසේ දිවුරීම, දරුවන් ගැන දිවුරීම යන දිවුරීමේ ක්‍රමවලට අමතර ව පත්තිනි දේවතාවිය ඇදහූ ජන කොටස් එම දේවතාවියගේ රන් සළඹට සමාන ව සැදූ ආභරණයක අත ගසා දිවුරීමේ සිරිතක් ද පැවතුණි. දීර්ඝ කාල පරිච්ඡේදයක් මුළුල්ලෙහි නීතිමය ස්වරූපයක් ද උසුලමින් යුක්තිය ඉෂ්ට කළා වූ සමාජ චාරිත්‍රයක් ව පැවති දිවුරීම රෝම ලන්දේසි නීති පද්ධතිය ස්ථාපිත වීමත් සමඟ ම අභාවයට පත් විය. එහෙත් අද දවසේ වුව ද ගැමි සමාජීය කටවහරේ බුදුන් පල්ලා, අම්මා පල්ලා, නේත්‍ර දෙක පල්ලා, දරුවන් පල්ලා වැනි යෙදුම් භාවිත වීම පැරණි දිවුරුම් ක්‍රමවල ශේෂයන් ලෙස දැක්විය හැකි ය. වර්තමානය තුළ ද ඇති වන සුළු ගැටලුකාරී තත්ත්වයන් හෘද සාක්ෂ්‍යයට එකඟ ව දිවුරීම තුළින් සමනය කර ගත හැකි වග නිගමනය කළ හැකි ය.

***ප්‍රමුඛ පදඃ*** *දිවුරීම, සමාජ චාරිත්‍ර, පත්තිනි දේවතාවිය.*

# Temporal Changes of Traditional Practices in Beach Seine Industry of Southern Sri Lanka

S. H. S. M. Siriwardana and Ven. P. Sangasumana

Department of Geography, University of Sri Jayawardenapura

*s.h.s.m.siriwardana@gmail.com*

Beach Seine identified as one of the ancient traditional fishing methods in Sri Lanka used to catch fish and small pelagic in the shallow sea water. Historically it was as a migratory capital assert from Madras in 1860s and became a well-established economic activity in the coastal region. This differs from other fishing techniques owing to one major trait as it consists of a unique series of traditional methods. Over the time, the typical traditions, customs, dress style and language have been changed due to several reasons. Since this has become an influential transformation, the focus of this study has set been up to investigate the temporal changes of the traditional beach seine industry in terms of customs and methods, technology and marketing system. Four research sites from Southern Province where traditional beach seine has been functioned seasonally were selected by using cluster sampling method. A mixed method of quantitative and qualitative was adopted for analyzing data collected through two techniques; PRA (Participatory rural appraisal) and Observation. The research results revealed that checking auspicious times, alms giving, providing grants to the god and conducting thovil rites have still been practicing abundantly. However, some traditional characteristics such as Seine language and Amba Gee no longer practiced more and some of them arewith significant modifications. Moreover, the typical dressing pattern like wearing a hat made from Idi leaves, a piece of cloth and a shirt woven from raw materials during the working time hasbeen disappeared. An important finding is that the level of change is totally differed among the selected research sites. The paper has widely discussed the way in which the traditions and customs have been changed over the time due to the socio-economic and environmental factors.

***Keywords:*** *Beach Seine, Convention, Temporal Changes, Traditions, Sri Lanka*

# කෘෂිකර්මාන්තයේ දී උපයෝගී කරගත් පැරණි කෙම් ක්‍රම හා විශ්වාසයන් පිළිබඳ අධ්‍යයනයක් (හුරුළු ගම් පලාත ඇසුරින්)

ආර්. එම්. එස්. පී. විජේරත්න, ආර්.ඩබ්. එස්. එස්. විමලරත්න, ඩී. එම්. එස්. එච්. ආර්. දිසානායක, ඩබ්. එම්. එන්. ඩී. රණසිංහ, එච්. ඩබ්. එස්. එස්. ධර්මසේන

පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය

*wimalarathnasajeewa@gmail.com*

ශ්‍රී ලංකාව ඈත අතීතයේ සිටම ස්වයංපෝෂිත ආර්ථික රටාවකට හිමිකම් කියන ලද දේශයකි. ආර්යාගමනයටත් පෙර සිට මෙරට කෘෂිකර්මාන්තය පැවති බවට සාධක හමු වී ඇත. නමුත් මෙලෙස ආරම්භ වූ ගොවිතැන විවිධ හානිකාරකයන්ගෙන් ආරක්ෂා කිරීමේ අරමුණින් පැරැන්නෝ විවිධ කෙම් ක්‍රම භාවිතකර ඇත. ''කෙම්'' යන්න තුළින් ආරක්ෂාව යන්න හැඟවේ. වසර 800ත් වඩා පැරණි අතීතයකට හිමිකම් කියන මෙම කෙම්ක්‍රම පිළිබඳව දඹදෙණි යුගයේ රචිත සද්ධර්මරත්නාවලියේ දේවදත්ත වස්තුවේ ''ගොයම් රෝගයට කෙම් කළ යුතුය'' යි සඳහන් වේ. මෙලෙස පැරැන්නෝ තම ගොවිතැන් ආරක්ෂාකර ගැනීමට අනුගමනය කළ දේශීය කෙම්ක්‍රම, විශ්වාස ක්‍රම රාශියක් ඇත. මෙහිදී අපගේ අරමුණ වූයේ කෘෂිකර්මාන්තයේදී පැරැන්නන් භාවිත කළ කෙම්ක්‍රම මොනවාද? පැරණි ක්‍රම වර්තමානය වනවිටත් පවතිනවාද? ඒවා වෙනස්කම්වලට භාජනය වී ඇත් ද? වර්තමානයේ ගොවියන් භාවිත කරන්නා වූ නව කෙම්ක්‍රම මොනවාද? යන්න අධ්‍යයනය කිරීමයි. මෙම අධ්‍යයනයේ දී අප විසින් පුස්තකාල අධ්‍යයනයක් තුළින් ප්‍රාථමික හා ද්විතීයික දත්ත ලබාගත් අතර, මීට අමතරව ක්ෂේත්‍ර ගවේෂණය, සම්මුඛ සාකච්ඡා වැනි ක්‍රම මඟින් ද දත්ත රැස්කිරීම සිදුකළේය. හුරුළු ගම් පලාත, අතීතයේ පටන් හුරුළු වැව යටතේ කෘෂිකාර්මාන්තය අතින් ස්වයංපෝෂිතව පැවති කලාපයකි. මෙම ප්‍රදේශයේ වී වගාවට අමතරව හේන් වගාවද ප්‍රධාන වශයෙන් සිදුකරනු ලබයි. වී වගාවේ දී ගොයමට වැළඳෙන රෝග, ඇස්වහ කටවහ, සතුන් මඟින් වන හානි, කෘමි උවදුරු ආදිය අවම කිරීම හෝ මර්දනය කිරීම සඳහා කෙම්ක්‍රම බහුල වශයෙන් යොදාගනියි. ගැටපණු රෝගය, මලකඩ රෝගය, කොළ හැකිලීම, කොළපුල්ලි රෝගය, කීඩෑවන් විදීම, පැළ මැක්කන් ගැහීම, කොළ කන දළඹුවා බෝවීම, ගැඩවිලන් කෑම ආදී වශයෙන් හඳුන්වනු ලබන රෝග රාශියක් ගොවියෝ හැඳින සිටි අතර ඒවා මර්දනයට කෙම්ක්‍රම භාවිත කළහ. ගවමහීෂ, මුව ගෝන, අලිඇත්, වල්ඌරන්, ඉබ්බන්, හාවන්, පක්ෂීන් ආදීන්ගෙන් ආරක්ෂාකර ගැනීමටත් මිනිසුන් කෙම්ක්‍රම හා විවිධ වතාවත් සිදුකරනු ලබයි. හේන් වගාවේදී ද අලි ඇතුන් පන්නා දැමීම සඳහා මන්ත්‍ර ජප කිරීම, පැල් රැකීමේදී සර්පයන්ගෙන් වන හානිය වැළැක්වීමට, බෝදිලිමා, උලලේනා වැනි සතුන්ගේ ශබ්දයන් ඇසුනුවිට මන්ත්‍ර ජප කිරීම, ආදිය සිදුකරනු ලබයි. මේවා ආගමික භක්තිය හා විශ්වාස සමග සම්බන්ධ කරන්නට ඇත්තේ ගොවිතැන සඳහා අලුත් පරම්පරාවල කැමැත්ත දිනා ගැනීමටත් ආකර්ෂණීය බවක් ඇති කිරීම සඳහාත් විය හැක. මෙතුළින් අපට එළඹිය හැකි නිගමනය වූයේ හුරුළුගම් පළාතේ අතීතයේ සිට පැමිණි කෙම්ක්‍රම හා ඇදහිලි බොහොමයක් වර්තමානයේ ද ඒ අයුරින්ම පවතින බවත්, ඇතැම් ඒවා වියැකී ගොස් ඇති බවත්, හේන් ගොවිතැනේ දී ගොවියන් විසින් ඇතැම් නව ක්‍රමෝපායන් ද මේ සඳහා භාවිත කරන බවත් ය. නමුත් මේ වනවිට වැඩි වශයෙන් වල්නාශක, පළිබෝධනාශක ගොවිතැනේ දී භාවිත කරන බැවින් මෙවැනි කෙම් ක්‍රම භාවිතයෙන් තොරවෙමින් පවතී.

***ප්‍රමුඛ පදඃ*** *කෙම් ක්‍රම, විශ්වාස ක්‍රම, ගොවිතැන, හුරුළු ගම් පලාත, පැරණි*

# දක්ෂිණ ධීවර ජන සංස්කෘතිය පිළිබඳව මානව විද්‍යාත්මක අධ්‍යයනයක් (ගාල්ල දිස්ත්‍රික්කයේ රත්ගම ප්‍රදේශය ආශ්‍රයෙන්)

එම්. ඩී. ආර්. ඒ. මෙන්ඩිස්, එම්. ඩී. එස්. ඒ. මෙන්ඩිස්

සමාජ විද්‍යා අධ්‍යයන අංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

*rojianusari@gmail.com*

සමාජය සහ සංස්කෘතිය අතර අවියෝජනීය සබඳතාවක් පවතියි. හා මහා සංස්කෘතියෙන් පැහැදිලිවම වෙනස් වූ කණ්ඩායමක් උප සංස්කෘතියක් වේ. ඒ අනුව උප සංස්කෘතිය යනු මහා සංස්කෘතිය යන කුලකයේ අඩංගු වන උප කුලකයකි. උප සංස්කෘතියක් බිහිවීම සඳහා අදාළ කණ්ඩායම හෝ සමූහය මහා සංස්කෘතියෙන් වෙන්වීම , කණ්ඩායමේ සියල්ලන් සමාන කටයුත්තක නියැලීම සහ කණ්ඩායමේ එකිනෙකා අතර අන්තර් ක්‍රියා පැවතිම යන නිර්ණායක බලපායි. ශ්‍රී ලංකාව තුළ ධීවර ප්‍රජාවගේ ජන සංස්කෘතිය ප්‍රධානතම උප සංස්කෘතීන් අතරින් එකක් ලෙස හඳුන්වාදිය හැකිය. අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වන්නේ දක්ෂිණ ධීවර ජන සංස්කෘතිය තුළ පවතින ආවේණික ලක්ෂණ හඳුනාගැනීමයි. සුවිශේෂී අරමුණු ලෙස දක්ෂිණ ධීවර ජන සංස්කෘතිය තුළ පවතින ආවේණික ජන වහර, ධීවර ජන ඇදහිලි ක්‍රම හඳුනා ගැනීම සහ ඔවුන්ගේ සමාජ තත්ත්වය හඳුනා ගැනීම යනාදිය පෙන්වා දිය හැකිය. දත්ත රැස් කිරීමේ දී ප්‍රාථමික දත්ත මූලාශ්‍රය සහ ද්විතීයික දත්ත මූලාශ්‍රය යොදා ගන්නා ලදී. අරමුණු සාධනයේදී දත්ත සපයා ගැනීම සඳහා නියදිය ලෙස දකුණු පළාතේ , ගාල්ල දිස්ත්‍රික්කයේ , රත්ගම ග්‍රාම නිළධාරී කොට්ඨාසයට අයත් ධීවර කර්මාන්තයේ නිරත වන ධීවරයන් 50 දෙනෙකු සපයා ගන්නා ලදි. දත්ත විශ්ලේෂණය සඳහා SPSS සහ Excel මෘදුකාංග යොදා ගන්නා ලදි. ආවේණික ධීවර ජන බස් වහර, ප්‍රාදේශීය උප භාෂා සහ භාෂා ස්වරූපයන් යන ආවේණික ලක්ෂණ ගණනාවක් දක්ෂිණ ධීවර ජන සංස්කෘතිය තුළ හඳුනා ගත හැකිය. ධීවර ජන ඇදහිලි ක්‍රම හඳුනා ගැනීමේදී දේව ඇදහීම, මසුන් අල්ලා දෙන අමනුෂ්‍ය බලවේග ඇදහීම සහ මුහුදු යාමට පෙර තම ආගම ඇදහීම යනාදිය හඳුනා ගත හැකිය. දේව ඇදහීමේදී විශේෂයෙන් සීනිගම, කතරගම සහ හූනියම් දේව ඇදහීම ප්‍රධාන ගණයෙහිලා ගත හැකිය. දක්ෂිණ ධීවර ජන සංස්කෘතිය තුළ ධීවරයන්ගේ සමාජ තත්ත්වය හඳුනා ගැනීමේදී සමාජීය පිළිගැනීම අඩු බව, පවුලේ ඉතුරුම් සුරක්ෂිත කිරීම් අඩු බව, අඩු අධ්‍යාපනය, අපචාර සහ අපචාරී චර්යාවන් සඳහා ගොදුරු වීමේ ප්‍රවණතාව වැඩිවීම, බොහෝ විට ධීවර කටයුතු සඳහා ළමා ශ්‍රමය යොදා ගැනීම සහ කාන්තාවන් ආර්ථිකයට මැදිහත් වීම යනාදී කාරණා හඳුනාගත හැක. දක්ෂිණ ධීවර ජන සංස්කෘතිය තුළ ආවේණික ජන බස් වහරක්, ඇදහීම් ක්‍රම සහ සමාජ පසුබිමක් පවතින බව අනාවරණය කර ගත හැකිය. ඒ අනුව එකිනෙක ජන සංස්කෘතීන් තුළ ආවේණික ලක්ෂණ පැවතීම අනිවාර්ය දෙයක් බව නිගමනය කළ හැක.

***ප්‍රමුඛ පදඃ*** *දක්ෂිණ, ධීවර, ජන සංස්කෘතිය, ජන වහර, ඇදහිලි*

# නාගරීකරණය හමුවේ වෙනස් වූ ශ්‍රී ලංකාවේ කුල ක්‍රමය

යූ. ඒ. එම්. සඳමිණි, පී. කේ. බී. ඉසුරු ප්‍රේමරත්න

කැලණිය විශ්වවිද්‍යාලය

*madusandamini@gmail.com*

කුල ක්‍රමය යනු අතීත ශ්‍රී ලාංකික සමාජ සන්දර්භය තුළ පැවති සංස්කෘතියේ අනන්‍ය ලක්ෂණයක් විය. අතීත පුද්ගලයාගේ වෘත්තිමය පදනම හා බැඳුණු සංස්කෘතිය තුළ කුල ක්‍රමය අනිවාර්යය අංගයක් බව පත් වූ අතර පුද්ගලයාගේ සම්පූර්ණ සමාජ තත්ත්වය මෙන්ම පිළිගැනීම ද කුල ක්‍රමය මත නිර්ණය විය. ඒ අනුව අතීත ශ්‍රී ලංකාවේ පැවති විශේෂ ප්‍රාගුණ්‍යය මෙන්ම ශ්‍රම විභජනය යන සංකල්පයන්ගේ ප්‍රායෝගිකත්වය පිළිබඳ යම් අදහසක් මෙම කුල ක්‍රමය මගින් විද්‍යමාන වූ බව පෙන්වා දිය හැකිය. කුල ක්‍රමය මගින් සුපෝෂිත වූ හෙළ සංස්කෘතිය තුළ සාර්ව මට්ටමින් සමාජයටත් ක්ෂුද්‍ර මට්ටමින් පුද්ගලයාටත් සාධනීය නිශේධනීය බලපෑම් රැසක් අත්විඳින්නට සිදු වූ අතර එහි ශේෂයන් අදටත් හඳුනා ගත හැකිය. දිගු කාලීන සමාජ වෙනස්වීමේ නියත ඵලයක් වූ නාගරීකරණය හරහා සිදු වූ චින්තනමය විප්ලවය තුළ පුද්ගලයා සංකීර්ණ වූවා පමණක් නොව තාර්කික ද වූ අතර අධිරාජ්‍යවාදයේ නැගී සිටීමත් සමගම ඇති වූ සංස්කෘතික සම්ප්‍රේෂණය හරහා මෙරට පැවති කුල ස්තරායණය කෙමෙන් ක්ෂය වී ගොස් තිබේ. මෙම පර්යේෂණයේ ගැටලුව වන්නේ නාගරීකරණය හමුවේ ශ්‍රී ලංකාවේ කුල ක්‍රමය වෙනස් වීමට ලක් වූයේ කෙසේද යන්නයි. පර්යේෂණ පරමාර්ථය ලෙස නාගරීකරණය හමුවේ ශ්‍රී ලංකාවේ කුල ක්‍රමය වෙනස් වූ ආකාරය විමසා බැලීම අපේක්ෂා කරන ලදි. මෙම පර්යේෂණය මගින් අපේක්ෂිත ශ්‍රී ලංකාවේ කුල ක්‍රමය වෙනස් වීමට බලපෑ හේතු සාධක විමසා බැලීම, නාගරීකරණය හමුවේ ශ්‍රී ලංකාවේ කුල ක්‍රමයේ සාධනීය හෝ නිශේධනීය ලක්ෂණ සහ නාගරීකරණය හමුවේ ලාංකික කුල ක්‍රමය තුළ සිදු වී ඇති වත්මන් ප්‍රවණතා මොනවාද යන අරමුණු සාධනය කර ගැනීම සඳහා සන්දර්භ විග්‍රහාත්මක ක්‍රමවේදය භාවිතයට ගත් අතර දත්ත රැස් කිරීමේ ශිල්ප ක්‍රමය ලෙස ලිපි සහ ග්‍රන්ථ ආදිය භාවිතයට ගනිමින් සාහිත්‍යය විමර්ෂණයක් සිදු කරන ලදි.මෙම පර්යේෂණය මගින් අනාවරණය වූ මූලිකම කරුණ වූයේ වර්තමානය වන විට කුල ස්තරායණය පන්ති ස්තරායණයක් බවට පරිවර්තනය වී ඇති බවයි. එසේම වර්තමානය වන විට කුලයේ කාර්යභාර්යය වෙනසකට ලක් වී ඇති බවත් කුලය මත පදනම් වූ සමාජ ව්‍යූහය වෙනස්වීමකට බඳුන් වී ඇති බවත් මෙයට මූලික වූ ප්‍රධානතම හේතුව පුද්ගලයා නාගරීකරණයට ලක්ව ඇති බවත් ධනවාදය තාර්කිකත්වය එයට හේතු වී ඇති බව මෙන්ම කුලයේ කාර්යය වෙනස් වුවද එහි නෂ්ටාවශේෂයන් ඇතැම් අවස්ථාවන්හි අදටත් සමාජ පිළිගැනීමට ලක්ව පවතින බව අනාවරණය විය. එසේම ගොවිගමකරණය වැනි ඇතැම් සංකල්පයන් හරහා ඇතැම් පහළ කුලයන් ගොවි කුලය අභිභවා යාමට උත්සහ දරා ඇති බවත් ඇතැම් කුල තුළ සිදු වූ සමාජ සංචලතාව නිසා කෙටි කාලීනව ගොවි කුලය හා සම වීමට හැකියාව ලද නමුත් එය අභිභවා යාමට නොහැකි වූ බවත් එසේම ඇතැම් පහළ කුල අතර පවා ප්‍රමුඛත්වය පිළිබඳ යම් ඝට්ටනයක් පවතින බව හා කුල ධුරාවලියේ පහළම මට්ටමේ ඇතැම් කුලයන් වර්තමානය වන විට විනාශ වී යාමේ තර්ජනයකට ලක්ව ඇති බවත් මෙම පර්යේෂණය මගින් අනාවරණය කර ගැනීමට හැකි විය.

***ප්‍රමුඛ පදඃ*** *කුල ස්තරායණය, පන්ති ස්තරායණය, කුල ධුරාවලිය, නාගරීකරණය, ශ්‍රම විභජනය, විශේෂ ප්‍රාගුණ්‍යය ගොවිගමකරණය*

# ශ්‍රී ලංකාවේ ඓතිහාසික යුගයේ ධීවර කර්මාන්තය පිළිබඳ අධ්‍යයනයක්

එච්. පී. ඩී අචිනි ලක්මාලි, එම්. ටී. එන් තිලකරත්න

ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය

*achini1218@gmail.com*

ශ්‍රී ලංකාවේ ධීවර කර්මාන්තයේ ඉතිහාසය ප්‍රාග් ඓතිහාසික යුගය දක්වා දිව යන අතර ඒ බව බුලත්සිංහල, පාහියන්ලෙන, කුරුවිට, බටදොඹලෙන, කිතුල්ගල, බෙලිලෙන, බෙල්ලන් බැඳි පැලැස්ස, කිරින්ද වරාය සහ කිරින්ද ගොඩවාන වැනි ස්ථානවලින් හමුවී ඇති ජලජ ජීවීන්ගේ අස්ථි කොටස් මඟින් පැහැදිලි වේ. ශ්‍රී ලංකාවේ ධීවර සම්පත් පරිභෝජනයේ ලිඛිත සාධක හමුවන්නේ ඓතිහාසික යුගය තුළදීය. ඒ අනුව මෙම අධ්‍යයනයේ අරමුණ වන්නේ වංශකතා සහ අනෙකුත් සාහිත්‍ය මූලාශ්‍ර ඇසුරෙන් ඓතිහාසික යුගයේ ධීවර කර්මාන්තය ක්‍රියාත්මක වූ ආකාරය පිළිබඳව හඳුනා ගැනීමයි. එහිදී ධීවර කර්මාන්තයේ ස්වභාවය, මසුන් ඇල්ලීමේ පන්න ක්‍රම, මසුන් පිළිබඳ අයිතිය සහ බදු ක්‍රම, මත්ස්‍ය විශේෂ සහ මත්ස්‍ය වෙළඳාම පිළිබඳව අධ්‍යයනය කරන ලදි. ඓතිහාසික යුගයේදී දිවයිනේ මිරිදිය ධීවර කර්මාන්තය මෙන්ම කරදිය ධීවර කර්මාන්තයද පැවති බව අනාවරණය වේ. මහාවංසය, ථූපවංසය, සද්ධර්මාලංකාරය, සහ රසවාහිනිය වැනි සාහිත්‍ය මූලාශ්‍රවලින් ලැබෙන සාධක අනුව කරදිය ධීවර කර්මාන්තය ප්‍රචලිතව පැවත තිබේ. අනුරාධපුරයට ආසන්නව පිහිටා තිබුණු මුගලයින් රට ධීවර ගම්මානයක් සහ ලංකාවේ බටහිර වෙරළ ආසන්නයේ මහදැල්ල නම් ධීවර ගම්මානයක් පිළිබඳව තොරතුරු රසවාහිනිය සහ සද්ධර්මලංකාරයේ සඳහන් වේ. මෙරට ධීවරයින් කෙවුලන් යන නාමයෙන් හඳුන්වා ඇති අතර ඔවුන්ගේ ගම්මාන කෙවුළුගාම යන නමින් හඳුන්වා තිබේ. වෘත්තීමය ධීවරයන් පමණක් නොව වැදි ජනතාව පවා මසුන් ඇල්ලීමෙහි නිරතව ඇති බවට සාධක හමුවේ. පැරණි සාහිත්‍ය මූලාශ්‍රවලට අනුව මෙම යුගයේ මසුන් අල්ලා ගැනීමේ උපකරණ වශයෙන් කරක්ගෙඩිය, බිලි කටු, කෙමන සහ මාළු දැල් භාවිත කොට තිබේ. මදනඵල නම් විෂ සහිත ගෙඩි වර්ගයක් තලා ජලයට මුසු කොට මසුන් මත් කොට අල්ලා ගන්නා ක්‍රමයක් පිළිබඳව සමන්තපාසාදිකාව දක්වයි. බුත්සරණේ සහ ජාතික අටුවා ගැටපදයේ සඳහන් ආකාරයට පෙතියන් වර්ග මෙන්ම ලූලා, වලයා, මඟුරා සහ හුංගා යනාදී මත්ස්‍ය විශේෂ ධීවරයින් විසින් අල්ලාගෙන තිබේ. පැරණි යුගයේ මසුන් පිළිබඳ අයිතිය පැවතියේ රාජ්‍යය, ග්‍රාමීය ආයතන සහ පුද්ගලයින් යන ත්‍රිවිධ කොටස්වලට ය. මෙම ත්‍රිවිධ කොටස්වලට අයත් ජලාශවලින් මසුන් ඇල්ලූ විට බද්දක් අය කෙරිණ. එම බද්ද මජිබික, මජිබුක, මතෙරමජිබක යනුවෙන් අනුරාධපුර යුගයේ හඳුන්වා තිබෙන අතර පිසඹුරුවත නමින් පොළොන්නරු යුගයේ හඳුන්වා ඇත. ක්‍රි.ව. 9 වන සියවසේ පටන් මෙරට මත්ස්‍ය වෙළඳාම සිදු වී ඇති බවට සාධක හමුවන අතර එය අටවන අග්බෝ රජු සමයේ පොහොය දිනවල අනුරාධපුර අගනුවරට මසුන් ගෙන ඒම තහනම් කිරීමෙන් සනාථ වේ. මත්ස්‍ය වෙළඳාමට අමතරව හක්ගෙඩි, මුතු, කොරල්, කැස්බෑ ලෙලි වැනි ජලජ ද්‍රව්‍ය දේශීයව භාවිත කළා පමණක් නොව විදේශ රටවලටද අපනයනය කළ බවට සාධක පවතී. ඒ අනුව ශ්‍රී ලංකාවේ ඓතිහාසික යුගයේ ධීවර කර්මාන්තයේ විවිධ පැතිකඩයන් පවතින බවත් සරල තාක්ෂණය ඔස්සේ ධීවර සම්පත් පරිභෝජනය කර ඇති බවත් පෙන්වාදිය හැකිය.

***ප්‍රමුඛ පදඃ*** *ධීවර කර්මාන්තය, ශ්‍රී ලංකාව, ඓතිහාසික යුගය, ලිඛිත මූලාශ්‍ර*

# මහාවංසයෙන් ගිලිහී ගිය සාමාන්‍ය ජන ජීවිතයට සද්ධර්මාලංකාරයෙන් ඌණපූරණයක්

එම්. කේ. එල්. අයිරාංගනී, එන්. ජී. අයි. එම්. වික්‍රමසිංහ

මානවශාස්ත්‍ර අධ්‍යයන අංශය, මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලය

*iranganimkl@yahoo.com*

ශ්‍රී ලාංකේය ඉතිහාසය අඛණ්ඩව ලේඛනගත කරමින් ක්‍රි.ව. පස්වැනි සියවසේදී රචිත මහාවංසය අනුරාධපුරය කේන්ද්‍ර කරගනිමින් පාලනය මෙහෙය වූ රාජ පරම්පරාවන්ගේ දේශපාලන සහ ආගමික සේවාවන් ප්‍රමුඛ කොට සළකා ඇත. නමුත් සමකාලීන සාමාන්‍ය ජනයා පිළිබඳව මහාවංසයෙන් හෙළිවන සාධක ඉතිහාසය පෝෂණය සඳහා ප්‍රමාණවත් නොවේ. දාහතරවැනි සියවසේදී ධර්මකීර්ති හිමියන් විසින් රචිත සද්ධර්මාලංකාරයෙහි එන කථා වස්තූන්ගෙන් නිරූපිත පොදුජන ජීවිතය පිළිබඳ සාධක තුළින් මහාවංසයේ රික්තකය පූරණය කිරීම මෙහි අරමුණයි. මහාවංසයේ සඳහන් සිදුවීම්වලට සමකාලීන තොරතුරු සද්ධර්මාලංකාරයේ ලංකාදීපුත්පත්ති කථා තුළින් ගෙනහැර දක්වන හෙයින් මූලිකවම මහාවංසයත් අවශ්‍යතාව අනුව තත්කාලීන අනෙකුත් සාහිත්‍යය මූලාශ්‍රය ද උපයුක්ත කොට ගෙන සංසන්දනාත්මක ඓතිහාසික විග්‍රහයක නියැලීම මෙහි පර්යේෂණ ක්‍රමවේදය වේ. මහාවංසය මෙරට ඉතිහාසය ගොඩනැඟීමේ ප්‍රමුඛතම මූලාශ්‍රය වශයෙන් සැළකුව ද කතු හිමියන්ගේ අවධානයට පාත්‍ර වී ඇත්තේ ථෙරවාදී බුදු දහමට අනුග්‍රහය දක්වූ රාජ පරම්පරාව පමණක් වන බැවින් ඉන් හෙළි වන්නේ සමාජයේ ප්‍රභූ පාර්ශවයකගේ ඉතිහාසය පමණි. නම් නොලියැවුණු ගොවීන්, කම්කරුවන්, කාර්මිකයින් මෙන්ම කාන්තාවන් ඇතුළත් රාජ්‍ය ප්‍රගමනයට උරදුන් බහුතරයේ ඉතිහාසය එනයින් සැඟව ගොස් ඇත. සීහලවත්ථුප්පකරණය, සහස්සවත්ථුප්පකරණය සහ රසවාහිනිය ආදී ග්‍රන්ථයන් පාදක කරගනිමින් සද්ධර්මාලංකාරය රචනා වී ඇති හෙයින් මෙහි එන කතා වස්තූන් කතු හිමියන්ගේ ප්‍රබන්ධයන් සේ සළකා ඉවත දැමිය නොහැකි ය. අනුරාධපුර අවධියේ මුල් කාලීන සමාජ සැකැස්ම තුළ පවුල සහ විවාහය, පන්ති ක්‍රමය සහ කුල භේදය, ආහාර රටාව, ඇඳුම් පැළඳුම් වැනි අංශ මෙන්ම සොරකම්, අනාචාර, මංකොල්ලකෑම්, ණය, පොළී ක්‍රම, වහල් සේවය සහ දරිද්‍රතාවය ආදී සමාජ ගැටළු ද සද්ධර්මාලංකාරය තුළින් අධ්‍යයනය කළ හැකිය. දරිද්‍රතාවය නිරූපණය කරමින් අම්බ අමාත්‍ය වස්තුවෙහි ''.......එම්බා සොදුර සායට වඩා දුකෙක් නැත. තෙල පිසු  සැළෙහිදා ඇලිච්ච බතෙක් ඇත්නම් පරීක්ෂා කෙරෙවයි කියා, එකලැ ඔහුගේ භාර්යා තොමෝ පළමු සැළෙහි බත් නැති බව දැන දැනම....." යනුවෙන් ද, රුක්ඛ දේවතා වස්තුවෙහි "එම සහල් අවුවේ වේලා භාජනයක ලා සොරුන් කෙරෙහි භයින් බිම සඟවා තබා.." යනුවෙන් සොරකම පිළිබඳව ද, පණ්ඩරංග වස්තුවෙහි " පණ්ඩරංග පරිබ්‍රාජකයා රාත්‍රියෙහි මාගමක සමඟ වසය කොට උදෑසන ඈ හා සමඟ රා බී මත්ව" යනුවෙන් දුරාචාරය පිළිබඳව ද සද්ධාර්මාලංකාර කතු හිමියන් හෙළි කරන්නේ සමාජයේ සැබෑ යථාර්ථයයි. මේ අනුව මහාවංස කතුවරයාට මගහැරුණු දේශීය ජන ජීවිතයේ තත්‍ය ස්වරූපය අධ්‍යයනය කිරීමෙහිලා සද්ධර්මාලංකාරය කෘතියෙන් ලබාදෙන මූලාශ්‍රමය දායකත්වය ප්‍රශංසනීය වේ.

***ප්‍රමුඛ පදඃ*** *මහාවංසය, සද්ධර්මාලංකාරය, ජන ජීවිතය, රික්තකය, පූරණය*

# බුද්ධකාලින භාරතීය සමාජයෙහි පැවැති ජන ක්‍රීඩා පිළිබඳ පෙළ සාහිත්‍යය ඇසුරින් විමර්ශනාත්මක අධ්‍යනයක්

ගිරාඹේ ධම්මරුචි හිමි

පාලි හා බෞද්ධ අධ්‍යනාංශය රුහුණ විශ්වවිද්‍යාලය

*girambedhammaruchi@gmail.com*

බුදුන් වහන්සේ ලොව පහළ වුයේ ක්‍රි පු 06 වන සියවසේදි ය. එකළ භාරතීය ජන සමාජය තුළ පැවැති ජන ක්‍රිඩාවන් රාශියක් පෙළ සාහිත්‍ය තුළින් අනාවරණය වේ. ග්‍රාමීය ජන ජිවිතයක් ගත කරන ජනතාවගේ ජිවිතය හා අත්‍යාන්තයෙන් බැඳි ඇති සුවිශේෂි කරුණක් ලෙස ජන ක්‍රිඩාවන් දැක්විය හැකි ය. බුද්ධකාලින භාරතීය සමාජය තුළ පැවැති ජන ක්‍රිඩාවන් අධ්‍යනය කිරිමේ දි, ඒවා ප්‍රධාන කොටස් තුනකින් යුක්ත බව හඳුනා ගැනුනි. එනම් විනෝද ක්‍රිඩා, සූදු ක්‍රිඩා හා යුධ අභ්‍යාස ක්‍රිඩා යනුවේනි. මෙම ජන ක්‍රිඩාවන් ආකාර තුනකින් සමාජගත වි ඇත. විනෝද ක්‍රිඩාවන් බොහෝ විට පැවැත් වුයේ උත්සවාකාරයෙනි. එම ක්‍රිඩාවන්ගෙන් පෙක්ඛ, අක්ඛාණ, පාණිස්සර, වංශ, චණ්ඩාල, ධොපන යන ක්‍රිඩාවන් සුවිශේෂිතය. නුතන ලාංකික ජන ජිවිතය හා සම්බන්ධ උත්සවයන් තුළින් අවිද්‍යමාන වන බොහෝ ජන ක්‍රිඩාවන්, බුද්ධකාලීන භාරතීය ජන සමාජයෙහි පැවැති ජන ක්‍රිඩාවන්ගෙන් විද්‍යමාන වේ. පෙළ සාහිත්‍යය අධ්‍යනය කිරිමේ දි අනාවරණය වන තවත් සුවිශේෂිත ජන ක්‍රිඩාවක් ලෙස යුධ අභ්‍යාස ක්‍රිඩාවන් දැක්විය හැකි ය. සටන් කලාවකින් යුක්ත වු මෙය යුද්ධය ඉලක්ක කොටගෙන කරන ලද අතර, දක්ෂයාට ප්‍රමුඛස්ථානය හිමි වේ. එකළ සම්මත වු ජන කොට්ඨාසයක් තුළින් පමණක් මෙම ක්‍රිඩාව දැකිය හැකි ය.පෙළ සාහිත්‍යයේහි දැක්වේන පරිදි එම ක්‍රිඩාවන් වන්නේ හත්‍ථි, අස්ස, මහීස, උසභ, අජ, මෙණ්ඩ, කුක්කුට, වට්ටක, දණ්ඩ, මුට්ඨි, නිබ්බුද්ධ, උය්‍යොධික, බලග්ග, සෙනාබ්‍යුහ යන්නයි. සූදුව සම්බන්ධයෙන් වු ජන ක්‍රිඩාවන් රාශියක් ද භාරතීය ජන සමාජයෙන් අනාවරණය වේ.එනම් අට්ඨපද දසපද ආකාස පරිහිරපථ සන්තික බලික ඝටිකා සලාකහත්‍ථ යනාදි වශයෙන් වේ. නුතන ලාංකික ජන ජිවිතය හා සම්බන්ධ උත්සවයන් තුළින් අවිද්‍යමාන වන බොහෝ ජන ක්‍රිඩාවන්, බුද්ධකාලීන භාරතීය ජන සමාජයෙහි පැවැති ජන ක්‍රිඩාවන්ගෙන් විද්‍යමාන වන බව පැහැදිලිය. මෙම පර්යේෂණයෙහි අරමුණ වන්නේ නුතන ජන සමාජයෙන් වේන්ව අභාවයට ගොස් ඇති ජන ක්‍රිඩාවන් බුද්ධකාලීන භාරතීය සමාජයෙහි දිස්වන ආකාරය පෙළ සාහිත්‍යයෙන් අනාවරණය කර ගැනිමයි. පර්යේෂණ ගැටළුව වන්නේ බුද්ධකාලීන ජන සමාජය තුළ ජන ක්‍රිඩාවන් කෙබඳු ආකාරයෙන් පැවතියේ ද යන්නයි. මෙම පර්යේෂණයෙන් ලැබේන ප්‍රයෝජන වන්නේ, පෙළ සාහිත්‍යයෙන් අනාවර්ණය වන ජන ක්‍රිඩාවන් දාර්ශනික අගයකින් යුක්ත වුවක් මෙන් ම විනෝදය, අධ්‍යාපනය, සාමුහිකත්වය වැනි බොහෝ කරුණු පෙළ සාහිත්‍යයෙන් විද්‍යමාන වන බවයි. පර්යේෂණන ක්‍රමවේදය වන්නේ සාහිත්‍ය මුලාශ්‍රය අධ්‍යනයයි. පර්යේෂණය අවසානයේ නිගමනය කරන ලද්දේ නුතන ලාංකික ජන ක්‍රිඩාව හා සබැඳියාවක් නැත, සුවිශේෂිත වු ජන ක්‍රිඩා සමුහයක් පෙළ සාහිත්‍යයෙන් අනාවරණය වන බවයි.

***ප්‍රමුඛ පදඃ*** *ජන, ක්‍රිඩා, පෙළ, සමාජය, සාහිත්‍යය*

# එදිනෙදා ජන ජීවිතයේ විවිධ අවශ්‍යතාවයන් සඳහා භාවිතා කළ සන්නිවේදන ක්‍රම පිළිබඳ අධ්‍යනයක් (ජනවහරේ භාවිත හූව පිළිබඳ තෝරා ගත් කලාප කිහිපයක් ඇසුරින්)

ඩබ්. මධුභාෂිණී චන්ද්‍රපාල

බාහිර විභාග හා පශ්චාත් උපාධි මධ්‍යස්ථානය, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය

*chandrapalamadhubhashini@gmail.com*

වර්තමානයේ තරම් දියුණු සන්නිවේදන ක්‍රමවේදයන් අතීතයේ නොතිබුණි. එනමුත් පැරණි සිංහල ජන සමාජයේ ජීවත් වූ ජනයා තම එදිනෙදා සන්නිවේදන අවශ්‍යතාවන් සඳහා විවිධ ශබ්ද, සටහන්, මුද්‍රා භාවිතා කිරීමට පුරුදු වී සිටියහ. මේවා සමාජයේ සම්මත වශයෙන් පරම්පරාවෙන් පරම්පරාවට පැවත ආ සම්මතයන් වේ. මේ අතරින් හූවට හිමිවන්නේ වැදගත් ස්ථානයකි. මෙය විවිධ අදහස් ප්‍රකාශ කිරීමට යොදා ගත්තත් මෙහිදී සලකා බලන්නේ සන්නිවේදන ක්‍රමයක් ලෙස ජන ජීවිතය තුළ හූව උපයෝගි කරගත් ආකාරය පිළිබඳවයි. අතීත ජන සමාජය තුළ පැවති මෙවන් ජන සන්නිවේදන ක්‍රමයන් වර්තමාන සමාජයෙන් ගිලිහී යමින් පවතින අතර එහි සමාජයීය වැදගත්කම අධ්‍යනය කරමින් ඒවා අනාගත පරපුරට දායාද කිරීමේ වැදගත්කම පෙන්වා දීම මෙහි මූලික අරමුණයි. මෙම පර්යේෂණය සඳහා දත්ත රැස් කිරීමේදී ද්විතීක මූලාශ්‍ර යටතේ පූර්ව පර්යේෂණ වාර්තා, ලිපි, අන්තර්ජාල භාවිතය මෙන්ම ඓතිහාසික මූලාශ්‍ර අධ්‍යනයට අමතරව ප්‍රාථමික මූලාශ්‍ර යටතේ සමීක්ෂණය, නිරීක්ෂණය, කේවල අධ්‍යනය හා සම්මුඛ සාකච්ඡා ආදී සමාජවිද්‍යා පර්යේෂණ විධික්‍රම යොදා ගන්නා ලදී. වාචික සන්නිවේදනය, අවාචික සන්නිවේදනය, දෘශ්‍ය සන්නිවේදනය, ශ්‍රව්‍ය සන්නිවේදනය යන සන්නිවේදන ස්වරූපයන් විධිමත් හා අවිධිමත් සන්නිවේදන ක්ෂේත්‍ර ලෙස ක්‍රියාත්මක වේ. මේ අතරින් ශ්‍රව්‍ය සන්නිවේදන ස්වරූපයට ජනවහරේ භාවිත වූ හූ කීමේ සන්නිවේදනය අයත් වේ. හඬ පාදක කරගෙන කරනු ලබන මෙම සන්නිවේදනයට ශ්‍රවනය කිරීමේ හැකියාව තිබිය යුතුය. මෙහිදි විවිධ ශබ්ද හා ධ්වනි උපයෝගී කරගෙන විවිධ අර්ථ පැහැදිලි කර ගත හැකිය. මෙහිදී සිදු කරන ලද පර්යේෂණයේ ප්‍රතිඵලයක් ලෙස ලංකාවේ විවිධ කලාපවල භාවිතා වන හූ කීමේ ප්‍රභේදයන් හඳුනා ගත හැකිය. ඒ අතරින් කිහිපයක් ලෙස; හෙවිල්ලුම් හූව, දඩයම් හූව, මළ හූව, රහස් හූව, බෝරේ හූව යනාදිය පෙන්වා දිය හැකිය. මෙම ප්‍රභේද එක් එක් සමාජයට ආවේණික වූ ඒවා වන අතර මෙම සාම්ප්‍රදායික ශබ්ද මාධ්‍ය නූතන ශබ්ද මාධ්‍ය හමුවේ ක්‍රමක්‍රමයෙන් පරිහානියට යන බවද මෙහිලා අවධාරණය කිරීමට කැමැත්තෙමි.

***ප්‍රමුඛ පදඃ*** *ජන සමාජය, ජන සන්නිවේදනය, දඩයම් හූව, මළ හූව, රහස් හූව*

# පානම් පත්තුවේ ජන ජීවිතය කෙරෙහි බලපානු ලබන ආගම හා බැඳුණු ජන සංස්කෘතිය පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක්

එන්. වී. පී. මධුශානි[1] , ආර්. එම්. එන්. පූර්ණිමා[2]

[1]සමාජවිද්‍යා අධ්‍යයනාංශය, [2]සිංහල අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය

*madushanipurnima543@gmail.com*

සමාජයේ තවත් සමාජයකිනුත් ජන කොට්ඨාසය තවත් ජන කොට්ඨාසයකිනුත් වෙන්ව හඳුනා ගත හැකි වන්නේ සංස්කෘතිය නිසාය. සමාජයේ සාමාජිකයෙකු වශයෙන් මිනිසා විසින් අත්පත් කර ගන්නා වූත්, ලබා ගන්නා වූත් දැනුම විශ්වාස කලා සදාචාර දහම් හා වෙනත් හැකියාවන්ගේ සමස්තය සංස්කෘතිය වේ. ඒ අනුව පානම් පත්තුව නැගෙනහිර පළාතෙහි අම්පාර දිස්ත්‍රික්කයේ දකුණු වෙරළබඩ තීරයට මායිම්ව පිහිටි ගම්මානයකි. ප්‍රෞඪ ඉතිහසයකට නෑකම් කියන පානම ගැමියෝ විශ්වාස කරන දෙවිවරු කිහිප දෙනෙක්ම සිටිති. කැබිලිත්ත, ඔකද, කතරගම, අම්පිටිය ආදී දෙවිවරුන්ද ගණ දෙවියන්ද අදහනු ලබයි. ගම්වැසියන්ගේ සමාජ ආර්ථික සංස්කෘතික ලෙස ජීවන රටාව පවත්වා ගෙන යාමේදී ආගම වෙත නැඹුරු වීමක් හඳුනා ගත හැකි වේ. ඒ අනුව මෙම අධ්‍යනයේ ගැටලුව ලෙස ආගම හා බැඳුණු සංස්කෘතිය ජන ජීවිතයට බලපෑම් කර ඇත්තේ කෙසේද? යන්න සොයා බලයි. පුද්ගල ජන ජීවිතය හා යහපැවැත්මට ආගම හා සංස්කෘතිය සෘජුව හා වක්‍රව බලපා ඇති ආකාරය හඳුනා ගැනීම, පුද්ගලයා ආගම මගින් තම ජීවිතය හැඩ ගස්වා ගැනීමට පෙළඹීමට හේතු හඳුනා ගැනීම මෙම අධ්‍යනයේ අරමුණු විය. අධ්‍යයන ක්‍රමවේදය ලෙස ප්‍රාථමික දත්ත රැස් කිරීම සඳහා අහඹු ලෙස තෝරා ගත් පුද්ගලයින් 20 සමඟ පැවැත්වූ සම්මුඛ සාකච්ඡා, නිරීක්ෂණ හා සිද්ධි අධ්‍යයන ක්‍රමවේද යොදා ගත් අතර ද්වීතික දත්ත රැස් කිරීම සඳහා පොත්පත්, සඟරා, පුවත් පත් ලිපි භාවිතයට ගන්නා ලදී. මෙහිදී පානම ජනතාව තුළ අම්පිටිය දේවාලය හා බැඳුණු විශ්වාස සමුදායක් පැවති බවත් එහි පවත්වන "අංකෙළිය "නම් උත්සවය හරහා මිනිසුන්ගේ දේව භක්තිය ජන ජීවිතයට කළ බලපෑම හඳුනා ගත හැකිය. අම්පිටිය දේවාලයේ පවත්වන අංකෙළිය උත්සවයේ ප්‍රධාන අරමුණ වන්නේද භෞතික යහපැවැත්ම ඇති කර ගැනීමයි. වේ. මානසික පීඩනයන් ආගම හරහා සංතෘප්ත කර ගැනීමට මිනිසුන් කටයුතු කරයි. පොල් ගැසීම, පූජා වට්ටි භාර වීම, බෝධි පූජා තැබීම, සෙත් කවි කීම, කටුගසා ගෙන හරහාර වීම වැනි කටයුතු උපද්‍රව වලින් මිදීම සඳහා කරනු ලබයි. මෙම දේවාලය ගත් විට එහි පවතින පුදපූජා උත්සව වලදී ගමේ සියලුම දෙනා ජාති භේදයකින් තොරව සහභාගි වේ. මෙවැනි ආයතන අධ්‍යයනය කිරීම තුළින් පුද්ගලයා කොතරම් දුරට ආගම මත පරාරෝපණය වී ඇත්ද යන්න මැනවින් හඳුනාගත හැකිය. ඒ අනුව පානම ආශ්‍රිත පවතින ජන සංස්කෘතිය ආගම හා බැඳී පවතින ආකාරය හා එය කෙතරම් දුරට ජන ජීවිතයට බලපෑම් කර තිබෙනවාද යන්න මෙම අධ්‍යයනය තුළින් ගම්‍යමාන විය.

***ප්‍රමුඛ පද:*** *සංස්කෘතිය, ජන ජීවිතය , ආගම, යහපැවැත්ම, විශ්වාස*

# ලාංකේය ජන සමාජයේ නඩු විභාග සඳහා භාවිත සාම්ප්‍රදායික විධාන ක්‍රම පිළිබඳව අධ්‍යයනයක්

පූජ්‍ය ගම්මහේගේ වැව අමිත හිමි

කැණීම් හා පර්යේෂණ අංශය ජේතවන ව්‍යාපෘතිය, මධ්‍යම සංස්කෘතික අරමුදල

*gmmahegewewaamitha@gmail.com*

ඓතිහාසික අවධියේ සිට මෙරට පරිපූර්ණ නීති පද්ධතියක් පැවැතිය බවට සාධක රැසක් අභිලේඛන මගින් තහාවුරු වේ. වර්තමානයේ ක්‍රියාත්මක වන නිතීය කුමක් වුවත් අතීතයේ සිට සාම්ප්‍රධායික සිංහල නිතී ක්‍රමවේදයක් පැවතිය බව මුලාශ්‍රය අධ්‍යයනය තුළින් හඳුනාගත හැකි ය. පසුකාලීනව ව්‍යාප්තියට පත් වු උඩරට නීතිය, යපා පටුනේ ද්‍රවිඩයන් කෙරෙහි බලපැවැත් වු තේසවාලාම් නම් ද්‍රවිඪ නීතිය, මුස්ලිම් නීතිය යන සිංහලේ නිතී රෝමානු ලන්දේසි නීතිය හා සංකලනය විමෙන් වර්ථමාන නිතී පද්ධතිය සකස්  වී තිබේ. නඩු විභාග කිරීමේ දී මේ වැනි වු නිතීන් අනුගමනය කළ ද සාම්ප්‍රදායික ජන ජිවිතය තුළ දී නඩු විසඳී ම සඳහා විධාන ක්‍රමවේදයන් යොදාගෙන ඇත. සම්මත නිතී ක්‍රමවේදයක් පැවැතිය ද මෙරට වැසියන් ආගමික මතවාදයන් හා විවිධ විශ්වාසයන් කෙරෙහි දැඩි ඇල්මක් දක්වන හෙයින් ග්‍රාමීය සමාජය තුල නඩු විසදීම සඳහා ගම් මුලාදැනියන් විසින් විධාන ක්‍රමවේදයන් යොදාගෙන තිබේයි. වර්තමානයේ දි පවා ඇතැම් ප්‍රදේශ ආශ්‍රතව මෙම විධාන ක්‍රමවේදයන් වෙනස් වු අයුරකින් පවතින බව අධ්‍යයනයන් තුලින් මනාව තහාවුරු වේ. එම ක්‍රමවේදයන් මොනවාදයන්න හඳුනා ගැනීම මෙහි ප්‍රධාන අරමුණ වේ. මෙම පර්යේෂණයේ දත්ත රැස්කිරිම සඳහා සමාජවිද්‍යා අධ්‍යයනවලදී යොදාගනු ලබන දත්ත රැස්කිරීමේ විධික්‍රම කිහිපයක් භාවිත කරන ලදී. මෙහි දී ගුණාත්මක දත්ත රැස්කිරිම සඳහා ක්ෂේත්‍ර අධ්‍යයනය හා ක්ෂේත්‍ර නොවෙන අධ්‍යයනය යන ප්‍රධාන පර්යේෂණ ක්‍රමවේද ඔස්සේ දත්ත රැස් කරගන්නා ලදි. ඉපැරණි ශ්‍රී ලාංකේය ජන සමාජයේ නඩු විභාග කිරිමේ දී දිවුරුම් පිට විභාග කිරීම සහ භයානක පරීක්ෂාවකින් නඩු විභාග කිරිම යන ප්‍රධාන විධාන ක්‍රමවේද දෙක භාවිතයට ගෙන ඇත. මෙහි පළමු ක්‍රමවේදය නම් දෙපක්ෂයෙන් කවර පක්ෂයක් වරදකරුදැයි දේව දඬුවම අනුව නිගමනය කිරීමයි. දේවාලයේ දිවුරුම, වී ගැන දිවුරුම, කිතුලේ දිවුරුම, පොල් ගෙඩියේ දිවුරුම, මඩ ගසා දිවුරුම හා දරුවන් ගැන දිවිරීම වැනි ක්‍රම කිහිපයක් ඒ සඳහා යොදාගෙන ඇත. ජනතාවට සාධාරණය ඉටු කිරීම සඳහා අනුරාධපුර යුගයේ සිට මෙරට විධිමත් නීති පද්ධතියක් පැවතිය බවට තෝනිගල, වේවැල්කැටිය ආදී ශිලා ලේඛන මගින් තහවුරු වේ. එදිනෙදා ජීවිතේ ග්‍රාමීය ජනතාවගේ නඩු විසඳීම සඳහා එවකට සමාජයේ පාලකයන් මෙම විධාන ක්‍රමවේදයන් භාවිතා කොට තිබේ.

***ප්‍රමුඛ පදඃ*** *සාම්ප්‍රදායික විධාන ක්‍රම, ශිලා ලේඛන, අභිලේඛන*

# මී මුරේ ගම්මානයේ ජන ජීවිතයේ මූලික අංගයක් වන සම්ප්‍රදායික වී ගොවිතැන පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

කේ. ඒ. අයි. චතුරංගි, ටී. රාජපක්ෂ

ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය

*chathuish0507@gmail.com*

මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ උඩුදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටි මී මුරේ ගම්මානය සොබාදහමේ අපූර්වතම නිර්මාණයකි. සාම්ප්‍රදායික ග්‍රාමීය ලක්ෂණ වර්තමානයේ ආරක්ෂා වී පවතින ගම්මානයක් ලෙස ද මෙය ලාංකේය ජනතාවගේ අවධානයට පාත්‍ර වී ඇත. ගම්මානයේ ඇති සාම්ප්‍රදායික ග්‍රාමීය ලක්ෂණ අතරින් වී ගොවිතැන සමග බැඳුණු සාම්ප්‍රදායික ලක්ෂණ පිළිබඳ මෙම අධ්‍යයනය මූලික වශයෙන් සිදුකර ඇත. මීමුරේ ගම්මානයේ දක්නට ඇති වී ගොවිතැනේ දී යොදාගන්නා සාම්ප්‍රදායික ක්‍රම මොනවා ද? යන්න අධ්‍යයනය කිරීම මෙහි මූලික අරමුණ වූ අතර වර්තමානය වන විට සාම්ප්‍රදායික කෘෂි උපක්‍රම භාවිතයේ පවතී ද, කාලයත් සමග සිදු වී ඇති වෙනස්කම් මොනවා ද යන්න අධ්‍යයනය කිරිමත් අනෙකුත් අරමුණු වේ. ක්ෂේත්‍ර නිරීක්ෂණය සහ සම්මුඛ සාකච්ඡා මූලික කරගෙන පුස්තකාල අධ්‍යයනය ද අධ්‍යයන ක්‍රමවේද ලෙස භාවිත කරන ලදී. මීමුරේ ගම්මානයේ වී ගොවිතැන සිදුකරනුයේ හෙල්මලු සහිත ගොඩ ගොවිතැන වශයෙනි. ස්වාභාවික ජල මූලාශ්‍රයන්හි සිට ගොවි ඇල ඔස්සේ ගොවිබිම් වෙත ජලය ගෙන යයි. ඔවුහු ගොවිතැනේ දී කැතිපෝරුව, කැට පෝරුව, පෝරු ලැල්ල, කෙකි නගුල වැනි සම්ප්‍රදායික කෘෂි උපකරණ භාවිත කරන අතර සේරු අතු, ගොම පොහොර, තිත්ත මල්, පිදුරු, කැකුණ හා ගිරිසීඩියා අතු පස හා මුසුකොට බිම් සකසා ගනී. පලිබෝධ නැසීම සඳහා පොකුරු මහන් හා නා අතු සිටුවීම, මඩු ඇට කොටා දැමීම, පන්දම් ගැසීම වැනි කෙම් ක්‍රම භාවිත කරති. ගොමමැටි ගා කමත සකස් කිරීම, අළු යන්ත්‍රය ඇදීම හා මීගවයින් යොදාගෙන ගොයම් පෑගීම, ගොවිතැන් ඇරඹීමේ සිට අස්වනු නෙළා ගැනීම දක්වා අත්තම් ක්‍රමය යොදාගැනීම, අස්වැන්නෙහි අග්‍රඵලය ගෙන අඩුක්කු පිදීම, නිවසට ගෙන ආ බැත කුරුණි පෙට්ටි, රිටි මළු, ලී අටු හා වරිච්චි අටුවල ආරක්ෂාකාරීව ගබඩා කිරීම ආදී සම්ප්‍රදායික ක්‍රමවේද රැසක් මොවුහු වී ගොවිතැනේ දී අනුගමනය කරති. නමුත් මෙම ගම්මානයේ ජීවත් වන ඇතැම් පිරිස් වී ගොවිතැන සඳහා අත් ට්‍රැක්ටර්, නූතන පොහොර හා පලිබෝධනාශක වර්ග භාවිත කිරීමට ද යොමු වෙමින් සිටිති. බොහෝ ප්‍රදේශවලින් වී ගොවිතැන සඳහා අතීතයේ සිට පැවත එන සම්ප්‍රදායික ක්‍රමවේද ගිලිහී ඇතත්, මීමුරේ ජනයාගේ ජීවිතයේ මූලික අංගයක් වන වී ගොවිතැන සඳහා බොහෝ පිරිසක් සම්ප්‍රදායික ක්‍රම අනුගමනය කරන බවත්, අතීතයෙහි පැවති ගොවිතැන හා බැඳුණු ක්‍රමවේද වර්තමානය තෙක් ආරක්ෂාකාරීව පැවත එන බව ක්ෂේත්‍ර නිරීක්ෂණ සහ ක්ෂේත්‍රයේ සිදුකළ සාකච්ඡා (10ක්) මගින් හඳුනාගත හැකි විය. නමුත් මෙම ප්‍රදේශයේ ජීවත් වන ඉදිරි පරම්පරාව සංචාරක කර්මාන්තය ඔස්සේ තම ජීවිකාව සපුරා ගැනීමට යොමු වීමේ ප්‍රවනතාවක් ඇති බැවින් නුදුරු අනාගතයේ දී මෙම සාම්ප්‍රදායික වී ගොවිතැන මීමුරේ ගම්මානයෙන් ද වියැකීයාමට ඉඩකඩ පවතී.

***ප්‍රමුඛ පද:*** *මී මුරේ ගම්මානය, සාම්ප්‍රදායික ක්‍රමවේද, වර්තමානයේ දී, ජනජීවිතය, වී ගොවිතැන*

# අම්බලම් හා බැඳි ජන සාහිත්‍යය පිළිබඳ විමර්ශනයක්

ඒ. ඩී. ඒ. එල්. ඩී.සෙනෙවිරත්න[1], අයි. ජේ. සී. කේ. ඉහළගෙදර[2]

[1]මානවශාස්ත්‍ර අධ්‍යයනාංශය, [2]පාරිසරික කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය

*asithasenavirathna91@gmail.com*

පැරණි ගැමි සමාජයේ ජන ජීවිතය හා බැඳුණු සංස්කෘතිකාංගයක් ලෙස අම්බලම හැඳින්වේ. මෙම අධ්‍යයනය සඳහා දත්ත ලබා ගැනීමේදී හිඳගල ශිලා ඛණ්ඩ ලිපිය, මහාවංශය, පූජාවලිය, උම්මග්ග ජාතකය, සද්ධර්මරත්නාකරය, සංදේශ සාහිත්‍යය, ආදී ප්‍රාථමික මූලාශ්‍රය හා සිංහල විශ්ව කොෂය හා අම්බලම සහ සමාජය යන ද්විතීයික සාහිත්‍යය මූලාශ්‍රය යොදාගන්නා ලදී. අම්බලම යනු මගීන්ගේ ප්‍රයෝජනය සඳහා ප්‍රධාන මාවත් හා වෙල්යායවල් අසල තනන ලද විශ්‍රාම ශාලාව, ගිමන්හල වේ. මධ්‍යසභා, උත්තර ශාලා, ඉසිඹුහල්, යන නම්වලින් අම්බලම හඳුන්වා ඇත. අම්බලම සෑම අයෙක්ම භාවිත කළ නිසා ජන ජීවිතය සමග සුවිශේෂී බැඳීමක් පවතී. මිනිසාගේ තනිකම, මහන්සිය, නිවාගැනීමටත් තම සිතිවිලි කවියට නඟා සන්නිවේදනයට යොදාගත් නිසාම ජන සාහිත්‍යයක පදනම නිර්මාණය විය. තරුණ අඟනක් හුදකලාව අම්බලමක සිටිනු දැක තරුණයකුගේ සිතිවිලි සන්නිවේදනය කළ අවස්ථා ජන සාහිත්‍යයේ ඇත. "අල්ලාගෙන නෙරිය අතකින් කින්ද න ගේ-වසාගෙන දෙතන සළු පොටකින්ද න ගේ-හිමියෙක් නැති ගමන් යන්නේ කින්ද න ගේ-අම්බලමේ පොඩ්ඩක් නවතින්න න ගේ," සමකාලීන ජන සමාජයේ අම්බලමේ කතා වූ පැරණි ඓතිහාසික කතා ජන සාහිත්‍යයේ අන්තර්ගත ය. "අයෙක් මිසදුටු ගත්-නොයෙක් කවිනළු රසදත්-පෙර තමතමනු ගත්-රාම සීතා කථා තෙපලත්", ද "පෙර ලක්දිව නොමඳ-රජකළ රජුන්ගේ සොඳ-ගුණෙන් බඳ සිව්පද-කියති සමහර මහල්ලෝ ඉඳ" පැරණි රජවරුන්ගේ හා රාම සීතා, කතා ගැමි ජනයාගේ ජනප්‍රිය මාතෘකා වී ඇත. අම්බලම කැඩුනාට ගව්ව කොට වේද, අම්බලමේ ලෑල්ල උඩ ඉන්න කාගෙන්වත් අවසර මොටද, අම්බලමේ ලෑල්ල උඩ ඉන්න නොදුන්නා වාගේ, ආදී ප්‍රස්තා පිරුළු අම්බලම ඇසුරෙන් නිර්මාණය විය. අම්බලම ආශ්‍රයෙන් උපදේශාත්මක පද්‍ය නිර්මාණය විය. මරුට යමෙක් කළ වෛරය පහ වේ ද-නැතුවට ගජන් කෙසරිඳු තණකොළ කාවා ද-නැටුනට මතවරණ කොරහේ නාවා ද-කැඩුනට අම්බලම ඇති දුර නැති වේ ද යනුවෙනි. විටක තම හේනේ පැලේ සිටිය ගොවියාට වෙල මැද අම්බලම සිහිවී මෙසේ පැවසුහ. "මන්දාරම් උඩ ඉගිලෙන වැහි ලේ නි-ගොන්නුන්ගේ පිටට දමීමා වැනි බර හෝ නී-වෙල මැද අම්බලම තාමත් පර වේ නි-මට තනි නැත නුඹ තාමත් උලලේ නි". ගැමි සමාජයේ සිතුම්-පැතුම් හඳුනාගන්නට අම්බලම තෝතැන්නක් විය. අම්බලම හා ජන සමාජය අතර අන්‍යෝන්‍ය සම්බන්ධයක් පවතින අතර ඓතිහාසික කතා, විරහව, කාන්සිය, තනිකම යනාදී සියලුම ගැමි චින්තනයන් ඇතුළත් විය. මේ සාධකයන්ට අනුව අම්බලම ඇසුරෙන් ජන කවි, උපදේශාත්මක කවි, ප්‍රස්ථාව පිරුළු, ආදීය එකතු වීමෙන් ජන සාහිත්‍යය පෝෂණය වී ඇති ආකාරයක් නිගමනය කළ හැකිය.

***ප්‍රමුඛ පද:*** *අම්බලම, ගැමි, ජන සාහිත්‍යය, සමාජය, සංස්කෘතිය*

# ශ්‍රී ලංකාවේ සංස්කෘත අභිලේඛනවලින් හෙළිවන සමාජ හා සංස්කෘතික තොරතුරු පිළිබඳව විමර්ශනාත්මක අධ්‍යයනයක්

සූරියවැව පඤ්ඤාසිරි හිමි, කුරුවිට විජයශාන්ත හිමි, ලුණුඅටුලැවේ සුසීම සෝභන හිමි, ඉරුදෙණියේ සිරිරතන හිමි

ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය

*sooriyawewehamuduruwo@gmail.com*

සංස්කෘත භාෂාව හමුවේ සිංහල හා දෙමළ සංස්කෘතිය තුළ සිදු වූ වෙනස්කම් හා සංස්කෘතිය ගමන් කළ දිශානතීන් මැනවින් අවබෝධ කරගැනීමට සංස්කෘත අභිලේඛන පිටිවහලක් සපයයි. ලක්දිව උගත් සමාජය සංස්කෘතය මාධ්‍යය කරගත් මහායාන බුදුදහම සිය ජීවිතවලට ළං කරගෙන සිටියා සේම ඒ භාෂා මාධ්‍යය වූ සංස්කෘතය ද දැන සිටි බව අභිලේඛන ආශ්‍රයෙන් හඳුනාගත හැකිය. මෙරට සංස්කෘතිය කෙරෙහි සංස්කෘතයෙහි බලපෑම පිළිබඳව අධ්‍යයනය කිරීම මෙම අධ්‍යයනයේ අරමුණයි. දත්ත රැස්කිරිම අභයගිරි, ජේතවන, තිරියාය, වේලයික්කාර ආදී අභිලේඛන මූලික කරගනිමින් සිදුකරන ලදී. මහායාන භික්ෂූන් අනුරාධපුර යුගයේ අවසාන භාගයේ බලවත් පිරිසක් ලෙස සමාජයේ කටයුතු කළ බවත් ලක්දිව රජවරු වරින්වර ප්‍රධාන විහාර දියුණු කරමින් භික්ෂූන්ට සැලකූ බවත් අභයගිරි, ගලපාත හා ලක්ෂ්මණ සමන් දේවාල ආදි සංස්කෘත අභිලේඛන වලින් තහවුරු වෙයි. නව වන සියවස පමණ වන විට භික්ෂු සමාජයේ පරිහානිමය තත්ත්වයක් උදාවී තිබූ බව අභයගිරි, ථූපාරාම හා ජේතවන සෙල්ලිපිවල ඇතැම් තොරතුරු වලින් පැහැදිලි වෙයි. ඒ බව ස්ත්‍රී පෝෂකයන්, ඉඩම් හිමියන්, මිථ්‍යා ජීවිත, ජීවීන්, රජගෙදරට පඬුරු පාක්කුඩම් යවන්නන් ආදී වූ අසත්‍යවාදී භික්ෂු පිරිසක් පිළිබඳව සඳහන් කිරීමෙන් පැහැදිලි වේ. ත්‍රිකුණාමලය, ආනඋලුන්දාව හා තිරියාය ගිරිලිපිය වැනි ලිපි වල වෙළඳ පිරිස් හා සංචාරක පිරිස් මෙහි පැමිණ කරන ලද පරිත්‍යාගයන් හා පූජා උපහාරය ලංකාවේ ආර්ථික ඉතිහාසය පිළිබඳව කරුණු හෙළිකරයි. අනුරාධපුර අවසන් භාගයේ හා පොළොන්නරු යුගය තුළ නැගෙනහිර මුහුද හා එහි වූ වරායන් ජාත්‍යන්තර වෙළඳාම සමග බද්ධව සිටි බව තිරියාය හා ත්‍රිකුණාමලය සංස්කෘත අභිලේඛන වලින් තහවුරු වේ. එසේම එදා සමාජය තුළ වී ගොවිතැන මෙන්ම හේන් ගොවිතැන ද පුළුල්ව තිබූ බවත් වී ගොවිතැනට අමතරව ගොවිතැන් වශයෙන් හේන් ගොවිතැන ද පැවති බවට අභයගිරි ලිපිය සාක්ෂි දරයි. වේලයික්කාර ලිපිය දෙමළ ලිපියක් වන අතර එහි ආරම්භයේ සංස්කෘත පාඨයක් අන්තර්ගතය. එහි දැක්වෙන්නේ පුලස්ති නගරයේ සාදන ලද දන්ත ධාතු මන්දිරය හා ඒ අවට විහාර ආරක්ෂා කළයුතු බවය. එමගින් දෙමළ භාෂාව තුළට සංස්කෘතයේ බලපෑම පෙනීයයි. මේ ආදි වශයෙන් සමාජ, ආගමික, ආර්ථික හා දේශපාලනික කරුණු රැසක් ප්‍රකට කර ගැනීමට සංස්කෘත අභිලේඛන ආශ්‍රයෙන් හැකි වේ.

***ප්‍රමුඛ පද:*** *මහායානය, භික්ෂු සමාජයේ පරිහානිය, ආර්ථිකය, සංස්කෘත භාෂාව*

# පැදුර තුළින් සංකේතවත්වන සැමියා සහ බිරිඳ අතර පවතින ආකල්ප පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් (පැල් කවි ඇසුරින්)

ඩබ්. එම්. පී. කේ. වාසල, ඩබ්ලිව්. එච්. ඩී. එන්. ජයවර්ධන

පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, මානවශාස්ත්‍ර අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය

*djayawardhana06@gmail.com*

පාරම්පරික ගැමි සමාජයේ පැදුර ජන විඥ්ඥාණය හා ඔවුන්ගේ අත්දැකීම් ප්‍රතිනිර්මාණය වීම කෙරේ හේතු වී තිබේ. ගැමි ජීවන රටාවේ පැල් රැකීම හා බැඳුනු ජන ගායනා තුළ පැදුරට හිමිවන්නේ සුවිශේෂී ස්ථානයකි. පැල් රැකීමට යන ගොවියෙකු හා කුටුම්භයේ සිටින සිය බිරිඳ අතර පවතින ආකල්පය පැල්කවියේ සඳහන්වන පැදුර තුළින් සංකේතවත්වන බව පෙන්වීම මෙහි අරමුණ වී තිබේ. මිහින්තලේ පොතාන ගම්මානය ආශ්‍රිතව හේන් ගොවීන් පස් දෙනෙකු ආශ්‍රයෙන් ලබාගත් තොරතුරු හා පුස්තකාල ගවේෂණය තුළින් මෙම පර්යේෂණය සිදු කර තිබේ. පැල්කවි තුළින් කියැවෙන පැදුර, ගැමි ජන සමාජයේ සැමියා හා බිරිඳ අතර පවතින සම්බන්ධතාවය සංකේතවත් කරන්නේ කෙසේද, යන්න පිළිබඳව මෙහිදී විමර්ෂණය කර තිබේ. පැදුර ජන ජීවිතයේ විවිධ අවස්ථා සමඟ අර්ථාන්විතව සම්බන්ධ වී ඇත. කැලෑ හෙලි පෙහෙලි කර ගනිමින් බීජ වපුරා අස්වැන්න නෙලාගන්නා කාලය දක්වා වනසතුන්ගෙන් හා සොර සතුරන්ගෙන් එල්ලවන තර්ජනවලින් තම බවබෝග ආරක්ෂා කර ගැනීමට ගොවියාට සිදු වේ. හේනේ හෝ කුඹුරේ තාවකාලික ව ඉදිකර ගන්නා පැල තුළ තම කුටුම්භයෙන් වෙන්වී රැය පහන් කිරීමට ගොවියාට සිදු වේ. රැය පහන් වනතුරු නින්ද සීමා කර ගැනීමට වෑයම් කරන ගොවියාගේ සිතෙහි තෙරපෙන අදහස් කවියට මුසුකර ගැයීමට ඔහු සමත් වේ. පැල් රැකීමේ දී අත්‍යවශ්‍ය සාධකයක් ලෙස පැදුර භාවිත කරන අතර පැලට පැදුර ගහට පොත්තමෙන් බැදී පැවතින. "කැලේ ගොසින් ඉනි කැපුවා කැත්ත දනී- වෙලේ ගොසින් ඉණි තැබුවා නියර දනී, පැලේ ගොසින් පැල්රැක්කා පැදුර දනී- මෙදා යලේ ගිනි තැප්පා දෙවියො දනී." සෑම රාත්‍රියකම කුටුම්භයෙන් නික්මෙන සිය ස්වාමියාට රටා තබමින් පැදුරක් නිර්මාණය කිරිමට බිරිඳ කටයුතු කරයි. පිලෙහි අතුරන ලද පැදුරෙහි සෙනහසින් වෙලෙන ඇඹු සැමි දෙදෙනා රාත්‍රියේදී වෙන්ව වාසය කරයි. ගතේ සහ සිතේ වෙහෙස නිවා ගැනීමට මෙහි සැතපෙන ගොවියාට සිය බිරිඳගේ හැඟීම් එකිනෙක මනසට ඇතුලු වී කවිපද මගින් ප්‍රකාශනය වේ. "පිලේ පැදුර හේනට අරගෙන යනවා- එලා පැදුර මැස්සේ එහි සැතපෙනවා, රටා වියපු අත්දෙක මට සිහි වෙනවා- හිතේ දුකට එතකොට කවි කියවෙනවා." යම් හෙයකින් ගොවියාට සිය පැදුර අහිමි වෙතොත් සිය බිරිඳගේ සිතේ ඇතිවන ආකල්ප කෙරෙහි ගොවියා තුළ බියක් ඇතිවේ. තමාට අයත් කාර්යය පැහැර හැර වෙනත් කාර්යයක ඔහු නියලෙන්නට ඇතැයි ගෙවිලිය තුළ සැකයක් ඇතිවේ. මේ අනුව පැදුර, සැමියා හා බිරිඳ අතර පවත්නා වූ ආදරය, විරහව, සැකය, ලිංගිකත්වය, විශ්වාසය යනාදී ආකල්පයන් ට සංකේතාත්මක වටිනාකමක් ලබාදී ඇති බව නිගමනය කළ හැකි ය.

***ප්‍රමුඛ පද:*** *පැදුර, ගැමි සමාජය, පාල, කුටුම්භය, බවබෝග*

# වාර්ෂික අංකෙළි උත්සව කාලසීමාවේ ජන ජීවිතයේ සිදුවන විපර්යාසයන් (පානම්පත්තුව ග්‍රාමය ඇසුරෙන්)

ඒ. අයි. සඳමාලි, එම්. පී. සී. මල්ලිකා, එච්. ඒ. සී. එස්. හතුරුසිංහ, කේ. ඒ. එල්. පී. පෙරේරා

සමාජීය විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය

*Piumalilasitha@gmail.com*

සංස්කෘතික උරුමයේ එක් ප්‍රභේදයක් නම් අස්පර්ශිත උරුමයයි. එය වනාහි ළයෙන් හා මනසෙන් ස්පර්ශ කරනු ලබන උරුමයයි. ඇදහිලි හා විශ්වාස ද ඒ අතර දක්නට ලැබේ. අම්පාර දිස්ත්‍රික්කයේ ලාහුගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් පානම ගම්මානය කේන්ද්‍ර කර ගනිමින් වසරක් පාසා පවත්වාගෙන යනු ලබන සාම්ප්‍රදායික අංකෙළි පෙරහැර මංගල්‍යය කතරගම දේවාල පෙරහැරේ දිය කැපීමේ මංගල්‍යයට පසුව පවත්වනු ලබන්නකි. ක්‍රි.ව. 1818 ඇති වූ උඩරට කැරැල්ලේ දී පලා ආ සිංහලයින් මෙහි පදිංචි වූ බවත් එවකට පානම විසූ ජනයා අතර සම්මිශ්‍රණයක් වී මෙම ඇදහිලි හා විශ්වාස වර්ධනය වූ බව ජනයාගේ පිළිගැනීමයි. අංකෙළි මංගල්‍යයට සූදානම් වීමේ සිට එය පවත්වනු ලබන කාල සීමාව තුළදී ජන ජීවිතයෙහි ඇතිවන්නා වූ විපර්යාසයන් පිළිබඳව සමාජ විද්‍යාත්මක දෘෂ්ටිකෝණයකින් විමසා බැලීම අපගේ අධ්‍යයන අරමුණ වේ. මෙහි අධ්‍යයන ක්‍රමවේදය ක්ෂේත්‍ර ගවේෂණය, සම්මුඛ සාකච්ඡා හා දත්ත නිරීක්ෂණය මත පදනම් වේ. අංකෙළි මංගල්‍යය පත්තිනි දේවමෑණියන්ගේ දේවාශිර්වාදය, සශ්‍රීකත්වය, වසංගත රෝග නිවාරණය යනාදිය අපේක්ෂාවෙන් දින පහළොවක් මුළුල්ලේ පවත්වනු ලබන අතර අංගල්ගහේ දැමීම, කොලු හා මහා අංකෙළිය, දේවාලයට යාම, දෙවියන් ගමට වැඩම කරවීම, දියකැපීම යන විශේෂාංගවලින් සමන්විත වේ. පානම්පත්තුවේ අංකෙළිය ජන ජීවිතය හා තදින් බැඳී පවතී. විශේෂයෙන් ම සමුද්‍රාශ්‍රිත ධීවර ජනයා මාළු ඇල්ලීමෙන් වැළකී වෙනත් ආදායම් මාර්ග වෙත අවතීර්ණ වීමත් සියලු ගම් වැසියන් නිර්මාංශී ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමත් දැකිය හැකිය. වෙළඳසැල්වලින් මස්, මාළු ආදි පිළිහුඩු වර්ග සම්පූර්ණයෙන් ම ඉවත්කර පවිත්‍රතාව ආරක්ෂා කරගනී. තවද මෙකී දිනවල ගමෙහි කාන්තාවන් මාස් කිල්ලට මුහුණදී ඇත්නම් ගමින් පිටමන් කිරීමෙන් හා අවමංගල්‍යක් වූයේ නම් ගමින් බැහැරව මෘත දේහය තබා අවමංගල්‍ය චාරිත්‍ර කරමින්ද ගමෙහි පවිත්‍රතාව තහවුරු කරගනී. අවුරුදු උදාවකට සැරසෙන්නාක් මෙන් සියලු නිවෙස් පවිත්‍ර කිරීමේ කාර්යන්වල යෙදීමත් සිදුවේ. මංගල කටයුතු සහ සංවාසයේ යෙදීමෙන් වියුක්ත වීම ද විශේෂත්වයකි. මෙකී ලෞකික සුඛයන් බහිස්කරණය කරමින් පේ වෙමින් විවිධ චාරිත්‍ර-වාරිත්‍ර වැසියන් ඉටු කරනු ලබන්නේ ඉමහත් වූ දේවත්වයකිනි. එසේ වත්පිළිවෙත් නොපිරීමෙන් දේව උදහසට ලක් වී විවිධ කරදර සහ දුක් පීඩාවන්ට ගොදුරු වීමට සිදුවෙතැයි ඔවුහු දැඩි විශ්වාසයෙන් යුතුව පිළිගනිති. උක්ත කාරණාවලින් ගම්‍යමාන වන්නේ පානම්පත්තුවේ වැසියන් වාර්ෂිකව පවත්වනු ලබන අංකෙළි මංගල්‍යය හා බැඳෙමින් ඔවුන්ගේ දෛනික ජීවිතය පවා තාවකාලික පෙරළියකට පත්කරගෙන දේවාශිර්වාදය ලබා ගැනීමට උත්සුක වන බවයි.

***ප්‍රමුඛ පද:*** *පානම්පත්තුව, අංකෙළිය, අංගල්ගහ, පත්තිනි, කිල්ල*

# දේශිය සටන් කලාව රැකගැනීමෙහිලා සංස්කෘතික සංචාරණයෙහි කාර්යභාරය පිළිබඳ විමසුමක් (අංගම්පොර සටන් කලාව ඇසුරින්)

ජී. ඇම්. එස්. වී. අපෝන්සු, මහේෂි සමරවික්‍රම

පුරාවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

*sumedaviraj1@gmail.com*

සිංහලයන්ගේ සාම්ප්‍රදායික යුධ සටන් ක්‍රමයක් වන අංගම්පොර සටන් කලාවේ ආරම්භය ඈත අතීතය දක්වා දිව යන්නකි. ඒ පිළිබඳ සොයාබැලීමේදී විවිධ ජනප්‍රවාද හමුවන අතර රාවණා රජ සමයටත් ඔබ්බෙන් එහි ඉතිහාසය දිවෙන බැව් ශිල්පීය විශාරදයෝ දක්වති. අතීතයේ මෙරටට එල්ලවූ යුධ ආක්‍රමණ රැසක් හමුවේ අංගම්පොර සටන්කලාව ආක්‍රමණිකයන්ට එරෙහිව සිංහලයන් යොදාගත් බව නොරහසකි. ලංකාව යටත් කරගත් යුරෝපා ජාතීන්ට මෙරට තුළ සිය පාලනය මෙහෙයවීමේදී අංගම්පොර ශිල්පීන්ගෙන් එල්ලවූයේ ප්‍රබල බලපෑමකි. එහි ප්‍රතිඵලයක් වශයෙන් වර්ෂ 1818 ඔක්තෝම්බර් 05වන දින එංගලන්ත යටත් විජිත ආණ්ඩුව ගැසට් නිවේදනයක් මඟින් මෙම සටන් කලාව තහනමට ලක් කෙරේ. එහි ප්‍රතිඵලයක් වශයෙන් අප්‍රකට රහස් ශිල්පයක් වශයෙන් ඉතාමත් රහසිගතව පවත්වාගෙන යන ලදී. එපමණක්ද නොව මෙම ශිල්පීය කුසලතා තවදුරටත් ආරක්ෂා කිරීමේ අභිලාෂයෙන් නර්තනය තුළට මෙම මෙම සටන් ශිල්පීය ක්‍රමවේදයන් බද්ධකොට නර්තනාංග වශයෙන් පවත්වාගෙන එනු ලැබීය. එවැනි සංස්කෘතිකමය වැදගත්කමකින් යුත් මෙම සටන් සහ නර්තන ශිල්පීය ක්‍රමවේදයන් කාලයාගේ ඇවෑමෙන් අභාවයට යාමේ තත්ත්වයක් හඳුනාගත හැකි විය. ක්ෂේත්‍රයේ නියුතු ශිල්පීන්ට ප්‍රමාණවත් තරම් ආර්ථික ප්‍රතිලාභ නොලැබීම ඊට ප්‍රධානම හේතුව වශයෙන් හඳුනාගැනීමට හැකි විය. මෙම සාම්ප්‍රදායික ශිල්පීය ක්‍රමවේදයන් ආරක්ෂා කරගැනීමට සංස්කෘතික සංචාරණය යොදාගැනීමේ ශක්‍යතාවය පිළිබඳ සොයාබැලීමේ අරමුණින් මෙම පර්යේෂණය සිදුකෙරෙණි. එහිදී ප්‍රාථමික මූලාශ වශයෙන් ශ්‍රී ලංකා ගුවන්හමුදාවේ අංගම්පොර සංචිතය, කොරතොට, ඉඳිබැද්ද යන ප්‍රදේශයන්හී වෙසෙන අංගම්පොර ශිල්පීන් සහ ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් සමඟ පවත්වන ලද සම්මුඛ සාකච්ඡා තුළින් ලැබූ දත්ත මෙන්ම විෂය පිළිබඳ ලියැවී ඇති ලිඛිත ග්‍රන්ථ, ලිපි, සඟරා ආදී ද්විතීය මූලාශයන්ගෙන් තොරතුරු රැස්කරන ලදී. අංගම්පොර පිළිබඳ උනන්දුවක් දක්වන සංචාරකයන්ගෙන් ඊට විශේෂ ඉල්ලුමක් පවතින බවත් එවැනි සංචාරකයන් හා සම්බන්ධවීමට මෙම ශිල්පීන් උනන්දුවක් දක්වන බවත් කරුණු විමර්ශනයේදී හඳුනාගත හැකි විය. ඒ අනුව නව අත්දැකීමක් අපේක්ෂාවෙන් පැමිණෙන සංචාරකයාට සාම්ප්‍රදායික සටන්කලාවේ සත්‍යතාවයට හානියක් නොවන ආකාරයෙන් ප්‍රායෝගිකව හඳුන්වාදීමට නිර්දේශ කළ හැකි සරඹ සහ නර්තනාංග කොටස් කවරේද යන්නත්, සංචාරකයන් සහ ශිල්පීන් සම්බන්ධ කිරීමේදී රජයේ සහ පුද්ගලික අංශයේ කාර්යභාරය කෙබඳු ද යන්නත්, සටන් කලාව දේශීය සහ විදේශීය සංස්කෘතික සංචාරකයන්ට පිළිගැන්වීමේදී සංචාරකයන්ගේ දායකත්වය ලබා ගත හැක්කේ කෙසේද යන්නත් පිළිබඳව නිගමන රැසකට එළැඹීමට හැකි විය.

***පුමුඛ පද*** *: අංගම්පොර, සංස්කෘතික, සටන්, ශිල්පීය, කලාව*

# උඩ අළුපොද්දෙනිය ග්‍රාමයේ සාම්ප්‍රදායික කිතුල් කර්මාන්තය පිළිබඳ අධ්‍යයනයක්

කේ. පී. ලක්මාලි

මානව ශාස්ත්‍ර අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය

*lakmaligayani1993@gmail.com*

සාම්ප්‍රදායික කර්මාන්තයන් අතර දේශීය අනන්‍යතාවය පිළිබිඹු කරන්නා වූ, කර්මාන්තයක් ලෙස කිතුල් පැණි කර්මාන්තය හඳුන්වා දිය හැකිය. කිතුල් මල සකස් කරන සාම්ප්‍රදායික ක්‍රියාවලිය සුවිශේෂී ලක්ෂණ වලින් යුක්තය. කිතුල් මලක් සාදා ගැනීම පිළිබඳව දකුණු පළාතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ, කටුවන ප්‍රාදේශීය වසමේ උඩ අළුපොද්දෙනිය ග්‍රාමය ඇසුරෙන් මෙම අධ්‍යයනය සිදු කරන ලදි. මෙහි දී, කිතුල් කර්මාන්තය අතීතයේ කෙසේ සිදු වීද, වර්තමානයේ කෙසේ සිදු වන්නේ ද? යන්න පර්යේෂණ අරමුණ වේ. එහි දී කට්ටාඩිගේ පියසේන මහතා සමඟ සිදු කළ සම්මුඛ සාකච්ඡාව තුළින් මේ සඳහා තොරතුරු ලබා ගන්නා ලදි. ප්‍රථමයෙන්ම සුදුසු කිතුල් මලක් තෝරා ගත යුතුය. මෙය ගැමියන් තම අත්දැකීමෙන් හා පරම්පරානුකූල දැනුමෙන් සිදු කිරීම විශේෂත්වයකි. පසුව කරනු ලබන්නේ කැලයෙන් කිරිඳි වැල් හෝ රදලිය වැල් 15 ක් පමණ කපා වළලු සාදා ජලයේ පෙඟෙන්නට හැරීමයි. ඉන් පසු දිගු වේ වැලක් කොටස් හතරක් වන සේ තුනී පටි වන ආකාරයෙන් සුද්ද කර ගැනීම සිදු කරනු ලබයි. පසුව උණ ගසක් ගෙන එය කිතුලට තබා එකට සිටින සේ කිහිප පොලකින් බැඳ ගෙන "හැර ගැසීම" කරනු ලබයි. මින් පසු තෙලිජ්ජ ලබා ගැනීමට මල සාදා ගැනීම ගැමියන් හඳුන්වන්නේ "සුදු කැරැල්ල නිල් වීම" යනුවෙනි. මෙසේ මල කොළ පැහැයට හැරුණු පසු කිතුල් මලේ මැද හාරා "උහු බේත්" යනුවෙන් හඳුන්වන බෙහෙත ඇතුල් කරනු ලබයි. මෙය සාදා ගනු ලබන්නේ ඔවුන් සතු රහස් වට්ටෝරුවකිනි. ඒ සඳහා ගනු ලබන්නේ අබ, ගම්මිරිස්, කුරුඳු පොතු, කැප්පෙටිය පොතු, සුදු ලූණු යන ඖෂධ වර්ග එකට ඇඹරීමෙනි. මෙම ක්‍රියාවලියෙන් පසු දවස් 3ක් පමණ තිබෙන්නට හරියි. ඉන් පසු පොල් කොළ පුළුස්සා ගත් අළු, විට කන හුණු, ෂෙඩාං දෙහි නමින් හඳුන්වන නාරං වර්ගයක යුෂ ද එක් කර සාදා ගත් මිශ්‍රණයක්, මද ගින්නේ තවා ගත් පින්න කොළ, හනසු මිටියක්, ගිනි පෙට්ටියක් යොදා ගනිමින් අවසාන වශයෙන් මල සකස් කරනු ලබයි. මෙය හඳුන්වන්නේ "මල වෙලීම" යනුවෙනි. මෙහි දී මල වටා ඇති කොලපු හැර හුණු මිශ්‍රණය මල වටා තවරනු ලැබේ. පසුව හනසු මිටියෙන් මල පුච්චනු ලැබේ. මෙම ක්‍රියාවලිය අවම වශයෙන් පස් වතාවක් සිදු කර පින්න කොළ මල වටා තබා කලින් සකස් කර ගත් වේවැල්වලින් මලේ මුල සිට අගට වෙලනු ලැබේ. මේ ආකාරයට මල වෙලා වතුර නොවදින සේ වසා තබනු ලබයි. මින් දවස් දෙකකට පමණ පසු තෙලිජ්ජ ලබා ගත හැකිය. මෙය හඳුන්වන්නේ "කඳුල පෙරීම" යනුවෙනි. ඉන් පසු දවසට හතර වතාවක් පමණ කැපීමෙන් තෙලිජ්ජ ලබා ගත හැකිය. තෙලිජ්ජ ලබා ගැනීමෙන් පසු වේල් දෙකක්, තුනක් එකතු කර උණු කරනු ලැබේ. කෙසේ වුව ද, තරුණයන් කිතුල් කර්මාන්තය පිළිබඳව නොදැන සිටීම, මේ සඳහා අවශ්‍ය කරන දේශීය ද්‍රව්‍ය හිඟකම (උදාඃ ෂෙඩාං දෙහි), කිසිදු අනුග්‍රහයක් නොලැබීම, අකුණු නිසා කිතුල් විනාශ වීම, සීනි මිශ්‍රිත පැණි සඳහා පවතින ඉල්ලුම යනාදිය නිසා කර්මාන්තය අභාවයට යමින් පවතී.

***ප්‍රමුඛ පදඃ** කිතුල් මල, වේවැල, හනසු මිටිය, පින්න කොළ*

# සිංහල ජන ජීවිතයේ හා සංස්කෘතියේ එන අලුත් සහල් මංගල්‍යය නම් මහා ගොවි පිළිවෙත පිළිබඳ විශ්ලේෂණාත්මක අධ්‍යයනයක්

එන්. සී. මධුෂානි

පේරාදෙණිය විශ්වවිද්‍යාලය

*chathurimadhushanink@gmail.com*

වී ගොවිතැනේ මුල සිට අගදක්වා වූ සෑම කටයුත්තක්ම බුදුන්, දෙවියන් පෙරදැරි කරගෙන සිදු කිරීම විශේෂ ලක්ෂණයකි. කෙත, කමත, වැව, දාගැබ ඇසුරින් වැඩුණු සිංහල කෘෂිකාර්මික ජන සංස්කෘතිය වප්මගුලෙන් ආරම්භ වී අගසස් දානයෙන් අවසන් වන සද්චාරිත්‍ර රැසක එකතුවකි. සශ්‍රීකත්වය පතා සිදු කරන අලුත් සහල් මංගල්‍යයේ ජාතික වැදගත්කමත්, ඊට හිමි රාජ්‍යය අනුග්‍රහයත් අධ්‍යයනය කිරීම මෙහි අරමුණ විය. අධ්‍යයන ක්ෂේත්‍රය වශයෙන් මහනුවර දළදා මාළිගයේ අලුත් සහල් මංගල්‍යය ද ඊට සම්බන්ධ ස්වාමීන් වහන්සේලා, දේවාලභාර කපු මහත්වරුන්, දියවඩන නිලමේතුමන්, ගොවිජන සේවා කොමසාරිස්තුමන්, මෙන්ම අලුස්සාල් මංගල්‍යයට සහභාගීවන ගොවි මහතුන් ඇතුළු 23 දෙනෙකුගෙන් යුතු නියදියෙන් සම්මුඛ සාකච්ඡා ඔස්සේ ප්‍රාථමික දත්තද, ග්‍රන්ථ, පුවත්පත්, සඟරා ඔස්සේ ද්විතීයික දත්තද රැස්කර විස්තරාත්මක විශ්ලේෂණය ඔස්සේ නිගමනවලට එළඹුණි. අධ්‍යයන සොයාගැනීම් අතර අලුත් සහල් මංගල්‍යය යනු රාජ්‍ය අනුග්‍රහය ලබන පූජා මංගල්‍යයක් බව පැහැදිළි විය. සංස්කෘතියෙන් සුපෝෂිත මෙම මංගල්‍යය ප්‍රදේශයෙන් ප්‍රදේශයට විවිධත්වයක් ගෙන තිබේ. අලුත් සහල් මංගල්‍යය සිංහල ජන කවියටද වස්තු බීජ සපයා තිබේ. තවද අලුත් සහල් මංගල්‍යය ගොවිතැන ආශ්‍රිත පුද පූජා රාශියක්ද ඇතුළත්ව සිදු කරන්නකි. මින් ගොවිතැනේ ආරක්ෂාවත් සශ්‍රීකත්වයත් අපේක්ෂා කරයි. එමෙන්ම එය අදටත් බුදුන් දෙවියන් පිළිබඳව වන අචල විශ්වාසය, භක්තිය පෙන්නුම් කරන පූජනීය මංගල්‍යයක් බවද අධ්‍යයනය තුළින් අනාවරණය විය. කන්ද උඩරට ගොවි ජනතාව ශ්‍රී දළදා වහන්සේ වෙතත්, නුවර කළාවියේ ගොවි ජනතාව අනුරාධපුර ජය ශ්‍රී බෝ සමිඳුන්ටත් මේ පූජෝපහාරය පවත්වනු ලබයි. නරේන්ද්‍රසිංහ රජු දවසේ පටන් වත්මන් මෛත්‍රීපාල සිරිසේන ජනපතිවරයා දක්වා නොකඩවා වාර්ෂිකව රාජ්‍ය අනුග්‍රහය ඊට හිමිවන අතර බුදු සමය තුළින් ලද මෙම ශික්ෂණය නිසා අදටත් ගැමි ජනතාව තමන් ලද අස්වනු වලින් අග්‍ර ඵලය තෙරුවන් උදෙසා පූජා කිරීමට පෙළඹ ඇත්තේ අතීත රජ දරුවන් විසින් සිදු කළ මෙම මහගු ක්‍රියාව හේතුවෙනි. මෙවර අනුරාධපුර ජය ශ්‍රී මහ බෝ සමිඳුන් අභියසදී අගසස් දානය සිදු කරන ලදී. ඊට විවිධ සංස්කෘතිකාංග ද එක් වූ අතර ස්වාමීන්වහන්සේලා, ජනපති, ඇමතිවරු ඇතුලු ගොවි ජනතාවගේ සහයෝගයෙන් විචිත්‍රවත්ව මෙවර අගසස්දානය පූජා කරන ලදී. නූතනය විද්‍යාව හා තාක්ෂණය අතින් කෙතරම් පොහොසත් වුවත්, බොහෝ සංස්කෘතික දායාදයන් අප අතින් ගිලිහී ගියත් අලුත් සහල් මංගල්‍යය යනු අදටත් නොනැසී පවතින සංස්කෘතික අංගයක් බවට පත් වීමට ප්‍රධානම හේතුව වන්නේ ඊට ලැබෙන රාජ්‍ය අනුග්‍රහය බව නිගමනය කළ හැකිය.

***ප්‍රමුඛ පදඃ*** *ගොවීන්, අලුත් සහල් මංගල්‍යය, සශ්‍රීකත්වය, රාජ්‍ය අනුග්‍රහය, සංස්කෘතික වටිනාකම්*

# Folk Economics in Sri Lanka

H. K. Liyanage

University of Sri Jayewardenepura

*kenisha.liyanage@gmail.com*

Folk economics is the intuitive economics of naïve people that have no knowledge about economics and their perceptions of the economic attributes. The notions of our ancestors, their intuitive decisions and conclusions on the government interventions and its influence on people's income and expenditure form part of folk economics. Folk economics helps to analyse the perceptions of the common people in Sri Lanka and how they see the economy based on the decisions of the politicians appointed by the people. The objective of this study is to investigate how the common people in Sri Lanka think about the economy and their notions on the fluctuations of behavioural variable that affects people's life style in the economy. The study focused on selected economic policies and analysed different individuals' perceptions on the recently implemented economic policies. The recent changes in economic variables such as prices and introduction of price mechanisms by the government were studied and people's perceptions were analysed based on the given responses. The majority of the people believed that such increase in prices and introduction of price mechanisms are due to the corruption level of the country. There is also a group of people that believed that the decrease in prices before elections and increase in prices after elections are to influence people in voting behaviour, while some did not identify this pattern. The study shows that there are three groups in the Sri Lankan society based on their level of economic knowledge. The first group do not have much knowledge of economics, do not see the broader picture and follow folk economics notions. The second group that have some idea about economics see somewhat of a big picture in medium run. The third group have intensive economics knowledge, see a broader picture and understand how each variable correlates with other behavioural variables. Based on the findings, it can be concluded that folk economics can be used to analyse and understand beliefs and choices of one segment of Sri Lankan society.

***Keywords:*** *Folk economics, Sri Lankan economy, Folk theories*

# The Traditional Military Knowledge of Sri Lanka is disclosed through Randeniwela Battle (The Concept of "Core Functions of War")

T. Witharana

Sri Lanka Military Academy, Diyathalawa

*thusharawith@gmail.com*

In 1594 and 1603, Portuguese failed to invade the Kandyan Kingdom and over the next couple of decades, they adopted a different kind of strategy to deter the kingship of Kandy. In 1630, according to the strategic requirement of King Senarath, the Portuguese were to be attracted towards the favourable upcountry via Uva and attacked. Basically, this study is a secondary data based battle analysis and its main objective is to derive the traditional military knowledge by analysing Randeniwela battle. The researcher has used the military concept of "Core Functions" to analyze the battle. Though the Portuguese failed in all stages of this concept, Kandyans were able to achieve the success of the battle in the following aspects: 1. Find - Highly succeeded in locating, identifying and assessing the enemy. 2. Fix - Highly succeeded in depriving the enemy from his goal. 3. Strike - Succeeded in manoeuvre and direct action. 4. Exploit- Succeeded in seizure of opportunity to achieve the goal. According to the analysis, the Kandyan Army was able to accommodate all the above aspects due to appropriate planning, application of local tactics and the practical knowledge of the Kandyan geography. When overviewing the present day military concept, "Core Functions" Kandyans could prove themselves that the above key stages are insufficient to perform better in a battlefield. More importantly, Kandyan force through Randeniwela battle displayed that their military knowledge is more advanced than that of the modern day military which is based on the concept of "Core Functions". Thereby, the study proposed a new military concept of "Core Functions of War" against "Core Functions" having included the following: Action – 1. Read, 2. Control, 3. Attack, 4. Achieve. Allow – 1. Let enemy to read 2. Let enemy to control 3. Let enemy to attack 4. Let enemy to achieve.

***Key words:*** *Traditional military knowledge, Battle of Randeniwela, Kandyan kingdom, Functions of war, Core Functions of war*

# ගිං ගඟ ආශ්‍රිත ජන ජීවිතය හා බැඳුණු සාම්ප්‍රදායික ධීවර සංස්කෘතිය වෙනස් වී ඇති ආකාරය පිළිබඳ මානවවිද්‍යාත්මක අධ්‍යයනයක්

ඕ. කේ. එන්. දමයන්ති , එන්. එම්. කේ. තක්ෂිලා

රුහුණ විශ්වවිද්‍යාලය

*nisansala.d.opatha@gmail.com*

ගිං ගඟ ආශ්‍රිතව ගොවිතැන, කිතුල් මැදීම, මැටි කර්මාන්තය ආදී කර්මාන්තයන් හා බැඳුණු සංස්කෘතීන් හඳුනා ගැනීමට හැකි අතර එම සංස්කෘතීන් අතර ධීවර කර්මාන්තය හා බැඳුණු උප සංස්කෘතියක් හඳුනාගත හැකිය. මෙම ධීවර උප සංස්කෘතිය තුළ ධීවර ජන ඇදහිලි, භාෂාව, චර්යාරටාව, සිරිත් විරිත්, යාතු කර්ම හා අභිචාර විධි දැකිය හැකි වීම සුවිශේෂී වේ. මෙම අධ්‍යයනයේ මූලික පරමාර්ථය වන්නේ, ගිං ගඟ ආශ්‍රිත ජන ජීවිතයේ සාම්ප්‍රදායික ධීවර සංස්කෘතිය පිළිබඳ අධ්‍යයනය කිරීමයි. අධ්‍යයන ප්‍රදේශය ලෙස, ගාල්ල දිස්ත්‍රික්කයේ රත්ගම, පිටිවැල්ල, බූස්ස, දොඩන්දූව, කුමාරකන්ද ප්‍රදේශ තෝරා ගන්නා ලදි. මෙහි දී, ප්‍රපංචවේදී ක්‍රමවේදය භාවිතා කරනු ලැබූ අතර ප්‍රාථමික දත්ත රැස් කිරීමේදී සම්මුඛ සාකච්ජා, ප්‍රත්‍යක්ෂ අධ්‍යයන ක්‍රමය, නිරීක්ෂණ ක්‍රමවේදය භාවිත කරන ලදී. දිවිතීයික දත්ත රැස් කිරිමේදී කෘතීන් හා අන්තර්ජාලය භාවිත කරන ලදි. මෙහිදී සොයාගත් දත්තවලට අනුව සාම්ප්‍රදායික ධීවර කර්මාන්තය හා යාන්ත්‍රික ධීවර කර්මාන්තය ලෙස කොටස් දෙකක් හඳුනා ගැනීමට හැකි වූ අතර සාම්ප්‍රදායික ධීවර කර්මාන්තයේ දී ඔරු තෙප්පම්, වල්ලම්, පාරු, කට්ටුමරම් හා පඩම් යන නම් වලින් හැඳින්වෙන යාත්‍රා ඇසුරෙන් මසුන් ඇල්ලීම සිදුකරයි. ගොඩ මුහුදේ දැල් එලීම, මාදැල් ඇදීම ආදී ක්‍රමයන් තුළින් මසුන් ඇල්ලීම සිදු කරයි. සාම්ප්‍රදායික ධීවර කර්මාන්තය හා බැඳුණු භාෂා රටාවක් හඳුනාගත හැකිවන අතර මරක්කලේ, තෙප්පම, අලුයම්පොළ, මුහුදුපත්ත, ඇම්කුඩය, ජාලය, කෝසු කිරීම ආදි ලෙස සුවිශේෂී භාෂා රටාවක් හඳුනාගැනීමට හැකි අතර ධීවර ජන ජීවිතය හා බැඳුණු ජන සාහිත්‍යාංගයක් ලෙස කාව්‍යමය සාහිත්‍ය ප්‍රධාන වී ඇත. නමුත්, වර්තමාන සමාජයේ මෙකී සාම්ප්‍රදායික තත්ත්වය ක්‍රමයෙන් වියැකී ගොස් නවීන යන්ත්‍රෝපකරණවලට යොමු වී ඇති බව අනාවරණය විය. මීට අමතරව ධීවර කර්මාන්තය හා බැඳුණු අවදානම් තත්ත්වයන්ගෙන් මිදීම සඳහා ඔවුන් විසින් එම ප්‍රදේශයට අනන්‍ය වූ ඇදහිලි, විශ්වාස, පුද සිරිත් අනුගමනය කරනු ලබන අතර කළුවැදි අඳුන, ගම්මඩු පූජාව වසරකට වරක් මුහුදට අරක්ගත් සියලුම දේවතාවරුන් සහ යක්ෂයන් උදෙසා මෙම පූජාවක් පවත්වනු ලැබේ. මෙහිදී කිරි ඉතිරවීම, පළතුරු, කැවිලි වර්ගද යොදාගනිමින් ආරක්ෂාව හා මාළු බහුලව අල්ලා ගැනීමේ බලාපොරොත්තුවෙන් පූජා පවත්වනු ලැබේ. මෙම සියලු කාරණා අවසානයේ ගෝලීයකරණය, නවීකරණය, තාක්ෂණයේ දියුණුව ආදී ලක්ෂණ නිසා සාම්ප්‍රදායික ධීවර කර්මාන්තය තුළ දැකිය හැකි ලක්ෂණ ක්‍රම ක්‍රමයෙන් යාන්ත්‍රික ධීවර කර්මාන්තය කෙරෙහි යොමු වීම හඳුනාගත හැකි විය.

***ප්‍රමුඛ පදඃ*** *සාම්ප්‍රදායික ධීවර කර්මාන්තය, ධීවර සංස්කෘතිය, යාන්ත්‍රික ධීවර කර්මාන්තය, ගෝලීයකරණය*

# සමාජ විපර්යාසයේ සංක්‍රාන්තික අවධියක පසුවන කටුපොත පාරම්පරික කුඹල් ග්‍රාමීය සමාජ ව්‍යුහය පිළිබඳ අධ්‍යයනයක්

එන්. එස්. යු. නැලිගම, පි. එන්. එම්. සමරතුංග

පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය

*sajirauneligama@gmail.com*

ක්‍රි.පු තෙවැනි සියවසේ ශ්‍රී මහා බෝධිය මෙරටට වැඩමවන අවස්ථාවේදි පැමිණි දහඅට කුලයක ශිල්පීන් සමඟ "කුම්භකාරක" ශිල්පීන් ද පැමිණි බව මහාවංශයේ තොරතුරු සඳහන් වේ. කුඹල් කර්මාන්තයේ යෙදෙන්නා අතීතයේ දි කුම්භකාරක යනුවෙන් හඳුන්වා ඇති අතර 'කුම්භය' යනු කළ ගෙඩියයි. 'කාර' යනු කරවන්නාය. උක්ත පර්යේෂණය මඟින් පාරම්පරික කුඹල් සමාජයක් වන කටුපොත ග්‍රාමීය ජන ජීවිතය නූතන සමාජ විපර්යාසයන් හමුවේ සංක්‍රාන්තිමත් අවධියක පසු වන්නේ කෙසේද යන්නත් එය කොතෙක් දුරට තත් කර්මාන්තයේ හා ජන ජීවිතයේ පැවැත්මට බලපා තිබේද යන්නත් අධ්‍යයනය කිරීම අරමුණ කර ගන්නා ලදි. මේ සඳහා සාහිත්‍ය මූලාශ්‍ර අධ්‍යයන හා ක්ෂේත්‍ර ගවේෂණයේදි ඍජු නිරීක්ෂණයෙන් හා කර්මාන්තයේ යෙදෙන සියලු සාමාජිකයන් සමඟ සම්මුඛ සාකච්ඡා මාර්ගයෙන් දත්ත රැස් කිරීම සිදු කරන ලදි. අනුරාධපුර ත්‍රිකුණාමලය පාරේ මහකනදරාව වැව අසල වේලන්කුලම හංදියේ සිට 5km දුරින් කටුපොත ග්‍රාමය පිහිටා තිබේ. පෙර සමයේ බහුතරයක් පිරිස කුඹල් කර්මාන්තයේ නියැලි ඇතිමුත් වර්තමානයේ ගැමි සමාජ ජනගහණයෙන් 10%ක ප්‍රතිශතයක් පමණක් අඛණ්ඩව මෙම කර්මාන්තයේ නියැලේ. වැඩිහිටි පරම්පරාව මෙම කාර්‍යයෙහි නිරත වූවත් පසු පරම්පරාවේ පිරිස කුඹල් කර්මාන්තය අත්හැර වෙනත් වෘත්තීන් වල යෙදීම හදුනාගත හැක. ශිල්පයේ නිපුණ බවත් කාර්යයයෙහි නියැලීමෙන් ලැබුණු විශේෂීකරණය හා ඉල්ලුමට සරිලන සැපයුම හේතුවෙන් කටුපොත කුඹල් කර්මාන්තයේ යහ පැවැත්මට හේතු වී තිබේ. වර්තමානය වන විට ඔවුන්ගේ සාම්ප්‍රදායික නිෂ්පාදන පමණක් නොව ගෑස් වළං, විසිතුරු භාණ්ඩ වැනි නව ඉල්ලුම් භාණ්ඩ ආදිය නිෂ්පාදනය කළ ද අතරමැදියන්ගේ ක්‍රියාකාරිත්වය හේතුවෙන් ලැබෙන ආදායම ප්‍රමාණවත් නොවන හෙයින් කුටුම්භ ආර්ථිකයට එකී විෂමතාව තදින් බලපා තිබේ. කිරල මැටි ලබා ගැනීමේ හා ප්‍රවාහනයේදී රජයේ නව නීති රෙගුලාසි වල බලපෑම හා සාම්ප්‍රදායික සකපෝරුවේ කාර්ය අතහැර නූතන කාර්‍යක්ෂම යාන්ත්‍රික මෙවලම් කරා සියලු ගැමියන් යොමු වීම හදුනාගත හැකි වූවත් ඒවා නඩත්තු කිරීමේ දැනුම ගැමියන් සතුව නොමැති බව පෙනේ. පෙර පරම්පරාවේ විවාහ සිරිත් ඔවුන්ගේ කුඹල් කුල අතර පමණක් සිදු වුවද වර්තමානයේ එවැනි තත්වයක් හඳුනාගත නොහැක. ග්‍රාමීය විශ්වාස හා ඇදහිලි ගිලිහී ගොස් ඇති අතර කර්මාන්තය හා බැඳුණු පාරිභාෂික වචන හා ජන වහර පිළිබඳව අවබෝධයක් ඇත්තේ ගැමියන් අතලොස්සකට පමණි. මේ ආකාරයෙන් සාම්ප්‍රදායික කුඹල් ජන ජීවිතයේ පෙර පැවති සම්ප්‍රධායන් හා ඔවුන් වටා බද්ධ වු සමාජ සංස්කෘතික සංරචක, ආර්ථික රටාව, නිෂ්පාදන ක්‍රියාවලිය නූතන තාක්ෂණය හා සමාජ විපර්යාසයන් හමුවේ සංක්‍රාන්තික අවධියක පසු වන ආකාරය හඳුනාගත හැක.

***ප්‍රමුඛ පදඃ*** *කටුපොත, කුඹල් ජනතාව, සමාජය, සංක්‍රාන්තිය*

# සිලප්පදිකාරම් කතුවරයාගේ මූලික අරමුණ හුදු දේව විශ්වාසයක් සමාජයේ පතළ කිරීමද? සිලප්පදිකාරම් ඇසුරෙනි

එම්. බී. දිල්හානි

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

*bhagyadilhani1@gmail.com*

දෙමළ සාහිත්‍යය ඉතිහාසය සංග සාහිත්‍යය, පශ්චාද් සංග සාහිත්‍යය, පල්ලව හා චෝළ සාහිත්‍යය වශයෙන් කොටස් කිහිපයකින් යුක්තය. පද්‍ය පාද 3 සිට 782 දක්වා දීර්ඝ ඡන්දස් සහිත ගීවලින් යුක්ත මුල්කාලීන සංග සාහිත්‍යයට වේදිකාවන්හි ගායනා කළ ජන ගී මූලාශ්‍රය විය. එකී ජන ගී, තනි කාව්‍යයක් වශයෙන් නිර්මාණය වූ බවට සාධක මෙම යුගයෙන් හමු නොවේ. දීර්ඝකාලීනව පැවති ජන ගී සම්ප්‍රදායට නවමු වෙනසක් ඇතිවූයේ පශ්චාද් සංග සාහිත්‍යය යුගයේදී සිලප්පදිකාරම් නම් කාව්‍යය රචනා වීමෙන් අනතුරුවයි. සිලම්බු හෙවත් පා සලඹ මුල් කර ගනිමින් රචිත මෙම කාව්‍යයේ කතුවරයා ඉලංගෝවඩිහල් ය. ඉන්දියාව, ශ්‍රී ලංකාව වැනි රටවල 'පත්තිනි' නමින් වන්දනාවට පාත්‍ර වූයේ සිලප්පදිකාරම් කාව්‍යයේ ප්‍රධාන චරිතය වන කන්නගී නමැත්තියයි. කතුවරයා හුදෙක් දේව විශ්වාසය පතළ කිරීම පමණක් අරමුණු කර ගනිමින් කාව්‍යය රචනා කළේද යන්න මෙහිදී මතු වූ ගැටලුවකි. ඒ අනුව කවියාගේ සැබෑ අරමුණ කුමක් වීද යන්න පිළිබඳ අධ්‍යයනය මෙහි පර්යේෂණ අරමුණු විය. මෙම අධ්‍යයනය සඳහා මූලික ප්‍රාථමික මූලාශ්‍රය වූයේ සිලප්පදිකාරම් කෘතියයි. ඊට අමතරව ද්විතියික මූලාශ්‍ර ලෙස පත්තිනි ඇදහිල්ල පිළිබඳ පළ වූ පුවත්පත් ලිපි පිළිබඳ අධ්‍යයනය කෙරුණි. ඉලංගෝවඩිහල් චේර රාජ්‍යයේ රජු (සොයුරා) සමග දිනක් සංචාරයේ යෙදෙන විට කොහොඹ ගසක් යට සිටි කාන්තාවක් දින දහහතරක් නිරාහාරව හිඳිමින් මිය ගිය පුවතක් අසන්නට ලැබෙයි. අසල සිටියවුන්ට ඇය පවසා ඇත්තේ 'තමා සැමියා අහිමි කරගත් පව්කාරියක' වන බවයි. මෙම සිදුවීම පාදක කර ගනිමින් ඉලංගෝවඩිහල් සිලප්පදිකාරම්හි කන්නගී නමැත්තිය ප්‍රතිනිර්මාණය කරයි. පැරණි කාලයේ දෙමළ රට පාණ්ඩ්‍ය, චේර, චෝළ ලෙස කොටස් තුනකට බෙදී පැවතුණි. සංග සාහිත්‍යය යුගයේදී තම මව්බිම චේර, චෝළ හෝ පාණ්ඩ්‍ය යනුවෙන් විනා තමිල්නාඩුව ලෙස දුටු එකඳු කවියෙක් හමුවන්නේ නැත. නමුත් ඉලංගෝවඩිහල් තමිල්නාඩුවේ මිනිසුන් හා එහි පරිසරය එකම ඇසකින් දැක වර්ණනා කරයි. කාව්‍යයේ එන කන්නගී චෝළ දේශයේ උපන්නීය. විවාහ වී පාණ්ඩ්‍ය දේශයේ ජීවත්වන්නී අවසානයේ කීර්තියට පත්වන්නේ චේර රටේය. මෙම සිදුවීම් පාදක කර ගනිමින් කවියා අපූරු ලෙස ත්‍රිත්ව රාජ්‍යයම එකම බැම්මකින් බැඳලයි. එසේ බලන කල ඉලංගෝවඩිහල්ගේ සැබෑ අරමුණ වූයේ හුදු දේව විශ්වාසයක් සමාජ ගත කිරීම නොව සියලු මිනිසුන් එක්ව සිටීමේ ධර්මතාව බව නිගමනය කළ හැකිය.

***ප්‍රමුඛ පදඃ*** *ඉලංගෝවඩිහල්, කන්නගී, මහා කාව්‍යය, සංග සාහිත්‍යය, සිලප්පදිකාරම්*

# ගිහි ජීවිතය සාර්ථක කරගැනීම විෂයෙහි සේඛියා ධර්මයන්ගේ උපයෝගීතාව පිළිබඳ අධ්‍යයනයක්

එච්. ඩී. යූ. පී මධුෂානි

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

*urreshmadu@gmail.com*

ප්‍රාතිමෝක්ෂ ශික්ෂාවන් අතර සේඛියා ධර්මවලට හිමිවන්නේ ප්‍රමුඛස්ථානයකි. සේඛියා යන්නෙහි සරල අදහස හික්මීමයි. භික්ෂූන් වහන්සේලා විසින් එදිනෙදා සිදුකරන දෛනික ක්‍රියාකාරකම් තුළ මනා ශික්ෂණයක් සහ ප්‍රසන්නතාවයක් ඇති කිරීමේ අරමුණින් දේශිත සේඛියාවන් තුළින් සුපේශල ශික්ෂාකාමී පැවිදි ජීවිතයක් සඳහා අවැසි පදනම සකසනු ලබයි. කිසියම් පුද්ගලයෙකුගේ ශිෂ්ටත්වය හැඳියාව පෙන්නුම් කරනු ලබන ප්‍රධානම සාධකය වන්නේ ඒ පුද්ගලයාගේ පැවැත්මයි. මෙම කරුණ ගිහි පැවිද දෙපාර්ශ්වය සඳහාම එකලෙස අදාළ කරගත හැකි කරුණකි. බුදු දහමෙහි දේශිත සේඛියා ධර්ම මෑත කාලවකවානුව දක්වා සාම්ප්‍රදායිකව පරම්පරාවෙන් පරම්පරාවට පැමිණි ඥාන සම්භාරයක් ලෙස සැලකිය හැකි අතර එමඟින් සැබෑ ලෙසම හැඩගස්වනු ලබන්නේ භික්ෂූන් වහන්සේලාගේ අල්පේච්ඡතාව ප්‍රමුඛ කොටගත් දැහැමි දිවි පෙවෙතයි. ඒ ආකාරයෙන් භික්ෂූන් වහන්සේලාගේ කායවාක් සංවරය ඇතිකිරීමේ අරමුණින් පමණක් දේශිත සේඛියා ධර්මයන් ගිහි ජීවිතයේ පැවැත්ම සංවිධිත කරලීම විෂයෙහි උපයෝගී කරගත හැකිද යන්න අධ්‍යයනය කිරීම මෙම අධ්‍යයනයේ අරමුණ විය. මෙම අධ්‍යයනය ද්විතීයික මූලාශ්‍ර මත පදනම්ව සිදුකරන ලදි. සේඛියා සික පදයන් හැත්තෑපහකි. එම ශික්ෂා පද විනය පිටකයේ පාචිත්තිය පාළිය කොටසේ භික්ඛු විභංගයේ සේඛියා කාණ්ඩයේ අන්තර්ගත වේ. සේඛියා ශික්ෂාපද වර්ග හතක් යටතේ බෙදා දක්වා ඇත. ඇඳීම පෙරවීම, ගමන බිමන, පිණ්ඩපාත, ආහාර ගැනීම භාවිතය සඳහා පනවා තිබෙන්නාවූ ශික්ෂා පදයන් මෙන්ම භික්ෂූ ජීවිතයේ පැවැත්ම සංවිධිත කරලීම විෂයෙහි වැදගත් වන කරුණු කාරණා රැසක් සේඛියා ධර්මයන්හි ඒ ඒ වර්ගය තුළ අන්තර්ගත කර ඇත. සේඛියා වූ කලී සෘජුවම සම්බන්ධ වන්නේ සදාචාරය හා සමඟය. සේඛියා තුළින් අර්ථගන්වන්නේ භික්ෂුවකගේ ජීවිතයේ විනය හා බැඳුණු සදාචාරාත්මක පසුබිමය. ගිහි ජීවිතයේ සංවර බව ඇති කරනු වස් සාම්ප්‍රදායිකව මුඛ පරම්පරානුගතව පැමිණි ඇතැම් කරුණු අදටත් අප සමාජයේ ශේෂව පවතී. යහපත් සදාචාරාත්මක පැවැත්මක් අපේක්ෂා කරමින් දේශිත සේඛියා ශික්ෂාපදයන් තුළින් ගිහි ජීවිතයේ අර්ථපූර්ණ බව උදෙසා උපයෝගී කරගත හැකි ශික්ෂාපදයන් එම විනය ශික්ෂාවන් තුළ අන්තර්ගත වන බව මෙම අධ්‍යයනයේ දී පැහැදිලිවම අවබෝධ කරගත සේඛියා පිළිබඳ කළ වර්ග කිරීමට අනුව පළමුවන, දෙවන හා තුන්වන වර්ගීකරණයන් ඇඳීම පෙරවීම, ගමන බිමන යනාදි ඇවතුම් පැවතුම් විෂයෙහි සංවරභාවයක් ඇති කිරීමේ අරමුණින් භික්ෂූන් වහන්සේලා උදෙසා දේශිත ශික්ෂාපදයන් වේ. මෙහි සිව්වැනි වර්ගය වන්නේ සක්කච්ච වර්ගයයි. භික්ෂූන් වහන්සේලා උදෙසා ආහාර ගැනීම සම්බන්ධයෙන් වන උපදෙස් මාලාවක් එහි සඳහන් කර ඇත. ඒ අනුව, සිහි ඇතිව පිඬු වළඳමියි හික්මිය යුතුය, බතේ මුදුනෙන් අනා පිඬු නොවළඳමියි හික්මිය යුතුය, ගරහනු කැමතිව අනුන්ගේ පාත්‍රය දෙස නොබලමියි හික්මිය යුතුය යනුවෙන් දක්වා ඇත. පස්වැනි වර්ගය වන කබල වර්ගය තුළත් ආහාර ගැනීම සම්බන්ධයෙන් වන ශික්ෂාවන් අන්තර්ගත කර ඇත. බත් පිඬ මුවට ළං වන තුරු මුව නොඇරිය යුතුය. බෞද්ධ විනයෙහි පැවත එන සාදාචාරාත්මක වටිනාකමක් සහිත මෙවන් ආචාරධර්ම පද්ධති බෞද්ධ ජන සමාජයේ සදාචාරාත්මක හරයන් වඩාත් සංවිධිත කරලීම උදෙසා උපස්ථම්භක වී ඇති බව අවබෝධ කරගත හැකිය.

***ප්‍රමුඛ පද:*** *ප්‍රාතිමෝක්ෂය, සේඛියා, විනය, අල්පේච්ඡතාවය, සංවරය*

# සිංහල විවාහ ක්‍රමයන්හි වත්මන් තත්වය (පුල්එළිය ගම්මානය ඇසුරින්)

කේ. පී. මදුශංඛ, එල්. එච්. එච්. කුමුදුමලී, එස්. සමරසේකර

මානව විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

*prasannamadu.pm.@gmail.com*

සිංහල සමාජය හා සංස්කෘතිය විකාශනය දෙස බැලීමේදී පරම්පරානුගත පුද්ගල සබඳතා වැදගත්ය. වර්ගයා බෝ කිරීමෙහි කායික විද්‍යාත්මක මෙන්ම සමාජ හා සංස්කෘතික වශයෙන් වැදගත්කමක් ඇති ද්වාරකර්මයක් වන විවාහය එහි පදනමයි. සංස්කෘතිකව වෙනස් ස්වරූපයක් ගන්නා විවාහය සෘජුවම අදාල සමාජයේ සංස්කෘතිය විදහා දක්වයි. ලිංගික සබඳතා පැවැත්වීමට, දරුවන් බිහිකිරීමට, පවුල් ඒකකයක් වශයෙන් බාහිර හා අභ්‍යන්තර සබඳතා පවත්වමින් ජීවත් වීම සඳහා සමාජයෙන් අවසර ලබා දීමක් ලෙස විවාහය හඳුනා ගත හැක. සිංහල සමාජයේ ක්‍රියාත්මක වන විවාහ ක්‍රමයන් දෙස අවධානය යොමු කිරීමේදී පවුලේ ධනය, බලය තර කරගනිමින් පරම්පරාව ඉදිරියට ගෙනයෑම මූලික කරගෙන ඇත. අතීතයේ පැවති සිංහල විවාහ ක්‍රමයන් ලෙස ඇවැස්සඥාති, බින්න, දීග, එකගෙයිකෑම යන විවාහ ක්‍රම හඳුනාගත හැකිය. 1954 වර්ෂයේදී ලීච් විසින් පුල්එළිය ගම්මානය පදනම් කරගෙන එකී විවාහ පිළිබඳව අධ්‍යයනය කරනු ලැබීය. වර්තමානයේ ද එම විවාහ ක්‍රම පුල්එළිය ගම්මානයේ ජනතාව විසින් පවත්වාගෙන යනු ලබන්නේද යන්න පිළිබඳව අධ්‍යයනය මෙම පර්යේෂණයේ අරමුණ වේ. ඒ සඳහා ගම්මානයේ වර්කමානයේ ජීවත් වන පවුල් 20ක් අහඹුලෙස තෝරා ගනිමින් සම්මුඛ සාකච්චා හරහා දත්ත ඒකරාශි කරන ලදි. මෙම අධ්‍යයනය තුළින් හෙළි වූයේ, අධ්‍යයන පවුල්හි වර්තමානයේ ජීවත්වන පිරිස් අතරින් 80%ක් තුලම දීග විවාහ පවතින බවත් බින්න විවාහ ක්‍රමයද 10%ක් ක්‍රියාත්මක වූවද එකගෙයිකෑම නෂ්ටව ගොස් ඇත. බහිර්ජන්‍ය විවාහ ක්‍රම බහුල වූ අතර දීග විවාහය වැඩිවශයෙන් දැකගත හැකිවිය. අතීතයේ දැකගතහැකි වූ ඇවැස්ස ඥාතී විවාහ ක්‍රමය 20%ක් පමන ක්‍රියාත්මක වේ. උරුමය පීතෘ පාර්ශවයෙන් වූවත් දේපල භුක්තිය දෙපාර්ශවයෙන්ම ක්‍රියාත්මක විය. ඥාතීත්වය ශක්තිමත් කිරීමටත්, දේපල ආරක්ෂා කිරීමත් මූලික අරමුණු කරගනිමින් අතීතයේදී මෙය ක්‍රියාත්මක වූවද වර්තමානයේදී එය අඩුවීමට බලපා ඇත්තේ, දුබල දරුඋපත් සිදුවනවා යන සෘණාත්මක ආකල්පයත්, සමාජ නවීකරණය මුල් කරගෙන ග්‍රාමීය ප්‍රදේශ මගින් ඈත් වීමත්, නව ඥාතී සබඳතා ඇතිකර ගැනීමට ඇති දැඩි කැමැත්තත්ය. ඇවැස්ස ඥාතී විවාහ මගින් එලෙස දුබල දරුඋපත් සිදු නොවෙන බව වෛද්‍යවරුන් විසින් සනාථ කර තිබුණද, එය නොදැනුවත්කම මුල් කරගෙන සිංහල විවාහ ක්‍රමයේ සාම්ප්‍රදායික ඇවැස්ස ඥාති විවාහ ක්‍රමය සංස්කෘතියෙන් වියැකී ගොස්ය. මෙම අධ්‍යයනය අනුව පැහැදිලි වූයේ පුල්එළිය ගම්මානයේ 20 වන සියවසේ අගභාගයේ පමණ සිට 21 සියවසේ මුල් කාලය වන විට සමාජ හා සංස්කෘතික නවීකරණය මුල් කරගෙන පෙර පැවති විවාහ ක්‍රම න්‍යෂ්ට වී ඇති බවකි.

***ප්‍රමුඛ පද:*** *සිංහල විවාහ, ඇවැස්ස විවාහ, පුල්එළිය*

# සාම්ප්‍රදායික, මල්වර තහංචි හා විශ්වාසයන්හි වත්මන් තත්ත්වය අධ්‍යයනය
# (නාකුළුගමුව ප්‍රදේශය ඇසුරෙන්)

එල්. එච්. එච්. කුමුදුමලී, එස්. සමරසේකර

මානව විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.

*hkumudumali1234@gmail.com*

උපත, වැඩිවිය පැමිණීම, විවාහය, මරණය ආදී පුද්ගල ජීවිතයේ සංක්‍රාන්ති අවදි 'ද්වාරකර්ම' වේ. මෙකී අවදි හා බැඳි පෙර, පසු තහංචි හා එහි නවතා තබා සිදුකරන චාරිත්‍ර අතීතයේ සිට පාරම්පරිකව ජන ඇදහිලි මත පදනම් වූ එක්තරා ආකාරයක අභිචාර ක්‍රමයන්ය. ඒවා ප්‍රාදේශිය වශයෙන් විවිධය. මෙම ද්වාරකර්ම අවස්ථා සමග ඒ ඒ පුද්ගලයන්ගේ සමාජ කාර්ය භාර්ය හා වගකීම වෙනස් වන අතර පුද්ගල සමාජානුයෝජනයේ වැදගත් කාර්ය භාර්යක් ද්වාරකර්ම තහංචි මගින් සිදුකරයි. 'තහංචි' ලෙස අර්ථකතනය කරනුයේ යමක් සිදුනොකර වැලකීම යන්නයි. ලංකාවේ ගැහැණු දරුවන් වැඩිවිය පැමිණීමේ චාරිත්‍ර දැකගත හැකි අතර වැඩැවිය පැමිණීමට ආසන්න ගැහැණු දරුවෙකුට විවිධ තහංචි ඇත. මාතෘත්වයට ඇයව ආරක්ෂාකාරී ලෙස සූදානම් කිරීමෙන් එහි වටිනාකම හා වගකීම ඒත්තු ගැන්වීම මෙම තහංචි වල අරමුණ වේ. මල්වරවීමට පෙරත්, සංක්‍රාන්ති අවදියේදීත්, ඉන් පසු ද විවිධ තහංචි රාශියක් ග්‍රාමිය සමාජයේ ක්‍රියාත්මක වේ. වර්තමානයේද ඒවා පවතිනවාද? නොපවතීනම් එයට හේතුව කුමක්ද? යන්න සෙවීම මෙම අධ්‍යයනයේ අරමුණ වේ. හම්බන්තොට දිස්ත්‍රිකයේ නාකුළුගමුව ප්‍රදේශයේ පෙර පැවති තහංචි පිළිබඳ විශ්වාස වර්ථමානයේදීද පවතිනවාද යන්න අධ්‍යනයට එහි ජීවත්වන පවුල් 250න් අහඹු නියදිය ඔස්සේ තෝරාගත් පවුල් 25ක් හා ප්‍රදේශයේ වැඩිහිටි කාන්තාවන් 08 දෙනෙකු සමඟ සිදුකළ සම්මුඛ සාකච්චා තුළින් මේ සඳහා අවශ්‍ය දත්ත රැස්කරගනු ලැබුනි. පිරිමි පාර්ශවය හා පවත්වන සමාජ සම්බන්ධතා අවමකිරීමත්, උෂ්ණ, තෙල් සහිත ආහාර ලබා නොදීමත් ඒ සඳහා තහංචි වේලාවන් පැනවීමත්, චර්යාව හා බැඳි විවිධ තහංචිද අතීතයේ ක්‍රියාත්මක වූ බව හඳුනාගත හැකිය. මෙම පර්යේෂණයට අනුව පැහැදිලි වූයේ ග්‍රාමීය ජනතාවගේ සිදුවී ඇති ආකල්පමය වෙනස හේතුවෙන් අදවන විට එම තත්වය අතීතයට වඩා වෙනස්ව ඇති බවය. අධ්‍යයන පවුල් වලින් 75% ක්ම එම තහංචි අනුගමනය නොකරයි. ඉන් 60% කගේම මතය වූයේ මේ පිළිබඳ විද්‍යාත්මක පදනමක් නොමැති බවය. නමුත් සමස්ත අධ්‍යයනයෙන්ම 30% කම අවධාරණය කරනු ලැබුවේ මෙකී තහංචි හරහා සංස්කෘතික පදනමක් මත පිහිටුවා සමාජ පාලනයක් ක්‍රියාත්මක වන බැවින් මේවා ක්‍රියාත්මක කළ යුතු බවකි. සමාජ, සංස්කෘතික, වශයෙන් විවිධාකාර වෙනස්වීම් අද වන විටද හඳුනාගත හැකි වුවද පවුලක නම්බුව රැඳී ඇත්තේ ගැහැණිය මත නිසා චර්යාමය හා ආකල්පමය මල්වර තහංචි කිහිපයක් මගින් හෝ ඇයට වටිනාකමක් ඇති බව පෙන්වීමට යොමුව ඇත.

***ප්‍රමුඛ පදඃ*** *මල්වර තහංචි, මල්වර චාරිත්‍ර, ද්වාරකර්ම, වැඩිවිය පැමිණීම*

# නේපාලයේ තරයි තැනිතලාවේ කපිලවස්තු දිස්ත්‍රික්කයේ තාරු ජනයාගේ සාම්ප්‍රදායික නිවාස හෙවත් ඝර් පිළිබඳ අධ්‍යයනයක්

ඩී. එස්. ඒ. මුණසිංහ, එන්. ඒ. ඩී. එම්. නිස්සංක

පුරාවිද්‍යා අධ්‍යයනාංශය, කැලණිය විශ්ව විද්‍යාලය

*anuzone92@gmail.com*

ඉන්දියානු උප මහද්වීපයේ ඉහළ සීමාව නියෝජනය කරනු ලබන නේපාල ජනරජය මුහුදු මට්ටමේ මීටර් 0 සිට මීටර් 8844 උන්නතාංශයක් දක්වා පැතිරීයන සංකීර්ණ භූ විද්‍යාත්මක පරිස්ථිතියකින් හෙබි රාජ්‍යයකි. නේපාල භූමිය ප්‍රධාන භූ කලාප තුනකට බෙදා දැක්විය හැකි අතර තරායි තැනිතලාව එහි මුහුදු මට්ටම හා සමෝච්ච කලාපය වෙයි. සංකීර්ණ ජන වාර්ගික විවිධත්වයක් හඳුනා ගත හැකි තරායි තැනිතලාව තුළ ජිවත් වන ප්‍රධානතම ජන කණ්ඩායමක් ලෙස තාරු ජනයා හඳුනාගත හැකි අතරම සංස්කෘතිකමය විවිධත්වය මත පදනම්ව තවදුරටත් උප කණ්ඩායම් කිහිපයකට බෙදී සිටියි. ඔවුන් ඔවුන්ටම ආවේණික වූ සාම්ප්‍රදායික නිවාස හෙවත් ඝර් වල වාසය කරනු ලබන අතර එම නිවාස වල ගෘහ නිර්මාණ තාක්ෂණය හා තාරු ජනයාගේ දෛනික ජිවිතය හා නිවාසය අතර පවතින සබැඳියාව කවරාකාරද යන්න තේරුම් ගැනීම මෙම පර්යේෂණයේ අරමුණු වේ. පර්යේෂණය සිදු කිරීමේදී කපිලවස්තු දිස්ත්‍රික්කයේ තිලවුර්කොට්, තෞලිහවා, චත්‍රාදායි ප්‍රදේශවල ක්ෂේත්‍ර ගවේෂණ සිදුකළ අතර තාරු පවුල් 30 ක පමණ නියැදියකින් හා යුනෙස්කෝ කපිලවස්තු ව්‍යාපෘතියේ පුරාවිද්‍යාඥයින් 15 දෙනෙකුගෙන් පමණ ද අහඹු සම්මුඛ සාකච්ඡා ලබාගන්නා ලදි. එමෙන්ම සහභාගිත්ව නිරීක්ෂණ හා පුස්තකාල ගවේෂණය ද සිදු කරන ලදි. තාරු සාම්ප්‍රදායික නිවාස මැටි පාදමක් මත දැව කණු සිටවා වරිච්චි කොට ඡානෝ හෙවත් වහලය සඳහා ටෝරි, මකායි, ධාල්, ගාහු වැනි ශාකවල ප්‍රාල් හා සාස් හෙවිළි කොට නිර්මාණය කර ඇත. නිවාස සැලසුම ආයත චතුරශ්‍රාකාර හෝ සෘජුකෝණාශ්‍රාකාර වන අතරම බිත්ති ඝනව නිර්මාණය කොට ඇත. කැපීපෙනෙන කුරු ස්වභාවයකින් යුතු තාරු නිවාස අඩි 05 ක පමණ සාමාන්‍යය උසකින් යුක්තවන අතර පිවිසුම් දොරටුව අඩි 04 ක පමණ උසකින් යුක්තය. නිවාසයට සමීපයේම හායිසී, සයි, භේදා, බක්‍රා, පෝති වැනි සතුන් සඳහා වෙන් වූ නිවාස වේ. නිවාසයේ සිට මීටර් 05 ක පමණ අරයකින් යුතු ප්‍රදේශයක මෙම සතුන් හා මිනිසා එක්ව ජිවත් වීම තාරු ගෞ හෙවත් ගම්මානයේ විශේෂ ලක්ෂණයක් වේ. ගෞ වටා විහිදී යන අක්කර ගණනාවක වගාභූමි හඳුනාගත හැකිය. සමායි මායි උදෙසා වෙන් වූ පූජනීය වෘක්ෂය, ප්‍රාල් හා සාස් කැපීමට ගන්නා යන්ත්‍ර හා සතුන්ට ආහාර දැමීමට යොදා ගන්නා විශාල මැටි හා බට පතුරු බඳුන්, ධාන්‍ය ගබඩා හා ප්‍රාල් කොටු සැම මිදුලකම අනිවාර්ය අංගයන් වේ. දෛනික පරිභෝජනයට අවශ්‍ය සියලුම එළවළු, පලා හා කුළුබඩු වර්ග ද ඉඩම තුළ වගාකොට ඇත. මෙම පර්යේෂණයෙන් පෙනීගිය ආකාරයට ශීත දේශගුණය හා සෘතු විපර්යාස සාර්ථකව ජයගැනීම තාරු ගෘහ නිර්මාණ තාක්ෂණයේ ප්‍රධානතම අරමුණ වන අතරම දෛනික ජිවිතයේ කුඩුමහත් අවශ්‍යතා හා තාරු නිවාසය අත්‍යන්තයෙන් බැඳී පවතින බව නිගමනය කළ හැකිය.

***ප්‍රමුඛ පද:*** *ගෘහ නිර්මාණ තාක්ෂණය, තරායි තැනිතලාව, තාරු ජනයා, දේශගුණය, සාම්ප්‍රදයික නිවාස*

# සංස්කෘතික දෙමුහුන්භාවය ෘ මාර්ටින් වික්‍රමසිංහගේ විරාගය නවකතාව ආශ්‍රිත විමර්ශනයක්


කේ. ඒ. ජේ. පී. කේ. මැදවත්ත

සිංහල අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

*jmedawatte@sjp.ac.lk*



සංස්කෘතික දෙමුහුන්භාවය (Cultural Hybridity) යනු සංස්කෘතික පරිසර දෙකක සම්මිශ්‍රණයෙන් ගොඩනැගුණු නව සංස්කෘතික සහවාසීභාවයයි. මෙම අධ්‍යයනයේ අරමුණ වන්නේ යටත්විජිතකරණය හේතු කොටගෙන ලාංකේය සමාජ සන්දර්භයෙහි නිර්මාණය වූ සංස්කෘතික සහවාසීභාවය, නවකතාව නමැති සාහිත්‍ය ප්‍රවර්ගයෙහි ප්‍රතිනිර්මාණය වී ඇති ආකාරය විමර්ශනය කිරීමයි. සංස්කෘතික සහවාසීභාවය, සමාජ සංස්ථාවල ක්‍රියාකාරිත්වය සහ කේවල පුද්ගල ආධ්‍යාත්මික විපර්යාසය මගින් ප්‍රකාශයට පත්වේ. මෙකී තත්ත්වය විමර්ශනය කිරීම සඳහා පළමුවැනි පුද්ගල කේන්ද්‍රීය නවකතාව ලෙස සැලකෙන මාර්ටින් වික්‍රමසිංහගේ විරාගය (1956) නවකතාව පාදක කොට ගෙන තිබේ. එහි අරමුණ වූයේ සංස්කෘතික සහවාසීභාවය, කේවල පුද්ගල චරිතයක් මගින් ප්‍රකාශයට පත්වන ආකාරය විමර්ශනය කිරීමත් එකී විපර්යාසයට තුඩු දුන් සමාජ බලවේගවල පදනම් සාධක නිවැරදිව හඳුනා ගැනීමත්ය. ඒ අනුව පුද්ගල චරිතයක සමාජීය ක්‍රියාකාරිත්වය පසුබිමෙහි පවතින සංස්කෘතික සහවාසීභාවයෙහි යථා ස්වරූපය කෙබඳුවේ ද යන්න මෙහි පර්යේෂණ ගැටලුව විය. මෙම අධ්‍යයනය සඳහා විරාගය නවකතාව ප්‍රාථමික මූලාශ්‍රය ලෙසත්, අදාළ න්‍යායික පදනම් විග්‍රහ කෙරෙන ප්‍රාමාණික ශාස්ත්‍රීය අධ්‍යයන ද්විතීයික මූලාශ්‍රය ලෙසත් භාවිත කර තිබේ. පශ්චාත් යටත්විජිතවාදී න්‍යාය හා අර්ථදීපනවේදී විධික්‍රමය මගින් දත්ත විශ්ලේෂණය සිදු කෙරිණ. පශ්චාත් යටත්විජිතවාදී න්‍යායට අනුව සංස්කෘතික සහවාසීභාවය නියෝජනය කරන දෙපාර්ශ්වය අතර පරිපූර්ණ සහසම්බන්ධතාවක් ඇති නොවේ. එබැවින් සියලු සංස්කෘතික ප්‍රකාශන සහ ක්‍රමවේද අතර අප්‍රකාශිත තෙවැනි පාර්ශ්වීය අවකාශයක් (Third Space of Enunciation) ගොඩනැගී තිබේ. එනම්, සම්මිශ්‍රණය නොවූ දෙපාර්ශ්වයටම අනන්‍ය වූ ලක්ෂණ පවතින අතර එය ප්‍රායෝගිකව ක්‍රියාත්මක කළ නොහැකි ශූන්‍ය අවකාශයක් ලෙස පවතී. මෙකී තෙවැනි පාර්ශ්වීය අවකාශය පුද්ගල ජීවිතයේ අභෞතික කලාපය නියෝජනය කරන අතර, පුද්ගලයා සමාජය සමග ගනුදෙනු කරන ආකාරය, ආකල්ප හා චර්යා රටා මගින් ඔහුගේ සංස්කෘතික දෙමුහුන්භාවයේ ලක්ෂණ මෙන්ම අනන්‍ය වූ ශූන්‍ය අවකාශය ද ප්‍රක්ෂේපණය වේ. විරාගය නවකතාව මගින් ප්‍රතිනිර්මාණය කෙරෙනුයේ සංස්කෘතික දෙමුහුන්භාවය හමුවේ පීඩාවට පත් වන, ආධ්‍යාත්මික ශූන්‍යභාවයට ගොදුරු වූ පුද්ගල චරිතයක සමාජීය පදනම හා මනෝභාවයයි. විරාගය නවකතාවේ ප්‍රධාන චරිතය වන අරවින්ද එක් පසෙකින් ග්‍රාමීය මධ්‍යම පන්තික සමාජයෙහි හැදී වැඩී ස්වකීය පන්තියෙහි අපේක්ෂාව වූ ආර්ථික සමෘද්ධිය හා සමාජ ගරුත්වය සොයා පන්ති සංයුතියෙහි ඉහළ නැගීමේ අරමුණෙන් මෙහෙයවනු ලැබූවෙක් වන අතර, අනෙක් පසින් එකී ක්‍රියාකාරිත්වයට ප්‍රතිපක්ෂව කටයුතු කළ පුද්ගල චරිතයකි. එබැවින් අරවින්ද යනු කේවල පුද්ගල චරිතයක් පමණක් නොව ඔහු නියෝජනය කරන ෆජ කුලකයේ පොදු නිරූපණයකි. යටත්විජිත ශ්‍රී ලාංකේය මධ්‍ය පන්තික නව පරපුර ඥානමය වශයෙන් ග්‍රාමීය ජනතාවගේ සාමූහික විඥානය ඉක්ම වූ බැවින් අරවින්දගේ චරිතය යට කී සමාජ තත්ත්වයේ යථාරූපී නියෝජනයක් ලෙස හඳුනා ගත හැකිය.



***ප්‍රමුඛ පදඃ*** *සංස්කෘතික දෙමුහුන්භාවය, පුද්ගල විඥානය, යටත්විජිත සමාජය, මාර්ටින් වික්‍රමසිංහ, විරාගය.*

# කුඹුක් ගස හා බැඳුණු ගැමි සංස්කෘතික පසුබිම පිළිබඳ අධ්‍යයනයක්

බී. එම්. ඩී. එම්. දර්ශනී, ජේ. පී. සී. ප්‍රබෝදිනී, එම්. ඒ. එන්. විරාජණී, පී. ඊ. ජී. ඒ. කල්‍යාණි

සමාජීය විද්‍යා හා මානව ශාස්ත්‍ර අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය

*nadeeshavirajanee2@gmail.com*

ආයුර්වේදයේ මෙන්ම සංස්කෘත භාෂාවේ අර්ජුන ලෙස හඳුන්වන කුඹුක් (*Terminalia arjuna*) ශාකයට සිංහල ගැමි පරිසරයේ සුවිශේෂි ස්ථානයක් හිමිව තිබුණි. කුඹුක් ගසක් ජල උල්පත් බොහෝ ප්‍රමාණයක් ප්‍රවර්ධනය කරන බවත් පරිසරය, පස සිසිල්ව තබා ගැනීමට විශිෂ්ට දායකත්වයක් සපයන බවත් විද්‍යාත්මකව ඔප්පු වී තිබේ. අතීතයේදී ගැමියා කුඹුක් ගසින් සෘජුව හා වක්‍රව ප්‍රයෝජනගත් හෙයින් කුඹුක් ගස රැක ගැනීමටත් ක්‍රියාකාරීව දායක වී ඇත. එම නිසා කුඹුක් ගස හා ගැමියා අතර පවතින්නේ සුවිශේෂි සබැඳියාවකි. විශේෂයෙන් සාම්ප්‍රදායික වැව් ගම්මාන සංස්කෘතියේ කුඹුක් ගස එයටම ආවේණික අංගයක් ලෙස නිරූපණය කරයි. මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වන්නේ කුඹුක් ගස හා බැඳුණු ගැමි සංස්කෘතිය පිළිබඳ අධ්‍යයනය කිරීමයි. සුවිශේෂී අරමුණු ලෙස කුඹුක් ගස හා බැඳුණු සංස්කෘතික වටිනාකම් අධ්‍යයනය කිරීමත් කුඹුක් ගස හා බැඳුණු විශ්වාසයන් අධ්‍යයනය කිරීමත් ය. මූලික දත්ත සාහිත්‍ය ගවේෂණය, ක්ෂේත්‍ර අධ්‍යයන සහ සම්මුඛ සාකච්ඡා හරහා රැස්කරගනු ලැබීය. අනුරාධපුර දිස්ත්‍රික්කයේ මැදවච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අධ්‍යයන ප්‍රදේශය ලෙස යොදාගනු ලැබීය. සම්මුඛ සාකච්ඡා සඳහා ආයුර්වේද වෛද්‍යවරුන් දෙදෙනෙක් සහ කුඹුක්ගොල්ලෑව ප්‍රදේශවාසීන් දහදෙනෙක් තෝරා ගැනුණි. වියළි කලාපීය වැව්වල ගස් ගොම්මනේ ඇති කුඹුක් මගින් වැව් ජලයේ පවතින කැඩ්මියම් සාන්ද්‍රණය මර්දනය කිරීමෙන් ජලය පවිත්‍ර විය. එමෙන්ම ජල සංස්කෘතියේ ජීවය සනිටුහන් කළ උරුමයක් ලෙස කුඹුක් ළිඳ තවමත් ගැමි පරිසරයේ නිදන්ගතව පවතී. කුඹුක් ඖෂධීය වටිනාකමකින් ද හෙබි වෘක්ෂයකි. කුඹුක් කිරි කසාය බීම හදවත් රෝගවලට සුවය දෙන අත්බෙහෙතකි. කුඹුක් පොතු ස්වරසයට තල තෙල් මිශ්‍ර කර පානය කිරීම මුත්‍රගල්වලටත් කුඹුක් පොතු තැම්බූ වතුරෙන් කටසේදීම මුඛ රෝගවලටත් සුදුසුම අත්බෙහෙතකි. කුඹුක්, ලෝලු සමඟ තම්බා බීම දිවිමකුළු විසට කරන ප්‍රතිකර්මයකි. වැව් ගම්මානවල ගමට දියවර සපයන වැවට පුද සත්කාර දැක්වීමට විශාල වෘක්ෂ වෙන් කරගන්නා අතර එය සංහිඳ නමින් හඳුන්වයි. සංහිඳ සඳහා බොහෝ දුරට ඇටවුම් බසින ලද කලාන්තරයක් ජීවය රදා පවතින කුඹුක් ගසක් තෝරා ගැනීම ජනසම්මතය වේ. මුට්ටි නැමීමේ මංගල්‍යය සඳහාද කුඹුක් ගසක් තෝරා ගැනීම ගැමි සම්ප්‍රදාය වේ. කුඹුක් ගස් ජල මූලාශ්‍ර නිර්මාණය කරන බවට විශ්වාසයක් ඇති හෙයින් පූජනීය වෘක්ෂයක් ලෙස සලකා යාපනයේ නාකර්-කෝයිල්හි කුඹුක් ගසකට වන්දනාමාන සිදු කරයි. කුඹුක් අළුවලට කිසිදු උපද්‍රවයකින් තොරව දරුවන් බිහි කිරීමට බලයක් ඇති බව ගර්භණී කාන්තාවන්ගේ විශ්වාසයක් පවතී. ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ සශ්‍රීකව වැඩෙන ඉතාමත් වටිනා ශාකයක් වන කුඹුක් සම්බන්ධව පවතින විද්‍යාත්මක කරුණු දන හෝ නොදන පැරණි මුතුන් මිත්තන් විසින් මෙම ශාකය පිළිබඳව දැඩි සැලකිල්ලක් දක්වා කටයුතු කර තිබෙන බව ඉතාමත් පැහැදිලිය. එම නිසා කුඹුක් වනාහි ගැමි සංස්කෘතියේ සශ්‍රීකත්වය ඔප්නැංවූ වටිනා වෘක්ෂයකි.

***ප්‍රමුඛ පදඃ*** *කුඹුක් ගස, ගැමි සංස්කෘතිය , සංහිඳ, කුඹුක් ළිඳ, මුට්ටි නැමීමේ මංගල්‍යය*

# මල්වල සංකේතාත්මක අර්ථයන් පිළිබඳ මානව විද්‍යාත්මක අධ්‍යයනයක්

පී. අබේසුන්දර, ඩී. දේවපුර

මානව විද්‍යා අධ්‍යනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

*dulshandewapura@gmail.com*

මිනිසුන්ගේ චර්යාවන්ට සබැඳි මල්, මානව සංස්කෘතියේ සුවිශේෂී අංගයකි. සංස්කෘතිය අමතක කොට පරිසරයේ මල්, මිනිසා හා සංස්කෘතිය අතර සම්බන්ධය ගැන අධ්‍යයනය කළ නොහැකිය. මෙම අධ්‍යයනයේ මුඛ්‍ය අරමුණ වනුයේ මල් සඳහා මානව සංස්කෘතියේ හිමිව ඇති ස්ථානයත් එය විවිධ ස්ථානීය හා පරමාර්ථගත අවශ්‍යතාවන් සඳහා යොදවන අන්දමත් අධ්‍යයනය කිරීමය. සෙසු අරමුණු ලෙස මල් සඳහා විවිධ අනන්‍යතාවන් ලැබීමට හේතු පාදක වූ ජනශ්‍රැතිය අධ්‍යයනය කිරීමත් දැක්විය හැකිය. මල්වල සංකේතාත්මක අර්ථයන් අධ්‍යයනය කිරීමේ දී ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය භාවිතයට ගත් අතර ප්‍රාථමික දත්ත ලෙස අහඹු නියැදියකට අනුව තෝරාගත් පුද්ගලයන් සමඟ සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමත් මල් අවස්ථානුගත භාවිතවන අන්දම නිරීක්ෂණය කිරීමත් කර ඇත. එසේම පරමාර්ථ නියැදියකට අනුව කළුතර, පිල්ලෑව, බෙල්ලන්විල විහාරය, කිඳෙල්පිටිය, නවගමුව, කතරගම දේවාලය යන ස්ථානවලින් දත්තදායකයන් දහදෙනා බැගින් හැට දෙනෙක් නියැදිය වශයෙන් තෝරාගත් අතර විශ්ව විද්‍යාල ආචාර්යවරුන් තිදෙනෙක්, ඇදුරන් දෙදෙනෙක් හා භික්ෂූන් වහන්සේලා හතරදෙනෙක් සමඟ සම්මුඛ සාකච්ඡා පැවැත්වීය. මිනිසාගේ සංස්කෘතිය ගොඩනැගෙන්නේ අතීතයේ සිට මිනිසා ගොඩ නගාගෙන ඇති ලෝක දෘෂ්ටියත් සමගයි. එම ලෝක දෘෂ්ටිය නියෝජනය කරන සංකේත රැසක් ඇතත් ඒ අතරින් මල් ප්‍රමුඛ වන්නේ මලේ සුන්දරත්වය නිසා ම පමණක් නොව ඒ හා බැඳුණු ජනශ්‍රැතිය, විශ්වාස, ඇදහිලි හා සංස්කෘතික සාරධර්ම රැසක් දක්නට ලැබීම නිසා ය. උදාහරණයක් ලෙස සල් මල පූජනීය ලෙස සලකන්නේ එහි බුද්ධ චරිතය අතර ඇති සම්බන්ධතාව නිසා ය. පර්යේෂණයේ ප්‍රතිඵල අනුව මල් යනු සමාජයේ ඉහල වටිනාකමක් ඇති දෙයක් බව හඳුනාගත් අතර ඒ සඳහා මෙවැනි අගයක් ලැබීමට හේතු වී ඇත්තේ එය අලංකරණයට ගිය ආගමික හා සංස්කෘතික අගයක් නිසා බව තහවුරු කරගන්නා ලදි. එසේම දත්ත දායකයන්ගෙන් ලබාගත් තොරතුරු අනුව පෙනීගියේ හින්දු සමාජය තුළ බෞද්ධ සමාජයට වඩා වෙනස් මුහුණුවරකින් මල්වලට සමාජ සංස්කෘතික වටිනාකමක් ලබා දී ඇති අතර දෙවියන්ට පුද පූජා කිරීමට මෙන්ම කාන්තාවන් තම ශරීර හා නිවාස අලංකරණය සඳහා ද මල් වැඩි වශයෙන් යොදා ගන්නා බවයි. එසේම ඔවුන්ගේ ජන විශ්වාසය වන්නේ මල්වල සුවඳ නිසා දෙවියන් සමීප වන බවය. එසේ වුවත් බෞද්ධ සමාජය තුළ අනිත්‍ය පෙන්වන ආකෘතියක් වශයෙන් මල් නිරූපණය වන බව ද පර්යේෂණයෙන් අනාවරණය විය. ඒ අනුව ආදරය, භක්තිය, දුක, සතුට ආදිය නියෝජනය කරන ගැඹුරු සංකේතාත්මක අර්ථ ලබාදෙන්නක් ලෙස මල් හැඳින්විය හැකි අතර ඒවායේ අන්තර් සංස්කෘතික අගනාකම මතු කිරීම මෙම පර්යේෂණයෙන් සිදු විය.

***ප්‍රමුඛ පද:*** *සංස්කෘතිය, මල්, ජනශ්‍රැතිය, අනන්‍යතාවන්, සංකේතාත්මක අර්ථයන්*

# මහවැලි ගංගාව මුල්කරගත් සමාජ හා සංස්කෘතික උපයෝජනයන් පිළිබඳ අධ්‍යයනයක් (උලපනේ සිට ඇත්ගාල දක්වා වූ ප්‍රදේශය ආශ්‍රයෙන්)

යූ. එස්. මීගහකොටුව

භූගෝල විද්‍යා දෙපාර්තමේන්තුව, පේරාදෙණිය විශ්වවිද්‍යාලය

*udanasaminjaya@gmail.com*

ශ්‍රී ලංකාව ඈත අතීතයේ සිටම ජලාශ්‍රිත ශිෂ්ටාචාරයකට උරුමකම් කියූ රටකි. ආර්යයන් විසින් මෙරට මුලින්ම ජනාවාස පිහිටුවාගෙන තිබෙන්නේ ගංගා නිම්න ආශ්‍රිතව යි. මහවැලි ගංගාව යනු ශ්‍රී ලංකාවේ දිගම ගංගාව මෙන්ම තෙත් හා වියළි යන දේශගුණික කලාපයන් දෙක ඔස්සේම ගලා ගොස් කොඩ්ඩියාර් බොක්ක ප්‍රදේශයෙන් මුහුදට ගලාබසිනා ගංගාවකි. අතීතයේදී මෙන්ම වර්තමානයේදී ද මහවැලි ජලාධාරයේ ජීවත්වන විවිධ වාර්ගික හා ආගමික කණ්ඩායම් වලට අයත් ජනයා තම බහුවිධ කටයුතු සඳහා මහවැලි ගංගාව උපයෝජනය කොට ගනී. මෙම අධ්‍යයනය යොමු වී ඇත්තේ ඉහළ මහවැලි ජලාධාර ප්‍රදේශයේ, උලපනේ සිට ඇත්ගාල දක්වා වූ කිලෝ මීටර් තුනක් පමණ වූ ප්‍රදේශය තුළදී ගංගා නිම්නයේ ජීවත්වන සිංහල, දෙමළ සහ මුස්ලිම් ජනයා සමාජ හා සංස්කෘතික කාර්යයන් සඳහා මහවැලි ගංගාව උපයෝජනය කර ගන්නා ආකාරය විමර්ශනය කිරීම සඳහාය. අධ්‍යයනය සඳහා අවශ්‍ය දත්ත රැස්කරන ලද්දේ උලපනේ සිට ඇත්ගාල දක්වා වූ මහවැලි ගංගාව දෙපස නිම්නයේ පදිංචිව සිටින පුද්ගලයින් 25 කට ලබාදුන් ප්‍රශ්නාවලියක් සහ ඔවුන් සමඟ පැවැත් වූ සම්මුඛ සාකච්ඡා ආධාරයෙනි. උලපනේ සිට ඇත්ගාල දක්වා වූ මහවැලි ගංගා කොටස තුළ දිය වළවල් (Water Holes) ගණනාවක් දක්නට ලැබේ. නිදසුන් ලෙස සයිබො වළ, දඬුකෙන්නා වළ, දේවිට වළ, අඹගහයට වළ සහ දුන්හිඳ වළ යනාදිය දැක්විය හැකිය. ප්‍රදේශයේ ජීවත්වන ජනතාව මෙම දිය වළවල් වලට නම් දමා ඇති අතර ඇතැම් වළවල් වලට නම් දමා තිබෙන්නේ ජනප්‍රවාදයේ එන කතා පුවත් ඇසුරු කරගෙනය (උදාහරණ : සයිබො නැමති පුද්ගලයා පන් කැපීමට ගොස් පය ලිස්සා දිය වළකට වැටී මියගොස් ඇති අතර එතැන් පටන් එම දිය වළ සයිබො වළ ලෙස හඳුන්වන බව කියනු ලබයි). වැලි ගොඩදැමීම, රෙදි සේදීම හා ස්නානය කිරීම වැනි කාර්යයන් සඳහා ප්‍රදේශයේ සිංහල හා දෙමළ ජනතාව ඉහත දිය වළවල් භාවිත කරන අතර උලපනය ප්‍රදේශයේ මුස්ලිම් පිරිස් දිය වළවල් කේන්ද්‍ර කොට ගෙන මාළු ඇල්ලීම සිදුකරනු ලබයි. එසේම වඳ වී යාමේ තර්ජනයකට ලක්වී තිබෙන මෙරටට ආවේණික වූ ගඩයා නැමති මත්ස්‍යය විශේෂය ද මෙම දිය වළවල් වල ජීවත් වේ. ගලත ග්‍රාම නිළධාරි වසමේ ජීවත් වන හින්දු ජනයා වාර්ෂික තේරු උත්සවයේ දී දියකැපීම ඇතුළු ආගමික වතාවත් රැසක් සඳහා දින තුනක පමණ කාලයක් දඬුකෙන්නා වළ ප්‍රදේශය භාවිතයට ගනී. එසේම මෙම ගංගා කොටසේ පවතින ගල්වන (Pot Holes) භූ දර්ශනය හා මීටර පහක් පමණ උසැති කුඩා දිය ඇල්ල නැරඹීම සඳහා දේශීය සංචාරකයන් පැමිණෙයි. ඇත්ගාල ප්‍රදේශයේ ගංගාවේ වම් ඉවුරට වන්නට අක්වා දුන්හිඳ විල නැමති සංචාරක බංගලාව ඉදිකර තිබෙන්නේ ද මූලිකවම ගංගා භූ දර්ශනය පදනම් කර ගෙනයි. මෙම සංචාරක බංගලාවට පැමිණෙන විදේශීය සංචාරකයින් භාවනා හා යෝගා ව්‍යායාම කිරීම සඳහා මහවැලි ගංගාවේ වූ වර්ණවත් ගල් තලාවන් භාවිත කරයි. නමුත් දැනට වැඩ ආරම්භ කර ඇති මොරගොල්ල ජලාශය උලපනය ප්‍රදේශයේ ඉදිකළ පසු මෙම අධ්‍යයනය සඳහා යොදාගත් මහවැලි ගංගා කොටසේ ජලය ශීඝ්‍ර ලෙස අඩුවේ. එබැවින් මොරගොල්ල ජලාශය ඉදිකිරීම හරහා ඉහතින් දැක්වූ සියලු සමාජ හා සංස්කෘතික උපයෝජනයන්ට බාධා පැමිණේ. එබැවින් මෙම ව්‍යාපෘතිය සිදු කිරීමේ දී ගංගාවේ අස්පර්ශීය වටිනාකම් ද සැලකිල්ලට ගත යුතුය.

**ප්‍රමුඛ පද:** *මහවැලි ගංගාව, උපයෝජනය, ජලාධාරය, දිය වළ, භූ දර්ශනය*

# ගන්නෑව කෝරළය හා බැඳුණු අස්පර්ශිත සංස්කෘතික උරුමයන්

පී. එම්. ඇඹුල්දෙනිය[1], කේ. ජී. එම්. කරුණාරත්න[2]

[1]උරුම අධ්‍යයන කේන්ද්‍රය, කැලණිය විශ්වවිද්‍යාලය, [2]පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව (මධ්‍යම), මහනුවර

*piyumiembuldeniya@gmail.com*

මධ්‍යම පළාතෙහි නුවරඑළිය දිස්ත්‍රික්කයේ හඟුරන්කෙත ප්‍රාදේශීය බලප්‍රදේශයෙහි පිහිටා ඇති ගන්නෑව කෝරළය; ඓතිහාසික, පුරාවිද්‍යාත්මක සහ මානවවිද්‍යාත්මක අගයන්ගෙන් යුක්ත ගම්මාන රැසකින් සමන්විතවූවකි. මෙම පර්යේෂණයේ අරමුණවනුයේ ගන්නෑව කෝරළය හා බැඳුණු; වර්තමාන සමාජයෙන් ගිලිහීයන අස්පර්ශිත සංස්කෘතික උරුමයන් පිළිබඳව සහ වර්තමාන සමාජය ආශ්‍රිතව පවතින අස්පර්ශිත සංස්කෘතික උරුමයන් පිළිබඳව අධ්‍යයනය කිරීමත් අස්පර්ශිත සංස්කෘතික උරුමයන් වාර්තාගත කිරීම හරහා සංරක්ෂණය කිරීමත්ය. මෙහිදී ලිඛිත මූලාශ්‍ර පරිශීලනය, ක්ෂේත්‍ර ගවේෂණ සහ විනිශ්චය නියැදීම යටතේ සම්මුඛ සාක්ච්චා පැවැත්වීම යන ක්‍රමවේද භාවිතකර තොරතුරු එක්රැස්කරන ලදී. ලිඛිත මූලාශ්‍ර පරිශීලනය මගින් ගන්නෑව කෝරළයේ ඓතිහාසික පසුබිම පිළිබඳව තොරතුරු අනාවරණය කරගනු ලැබූ අතර ක්ෂේත්‍ර ගවේෂණ සහ විනිශ්චය නියැදීම යටතේ විසිදෙනෙකු සමඟ පැවැත්වූ සම්මුඛ සාක්ච්ඡා ඇසුරින් ගන්නෑව කෝරළය හා බැඳුණු අස්පර්ශිත සංස්කෘතික උරුමයන් පිළිබඳ තොරතුරු එක්රැස්කරගනු ලැබිණි. එම තොරතුරු ගුණාත්මක දත්ත විශ්ලේෂණ ක්‍රමය යටතේ විග්‍රහ කරන ලදී. මේ අනුව ගන්නෑව කෝරළය පිළිබඳ අධ්‍යයනයේදී විවිධ පුදපිළිවෙත්, අත්බෙහෙත්, කෙම්ක්‍රම, ජන කවි, ජනශ්‍රැති, භාෂාව, ගැමි නාටක, කෘෂිකර්මාන්තය හා සම්බන්ධ සාම්ප්‍රදායයික ක්‍රමවේද, දේව ඇදහිලි, පශු සම්පත් හා බැඳුණු සාම්ප්‍රදායයික විශ්වාස, නිවසේ පවිත්‍රත්වය හා බැඳුණු සාම්ප්‍රදායයික විශ්වාස ආදීවූ අංශ රැසක් ඔස්සේ අස්පර්ශිත සංස්කෘතික උරුමයන් හඳුනාගත හැකිය. මෙහිදී අධ්‍යයනයට පාත්‍රවූ ගන්නෑව කෝරළයෙහි පවතින අඩුක්කු පිදීම, අලුත් සහල් මංගල්‍යය, පූජාපදය වාදනය කිරීම, කැවුම් මගින් අතපය තැවීම, තෙල් මැතිරීම ආදීවූ සුවිශේෂී අස්පර්ශිත සංස්කෘතික උරුමයන් නිදසුන් වශයෙන් දැක්විය හැකි අතර සමස්තයක් ලෙස ගන්නෑව කෝරළය එම ප්‍රදේශයට සුවිශේෂීවූ අස්පර්ෂිත අස්පර්ශිත උරුමයන්ගෙන් සමන්විත භූමිප්‍රදේශයක් වශයෙන් හැඳින්විය හැකිය.

***ප්‍රමුඛ පද:*** *ගන්නෑව කෝරළය, අස්පර්ශිත සංස්කෘතික උරුමයන්, සංරක්ෂණය*

# බුලත් පිළිබඳ සංකල්පයන්හි සමාරම්භය හා ඓතිහාසික විකාශනය පිළිබඳ අධ්‍යයනයක්

කේ. පඤ්ඤානන්ද හිමි

පුරාවිද්‍යා අධ්‍යයනාංශය ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය, හෝමාගම

*pagngnananda123@gmail.com*

ලාංකීය ජන සංස්කෘතිය හා බුලත් කොළය අතර පවතින්නේ අවිච්ඡින්න සබැදියාවකි. සශ්‍රීකත්වය, වර්ධනය, දීර්ඝායුෂය යන සංකල්ප සංකේතවත් කරමින් සිංහල ජන සංස්කෘතියේ බුලත් පිදීම සිදුකරයි. ඉංග්‍රීසි භාෂාවෙහි Betel යන නාමයෙන් සදහන් වන අතර සිංහල භාෂාවෙහි තාම්බුලී, නාගවල්ලි, තාම්බුලීවල්ලි, නාගිනී, මුඛරාගකරී, කාමජනනී, හා ශ්‍රමභඤ්ජනී වශයෙන් බුලත් හදුන්වා ඇත. මෙම පර්යේෂණය මගින් බුලත හා සැබැඳි ඓතිහාසිකත්වය පිළිබඳව අධ්‍යයනය කරන ලදි. මේ සඳහා දත්ත සපයා ගැනීමේ දී සාහිත්‍යය ගවේශනය හරහා දත්ත රැස් කරන ලදි. පන්සිය පනස් ජාතක පොතහි "දළුමුර උපත" නම් සංග්‍රහයට අනුව සදෙහි සාරුව ශක්‍රයා විසින් අදින ලද බවත් නා රජුගේ මළ සිරුර දවාලු තැනින් දල්ලක් හටගත් බවත් කියවේ. එම දල්ල මුර කිරීමට නාගයන් 8ක් සිට ඇති අතර ඒ අර්ථයෙන් "දළුමුර" වී ඇත. නාගයාගේ වලිගයෙන් මුල් ද, කදෙන් වැල් ද, පෙනයෙන් කොළය ද හටගත් නිසා නාගවල්ලි යන නාමයෙන් හැදින්වේ. ශාන්තිකර්මයන්හි දැක්වෙන පරිදි මහා සම්මත රජුගේ බිසව වූ මැණික්පාල බිසවට ඇති වූ දොළදුක සංසිඳවීමට නාලොව නා රජු විසින් බුලත් කොළයක් දෙකොනින් අල්ලා ගෙන ගෙන ආ බවට විශ්වාස කරයි. මේ හේතුව නිසා නූතනයේ ද බුලත් කෑමට පෙර නාගයාගෙ විෂ ඇතැයි සලකා බුලත් කොළයේ දෙකොන කඩා ඉවත් කරයි. තවත් ජනප්‍රවාදයකට අනුව සක් දෙවිඳු විසින් ඉවත දමන ලද කොළය මුචලින්ද නා රජුගේ මුඛයට වැටුණු නිසා "ගිරිදළු" නම් වන බවත් සදහන් වේ. ඇතැම් පැරැන්නන් විසින් කැලණියේ සිදුවූ නාග සංග්‍රාමයේ දී මෙය ගෙන ආ බවත් ඉන්පසු පෘථිවිය පුරා ව්‍යාප්ත වූ බවත් සදහන් කරති. භූමියේ හටගත් ලත් හෙවත් වැල් බුලත් වනබව ගැමියන්ගේ විශ්වාසයයි. පූජාවලියෙහි බත බුලත් දී සතපා වශයෙන් ද, සද්ධර්මරත්නාවලියේ බුලත් කා යනුවෙන් ද, කුවේණි අස්නෙහි බත් බුලත් දී සොඳ වශයෙන් ද සඳහන් කොට ඇත. මහාවංශයට අනුව වසභ රජුගේ නැන්දනිය වසභ සමග රජවාසලට ගිය සිය සැමියාට හුරු නැති බුලත් දුන් බව මහාවංසයේ දැක්වේ. හෝපිටිගමුව ශිලාලේඛනයට අනුව බුලත් පුවක් මණ්ඩපයක නොතබා විකිණීම දඩුවම් ලැබිය හැකි වරදකි. නිශ්ශංකමල්ල රජුගේ ශිලාලේඛනයක බුලත් සැපයීමේ දී පස්පලවකින් යුතුව සංග්‍රහ කළ යුතු බව දැක්වේ. සන්නසක සදහන් වන පරිදි ක්‍රි:ව 1953 දී කෝට්ටේ රජ වූ 6 වැනි පරාක්‍රමබාහු රජු විසින් ගිලීමලෙන් සමන් දේවාලයට බුලත් සැපයූ බව දැක්වේ. පැරැන්නන් විශ්වාස කරන පරිදි බුදුරජාණන් වහන්සේගේ මුඛයේ පිහිටා ඇති දන්තයන් 40 සංකේතවත් කිරීමට බුලත් අතට කොළ 40 ක් ඇතුළත් වන බව සඳහන් කරති. බුදුරජාණන් වහන්සේගේ තෙවන ලංකාගමනයේ දී නාගයින් සමගි කිරීමට මුලු පිරිස සංකේතවත් කරමින් බුලත් කොළ 40 ක්, බුලත් අතට ඇතුලත් කළ බව නූතන ජන ව්‍යවහාරය තුළ පවතින තවත් විශ්වාසයකි. මේ අනුව බුලතේ ඓතිහාසිකත්වය ඉතා ඈත අතීතයකට දිව යන බව පැහැදිලි ය.

***ප්‍රමුඛ පදඃ*** *බුලත, සමාරම්භය, ජන ව්‍යවහාරය, විකාශය*

# ග්‍රාමීය ජන ජීවිතය කෙරෙහි ග්‍රාමයේ භූ විෂමතාවය සිදු කරන බලපෑම පිළිබඳ මානව විද්‍යාත්මක අධ්‍යයනයක්, කොහොනාවල ග්‍රාමය ඇසුරින්

ටී. බී. ඩී. හෙට්ටිආරච්චි

මානව විද්‍යා අධ්‍යයනාංශය, මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

*thilinibhagyadeshani@gmail.com*

භූ විෂමතාවය යනු ලෝකයෙහි සියලු ප්‍රදේශ ආවේණික භෞතික ලක්ෂණවලින් අනූන වීමයි.විශේෂිත භූ විෂමතා රටාවක ජීවත්වන්නන්ට එය වාසිදායකවත් අවාසිදායකවත් බලපායි.ඒ අනුව ග්‍රාමීය ජන ජීවිතයට සිදුවන බලපෑම කෙබඳුදැයි මෙහිදී අධ්‍යයනය කෙරුණි. ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, කොහොනාවල ග්‍රාමය මුහුදු මට්ටමෙන් 508ක උසින් කොහොනාවල, බඹරගල, ලුණුගල, වියන්ගල, හා නමුණුකුළ ආදි විශේෂිත කඳුවලට මැදිව සානුගත භූ විෂමතාවයකින් පිහිටයි.එනිසා ඔවුන්ගේ ජීවිතය ආර්ථික හා සමාජීයවත් කායික හා මානසිකවත් විවිධ වෙනස්කම්වලට ලක්ව ඇත.කොහොනාවල සම්බන්ධව විවිධ ජනශ්‍රැතීන් පැවතියත් විදේශීය හා ලාංකේය අධ්‍යයන, පර්යේෂණ හා ලිඛිත සාක්ෂි සටහන් නොමැත්තෙන් ඔවුන්ගේ ජන ජීවිතයත් එහි වත්මන් වෙනස් වීමත් භූ විෂමතාව හේතුවෙන් ආර්ථික, සාමාජීය, සංස්කෘතික හා මානසික වශයෙන් ඔවුන් මුහුණපාන ගැටලු හා බලපෑමත් පදනම් කරගෙන ඔවුන්ගේ ජන ජීවිතය මෙහිදී විමර්ශනය කෙරුණි.මෙම ග්‍රාමයේ ජනයා ආදිවාසීන් වූ වැදි ජනයාගෙන් පැවත එන බවත් එහි ජීවත් වූ "කොහොනා" නමැති වැදි නායකයා රන්මුද්‍රවක් තුළින් ඊතලයක් විද ජයග්‍රහණය කිරීම හේතුවෙන් රන්පත් මුදියන්සේලාගේ යන ගරුත්ව නාමය ඔවුන්ට හිමි වූ බවත් එදා පටන් අද දක්වා කොහොනාවල ග්‍රාමීය ජනයා මෙම වාසගමෙන් පැවත ඒම ඔවුන්ගේ ඥාතිත්වයේ විශේෂත්වයකි.එසේ ම 1818 වෙල්ලසේ කැරැල්ලෙන් මිදී ආ එක ම පවුලේ සහෝදරයෙක් හා සහෝදරියකගෙන් මොවුන් පැවත එන බවත් බොහෝ දුරට රූපවිද්‍යාත්මක ලක්ෂණ අතින් එකිනෙකාට සමාන වීමට ද මෙය හේතු විය හැකි ය. තව ද සානුගත පිහිටීම හේතු කොටගෙන කොන්ගත වූ වළක් ආකාරයෙන් ඉහළට දිස්වන බැවින් කොහොනාවල වූවා යැයි ද ජනශ්‍රැතියේ කියැවේ. ග්‍රාමයේ ජීවත්වන පවුල් 40න් 18ක් ඇසුරින් සම්මුඛ සාකච්ඡා හරහා දත්ත රැස්කර ගැණුනි.ගැමි ආර්ථිකයක් පවතින මෙහි මූලිකව 60% ක් ගම්මිරිස්, කුරුඳු ආදි කුළුබඩුත්, 25% ක් වී, බඩඉරිඟු ආදි ධාන්‍යත්, 14%ක් වට්ටක්කා, මිරිස්, ආදි රාමුගත බෝගත් වගා කෙරෙයි.1%ක් තේ, උක් හා කිතුල් කර්මාන්තයත් මොවුන්ගේ ආර්ථිකයේ කොටසකි.බෑවුම්ගත පිහිටීමත් වගා හානිත් පශු සම්පත් භාවිතය අවම කරයි.මොවුන්ට ඇත්තේ සරල ආහාර රටාවකි.ග්‍රාමයේ සිට වෙළඳපොළ දක්වා යාමට වැඩිපුර කාලයත් ශ්‍රමයත් වැය වීම හේතුවෙන් සති 02කට සැරයක් වෙළඳපොළට යති.ග්‍රාමයට පිවිසෙන මාර්ග 02ක ම බෑවුම්, පර්වත, ජල මූලාශ්‍ර ආදි ස්වාභාවික බාධාවලින් යුතු නිසා අතීතයේ තවලම් යොදා ගැනුනත් වර්තමානයේදී ඔවුහු ඒ බාධක මැඩලමින් සිටිති.බුදුදහම මුල් වූ මොවුන්ගේ ආගමික ජීවිතයේ ප්‍රේත විශ්වාසද ඇත.දේව ආශිර්වාදය උදෙසා සොක්කිරි අම්මා, කාලි අම්මා, පච්ච වීරා ආදි චරිත මගින් සොක්කිරි සෙල්ලම් දින 7ක් පුරා කිරීම ජනශ්‍රැතියේ තිබූ ප්‍රධාන අංගයකි. වැඩිහිටියන් එහි ම විසීමට තැත් කළත් තරුණයෝ පවතින දුෂ්කරතා හේතුවෙන් නගරබද රැකියා සොයා යති.ග්‍රාමයේ තරුණ පිරිසගෙන් 60%ක් සාමාන්‍ය පෙළ දක්වා පමණක් උගනිති. එයින් 15%ක් උසස් පෙළට යොමු වී ඇත.කොහොනාවල විද්‍යාලය ළමුන් 09 දෙනෙකුගෙන් යුතු ප්‍රාථමික පාසලකි. දරිද්‍රතාවය, භූ විෂමතා ගැටලු, බුද්ධිමය හා සමාජීය ආකල්ප මෙයට මූලිකව බලපායි.එක ම ඥාතිත්ව පරම්පරාවක් මුල් කරගත් ගැමියෝ දැඩි බැඳීමකින්, සහයෝගයකින් සිටිති.සෑම කුටුම්භයක් ම හැඳින්වීමට විශේෂිත නාමයන් ඇත. භූ විෂමතාව මොවුන්ගේ ජීවිතය වත්මන් සමාජය හමුවේ මන්දගාමීව පරිවර්තනය කරයි (උදාඃ ග්‍රාමයට විදුලිය ලැබෙන්නේ 2016 වර්ෂයේදී ය). එහෙයින් අවශ්‍ය පහසුකම්, සම්පත් ප්‍රවේශ වීමේ හැකියාව ඉහළ නංවමින් ආර්ථිකය නඟා සිටුවීම, උසස් අධ්‍යාපනයට ප්‍රමාණවත් පහසුකම්, උත්පාදන ජීවනෝපාය තත්ත්වයන්, විධිමත් මානසික හා කායික සුභසාධන සේවා ආදි උචිත ක්‍රියා මාර්ගවලින් මොවුන්ගේ ජන ජීවිතය ඉහළ නැංවිය හැකි බව නිගමනය කළ හැකි ය.

***ප්‍රමුඛ පදඃ*** *භූ විෂමතාව, ජන ජීවිතය, ජන ශ්‍රැතිය, ඥාතිත්වය, පරිවර්තනය*

# වතු කම්කරු ජනතාවගේ සංස්කෘතියේ පවතින ජන ක්‍රීඩා මඟින් නිරූපිත වතු ජීවන රටාව පිළබඳ විමර්ශනාත්මක විග්‍රහයක්

තනුජා දිල්හානි, ඩබ්ලිව්. ජී. ඩී. පෙරේරා, එච්. එම්. කේ. ජී. දුෂ්මන්ත

සමාජ විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

*wgihanhatton@gmail.com*

නූතනය වන විට දැවැන්ත ජීවන අර්බුද ප්‍රමාණයකට මුහුණදී සිටින වතුකරයේ ජනතාව සතුව ඔවුන්ගේ ජීවන රටාව ඇසුරු කොටගෙන ගොඩනැගුණු සුවිශේෂී සංස්කෘතියක් හඳුනාගත හැක. එම සංස්කෘතියේ පදනම ඔවුන්ගේ ජීවන රටාව වේ. ජන සංස්කෘතියක හඳුනාගත හැකි ප්‍රධාන සංස්කෘතිකාංගයක් වශයෙන් ජන ක්‍රීඩා හඳුනාගත හැක. ජන ක්‍රීඩාවක් යනු ජනයා අතින්ම නිර්මාණය වූ ද ජන ජීවිතයේ සුවිශේෂී තත්ත්වයන් නිරූපණයට යොදා ගනු ලබන විනෝදය හා සාම්ප්‍රදායික ආවේණිකත්වයක් ප්‍රකට කරන ක්‍රීඩා වේ. ජන සමූහයේ ආර්ථික, ආගමික හා සමාජීය සන්දර්භයේ සුවිශේෂීතා කේන්ද්‍ර කොටගෙන මෙම ක්‍රීඩා ඇතිවේ. මෙම අධ්‍යයනයේ දී වතු රැකියාවේ නියුතු ජනතාවගේ ජන ක්‍රීඩා මගින් ඔවුන්ගේ ජීවන රටාව ඉස්මතු වන ආකාරය හඳුනා ගැනීම අරමුණු කර ගැනුනි. නුවරඑළිය ප්‍රදේශයේ "නෝවුඩ් වන රාජා" වතු ගම්මානය ඇසුරෙන් පවතින සිදුකරන ලද සම්මුඛ සාකච්ඡා නවයක් හා එම ක්‍රිඩා පිළිබද සිදු කළ නිරීක්ෂණයන් මත පදනම් වූ ප්‍රාථමික දත්තයන්ද වතුකරයේ ජන ක්‍රීඩා සම්බන්ධව පවතින සාහිත්‍ය මූලාශ්‍ර අධ්‍යයනය හරහා ද්විතීයික දත්ත ද සපයා ගෙන ඇත. වතුකරයේ පවතින ජන ක්‍රීඩා අතර "අශ්ව ගුඩුං, ආඩු පිදිත්තල්, කබඩ් විලෙයාඩ්, කොම්බු විලයාට්ටු" යන ජන ක්‍රීඩා සුවිශේෂී වේ. "අශ්ව ගුඩුං" යනු ඉතා සරල ක්‍රීඩාවක් වන අතර මෙය දේශීය පොදු සංස්කෘතියේද විද්‍යමාන වේ. "ආඩු පිඩිත්තල්" යන්න සිංහල භාෂාවේදී එළුවන්කෑම යනුවෙන් හඳුන්වයි. එළුවා යනු දමිලයන් අතර තවත් සුවිශේෂී සත්ත්වයෙකි. ඉතා සරල ක්‍රීඩාවක් වුවත් එහිදී ඔවුන්ගේ ජන ජීවිතය හා බද්ධ වූ සාධක නිරූපණය වේ. කබඩ් යනු ඉන්දියානු සම්භවයක් ඇති ජන ක්‍රීඩාවක් වුවත් දේශීය ආරයකට අනුව පවතින බව පෙනී යයි. දෙපිළකට කරන ක්‍රීඩාව තුළින් එදිනෙදා දිවියේ දී ඔවුන්ට අවශ්‍ය වන සහයෝගිතාව, අවධානය කාර්යක්ෂමතාව යන ගුණාංග ප්‍රකට කරවන ක්‍රීඩාවකි. අන් කෙළිය වතුකරයේ දී "කොම්බු විලයාට්ටු" යනුවෙන් ව්‍යවහාර කරයි. මෙය පත්තිනි දේව ඇදහිල්ල හා සම්බන්ධ ක්‍රීඩාවකි. මෙහිදී අං ගස, "කරයියාක් කුමරම්" නමින් හඳුන්වයි. මෙම ජන ක්‍රීඩා මගින් වතුකරයේ ජනතාවගේ ආගමික විශ්වාසයන් පිළිබඳ වූ තත්ත්වයන් නිරූපණය වේ. මෙහිදි පත්තිනි දෙවියන්ගේ උපත් කථාව හා සම්බන්ධ කවි ගායනා ද යොදා ගැනීම සුවිශේෂී වේ ඇතැම් ස්ථානවල උත්සවාකාරයෙන් පවත්වන මෙම ජන ක්‍රීඩාව තුළදී "කුලත්ති නැටුම" තුළින් පත්තිනි දෙවියන් ගේ ගුණ ගායනා කරයි. එහිදී දක්වන රංගනයන් වන "මෙඩවන් කුරුවර්, ඉඩි මන්තර්, මුණිවර්, ආඬි වගවන්" චරිත තුළින් ද ඔවුන්ගේ ජීවන තත්ත්වයට අදාළ වූ විවිධ සංසිද්ධීන් නිරූපණය කරයි. ජන ක්‍රිඩා තුළන් නිරූපණය වන සතුන් මෙන්ම පුද්ගල චරිතද මෙම සමාජයට ආවේණික වීම තුළ වතුකරයේ ජනයා සතුව පවතින ජන ක්‍රීඩා ඔවුන්ගේ විශ්වාසයන්, ආර්ථික ක්‍රියා කලාපයන් හා මානව සබඳතා නිරූපණය වේ. ආශ්‍රයෙන් ඇතිවී ඇති බවත්, ජීවන තත්ත්වයට අදාළ ලක්ෂණ හඳුනා ගැනීමේ හැකියාවක් පවතින බව දැක්විය හැක.

***ප්‍රමුඛ පදඃ-** ජන ක්‍රීඩා, වතුකරය, ජන ශ්‍රැතිය, විශ්වාසයන්, ජීවන රටාව*

# 'ලංකා ගීතය' චිත්‍රපටයෙන් නිරූපිත සමාජ සංස්කෘතික පැතිකඩ

රවීන්ද්‍ර ප්‍රියන්ත ලාල්

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව

*ravipriyanlal@gmail.com*

බ්‍රිතාන්‍ය ජාතික බැසිල් රයිට් විසින් අධ්‍යක්ෂණය කරන ලද (The Song of Ceylon) ''ලංකා ගීතය'' වාර්තා චිත්‍රපටය 1934 කාල වකවානුවේ ශ්‍රී ලංකාවේ දී රූගත කරන ලද්දකි. ශ්‍රී ලංකාවේ නිපදවන තේ ප්‍රචාරණය අරමුණු කොට ගෙන නිර්මාණය කරන ලද මෙම චිත්‍රපටය තුළ ලාංකේය ජනසමාජය හා පරිසරය පිළිබඳ ශ්‍රව්‍ය දෘශ්‍ය තොරතුරු බොහොමයක් අන්තර්ගතව ඇත. ඒ අනුව ලංකා ගීතය චිත්‍රපටය තුළ ශ්‍රී ලාංකේය ජන සංස්කෘතියේ පැතිකඩක් නිරූපණය වන්නේ ද යන්න පර්යේෂණ ගැටලුව විය. චිත්‍රපටයේ රූප රාමු හා හඬ පටය මගින් එකී සමාජ සංස්කෘතික ලක්ෂණ කවරාකාරයෙන් නිරූපණය වන්නේ ද යන්න සොයා බැලීමත්, එකී කරුණු විශ්ලේෂණය කිරීමත් අධ්‍යයනයේ අරමුණු විය. මෙහි දී ලංකා ගීතය චිත්‍රපටය පිළිබඳවත්, ශ්‍රී ලාංකේය ඉතිහාසය පිළිබඳවත් එල වී ඇති තොරතුරු, චිත්‍රපටයේ රූපරාමු හා හඬ පටය සමග සංසන්දනාත්මකව අධ්‍යයනයට ලක් කරන ලදී. ලංකා ගීතය චිත්‍රපටය, වාර්තා චිත්‍රපට සම්ප්‍රදායේ පියා ලෙස සැලකෙන ජෝන් ග්‍රියර්සන්ගේ නිෂ්පාදනයක් වන අතර, ඔහුගේ අනුගාමිකයෙකු වන බැසිල් රයිට් ගේ අධ්‍යක්ෂණයකි. වාර්තා චිත්‍රපට සම්ප්‍රදායට අනුව අධ්‍යක්ෂවරයාගේ ඍජු මැදිහත් වීමකින් තොරව පවතින යථාර්ථය රූපයට නගා සිනමා ව්‍යාකරණ ඔස්සේ නව නිර්මාණයක් කිරීමට උත්සාහ කෙරේ. The Buddha, Virgin Island, Voice of Commerce, Apperel of God ආදී වශයෙන් පරිච්ඡේද හතරක් ඔස්සේ චිත්‍රපටය තිරය මත දිගහැරේ. චිත්‍රපටයේ නාමාවලිය ආරම්භ වන්නේ උඩරට නර්තන සම්ප්‍රදායේ ගායනයක් සමග ය. අනතුරු ව පහතරට නර්තන සම්ප්‍රදායේ සන්නියකුම ශාන්තිකර්මයේ නර්තන විලාසයන් රූපයට එක් වේ. ඉන් පසු තුන්සරණ ගයමින් සිරිපා නගින වන්දනාකරුවන්ගේ රූපාවලියක් දිස්වේ. මේ අයුරින් ශ්‍රව්‍යදෘශ්‍ය වශයෙන් චිත්‍රපටයෙන් නිරූපිත සමාජ සංස්කෘතික ලක්ෂණ, ආගමික ඇදහිලි හා චාරිත්‍ර, ජීවනෝපාය හා දෛනික දිවිපෙවෙත සහ කලා හා ශිල්ප යන අංශ ඔස්සේ හඳුනාගත හැකි අතර, වෙනත් සියුම් ජනශ්‍රැතික ලක්ෂණ ද අන්තර්ගත වේ. සමස්ත චිත්‍රපටයෙන් කියාපෑමට උත්සහ දරා ඇත්තේ ශ්‍රී ලංකාවේ පාරිසරික හා සංස්කෘතික පොහොසත් භාවය යි. ඒ සඳහා ශ්‍රී ලාංකේය ජන ජීවිතය හා ක්‍රියාකාරකම් ඒ ආකාරයෙන් ම රූපයට නගා ඇත. එය, වාර්තා චිත්‍රපට සම්ප්‍රදායේ ප්‍රධාන ලක්ෂණයකි. දර්ශන තල සම්බන්ධීකරණයට, මෙන් ම විස්තර කථනය සඳහා ලාංකේය ජන සමාජය පිළිබඳ මනා පරිචයක් තිබූ ලයනල් වෙන්ඩ්ට් තෝරාගැනීමෙන් ද විස්තර කථනය සඳහා 1680 දී රොබට් නොක්ස් විසින් රචිත සටහන් උපයෝගී කරගැනීමෙන් ද පෙනී යන්නේ ශ්‍රී ලංකාව පිළිබඳ නිවැරදි හා වැදගත් තොරතුරු චිත්‍රපටයට එක් කිරීමට අධ්‍යක්ෂවරයාට තිබූ උවමනාව යි. ඒ අනුව (The Song of Ceylon) ලංකා ගීතය වාර්තා චිත්‍රපටයෙන් ශ්‍රී ලාංකේය සමාජ සංස්කෘතියේ සැබෑ පැතිකඩක් නිරූපණය වන බව නිගමනය කළ හැක.

***ප්‍රමුඛ පද:*** *සමාජ සංස්කෘතික පැතිකඩ, වාර්තා චිත්‍රපට, (The Song of Ceylon) ලංකා ගීතය.*

# පොරපොල් ක්‍රීඩාව මඟින් ප්‍රකට වන ග්‍රාමීය සංහිඳියාව සහ ජනශ්‍රැතිය (මාතර-මිරිස්ස ග්‍රාමය ඇසුරෙනි)

ඉරංගා සමින්දනී වීරක්කොඩි

සංගීතවිද්‍යා අධ්‍යයනාංශය, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය

*iranga.w@vpa.ac.lk*

පොල් වෘක්ෂය ආශ්‍රිත ජනක්‍රීඩා රාශියක් දැකිය හැකි ය. 'පොරපොල් ක්‍රීඩාව' යනු ඉන් එකකි. එය මාතර, වැලිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් 'මිරිස්ස' ග්‍රාමයෙහි පාරම්පරික ක්‍රීඩාවකි. මෙහි අධ්‍යයන සංගහණය වන්නේ මිරිස්ස 'උඩුපිළ' ග්‍රාමයෙහි පොරපොල් කණ්ඩායම වේ. මෙය ගුණාත්මක පර්යේෂණයක් වන අතර, සිද්ධි අධ්‍යයනය ප්‍රවේශය මෙහිලා යොදාගැනුනි. පොරපොල් ක්‍රීඩාවෙන් ගම්‍ය වන ජනශ්‍රැතිය හඳුනාගැනීම, භාව විශෝධනයට සහ ආධ්‍යාත්මික සංවර්ධනය ඇතිකර ගැනීමට මෙවැනි සාමූහික ක්‍රීඩා පිටිවහලක් වේ දැයි විමසා බැලීම, සංහිඳියාව ගොඩනැගීමට සහ සංස්කෘතික ප්‍රතිපෝෂණයට පොරපොල් ක්‍රීඩාවෙහි දායකත්වය සාකච්ඡා කිරීම මෙහි පර්යේෂණ අරමුණු විය. දත්ත රැස් කිරීමේ විධික්‍රම ලෙස පස් වසරකට වරක් උඩුපිළ - යටිපිළ ලෙස පිල් දෙකකට බෙදී වත්මනේ පැවැත්වෙන මෙකී ක්‍රීඩාව නිරීක්ෂණය, ශ්‍රව්‍ය-දෘශ්‍ය පටිගතකිරීම, අව්ධිමත් සම්මුඛ සාකච්ඡා ඉවහල් කර ගැනුනි. ක්‍රීඩා කරන මෙකී කාලපරිච්ඡේදය තුළ පේළි පෙරහැර, කොඩි පෙරහැර, දේව දානය ආශ්‍රිත වත්පිළිවෙත් දැකිය හැකි ය. එහිලා කපු මහතා, වට්ටඩිරාළ, මඩුපුරේ සහ අණබෙරකරු යන අයට සාම්ප්‍රදායානුකූල ව වගකීම් පැවරී තිබේ. උක්ත ක්‍රීඩාව මඟින් 'දුරාව', 'නැකති', 'රජක' සහ 'ගොවිගම' යන කුල සාධක සතර ඒකරාශි වීමෙන් ග්‍රාමීය සංහිඳියාවක් ගොඩනැගීම විශේෂිත වූවකි. මෙම ක්‍රීඩාව හා බැඳි සංස්කෘතිකාංග 'පුරුෂ' පාර්ශ්වයට පමණක් සීමා වී තිබෙන අතර, මෙකී කාර්යය සඳහා පේවී සිටීම ද නිරීක්ෂණය වූවකි. පොරපොල් යනු හුදු ක්‍රීඩාවක් පමණක් නොව ප්‍රීනන යාතුකර්මයකි. පත්තිනි දෙවියන් හා බැඳි වත්පිළිවෙත්, චාරිත්‍ර, පූජා විධි මෙන් ම ක්‍රීඩාව සහ ප්‍රදේශය සම්බන්ධ ජනශ්‍රැති රැසකින් සමන්විත ය. උක්ත ක්‍රියාවලිය තුළින් ලොකු - කුඩා බොහෝ අයට තම සංස්කෘතිකාංග පිළිබඳ අවබෝධයක් මෙන් ම පුහුණුවක් නිතැතින් ලබා දෙයි. පූජාර්ථය මුල් කොටගත් මෙකී ක්‍රීඩාව සහ ක්‍රීඩාව අවසානයේ රඟ දැක්වෙන කෝලම්, ගම්මඩු ආදිය එළි දැක්වීම හරහා පුද්ගල ආවේග සහ මනෝභාව මුදාහැරීමට ඇති හැකියාව තුළින් භාව විශෝධනයක් ද සිදුවන බව ගම්‍ය වූවකි. ලාංකේය අස්පර්ශනීය උරුමයක් ලෙස මෙකී සංස්කෘතිකාංග අධ්‍යයනය වැදගත් වන්නකි.

***ප්‍රමුඛ පදඃ*** *ජනශ්‍රැතිය, ජනක්‍රීඩා, ලාංකේය අස්පර්ශනීය උරුමය, පත්තිනි සංස්කෘතිය, සංහිඳියාව*

# පැරණි ලාංකේය සමාජයේ පැවති කුල ක්‍රමය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

එල්. එම්. සී. එස්. පී. ලන්දේකුඹුර

රුහුණ විශ්වවිද්‍යාලය

*sandunika1995chamari@gmail.com*

භාරතයේ සිට මෙරටට පැමිණියා වූ විවිධ පිරිස් එහි පැවතියා වූ සංස්කෘතිය මෙරටට ගෙන එන ලදි. නමුත් ලාංකීය සමාජයටම ආවේණික කුල ක්‍රමයක් ගොඩනගාගැනීමට මෙරට ජනයා සමත් විය. කුල යන්න පවුල, ජාතිය හැඳින්වීමට යොදාගැනුනි. ලාංකීය සමාජයේ කුල ක්‍රමය වෘත්තීන් අනුව සංවර්ධනය වූ ආකාරයක් දැකගත හැකිය. තම හැකියා හා දක්ෂතා පදනම් කරගෙන ජනයා විවිධ රැකියාවල නිරත විය. පසුකාලීනව ඒවා පරම්පරාවෙන් පරම්පරාවට පැවත ගිය අතර ඒවා කුල ලෙස සම්මත විය. ඒ අනුව ලාංකීය කුල ක්‍රමය රැකියා කේන්ද්‍ර කරගෙන ගොඩනැගුන බව හඳුනාගත හැකිය. භාරතයේ පැවතියා මෙන් දරුණු කුල ක්‍රමයක් ලාංකේය සමාජයේ නොවීය. නමුත් බ්‍රාහ්මණ, ක්ෂත්‍රිය, වෛශ්‍ය හා චණ්ඩාල යනුවෙන් කොට්ඨාස විය. මෙම පර්යේෂණයේ ගැටලුව වන්නේ පැරණි ලාංකේය සමාජයේ පැවතියා වූ කුල ක්‍රමය කෙබඳු'ද යන්න යි. මෙහි අරමුණ වන්නේ පැරණි ලාංකීය සමාජයේ පැවති කුල ක්‍රමය පිළිබඳ අධ්‍යයනය කිරීමයි. පර්යේෂණ ක්‍රමවේදය වශයෙන් මූලාශ්‍ර අධ්‍යයනය සිදුකරන ලදි. මහාවංශයේ විජය පුරාවෘතයට අනුව උපතිස්ස ග්‍රාමය උපතිස්ස නම් බ්‍රාහ්මණයා පිහිට වන ලදි. මොවුන් පුරෝහිත තනතුරට පත් වූ අතර සිංහාසනය හිස් වූ විට රාජ්‍ය පවා පාලනය කළ බව සඳහන් වේ. මොවුනට සමාජයේ ප්‍රමුඛත්වයක් හිමි විය. පැරණි ලාංකීය සමාජයේ ක්ෂත්‍රියන් ලෙස හැඳින්වූ කුඹුරු හෙවත් කෙත්වතු ආරක්ෂා කළ පිරිසක් විය. එමෙන්ම ජනතාව මෙන්ම නීතිය හා සාමය ද ආරක්ෂා කළේය. අනුරාධපුර යුගයේ ශ්‍රී මහා බෝධී රෝපණයට කාචරග්‍රාම ක්ෂත්‍රීයන් හා චන්දන ග්‍රාමයේ ක්ෂත්‍රියන් ලෙස හැඳින්වූ පිරිසක් පැමිණි බව මහාවංශයේ දැක්වේ. වෛශ්‍ය ලෙස හැඳින්වූ පිරිසක් ද විය. මිහිඳු හිමිගෙන් පැවිද්ද ලැබුවන් අතර "වෙස්ස" ලෙස හැඳින්වූ පිරිසක් සිටි බවත් ඔවුන් වෙස්සගිරි නම් ප්‍රදේශයේ වාසය කළ බව මහාවංශයේ සඳහන් වේ. පැරණි ලංකාවේ ශුද්‍ර ලෙස හැඳින්වූ කුල ප්‍රභේදයක් නොවූ නමුත් චණ්ඩාල නම් කුල ප්‍රභේදයක් සිටි බව දැකගත හැකිය. මොවුන් මෘත ශරීර හා කැලි කසළ ඉවත් කිරීම වැනි සමාජයේ පහත් යැයි සම්මත රැකියාවල නිරත විය. පණ්ඩුකාභය රජු නගර නිර්මාණයේ දී චණ්ඩාලයන් උදෙසා වෙනම ග්‍රාමයක් පිහිට වූ බව මහාවංශයේ දැක්වේ. ඒ අනුව වෘත්තීන් පදනම් කරගෙන පැරණි සමාජයේ කුල ක්‍රමය සංවිධානය වූ බව හඳුනාගත හැකිය. පසු කාලීනව එකී කුල පදනම් කරගෙන ගම් නිර්මාණය වීමද දැකගත හැකිය. කම්මාරග්‍රාම, වඩ්ඩකී ග්‍රාම, කුඹල් ග්‍රාම ඉන් කිහිපයකි. ඒ අනුව ලාංකීයන්ගේ කුල ක්‍රමය භාරතීය සම්ප්‍රදායෙන් බැහැරව ලාංකේයන්ටම අනන්‍ය වූ ආකාරයට ගොඩනගාගෙන ඇති ආකාරය හඳුනාගත හැකිය. පර්යේෂණයේ ප්‍රතිඵලය නම් ලාංකීය සමාජයේ පැවතියා වූ කුල ක්‍රමය පිළිබඳ අවබෝධයක් ලද හැකි වීමයි. මෙම පර්යේෂණයේ නිගමනය වන්නේ පැරණි ලාංකේය කුල ක්‍රමය වෘත්තීන් පදනම් කරගෙන ලාංකිකයන්ටම ආවේණික වූ ක්‍රමයකට සකස් වු බවයි.

***ප්‍රමුඛ පද:*** *ලාංකේය සමාජය, භාරතය, කුල ක්‍රමය, වෘත්තීන්, ලාංකිකයන්*

# Shaping Statesmen and Rulers via Animal-Lore by Niccolo Machiavelli in his Political Treatise, the Prince

Desmond Mallikarachchi

Peradeniya University and Kelaniya University

*wasanthimanik@yahoo.com*

'It is impossible to disentangle what the people of the past thought about plants and animals from what they thought about themselves". (Keith Thomas Man and the Natural World) . It is abundantly clear that the characters of animals have become an integral part of our descriptive, communicative and pedagogical language whether it is moral or political. For example; Owls are wise. Bears are strong. Rabbits are timid. Monkeys are mischievous. Bees are the busiest. Doves are gentle. Lions are brave. Foxes are cunning, and the list obviously is pretty long. Featuring animals as metaphors the texts such as Aesop's fables, Vishnu Mitra's Panchathantra, and the Jatakas have taught humans the value of compassion, respect, integrity and responsibility etc. While moralists in the west and the east alike have used animals depicted in folk literature to teach moral lessons to humans with a view to cultivate their mental attitudes and behavioral patterns there were others who explained their political viewpoints using farmland animals (e.g. George Orwell in Animal Farm) and brutish genetic characters of wild animals (e.g.Thomas Hobbes in Leviathan). But 16th century Italian diplomat Niccolo Machiavelli was a different kettle of fish from others as he was politically peda+gogical. Machiavelli wrote his Prince to educate rulers on a set of administrative norms. Kautilya's Artha Sastra too was written to advice princes about principles of positive governing but he depended on traditional texts. But, having depended on wild animals, Machiavelli skillfully and impressively executed the animal-lore variety of folklore to mould rulers or heads of states. He was in firm belief that some animal instincts are needed to guide the rulers, and he therefore, used the metaphor of the lion and the fox as the exemplary bestial natures to mimic. A lion is strong and brave, but not very cunning, and the fox is cunning and easily escapes snares, but isn't very strong. The ruler, however, cannot afford to choose between the lion and the fox but be both at the same time if he is desired and inclined to be a powerful and successful ruler. Machiavelli's intent was to teach statesmen how to acquire political power and preserve it with astute craftiness. Despite his prosaic style writing Machiavelli has cleverly utilized the characteristics of these two animals, lion and fox, to strengthen his pedagogical political mission of shaping rulers, in my belief, has provided an additional strength to his radical political theory. The Prince is a clear amalgam of two diverse disciplines, politics and animal lore genre of folklore.

**Key Words:** Folklore, Animal-lore, Machiavelli, Pedagog, Kautilya

# Animal-lore of Sri Lanka

A. A. Jayantha Jayasiri[1], A. A. R. Thamodi[2]

[1]Department of Anthropology, [2]Department of Geography, University of Sri Jayewardenepura

*jayanthajayasiri@yahoo.com*

Animal-lore is one of the major elements of folklore. Various types of animal-lore have been identified in almost every cultures of the world. It can be categorized into various themes as fortune-misfortune, mythical, supernatural, religious, magical as well as paranormal. Accordingly, all the types of social attitudes and concepts, social values and norms are concerned towards the animal-lore. So, it is very significant not only in the Science of folklore but also to other humanities and social sciences. The main objective of the study is to identify the nature of the animal-lore in Sri Lanka. To conduct this research, mainly primary and secondary sources were used. As the literary sources books, articles and important documents were referred. As primary sources, different types of animal-lore were gathered from respondents of various parts of the island. As research methods of data collection, interview and observation methods were used by the researcher. According to Sri Lankan animal-lore various types of myths, beliefs, magic, attitudes, concepts and rituals have been built up on most of the animals and birds by the folk community. The sound of crow (kaputusas̄tara), house lizard (hun̄u-sas̄tara), devil bird, owl, yellow-billed babbler (demalichchȧ), oriental magpie-robin (polkichchȧ), hawk, cock, cat, jackal, wolf, dog, horse and elephant have been built up various beliefs among the communities. Arrival of various kinds of animals and birds have led to create beliefs and attitudes of the society such as, flying ants (meru), beetle (ambalampal̇uvȧ), greater coucal (ati kukulȧ), ants (geri), water monitor, Bengal monitor, rat, house sparrow, rat snake, cobra, pigeon, termite and oriental magpie-robin. According to natural scientists, the world is an assemblage of human beings, natural environment and the all kinds of animals and birds. But at present, the life on the Earth has started to disappear enormously as a result of exploiting these animals. Accordingly, ensuring the protection of the animal world is one of the valuable duties of humankind of the world. Therefore, these types of folklore should be protected to develop and change the attitudes of humankind towards the animals and birds.

***Keywords:*** *Animal-lore, Buddhist culture, Sub culture, Natural environment*

# A Study on Cultural Impact on Criminal Victimization in Sri Lanka with Special Reference to "Human Trafficking"

K. G. N. U. Ranaweera, M. P. A. A. Buddhadasa, R. B. N. Sunil

Department of Criminology and Criminal Justice, University of Sri Jayewardanepura

*ranaweera@sjp.ac.lk*

Culture consists of the beliefs, behaviors, objects and other characteristics that are common to the members of a particular group or society. Through culture, people and groups define themselves, conform to society's shared values, and contribute to society. As culture is a part of routine activities of people, multiple relationships between "culture" and "human activities" can be identified. Norms and values create relationships with positive results while specific beliefs generate negative outcomes. Crime and criminal victimization are certain negative consequences produced by culture. According to "Palermo" declaration, "human trafficking" is a transnational organized crime, which means the recruitment, transportation, transfer, harboring or receipt of persons, by means of the threat or use of force or other forms of coercion, of abduction, of fraud, of deception, of the abuse of power or of a position of vulnerability or of the giving or receiving of payments or benefits to achieve the consent of a person having control over another person, for the purpose of exploitation. This research addresses the question of how culture affects criminal victimization which focuses on impact of culture on its human trafficking victimization in Sri Lanka. The sample consisted 100 victims of external human trafficking. According to the reported crimes to the Crime Investigation Department (CID), the random sampling method has been used. Structured questionnaire method was used to gather data, and tabulated using quantitative and qualitative methodologies. Results revealed that the concept of kamma, social detraction, black magic, misfortune of the land (bhoomi dõsha), and catastrophes by planets and stars (graha dõsha), evil mouths and eyes have been identified as cultural reasons for human trafficking victimization. Moreover this cluster of cultural believes has created a "trap of victimization". Making people aware of law and human rights, simplifying the legal procedure, implementing counseling and awareness programmes and introducing a hot line contact number could be recognized as the recommendations to eliminate cultural impact on criminal victimization and control and prevent human trafficking by reducing the victimization.

***Key words:*** *Black magic, Criminal victimization, Culture, Human trafficking*

# මහනුවර යුගයෙහි මාතලේ දිසාවේ, හමුදාවේ ලේකම්මිටියෙන් හෙළිවන තත්කාලීන ජන සංස්කෘතියෙහි භාවිත හමුදා නිලනාම සහ ආයුධ පිළිබඳ අධ්‍යයනයක්

කුසුමලතා ලංකාමුල්ල[1] , චන්ද්‍රාණි ලංකාමුල්ල[2]

[1]සිංහල හා ජනසන්නිවේදන අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, [2]ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව

*kusumalathalanka@gmail.com*

මහනුවර සමයෙහි මාතලේ දිසාවේ හමුදාවේ ලේකම්මිටියෙන් හෙළිවන තත්කාලීන ජන සංස්කෘතියෙහි භාවිත ආයුධ සහ හමුදා නිල පිළිබඳ අධ්‍යයනය මෙම පර්යේෂණයෙහි මූලික අරමුණ විය. දත්ත රැස්කරන ලද මූලාශ්‍රය මාතලේ දිසාවේ හමුදාවේ ලේකම්මිටියයි. එය බත්තරමුල්ල, ඉඩම් අමාත්‍යාංශයෙහි, ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ ලේඛනාගාරයේ පුස්කොළ පොත් එකතුවට අයත් වූවකි. එහි පත් ඉරු 192 කි. මෙය ලේඛන ගත කොටඇත්තේ මාතලේ හුළංගමුවේ රත්වත්තේ විජයවර්ධන සෙනෙවිරත්න අභයකෝන් බණ්ඩාරනායක වාසල මුදියන්සේ මාතලේ දිසාව වශයෙන් සේවය කරන සමයෙහිය. මෙම ලේකම්මිටියෙන් සමකාලීන රාජ්‍ය ආරක්‍ෂාව සම්බන්ධ තොරතුරු හෙළිකර ගතහැකිද යන පර්යේෂණ ගැටලුවට පිළිතුරු සොයමින් මෙකී අධ්‍යයනය සිදුකරන ලදි. ඒ අනුව ක්‍රි. ව. 1592 සිට 1815 දක්වා වූ සියවස් කිහිපයක කාල සීමාව සිංහල සාහිත්‍යයෙහි මහනුවර සමය ලෙස සැලකෙයි. මෙකල රාජ්‍යය පාලනය වූයේ රාජකාරී ක්‍රමය මත ය. ප්‍රධානතම ආදායම රාජකාරියත් ඊට අදාළ සේවාවලින් ලද ආදායමත්ය. මෙකී රාජ්‍ය තොරතුරු ලේඛනගතකොට තැබීමේ ක්‍රමවේදය තහවුරු වූයේ මහනුවර යුගයේදීය. ඒ සඳහා පරිපාලනමය කඩඉම්, සන්නස් - තුඩපත්, අත්තානි ප්‍රදාන, දිවිසීට්ටු ආදි ලේඛන වර්ග යොදාගන්නා ලදි. එයින් එක් ප්‍රවර්ගයක් ලේකම්මිටි නමින් හැඳින්වෙයි. මේවා චූල ගණයේ ඓතිහාසික ලේඛන වන අතර සිවිල් හා රාජ්‍ය ආරක්ෂාව සම්බන්ධයෙන් සකස් කරන ලද ලේකම්මිටි යටතට දුනුකාර, මඩුවේ, වඩන තුවක්කු, සහ හමුදාවේ ලේකම්මිටි අයත් වෙයි. හමුදාවේ ලේකම්මිටිය කොටස් කිහිපයකින් යුක්තය. හමුදා නිලධාරීන්ට ඉඩම් පැවරීම, ප්‍රමාණය, භුක්තිය කෙසේද, අස්වැන්න අයවන ආකාරය, දැකුම් රාජකාරිය, හමුදා කාර්යාංශ, නිලනාම, නිලවලට අයත් අවිආයුධ, ඒවා බෙදී ගිය ආකාරය ආදි වශයෙනි. තත් ලේකම්මිටියෙන් හෙළිවන හමුදා නිල නම් අතපත්තුනානායක්කාර, අතපත්තු රණබාහු ආරච්චි, අතපත්තු රජපස්ස මුදලි, අතපත්තු දවුණ්ඩ රාල, අතපත්තු බන්නැකරාල, අතපත්තු ආරච්චි, අගම්පොඩි, පලිහවඩන, පලිපානරාල, රණසිංහ, මහවෙඩික්කාර මුහන්දිරම, වඩන තුවක්කුකාර, හේවා පන්නය, පඩිකාරමුහන්දිරං, දුග්ගන්නාරාල, ලන්ෂකාර මුහන්දිරම්, මහලන්ෂකාර මුහන්දිරම්, ලන්ෂකාරමකුලේ මඩවිදානේ, ලංසකාරහේවා, මොහොට්ටාල, කොඩිතුවක්කු, කොඩිතුවක්කුකාරහේවා, කුඩාවෙඩික්කාර, හේවාවසම්, දිසානැකරාල, කුලහේවා මුහන්දිරම්, කඩවතේ මොහොට්ටාල, කඩවතේ ආරච්චි ආදි වශයෙනි. මෙම ලේකම්මිටියෙන් හෙළිවන ආයුධ වර්ග මෙසේ ය. තුවක්කු, අත්තුවක්කු, කොඩිතුවක්කු, ලන්ස, පටිසාන, සූස, දුනු-ඊතල, තම්මැට්ට, කස, වේවැල් යන යුධ උපකරණ යි. මෙම ලේකම් මිටියෙන් හෙළිවනුයේ අවසන්වරට පෘතුගීසින්ගෙන් කොළඹ කොටුව (කෝලාඹු නම් කඳවුරු බිඳ) මුදාගැනීමේ සටනට සහභාගී වූ නිල පිරිස වෙත නිකුත්කරන ලද ආයුධ සහ ජයග්‍රහණයෙන් පසුව ඔවුන්ට පිරිනමන ලද ඉඩම් පිළිබඳ විස්තරයි. මහනුවර සමයෙහි ජන සංස්කෘතියෙහි ව්‍යවහාර වුණු ආයුධ සහ යුද සේනාවක තොරතුරු ඇතුළු රාජ්‍ය ආරක්‍ෂක ක්‍රමෝපාය පිළිබඳ ප්‍රක්ෂේපණයක් ලෙස මෙය සැලකිය හැකි බව නිගමනය කළ හැකිය.

***ප්‍රමුඛ පද:*** *හමුදාවේ ලේකම්මිටිය, නිලනාම, අවි ආයුධ, රාජ්‍ය ලේඛන, ආරක්‍ෂා ක්‍රමෝපාය*

# සාම්ප්‍රදායික කුල විභජනය මත පදනම් ව ආර්ථිකය ශක්තිමත් කළ හැකි ද? යන්න පිළිබඳ අධ්‍යයනයක් (මහනුවර යුගයෙහි පැවති කුල ක්‍රමය ආශ්‍රයෙන්)

නීලපොල ධම්මතිලක හිමි

සිංහල අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය

*chathuraprabuddhika1994@gmail.com*

මහනුවර යුගය වන විට ලංකා සමාජ සංවිධානය තුළ ප්‍රධාන සාධක කීපයක් ක්‍රියාත්මක විය. ඒ අතර කුල විභජනය ප්‍රධාන තැනක් ගනී. රටෙහි ආර්ථිකය කෙරෙහි සෘජු හා වක්‍රව කුල විභජනය බලපෑම් කරන්නට යෙදුණි. මෙහි පර්යේෂණ අරමුණ එකල ආර්ථිකය නගා සිටුවීම සඳහා කුල විභජනය ඉවහල් වූ ආකාරය සොයා බැලීම යි. කුල විභජනය පදනම් කොට ගෙන රටෙහි ආර්ථිකය ශක්තිමත් කළ හැකි ද යන්න අධ්‍යයනය කිරීම මෙහි පර්යේෂණ ගැටලුව යි . මූලාශ්‍රය පරිශීලනය, සාකච්ඡා, අන්තර්ජාල භාවිතය දත්ත ඒකරාශී කිරීමේ ක්‍රමවේද වේ. ජෝන් ඩේවි ගොවි, කරා, ආචාරි, හන්නාරි, බඩහැල, ඇම්බැට්ටයෝ, රදා, හාලි, හකුරෝ, හුනු, පණ්ණයෝ, විල්ලිදුරයි, දඩ වැද්දෝ, පදු, බෙරවා, හන්ඩි, ඔලී, පලී, කින්නරු හා රොඩී වශයෙන් කුල විස්සක් මහනුවර යුගයේ පැවති බව දක්වයි. මේ කාලය තුළ ආර්ථිකය යන කරුණ කුල ක්‍රමයෙහි බේදීයාම මත පදනම් වී තිබිණි. ඒ සඳහා තුඩුදුන් ප්‍රධාන කරුණු තුනකි. සම කුල විවාහය, කුලයේ වගකීම ඉටු කිරීම, භාණ්ඩ හා සේවා හුවමාරුව යන්න ය. නෑනා මස්සිනා විවාහය මහනුවර යුගයේ දී වඩා වර්ධනීය තත්ත්වයක පැවතුණි. කුල උරුමය රැකගැනීම, උපකුලයන් නිවැරදි ව ගැළපීමත් ඒ මඟින් බාධාවකින් තොර ව තම කුලයට පැවරුණු භාණ්ඩ හා සේවාවන් නිපදවීම හැකියාව සම කුල විවාහයේ මුඛ්‍යාර්ථය යි. සෑම කුලයකට ම වගකීමක් පැවරී තිබුණි. ආහාර සැපයීමේ රාජකාරිය ගොවි කුලයට හිමි වූ අතර එය උසස් ම කුලය ලෙස ද පිළිගනී. කින්නර කුලයට අයත් වූයේ කලාල හා පැදුරු වියමින් ඔවුන්ට පැවරි රාජකාරිය හා වගකීම ගෞරව සහිත ව කරමින් රටෙහි ආර්ථිකය ශක්තිමත් කිරීම ය. මූල්‍ය ගනුදෙනු සමතික්‍රමණය කරමින් භාණ්ඩ හා සේවා හුවමාරු ක්‍රමයක් මහනුවර යුගයේ පැවතිණි. 'ගොවි කුලයේ වූවෝ සැමට බත බෙදූහ.' ඒ සඳහා අවශ්‍ය උපකරණාදිය සකසා දීම ආචාරි කුලයේ කාර්යභාර්ය විය. මෙයට මිලක් නියම වූයේ ද නැත. හේතුව ගොවි කුලය ආචාරි කුලයට බත සැපයීම යි. එබැවින් දිළින්දන් සමාජය තුළ ව්‍යාප්ත වී සිටියේ ද නැත. රාජ්‍ය ආර්ථිකයේ කොටසක් දිළිඳු සමාජය වෙත යෑම වෙනුවට රටේ ආර්ථිකයට සෑම පුද්ගලයෙක් ම කුල ක්‍රමය මඟින් දායක කරගත හැකි වූ අතර පුද්ගල ආර්ථිකයත් රටෙහි ආර්ථිකයත් එක ලෙස පවත්වා ගෙන යෑමේ ශක්‍යතාව මෙමඟින් නිගමනය කළ හැකි ය.

***ප්‍රමුඛ පදඃ*** *කුලය, ආර්ථිකය, විභජනය, මහනුවර*

# Impact of resettlement on Vedda's Folklife: Based on Hennanigala Village

T. B. D. Hettiarachchi, T. S. S. Dayarathna, S. R Hettimulla

Department of Anthropology, University of Sri Jayewardenepura

*thilinibhagyadeshani@gmail.com*

The Veddas of Sri Lanka have been the indigenous island for centuries. They were scattered all over the island in the eastern and north central parts of the country. Hennanigala is one of the Vedda's village situated in front of Maduru Oya National park. It was declared a under Mahaweli development project in the 1980 s. The people of the Hennanigala village is were resettled under this project. Hence their entire folklife has been changed. Although they had owned an intangible folk cultural heritage, but presently it is very closely connected with the core- society. In fact, Vedda's folklife elements: Language, Myths, Hunting, Gathering and Fishing, Na Yakku rituals (Hathma Yagaya, Kirikoraha Yagaya), folksongs, Clothing appearance and Folk Medicine are eventually changing. According to above elements, Language can be considered as the most important aspect of Vedda's culture. But in presently urbanisation and increased interaction and integration with the other communities have resulted in the disuse of the traditional Vedda language and hunting abilities. In Henanigala Veddas are facing difficulties in engaging in inland fishing in Henanigala and Maduru Oya tanks which they execute permissions for fishing and not in possession of a licence granted. Furthermore, massively changing environment and disuse of cultural aspects, folk songs affect fast becoming of disused and mostly older ones can only sing and memorise traditional songs and lullabies by the Veddas. They try to connect their animistic concepts with in Buddhist ideas. As a result of these, resettlement has contributed to the rapid disappearances of their folklife consequently. This research conducted with a structural questioner – based survey consisted of 25 families around Hennanigala village, which focus on Vedda's folklife, cultural aspects via resettlement issues. Nevertheless, intangible folklife of the living culture of Hennanigala Veddas are currently not appreciated when compared to the historic monuments. The intangible living treasures when in the Vedda's community are being neglected by them or seen as a practise for economical needs and entertainment. And also, Veddas have been attempted parallelly through Sinhalisation and Buddhicisation, it resulted to increase risk of becoming extinct their pure folklife. Although they were living in isolation, there have been external influences from time to time which have in a way enriched the cultural diversity of the Veddas with provide and developed their basic needs, Regional Development plans and Reallocation of the traditional land rights to the Vedda community etc.

***Keywords:*** *Resettlement, Vedda people, Folklife, Intangible, Core- Society*

# Changing Upcountry Tamil Caste System: A Study with Special Reference to Gonamottawa Estate

B. F. Sabrina

Department of Sociology, University of Peradeniya

*fathimasha795@gmail.com*

Caste is social stratification inherited by birth. This stratification varies according to the region as well as religion. Caste system of upcountry Tamil people is area specific. It significantly differ from northern and eastern caste related practices. Hindu caste system is perceived as rigid and resist to mobility compared to Sinhalese caste system. However, as human behavior and culture meet changes all over the time, this study mainly focused on the changes occurred in upcountry caste system. The study was conducted in Gonamotawa estate in Uva Province. This empirical study mainly based on qualitative research approach. And applied purposive sampling for the selection of 12 respondents. The data collection was employed with in-depth interviews and the data was analyzed using thematic analysis. The study revealed that caste has met with changes in many aspects including perception on caste, caste identity, passing caste identity, considering caste differences in marriage and social interaction. Moreover, changes in political participation, caste mobility, replacement of class instead of caste were revealed in the study. Based on the study findings, it is concluded that perception on caste has been changed in Gonamotawa. Caste does not strongly attached to day life of people. It occupies priority in the course of match making and during the ritualistic activities. This works as a strong base in transforming caste identity. Moreover, religion and caste based associations strengthen the practice caste system in the area and further creates disharmony. The study confirmed that compare to the previous generation, caste system does not play a vital role among younger generation. Though complete casteless society is an imagination, present condition depicts that the caste system has started to change.

***Keywords****: caste, perception, caste mobility*

# Stake Net Fishery in Negombo and Chilaw: Status of Traditional Fishing Rights and Cultural heritage

M. T. N. Thilakarathna, H. P. D. A. Lakmali, M. M. A. S. Maheepala, K. H. M. L. Amaralal

Socio- economic and Marketing Research Division, National Aquatic Resources Research and Development Agency (NARA)

*thanujam592@gmail.com*

Stake net, Kattudel, fishery is one of the traditional fishing methods practiced by fishers in Negombo and Chilaw lagoons. This paper examines the evolution of fishing rights and its cultural bindings of stake net fishery in Chilaw and Negombo lagoons. Primary data were collected through administrating semi-structured questionnaire surveys with 15 fishers and conducting 2 Participatory Rural Appraisals (PRA). Data were collected on socio-economic characteristics, fishing rights and cultural linkages of fishers. A majority of fishers (40%) was in the range of 60- 74 years age group while over 33% had between 40 to 49 years of experience in the fishery. The pioneers, 3 families in Negombo: Mihindukulasuriya, Kurukulasuriya and Warnakulasuriya and 3 families in Chilaw: Mihindukulasuriya, Kurukulasuriya and Jayasuriya have still been entitled the traditional fishing rights for this fishery. The locations where the stake nets are being operated called Kattudel paduwa. Seventeen (17) Kattudel paduwa have been identified by the Negombo (Kattudel) fishing regulation and fishing rights have been distributed among four Kattudel Fishermen Associations (KFA): Grand Street KFA, Sea Street KFA, Duwa- Pitipana KFA and Pitipana KFA. In Chilaw fishing regulation, five areas have been reserved for Kattudel fisheries among the sub groups of Pitipana Street, Aluthwatte and Sea Street. Presently, 22 fishing sites in Negombo and 8 fishing sites in Chilaw are being operated. Only married, Christian male descendants have the ownership rights of stake net fishery in both lagoons. It is needed to protect fishing rights and cultural heritage in stake net fishery because it is one of the traditional fishing practices in Sri Lanka.

***Key words:*** *Cultural heritage, Fishing rights, Kattudel paduwa, Stake net fishery*

# FOLK MEDICINE

# විද්‍යාව හා තාක්ෂණය ප්‍රමුඛ කොටගත් සමාජයක් තුළ හෙළ වෙදකමෙහි වැදගත්කම පිළිබඳ විශ්ලේෂණාත්මක අධ්‍යයනයක්

බී. ජී. ඉමේෂා මධුවන්ති

දේශපාලන විද්‍යා අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය

*imeshamaduwanthi46@gmail.com*

හෙළ වෙදකම, බටහිර වෙදකම ආදිය ශ්‍රී ලංකාවේ මානව රෝග නිවාරණය සඳහා යොදාගනු ලබන වෛද්‍ය ධාරවන් වේ. විද්‍යාව හා තාක්ෂණය විසින් බටහිර වෛද්‍ය ශාස්ත්‍රය මනුෂ්‍ය සංහතියේ යහපතට පහළ කළද නූතනයේදී එමගින් සාම්ප්‍රදායික හෙළ වෙදකම මෙන්ම අනෙකුත් වෛකල්පික වෛද්‍ය ක්‍රම විනාශ කිරීමේ දරුණු නිශ්ශබ්ද යුද්ධයක් දියත් කරමින් සිටී. මෙම මරාන්තික තර්ජනයට විසඳුම් වශයෙන්  හෙළ වෙදකමෙහි වටිනාකම මතුව ඇත. නූතන මිනිසාගේ ජීවිතය යහපත් කිරීමෙහිලා හෙළ වෙදකමෙහි දායකත්වය සොයා බැලීම හා එය පිරිහී යාමට බලපෑ හේතු හඳුනා ගැනීම මෙහි අරමුණ විය. අධ්‍යයන ක්ෂේත්‍රය ලෙස වලස්මුල්ල ප්‍රදේශයේ ජීවත්වන වෙද මහතුන් හා යකැදුරන් 10ක්, සාමාන්‍ය ජනතාව 15කින් යුත් නියැදියක් තෝරා ගැනුණි. නිරීක්ෂණ හා සම්මුඛ සාකච්ඡා ඔස්සේ ප්‍රාථමික දත්තද ශාස්ත්‍රීය ග්‍රන්ථ, පුවත්පත්, සඟරා  ඔස්සේ ද්විතීයික දත්තද රැස්කර ගත් අතර, විස්තරාත්මක විශ්ලේෂණය ඔස්සේ අවසානයේ නිගමනවලට එළඹුණි. අධ්‍යයනයේ සොයාගැනීම් වශයෙන් දේශීය වෙදකම බරපතල ලෙස අභියෝගයට ලක්වීම, නූතන සමාජයන්හි බටහිර වෛද්‍ය විද්‍යාව මඟින් බොහෝ ගැටලු ඇති කර තිබීම, ග්‍රාමීය ප්‍රදේශවල තවමත් හෙළ වෙදකම නොනැසී පැවතීම, හෙළ වෙදකමෙන් වන අතුරු ආබාධ අවම වීම, බටහිර වෛද්‍ය විද්‍යාවෙන් ප්‍රතිකර්ම සොයා නොගත් රෝගවලට හෙළ වෙදකම මගින් ප්‍රතිකර්ම සොයා ගැනීම, විවිධ රෝග සඳහා ශාන්තිකර්ම යොදාගැනීම යනාදිය හඳුනාගත හැකිවිය. විශේෂයෙන්ම ලංකාවට පමණක් සුවිශේෂී ඖෂධීය ශාකවල අයිතිය විදේශීය රාජ්‍යයන් විසින් අත්පත් කරගැනීමත් ඒවා ලබාගැනීමට මුදල් ගෙවීමට සිදුවීම බරපතල ගැටලුවකි. නාගරික ප්‍රදේශවලින් හෙළ වෙදකම ඈත්වීම, හෙළ වෙදකම පිළිබඳ මනා නිපුණත්වයකින් හෙබි පාරම්පරික වෛද්‍යවරුන්ට රජය මගින් නීත්‍යානුකූල පිළිගැනීමක් ලබා නොදීම, ව්‍යාජ දේශීය වෛද්‍යවරු පිරිසක් බිහිවීම, බටහිර වෛද්‍යවරු හෙළ වෙදකම පහත් තත්ත්වයෙහිලා සැළකීම, හෙළ වෙදකම වාණිජකරණය වීමත් ගුණාත්මක තත්ත්වයෙන් අඩු දේශීය ඖෂධ වෙළඳපොළට පිවිසීම, දේශීය ඖෂධීය ශාක විනාශ වීම හේතුවෙන් හෙළ වෙදකම ප්‍රබල ලෙස අභියෝගයට ලක්ව තිබේ. බටහිර වෛද්‍ය විද්‍යාවේ දීර්ඝකාලින ප්‍රතිකර්මවලින් වන අතුරු ආබාධ මුල් ආබාධයට වඩා දරුණු වීමත්, පමණ ඉක්මවා ඖෂධ භාවිතයත් නිසා ගැටලු මතුව ඇත. සර්පයින් දෂ්ඨ කිරීම, අස්ථි බිඳීයාම් වැනි රෝගයන්ටද ප්‍රතිකාර පිණිස ජනතාව හෙළ වෙදකමට යොමුව ඇත්තේ ඒ පිළිබඳව පවතින විශ්වාසයත්, එම ප්‍රතිකාර ගැමි සංස්කෘතියත් සමග බද්ධවීම හේතුවෙනි. බටහිර වෛද්‍ය විද්‍යාවේදී යම් ඖෂධයක් නිපදවීමට අවුරුදු ගණනාවක් ගතවුවද, රෝගීයා දුටු පමණින් ප්‍රතිකර්ම හඳුනාගැනීමේත් ආවේශ, ආරූඪ, දිෂ්ටි වැනි මානසික රෝගයන්ට ප්‍රතිකාර කිරීමේත් ශක්‍යතාවය හෙළ වෙදකම සතු විය. මෙමඟින් එළඹිය හැකි නිගමනය වන්නේ, බටහිර වෛද්‍ය ක්‍රමයෙන් නිර්මාණය වී තිබෙන ගැටලුකාරී තත්ත්වයන්ට පිළියමක් වශයෙන් පාරම්පරික හෙළ වෙදකමෙහි රෝග නිර්වාණී ගුණය හඳුනා ගනිමින්, දේශීය හා විදේශීය සංවිධාන විසින් එය යාවත්කාලීන කිරීමට උත්සාහ ගන්නා බවයි.

***ප්‍රමුඛ පද:*** *හෙළ වෙදකම, විද්‍යාව හා තාක්ෂණය, දේශීය වෛද්‍ය ක්‍රම, බටහිර වෙදකම, රෝග*

# දියවැඩියාව දේශීය වෛද්‍ය ක්‍රම මගින් සම්පූර්ණයෙන්ම සුව කරගැනීම පිළිබඳව ගෝලීය පුරවැසියන්ට ලබා දිය හැකි අවබෝධය

එන්. එච්. එල්. කවීශා තත්සරණී

කැලණිය විශ්වවිද්‍යාලය

*kaveeshananayakkara1995@gmail.com*

ලෝකයේ සෑම රටකම පාහේ වයස් බේදයකින් තොරව දක්නට ලැබෙන දියවැඩියා රෝගය සිරුරේ ඇති ඉන්සියුලින් ප්‍රතිශතය අඩුවීමෙන් රුධිරයේ ඇති සීනි ප්‍රමාණය පාලනය කරගත නොහැකි තත්වයට පත්වීම නිසා රුධිරයේ ඇති සීනි ප්‍රමාණය ඉහළ යෑම නිසා ඇතිවෙන්නකි. බටහිර වෛද්‍ය ශාස්ත්‍රයට අනුව මෙම රෝගයට ස්ථිර ප්‍රතිකාර හෝ සම්පූර්ණයෙන් සුව වෙන ප්‍රතිකාර ලබාදීමක් සිදු නොවන අතර දියවැඩියාව පාලනය කිරීම සඳහා පමණක් කටයුතු යොදයි. මෙම රෝගය පාලනයට මිල අධික ඖෂධ මිලදී ගැනීමට ලොව පුරා රටවල් විශාල ධනස්කන්ධයක් වැය කරයි. ශ්‍රී ලංකාවේ ඉපැරණි ඔසු වලින්, පාරම්පරික හා දේශීය වෛද්‍ය ක්‍රම මගින් මෙම රෝගය සම්පූර්ණයෙන් ම සුව කිරීම සිදු කළ හැකි ද යන්න සොයා බැලීම මෙම අධ්‍යනයේ එක් අරමුණකි. එමෙන්ම මෙම හෙළ වෛද්‍ය ශාස්ත්‍රය භාවිතයෙන් දියවැඩියාව සුව කිරීමට ඇති හැකියාව පිළිබඳව ගෝලීය පුරවැසියන්ට නිසි අවබෝධයක් ලබා දීම මෙහි අනෙක් අරමුණයි. මෙම අධ්‍යයනය සඳහා දේශීය වෛද්‍ය විද්‍යාව පිළිබඳව සඳහන් ග්‍රන්ථ, පුවත්පත් හා  වෙනත් ලිපි උපයෝගී කරගන්නා ලදී. එමෙන්ම දේශීය වෛද්‍යවරියෙක් සමඟ සාකච්ඡා කිරීමෙන් ලබාගත් තොරතුරු ද ආශ්‍රයෙන් අධ්‍යයනය සිදුකරනු ලැබීය. එම අධ්‍යනයේ දී හෙළ ඔසු භාවිතයෙන් ඉතාමත් සරළ හා වියදම් අවම ක්‍රම මගින් දියවැඩියාව වැළදීම වලක්වා ගැනීම මෙන්ම රෝගය සම්පූර්ණයෙන්ම සුව කළ හැකි ආකාර කිහිපයක් පිළිබඳව කරුණු එක්රැස් කළහැකි විය. විශේෂයෙන්  අපට එදිනෙදා සොයාගත හැකි කුරුඳු, තැඹිලි, මී පැණි, අරළු, එනසාල්, වෙනිවැල් ගැට, අට්ටික්කා මුල්, තෙඹු කොළ, වල් කොත්තමල්ලි, කහ, නෙල්ලි, දෙළුම්, කොහොඹ කොළ වැනි ඖෂධ මේ සඳහා භාවිතයට ගතහැකිය. මීට අමතරව ආයුර්වේදයේ තවත් බොහෝ ප්‍රතිකාර දියවැඩියාව සුව කිරීම සඳහා යොදා ගනියි. බටහිර වෛද්‍ය විද්‍යාවේදී පොදුවේ දියවැඩියාව යන නමින් හැඳින්වුවත් ආයුර්වේදයේදී මෙය වර්ග ගණනාවකට වර්ග කරමින් ප්‍රතිකාර කරන ආකාරයක් ද දක්නට ලැබේ. ඒ අනුව බලන විට බටහිර වෛද්‍ය ක්‍රමයට වඩා විධිමත්භාවයක ප්‍රතිකාර දියවැඩියාව සඳහා දේශීය වෛද්‍ය ශාස්ත්‍රයන්ගෙන් ලැබෙන බවක් පෙනී යයි. දේශීය වෛද්‍ය ක්‍රම වල අදහස් ද ගෙන එයට දියුණු වෛද්‍ය විද්‍යාත්මක ක්‍රම හා තාක්ෂණය එකතු කිරීම මගින් වර්තමානයට ගැළපෙන ආකාරයට දියුණු ප්‍රතිකාර ක්‍රමයක් නිර්මාණය කරන්නට හැකි නම් එය වඩාත් වැදගත්වනු ඇත.

***ප්‍රමුඛ පදඃ*** *දියවැඩියාව, දේශීය වෛද්‍ය, සුව කිරීම, අවබෝධය*

# ශාන්තිකර්මයන්හි අන්තර්ගත වර්ණ සංයෝජනය තුළින් සිදුවන රෝගනිවාරණ මනෝචිකිත්සාව පිළිබඳ අධ්‍යයනයක්

එල්. එන්. අනුපමා

භාෂා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය

*anupamaliyanage49@gamil.com*

අතීතයේ සිටම ලාංකික ජන සමාජය තුළ විශ්වාසය පදනම් කොටගත් ඇදහිලි රාශියක් පැවැතුණු අතර වර්තමානයේ ද එයින් ශේෂව පවත්නා යක්තොවිල්, දේවතොවිල්, බලිතොවිල් ආතුරයන්ගේ රෝගෝපද්‍රවයන් සමනය කිරීම උදෙසා පවත්වනු ලැබේ. භූතාචාර්යයන් විසින් ශාන්තිකර්ම ආකෘතිය සකස් කිරිමේදී විවිධ චිකිත්සක ක්‍රමෝපායන් භාවිතයට ගෙන ඇත. මෙම චිකිත්සක ක්‍රම තුළ වර්ණ භාවිතයට හිමි වන්නේ ප්‍රධාන ස්ථානයකි. දෘෂ්‍ය මාධ්‍ය අවකාශය තුළ වර්ණ තුළින් ග්‍රාහකයාට ප්‍රබල බලපෑමක් ඇති කරමින් මිනිසාගේ මානසික හැඟීම් වෙනස් කිරීමට හා නව අදහස් ජනනය කිරීමට වර්ණවලට හැකියාව ඇත. ශාන්තිකර්ම තුළ අන්තර්ගත වර්ණ සංයෝජනයේ භාවිතාවන් සහ මනෝවිද්‍යාත්මක වශයෙන් ඒවායේ සාර්ථකභාවය කවරාකාර ද යන්න අධ්‍යයනය අරමුණු කරගත් මෙම පර්යේෂණයේදි සන්නියකුම, රටයකුම, බලියාගය යන ශාන්තිකර්ම යොදා ගැනුණි. මෙම පර්යේෂණයෙදී දත්ත ඒකරාශි කිරීම සඳහා ගුණාත්මක දත්ත රැස්කිරිමේ ක්‍රමවේදය සහ සාහිත්‍ය මුලාශ්‍ර පරිශීලනය සිදු කරන ලදි. ශාන්තිකර්ම තුළ භාවිත කරනු ලබන ඇඳුම්පැළඳුම්, වේෂනිරූපණය. රංගාලෝකකරණය, වේදිකා සැරසිලි සඳහා වර්ණ රැසක් මනා ශික්ෂණයකින් හා ඉතා සුක්ෂම ලෙස සංයෝග කර ඇත. ජනවිඥාණගත යක්ෂයින් සහ මනඃකල්පිත ප්‍රතිරූප ආතුරයාගේ අභිමුවට ගෙන ඒමේදි දැඩි විශ්වාසනීත්වයක් ඇති කිරීම සඳහා වර්ණ න්‍යාය භාවිතා කර ඇති බව පෙනි යයි. වර්තමානයේදී සුදු පැහැයෙන් සියලුම වර්ණ පරාවර්තයත්, රතු දීර්ඝතම තරංග ආයමයක් සහිත ආක්‍රමණශිලි වර්ණයක් ලෙසත්, කහ ක්ෂණික උත්තේජනයක් සහිත පාරිශුද්ධත්වයද, කළු සියලු වර්ණ අවශෝෂණය හා භයානකත්වයත් නිරූපණය වන බව විද්‍යාත්මකව තහවුරු වී ඇත. සන්නියකුමේදී ලෙඩරෝග නිරූපණය සඳහා වෙස්මුහුණු බහුලව යොදා ගන්නා අතර රතු, කළු, නිල්, කහ වැනි වර්ණ යොදා ගැනේ. දරු ගැබක් හට ගැනීමේ සිට ප්‍රසූතිය දක්වා කාන්තාවගේ පිරිසිදු භාවය මුලික කර ගනිමින් කපුයක්කාරිය, නානුමුරය වැනි අවස්ථාවන්හිදි සුදු හා රතු, කළු, නිල්, කහ වැනි වර්ණ ද යොදා ගෙන ඇත. නවග්‍රහයින්ට ආවේණික වර්ණ ලෙස රන්වන් පැහැය, සුදු, රතු, නිල්, කහ, අළු, පඬු පැහැය වැනි වර්ණ යොදා ගන්නා අතර බලි වර්ණවත් කිරීමෙන් එයට සජිවි බවක් ආරෝපණය වී ඉන් කිරණක් නිකුත් වන බව භූතාචාර්යයන්ගේ මතයයි. මේ අනුව අතීතයේ පටන් භූතාචාර්යයන්ගේ සිතැගි පරිදි වර්ණ යොදා ගැනීමක් නොව මිනිසුන්ගේ චේෂ්ටාවන් සුභදායි ලෙස සංජානනය කිරීම සඳහාම වර්ණ මනෝවිද්‍යාත්මකව යොදා ගත් බවත්, එයින් අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනය සඳහා අත්වැසිල්ලක් වු බව පෙනි යයි. ඒ අනුව ශාන්තිකර්ම පුරාවට විහිදි ඇති චිකිත්සක ක්‍රම අතර වර්ණ භාවිතය ද මනෝචිකිත්සක ක්‍රමයක් ලෙස හඳුනා ගත හැකිය.

***ප්‍රමුඛ පදඃ*** *වර්ණ, ශාන්තිකර්ම, රෝගනිවාරණය*

# Sri Lankan Folk Medicine for the Treatment of Eye Diseases

J. I. D. Diddeniya

Institute of Indigenous Medicine, University of Colombo

*jidd1524@gmail.com*

Folk medicine which is also known as traditional medicine or Indigenous medicine is unique to each country and it has been practiced for many centuries. The Sri Lankan folk medicine has a vast history and people who lived in the past, practiced it before the advent of modern health care. With the availability of resources and time, those days' people made use different kinds of drug preparations accordingly. Even in the present days, the usage of folk medicine is very common due to its effectiveness. Eye diseases such as cataract, conjunctivitis, glaucoma and retinopathy are commonly found due to various reasons like exposing to ultra violet light, unhealthy dietary and behavioral patterns, misuse of computers, mobile phones etc. Folk medicine can be used in a significant way to prevent them. The objective of this study was to examine the remedies documented in texts related to folk medicine such as "Thalpathe Piliyam", "Deshiya Chikitsa Sangrahaya" in order to overcome eye diseases. Both external and internal drug preparations have been used in folk medicine for that purpose. The results obtained from the survey showed that many drug preparations can be used in relieving eye diseases. Some of them can be mentioned as follows, "Kashaaya"(decoctions) such as "Triphala Kashaaya" which contains "Aralu"(*Terminalia chebula*), "Bulu"(*Terminalia belerica*), "Nelli" (*Phyllanthus emblica*), and "Guli"(pills), "Kalka"(pastes) can be used as internal drug preparations. External preparations such as "Thawili", "Hisa gallum", "Netra bindu", "Nasna", "Adun" are highly effective in alleviating eye diseases. For washing the eyes, boiled water of "Siyambala"(*Tamarindus indica*), "Delum"(*Punica granatum*), "Sepalika"(*Nyctanthes arbor-tristis*) can be used. "Purawaliyam" means a preparation which has to be applied around eyes. As an example "Rath hadun" (*Pterocarpus santalinus*), "Sudu hadun"(*Santalum album*), "Welmi"(*Glycyrrhiza glabra*) grinded with bee's honey can be mentioned. Very abundantly used "Netra bindu"(eye drop) is "Triphala Netra bindu". Especially "Adun"(collyrium) such as "Nawapatala varthi" is widely used in treating cataract. Apart from that, preventive measures such as putting few drops of lime into eyes, eating green leaves, applying oil on head has also been mentioned in folk medicine. Therefore it can be concluded that for the prevention of eye diseases folk medicine can play a major role and if we are able to follow it appropriately, we can refrain from eye diseases very well.

***Key words:*** *Folk medicine, Sri Lanka, eye diseases, Drug preparations*

# ලාංකේය සංස්කෘතික සන්දර්භය තුළ දෙවියන්ගේ ලෙඩ ලෙස හඳුන්වනු ලබන පැපොල රෝගය නිවාරණය උදෙසා ජනවෙදකමෙහි උපයෝගීතාව

කේ. ඩී පියුමාලි

සමාජ විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

*piumali.dp@gmail.com*

කිසියම් සමාජයක් පිළිබඳ කතා කිරීමේ දී ඒ හා බැඳුණු සංකල්පයක් ලෙස සංස්කෘතිය (Culture) සැලකිය හැකිය. සංස්කෘතිය පිළිබඳ අර්ථකතන රැසකි. ඒ සියල්ල සැලකූ විට එහි පොදු අදහස නම් සංස්කෘතිය යනු ජනතාවගේ සමස්ත ජීවන ක්‍රමය බවයි. පැපොල රෝගය බටහිර වෛද්‍ය විද්‍යාවට අනුව *varicella zoster* නැමැති වෛරසය මගින් ආසාදනය වන ඉතා ඉක්මනින් අන් අයට බෝවන රෝගී තත්වයක් ලෙස නිර්වචනය කරනු ලැබුව ද ලාංකීය ජීවන ක්‍රමය තුළ එවැනි රෝග හඳුන්වනු ලබන්නේ දෙවියන්ගෙන් උරුම වූ ලෙඩ නැතිනම් දෙවියන්ගේ ලෙඩ ලෙසය. ගැමියන් අතර පාරම්පරිකව පැවැත එන ප්‍රචලිත ජනශ්‍රැති අංගයක් ලෙස සැලකෙන ජනවෙදකම සඳහා ලාංකීය සංස්කෘතිය තුළ ඇත්තේ දැඩි විශ්වාසයකි. සාම්ප්‍රදායික වෙදකම ලෙස හඳුන්වනු ලබන මේ සඳහා මුදල් වැය වීමක් නැති අතර ගැමියන් විසින් ඖෂධ සපයා ගැනීම සිදු කරයි. විශේෂයෙන් ම කසාය, තෙල්, පත්තු, පොට්ටනි ආදිය ද කෙම් ක්‍රම මැතිරීම් ද වෙදකමේ අංග වූ අතර බෝධි පූජා පැවැත්වීම, දෙවියන් උදෙසා පුද පූජා පැවැත්වීම ද සිදුකරනු ලබයි. හුරුව මත පදනම් වූ ජන වෙදකම දියුණු සන්නිවේදන ක්‍රමෝපායන් තුලින් පරම්පරාවෙන් පරම්පරාවට පැවැත ඇත. බෝවන රෝග කාණ්ඩයට අයත්වන රෝගයක් වන පැපොල රෝගය සමඟ ලාංකීය ජනවෙදකමට ඇත්තේ සමීප සබඳතාවයක් වන අතර ලාංකීය සංස්කෘතික සංන්ධර්භය තුළ පැපොල රෝගය නිවාරණය උදෙසා ජනවෙදකමෙහි උපයෝගීතාව අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ මුඛ්‍ය අරමුණ වේ. මෙම පර්යේෂණයේ අරමුණ විග්‍රහ කිරීම සඳහා ගාල්ල දිස්ත්‍රික්කයේ හබරාදුව ප්‍රදේශීය කොට්ඨාශයේ පිටිදූව ග්‍රාම නිළධාරී වසමේ අවුරුදු 10ට වඩා පදිංචි ගෘහ කුටුම්භ 50 ක් නියදිය වශයෙන් සරල සසම්භාවී නියදීමේ ක්‍රමයට තෝරාගන්නා ලදි. එයට අමතරව ද්විතීක මූලාශ්‍ර වශයෙන් පුස්තකාල පොතපත අධ්‍යනය කිරීමෙන් තොරතුරු රැස්කරන ලදි. නාගරික ග්‍රාමීය ජනයා පැපොල රෝගය නිවාරණය උදෙසා බටහිර වෛද්‍ය ක්‍රමයන් සහතික කළ ද පැපොල රෝග හා බැඳි ජන වෙදකම හා විශ්වාසයන් තුළින් රෝගය නිවාරණය හා ව්‍යාප්තිය අවම කිරීම උදෙසා ඉහළ දායකත්වයක් ලබා දෙන බව අධ්‍යයනය තුළින් තහවුරු විය. නූතන වාණිජකරණයට ලක් වූ සංස්කෘතිය තුළ ජනවෙදකම අභියෝගයට ලක්වෙමින් පැවැතිය ද දෙවියන්ගේ ලෙඩ ලෙස සැලකෙන පැපොල රෝගය, කම්මුල්ගාය, ඇස්ලෙඩ ආදී බෝවන රෝග නිවාරණය හා බෝවීම අවම කිරීම උදෙසා ජනවෙදකම හා බැඳි අභිචාර විධි, පුද පූජා හා විශ්වාසයන්ට රෝගියාගේ මානසික සුවතාවය හා විශ්වාසනීයත්වය වර්ධනය සඳහා ධණාත්මක බලපෑමක් කිරීමේ හැකියාවක් පවතී.

***ප්‍රමුඛ පද:*** *දෙවියන්ගේ ලෙඩ, ජන වෙදකම, පැපොල රෝගය*

# පහතරට ජන වෙදකම: දේශීය චිකිත්සාවේ දී යොදා ගන්නා පුවක් මල් ප්‍රතිකාරය පිළිබඳ අධ්‍යයනයක්

පී. එස්. ජී. ආරච්චිගේ

කැලණිය විශ්වවිද්‍යාලය

*helawedan@gmail.com*

*Areca catechu* යන උද්භිද විද්‍යාත්මක නාමයෙන් හැඳින්වෙන පුවක් ගස ලාංකේය ජන ජීවිතය හා බැඳී පවතින්නේ අනාදිමත් කාලයක සිට ය. එකී උද්භිදයෙහි ගෙඩි, මල්, කොළ, මුල් ආදි කොටස් ඖෂධ පිණිස ද දේශීය චිකිත්සාවේ දී භාවිත කරන්නකි. පුවක් මල් සමඟ ලාංකේය සමාජයෙහි ඇත්තේ සුවිශේෂ සංස්කෘතිමය බැඳීමකි. ජන වෙදකම තුළ පුවක්මල් ප්‍රතිකාර ක්‍රමයෙහි උපයෝගිතාව කෙබඳු ද? කිනම් රෝග සඳහා භාවිත කළ හැකි වේ ද? එහි දේශීය චිකිත්සීය ස්වභාවය කවරාකාර ද? යන පර්යේෂණ ප්‍රශ්න මෙහිලා අවධාරණය කෙරේ. මාස හයක කාල පරිච්ඡේදයක් තුළ ප්‍රතිකාර සඳහා පැමිණි රෝගීන් විසි දෙනෙකු ඇසුරින් සම්මුඛ සාකච්ඡා ක්‍රමවේදය සහ සායනික අත්දැකීම් පදනම් කොට මෙහි දත්ත එක්රැස් කර තිබේ. රෝග රැසක් නිවාරණයට පුවක්මල් ප්‍රතිකාරය ප්‍රතිඵලදායක වූ බව මෙහිලා පෙනී යන්නකි. ගන්ඩමාල චිකිත්සාව, කැඩුම් බිඳුම් චිකිත්සාව ආදියේ දී මෙන් ම රක්ත ප්‍රදර රෝගයේ දී ද දත් මුල් දිය වීම, විෂ ශරීර ගත වීම ළපටි පුවක්මල් උපයෝගි කරගැනීමෙන් ප්‍රතිඵල රැසක් ළඟා කර ගත හැකි බව නිරීක්ෂණය වූවකි. විශේෂයෙන් නහර ගැට ගැසීමේ රෝගයේ දී පුවක් මල් උපයෝගි කර ගෙන ප්‍රතිකාර කිරීම ඉතා සාර්ථක වූවකි. රෝග අවස්ථාව අනුව වට්ටෝරු දෙකක් ඇසුරෙන් ප්‍රතිකාර නිර්දේශ කළ අතර, ළපටි පුවක්මල්, අක්කපාන කොළ, අමු ගොරකා බික් දෙකක්, අමු කහ, වල් අඹරැල්ලා දළු, සහිඳ ලුණු සමඟ අඹරා නහර ගැට ගැසී ඇති ස්ථානවල අලේප කිරීමෙන් රෝගය මුල් අවස්ථාවේ දී ම සුවපත් කරගත් බහුතරයක් දැකිය හැකි විය. ළපටි පුවක් මල් කපා ලුණු ලා සිහින් වන තුරු වනේ දමා කොටා මලවා රාත්‍රියේ නහර ගැට ගැසී ඇති ස්ථානවල බැඳ තැබීමෙන් නහර ගැට ගැසීම අවම කර ගත හැකි බව සායනික පරීක්ෂාවේ දී ප්‍රත්‍යක්ෂ වූවකි.

***ප්‍රමුඛ පද:*** *පුවක් මල්, දේශීය චිකිත්සාව, ජන වෙදකම, අත් බෙහෙත්, පාරම්පරික දැනුම*

# බලි ශාන්තිකර්මයේ භාවිත නව කොළ අත්ත හා එහි ඇති දේශීය වෛද්‍ය විද්‍යාත්මක වටිනාකම

ඩබ්. ජී. එච්. එම්. වෙද්දෙනිය, ජේ. ඒ. ටී. සී. ජයසිංහ

මානව ශාස්ත්‍ර පීඨය, ලලිතකලා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

*weddeniya@gmail.com*

දේශීය බලි ශාන්තිකර්මය උඩරට, පහතරට, සබරගමු යන නර්තන සම්ප්‍රදායන් ත්‍රිත්වයටම පොදු වූ ග්‍රහයන් උදෙසා කරන ශාන්තිකර්මයකි. එය උඩරට බලි, පහතරට බලි, සබරගමු බලි, නුවරකළාවීය බලි, ඌවේ බලි වශයෙන් ප්‍රධාන ශෛලීන් 5ක් යටතේ හඳුනාගත හැකිය. එම ශෛලීන් පහේ ම පොදුවේ භාවිත වන ග්‍රහයින්ගේ විමාන ලෙස සලකනු ලබන ශාක නවයක් ද හඳුනාගත හැකිය. එනම් ඉඹුල්, කරඳ, කොලොන්, නුග, වැටකේ, දිවුල්, කොහොඹ, බෝ, කෙසෙල් යන ශාකයන්ය. ජන වෙදකම  හා දක්වන සම්බන්ධය නිසාවෙන්ම එම ශාකවල අතු බලි රංගභූමිය තුල ද භාවිත වේ. බලි ශාන්තිකර්මයේ භාවිතයට ගන්නා නව කොළ අත්තේ දේශීය වෛද්‍ය විද්‍යාත්මක පසුබිම හා ස්පර්ශ චිකිත්සා ක්‍රමවේදයක් ලෙස ඒවා භාවිතයට ගන්නා ආකාරය පිළිබඳව අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ මූලික අරමුණ වේ. මෙහිදී මෙකී ලක්ෂණ විමර්ශනය සඳහා දැනට ලියැවී ඇති මූලාශ්‍ර සාධක, ක්ෂේත්‍ර ගවේෂණ, සම්මුඛ සාකච්ඡා සහ සහභාගිත්ව නිරීක්ෂණය තුලින් ලබා ගත් දත්ත උපයෝගී කොට ගෙන ඇත. දේශීය බලි ශාන්තිකර්මය ග්‍රහයින්ගෙන් පැමිණෙන අපල උපද්‍රව සහ ලෙඩ රෝග වලින් දුරුවී ශාන්තිය ලඟා කරගැනීම උදෙසා පවත්වන ශාන්තිකර්මයකි. බොහෝ පර්යේෂකයින් පෙන්වා දෙන පරිදි නව කොළ අත්ත තුළ ප්‍රාථමික ලක්ෂණ විද්‍යමාන කරන අතර එය භාවිත කරනු ලබන මෙම බලි ශාන්තිකර්මයද ප්‍රාථමික ගණයේලා සැලකිය හැකි ශාන්තිකර්මයක් වන බවට කරුණු දක්වා තිබීම නිවැරදි ද යන්න මෙම පර්යේෂණයෙහිදී මතු වූ ප්‍රධාන ගැටළුව වේ. එම මතය ඔවුන් විසින් දරනුයේ බලි යාගය සහ බලි යාග ඇදුරා පිළිබඳ කරුණු නොදන්නා හෙයින් බව උපකල්පනය කළ හැකිය. දේශීය බලි යාගය තුළ භාවිතයට ගන්නා නව කොළ අත්ත සඳහා ඉඹුල්, කරඳ, කොලොන්, නුග, වැටකේ, දිවුල්, කොහොඹ, බෝ, කෙසෙල් යන ශාක පිළිවෙලින් රවි, සිකුරු, කුජ, ශනි, රාහු, චන්ද්‍ර, බුධ, ගුරු, කේතු යන ග්‍රහයින්ට නිවේදනය ව පවතී. දේශීය වෛද්‍ය ක්‍රමයට අනුව නවකොල අත්ත සඳහා භාවිත කොළ අතු තුළින් වා, පිත්, සෙම් සමනය කිරීම සිදු වේ. එබැවින් බලිය තුලදී වාතය, සෙම හා පිත සමව පවත්වා ගෙන යාමට නවකොල අත්ත ඉවහල් වේ. එමෙන්ම ජ්‍යොතිශයට අනුව ඒ ඒ ග්‍රහයින්ට අදාල කොළ අතු වලින් ග්‍රහයා නිවේදනය දක්වන රෝගය සහ ආතුර මානසිකත්වය පාලනය සඳහා ස්පර්ශ චිකිත්සාවක් වශයෙන් බලි ශාන්තිකර්මය තුළ භාවිතා කරනු ලැබේ. එහිදී රුධිරය සඳහා ප්‍රධාන වන රවි ග්‍රහයාගෙන් ඇති වන ශරීර උෂ්ණත්වය පාලනයට ඉඹුල් අතු, මිනිස් හැඟීම් හා රාගිකමය සිතුවිලි වලට නිවේදනය වන සිකුරු ග්‍රහයාගේ මිනිස් රාගික හැඟීම් පාලනයට කරඳ අතු, අස්ථි සම්බන්ධ කුජ ග්‍රහයාගේ බලපෑම් පාලනයට කොලොන් අතු, වාතය හා සම්බන්ධ ශනි ග්‍රහ දොස් වලට වාතය සමව පවත්වා ගැනීමට නුග අතු, රාහු මිනිස් සිරුරේ ගෙලෙන් උඩ කොටසට නිවේදනය වන අතර මානසික සුවය ඇති කිරීමට වැටකේ අතු, මනස හා සම්බන්ධ චන්ද්‍රගේ බලපෑමෙන් ඇති වන සෙම් රෝග සඳහා දිවුල් අතු යොදා ගනී. මෙම පර්යේෂණයේ දී ලද දත්ත හා තොරතුරු විශ්ලේෂණයෙහිදී හුදු මිත්‍යා විශ්වාස සහ ප්‍රාථමික ඇදහිල්ලක් නිසා හෝ ප්‍රාථමික සමාජීය ලක්ෂණ පිළිබිඹු කිරීමට හෝ මෙම ශාක පත්‍ර ශාන්තිකර්මය තුළ භාවිතා නොවන අතර එහි දේශීය වෛද්‍ය විද්‍යාත්මක සහ ජ්‍යොතිෂ විද්‍යාත්මක සාධක නිතැතින්ම අන්තර්ගතව භාවිතා වනබව නිගමනය කළ හැකිය.

***ප්‍රමුඛ පදඃ*** *බලි ශාන්තිකර්මය, නවකොළ අත්ත, දේශීය වෛද්‍ය ක්‍රමය, ජ්‍යොතිෂ විද්‍යාව*

# පැරණි ලංකාවේ ග්‍රාමීය සෞඛ්‍ය සංරක්ෂණ විධි පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

ඒ. ජී. සු' ලක්මාලි, ඩී. ඒ. අයි. එස්. එස්. ධර්මපාල, පී. ජී. අයි. සෙව්වන්දි

රුහුණ විශ්වවිද්‍යාලය

*agsurekalakmali@gmail.com*

සෞඛ්‍යය යනු, හුදෙක් ලෙඩ රෝගවලින් තොරවීම පමණක් නොව කායික, මානසික, සමාජීය හා ආධ්‍යාත්මික යහපැවැත්මේ පූර්ණත්වය ලෙසින් ලෝක සෞඛ්‍යය සංවිධානය නිර්වචනය කරනු ලබයි. ක්‍රි.පූ. හයවන සියවසේ දී ගෞතම බුදුන් වහන්සේ විසින් "ආරෝග්‍ය පරමා ලාභා" යන ගාථාව තුළින් ද යථෝක්ත අදහස පිළිබඳව දේශනා කොට ඇත. ප්‍රාග් ඓතිහාසික යුගයේ පටන්ම ලංකාවේ ග්‍රාමීය සෞඛ්‍යය සංරක්ෂණ විධි භාවිත කොට ඇති නමුදු මහින්දාගමනයෙන් පසු එහි සංවර්ධනීය මෙන්ම විධිමත් තත්වයක් දැකගත හැකිය. අතීත රජවරුන් සෞඛ්‍යය සංරක්ෂණය සඳහා අනුගමනය කළ ක්‍රමෝපායන් මෙන්ම පැරණි නගර සැලසුම් ද ක්‍රමවත්ව සිදු කළ බව ජලය සැපයීමට, අපද්‍රව්‍ය බැහැර කිරිමට, ඊසාන දිග මෝසම් සුළංවලින් ඇදවැටෙන මහා ජලස්කන්ධය කළමනාකරණය කර ගැනීමට සූක්ෂ්ම ක්‍රමවේද භාවිත කළ බව පැරණි නටඹුන් අධ්‍යයනයෙන් පැහැදිළි වේ. ඒ අනුව පැරණි ලංකාවේ ග්‍රාමීය  සෞඛ්‍යය සංරක්ෂණ විධි නූතනයට යොදා ගත හැකි ද? යන්න මෙම පර්යේෂණයේ ගැටලුව විය. මෙම පර්යේෂණයේ මූලික අරමුණ වන්නේ පැරණි ලංකාවේ ග්‍රාමීය සෞඛ්‍යය සංරක්ෂණ විධි නූතනයට යොදා ගැනීම පිළිබඳව පෙන්වා දීමයි. මෙහි පර්යේෂණ ක්‍රමවේදය ලෙස ක්ෂේත්‍ර අධ්‍යයනය හා සාහිත්‍යය මූලාශ්‍රය භාවිත කරන ලදි. අතීත ජනයා සෞඛ්‍යය සංරක්ෂණය උදෙසා ශාන්තිකර්ම, නොයෙක් කෙම්ක්‍රම, බෝධි පූජා, පිරිත් දේශනා ආදිය සිදුකොට ඇත. ලෙඩ රෝග සඳහා ආයුර්වේද ප්‍රතිකාර මෙන්ම රෝගවලින් වැලකීම සඳහා පරිසරය ක්‍රමවත්ව තබා ගැනීමට විවිධ ක්‍රමවේද භාවිත කොට ඇත. අපද්‍රව්‍ය බැහැර කිරීමේ ක්‍රමවේද පැවති බව අභයගිරිය, බද්ධ සීමා ප්‍රාසාදය අවටින් හමුවන වැසිකිළි කැසිකිළි ඉදිකිරීමේ තාක්‍ෂණයෙන් මනාව පැහැදිලි වේ. සිදුරු සහිත මුට්ටි පද්ධතියක් ඔස්සේ අවසානයේ ජලය පමණක් පොළවට උරාගන්නා ආකාරයෙන් එම වැසිකිළි කැසිකිළි පද්ධති සකස් කර ඇත. මිහින්තලය, මැදිරිගිරිය, දීඝවාපිය, මාලගාවිල ආදී බොහෝ ස්ථානවල පැවති ආරෝග්‍යශාලාවලින් හමුවන බෙහෙත් ඔරු, ජන්තාගාර, මැටි බරණි, බෙහෙත් ද්‍රව්‍ය ගබඩා කළ බඳුන් ආදිය තුළින් ඉපැරණි ලංකාවේ පුද්ගල සෞඛ්‍යය ආරක්‍ෂා වන ආයුර්වේද ක්‍රමයක් පැවති බව තහවුරු වේ. ජනතාවගේ කායික සුවය මෙන්ම මානසික සුවය ද ආරක්‍ෂා වන ආකාරයට අතීතයේ සෞඛ්‍යය සංරක්‍ෂණය සිදු වී ඇති අතර ඒවා නූතනයට ද උපයෝගී කර ගැනීමෙන් තවදුරටත් එම ක්‍රම ආරක්‍ෂා කරගනිමින් සෞඛ්‍යය සංරක්‍ෂය කළ හැක. ආයුර්වේද වෛද්‍ය ක්ෂේත්‍රයේ දියුණුවක් ලංකාව තුළ සනිටුවන් වුව ද කාර්මීකරණයත් සමඟ බටහිර වෛද්‍ය ක්‍රමය ලක්දිවට පැමිණෙන අතර පැරණි ලංකාවේ ග්‍රාමීය සෞඛ්‍යය සංරක්ෂණ විධීන්හි ගිලිහීයාමක් දැකගත හැකිවිය. පැරණි ලංකාවේ කායික, මානසික, සෞඛ්‍යය සංරක්ෂයෙහිලා සිංහල රජදරුවන් ගන්නා ලද සෞඛ්‍යය සංරක්ෂණ විධි නූතන වෛද්‍යක්ෂේත්‍රයට යොදා ගත හැකි බව මෙම පර්යේෂණය තුළින් නිගමනය විය.

**ප්‍රමුඛ පදඃ** *ග්‍රාමීය සෞඛ්‍යය, සංරක්ෂණය, රෝග*

# කුඩැල්ලන් ඇඟ කැවීමේ සාම්ප්‍රදායික ක්‍රමවේදය තුළින් රෝග නිවාරණය කිරීම

උල්පතගම අමිතරතන හිමි, කේ. එම්. ඩිලන්ත රසන්ජන්

වෛද්‍ය පීඨය, රජරට විශ්වවිද්‍යාලය

*uamitha@gmail.com*

ලෝකයේ ජීවත්වන සියලු දෙනාගේ අපේක්ෂාව වන්නේ නිරෝගිමත් කයක් පවත්වාගෙන යෑමය. ශ්‍රී ලංකාවේ වෙදකම හා සම්බන්ධ තොරතුරු අධ්‍යයනය කිරීමේ දී එය අනුරාධපුර යුගය දක්වාම දිවයන බව ඓතිහාසික තොරතුරු මඟින් අනාවරණය වේ. එම තොරතුරු පදනම් කොට ගෙන මිනිසාගේ කයෙහි පවත්නා රෝග නිවාරණය සඳහා කුඩැල්ලන් උපයෝගි කොට ගෙන සිදු කරනු ලබන ප්‍රතිකර්මයන් පිළිබඳ මෙහි දී අධ්‍යයනයට බඳුන් කෙරේ. කුඩැල්ලන් ඇඟ කැවීමේ ප්‍රතිකාර ක්‍රමවේදය ඉතා සාර්ථක ක්‍රමවේදයක් බව මෙම තොරතුරු මඟින් අනාවරණය කරගත හැකි විය. අනුරාධපුර ආරාම ආශ්‍රිත නිර්මාණය වූ රෝහල් තුළ අනෙකුත් ශල්‍ය වෛද්‍ය ක්‍රමවේදයන්ට අමතරව කුඩැල්ල මඟින් ද මිනිස් සිරුරේ හටගත් රෝගාබාධ සඳහා පිළියම් යොදා තිබේ. මිහින්තලේ හමුවන ශිලා ලේඛනයෙහි ''පුහුඬා වෙදුන්'' යනුවෙන් හඳුන්වා තිබෙන්නේ මෙම ක්‍රමවේදය අනුගමනය කළ වෛද්‍යවරුන්ය. මෙම ක්‍රමවේදය සුවිශේෂී වෛද්‍ය ක්‍රමවේදයක් ලෙස හඳුනාගත හැකිය. සුශ්‍රැත සංහිතාව, අෂ්ටාංගහෘදය සංහිතාව, යෝගාර්ණවය යන ග්‍රන්ථවල කුඩලු වෙදකම ශල්‍ය වෛද්‍ය ක්‍රමවේදයක් ලෙස දක්වා තිබේ. කුඩැල්ලා නූතනයේ ජීව විද්‍යාත්මක නාමය අනුව අනෙලිඩා වංශයේ හිරුඩිනියා වර්ගයට අයත් ලේ උරන්නා යන පොදු නාමයෙන් හඳුන්වනු ලබයි. යෝගාර්ණවයේ කුඩැල්ලන් වර්ග 12 ක් පමණ දක්වා තිබේ. ඔවුන්ගෙන් හය දෙනෙකු පමණ විෂ රහිත වේ. විෂ සහිත කුඩැල්ලන් වෛද්‍ය ක්‍රමවේදය සඳහා යොදා ගනු නොලැබේ. ඔවුන්ගේ විෂ නිසා රෝගියාට වෙනත් රෝගාබාධ වැළඳිය හැකි බැවිනි. ඒ අනුව වෛද්‍යවරයාට කුඩැල්ලන් උපයෝගි කොට ගෙන සිදු කරනු ලබන ශල්‍යකර්මවල දී මනා ප්‍රවීනත්වයක් තිබිය යුතුය. මෙම ක්‍රමවේදය සත්ත්වයන් සඳහා ද යොදා ගෙන තිබේ. ප්‍රතිකාර කිරීම සඳහා අල්ලා ගනු ලබන කුඩැල්ලන් දින හතක් ගිය පසු කහ වතුරෙන් නහවා පිරිසිදු කොට රෝගය ඇති තැන තැබිය යුතුය. කුඩැල්ලා රෝගය ඇති තැන සපා නොකයි නම් තනකිරි හෝ ලේ බිංදුවක් එම ස්ථානයෙන් තැබිය යුතුය. නැතහොත් එම ස්ථානය තුවාල කොට දිය යුතුය. ලේ උරා බීමේ දී රෝගියාට කිසිදු වේදනාවක් නොදෙනේ. කුඩැල්ලන් කැවීමේ ක්‍රමවේදය රෝග කිහිපයක්ම සඳහා භාවිත කරනු ලබයි. සමේ රෝග, හිසරදය, උපදංශ රෝග, පාද ශෝථය, අක්ෂි රෝග ශරීරයේ අපවිත්‍ර වූ ලේ කැටිති නිසා හටගනු ලබන බොහෝ රෝග කාරක සඳහා මෙම ක්‍රමවේදය යොදාගෙන තිබේ. කුඩැල්ලන් ඇඟ කැවීමේ සාම්ප්‍රදායික වෛද්‍ය ක්‍රමය තුළ රෝග කාරක බොහෝ ප්‍රමාණයක් නිවාරණය කර ගත හැකි බව දක්නට ලැබේ. ඒ අනුව මෙම ක්‍රමවේදය ඉතා සාර්ථක වෛද්‍ය ක්‍රමවේදයක් ලෙස හඳුනාගත හැකිය.

***ප්‍රමුඛ පදඃ*** *පුහුඬා, කුඩැල්ලා, සාම්ප්‍රදායික ක්‍රමවේද*

# පාරම්පරික ඇදහිල්ලක් වන වෙහෙරගල ''කෝවිල් දානය'' පිළිබඳ අධ්‍යනයක්

කේ. ඩී. එම්. එස්. එම්. දිසානායක, එස්. ආර්. ටී. සඳමාලී

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය

*shyalika1995@gmail.com*

අභිචාර විධි යනු කිසියම් සමාජයක සම්ප්‍රදායෙන් පැවතගෙන එන සිරිත් විරිත් ඇදහිලි ක්‍රම සම්ප්‍රදායකි. එහි කාල නිර්ණයක් කිරීම අපහසුය. මන්ද, මිනිසාගේ ආරම්භයත් සමගම අභිචාර ක්‍රම පැන නැගී ඇති නිසාවෙනි. ජන සංස්කෘතිය තුලදී විවධ අභිචාර ක්‍රම හඳුනාගෙන ඇති අතර ඇතැම් ගම්වලට පමණක්ම ආවේණික වු  අභිචාර විධි පවති. ඒ අනුව කෝවිල් දානය යනු විෂඝෝර සර්පයින්ගෙන් ආරක්ෂාවීම සඳහා සිදු කරනු ලබන අභිචාර ක්‍රමයකි. මෙහිදී ක්‍ෂේත්‍ර අධ්‍යයනය යටතේ පුද්ගලයින් පස්දෙනෙකු සමග සිදු කරනලද සම්මුඛ සාකච්ඡා, ක්ෂේත්‍ර අධ්‍යයන, පුස්තකාල ගවේෂණය හරහා දත්ත රැස් කිරීම සිදුකරන ලදී. අනුරධපුර දිස්ත්‍රික්කයේ රඹෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වෙහෙරගල ග්‍රාමයේ දැකිය හැකි අභිචාර ක්‍රමයක් ලෙස මෙම කෝවිල් දානය පෙන්වා දිය හැකිය. මෙය පරම්පරාවෙන් පැවතගෙන එන අභිචාර ක්‍රමයක් වන අතර අදටත් පවත්වාගෙන යනු ලැබේ. මෙහිදි  තමන් ඇතුලු පවුලේ සියළු දෙනාම සර්පයින්ගෙන් ආරක්ෂා කරදෙන ලෙස ඉල්ලා කෝවිල් අම්මා නැමති දේවතාවියට තම නිවස තුලදීම බාර වෙයි. මෙහිදී  පිරිසිඳු රෙදි කඩකට හාල් ස්වල්පයක් ගැට ගසා එය කොහොඹ කෝටුවක එල්ලා සර්පයින්ගෙන් ආරක්ෂා කර දෙන ලෙස සිතින් යාතිකා කොට නිවසේ  උස තැනක එල්ලයි. එම හාල් ගැටය යම් හෙයකින් කිසියම් සතෙකු විසින් හානි සිදු කරන ලද්දේ නම් ගැමියන් විශ්වාස කරනුයේ එය සර්පයින් ගෙවත්තට ඇතුලු වන නිමිත්තක් ලෙසය. එබැවින් නැවත මෙම හාල් ගැටය ඔවුන් විසින් අලුත් කරනු ලැබේ. ඔවුන් කෝවිල් අම්මා වෙනුවෙන් මෙම බාරහාර ඔප්පු කරනු ලබන්නේ අළුත් අවුරුදු මාසයේ පරණ අවුරුද්ද දවසේ උදෑසනදී ය. එදින නිවසෙහි මස්මාංශ පිසීමෙන් වළකින අතර සෑම නිවසකම කෝවිල් අම්මා වෙනුවෙන්  බතක් සහ පරිප්පු ව්‍යංජනයක් සකසා එම ව්‍යංජනයට මුරුංගා කොළ එකතු කරයි. මෙසේ පිසගත් දානය පිඟන්වලට බෙදා මේසයට අරින අතර, මේසය මත පොල්තෙල් පහනක් දල්වයි. ඉන්පසු කෝවිල් අම්මාට දානය පිළිගැන්වීම සිදු කරයි. එහිදී පිරිසිදු වතුර වීදුරුවක් ගෙන පිඟන් වලට බෙදු දානෙන් කුඩා කොටසක් එම වතුර වීදුරුවට දමා එය කොහොඹ කිනිත්තක් එයට දමයි. ඉන්පසු සර්පයින් තම ගෙවත්තට ඇතුලු නොවෙන ලෙස ඉල්ලා කෝවිල් අම්මාට යාතිකා කොට වීදුරුවහි ඇති දානය වත්ත පුරාවටම ඉසිනු ලබයි. ඉන් අනතුරුව පිඟන්වලට  බෙදු දානය අසල් වැසියන්ට බෙදා දෙන අතර ඔවුන් එම දානයට වැඳ නමස්කාර කොට ආහාරයට ගනියි. ඉන්පසුව නිවසේ පිරිස් දානය අනුභව කිරීමෙන් පසු බාර ඔප්පු කිරීම අවසන් වේ.

***ප්‍රමුඛ පදඃ*** *අභිචාර, සර්පයින්, කෝවිල් අම්මා*

# නිදන්ගත වකුගඩු රෝගය හා බැඳි ජන වෙදකම පිළිබඳ සමාජවිද්‍යාත්මක අධ්‍යයනයක්

කේ. පී. ආර්. සුජානි අසංගිකා

සමාජවිද්‍යා අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය

*kprsujani@gmail.com*

වකුගඩු යුග්මය අපගේ පැවැත්මට අත්‍යවශ්‍ය ඉන්ද්‍රිය දෙකක්වන අතර එකී වකුගඩු රෝගීවීම ප්‍රධාන ආකාර 2 ක් යටතේ හඳුනාගත හැකි ය. එනම්, තීව්‍ර වකුගඩු අකර්මණ්‍යතාව (Acute renal Failure) හා නිදන්ගත වකුගඩු අකර්මණ්‍යතාවය (Chronic Kidney disease) යනුවෙනි. ලෝකය පුරා පැන නැගෙන සෞඛ්‍ය ගැටලු අතර වර්තමානයේ කතිකාවට ලක්වන්නා වූ සුවිශේෂි රෝගී තත්ත්වයක් වශයෙන් වකුගඩු රෝගය හඳුනාගත හැකි ය. මෙකී වකුගඩු රෝගය ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික කලාපවල නැතහොත් වියළි කලාපයේ ජනතාවට වැළඳෙන දිගුකාලින වකුගඩු රෝගය ''හඳුනානොගත් හේතු නිසා හටගත්'' රෝගයකි. Chronic Kidney Disease of Unknown Etiology (CKDU) යනුවෙන් ඉංග්‍රිසි භාෂාවෙන් දක්වයි. ගැමි සමාජ ක්‍රමයන් හි අතීතයේ පටන් ජනතාව රෝග පීඩා වැළඳුණ විට දේශිය ඖෂධ භාවිත කරමින්, යන්ත්‍ර මන්ත්‍ර, ශාන්ති කර්ම හා විවිධ අභිචාර ක්‍රම අනුගමනය කරමින් රෝග පීඩාවන්ගෙන් සහනයක් පැතුහ. ජන වෙදකමේ දී රෝග සුව කිරීම සඳහා ප්‍රධාන විධික්‍රම දෙකක් භාවිත විය. පළමු වැන්න අභිචාරාත්මක ගීත ගායන යයි. දෙවැන්න බලි, බිලි පූජා කිරිමයි. අථර්ව වේදයෙහි එක් තැනක මෙවැනි කියමනක් තිබේ, "වෛද්‍යවරුන් සිය ගණනින් හා බෙහෙත් පැළෑටි දහස් ගණනින් කළ හැකි කටයුත්ත මතුරන ලද එක් යන්ත්‍රයකට (Amulet) කළ හැකි ය. මෙම පර්යේෂණයේ ගැටලුව වන්නේ, නිදන්ගත වකුගඩු රෝගයට ප්‍රතිකාර වශයෙන් ජන වෙදකම කෙතෙක්දුරට උපයුක්ත වන්නේ ද? යන්නයි. මෙම පර්යේෂණයේ පර්මාර්ථය වන්නේ ජන වෙදකම වකුගඩු රෝගය නිවාරණයෙහි ලා කෙසේ යොදාගත හැක ද? හා අරමුණ වශයෙන් පාරම්පරික ඥානය මිනිසුන් කෙතෙක්දුරට භාවිතයට ගන්නේ ද යන්න හඳුනාගැනීමයි. ඒ අනුව සසම්භාවි නියැඳුම් ක්‍රමය යටතේ අරමුණුගත නියැදියක් වශයෙන් වකුගඩු රෝගය සදහා දේශිය හා බටහිර වෛද්‍ය ප්‍රතිකාර සඳහා යොමුවන රෝගීන් යොදා ගන්නා ලදි. දත්ත රැස්කිරිමේ ශිල්පක්‍රම වශයෙන් ප්‍රශ්නාවලි, සම්මුඛ සාකච්ඡා භාවිත කරන ලදි. නියැඳිය වශයෙන් අනුරාධපුර දිස්ත්‍රික්කයේ පදවිය ප්‍රදේශයෙන් වකුගඩු රෝගීන් 50 දෙනෙක් යොදා ගනිමින් දත්ත දායකයින්ගෙන් සපයාගත් දත්ත SPSS මෘදුකාංගය මගින් විශ්ලේෂණය කරන ලදි. මෙම පර්යේෂණයේ ප්‍රතිඵල වශයෙන් හඳුනාගත හැකි වුයේ වකුගඩු රෝගීන් බහුතරයක් බටහිර වෛද්‍ය ප්‍රතිකාර වෙත යොමු වුව ද ඔවුන්ගේ දැඩි විශ්වාසයක් ජන වෙදකම කෙරෙහි පවතින බවයි. එසේ ම බටහිර වෙදකම සඳහා යොමු නොවන සුළුතරයක් දේශිය ප්‍රතිකාර ලබා ගන්නා බවත්, බහුතරයක් බටහිර වෛද්‍ය ප්‍රතිකාර සිදුකරන අතර ජන වෙදකමේ යම් යම් අංග තවදුරටත් අනුගමනය කරන බවක් හඳුනාගත හැකි ය. එසේ ම දේශිය ජන වෙදකම කෙරෙහි යොමු වූ බහුතරයක් රෝගීන්ට මේවන විට රෝගය යම් ආකාරයකින් පාලනය කරගත හැකිවාක් මෙන් ම විවිධාකාරයේ අතුරු ආබාධ වශයෙන් දියවැඩියාව, අධිරුධිර පීඩනය වැනි නිදන්ගත රෝගයන්ට ගොදුරුවීමේ අවධානමක් නොමැති බව අනාවරණය විය. මේ අනුව නිගමනය කළ හැක්කේ නිදන්ගත රෝග සඳහා ද පාරම්පරික සිංහල ජන වෙදකම තවදුරටත් භාවිත වන බවත්, එය බටහිර වෛද්‍ය ක්‍රමයට වඩා ජනතාවගේ ශරීරයට හිතකර බවත් ය. නමුත් රෝගීන් ජන වෙදකම කෙරෙහි යොමුවීම් අඩු වීම කෙරෙහි බලපාන හේතු වනුයේ ඒ සඳහා දැනුවත්භාවය අඩුවීම, අමුද්‍රව්‍ය සපයා ගැනීම, සකස් කර ගැනීම ආදි දුෂ්කරතා හේතුවෙනි.

***ප්‍රමුඛ පද:*** *නිදන්ගත වකුගඩු රෝගීන්, ජන වෙදකම, දේශිය වෙදකම, අභිචාර, බෙහෙත්*

# FOLK MUSIC, POEM, & TALES

# "පන්නම් කතුර" පැදි පෙළින් හෙළිවන පන් කර්මාන්තය හා ඒ ආශ්‍රිත තාක්ෂණය පිළිබඳ අධ්‍යයනයක්

යූ. ඩී. ආර්. ෂෙහාන් තිලකරත්න

පුරාවිද්‍යා අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය

*shehanthilakarathna1205@gmail.com*

සාම්ප්‍රදායික මානව ඥානය සංචිතව පවත්නා සුවිශේෂී ඥාන සංචිතයක් ලෙසින් 'ජනකවිය' හැඳින්විය හැකිය. අතීතයේ සිට ම පරම්පරාගතව පැවත ගෙන ආ ජනකවි සම්ප්‍රදාය, ශ්‍රී ලාංකේය සංස්කෘතියට අනන්‍ය වූ අභිචාර, ශිල්ප කර්මාන්ත ආදී ඉතා වැදගත් තොරතුරු රැසක් හෙළි කරයි. එවැනි වැදගත් මූලාශ්‍රයක් වන "පන්නම් කතුර" පැදි පෙළ ඇසුරින් වර්තමාන සමාජයෙහි වියැකෙමින් යන සාම්ප්‍රදායික ශිල්ප කර්මාන්තයක් වූ පන් කර්මාන්තය පිළිබඳව වැදගත් වූ තොරතුරු රාශියක් හඳුනාගත හැකිය. ද්විතීක මූලාශ්‍ර පරිශීලනය හරහා සිදුකළ අධ්‍යයනයේ අරමුණ වූයේ " පන්නම් කතුර" පැදි පෙළ තුළ අන්තර්ගත වන සාම්ප්‍රදායික පන් කර්මාන්තයේ ස්වරූපය කෙබඳුදැයි යන්න හඳුනා ගැනීමයි. මෙම කවි පළ වී ඇත්තේ ආනන්ද කේ. කුමාරස්වාමි මහතාගේ 'මධ්‍යකාලීන සිංහල කලා කෘතියෙහි' ය. එහි පද්‍ය 55 කි. පන් නෙළීමේ සිට පැදුරු වියා අවසන් වන තෙක් සිදුවන ක්‍රියාකාරකම් සියල්ල ම නිර්මාණාත්මකව ඉදිරිපත් පත් කරන මෙය කියවීමේ දී පන් කර්මාන්තයේ ඒ ඒ අවස්ථාවන් පිළිබඳව ප්‍රබල චිත්තරූප මැවීමට සමත් වන අතර ම අතීතයේ දී මෙම කර්මාන්තය කොතෙක් දුරට සමාජගතව තිබුණේ ද යන්න පිළිබඳව පැහැදිලි අවබෝධයක් ලබාදෙයි. පන්නම් කවිවලින් පැවසෙන පරිදි පන් කර්මාන්තය හුදෙකලා එකක් නොව කාන්තාවන් සාමූහික වශයෙන් සහභාගී වූ කර්මාන්තයකි. එහි දී ඔවුන් සූදානම් වී ඇත්තේ චමත්කාර ජනක අන්දමට බව 8, 13, 14, 15 වන කවිවලින් පැහැදිලි වේ. 12, 13, 17 කවිවලින් බිළිඳුන් සිටින මව්වරුන්ට එම කර්මාන්තය සඳහා සහභාගී වීමට ඇති දුෂ්කරතාව පිළිබිඹු වෙයි. 8, 16 කවිවලින් පන් කැත්ත පන් කර්මාන්තයේ දී භාවිතයට ගත් ආකාරය හඳුනාගත හැකිය. පන් කර්මාන්තය අභාවයට යැමත් සමඟ පන් කැත්ත ද සමාජයෙන් තුරන් ව ගොස් ඇත. බොහෝ විට මේ ආකාරයේ ජනකවිවල පමණක් එම ආයුධය පිළිබඳ මතය ශේෂ වී පවතිනවා වන්නට පුළුවන. ගැමි කාන්තාවන් විසින් පන් නෙළා ගත් පසු සිදු කරන සෙසු ක්‍රියාකාරකම් ද 18, 19, 21 පන්නම් කවිවල විස්තර කර ඇත. 19, 40, 41, 42, 43 ආදී පන්නම් කවිවලින් පුරාණ පැදුරු රටාවන් පිළිබඳවත් 19, 43, 52 යන පන්නම් කවිවලින් සුවිශේෂී පැදුරු වර්ග කිහිපයක් පිළිබඳවත් හඳුනාගත හැකිය. විද්‍යාත්මකව තහවුරු කිරීමට අපොහොසත් වූ පමණින් ම සාම්ප්‍රදායික ඥානය බැහැර කිරීම සුදුසු නොවන්නේය. මන්ද ඒවායෙහි පුරාණ තාක්ෂණයක් ගැබ් වී ඇති බැවිනි. ඒ සඳහා හොඳ ම නිදසුන නම් මෙම 'පන්නම් කවි' සමූහය යි.

***ප්‍රමුඛ පද:*** *කාන්තාවන්, ජනකවිය, පන් කර්මාන්තය, පන්නම් කතුර, පන් කැත්ත*

# ජනකවියෙන් නිරූපිත ග්‍රහචාරය පිළිබඳ විමසුමක්

එල්. ටී. ටී. ද. සිල්වා[1], එල්. ඩී. අයි ද සිල්වා[2]

[1]ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, [2]රජරට විශ්වවිද්‍යාලය

*lttharushi92@gmail.com*

ජනසාහිත්‍යයේ එක් ප්‍රධාන අංගයක් ලෙස ජනකවිය හැඳින්විය හැකිය. ගැමි ජනයා තම සිතෙහි නිරායාසයෙන් ඇති වන්නා වූ අව්‍යාජ හැඟීම් ප්‍රකාශ කිරීමෙහි ලා එක් මාධ්‍යයක් ලෙස ජනකවිය යොදා ගත්හ. සරල දිවි පෙවෙතක් ගත කළ ගැමියන් තම ඇදහිලි හා විශ්වාස මුල් කර ගත් පාරභෞතික වස්තූන් ද ජනකවිය සඳහා වස්තු විෂය කර ගත් බැව් පෙනේ. පාරභෞතික වස්තු අතුරින් ග්‍රහචාරයට හිමිවනුයේ ප්‍රමුඛස්ථානයකි. ජනසම්මතයට අනුව ග්‍රහයන් නව දෙනෙකු සිටින අතර එම ග්‍රහයන් 'නවග්‍රහයන්' ලෙසින් හඳුන්වනු ලබයි. නවග්‍රහයන් අතුරින් සෙනසුරු (ශනි) - රාහු - කේතු - කුජ - රිවි ආදි ග්‍රහයන් අයහපත් ප්‍රතිඵල ඇති කරන අතර සිකුරු - බ්‍රහස්පති - බුධ - චන්ද්‍ර වැනි ග්‍රහයන් යහපත් ප්‍රතිඵල ඇති කරන බව පොදු පිළිගැනීමයි. යමෙකුට වාසනාව හෝ අවාසනාව ගෙන එන්නේ ද, මිත්‍ර සබඳතා, විරෝධතා, කරදර, රෝග පීඩා, ධන හානි හා පිරිහීම් වැනි ශුභාශුභ ප්‍රතිඵල හිමිවනුයේ ද තම ජන්මපත්‍රයේ මේ නව ග්‍රහයන්ගේ පිහිටීමෙන් ඇතිවන බලපෑම් නිසා බැව් පොදු ජන විශ්වාසයයි. එබැවින් ග්‍රහයන්ට අධිමානුෂීයත්වයක් හෝ දේවත්වයක් ආරෝපණය කරමින්, 'ග්‍රහ දෙවියෝ' හෙවත් 'ගිරහ දෙවියෝ' ලෙස හඳුන්වමින් ග්‍රහයන් හා බැඳුණු විවිධ මත, විශ්වාස හා ඇදහිලි පවත්වා ගෙන යෑමට ජනතාව කටයුතු කළහ. මෙවැනි සන්දර්භයක ලා නක්ෂත්‍රානුකූල හේතු, භූත විද්‍යානුකූල හේතු හා දේව විශ්වාස හේතු යනාදිය මුල් කර ගනිමින් ග්‍රහයන්ගෙන් පීඩාවට පත්වන ගැමියා ඒවායින් මිදීම සඳහා ද නොයෙක් වත් පිළිවෙත් හා සෙත් ශාන්තිකිරීම් සිදු කරන බව පෙනේ. නවග්‍රහයන් පිළිබඳවත්, එක් එක් ග්‍රහයන්ට හිමි වර්ණ, ආයුධ, වාසස්ථාන, සංකේත, දිශා, මැණික්, වෘක්ෂ ආදිය සඳහන්ව ඇති ජනකවි හඳුනා ගනිමින් ග්‍රහචාරයෙන් ඇතිවන යහපත් - අයහපත් බලපෑම් පිළිබඳවත්, ඒවායින් අත්මිදීමට යොදා ගත් ප්‍රතිකර්ම පිළිබඳව පැවති පොදු ජන විශ්වාසය ජනකවියෙන් කෙසේ නිරූපණය වී තිබේ දැයි විමර්ශනය මෙම අධ්‍යයනයෙහි අරමුණ විය. සාහිත්‍ය මූලාශ්‍ර හා සම්මුඛ සාකච්ඡා මත පදනම්ව දත්ත රැස් කිරීම සිදු කරනා ලදී. නිර්මාපකයා අඥාත වූ චූල සම්ප්‍රදායට අයත් සාහිත්‍යාංගයක් වන ජනකවිය ලාංකේය ජනසමාජයේ විවිධ පැතිකඩ ප්‍රතීයමාන කෙරෙන ජනශ්‍රැති මූලාශ්‍රයක් වශයෙන් වැදගත් වේ. ග්‍රහචාරයට අදාළව නිර්මාණය වී ඇති ජනකවි අද වන විට ජනසමාජයේ භාවිතයෙන් වියැකී යමින් පවතින බව ද, විද්‍යාව හා තාක්‍ෂණය මෙතරම් දියුණුව පවතින යුගයක දී පවා සමාජයේ විවිධ තල නියෝජනය කරන ඇතැම් පිරිස් එදිනෙදා ජීවිතයේ වැදගත් සිදුවීම්වල දී නව ග්‍රහයන් කෙරෙහි විශ්වාසය තබා කටයුතු කරන බව නොරහසකි.

***ප්‍රමුඛ පද:*** *ජනකවිය, නවග්‍රහයන්, ශුභාශුභ ඵල, ග්‍රහ අපල, ජන්මපත්‍රය*

# පානම අම්පිටිය දේවාලය පිළිබඳ පුරාවෘත්ත මගින් ජන ජීවිතයට එල්ල කරන බලපෑම් පිළිබඳ මානව විද්‍යාත්මක අධ්‍යයනයක්

එන්. එම්. කේ. තක්ෂිලා නදීශානි

රුහුණ විශ්වවිද්‍යාලය

*thakshilanadeeshani0811@.gmail.com*

ආගමික විශ්වාස සහ ඇදහිලි සමාජයේ මූලික පැතිකඩක් ලෙස සමාජ විද්‍යාව හා මානව විද්‍යාව ආරම්භයේ සිටම හඳුනා ගන්නා ලදි. සමාජ ඒකාබද්ධතාව, සුජාතභාවය සහ සමාජ ධූරාවලිය වැනි කරුණු අතින් සමාජයේ විවිධ පාර්ශව කරුවන් අතර එකඟතාවක් හෝ සම්මුතියක් බොහෝ විට ගොඩ නැගී ඇත්තේ ආගමික විශ්වාස පද්ධතියක් ඇසුරිනි. පානම ගැමියෝ විශ්වාස කරන දෙවිවරු කිහිප දෙනෙක්ම සිටිති. කැබිලිත්ත, ඔකද, කතරගම, අම්පිටිය ආදී ස්ථාන තුලින් ආගමික විශ්වාස ගොඩ නැගී ඇති අතර ගණ දෙවියන් ද අදහනු ලබයි. මෙම අධ්‍යයනයේ පරමාර්ථය වන්නේ අම්පාර දිස්ත්‍රික්කයේ පානම අම්පිටිය දේවාලය ආශ්‍රිත විශ්වාසය පද්ධතිය ජන ජීවිතයට බලපෑම් කරන්නේ කෙසේද යන්න හඳුනා ගැනීමයි. අධ්‍යයන ප්‍රදේශය ලෙස අම්පාර දිස්ත්‍රික්කයේ අම්පිටිය දේවාලය ආශ්‍රිත ප්‍රදේශය තෝරා ගන්නා ලදි. මෙහි දී, ක්ෂේත්‍ර අධ්‍යයන ක්‍රමවේදය භාවිතා කරනු ලැබූ අතර ප්‍රාථමික දත්ත රැස් කිරීමේදී සම්මුඛ සාකච්ජා, ප්‍රත්‍යක්ෂ අධ්‍යයන ක්‍රමය සහ නිරීක්ෂණ ක්‍රමවේදය භාවිතා කරන ලදී. මෙහිදී පානම ජනශ්‍රැතිය ආශ්‍රිතව ලියවූ ඇතැම් ප්‍රදේශීය මූලාශ්‍ර භාවිත කරනු ලැබිණි. එහිදී සොයා ගත් දත්තවලට අනුව පානම් පත්තුවේ ගැමියන්ගේ අධිපති දෙවිවරුන් ලෙස අම්පිටිය දේවාලයේ උඩුපිල දේවාලය හා යටිපිල දේවාලය යනුවෙන් දේවාල දෙකකි. උඩුපිල දේවාලයේ වැඩ වසන්නේ අලුත් දෙවියන් වන අතර යටිපිල දේවාලයේ පත්තිනි දෙවියන් ද වැඩ වාසය කරයි. අම්පිටිය දේවලයේ උඩුපිල හා යටිපිල වශයෙන් දෙකට බෙදී අං කෙළිය ශාන්ති කර්මය පවත්වන්නේ ගැමියන් තුළින් සිංහල ගැමියන් උඩුපිල ද දෙමළ ගැමියන් යටිපිල ද නියෝජනය තුළින් ජනවාර්ගික ඒකාබද්ධතාවය නිරූපණය වෙයි. උඩුපිල ජයග්‍රහණය ලෙඩ රෝග වලින් තොර වීම ද යටිපිල ජයග්‍රහණයෙන් සශ්‍රීකත්වය සහ ස්වභාවික විපත් වලින් තොර වීම බලාපොරොත්තු වෙයි. එහිදී කිලි වලට හසු නොවීම හා උත්සවයට පෙර සිටම පේවී සිටීම සිදු වේ. එහිදී දේවාල භූමියට උත්සවය පවත්වන කාලයේ දී ගැහැණු උදවියට ඇතුළුවිය නොහැකි අතර ඔවුනට දේවාලයට යාමට දිනයක් පවතී. ඔවුන්ගේ ආර්ථික කටයුතු වල ආරම්භයේදී භාරහාර වීම අනිවාර්ය වන අතර පානම ගැමියන්ගේ මානසික යහපැවැත්මට සෘජු සාධකයක් වී ඇත්තේ අම්පිටිය දේවාලයයි. බොහෝ දුරට දේව චාරිත්‍ර තුළින් කුලය, සමාජ පංතිය අනුව රාමුකරණය වී සිදු කරයි. මේ අනුව පැහැදිලි වන්නේ පානම ගැමියන්ගේ භෞතික, සමාජ හා මානසික ජීවිතය කෙරෙහි පත්තිනි දේවාලය හා සම්බන්ධ සුවිශේෂ විශ්වාසය පද්ධතිය සෘජු බලපෑමක් සිදු කර ඇති බව හඳුනා ගත හැකිය.

***ප්‍රමුඛ පදඃ*** *අන්තර් සම්බන්ධතා ,අම්පිටිය දේවාල, අං කෙළිය, පත්තිනි දේවතාවිය, සමාජ ස්ථරායනය*

# ජනකවියෙන් ගම්‍ය වන ලාංකේය ජන ජීවිතයේ තහනම් ලේ ඥාතීන් අතර වූ කාම විහරණය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

ආර්. එම්. ඒ. පී. රත්නායක, ආර්. එන්. එම්. රණවීර

මානවශාස්ත්‍ර අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය

*amilapriyantha18@gmail.com*

අතීතයේ පටන් සිංහල ජන සමාජය තුළ ලිංගික සබඳතා කෙරෙහි ආචාරධර්ම පද්ධතියක් ස්ථාපිත ව පැවතිණි. නෑවාසියට අනුව හෝ සමාන කුල ගෝත්‍ර අනුව විවාහයන් සිදුකර ඇත. තහනම් ලේ ඥාතීන් අතර වන කාම විහරණය හෙවත් ව්‍යභිචාරී සබඳතා අසම්මතයක් ලෙස සැලකුවත් එවැනි සබඳතා පැවති බව ජනකවියෙන් ගම්‍ය වේ. ව්‍යභිචාරී සබඳතා ජනකවියෙන් ගම්‍ය වන්නේ කෙසේද යන්න මෙහි පර්යේෂණ ගැටලුවයි. මානව සමාජයේ ශිෂ්ටත්වයට මෙවැනි සබඳතා බලපෑම් කළ ආකාරය ජනකවිය තුළින් හඳුනාගැනීම මෙහි අරමුණයි. චූල සම්ප්‍රදායට අයත් ජනකවි විමර්ශනයට ලක් කරමින් පුස්තකාල පර්යේෂණයක් වශයෙන් සිදු කෙරෙන මෙම පර්යේෂණය ප්‍රකාශයට පත් ජනකවි ප්‍රාථමික මූලාශ්‍රය කර ගනිමින් සිදු කරන ලදි. ව්‍යභිචාරී සම්බන්ධතා විෂය වූ සාහිත්‍ය කෘති පුරාණයේ පටන් සිංහල සමාජයේ පැවතුණි. පුරාකතා, නාට්‍ය, ජනකවි එහිදී කැපී පෙනේ. ඒ අතුරින් ලාංකේය ජන ජීවිතයේ සත්‍ය තොරතුරු තථ්‍ය ආකාරයෙන් ම ඉදිරිපත් කරන ජනකවි තුළින් තහනම් ලේ ඥාතීන් අතර පැවති අසම්මත ලිංගික සබඳතා පිළිබඳ තොරතුරු සපයයි. මවුපියන් හා දූ දරුවන්, සහෝදර සහෝදරියන්, නැන්දා මාමා හා දූ දරුවන් ලේ ඥාතීන් අතර වෙයි. මොවුන් අතර වන කාම විහරණය සමාජ අසම්මතයක් ලෙස සැලකුව ද එවැනි සබඳතා පැවතිණි. සංවාදරූපී වූ මෙම ජනකවි ද්විත්වයෙන් පියෙකු හා දියණියක අතර වූ ලිංගික සබඳතාවක් පිළිබඳ කරුණු කියවෙයි. පියා:"සුසිරි පොල් අත්ත වෙල බලව බලවා-සුසිරි තුනු ඉගේ රැලි බලව බලවා-පුංචි තන කරඬු බඳ සොලව සොලවා-එනිදළු ළමා රන්කඳ නලව නලවා", දියණිය:"සුසිරි පොල් අත්ත වෙල බලවන්ඩ නැතී-සුසිරි තුනු ඉගේ රැලි බලවන්ඩ නැතී-පුංචි තන කරඬු බඳ සොලවන්ඩ නැතී-අප්පච්චී රන්කඳ නලවන්ට නැතී" සහෝදර සහෝදරියන් අතර වූ මෙවුන්දම් සේවනය නිසා නැගණිය ගර්භණියක් වූ බවක් මෙම ජනකවියෙන් කියැවේ. අයියා:"නගේ මන්ද නුඹ එහෙම සිතුවේ-දගේ කියා නුඹ මට ගෙන්වූයේ-මගේ මදන වෙරි නුඹ පහ කෙරුවේ-මගේ රුවට රුව නුඹට ගෙනාවේ", නැගණිය:"නුඹට හිතට විලි ලැජ්ජා නැතුවාට-මෙමට බැරිය දැන් ඔහොම හිතන්නට-ලොවට දැනෙන විට කියති කටින් කට-එවිට සිනාසෙති ගෑණු ඉතින් මට" මෙවැනි අවස්ථා රැසක් ජනකවියෙන් ගම්‍ය වේ. ලාංකේය ජන ජීවිතය තුළ තහනම් ලේ ඥාතීන් අතර වන කාම විහරණය උපහාසයට ලක්කරන්නේ එය අසම්මතයක් ලෙස සැලකූ නිසාය. වර්තමානයේ පවා දැකගත හැකි එවැනි සබඳතා අනාදිමත් කාලයක පටන් පැවති බව මෙම ජනකවි අධ්‍යයනයෙන් පසක් වේ.

***ප්‍රමුඛ පද:*** *ජනකවි, සමාජය, ව්‍යභිචාරී සබඳතා, අසම්මතය, ලේ ඥාතීන්*

## ජන ගායනාවන් ආරක්ෂණය පිණිස ශ්‍රී ලංකාවේ බුද්ධිමය දේපළ නීතියේ දායකත්වය පිළිබඳ විශ්ලේෂණාත්මක විග්‍රහයක්

ආර්. පී. එස්. එස්. රාජපක්ෂ

නීති පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය

*shashirajapaksha2016@gmail.com*

බුද්ධිමය දේපළ නීතිය මඟින් මිනිසා විසින් සිදු කරන නිර්මාණයන්හි නිර්මාණාත්මක අනන්‍යතාව ආරක්ෂා කරනු ලබයි. පහසුවෙන් සොරකම් කර හැකි වීම, අයුතු ආර්ථික වාසි ලබා ගැනීම පිණිස විකෘති කිරීමේ හැකියාව බුද්ධිමය දේපළ වලට අනන්‍ය ලක්ෂණයන් ය. එනිසා ම අනෙකුත් දේපළවලට වඩා වැඩි ආරක්ෂාවක් බුද්ධිමය දේපළ වලට අවශ්‍ය වේ. 2003 අංක 36 දරණ බුද්ධිමය දේපළ පනතෙහි 24 වන වගන්තිය මඟින් ශ්‍රී ලංකාව තුළ ජනප්‍රවාද සඳහා ප්‍රකාශන හිමිකම් ආරක්ෂාව ලබා දී ඇත. කෙසේ වුව ද එම ආරක්ෂාව හිමි වනුයේ නිශ්චිත පුද්ගලයෙකු හෝ ජන කණ්ඩායමක් විසින් හිමිකම් කියා සිටින ජන ගායනාවන් සඳහා පමණි. මේ තත්ත්වය සමාජය තුළ පොදුවේ පැවත එන අනෙකුත් ජන ගායනාවන්හි මුල් ස්වරූපය ආරක්ෂා කරගැනීම පිණිස අහිතකර ලෙස බලපා තිබේ. ශ්‍රී ලාංකීය ජන ගායනා ආරක්ෂා කිරීම පිණිස වර්තමාන බුද්ධිමය දේපළ නීතිය තුළ නිශ්චිත ප්‍රතිපාදන පවතී ද? එසේ පවතී නම් ජන ගායනාවන්හි මුල් ස්වභාවය ආරක්ෂා කිරීමට එකී නීති ප්‍රතිපාදන ප්‍රමාණවත් වේ ද? යන්න මෙහි අධ්‍යයනය ගැටලුව විය. ලාංකීය ජන ගායනා ආරක්ෂා කිරීමට අදාළ වන නීතිය සියුම්ව අධ්‍යනය කිරීම, එහි පවතින දුර්වලතා හඳුනා ගැනීම සහ ඒ සඳහා අවශ්‍යය නිර්දේශයන් ඉදිරිපත් කිරීම අධ්‍යනයෙහි අරමුණ වේ. මෙම අධ්‍යයනය ගුණාත්මක අධ්‍යනය ක්‍රමය මත පදනම් විය. ඒ අනුව ප්‍රාථමික සහ ද්විතික මූලාශ්‍රයන් භාවිතා කරනු ලැබූ අතර ප්‍රාථමික මූලාශ්‍ර ලෙස අණ පනත් නීති රෙගුලාසි නඩු තීන්දු ද ද්විතික මූලාශ්‍ර ලෙස පර්යේෂණ ග්‍රන්ථ, ශාස්ත්‍රීය ලිපි, අන්තර්ජාල ලිපි භාවිතා කරනු ලැබීය. කරුණු වැඩිදුර තහවුරු කර ගැනීම පිණිස බුද්ධිමය දේපළ නිතීඥවරුන්, පාරම්පරික ජන ගායනා ශිල්පීන් සහ ඒ පිළිබඳ අධ්‍යනය කරන්නන් සමඟ සම්මුඛ සාකච්ඡා පැවැත්වීය. මෙහිදී ලාංකීය ජන සමාජය තුළ රන්වල පදනම වැනි පදනම් හරහා යම් ප්‍රමාණයක ජන ගායනාවන් ලේඛන ගත කොට ආරක්ෂා කිරීමට ලක් කළ ද එය මුලු මහත් ජන ගායනා කෙරෙහිම ව්‍යාප්ත වී නොමැති බවත් ජන ගායනාවන් සොයා ඒවා අධ්‍යයනය කිරීමට, දැනුවත් කර ලියාපදිංචි කිරීමට හෝ එහි බුද්ධිමය දේපළ අයිතිය ආරක්ෂා කර ගැනීමට අධිකාරියක් නොමැති බව අනාවරණය විය. එනිසාවෙන් විකෘති කිරීම් වලට ලක්ව ජන ගායනාවන්හි මුල් ස්වරූපය නැති වීම, අනාගත පරම්පරාවන්ට එහි සත්‍යයතාවය සොයා බැලීමට නොහැකි වීම සහ 24 වගන්තියෙහි හිමිකම් කියා නොපෑම මත එහි ආරක්ෂාව ගැනීමට ද නොහැකි වනු ඇත. ඒ අනුව ජන ගායනාවන් ඒවායේ මුල් ස්වභාවයෙන් ම ආරක්ෂා කර ගැනීම සඳහා දැනට පවතින නෛතික ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන බවත් ඒ සඳහා නිසි බලය සහිත ආයතනයක් පිහිටුවීමට පියවර ගැනීම කාලීන අවශ්‍යතාවක් බවත් මෙම අධ්‍යයනයේ දී අනාවරණය විය.

***ප්‍රමුඛ පද:*** *ශ්‍රී ලංකාවේ බුද්ධිමය දේපළ නීතිය, ජන ගායනා, ජන ගායනාවන්හි මුල් ස්වභාවය ආරක්ෂා කිරීම*

# ජන කවියෙන් හෙළිවන කූරගල පුදබිමේ ඓතිහාසික බෞද්ධ උරුමය පිළිබඳ අධ්‍යයනයක්

පූජ්‍ය මොරවක දීපානන්ද හිමි

බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය

*deepmorawaka@gmail.com*

සබරගමු පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයට අයත් බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ තන්ජත්තැන්න ග්‍රාමසේවා වසමට අයත් කූරගල පුදබිම ප්‍රෞඪ බෞද්ධ සංස්කෘතික උරුමයේ ප්‍රධාන කේන්ද්‍රස්ථානයකි. මෙය රා. ව. පූ 6500-2800 අතරතුර ප්‍රාග් මානව යුගයේ බලන්ගොඩ මානවයාගේ නිජබිම වශයෙන් පැවති ගල්ලෙන් හා ගල් ගුහා ආශ්‍රිත වනගත ප්‍රදේශයකි. මෙම පුදබිම හා බැඳුණු ජන කවි සාම්ප්‍රදායක් එම ප්‍රදේශයේ ගැමි ජනතාව අතර ප්‍රචලිත ය. කූරගල බෞද්ධ පුදබිමේ ඓතිහාසිකත්වය අප්‍රකට වීම මත පුරාවිද්‍යාත්මක වස්තු විනාශ වීම හා ප්‍රතිසංස්කරණය නොවීම යන කරුණු සඳහා බලපෑ ප්‍රධාන සාධක අධ්‍යයනය කිරීම හා විසඳුම් සෙවීමට ජන කවිය උපයෝගී කරගැනීම මෙම පර්යේෂණයේ අරමුණ යි. ජන කවියෙන් හෙළිවන කූරගල පුදබිමේ ඓතිහාසිකත්වය පිළිබඳ ජන විඥාන ගත වී ජනාදරයට හා බහුමානයට පත් නොවූයේ ඇයි ද යන්න මෙහි පර්යේෂණ ගැටලුව යි. මෙම පර්යේෂණය සඳහා උපයුක්ත පර්යේෂණ ක්‍රමවේද ලෙස සාහිත්‍ය මූලාශ්‍රය අධ්‍යයනය හා සම්මුඛ සාකච්ඡා ආදිය භාවිත වේ. ලක්ෂමණ පරපුරේ සුර රජෙකු වූ සමන් සුරිඳුගේ කාලයේ දී බුදුරජාණන් වහන්සේ ලංකාවට වැඩම කොට සමන්ත කූඨයේ ශ්‍රී පාද පද්මය සලකුණු කොට කූරගල දිවා විහරණය කළ බවත් එතැන් පටන් එය දිවා ගුහාව ලෙස ප්‍රකට වූ බවත් ජන කවි සාක්ෂි දරයි. කූරගල පිහිටුවා ඇතැයි සැලකෙන ශ්‍රී පාදය ගැන ද යම් අදහසක් ජන කවි තුළින් ගත හැකි ය. ඒ මෙසේය "ගෝර බලැති රුපු බිඳ හැර බෝසත් පාරමිතා දස බලයෙන්දා - සාර උතුම් සිරිපතුල් පිහිටුවේ කූරගල පිට මන නන්දා". සී. එච්. කොලින්ස් මහතා ශ්‍රී පාද සටහන පිළිබඳ පැරණි චිත්‍රයක් කූරගල ප්‍රදේශයෙන් සොයාගත් බැවින් යථෝක්ත ජන කවියේ ඇති අදහස තහවුරු වේ. කකුසඳ, කෝණාගම හා කස්සප බුදුරජාණන් වහන්සේලාගේ සිරිපා ලකුණු ද කූරගල හෙවත් කුහරේගල පුදබිමේ පිහිටුවා ඇති බව ජනකවි සාක්ෂි දරයි. රහතුන් වහන්සේලාගේ ආගමනයෙන් මෙහි ආරම්භ වූ ආරණ්‍ය සේනාසනය කෝට්ටේ සීතාවක යුග දක්වා ම විකාශනය වූ බව ජන කවිවල සඳහන් වේ. කූරගල පුදබිමේ ඓතිහාසික බෞද්ධ උරුමය ජන කවියෙන් හෙළිවන බවට  යථෝක්ත කාරණා සාක්ෂි දරයි.

***ප්‍රමුඛ පදඃ*** *ඓතිහාසික බෞද්ධ උරුමය, කූරගල පුදබිම, ජන කවිය, දිවා ගුහාව, ශ්‍රී පාදය*

# උඩරට මංගල භේරි වාදනයෙහි ශුභා'ශුභ භාවය

ආර්. බී. රණවීර, එල්. එම්. ආරියරත්න, එච්. පී. එම්. ඩී. චමින්ද

සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය

*horanarbr@gmail.com*

උඩරට නර්තන සම්ප්‍රදායයට අයත් කොහොඹා යක්කම් කාරිය වලියක් මංගල්ලය, කඩවර කංකාරිය, බත් මාලා පිදවිල්ල, බලි යාගය වැනි අවශේෂ යාතුකර්ම ගණනාවක ප්‍රධාන අවනද්ධය ගැටබෙරය වෙයි. එමෙන් ම පිරිත් පිංකම් වැනි බෞද්ධ පූජාකර්මයන් ද, පසුකාලීන ව විවාහ උත්සව, සමාජ උත්සව, මෙන් ම රාජ්‍ය උත්සවයන්හි දී ද ගැටබෙරය අත්‍යවශ්‍ය වාද්‍ය භාණ්ඩයක් බවට පත් වූයේ එය භාවිතයෙන් කෙරෙන මගුල් බෙර වාදනය හේතුවෙනි. එම වාදනය ශුභ ඵල උපදවන බවට පවතින විශ්වාසය එහි දී ප්‍රමුඛ වෙයි. ඡන්දස්ශාස්ත්‍රයට අනුව ගැටබෙරයෙන් වැයෙන මඟුල් බෙර පදවලට අදාළ අක්ෂරයන්හි ශුභ ගණ පිහිටීම් වන බව බොහෝ දෙනකුගේ මතය යි. එහෙත් එම බෙරපද පූර්ණ ලෙස ඡන්දස්ශාස්ත්‍රය සමග සංසන්දනය කෙරුණු අවස්ථාවක් දක්නට නො වේ. එහි දී උද්ගත වන අනෙක් ගැටලුව වනුයේ මඟුල් බෙර වාදනයට අයත් බෙරපද සංගතියෙහි ඒකත්වයක් නොමැති වීම යි. මුද්‍රිත ග්‍රන්ථයන්හි දැක්වෙන මඟුල් බෙරපදත්, විවිධ ගුරුකුල ආශ්‍රිත මඟුල් බෙරපදත් උසස් අධ්‍යාපන ආයතනයන්හි ඉගැන්වෙන මඟුල් බෙරපදත් අතර සමතාවක් නොවේ. ඒ අනුව ආශීර්වාද වශයෙන් වැයෙන, මඟුල් බෙර වාදනයෙහි ශුභා'ශුභ භාවය පිළිබඳ ව කවර භාවිතයක් ප්‍රමුඛත්වය ගනු ලබන්නේ ද යනු විමසීම මෙම පර්යේෂණයෙහි අරමුණ විය. මඟුල් බෙරපද භාවිතයෙහි දක්වන වෙනස්කම් සලකා පූර්වෝක්ත මූලාශ්‍රය තුනෙහි මඟුල් බෙරපද ඡන්දස්ශාස්ත්‍රය ඇසුරින් විභාග කෙරිණි. මෙහි දී ඡන්දස්ශාස්ත්‍රය අක්ෂර ඡන්දස හා මාත්‍රා ඡන්දස ලෙස දක්වන ප්‍රධාන ප්‍රභේදයන්ගෙන් අක්ෂර ඡන්දස උපයෝගි කොට ගැනිණි. අවස්ථානුකූල ව හා පුද්ගලානුබද්ධ ව මඟුල් බෙර වාදනයෙහි මාත්‍රා ඡන්දස වෙනස්කම් දැක්වීම එහි දී අවධානයට ගැනිණි. ඒ අනුව පුස්තකාලය පර්යේෂණ ක්‍රමවේදය මෙම පර්යේෂණයෙහි ලා ප්‍රමුඛ ව අනුගමනය කෙරිණි. ඒ අනුව පරිශීලිත මූලාශ්‍රය අතුරින් උඩරට නැටුම් කලාව කෘතියෙහි දැක්වෙන මඟුල් බෙරපදවල ශුභ ගණ සංයුතිය 66.14%ක් ද, අශුභ ගණ සංයුතිය 33.85%ක් ද වෙයි. අහුගොඩ ශිල්පීන් දක්වන මඟුල් බෙරපදවල ශුභ ගණ සංයුතිය 71.91%ක් ද, අශුභ ගණ සංයුතිය 28.08%ක් ද වෙයි. උසස් අධ්‍යාපන ආයතනයන්හි ඉගැන්වෙන බෙරපද ශුභ ගණ සංයුතිය 71.05%ක් ද, අශුභ ගණ සංයුතිය 28.94%ක් ද වෙයි. මෙම ප්‍රතිඵල අනුව මඟුල් බෙර වාදනයෙහි සුබ ගණ සංයුතියෙහි සාමාන්‍යය 69.7%ක් වෙයි. අශුභ ගණ සංයුතියෙහි සාමාන්‍යය 30.29%කි. ඒ අනුව ඡන්දස්ශාස්ත්‍රානුකූල ව මඟුල් බෙර වාදනය යනු ශුභ ඵල දක්වන්නක් වෙයි. මූලාශ්‍රය අතුරින් අහුගොඩ ශිල්පීන් වාදනය කරන මඟුල් බෙරපද ඡන්දස් ශාස්ත්‍රය අනුව වඩාත් ශුභඵල දක්වන බව මෙම පර්යේෂණයේ දී පැහැදිලි විය.

***ප්‍රමුඛ පදඃ*** *මඟුල් බෙර, ඡන්දස් ශාස්ත්‍රය, ශුභ ගණ, අශුභ ගණ*

# Rajasthan Folk Music and Hindustani Classical Music (Raga system)

W. H. A. N. Weerasinghe

Department of North Indian Music, University of Visual Arts and Performing Arts

*whaniroshan@gmail.com*

This paper examines the similarities between Rajasthan folk music and Hindustani Classical music (Raga system). The study involved a survey of literature, scholarly studies and Audio-Video records collected by the candidate. The folk music of Rajasthan has a great impact to improvisation of Hindustani Classical music. The essentials like *raga, tala, svara*, rhythm, ascending and descending, *Alap, Tana, Murki, Palte, Boltan* etc., which provides evidence to prove similarities with Hindustani Classical Music. The tunes of Rajasthan folk songs resemble the main notes of Raga *Thilak Kamod, Bilawal, Hindol, Maand, Sarang, Peelu, Desh, Sorath* etc. The songs which are sung on *Gangnur* festival are usually based on *Raga Bilawal.* The song *Ghoomar* which is followed by *Ghoomar* dance is sung in *raga Peelu.* The songs sung on *Teej* festival are sung in *Raga Hindole.* The style of singing known as *Maand* is based on *Raga Maand.* Although a style of folk song known as *Khyal*, which is sung in the same style as *Khyala* in Hindustani Classical Music. *Panihari, Dhola, Maru, Phad, Rasia, Hori, Chunari*, etc., are typical styles of singing in Rajasthan folk music which have been followed the definite notes related to the melodies of Classical *Ragas* in Hindustani music. Thus, it is apparent that the folk music of Rajasthan has a significant influence on the musical principles of Hindustani Classical music.

***Key words:*** *Rajasthan Folk music, Hindustani Classical music, Raga system, Significance, Similarities*

# ජනකවියෙන් විද්‍යමාන වන ලාංකේය වලව් සමාජය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

එච්. ඒ. ජී. කේ. කුලතිලක

රුහුණ විශ්වවිද්‍යාලය

*hagkkulathilaka@gmail.com*

චූල සම්ප්‍රදායට අයත් ජනකවිය මානව සමාජයේ භාව ප්‍රකාශන ක්‍රමවේදයක් බවට පත් වූ අතර එකී ප්‍රජාවේ දුක, සතුට, ක්‍රෝධය, ඊර්ෂ්‍යාව, පිළිකුල ආදී ඔවුන් සතු වේදිතයන් සමුදාය නිර්ව්‍යාජ, සරල සහ ගීතවත් ස්වරයෙන් ජනකවි වශයෙන් ප්‍රකාශයට පත්විය. අතීත සමාජයේ ප්‍රභූ සහ නිර්ප්‍රභූ නැතහොත් පීඩක හා පීඩිත පන්ති නිර්මාණය වී ඇති බවද ඔවුන්ගේ ප්‍රකාශන තුළින් විද්‍යමාන වේ. මේ වන විට වත්මන් වාණිජවාදී සමාජයේ නටබුන් බවට පත්ව ඇති වලව් සමාජය අතීතයේදී සාමාන්‍ය ජනයා දැඩි ලෙස පීඩාවට පත් කළ සමාජ පන්තියක් විය. මෙම අධ්‍යයනයෙන් ජනකවියා ලාංකේය වලව් සමාජය කෙරෙහි දක් වූ දෘෂ්ටිය කෙබඳුද යන්න පරීක්ෂාවට බඳුන් කෙරේ. ඒ අනුව වලව් නම් වූ ප්‍රභූ පැලැන්තිය ලාංකේය වලව් සමාජයේ ක්‍රියාත්මක වූ ආකාරය ජනකවිය තුළින් හඳුනා ගැනීම මෙම පර්යේෂණයෙහි අරමුණයි. ලංකාවේ සංචිත ජනකවි පරිශීලනයෙන් දත්ත රැස් කර විශ්ලේෂණයට බඳුන් කිරීම මෙම පර්යේෂණයේ ප්‍රධාන අධ්‍යයන ක්‍රමවේදය බවට පත්විය. " ගුනේ පනේ ඇති ගමේ වලව්වෙන් වී කෙටුමට පණිවිඩ ආවේ - වී කෙටුවා මිස දුන්න දෙයක් නැත හඳපානේ ගෙදරට ආවේ" යන කවිය මගින් වැඩවසම් සමාජ ක්‍රමයේ මව සහ දරුවන් අතර ඇති කුටුම්බගත ජීවන පැවැත්ම ප්‍රභූ සමාජයේ බලපෑම හමුවේ ඇතිවන අර්බුදය ධනපති හා නිර්ධන පන්ති අතර ගැටුම භෞතික සමාජයේ පිහිටක් නොලබන ජනයා අදෘශ්‍යමාන බලවේග තුළින් පිහිට පතන ආකාරය ආදී කරුණු රැසක් විද්‍යමාන වෙයි. "හොඳයි කියන ඇලපාත වලව්වේ මන්දැයි අපෙ නඩු නාසන්නේ - ඇතා වගේ මගෙ ගොනා මරාලා කවුදැයි ඇල්ලට පෙරලුවේ" පීඩිත පන්තිය සතු මානව අයිතිවාසිකම් උල්ලංඝනය වී උදාවන ශෝචනීය තත්ත්වය කියාපාන අතර "ඉනේ බලාපන් හවඩිය දිලිසෙනවා - නිලමෙ බලාපන් දෝලාවෙන් යනවා" ආදී උදාහරණ මගින් ප්‍රභූ පැලැන්තිය ගත කළ සුඛෝපභෝගී ජීවන රටාව පිළිබඳ ගැමියාගේ අව්‍යාජ දෘෂ්ටිය ප්‍රකාශනය වේ. වැඩවසම් සමාජ ක්‍රමය තුළ ධනපති හා නිර්ධන වශයෙන් පන්ති ක්‍රම දෙකක් පැහැදිලිව විභජනය විය. ධනය, කුලය, බලය, නිලය ඒකරාශී කරගත් ධනපති පන්තිය නිර්ධන පාන්තිකයන් පෙලමින් ඔවුන්ගේ ශ්‍රමය සූරාකමින් සුඛවිහරණය කළේය. බහුතර පිරිසක් වූ නිර්ධන පාන්තිකයා තමා සතු කුටුම්භ ගත ජීවිතය, නිදහස, මානසික සුවය පමණක් නොව ස්වකීය ශරීර ශක්තිය පවා සුළුතර ධනපති පන්තිය වෙත පූජා කරමින් අතිශය ශෝචනීය ජීවිතයක් ගත කළෝය. මෙම අසාධාරණ ක්‍රියාපටිපාටිය කෙරෙහි අදෘශ්‍යමාන බලවේගවලින් පිහිට පැතූ නිර්ධන පාන්තිකයාගේ භාවාත්මක ප්‍රකාශන ඉතා සරලව නිර්ව්‍යාජී ලෙස ජනකවියට විෂයය වීම තුළින් එදා පැවති පීඩක හා පීඩිත පන්තියේ යථා ස්වභාවය නිරූපණය වේ.

***ප්‍රමුඛ පද:*** *නූතන ජනකවිය, වලව්, ධනපති පන්තිය, නිර්ධන පන්තිය, සමාජ දෘෂ්ටිය*

# සිංහල නැළවිලි ගීයෙන් නිරූපිත සමාජ පාලනය

එච්. පී. කේ. එන්. හේවාවසම්

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

*kaushi@sjp.ac.lk*

සිංහල ජනසාහිත්‍යයේ සදුපදේශ සම්පාදනයේ ලා මූලික අඩිතාලමක් සිංහල ජනකවියට ලැබෙනු ඇත. ජනකවිය පුළුල් සමාජ පසුබිමක් මත ජනනය වූ බැවින් එහි විවිධ පරාසයන් පවතිනවා සේ ම නැළවිලි ගීයට ලැබෙනුයේ ප්‍රමුඛ ස්ථානයකි. දාරක ප්‍රේමය උත්පාදනයෙහි ලා මෙන් ම ප්‍රාථමික සමාජානුයෝජන කාර්යයේ නියැලෙන පවුල තුළින් යහපත් දරුවන් සමාජයට දායාද කිරීමට මෙන් ම ගුණ ධර්ම උගැන්වීමට ද අතීත ජනයා නැළවිලි ගී විවිධාකාරයෙන් යොදා ගෙන ඇත. ඒ අනුව මෙම අධ්‍යයනයේ දී මූලික අවධානය යොමු කරනු ලබන්නේ අතීත සමාජයේ භාවිතයට ගන්නා ලද නැළවිලි ගී තුළින් ඉස්මතු සදුපදේශයන්ට ආමන්ත්‍රණය කිරීම හා එම සඳුපදේශ වර්තමාන සමාජයට නැවතත් ප්‍රත්‍යාවලෝකනය කිරීම වේ. නූතන සමාජයේ විධිමත් සමාජ පාලන කාරක පැවතියත්, අපරාධ හෝ සමාජ විරෝධී ක්‍රියාවන්හි අවම බවක් අතීත සමාජය හා සසඳා බැලීමේ දී හඳුනාගත නොහැකිය. එය නූතන සමාජානුයෝජනයේ දුර්වලතා පවතින බවට කදිම නිදසුනකි. ඒ අනුව මෙම පර්යේෂණයේ පර්යේෂණ ගැටලුව වන්නේ සිංහල ජනසමාජයේ නැලවිලි ගී තුළින් ඉස්මතු වන සදුපදේශයන් මොනවාද? එම සඳුපදේශ සමාජ පාලනයට සිදුකරන දායකත්වය කුමක්ද? යන්නයි. පර්යේෂණ සඳහා දත්ත රැස්කිරිමේ දී ප්‍රාථමික මූලාශ්‍ර වන නැලවිලි ගී හා බැඳි සාහිත්‍ය මූලාශ්‍ර වන ජනශ්‍රැතිය, ජනකවි හා සම්බන්ධ ග්‍රන්ථ යොදා ගන්නා ලදි. නැලවිලි ගී තුළින් ඉස්මතු ප්‍රධාන සදුපදේශ අතර තම දෙමාපියන්ට ගරු කිරීම (දිනේ පටන් මා උපන්න - මව් විඳි දුක් බෑ කියන්ට...) ඥාතීන් හිතමිතුරන්ට ගෞරව දැක්වීම (දුවෙනි උතුම් අත්තලාට - වැඳපන් දැතින් හනිකට), දඟර නොකර සිටීම (ලොවේ ළමයි වැලි කෙළිති - වැලි මැන මැන දඟර වෙති), නඩු නොකීම, බොරු නොකීම සිරගෙට නොයාම (ලොවේ ළමයි නඩු කියති - ගුටි අනිමින් සිර කරති), සංවර ඇඳුම් පැළඳුම් භාවිත කිරීම (වැඳපන් වරලස කොනකට - ඇඳපන් සුදුවත ඔබිනට), ඌන පෞරුෂයෙන් මුදවා යහපත් පෞරුෂත්වයක් හිමිකර දීම (ඔන්න බබෝ ඇතින්නියා - ගල් අරඹේ සිටින්නියා, නුඹෙ අම්මා කළුම කළුයි), සතුන්ට හිංසා නොකිරීම (ලොවේ ළමයි ගොන් කෙළිති - උකුකලමින් පොර අනිති), වීරත්වය ආදේශ කිරීම (ආගම රන් විමනක් වේ - ජාතිය මිණි පහනක් වේ) වැනි ගුණාංග පුරුදු කොට ඇත. ඒ අනුව මෙවැනි සදුපදේශ තුළින් කුඩා දරුවා අපගාමී පෞරුෂත්වයෙන් ඈත්කරමින් සමාජ සුභවාදියකු බවට පත්කිරීමට නැළවිලි ගී තුළින් විශාල සමාජ කාර්යයක් ඉටු කොට ඇත. මේ අනුව මෙම නැළවිලි ගී නූතන සමාජයේ බාල, තරුණ, මහලු පුද්ගලයින් හරහා සන්නිවේදනය කිරීම, පාසල් විෂයය මාලාවන්ට පාඩම් වශයෙන් හඳුන්වා දීම, ජනමාධ්‍ය හරහා නිතර ශ්‍රවණයට අවශ්‍ය පහසුකම් සැපයීම, මව්වරුන්ගේ සායන තුළින් දැනට සිදුකරන දැනුවත් කිරීමේ ක්‍රමවේද තවදුරටත් සංවර්ධන කිරීම ආදිය වැදගත් වනු ඇත.

***ප්‍රමුඛ පද:*** *නැළවිලි ගී, සදුපදේශ, සමාජ පාලනය, සිංහල ජනකවිය, සමාජානුයෝජනය*

# ඇමරිකානු කිවියර රොබට් ෆ්‍රොස්ට්ගේ කාව්‍යවල විද්‍යමාන ජනකාව්‍ය ලක්ෂණ, සිංහල ජනකවි හා සසඳමින් කැරෙන අධ්‍යයනයක්


කේ. ලංකාමුල්ල[1], ඩී. එම්. එස්. එන්. වීරසූරිය[2], ආර්. එම්. එස්. කේ. රණසිංහ[3]

[1]සිංහල හා ජනසන්නිවේදන අධ්‍යයනාංශය, [2]විනිවිද ශ්‍රව්‍ය ග්‍රන්ථ ව්‍යාපෘතිය, [3]ඉංග්‍රිසි හා වාග්විද්‍යා අධ්‍යනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

*klankamulla@sjp.ac.lk*



සිංහල ජනකවිය ජනතාව අතුරින් බිහිව මුඛපරම්පරාගතව පැවත එන, ජනකලා අතර සුවිශේෂ ආස්ථානයක් හිමි කරගන්නා සාහිත්‍ය ශානරයකි. මෙම පර්යේෂණයෙහි අරමුණ සිංහල ජනකවියත් ඇමරිකානු කිවියර රොබට් ෆ්‍රොස්ට්ගේ කාව්‍යවල අන්තර්ගත ජනකාව්‍ය ලක්ෂණ අතර සංසන්දනාත්මක අධ්‍යයනයක් සිදුකිරීමයි. භාවිත ක්‍රමවේදය වන්නේ ප්‍රාථමික මූලාශ්‍රය වශයෙන් ජනවිඥානගත තොරතුරුද, ද්වීතීයික මූලාශ්‍රය වශයෙන් සිංහල ජනසම්මත ජනකාව්‍ය (සිල්වා, මලලසේකරඃ1935), Robert Frost : A Collection of Critical Essays ප්‍රමුඛ සාහිත්‍ය කෘති සහ අන්තර්ජාලයද යොදා ගැනීමයි. රොබට් ෆ්‍රොස්ට්ගේ නිර්මාණ අතුරින් බොහොමයක් ජනජීවිතය හා බැඳී පවතී. පෙර'පරදිග ජනජීවිතයෙහි සැලකිය යුතු වෙනස්කම් පවතින මුත් වෘත්තියෙන් ගොවියකු වූ ෆ්‍රොස්ට්ගේ කවිවල අන්තර්ගත බොහෝ අනුභූති සිංහල ජනකවි සංකල්ප හා සැසඳෙයි. පර්යේෂණ ප්‍රතිඵල වශයෙන් සිංහල ජනකවියේ ගොවිතැන හා ශ්‍රම කළමනාකරණ සංකල්ප 'ගිමන් හැර ගොසින් නැමිලා නෙළන කොට' ආදි වශයෙන් විශද කරද්දී ෆ්‍රොස්ට්ගේ 'After Apple Picking' සහ 'Mowing' නිර්මාණවල එය පිළිබිඹු වෙයි. 'උදය සවස එන ගොයම් කුරුල්ලෝ'වැනි සිංහල ජනකවියේ එන සොබාදහම් සංකල්ප සමග ෆ්‍රොස්ට්ගේ 'The Owen Bird' වැනි කාව්‍ය සැසඳෙයි. එසේම 'ලොව්තුරු මුනිඳුගෙ අණය මුළුල්ලේ - සිව්වරම දෙවියෝ සහ මෙසියල්ලේ' යන ජනකවිවල බුදුදහමත් දේව සංකල්පත් අන්තර්ගතය. ෆ්‍රොස්ට්ගේ 'God's Garden' කාව්‍යයෙහි ඔහුගේ ලබ්ධිය අන්තර්ගතය. 'හිර ගියා දා සිට පිල් ඉරුවේ ලැග අඳ අස්වනු ලැබ නව දැල්ලේ' වැනි සිංහල ජනකවිවලට වස්තු විෂය වූ මාපිය, දූදරු, අඹුසැමි සබඳතා ෆ්‍රොස්ට්ගේ පැදිවලද දැකිය හැකිය. ගැමි පවුලක අනුවේදනීය සිදුවීමක් අරබයා ගෙතුණු 'Home Buriel' ඊට නිදසුනි. 'අගුලේ රඟ දැනෙන්නේ පැද්ද කල්හි ගශේයා' වැනි සිංහල ජනකවියෙහි පවත්නා ජීවන දර්ශනය ෆ්‍රොස්ට්ගේ පැදිවලින්ද ප්‍රතීයමානය. නිදසුන් ලෙස 'Nothing Gold Can Stay' සොබාදහමේත් - මනුෂ්‍ය ජීවිතයේත් අනියත බව පිළිබඳව විවරණයක් බඳුය. ' වැනේලු කළු වැනේලූ' ආදි වශයෙන් ආකෘතික වශයෙන් ජනකවියෙහි රිද්මයානුකූල බවක්ද, විරිතක්ද පවතී. ජනකවි ආකෘතියට සපුරාම නොසම මුත් 'A Girl in the garden' වැනි කවක මනා රිද්මයක් තිබේ. එසේම 'දොඩම් කපාලා - ඇඹුල් තනාලා' ආදි කවකින් හෙළිවන පරිදි ජනකවිය සරලය. අව්‍යාජය. කිවියර ෆ්‍රොස්ට් මෙම ගුණයෙන් සිංහල ජනකවියාට අතිසමීපය. ඔහුගේ 'A Late Walk' වැනි කවියක පවත්නේ ජීවිතයේ කුඩා සංසිද්ධීන් නිර්ව්‍යාජව කවියට නැංවූ සරලවූත්, අව්‍යාජවූත් කාව්‍යාත්මයයි. එසේම 'A Question' වැනි පද්‍යයක පවතින සංක්ෂිප්ත බව 'අම්බලමේ පිනා - වළං කදක් ගෙනා' වැනි හෙළ ජනකවි බොහොමයක පාහේ දක්නට ලැබෙන පොදු ගුණාංගයකි. ඉහත සඳහන් කරුණු සැලකිල්ලට ගැනීමෙන් ඇමරිකානු කිවියර රොබට් ෆ්‍රොස්ට්ගේ පද්‍යය සහ සිංහල ජනකාව්‍යය අතර සැලකිය යුතු අන්දමේ සමානතා පවතින බව නිගමනය කළ හැකිය.



***ප්‍රමුඛ පදඃ*** *ජනකවිය, ෆ්‍රොස්ට්, ජනජීවිතය, පෙරදිග, අපරදිග*

# සමාජ පාලනයෙහිලා ජන කවියෙන් ලැබුණු දායකත්වය පිළිබඳ අධ්‍යයනයක්

ගනේගමගේ අසංකා මධුහංසි

අපරාධ විද්‍යා හා අපරාධ යුක්ති අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

*asankaganegama17@gmail.com*

සංස්කෘතියේ අංගයක් වන ජනශ්‍රැතිය සමාජශෝධන කාර්යභාර්යක් සහ සමාජ පාලනයක් උදෙසා ඵලදායී ලෙස යොදා ගෙන ඇති බව ඓතිහාසික සාධක ඔස්සේ තහවුරු වේ. මේ අනුව, ජනශ්‍රැතියෙහි අවියෝජනීය අංගයක් ලෙස ජනකවියට ප්‍රබල ස්ථානයක් හිමි වේ. "ජන" යනු, පොදු යන්නයි. නැතහොත් සමුහයා විසින් ගොඩනගන ලද්දක් ලෙස ද අර්ථ විග්‍රහ කල හැකිය. මේ අනුව ජනකවිය යනු අතීත ජන සමුහයා විසින් සිය සාමුහික අවශ්‍යතා පදනම් කොටගෙන සාමුහික චින්තනධාරා නියෝජකත්වයෙන් ගොඩනැගුණු නිර්මාණාත්මක සන්නිවේදන මාධ්‍යයකි. ජනකවියේ පොදු ලක්ෂණ විමසා බැලීමේදී, නිර්මාණාත්මක වීම, සංවාදාත්මක වීම, හුදෙකලා වීම, ආකෘතිමය විවිධත්වය, උපදේශාත්මක වීම යන කරුණු හඳුනා ගැනීමට පුළුවන. ගැමිජනයා සමාජ ශෝධනයෙහිලා, උපදේශාත්මක ලෙස ජනකවිය උපයෝගී කරගත් ආකාරය අධ්‍යයනය කිරීම මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වූ අතර, ජනකවිය තුළින් සැබෑ ලෙස ම සමාජ පාලනයක් සිදු වී තිබේද? යන්න අධ්‍යයනයේ ගැටලුව විය. මෙම අධ්‍යයනය සඳහා සාහිත්‍ය මුලාශ්‍රය යොදා ගන්නා ලදි. මෙම අධ්‍යයනය මගින් පෙනී යන්නේ, අතීත ගැමියා සිය ජීවිත පරිඥානය තුළින් ලද අත්දැකීම් ජනකවි හරහා, සමාජ පර්යාය සුරක්ෂිත කිරීම සඳහා යොදා ගෙන ඇති බවයි. කාන්තාවන්ගේ පතිවෘතාවෙහි අගය පිළිබඳව සඳහන් වන "ලියට අභරණය හොඳ කල්කිරියාව - කුමට ලියගෙ කැත වුණි නම් කිරියාව" වැනි කවි මගින් ද, මුසාවාදයෙන් තොර උත්තම මිනිස් ගුණාංගයන්හි වැදගත්කම සම්බන්ධයෙන් සඳහන් වන "හැට පැන්නත් වඳුරා බිම ගමන් නැත - උත්තමයන්ගෙ බොරුවට දිව නැමෙන් නැත" ආදී කවි ද, අධාර්මික දිවිපෙවෙතක් ගත කිරීමෙන් ඇති වන අයහපත් විපාක සම්බන්ධයෙන් "කරන කලට පවුකම් වේ රසට රසේ - විඳවමු එය ගොනු කර බැඳි කරත්ත සේ" වැනි ජන කවි මගින් ද, අපගාමී සහ අපරාධවල වින්දිතයන් බවට පත්වීම වැළැක්වීම සඳහා වූ උපදේශයන් දැක්වෙන "අන්දර කැලේ දර කැඩුමට යන්ට එපා - පාලු ළිඳේ දිය කෙළියේ යන්ට එපා" ආදී වූ සමාජ පාලනයෙහිලා වැදගත් වන අංශයන් පිළිබඳව ජනකවිය මගින් අවධානය යොමු කර ඇති බව මෙම අධ්‍යයනයෙන් ප්‍රධාන වශයෙන් තහවුරු විය. ඒ අනුව ජනකවිය යනු, හුදෙක් රසවින්දනය සඳහා පමණක් නොව සමාජ ශෝධන කාර්යභාර්යයෙහිලා ද වැදගත් වන සුවිශේෂී කලා මාධ්‍යයක් බව නිගමනය කළ හැකි ය. එනයින් අද්‍යතන සමාජ පාලන කාර්යයෙහිලා ද ජනකවියේ සඳහන් උපදේශයන් ඵලදායී ලෙස උපයුක්ත කර ගත හැකි ය.

***ප්‍රමුඛ පදඃ*** *ජනකවිය, ජනශ්‍රැති, සමාජ පාලනය, සමාජ ශෝධනය, ගැමි ජනයා*

# වතුකරයේ ජන කවිය මගින් ඉස්මතු වන ජීවන ශෛලීන් පිළිබඳ විමර්ශනාත්මක විග්‍රහයක්

එච්. එම්. කේ. ජී. දුෂ්මන්ත, ඩබ්ලිව්. ජී. ඩී. පෙරේරා, ආර්. අනුෂාරි

සමාජ විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

*kalindudush94@gmail.com*

ජන කවිය යනු ඕනෑම ජන සමූහයක ඔවුන්ගේ ජීවන ශෛලිය ප්‍රතිරූපණය කරන ප්‍රතිබිම්භයක් වැනිය. ශ්‍රී ලංකාවේ ජන ශ්‍රැති අධ්‍යනයන් විමසා බැලීමේදී විවිධ ජනවර්ග මත පදනම් වූ ජනකවි හඳුනාගත හැකි අතර එහි දී වතුකරයට අදාළව ගොඩනැගුණු ජනකවි සම්ප්‍රදාය ද හඳුනාගත හැකිය. සිංහල කවියේ ප්‍රභවය හා විකාශනය මෙන් වතුකරයේ සුවිශේෂී වූ ජනකවියේ ව්‍යාප්තියක් ද සිදුවී ඇත. වතුකරයට සුවිශේෂී වූ ආර්ථික රටාව තුළ මෙම ජනකවි ප්‍රභේදය තවත් සුවිශේෂී වන අතර එහිදී වතුකම්කරුවන් ශ්‍රී ලංකාවට සංක්‍රමණය වීමේදී සිදු වූ ඓතිහාසික සංසිද්ධීන් මෙන්ම දකුණු ඉන්දියානු සංස්කෘතික ආභාසයන් ද වතුකරයේ ජන කවිය පෝෂණය වී ඇත. මෙම ජනකවිය ඔවුන්ගේ එදිනෙදා ජීවිතයේදී සිදුවන සියුම් ක්‍රියාකාරකම් මෙන්ම භාවීය ප්‍රකාශනද මත පදනම්ව සුවිශේෂී වූ භාෂාත්මක ආකෘතියකින් ගොඩනැගුණු ජනකවි අංගයක් ලෙසද හඳුනාගත හැකිය. අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වනුයේ වතුකරයේ ව්‍යාප්ත වී පවතින ජනකවියේ ස්වරූපය හඳුනා ගනිමින් ඒ තුළ විද්‍යමානවන වතුකරයට ආවේණික ජීවන ශෛලීන්වල ස්වභාවය විවරණය කිරීම වේ. අධ්‍යයන ක්ෂේත්‍රය වශයෙන් නුවරඑළිය දිස්ත්‍රික්කයේ පිහිටා ඇති ‘‘ස්ට්‍රැඩෙඩ්’’ සහ ‘‘යුනිෆීල්ඩ්’’ වතු ගම්මාන අධ්‍යයන ක්ෂේත්‍ර වූ අතර වතුකරයේ ජන ශ්‍රැතියට අදාළව පවතින ද්විතීයික මූලාශ්‍ර පරිශීලනය හා සම්මුඛ සාකච්චා 09ක් හා ප්‍රත්‍යක්ෂ අධ්‍යයන කිහිපයක් මඟින් සපයා ගත් දත්තයන් ගුණාත්මක ප්‍රවේශයක සිට විශ්ලේෂණය සිදු කරන ලදී. වතුකරයේ ජන කවිය තුළ දකුණු ඉන්දියානු ජන කවියේ ආභාසය මෙන්ම දේශීය භාෂාත්මක නාද රටාවල ආභාෂයෙන් ද පවතියි. වතුකරයේ ජන කවිය තුල ඔවුන්ගේ සමස්ත ජීවන රටාවම නිරූපණය වේ. මුල්කාලීනව කෝපි වගාවට කම්කරුවන් ගෙන්වීමේදී සිදුවූ සංසිද්ධීන් පවා මෙහි ඇතුලත් වේ. වතුකරයේ ජන කවිය වතු ජනයාගේ භාව ප්‍රකාශන මාධ්‍යයක් විය. එහිදී "තෝඩම් කාදල්" යන ජන කවිය තේ වත්තේ දී සිදුවන ආදර සබඳතා පිළිබඳ වූ කවියකි. එහිදී,‘‘ කුඩේ මේලේ කුඩ වච්චී - කොලුන්දු එඩක්කු පොර මුල්ලේ’’ යනුවෙන් එම භාවාත්මක ප්‍රකාශයන් කවියෙන් විවරණය කොට ඇත. වත්තේ පඩි ක්‍රමය ඇසුරෙන්ද ද ජනකවි නිර්මාණය වී තිබේ. මෙම ජන කවියේ දි තේ කුඩය යනු වතු කම්කරුවාගේ ප්‍රධාන භාණ්ඩයක් වේ මේ අයුරින් ජන කවිය නිර්මාණය වනුයේ එම ජනයාගේ ජීවන රටාව ඇසුරෙන් බව ගම්‍ය වේ වතුකරයේ ජන කවියේ නැලවිලි කවිවල දේශීය භාෂාත්මක නාද රටාවලට වඩා සජීව ආකෘතියක් පවතී. සිංහල භාෂාවේ "දොයි දොයි දොයිය බබා" යන්න "ආරාරෝ අයිරරෝ" යනුවෙන් භාවිත වීම් තවත් සුවිශේෂී තත්ත්වයකි. නාද රටාව තුළ ද අදාළ ජීවන රටාවේ රිද්මය ධ්වනිත කරවයි. ජන කවිය යනු ජන කොටසකගේ ජීවන රටාව පිළිබඳ වූ භාෂාත්මක මෝස්තරයකින් ඉදිරිපත් කරන විවරණයක් සපයන තහවුරුවක් වේ. මන්ද කම්කරුවන්ගේ ජන කවිය තුළ සැබෑ ලෙසම ඔවුන්ගේ ජීවන රටාව විවරණය කරන නිසාය. නමුත් වර්තමානයේ මෙම ජන කවියේ භාවිතය පිළිබඳ යම් පසුගාමීත්වයක් පවතී. මන්ද නූතනයේ වතුකරයේ සංස්කෘතිය ද ශීඝ්‍ර වෙනස්වීමකට භාජනය වන බැවිනි.

***ප්‍රමුඛ පදඃ*** *ජන ශ්‍රැතිය, වතුකරය, ජන කවිය, ජීවන ශෛලිය, වතු කම්කරුවන්*

# වතුකරයේ ජනශ්‍රැතිය තුළ පවතින ජන කතා තුලින් ගම්‍යවන ආගමික විශ්වාසයන්, සමාජ පර්යායන් පිළිබඳ අධ්‍යයනයක්

ඩබ්ලිව්. ජී. ඩී. පෙරේරා, එච්. එම්. කේ. ජී. දුෂ්මන්ත, ටී. දිල්හානි

සමාජවිද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

*wgihanhatton@gmail.com*

ලාංකීය සමාජ සංස්කෘතිය තුළ අන්තර්ගත වන තවත් සුවිශේෂී අංගයක් වශයෙන් වතුකරයේ විද්‍යමානවන ජනශ්‍රැතිය හඳුනා ගත හැකිය. වතු වගාව කේන්ද්‍රකොටගෙන සංක්‍රමණය වූ දකුණු ඉන්දීය ද්‍රවිඩ ජනයා තුළ පැවති සංස්කෘතිතාංග ඔවුන්ගේ මුල් භූමි වූ තාංජෝර් ප්‍රදේශයේ සිට දේශීය මධ්‍යම කඳුකරයට සංක්‍රමණය වන විටද එම සංස්කෘතිය තුල පැවතියා වූ ආගමික විශ්වාසයන්, සිරිත් විරිත්, කලාංග සංක්‍රමණය වූ අතර ඇතැම් අංග දේශීය තත්ත්වයන් සමග සම්මිශ්‍රණය වී ව්‍යාප්ත වූ අතර කොටසක් එසේ මිශ්‍රණයට හෝ සංස්කරණයට ලක් වූයේ නැත. ජනකතා යනු වාචික වූ ප්‍රවාහයක් යටතේ ව්‍යාප්ත වූ හාස්‍ය, උපදේශනය, කුතුහලය දැනවීම සඳහා නිර්මාණය කරන ලද ප්‍රබන්ධයක් හෝ කල්පිතයක් යනුවෙන් ප්‍රකාශ කළ හැකි වුවත් මෙම ප්‍රබන්ධ සඳහා වස්තු විෂය ලෙස සත්‍ය සිදුවීම් වැනි සාධක ද බලපායි. මෙම ජනකතා ඇසුරෙන් විවිධ සමාජ කෘත්‍යයන්, ආගමික විශ්වාසයන් හා සමාජය යහපත් අයුරින් පවත්වාගෙන යාමට අදාල වූ කාර්යයන් පිළිබඳව ජන සමාජය සවිඥානක කරනු ලබයි. වතුකරයේ ජනකතා ආගමික කේන්ද්‍රයෙන්ම ආරම්භ වී සමාජ පර්යාය ආමන්ත්‍රණය කරන ආකෘතියකින් ගොඩනැඟී ඇද්ද යන්න මෙම අධ්‍යයනයේ අධ්‍යයන ගැටලුව වේ. වතුකරයේ ජනකතාවේ මූලික ආකෘතිය හඳුනාගනිමින් ඒ හරහා සමාජ පර්යාය පවත්වාගෙන යාමට ඇති කරන බලපෑමේ හි ස්වරූපය අධ්‍යයනය කිරීම අධ්‍යනය අරමුණ වශයෙන් දැක්විය හැක. මෙම අධ්‍යනය සිදු කිරීමේදී නුවරඑළිය දිස්ත්‍රික්කයේ තෝරාගත් වතු ගම්මානයක් වූ තලවාකැලේ ටෘප් වතු ගම්මානයෙහි ජනයා සමග සිදුකළ සම්මුඛ සාකච්ඡා අටක් හරහා ප්‍රාථමික දත්ත සපයා ගත් අතර ද්විතීක දත්තයන් වතුකරයේ ජනකතා පිළිබඳ වූ සාහිත්‍ය මූලාශ්‍රයන් පරිශීලනය තුළින් සපයා ගෙන ඇත. වතුකරයේ පවතින ජන කතා තුළ බහුල වශයෙන් දෙවියන්, යකුන්, සුරංගනාවියන්, සතුන් වැනි චරිත භාවිතා කරන අතර ඇතැම් අවස්ථාවලදී මනුෂ්‍යයාද යොදා ගනියි. රාමායනය වතුකරයේ ජනකතාවක් ලෙස භාවිත වේ. රාමා, සීතා, හනුමාන් යන චරිත වතුකරයේ අදටත් වන්දනාවට පත් වීම තුල යහපත, අයහපත පරයා ජය ගන්නා බව සමාජයට ඒත්තු ගන්වා ඇත. අදටත් වතුකරයේ සුනඛයෙක් තම වාහනය කරගත් "මුණි" නමින් හඳුන්වන දෙවියෙක් වන්දනාවට පාත්‍ර කරයි. සුනඛයෙක් විසින් මංමුලා වු වන්දනාකරුවන්ට උදව් කළ කතාවක් වතු ජනයා අතර ප්‍රකටය. එයින් 'යහපතෙහි හැසිරෙන්නා යහපතෙන් ආරක්ෂා කරයි' යන සමාජ පර්යායගත ධර්මතාවය විශාද කරයි. කාලි දෙවියන් හා සම්බන්ධ කොටගෙන ජනකතා බොහොමයක් වතුකරයේ පවතී. එහිදී 'වරදට දඬුවම් කළ යුතුය' යන සමාජ මතය ඉස්මතු වේ.වතු කරයේ ජන කතා ආගමික විශ්වාසයන් මත පදනම් වු උපදේශයන් මගින් සමාජ පර්යාය පිළිබඳ ජන සමාජයට අවබෝධ කර දීමේ ආකෘතියක් මූලික වශයෙන් වතුකරයේ ජනකතා ඇසුරෙන් හඳුනාගත හැක. ඒ තුළ වතුකරයේ ජන කතාවේ මාධ්‍ය ආගමික විශ්වාසයන් වන බවත් එහි අරමුණ සමාජ පර්යාය පවත්වාගෙන යාම බවත් ප්‍රකට වේ.

***ප්‍රමුඛ පදඃ*** *ජන කතා, වතුකරය, සමාජ පර්යාය, ජනශ්‍රැතිය, ආගමික විශ්වාසයන්*

# ගැමිජනයා දුටු ඉගෙනීමේ අගය ජනකවි ආශ්‍රයෙන් විමර්ශනාත්මක අධ්‍යයනයක්

ජී. ජී. ඒ. මධුහංසි, කේ. ඩී. එම්. සඳරුවන්

අපරාධ විද්‍යා හා අපරාධ යුක්ති අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

*asankaganegama17@gmail.com*

අද්‍යතනයේ මෙන් විධිමත් අධ්‍යාපන ක්‍රමයක් හෝ සංවර්ධනයට හිතකර විෂයානුබද්ධ පාඨමාලාවක් සාම්ප්‍රදායික ගැමි සමාජවල ක්‍රියාත්මක වුයේ නැත. සරල කෘෂිකාර්මික දිවිපෙවෙතක් ගෙන ගිය ගැමියන්ට අවශ්‍ය වුයේ, එදිනෙදා වැඩකටයුතු කරගෙන යාම සඳහා වු අවශ්‍ය දැනුමකි. පරිසරය හා ගැටීමෙන් මෙන්ම පාරම්පරිකව ඒ දැනුම ලබා ගත්තේ පතපොත පරිශීලනය කිරීමෙන් නොවේ. එක්තරාදුරකට ස්වයංපෝෂිත අර්ථක්‍රමයකට හිමිකම් කිවූ සාම්ප්‍රදායික ගැමි ජනතාව ඒ සඳහා පිහිට කොට ගත්තේ, ස්වභාවික සම්පත් ය. පන්සල හෝ පිරිවෙන කේන්ද්‍ර කොටගත් අධ්‍යාපන ක්‍රමයක් ක්‍රියාත්මක වුයේ, ක්‍රි. පූ තුන්වැනි සියවයේ භාරතයෙන් මෙරටට බුදුසමය ලැබුණු දා පටන් ය. එහෙත්, ගමේ සියලු දෙනාට අධ්‍යාපනය ලැබීමේ සමාන ඉඩප්‍රස්ථා හිමි නොවීය. මන්දයත්, ගමේ ඉහළ යැයි සම්මත අයට පමණක් එම අධ්‍යාපන අයිතීන් හිමි වු බැවිනි. අකුරු ශාස්ත්‍රය ඉගෙන ගත යුතු ය යන අදහස පැරණි සමාජයේ පැවතුණු බව ජනශ්‍රැති විශේෂයෙන් ජනකවි මගින් පැහැදිලි වේ. මෙම අධ්‍යයනයේ, ප්‍රධාන අරමුණ වූයේ විවිධ ජනකවි තුළින් අකුරු ඉගෙනීම සම්බන්ධයෙන් සහ ඉගෙනීමේ අගය එදා ගැමි ජනතාව දුටු ආකාරය පිළිබඳව අධ්‍යයනය කිරීමයි. ජනකවිය මගින් අකුරු ඉගෙනීම සඳහා ගැමියා විසින් යම් පෙළඹවීමක් සමාජය තුළ ජනිත කළා ද? යන්න අධ්‍යයනයේ ගැටලුව වූ අතර සාහිත්‍ය මුලාශ්‍ර ඇසුරින් අධ්‍යයනය සිදු කරන ලදි. අතීතයේ ජීවත් වු ගැමි දරුවන්, ඉගෙනීම සඳහා එතරම් උනන්දුවක් දක්වා නොමැති අතර වැඩිහිටියන් ජනකවි මගින් විවිධ උපදේශයන් ඔවුනට ලබා දී ඇති බව අධ්‍යයනය මගින් සොයා ගන්නා ලදි. එය "ලබමින් සිප් සොඳ ගුරු මෙන් සසොබන - දහමින් වෙන් නොව සුසිරිත ගුණ සෙත" මෙන් ම "වස්තුව තිබුණොට ඔහු පිරිමියෙක් නොවෙයි - සිප්සත උගත හොත් ඔහු පිරිමියෙක් තමයි" යන ජන කවි තුළින් පැහැදිළි ය. ඇල්මෙන් අකුරු කිරීම තුළින් අනාගත ජිවිතේ යහපත් කරගත හැකි බවත්, මනා හික්මීමකින් සහ විනයකින් යුතුව ගුරු ගෙදරින් ශාස්ත්‍ර ඥානය ලබා ගත යුතු බවත්, නැතිනම් වේවැල් කොටු නාරන් සියඹලා අතු මගින් දඬුවම් කරන බවත් ජනකවියෙහි දක්වා ඇත. අද්‍යතනයේ මෙන්ම අතීත සමාජය තුළ ද අධ්‍යාපනය ලැබු පිරිසට සුවිශේෂි පිළිගැනීමක් ලැබී තිබු බව "දහසක් දෙනා සිටිය සබ මැද්දේ - අකුරු උගත් අයමයි පරසිද්දේ" යන ජනකවිය තුළින් විශද වේ. ඒ අනුව අපේ පැරණි ගැමියා ඉගෙනීමේ අගය මනාව අවබෝධ කරගෙන සිටි බවත්, ජනකවිය හරහා එම ඉගෙනීමේ අගය සමාජයට අවධාරණය කරන මාධ්‍යයක් ලෙස යොදාගත් ආකාරයත්, ඉගෙනීම කෙනෙකුගේ දියුණුවට හා අධ්‍යාත්මික ජීවිතයට අඩිතාලමක් වනු ඇතැයි යන අදහසින් එය සිදු කළ බවත් මෙම අධ්‍යයනයේදී හෙළිදරව් වීය. මේ අනුව, ජනශ්‍රැති අතර ජනකවිය ඉගනීමේ අගය පිළිබඳව තත් කාලීන ජන සමාජය දැනුවත් කිරීමෙහිලා ප්‍රබල සන්නිවේදන මාධ්‍යයක් ලෙස අතීතයේ යොදා ගෙන ඇති බව ද තහවුරු වේ.

***ප්‍රමුඛ පදඃ*** *ජන කවිය, අධ්‍යාපනය, ගැමියා, කෘෂිකාර්මික අර්ථ ක්‍රමය, අතීත සමාජය*

# ජන කවියෙහි සංවාද කවි භාවිතය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

ජේ. ඩී. අයි. ශෂිකලා, අයි. එම්. ජේ.දහනායක, ආර්. කේ. කේ. ටී. පී පත්මතුංග, එම්. යසින්ත දිල්ශාන්

කැලණිය විශ්ව විද්‍යාලය

*isurishashikala166@gmail.com*

මිනිසා භාෂාව පිළිබඳ ව හඳුනා ගැනීමෙන් පසු සිය සිතුවිලි අන්‍යයන්ට ප්‍රකාශ කිරීම සඳහා යොදාගත් අනේක විධ උපක්‍රම අතර ජන කවිය ද එක් ප්‍රභේදයකි. ලොව පවතින විවිධ සාහිත්‍යයන් හි වියත් කවි මෙන් ම ජන කවි ද අන්තර්ගත වේ. කාලාන්තරයක සිට ම පොදු ජනයා අතර පරපුරෙන් පරපුරට වාචෝද්ගත ව, අලිඛිත ව පැවත ඒ මේ හේතුව පදනම් කරගනිමින් ජන කවිය, ජනශ්‍රැති විශේෂයක් ලෙස සැලකෙයි. අතීත ජනයා නිරුත්සාහික ව සිතට නැගෙන සිතුවිලි කවියක් ලෙසින් අන් අයට ශ්‍රවනය වන සේ ගායනා කිරීම සිදු කර ඇත. ජන කාව්‍යයෙහි විවිධ ප්‍රභේද හඳුනාගත හැකි අතර,එහි එක් විශේෂ අංගයක් ලෙස සංවාදාත්මක ස්වරූපයෙන් රචිත ජන කවි දැක්විය හැකි ය. ජන කවිය පිළිබඳ කෙරෙන විග්‍රහයන් හි දී ජෝඩු සී පද ලෙස උක්ත කවි හඳුන්වා ඇත. ජන අත්දැකීම් ආශ්‍රය කරගෙන සංවාද කවි පටබැඳී ඇති බැව් ජන කවිය පිළිබඳ ව විමසීමේ දී පැහැදිලි වන කරුණකි. දෙදෙනෙකු හෝ බහු පාර්ශවයක් අතර සිදු වන කවි සංවාද,ජන කවි සාහිත්‍යයෙහි බහුල ව දක්නට ලැබේ. ආදරය, අනුරාගය, සුඛ-දුක්ඛ යනා දී නන්විධ තේමාවන් කරණකොටගෙන සංවාද කවි උද්භවය වී ඇති බැව් ජන සාහිත්‍යය විමසීමේ දී පෙනී යයි. මෙම පර්යේෂණයේ ගැටලුව බවට පත් වූයේ ජන කවියෙහි සංවාද කවි භාවිතය සිදු ව ඇත්තේ කෙසේ ද? යන්න විමර්ෂණය කිරීම යි. ජන කවියෙහි සංවාද කවි පිළිබඳ ශාස්ත්‍රීය අධ්‍යයනයක නියැලීම, විද්‍යාර්ථීන්ට නව පර්යේෂණ මංපෙත් විවර කර දීම, එම සංවාද කවිවල භාෂා භාවිතය සහ සාහිත්‍යයික ලක්ෂණ සම්බන්ධ ව අධ්‍යයනය මෙම පර්යේෂණයේ අරමුණු විය. මෙම පර්යේෂණයේ දී අන්තර්ජාලය සහ පුස්තකාලය පරිශීලනය, විෂය ප්‍රාමාණික විද්වතුන් සිව්දෙනෙකු සමඟ සිදු කරනු ලැබූ සම්මුඛ සාකච්ඡා ආදිය දත්ත ගවේෂණය සඳහා භාවිත කෙරුණි. දත්ත විශ්ලේෂණයේ දී ජන කවිය සහ එහි ඉතිහාසය අධ්‍යයනය, ජන කවියෙහි සංවාද කවි භාවිත වූ අයුරු අධ්‍යයනය කිරීම, එම සංවාද කවිවල අන්තර්ගත කාව්‍යාලංකාර හඳුනා ගැනීම, සංවාද කවි පබැඳීමට පාදක කරගෙන ඇති වස්තුවිෂය පිළිබඳ තොරතුරු අධ්‍යයනය සිදු කරන ලදී. ජන සාහිත්‍යයෙහි උපේත සංවාද කවියෙහි වස්තුවිෂය,ලෝකෝත්තර තේමාවන්ගෙන් බැහැර ව දෛනික ජීවිතයෙහි ක්ෂුද්‍ර හැඟුම් වුව කවියට නගා ඇති බවත්, ඊට උචිත පොදු ජන ප්‍රිය බස් වහරක් උපයුක්ත කරගෙන ඇති බවත් ගම්‍ය විය. එමෙන් ම, ජන කවිය තුළ සංවාද කවිය පොදු ජන සන්නිවේදන මාධ්‍යයක් බවට පරිවර්තනය වීම හේතුවෙන් සිංහල පද්‍ය සාහිත්‍යය සුපෝෂණය වී ඇති බව ද මෙහි දී නිගමනය කළ හැකි විය.

***ප්‍රමුඛ පද:*** *ජන කවිය, සංවාද කවි, සන්නිවේදන මාධ්‍යය, වාචෝද්ගත, පොදු ජන ප්‍රිය*

# සමාජ පාලනයෙහිලා ජන කවියෙන් ලැබුණු දායකත්වය පිළිබඳ අධ්‍යයනයක්

ජී. ජී. ඒ. මධුහංසි

අපරාධ විද්‍යා හා අපරාධ යුක්ති අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

*asankaganegama17@gmail.com*

සංස්කෘතියේ අංගයක් වන ජනශ්‍රැතිය සමාජ ශෝධන කාර්යභාරයක් සහ සමාජ පාලනයක් උදෙසා ඵලදායී ලෙස යොදා ගෙන ඇති බව ඓතිහාසික සාධක ඔස්සේ තහවුරු වේ. මේ අනුව, ජනශ්‍රැතියෙහි අවියෝජනීය අංගයක් ලෙස ජනකවියට ප්‍රබල ස්ථානයක් හිමි වේ. "ජන" යනු, පොදු යන්නයි. නැතහොත් සමූහයා විසින් ගොඩනගන ලද්දක් ලෙස ද අර්ථ විග්‍රහ කල හැකිය. මේ අනුව ජනකවිය යනු අතීත ජන සමූහයා විසින් සිය සාමූහික අවශ්‍යතා පදනම් කොටගෙන සාමූහික චින්තනධාරා නියෝජකත්වයෙන් ගොඩනැගුණු නිර්මාණාත්මක සන්නිවේදන මාධ්‍යයකි. ජනකවියේ පොදු ලක්ෂණ විමසා බැලීමේදී, නිර්මාණාත්මක වීම, සංවාදාත්මක වීම, හුදෙකලා වීම, ආකෘතිමය විවිධත්වය, උපදේශාත්මක වීම යන කරුණු හඳුනා ගැනීමට පුළුවන. ගැමිජනයා සමාජ ශෝධනයෙහිලා, උපදේශාත්මක ලෙස ජනකවිය උපයෝගී කරගත් ආකාරය අධ්‍යයනය කිරීම මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වූ අතර, ජනකවිය තුළින් සැබෑ ලෙස ම සමාජ පාලනයක් සිදු වී තිබේද? යන්න අධ්‍යයනයේ ගැටලුව විය. මෙම අධ්‍යයනය සඳහා සාහිත්‍ය මූලාශ්‍රය යොදා ගන්නා ලදි. මෙම අධ්‍යයනය මගින් පෙනී යන්නේ, අතීත ගැමියා සිය ජීවිත පරිඥානය තුළින් ලද අත්දැකීම් ජනකවි හරහා, සමාජ පර්යාය සුරක්ෂිත කිරීම සඳහා යොදා ගෙන ඇති බවයි. කාන්තාවන්ගේ පතිවුතාවෙහි අගය පිළිබඳව සඳහන් වන "ළියට අභරණය හොඳ කල්කිරියාව - කුමට ළියගෙ කැත වුණි නම් කිරියාව" වැනි කවි මගින් ද, මුසාවාදයෙන් තොර උත්තම මිනිස් ගුණාංගයන්හි වැදගත්කම සම්බන්ධයෙන් සඳහන් වන "හැට පැන්නත් වඳුරා බිම ගමන් නැත - උත්තමයන්ගෙ බොරුවට දිව නැමෙන් නැත" ආදී කවි ද, අධාර්මික දිවිපෙවෙතක් ගත කිරීමෙන් ඇති වන අයහපත් විපාක සම්බන්ධයෙන් "කරන කලට පවුකම් වේ රසට රසේ - විඳවමු එය ගොනු කර බැඳි කරත්ත සේ" වැනි ජන කවි මගින් ද, අපගාමී සහ අපරාධවල වින්දිතයන් බවට පත්වීම වැළැක්වීම සඳහා වූ උපදේශයන් දැක්වෙන "අන්දර කැලේ දර කැඩුමට යන්ට එපා - පාලු ළිඳේ දිය කෙළියේ යන්ට එපා" ආදී වූ සමාජ පාලනයෙහිලා වැදගත් වන අංශයන් පිළිබඳව ජනකවිය මගින් අවධානය යොමු කර ඇති බව මෙම අධ්‍යයනයෙන් ප්‍රධාන වශයෙන් තහවුරු විය. ඒ අනුව ජනකවිය යනු, හුදෙක් රසවින්දනය සඳහා පමණක් නොව සමාජ ශෝධන කාර්යභාර්යයෙහිලා ද වැදගත් වන සුවිශේෂී කලා මාධ්‍යයක් බව නිගමනය කළ හැකි ය. එනයින් අද්‍යතන සමාජ පාලන කාර්යයෙහිලා ද ජනකවියේ සඳහන් උපදේශයන් ඵලදායී ලෙස උපයුක්ත කර ගත හැකි ය.

***ප්‍රමුඛ පදඃ*** *ජනකවිය, ජනශ්‍රැති, සමාජ පාලනය, සමාජ ශෝධනය, ගැමි ජනයා*

# අතීත ජනකවිය හා වර්තමාන ගීතය මිනිසුන්ගේ මානසික සංවර්ධනය හා පිරිහීමේහිලා බලපාන ආකාරය පිළිබඳ තුලනාත්මක විග්‍රහය

ටී. ආර්. එස්. එස්. දයාරත්න, යූ. ජී. එස්. දිල්ෂානි, කේ. ජී. සී. පී. කුමාර

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

*siyathnisewsandamathi@gmail.com*

කලාව වනාහි මානව ජීවිතයට ඖෂධයක් බඳු වූ සුවිශේෂී ක්ෂේත්‍රයකි. එහිලා ජන කවිය හා ගීත සාහිත්‍යයට කලාව තුළ ඇත්තේ මුදුන් මල් කඩ බඳු වූ ස්ථානයකි. හුදෙක් කායික වශයෙන් හෝ මානසික වශයෙන් රෝගාබාධයට පත් වූ යම් පුද්ගලයෙකු වේද, ඔවුන් සුවපත් කිරීමට තරම් අපිරිමිත කුසලතාවයක්, අදෘෂ්‍යමාන බලවේගයක් කවි හා ගීතය තුළ ගැබ්ව ඇත. ලෝකය තුළ, විශේෂයෙන් ජපානය, තායිලන්තය වැනි ආසියාතික රටවල් තුල මෙන්ම යුරෝපීය රටවල් තුළද රෝගීන් සුවපත් කිරීමට පවා මෙම ගීත නිර්මාණයොදාගෙන ඇත. මින් විශේෂයෙන්ම අවධානය යොමු වන්නේ ලාංකීය ජන ජීවිතය තුළ අතීත ගැමියා තම කාන්සිය මහන්සිය නිවා ගැනීමට මෙන්ම දෛනික අභියෝග ජය ගැනීමේදී ජන කවිය භාවිතා කිරීමත් ඉන් ඔවුන්ගේ මානසික සංවර්ධනය කෙරෙහි කොතෙක් දුරට ජන කවි බලපෑම් කරන්නේද යන්න අධ්‍යනය කිරීම මතය. ජන කවිය වර්තමානය වනවිට තුරන්ව යමින් පවතින සමාජයක වර්තමාන ගීතය තුළින් මානවයාගේ මානසික සංවර්ධනය, චෛතසික ඒකාග්‍රතාවය නිසියාකරයෙන් සිදු වෙන්නේ ද යන්න ගැටළුවක් පැන නගී මෙවන් පසුබිමක් තුළ වර්තමාන ගීතය හා අතීත ජන ජීවිතය මිනිසුන්ගේ මානසික සංවර්ධනය හා පිරිහීම කෙරෙහි අධ්‍යයනය කිරීම අත්‍යවශ්‍යය. ඒ පිළිබඳ මෙම පර්යේෂණය තුළින් මනෝ විද්‍යාත්මක මුහුණුවරකින් අධ්‍යනය කෙරේ. බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ වාද්දුව ප්‍රදේශය හා නැගෙනහිර පළාතේ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ සේරුවිල ප්‍රදේශය ඇසුරු කොට මීට අදාල ප්‍රාථමික දත්ත ප්‍රශ්නවලි 20ක් ඇසුරින් අවධිමත් සම්මුඛ සාකච්ඡා ක්‍රමය භාවිතයෙන් ලබාගත් ප්‍රාථමික මූලාශ්‍ර හා ද්විතික මූලාශ්‍ර ආශ්‍රයෙන් මෙම අධ්‍යනය සිදුකොට ඇත. පර්යේෂණ ගැටලුව ලෙස අතීත ජන කවිය හා වර්තමාන ගීතය මිනිසුන්ගේ මානසික සංවර්ධනය කෙරෙහිද මෙන්ම පිරිහීම කෙරෙහි කොතෙක් දුරට බලපෑම් කරන්නේද යන්න අධ්‍යනය කෙරේ. වර්තමානය තුළ මානවයා මුදල් පසුපස හඹායන තාක්ෂණය ප්‍රමුඛ කොටගත් හුදෙකලා වූ ජීවිතයක් ගත කරන අතර එවන් පරිසරයක ඔවුන්ගේ මානසිකත්වය අසංවර, අතෘප්තිකරයෙන් පවතී. එම නිසාම ඔවුන්ගේ ක්‍රියාකාරීත්වය මුළුමහත් සමාජ සංස්ථාව පමණක් නොව සමස්ථ ලෝකයට වක්‍රාකාරයෙන් බලපායි. නමුත් අතීතය තුල ගැමියා තම දෛනික දිවියේ එන අභියෝගී ඉතා සුවිශේෂී හා සරල ආකාරයෙන් මුහුණදුන් අතර එය ගැමි ජනකවිය තුළින් මනාව විද්‍යාමාන වේ. ඔවුන්ගේ කාන්සිය මහන්සිය සියල්ලක්ම හෙතෙම මෙම සාහිත්‍ය නිර්මාණ තුළින් ඉදිරිපත් කෙරෙන අතර විටෙක අය මානසික සංවර්ධනයට සුවිශේෂ ලෙස උපකාරී වේ. මෙම නිරීක්ෂණ තුළින් ඒ පිළිබඳව මනාව අධ්‍යනය කෙරෙන අතර හුදෙක් වර්තමාන ඇතැම් ගීත නිර්මාණ තුළින් සමාජයට දෙනු ලබන ආදර්ශය තරමක් වැරදි ස්වභාවයක් ගනී. ඇතැම් භාවාත්මක හැසිරීම් කෙරෙහි ඒවා බලපාන ආකාරය ජනකවිය හා වර්තමාන ගීතය අතර පවතින තුළනාත්මක වෙනස ඉන් සමාජයට ලබාදෙන ආදර්ශයේ වෙනස පිළිබඳව මෙම පරීක්ෂණය තුළින් අධ්‍යනය කෙරේ. ඒ මෙන්ම කලාව තුළ කාලීන සමාජයට නිර්මාණය විය යුත්තේ කුමන ආකාරයේ නිර්මාණයන්ද යන්න මෙම පරීක්ෂණයතුලින් අවසාන වශයෙන් විග්‍රහ කෙරේ.

***ප්‍රමුඛ පදඃ*** *ජන කවිය, මානසික සංවර්ධනය, තුලනාත්මක විග්‍රහය*

# Healing Through Music; with reference to *Saraswathi Sangeetha Mandapaya* in Peradeniya Academic Tradition in Sri Lanka

I. Wanniarachchi

University of Peradeniya

*isharawanniarachchi@gmail.com*

Music is an important part of daily life. A certain song can make us feel happy, sad, energetic, or relaxed. Because music can have such an impact on a person's mindset and well-being, it should come as no surprise that music therapy has been studied for use in managing numerous medical conditions. The main objective of this study was to identify the social profile of the *Saraswathi Sangeetha Mandapa* and to study the development of the spiritual life of people with the combination of Music and Religion. The study field of the research was *Saraswathi Sangeetha Mandapa* in University of Peradeniya. Based on purposive sampling, 30 respondents were selected for the study sample. A set of qualitative data collection methods; Case studies and in-depth interviews and observations were utilized for primary data collection and the key sources of secondary data were official documents and representations. As the study reveals, the *Saraswathi Sangeetha Mandapa* was organized as a devote to the Goddesses Sarasawathi, and it was become a stage to perform vocal music, instrumental music, dancing and chanting. Further to that, the study revealed that the ones who participate in this madapa will have the privilege of exposing to valuable discussions on understanding and facing challenges in their day today lives. Specially, obtaining knowledge to give out solutions which are based on Mahayana Buddhism was also another outcome of this combination of Music and Religion whole night. This was helped to a spiritual development within the participants and some of them believed this as a 'Sangeetha Pooja', 'Sangeetha Samadhi' or a 'Healing therapy'. The study revealed that the face to face communication has been able to develop a better inter relationship between the university community; students, academic staff and non- academic staff despite of their class, caste, gender and status. Also, *Saraswathi mandapa* was become a place where not only talented ones get the chance to perform but also the ones with hidden talents will have a chance to do their best in performing by learning, teaching and training. Most of respondents believed that the combination of Uttar Bharat Music, Sri Lankan traditional music and Western music have led the *Saraswathi Sangeetha Mandapa* to shine more. In conclusion we can identified, the *Saraswathi Sangeetha Mandapa* which is organized with the objective of spiritual development within the participants has now resulted in developing self-control and patience, dispute settlement, Flexibility and Love and Affection amongst the people.

***Key Words:*** *Healing Theraphy, Music, Saraswathi Sangeetha Mandapaya, Spiritual development*

# ජන කවියෙන් ප්‍රතීයමාන සඳ

එම්. මනම්පේරි

භාෂා සංස්කෘතික අධ්‍යයනය හා ප්‍රාසංගික කලා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.

*manori.akms @gmail.com*

මානව ජන දිවියෙහි පවතින සත්‍ය ස්වභාවය තථ්‍ය ආකාරයෙන් ම ගෙන සොබාදහම ඇසුරෙන් ගොඩනැඟුණු අව්‍යාජ ප්‍රකාශනයකි ජනකවිය. 'සඳ' නැඟ එන අවස්ථාවේ සිට සඳ බැසයන අවස්ථාව දක්වා වන සියලු වෙනස්වීම් කවි ඇසට ලක් ව ඇත. සරල බස්වහරකින් ද, ගැඹුරු යථාර්ථයෙන් ද යුතුව සඳෙහි ඇති වෙනස්වීම් මනුෂ්‍ය දිවියට සම්බන්ධ කර ගත් අයුරු ජන කවියෙන් හඳුනාගත හැකිය. මනුෂ්‍ය උපතට ද, පැවත්මට උපකාර වූ සඳ, කෘෂි ආර්ථික රටාවකට අනුව දිවි ගෙවන ලාංකේය ගැමි ජනයාගේ කාන්සිය, පාළුව, තනිකම මකාගැනීමට ද උදව් වූ බවට ජන කවිය සාක්ෂි සපයයි. ජන කවියෙන් ප්‍රතීයමාන සඳ කුමන සංස්කෘතික මුහුණුවරකින් යොදාගෙන තිබේ ද; නූතනයේ දී කුමන අන්දමකින් මෙය සමාජගත ගත කළ හැකි ද යනු මෙහි ගැටලුව වේ. සිංහලයන් සතු අපූර්ව සංකේතයක් වන ජන කවියේ සඳ/හඳ ප්‍රතීයමාන ව ඇති අයුරු සොයා බැලීම මෙහි අරමුණයි. ලිඛිත මූලාශ්‍රය උපයෝගී කර ගනිමින්, ජන කවි ඉගෙනුමෙන් හා පසුකලක ඉගැන්වීමෙන් ලද දැනුම මත පදනම් වෙමින් තොරතුරු රැස් කර ගනිමින් ගුණාත්මක පර්යේෂණයක යෙදීමට මෙහි දී අපේක්ෂා කෙරේ. ජනකවියා සඳ විවිධාර්ථ ඇඟවීමට බද්ධ කර ඇති බව පෙනී ගියේය. කමත් කවිවල කමත් භූමිය පමණක් නොව ගවයා පවා සඳ දෙවිඳුට භාර කළ බව පැවසෙන කවි සංකල්පනා සත්ත්ව හිතවාදී ගුණයෙන් යුතු ආකල්පයමය වෙනසක් ඇති කරයි. එමෙන්ම මව්, පිය, ගුරු ගුණ කවිවලට ද සඳ බද්ධ කර ඇත්තේ හැඟීම් දනවන අයුරෙනි. දරුවන් වර්ණනා කෙරෙන කවි ධනාත්මක චින්තනය ගොඩනැඟීමෙහිලා ද, සමස්ත පෞරුෂ වර්ධනයට ද බලපානු ඇත. විවිධ වෘත්තීන් පිළිබඳ පැවසෙන කවිවලින් සඳ පිළිබඳ විවිධ අරුත් මෙන්ම එකල පැවති වෘත්තීන් පිළිබඳ තොරතුරු ද, ගැමි දිවිය පිළිබඳ තොරතුරු ද දැනුමට එක්කර ගත හැකිය. චන්ද්‍රමාස ක්‍රමය දැක්වෙන කවි, තේරවිලි කවි වන සිදුහත් කුමර උපත පිළිබඳ ජන්ම පත්‍රය, බුදුන් වහන්සේ ගේ කේන්ද්‍රය, සංසාර චක්‍රය, සසරින් එතෙර වීම ගැන පැවසෙන 'සඳ' සම්බන්ධ කවි සිසුවාගේ ධාරණ ශක්තිය මෙන්ම පරිකල්පන ශක්තිය වර්ධනය කිරීමට ද බලපානු ඇත. මෙවැනි පරිසර අවස්ථා හා සිසුන් සම්බන්ධ කිරීමෙන් කායික මානසික තෘප්තිය ලබා ගැනීමටත්, වින්දන ශක්තිය ඇති කිරීමටත්, කවි රචනයට මෙන්ම ගැයීමේ කුසලතා වර්ධනය කර ගැනීමටත් හැකි වේ. ඒ අනුව ජන කවියෙන් ප්‍රතීයමාන සඳ පිළිබඳ සංකල්පය නව අධ්‍යාපන චින්තනයන්හි එන සමස්ත පෞරුෂ වර්ධනයට හා පුද්ගල අධ්‍යාත්මය සංවර්ධනය කෙරෙහි ප්‍රබල සංස්කෘතිකාංගයක් වශයෙන් ඉහළ බලපෑමක් සිදු කරන බව හඳුනාගත හැකිය.

***ප්‍රමුඛ පදඃ*** *සඳ/හඳ, ජනකවිය, පරිසරය, සංස්කෘතිකාංග, පුද්ගල අධ්‍යාත්මය*

# FOLK RELIGION

# බංඩාර දෙවියන් හෙවත් රාවණා රජතුමා ප්‍රමුඛ කොටගෙන දෙවියන් හා යකුන් අදහන ලග්ගල ප්‍රදේශයේ ජනතාව පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

ආර්. එම්. අයි. ජී. ඩී. කේ. රත්නායක[1], කේ. ඩී. ජී කරුණාතිලක[2], එච්. ආර්. එස්. ටී. එල් හපුවිට[3]

[1,2]පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, [3]භෞතික විද්‍යා අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය

*deepikaarcc@gmail.com*

ස්වාභාවික විපත්, ලෙඩ රෝග මෙන්ම තම පවුලට, රටට සශ්‍රීකත්වය සෞභාග්‍ය පතා විවිධ ශාන්තිකර්ම, බලිතොවිල් ආදිය සිදුකිරීම මෙරට සමාජ ක්‍රමය තුළ මුල්බැසගෙන ඇත. ප්‍රාග් ඓතිහාසික යුගයේ පටන් අද දක්වාම මානවයා තම අරමුණ සඵල කරගැනීමට හා ලෙඩරෝගවලින් ආරක්ෂා වීමට යක්ෂ, දේව ආදින්ට විවිධ පුදපූජා පවත්වනු ලැබේ. ඒ අනුව යමින් වර්තමානයේ ද මාතලේ දිස්ත්‍රික්කයේ ලග්ගල ප්‍රදේශයේ ද  අපට යක්ෂ, දේව ආදීන්ට කරනු ලබන පුදපූජා දැකගත හැකි වන අතර ලෙඩරෝග ඇති වූ විට ඒවායින් අත්මිදීමට මෙසේ පුදපූජා පවත්වනු ලැබේ. මෙහි අරමුණ වශයෙන් ලග්ගල ප්‍රදේශයේ යකුන් හා දෙවියන් ඇදහීම පිළිබඳ විමර්ශනය කර වර්තමානයේ ඒ පිළිබඳව දක්වන නැඹුරුව අධ්‍යනය කිරීම පෙන්වා දිය හැකිය. මෙම පර්යේෂණයට අදාළව දත්ත රැස් කිරීමේදී සාහිත්‍ය මූලාශ්‍ර හා සම්මුඛ සාකච්ඡා මගින් දත්ත එක්රැස් කර ගන්නා ලදී. මෙම ප්‍රදේශයේ ජනතාව කිසියම් රෝගයක් වැළඳුණු විට එය යක්ෂ දෝෂයක් ලෙස සලකා තම ගමේ සිටින කපුමහතකු හමුවේ. නාඩි බැලීම හෝ බෙල්ලෝ කුට්ටම මගින් ආතුරයාට රෝගකර ඇති යක්ෂයා හෝ දෙවියා තීරණය කරනු ලබයි. මෙය නිමිති බැලීම ලෙස හඳුන්වයි. යක්ෂ දෝෂයක්නම් ඊට ප්‍රතිකාර වශයෙන් නූලක් හෝ පඩුරක් පැළඳවීම, බුලත් යහනක්, බුලත් මඩුවක්, පිදවිල්ලක් හෝ යක්කමක් සිදුකරනු ලබයි. දෙවියන් හා යක්ෂයින් රාශියක් මෙම ප්‍රදේශයේ අදහනු ලබන අතර යක්ෂයින් "උන්නැහැ" වශයෙන් හඳුන්වයි. මෙහි විශේෂත්වය වශයෙන් ලකේගල පිහිටි රණමුරේ හා නාරංගමුව යන ගම් වල රාවණ රජතුමා "බංඩාර දෙවියන්" වශයෙන් ඇදහීම පෙන්වා දිමත් රණමුරේ ගම්මානයේ දේවාලයෙහි රාවණා  වෙනුවෙන් වෙන් කළ ආයුධයකුත් දැකගත හැකිය. ඊට අමතරව කන්දේ දෙයියෝ, අලුත් දෙයියෝ, කුමාර බංඩාර උන්නැහැ, කඩවරබූත උන්නැහැ, මල්වඩම් උන්නැහැ, හැන්දෑබූත උන්නැහැ අදහනු ලබයි. මෙම ප්‍රදේශයේද එක් එක් ගම්මානවලට ප්‍රධාන වූ දෙවියකු හෝ යක්ෂයකු සිටී. රණමුරේ, නාරංගමුව යන ප්‍රදේශයට බංඩාර දෙවියනුත් පොත්තටවෙල, දම්මන්තැන්න, පුවක්පිටිය ප්‍රදේශයට මින්නේරි දෙවියනුත් ප්‍රධාන වේ. මෙම ඇදහීම මිනිසුන්ගේ සිතේ ඇති දැඩි විශ්වාසයන් මත ගොඩනැගෙන අතර මේ ජනතාව කාන්තාවන්ට දරුවන් නැති වූ විට පිහිට පතා දරුවන් ලබාගත් අවස්ථාද දැකගත හැකිය. වර්තමානය වනවිට යකුන් හා දෙවියන් ඇදහීම මෙම ප්‍රදේශයේ සුළු වශයෙන් දක්නට ලැබෙන අතර ඊට හේතුව වශයෙන් වර්තමාන පරම්පරාව ඊට නැඹුරු නොවීම පෙන්වා දිය හැකිය.

***ප්‍රමුඛ පදඃ*** *විශ්වාස, ඇදහිලි, යක්ෂයින්, දෙවියන්, ලග්ගල*

# මාදූව දූපතෙහි ඉපැරණි පත්තිනි දෙවොල ආශ්‍රිත පූජා චාරිත්‍ර විධි පිළිබඳ අධ්‍යයනයක්

කේ. උදාරි අනුපමා

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
*ud.anupama@gmail.com*

අතීතයේ වැලනී, වාලුකා යන නමින් හඳුනාගත්, බලපිටිය ප්‍රදේශයට අයත් මාදු ගඟ වර්තමානය වන විට දූපත් විසි පහකට අධික ප්‍රමාණයකට උරුමකම් කියති. එම දූපත් අතර විශාලතම දූපත වන මාදූව දූපත ජනාවාස වූ දූපතක් වන අතර විහාරස්ථාන ද්විත්වයද ඉපැරණි පත්තිනි දෙවොලද මෙහි සුවිශේෂිත්වය ප්‍රකට කරයි. මාදූව පත්තිනි දේවාලය පිහිටවූ කාලය පිළිබඳ පැහැදිලි තොරතුරු අවම වන අතර මාදූව දූපත් වැසියෙකු වූ තෙන්නයිදේ නම් තැනත්තෙකු විසින් තම ඥාතියෙකුට ඇතිවූ අමනුෂ්‍ය දෝෂයකින් මිදීම උදෙසා මෙම දේවාලය ඉදිකොට පූජා කළ බව ජනප්‍රවාදයේ එයි. මෙම අධ්‍යයනය මාදූව දූපතෙහි පත්තිනි දෙවොල ආශ්‍රිත පූජා චාරිත්‍ර විධි පිළිබඳ අධ්‍යයනය කිරීම, අරමුණු කර ගත්තකි. දත්ත රැස් කිරීම මූලාශ්‍ර අධ්‍යයනය ද ක්ෂේත්‍ර අධ්‍යයනය සම්මුඛ සාකච්ඡා හා සහභාගිත්ව නිරීක්ෂණය හරහා සිදුකරන ලදී. ක්‍රි.ව. 1215 දී දේවපතිරාජ ඇමතිතුමාගේ අනුග්‍රහයෙන් ඇරඹෙන බලපිටිය, වැලිවත්ත පත්තිනි දෙවොල හ ාසබැඳිව, දේවාල දාන පූජා මාලාවක් ඒ ආශ්‍රිත ප්‍රදේශයන්හි පත්තිනි දේවාල ආශ්‍රය කොටගෙන වසරක් පාසා සිදූකිරීම හඳුනාගත හැකිය. මෙම දේවාල පූජා මාලාවට මාදූවෙහි පත්තිනි දේවාල පූජාවද අයත්වේ. මාදූවෙහි පත්තිනි දෙවොල ආශ්‍රිත දේවාල දාන පූජා චාරිත්‍රය දින දෙකක් මුළුල්ලේ පවතී. දේවාල පූජාව ආශ්‍රිත චාරිත්‍ර විධි ආරම්භ වන්නේ දේවාල භූමිය වෙත භික්ෂූන් වහන්සේලා වැඩමවා දානය පූජා කිරීමෙන් පසුව වන අතර සියලු දෙනා චාරිත්‍රයන්ට යොමු වන්නේද බුදුන් වැඳීමෙන් පසුවය. දරුඵල ලබාගැනීම උදෙසා, පවතින දරු ගැබ ආරක්ෂා කර ගැනීම උදෙසා අධ්‍යාපන කටයුතු සාර්ථක කරගැනීමඋදෙසා, ලෙඩරෝග වලින් මිදීම උදෙසා ආදී ලෙසට පත්තිනි දෙවියන්ට බාරහාර වී පඬුරු ගැට ගැසීම සිදුකෙරේ. දේවාල පූජාව ඇරඹෙන්නේ ගම්වැසියන් විසින් භික්ෂූන් වහන්සේලා උදෙසා දානය පූජා කිරීමෙන් පසුවය. මාදුවෙහි පත්තිනි දේවාල පූජා චාරිත්‍රයේ ආරම්භයත් සමඟ සුවිශේෂී චාරිත්‍රවිධි බොහොමයක් ඉටුකිරීම හඳුනාගත හැකිය. මෙම චාරිත්‍ර ඉටුකිරීමට පැමිණෙන්නේ වැලිවත්ත පුරාණ මහා පත්තිනි දේවාලයෙහි පාරම්පරිකව පැවත එන දේවගැති කපු මහත්වරුන්ය. කාලපන්දම් ගහ සිටුවීම මෙහි සුවිශේෂි චාරිත්‍රයකි. කාලපන්දම් ගහ සඳහා යොදාගන්නා පුවක් ගස කපා ගැනීමේ පටන් කාල පන්දම් ගහ සිටුවීම දක්වාම ඒ ආශ්‍රිත සුවිශේෂී චාරිත්‍රවිධි ගණනාවක් හඳුනාගත හැකිය. මෙහිදී කාල පන්දම් ගහ සඳහා තෝරා ගන්නා පුවක් ගස කපා දේවාල භූමිය වෙත රැගෙන එන්නේ බෙර වාදනය කරමිනි. කාල පන්දම් ගස සඳහා යොදා ගන්නා කාල පන්දමට යෙදීම සඳහා අවැසි තෙල් දේවාල භූමියෙහි සිටම සකස් කරගනී. එම තෙල් දේවගැති කපු මහතා විසින් ටිකෙන් ටික කාලපන්දම වෙත වත්කරද්දී දේවාල භූමිය වෙත පැමිණි ජනයා ද ඒ සඳහා හවුල් වේ. මධ්‍යම රාත්‍රියේ දී කාලපන්දම් ගහ ඉතා ගෞරවාන්විතව බෙර වාදනය හා ස්තෝත්‍ර ගායනය අතරතුර සිටවනු ලැබේ. අපල දුරු කර ගැනීම හා බාරහාර වීම උදෙසා ද ජනයා කාලපන්දම් ගහේ පඬුරු ගැට ගසයි. මීට අමතරව කුඩා කාලපන්දම් ගස් සිටුවීම ද ජනයා විසින් සිදු කෙරේ. ඉන් පසුව ගිනි පෑගීමේ චාරිත්‍රය, පොර පොල් ගැසීම, පහන් පැල නිර්මාණය, පන්දම් ගෙන දෙවියන් උදෙසා විශේෂ නර්තන ඉදිරිපත් කරමින් ස්තෝත්‍ර ගායනය, හලං හැළීම හා ආශීර්වාද පැතීම, උදෑසන කිරි දානය පිසීමේ චාරිත්‍රය, රාත්‍රී දානය පිසීමේ චාරිත්‍රය ආදී විශේෂ චාරිත්‍ර ද ඒ අතර අතුරු චාරිත්‍ර විධි ගණනාවක් ද හඳුනාගත හැකිය. මාදූව ගම්වාසී සියලු දෙනාගේ සහභාගීත්වයෙන් ඉටු කෙරෙන්නා වූ මාදූව ඉපැරණි පත්තිනි දෙවොල ආශ්‍රිත දේවාල දාන පූජා චාරිත්‍රය තුළ අතීතයේ සිට පැවත එන සුවිශේෂී චාරිත්‍ර විධි ගණනාවක් හඳුනාගත හැකිය.

***ප්‍රමුඛ පද:*** *මාදූව, දේවාලය, පූජාව*

# මිහින්තලේ කටුසෑය හා බැඳුණු අභිචාර විධි

එම්.කේ. එල්. අයිරාංගනී[1], එම්. ඩී. අයි. කේ. අබේනායක[2], ගාමිණී සමරනායක[3], එන්. ජී. අයි. එම්. වික්‍රමසිංහ[4]

[1,4]මානවශාස්ත්‍ර අධ්‍යයන අංශය, මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, [2]ඉතිහාසය හා පුරාවිද්‍යා අංශය, මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, [3]ශ්‍රී ලංකා පුරාවිද්‍යා කෞතුකාගාරය, මිහින්තලය

*iranganimkl@yahoo.com*

මිහින්තලා පුරාවිද්‍යා පරිශ්‍රයට අයත් පෞරාණික ස්තූපයක් වන 'කටුසෑය' ආශ්‍රය කරගනිමින් ගොඩනැගුණු, බුදු දහමෙන් ඔබ්බට ගිය අභිචාර විධි රාශියක් හඳුනාගත හැකිය. මිනිසාට ස්වෝත්සාහයෙන් ඉටුකරගත නොහැකිවන අපේක්ෂාවන් පූර්ණය කරගනු වස් භාවිත, ආගමක් ලෙස සංවර්ධනය නොවූ අසංවිධානාත්මක ඇදහීම් ක්‍රම අභිචාර වේ. ලෞකිකත්වයෙන් මිදී නිර්වාණය උදාකරගැනීම අරමුණු කරගත් ලාංකේය බුදු දහමේ තිඹිරිගෙය වන මිහින්තලා පරිශ්‍රය තුළ එදිනෙදා ජන සමාජය මුහුණ දෙන අභියෝග මූලික කරගනිමින් බිහි වී ඇති අන්‍ය ඇදහිල්ලක් වර්ධනය වූයේ ඇයි ද යන්න ගැටළුවකි. එබැවින් මෙම අභිචාර සම්ප්‍රදායේ ආරම්භය සහ අර්ථය විග්‍රහ කිරීම මෙම අධ්‍යයනයේ අරමුණයි. මෙහිදී සාහිත්‍ය හා සෙල්ලිපි මූලාශ්‍රය, ක්ෂේත්‍ර ගවේෂණය මෙන්ම කපුමහතුන් (10) හා බැතිමතුන් (30) සමඟ සිදුකළ සවිස්තරාත්මක සම්මුඛ සාකච්ඡා සහ ප්‍රශ්නාවලි භාවිතයෙන් දත්ත එක්රැස් කරගන්නා ලද අතර දත්ත විශ්ලේෂණයේදී ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යොදාගන්නා ලදී. මෙරටට මහායාන සහ හින්දු ආභාසය ලැබීමත් සමඟ දේව වන්දනය ප්‍රචලිත වන අතර මෙම පර්යේෂණයට පාදක වන කටුසෑයේ ගර්භයෙන් ද මහායාන සූත්‍ර ධර්ම අඩංගු තඹ පත්ඉරු හමු වී ඇත. මිහින්තලා භූමියෙහි විහාරාරාම නිර්මාණයට භාවිත ආයුධ තැන්පත් කළ බවට ජන විශ්වාසයේ පවතින කටුසෑය පිළිබඳව සිව්වැනි මිහිඳුගේ මිහින්තලා පුවරුලිපියේ ද සඳහන් වේ. තුන්මහල් පේසාවන්ගේ අවසානය දක්වාම ගලින් කරවා එයින් ඉහළ කොටස ගඩොලින් නිම කළ මෙම ස්තූපය විජයාරාම ස්තූපයට සමාන වේ. වනස්පතීන්ගෙන් වැසී ගිය මිහින්තලා පුදබිමට පැමිණෙන බැතිමත්හු උවදුරුවලින් ආරක්ෂාවීමේ අරමුණින් කටුසෑයට පුද පූජා කිරීම ඇරඹුණු අතර ක්‍රමයෙන් A9 මාර්ගය අවට ජනාවාසකරණය වීමත් සමඟ සංකීර්ණ වූ ජීවන ගැටළු හමුවේ කටුසෑයේ පිහිට පැතීමට නැඹුරු වූහ. නුවරකලාවියේ ඇදහීමට ලක්වන දේව ගණයාගේ නිශ්චිත නියෝජනයක් හෝ දේවාලයක මෙන් නිත්‍ය කපුවන් ද දක්නට නොහැකි එහෙත් ඒ ඒ අවස්ථාවේදී පෙනී සිටින කපුවන් හා බාහිරෙන් එන කපුමහතුන් විසින් සිදුකරන අභිචාර හමුවේ ස්තූපයේ ඇති පෞරාණික බෞද්ධ ආකල්පය ද ගිලිහී ගොසිනි. එලදායී, ආරක්ෂාකාරී සහ විනාශකාරී ප්‍රාර්ථනාවන් පෙරදැරිව මෙහි පැමිණෙන ජනයා බාරහාර වී විවිධ වතාවත් සිදුකරමින් කන්නලව් කරති. ලාංකේය සමාජය බොදුනු සංස්කෘතියකින් පෝෂණය කිරීමෙහිලා නායකත්වය දුන් මිහින්තලා පරිශ්‍රයේ ම අභිචාර සංස්කෘතියකට මංපෙත් සැකසීම නැවත පූර්ව බෞද්ධ යුගයකට සමාජය විතැන්කිරීමක් මෙන්ම නිර්වාණගාමී බෞද්ධ ප්‍රතිපදාව අභියෝගයට ලක්කිරීමක් ලෙසද නිගමනය කළ හැකිය.

**ප්‍රමුඛ පද:** අභිචාර, කටුසෑය, මහායාන, කන්නලව්ව, ඇදහීම

# ගල්ගමුව, නාහෙට්ටිකුලම ග්‍රාමයේ වැදි කඩවර පිදීම හෙවත් පිටිය පිදිල්ල ශාන්ති කර්මය

සී. එම්. අධිපත්තු

පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, සමාජීය විද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය

*chanakamadhumaladhipaththu@gmail.com*

කුරුණෑගල,ගල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මී ඔයෙන් මෙගොඩ කෝරලේ නාහෙට්ටිකුලම පාරම්පරික ගම්වාසි පවුල් කිහිපයක් විසින් පවත්වාගෙන එනු ලබන වැදි කඩවර පිදීම හෙවත් පිටිය පිදිල්ල ශාන්ති කර්මය පිළිබඳව විමර්ශනය හා එම ශාන්තිකර්මය හා බැඳුණු මානව හා සමාජ විද්‍යාත්මක වටිනාකම් වාර්තාගත කිරීම මෙම අධ්‍යයනයේ අරමුණ වේ. සහභාගීත්ව නිරීක්ෂණය, සම්මුඛ සාකච්ඡා හා ලේඛනාගාර අධ්‍යනය දත්ත හඳුනාගැනීමේ හා එක්රැස්කිරීමේ ක්‍රමවේද වශයෙන් උපයුක්ත කරගන්නා ලද අතර සහභාගීත්ව නිරීක්‍ෂණය මඟින් ක්‍ෂේත්‍ර දත්ත සම්පාදනය කරගන්නා ලදී. පිටිය පිදිල්ල හෙවත් වැදි කඩවර දේවතාවුන් වහන්සේ පිදීම පරම්පරා හැට නවයක සිට පැවත එන පුරාණ සිරිතක් බව මෙය පිරිමහන නාහෙට්ටිකුලම ගම්වාසී උරුමක්කාර පවුල් අටක පුද්ගලයන් ද එම රාජකාරිය පිරිමහන ගුරුන්නාසේ විසින් ද සාකච්ඡාවේ දී පවසන ලදී. ගල්ගමුව තදාශ්‍රිත නාහෙට්ටිකුලම, තම්මැන්නාවැටිය, තෝරව හා දෙමැද දිවුල්වැව යන ගම් කිහිපයකට සීමා වන, මෙහි දී කඩවර හත් කට්ටුවට අයත් වැදි කඩවර හා ජයරත්න කඩවර ආහාරයෙන් පිදීම ප්‍රමුඛ කටයුත්තයි. ඈත අතීතයේ පරම්පරාගතව ජීවත් වූ බලවත් නායකයෙකු වූ මිය යාමෙන් පසු වැදි කඩවර ලෙස ඉපිද තම පරම්පරාවට ආරක්ෂාව දෙන බව විශ්වාස කරමින් සෑම වසරකම සිංහල අලුත් අවුරුද්දට පූර්වයේ අඟහරුවදා හෝ ඉරිදා දිනක දී පිටිය පිදිල්ල ශාන්ති කර්මය පිරිමහනු ලැබේ. අලුත් සහල් අස්වැන්නෙන් බුද්ධ පූජාව පවත්වා, ගම්බාර මුත්තන්ට කිරි ඉතිරීමෙන් පසු වසරකට කලින් වහලයේ මුදුන් ලීයේ එල්ලන ලද අක්යාල ගලවා එයට සුවඳ දුම් අල්ලා කන්නලව් කර භාර වූ පොරොන්දුව පිරිමහනු ලැබේ. එහි දී ලාස් පහක පමණ වී පැදුරක අතුරා හැලිවලං, මෝල් ගස, මාළු දැල හා ගිනිබටය (තුවක්කු) ද තබා කන්නලව් කරනු ලැබේ. අනතුරුව එම වී වලින් සකසන දානය පෙර වංගෙඩියක් මත පහනක් දල්වා මෝල් ගසේ පොල්කොළ වලින් බඳින ලද කදක් උපකාරයෙන් අඩුක්කුව ගෙන එනු ලැබීමෙන් පසු නෑදෑ සනුහරේ ඉදිරිපිට දී පිටිය පිදිල්ල පිරිමහනු ලැබේ. යාතිකා වීමෙන් අනතුරුව නෑදෑ සනුහරේ ඇත්තන් අතර ගොටු තටු බෙදා දී පිටිය පිදිල්ල අවසන් කරනු ලැබේ. මෙම පූජාව නියමිත කාලයට ඔප්පු නොදුනහොත් ලෙඩ ඇති කරවනු ඇතැයි පවුලේ සාමාජිකයින් අතරේ තදබල විශ්වාසයක් පවතී. වාග් විද්‍යාත්මක වටිනාකමක් මෙන් ම අභිචාරීමය වැදගත්කමක් සහිත පිටිය පිදිල්ල තුළ අදාළ පවුලේ ලේ උරුමක්කාරයින් විසින් අවුරුද්දකට වතාවක් එක්තැන් වී පිරිමහනු ලැබීම තුළින් එකී පවුලේ අනන්‍ය පාරම්පරික සංස්කෘතිය අඛණ්ඩ බව හා කුල සිරිත් ආරක්‍ෂා වීම දැකගත හැකි වේ. විපතක දී මිය ගිය නෑදෑයින්ගේ ඇල්මබැල්ම හා ආරක්ෂාව ඇති බවට විශ්වාස කරමින් පිහිට අපේක්ෂා කිරීම තුළින් කෘතවේදීත්වය මෙන්ම මනෝ විද්‍යාත්මක ස්වරූපයක් ද දැකගත හැකි වේ.

**ප්‍රමුඛ පදඃ** *ගල්ගමුව, උරුමක්කාරයින්, වැදි කඩවර, පිටිය පිදිල්ල, ජයරත්න කඩවර*

# ශ්‍රී ලාංකේය බෞද්ධාගමික අවමංගල්‍ය චාරිත්‍ර වාරිත්‍ර හා බැඳි "මළ බෙර" වාදනයෙහි සුවිශේෂිතාව පිළිබඳව අධ්‍යයනයක්


ආර්. එම්. පී. එස්. වීරසූරිය

ජාතික තාක්ෂණික ඩිප්ලෝමා ආයතනය, මොරටුව විශ්වවිද්‍යාලය

*prasad.weerasooriya1@gmail.com*



ශ්‍රී ලාංකේය බෞද්ධාගමික අවමංගල්‍යය චාරිත්‍ර වාරිත්‍ර සඳහා මළ බෙර වාදනය අතීත ජන සමාජයේ සිටම භාවිත කර ඇති අතර වර්තමානයේ මේ සඳහා දවුල, තම්මැට්ටම, හොරණෑව යන වාදන භාණ්ඩ භාවිත කරනු ලබයි. මෙහි දී දවුල සුදු රෙදි කඩකින් ආවරණය කිරීම විශේෂත්වයකි. එමගින් හඬ ගොළු කරමින් ශෝකී ධ්වනියක් උත්පාදනය කර ගැනීම අරමුණ වේ. එමෙන්ම ලාංකේය ජන සමාජයේ ප්‍රාදේශීය වශයෙන් මළ බෙර වාදනයේ දී යොදා ගනු ලබන මළ බෙර පද සහ අංග ලක්ෂණ විවිධ වේ. ගාල්ල දිස්ත්‍රික්කයේ බෙන්තර, නියාගම, ඉමදූව, ගාල්ල ආදී ප්‍රදේශ ද අම්පාර උහන, බස්නාහිර පළාතෙහි ද භාවිත මළ බෙර පද එකිනෙකට වෙනස්කම් වලින් යුක්ත වන අතර වාරිත්‍රයන්ගේ විවිධතාවය මත ද මෙම මළ බෙර පද වල අසමානතා දැකිය හැකිය. ශ්‍රී ලාංකේය බෞද්ධ අවමංගල්‍යය චාරිත්‍ර හා බැඳි මළ බෙර වාදනයෙහි ප්‍රාදේශිය සුවිශේෂතාවයක් පවතීද යන ගැටලුව මූලික වෙමින් මෙම පර්යේෂණය සිදු කළ අතර බෞද්ධ අවමංගල්‍යය මළ බෙර වාදනයෙහි දී ප්‍රාදේශිය විශේෂතා පවතිනවා මෙන්ම භාවිතය, පුද්ගලයා හා කාලය අනුව මෙය වෙනස් වේ යන උපන්‍යාසය මත දත්ත රුස් කර ගනිමින් මෙම පර්යේෂණය සිදු කරන ලදී. මෙහි දී බෞද්ධ අවමංගල්‍යය චාරිත්‍ර සඳහා භාවිත කරන මළ බෙර පද අධ්‍යයනය කිරීම, ප්‍රාදේශිය වෙනස්කම් අනුව වාදන අංග අධ්‍යයනය කිරීම ආදිය අන්තර්ගත විය. දත්ත රැස්කිරීමේ පර්යේෂණ ක්‍රමවේද ලෙස ගුණාත්මක දත්ත රැස් කිරීමේ ක්‍රමවේදය හා කතිකා විග්‍රහය නැමැති පර්යේෂණ ක්‍රමවේද භාවිත විය. එහි දී ප්‍රාථමික මූලාශ්‍රය හා ද්විතියික මූලාශ්‍රය යොදා ගනු ලැබීය. ප්‍රාථමික මූලාශ්‍රය මඟින් දත්ත රැස්කිරීමේ දී ක්ෂේත්‍ර අධ්‍යයනය හා බෙන්තර, නියාගම, ඉමදූව, ගාල්ල, අම්පාර උහන, බස්නාහිර පළාතෙහි වාදන ශිල්පීන් හය දෙනෙකු පමණ හමු වී සම්මුඛ සාකච්ඡා සිදු කළ අතර ද්විතියික මූලාශ්‍රය මඟින් දත්ත රැස්කිරීමේ දී ග්‍රන්ථ පුවත්පත්, ලිපි ලේඛන පරිශීලනය සිදුකරන ලදී. මෙම දත්ත විශ්ලේෂණය කරමින් ලාංකේය බෞද්ධ අවමංගල්‍යය චාරිත්‍ර වාරිත්‍ර හා බැඳි මළ බෙර වාදනයෙහි බෙරපද වල, චාරිත්‍ර හා බැඳි බෙර වාදන අක්ෂර, ශිල්ප ක්‍රමයන්හි ප්‍රාදේශීය වශයෙන් සුවිශේෂතාවයක් පවතින බවද, චාරිත්‍ර සිදු කිරීමේදී ප්‍රාදේශිය සාපේක්ෂතාවන් හා ලක්ෂණ අන්තර්ගත වන බවද, වාදනය වන ලයෙහි වෙනසකම් හා අවස්ථාව අනුව විෂමතා පවතින බවද පැහැදිලි විය.



***ප්‍රමුඛ පද :*** *අවමංගල්‍යය චාරිත්‍ර වාරිත්‍ර, දවුල් වාදනය, සන්නිවේදනය, වාදන ශිල්පීන්, සංගීතය*

# මුරගල හා බැඳි ජන ඇදහිලි තුළින් දරු සම්පත් ලබාගැනීම පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් (අභයගිරි ස්තූපය ඇසුරෙන්)

ඩබ්ලිව්. එච්. ඩී. එන් ජයවර්ධන, ඩබ්ලිව්. එම්. කේ. වාසල

සමාජීය විද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය

*djayawardhana06@gmail.com*

තීය බ්‍රාහ්මණයා විසින් සිදුකරන ලද ආක්‍රමණය හේතුවෙන් වළගම්බා රජු පලායන අවස්ථාවේ දී රජුට නිග්‍රහ කළ ගිරි නිඝන්ඨයාට එරෙහි ව, රජු නැවත බලයට පැමිණි පසු එම ගිරි නිඝන්ඨයා පන්නා දමා එම ස්ථානයේ අභයගිරි ස්තූපය ඉදිකළ බව ජනප්‍රවාදයේ පවතී. ස්තූපයට අයත් ප්‍රධාන අංගයක් ලෙස මුරගලට හිමිවන්නේ ඉතා වැදගත් ස්ථානයකි. එකල ජනයා තුළ සංඛ පද්ම රූප කෙරෙහි පැවති විශ්වාසයන් අභයගිරි ස්තූපයේ පියගැට පෙළ නිර්මාණය කිරීමේ දී ද යොදා ගෙන තිබේ. මුරගලේ දක්නට ලැබෙන මෙම සංඛ පද්ම කැටයම් කෙරෙහි එදා ජනයා තුළ පැවති විශ්වාසය නූතනයේ දී ද පවතින බව පෙන්වා දීම මෙහි අරමුණ වී තිබේ. අභයගිරි දකුණු දොරටුවේ පියගැටපෙළ හා බැඳී ඇති සංඛ පද්ම මුරගල් කෙරෙහි ජනයා තුළ පවතින විශ්වාසය කුමක්ද යන ගැටලුව මෙහිදී අධ්‍යයනය කිරීමට බලාපොරොත්තු වේ. මෙහිදී අභයගිරි පුරාවිද්‍යා භූමිය නිරීක්ෂණය තුළින් හා අභයගිරි පුරාවිද්‍යා පුහුණු නිලධාරිනීන් සිව්දෙනකුගෙන් හා සාමානය වැසියන් පස්දෙනකු සමඟ සිදුකල සම්මුඛ සාකච්ජා මගින් තොරතුරු රැස්කර ගෙන තිබේ. අතීත ගෘහ නිර්මාන ශිල්පියා විසින් නිර්මාණය කරන ලද පියගැටපෙලේ ගමන් ගන්නා ඕනෑම අයෙකුට අත්වැටක් ලෙස ඉදිකළ කොරවග්ගල ඉදිරියට තල්ලුවී ඒම වැළැක්වීම සඳහා මුරගල භාවිතා කර තිබේ. මුල් අවස්ථාවේ පටන් විවිධ අවස්ථාවලදී සංවර්ධනය වූ මුරගල සඳහා යොදාගන්නා සංඛ පද්ම රූප කෙරේ ජනයා තුළ පැවති බිය හා විවිධ විශ්වාසයන් හේතුවෙන් මුරගල පිදීමට ජනයා පුරුදු විය. අතීතයේ වෙහෙර විහාර සතු දේපල ආරක්ෂාකර ගැනීමට නිර්මාණය කරන ලද්දක් ලෙස ද සංඛ පද්ම රූප සහිත මුරගල් යෙදීම හඳුනාගත හැකි ය. අභයගිරි ස්තූපය වටා පිහිටි මුරගල් මෙයට කදිම නිදසුනකි. බොහෝ දෙනකුගේ අවධානයට ලක්නොවූ මුරගල් ලෙස අභයගිරියේ දකුණු දොරටුවේ දක්නට ලැබෙන මුරගලහි විශේෂත්වයක් දක්නට ලැබේ. මෙම මුරගල්හි නූතනයේ දී හුනු ආලේප කර ඇති ආකාරයක් දක්නට ලැබේ. ගැමි ජන විශ්වාසයක් මෙයට ප්‍රධාන හේතුව වී තිබේ. දරුසම්පත් නොලද ස්ත්‍රී-පුරුෂ දෙපක්ෂය විසින් මැදියම් රැයේ නිරුවතින් පැමිණ මෙහි ඇති සංඛපද්ම මුරගල්හි හුණු ආලේප කරනු ඇත. ඔවුන්ට එතුළින් දරුසම්පත් ලබාගත හැකි බව ගැමිජන විශ්වාසයයි. මෙයට සමගාමීව ස්තූප සලපතල මළුවෙහි ගර්භනී රූප, කළල රූප හා කෙළිලොල් දරුවන්ගේ රූප දක්නට ලැබේ. මෙම සංකේත පයගැටීමෙන් දරුසම්පත් ලැබෙන බව පැරණි ගැමියන්ගේ විශ්වාසයයි. මුරගල හා බැඳි විවිධ විශ්වාසයන් අතර අභයගිරි ස්තූපයට ප්‍රවේශවන දකුණු දොරටුවේ දක්නට ලැබෙන මුරගල් සඳහා ගැමිජන විශ්වාසයක් නූතනයේදී ද හිමිවන බව නිගමනය කළ හැකි ය.

***ප්‍රමුඛ පද:*** *අභයගිරිය, මුරගල, කොරවග්ගල, ස්තූපය, සංඛ පද්ම*

# කුඹල්මුල්ල පත්තිනි දේවාලය පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක්

ඞී. ටී. සිරිවර්ධන

පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය

*tharo.dilini@gmail.com*

සබරගමු පළාත තුළ සිදුවන පත්තිනි දේව ඇදහිල්ල ප්‍රමුඛ වන්නේ සබරගමුවට ම ආවේණික පහන්මඩු යාගය නිසාවෙනි. කහවත්ත බුංගිරිය, රත්නපුර මඟුරාගොඩ, කලවාන අරුක්ගොඩ හා බලංගොඩ කුඹල්මුල්ල සබරගමුවේ පත්තිනී දේවාල හී ප්‍රමුඛ වේ. මෙම අධ්‍යයනයේ අධ්‍යයන ක්ෂේත්‍රය වන්නේ සබරගමු පළාත්, රත්නපුර දිස්ත්‍රික්, බලංගොඩ කොට්ඨාශ, ඉඹුල්පේ ප්‍රාදේශිය සභාවට අයත් කුඹල්මුල්ල පත්තිනී දේවාලයයි. මෙම දේවාලය පිළිබඳ නිශ්චිත ලිඛිත මුලාශ්‍ර 1870 දේවාල කොමසාරිස් ලියැවිල්ලේ සඳහන් වුවද ඊට පෙර සිට දිර්ඝ ඉතිහාසයක් මෙම දේවාලය සතුය. මෙම අධ්‍යයනය සඳහා කතෘ අරමුණු සහගත නියැදි ක්‍රමය භාවිතා කර පරමාර්ථගත නියැදියක් තෝරා ආනාකෘතිත ගැඹුරු සම්මුඛ සාකච්ඡා තුළින් ලබාගත් නිරීක්ෂණ සහිත ප්‍රාථමික හා ලිඛිත මුලාශ්‍ර සහිත ද්විතීක දත්ත තුළින් ලබාගත් ගුණාත්මක දත්ත මත පදනම්ව පශ්චාත් යථානුභූතවාදී ප්‍රවේශයක් තුළින් දත්ත විශ්ලේෂණයට යොමුවේ. අධ්‍යයනයේ මූලික අරමුණ නම්, මුළුගැන්වී තිබූ නමුත් සබරගමු සම්ප්‍රධාය තුළ පත්තිනී දේව ඇඳහිල්ල ඉදිරියට ගෙනයන කුඹල්මුල්ල පත්තිනී දේවාල කාර්යයභාර, පුජාවිධි, පහන්මඩු යාගය, අභිචාර සහ බැතිමතුන්ගේ විශ්වාස අරමුණු ඔස්සේ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක් ගොඩ නැගීමයි. දේවාලයේ ආරම්භය සැළකිමේදි දේවාලය සතු පත්තිනී දේව සළඹ ලෙස සළකන පුජනීය වස්තුව ගජබා රාජ සමයේ සොළි රටින් වැඩම කරන ලද බව විශ්වාස කරන අතර එය එම ගමේහිම "අරාහේන" නම් ප්‍රදේශයේ තුඹසක තිබී හමුවී ඇත. අද ද මේම දේවාලයේහි සළඹ හා අනෙකුත් දේව භාණ්ඩ සුදු නාගයෙකු විසින් ආරක්ෂා කරන බවටත් පුජා සමයේ දි නාගයා එම කුටියෙන් නික්මෙන බවටත් ගැමියන් හා කපු මහතා ප්‍රකාශ කරන ලදි. අතීතයේ සිට දේවතෝත්‍ර පවත්වන ප්‍රධාන කපු පත්තිනීවරු ගොවී කුලය විම අනිවාර්යය වුවකි. අනෙකුත් දේවාල හී දවුල් වාදනය සඳහා වෙනත් හීන කූල ගෙන් වුවද මෙහි ඒ සඳහා ද ගොවී කූල පුද්ගලයින් සහාභාගී වේ. දේවාලයේහි කූල අනුව වර්ගීගත කාර්යය පවති. පහන්මඩු සඳහා අවශ්‍ය වලං, කේතල, අඟුරුකබල් සැපයීම බඩහැල, පිරුවට ලබාදිම රදා, සළඹ වාත්තු කිරිම හේමල්, අඹ වැනුම අඹ හා හොරණෑ පිඹීම හා පහන් ඇල්ලීමට හීනකූල පුද්ගලයන් යොදාගනියි. තම කාර්යය දේව කාර්යයක් සේ සළකා ක්‍රියා කරනු විනා කාල්මාක්ස්ගේ ආගමික අර්ථකථනය අනුව සමාජ අසමානතාවයක් සිදුවන බව ඔවුන්ට අවබෝධයක් නොමැත. මෙම දේවාලයට නින්දගම් ලැබී ඇත්තේ මහවලතැන්න අධිකාරම් දිසා හාමුදුරුවන්ගෙනි. දේවාලය උඩමන්දිරය, පහළ මන්දිරය හා බණ්ඩාර ගේ ලෙස කොටස් තුනකි. උඩමන්දිරය කාන්තාවන්ට අකැප වන අතර සියළු දේවාල කටයුතු පුරුෂයන් පමණක් සිදු කරයි. ප්‍රධාන මංගල්‍යය ලෙස වාර්ෂිකව පහන්මඩු යාගය පැවැත්වේ. එහි එම දේවාලයටම ආවේණික පුජාවිධි, සැරසිලි පවතින අතර විශේෂයෙන් පහන්මඩු යාගය තුළ ප්‍රාදේශීය දෙවිවරු වු මංගර දෙවියන් හා ගරායකුට පුදපඬුරු කැප කරමින් පහන්මඩු යාගය හරහා " පන්තිස්කොල්මුරය" නිරූපනය කරයි. මේ තුළදී " දෝලිහත්පාදය" නැටීම, පත්තිනී තොරණේහි ගෙප් හතක් සකස් කිරිම, මුරුගු පාලිය නැටීම හා චාමර නැටීම (පාලි 9 ක් පවති) මෙම කුඹල්මුල්ල පත්තිනී දේවාල පහන්මඩු යාගයට පමණක් ආවේණීක විම විශේෂ ලක්ෂණයකි. මෙම සමස්ත කාරණා විශ්ලේෂණය තුළ නිගමනය කළ හැකිවන්නේ පත්තිනී දේව ඇඳහිල්ල ඉතා ගැඹුරින් ගැමියන් තුළ මුල්බැස ඇති බවයි. පුජා රටා සඳහා බුදු දහමේ මිශ්‍ර විම් දැකගත හැකි අතර කාලයා ඇවෑමෙන් යම් සංස්කෘතික රටා ගිලිහී ගොස් නව ආගමික චර්යා එකතු වී ඇත. ගිනි පෑගීම එවැනි නවාංගයකි. මෙසේ පත්තිනී දේව ඇඳහිල්ලේ අනන්‍යතාවය සුරක්ෂිත වු සංදිස්ථානයක් ලෙස කුඹල්මුල්ල පත්තිනී දේවාලය හැඳින්විය හැකිය.

***ප්‍රමුඛ පදඃ*** *කුඹල්මුල්ල පත්තිනී දේවාලය, පහන්මඩු යාගය, පන්තිස්කොල්මුරය, දෝලිහත්පාදය*

# පහතරට ශාන්තිකර්මවල අභිචාරමය ප්‍රවණතා පිළිබඳ සමාජ විද්‍යාත්මක විමසුමක් (රටයකුම හා සන්නියකුම ඇසුරෙන්)

එච්. එස්. එන්. සිල්වා

සමාජවිද්‍යා අධ්‍යයනාංශය කැලණිය විශ්වවිද්‍යාලය

*sachinisilva3@gmail.com*

ශාන්තිකර්ම වූ කලී මිනිසුන්ට ඇතිවන්නා වූ අපල උපද්‍රව හා විවිධ දෝෂ සඳහා පවත්වනු ලබන සෙත් ශාන්ති විශේෂයකි. ශාන්තිකර්ම යනු කිසියම් පුද්ගලයෙකුට මානසික හෝ කායික සුබ සිද්ධිය අරමුණු කොට දෙවියන් යක්ෂයන් හෝ වෙනත් එවන් දෘශ්‍යමාන හෝ අදෘශ්‍යමාන පුද්ගලයෙක් බලවේග උදෙසා පවත්වන කිසියම් කාර්ය සංසිද්ධියකි. පහතරට නර්තන සම්ප්‍රදායේ රටයකුම හා සන්නියකුම ශාන්තිකර්ම ගර්භ සංරක්ෂණය හා දරු ප්‍රසුතිය පහසු කිරිමටත්, දහඅටක් වන සන්නිරෝග සුව කිරිමටත් යොදා ගෙන ඇත. මෙම පර්යේෂණයේ පර්යේෂණ ගැටළුව වන්නේ පහතරට ශාන්තිකර්මවල ඇති අභිචාරමය ප්‍රවණතා කෙබඳුද? යන්නයි. පර්යේෂණයේ අරමුණු වන්නේ එම ශාන්තිකර්මයන්හි අන්තර්ගත භෞතික ලක්ෂණ තුළින් හෙළිවන අභිචාරමය ක්‍රියාවලිය හදුනාගැනීම, ලෞකික දිවියේ ඇතිවන ගැටලුවලට එම ශාන්තිකර්ම හා අභිචාරමය ක්‍රියාවලියෙන් කෙරෙන බලපෑම හඳුනාගැනීමයි. පර්යේෂණයේ ක්‍රමවේදය ලෙස සිද්ධි අධ්‍යන ක්‍රමය හා සමීක්ෂණ ක්‍රමය යොදාගන්නා ලදී. මීට අමතරව දත්ත රැස් කිරීමේ දී භාවිත කරන ලද සම්මුඛ සාකච්ඡා අවධිමත් සම්මුඛ සාකච්ඡා විය. මෙම පර්යේෂණයේ අරමුණුගත නියැඳිය සඳහා නිස්සම්භාවී නියැදියක් යොදා ගෙන ඇත. මෙහිදී දත්ත රැස් කිරීම සඳහා ශාන්තිකර්ම ගුරුන්නාන්සේවරු පස්දෙනෙකු  ශාන්තිකර්ම පවත්වා ගත් ගැමි ආතුරයන් පස් දෙනෙකු හා මේ පිළිබඳ අදහස් ග්‍රාමීය සාමාන්‍ය වැසියන් දස දෙනෙකගෙන්ද ලබා ගන්නා ලදී. එසේම ප්‍රශ්නාවලියක් යොමු කරමින් නාගරික වැසියන් දස දෙනෙකුගෙන්ද ප්‍රමාණාත්මක දත්ත හා ගුණාත්මක දත්ත ලබා ගනිමින් දත්ත විශ්ලේෂණයේදී සම්මිශ්‍රණ දත්ත විශ්ලේෂණ ක්‍රමය මඟින් නිගමන කරා එළඹීමට හැකි විය. අනාවරණය කරගත් ආකාරයට සාමාන්‍ය ජීවිත ගත කරන මිනිසුන් මෙන්ම කාර්ය බහුල ජීවිත ගත කරන පිරිස් අතර, මානසික හා කායික රෝග නිවාරණය උදෙසා සිදුකරන ශාන්තිකර්ම වර්තමානයේ කාලය හා මුදල මුල් කර ගනිමින් පවත්වන බව දැක ගත හැකි බවයි. කාලානුරූපීව ශාන්තිකර්මයේ පුද පූජා රටාවන්ගේ හා එහි විවිධ අංගයන්ගේ යම් වෙනස්කම්ද සොයා ගැනීම් වලින් අනාවරණය විය. ලෞකික ජීවිතයේ අත්‍යවශ්‍ය සංධිස්ථාන වලදී පෞද්ගලිකව හෝ අභිචාරමය වශයෙන් එම ශාන්තිකර්ම ද්විත්වය මානසික හා කායික සහනය උදෙසා පවත්වා ගැනීමේ නව ප්‍රවණතාවක් දැකගත හැකි වේ.  ඒ අනුව නූතන සමාජයේ අභිචාරාත්මක ප්‍රවණතා තුළ නිශේධනීය බලපෑම්වලට වඩා සාධනීය බලපෑම් වර්ධනය වී තිබේ.

***ප්‍රමුඛ පදඃ** ශාන්තිකර්ම, මනෝචිකිත්සක, යාතුකර්ම, යකැදුරා, අභිචාර*

# Articulating Beingness: "Orality" as Integral to the Buddhist Heritage

Amrita Singh

S. P. M College, Delhi University, New Delhi, India

*amritachauhan1981@gmail.com*

The mainstream of interpretation practices on heritage has focused on built, natural or art remains or simply visual/tangible heritage. Hence it is essential to break the mould and widen the gaze to portray greater human expressions and cultural continuity. The concern for intangible heritage may have existed if not absent but has gained ground in the recent past particularly after its formal recognition by the UNESCO. The importance of intangible cultural heritage lies not just in the cultural manifestation but rather in the wealth of knowledge and skills that is transmitted through it from generation to generation by communities. This paper attempts to bring 'orality' and its many dimensions into focus for historical investigation enabling the study of early cultures and religious traditions. Also, at the same time making a noticeable place for it in the growing spectrum of Heritage studies. The paper explores theoretical perspectives on orality in general and Buddhism in particular to make a case for it being an essential part in the Intangible Cultural Heritage of Buddhism. Just as ever altering technological know-how affects the lives of people world over today, possibly technology must have significantly altered the lives of people or community at large in early societies. Much before the media theory had gained ground scholars especially those engaged with the aspect of 'orality' have argued for the effects of various media in a variety of ways on societies in the making. Though social transformation as a product of change in technology and modes of communication can be seen as making a case for materialistic determinism. That is not the focus here, here it's just one of the ways of looking at a Buddhist past and Heritage as it lives on, in communities even today. To sum up it would be worthwhile to state that oral Buddhist discourses form a part of living cultures and Intangible Cultural Heritage. A model needs to be created for a sustainable relationship between representing the tradition and safeguarding it as Intangible cultural. It is also time we bridge up the theoretical underpinnings with praxis. 'Orality' as a living form of the Buddhist tradition proves its feasibility and effectiveness on the lines of ICH and needs vital attention in the larger purview of Heritage.

***Key words:*** *orality, heritage, medium of Communication, Buddhism, interfaces*

# කැළණි ගං මිටියාවතෙහි පවතින රංවල දේව සංකල්පය

ටී. වයි. ඩී. වික්‍රමනායක, එස්. සමරසේකර

මානව විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

*thamaliwickramanayake@gmail.com*

සෑම මිනිස් වර්ගයකට ම ආවේණික අතිපෞරාණික උරුමයක් ලෙස ජනශ්‍රැතිය හැඳින්විය හැකිය. ජනශ්‍රැතියෙහි අන්තර්ගත ප්‍රධාන අංගයක් වන ජන ආගම අදාළ සංස්කෘතියෙහි ඉපිද පරම්පරාවෙන් පරම්පරාවට ජනවහරේ පැමිණි ඇදහිලි විශ්වාස සමුදායකි. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන විවිධ ජන ඇදහිලි විශ්වාස බුදුදහම පදනම් කරගෙන ගොඩනැගෙයි. වර්තමානය වනවිට ජනප්‍රිය බුදුදහම යන සංකල්පයෙහි එන චූල සම්ප්‍රදාය යටතේ නියෝජනය වන 'ප්‍රාදේශීය දේව වන්දනා' පොදු ජනතාවගේ සංස්කෘතික ලක්ෂණයක් ලෙස හැඳින්විය හැකිය. මෙසේ සිංහල බෞද්ධ ජනතාව අතර ප්‍රාදේශීයව පවතින දේව සංකල්පයකි, 'රංවල දේව සංකල්පය'. මෙම රංවල දේව සංකල්පය කැළණි ගංගාව ආශ්‍රිතව ප්‍රභවය වීම හා බැඳි ජනශ්‍රැතීන් මෙන්ම ජන ජීවිතයට එමගින් සලසා දෙන භාවාත්මක ආධාරකය පිළිබඳ අධ්‍යයනය කිරීම අධ්‍යයනයේ අරමුණ වන්නේය. ශ්‍රී ලංකාවේ කොළඹ දිස්ත්‍රික්කයේ පහළ කැළණි ගං මිටියාවතෙහි පිහිටි හංවැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇසුරින් මෙම අධ්‍යයනය සිදු කරන ලදී. මෙම ප්‍රදේශයේ ජීවත් වන ජනතාවගෙන් 30 දෙනෙකුගේ ප්‍රමාණයක් අහඹු නියදිය යටතේ තෝරාගෙන දත්ත ලබා ගත් අතර ඒ සඳහා ක්ෂේත්‍ර නිරීක්ෂණ සහ සම්මුඛ සාකච්ඡා යන ක්‍රමවේද භාවිත කෙරිණි. අද්‍යතනය වනවිට රංවල සිට කැළණිය දක්වා කැළණි ගං මිටියාවතේ සියනෑ හේවාගම් දෙකොරළයේම රංවල දෙවියන්ගේ තෙදබල ව්‍යාප්තව පවතී යැයි විශ්වාසය මත මෙම ප්‍රදේශයන්හි ජීවත්වන ජනතාව රංවල දෙවියන් ඇදහීම සිදුකරයි. ප්‍රාදේශීය සෙසු දෙවිවරුන් අභිබවා ප්‍රසිද්ධියට පත්ව ඇති රංවල දේව සංකල්පය බෞද්ධාගමික පසුබිමක පෝෂණය වී ඇති බව මෙහි ප්‍රභවය පිළිබඳ අධ්‍යයනයේදී පැහැදිලි වේ. ජනප්‍රවාදන් අනුව තුණුරුවන් කෙරෙහි අචල වූ ශ්‍රද්ධාවෙන් ජීවත් වූ එක් ගැමියෙක් පොහෝ දිනවල සිල් සමාදන් වීම සඳහා කැළණි රජමහා විහාරයට ඔරුවකින් ගමන් කළේය. එසේ යනඑන විට මග දෙපස ආලෝකවත්වීම සඳහා පුහුල් පහන් ගඟට නැමුණු ගස් අතුවල එල්ලූ බව කියවෙයි. ඔහුගේ මරණින් අනතුරුව දේවත්වය ලද බවත් කැළණි ගං මිටියාවතේ පදිංචි වූවන්ට ආරක්ෂා රැකවරණය සලසන බවත් ගැමියෝ විශ්වාස කරති. මේ හේතුව නිසා අදටත් රංවල දෙවියන් උදෙසා පුහුල් පහන් දැල්වීමට මෙහි ජීවත්වන ජනතාව පුරුදු වී සිටිති. ඒ අනුව කැළණි ගඟේ ඔරු-පාරු දියත් කිරීම, වැලි තොටුපළ ඇරඹීම, අපල උපද්‍රව දුරු කර ගැනීම, නව නිවසක් තැනීම, රැකියා ලබා ගැනීම ආදී සෑම කටයුත්තකදීම බැතිමතුන් රංවල දේව පිහිට පතති. මෙකී අධ්‍යයනයන් හරහා රංවල දේව වන්දනය කැළණි ගඟ ආශ්‍රිත වූ ජීවන වෘත්තාන්තය සමඟ මෙන්ම සමස්ත ජීවන රටාව සමඟම බැඳී පවත්නා සංකල්පයක් වශයෙන් දැක්විය හැකිය. ඒ අනුව රංවල දේව සංකල්පයේ ස්වාභාවය සහ එය ජන ජීවිතය සමඟ භාවාත්මකව බද්ධ වී ඇති අයුරු පිළිබඳ මානව විද්‍යාත්මක විග්‍රහයක් මෙතුළින් විග්‍රහාත්මකව ඉදිරිපත් වනු ඇත.

***ප්‍රමුඛ පද:*** *රංවල දෙවියන්, දේව සංකල්පය, දේව ඇදහිලි, ප්‍රාදේශීය දේව ඇදහිලි*

# බෙන්තර ගලපාන රජමහා විහාරයේ මහා කාශ්‍යප දළද පූජාවේ චාරිත්‍ර විධි

ඩබ්. ඩබ්. එස්. දමයන්ති

කොළඹ විශ්වවිද්‍යාලය

*wdskumara862@gmail.com*

මහරහතන් වහන්සේ නමකගේ ඇති, ලොව එකම දළදව වන්නේ මහා කාශ්‍යප මහරහත් වහන්සේගේ දළදව පමණකි. මහා කාශ්‍යප මහරහත් වහන්සේ ජීවමානව වැඩ සිටින කාලයේ ශ්‍රී මුඛ්‍යයෙන් ගිලිහුණු දත්ත ධාතුව බෙන්තර ගලපාත රජමහා විහාරයේ කුඩා ස්ථූප ගර්භය තුළ තැන්පත් කොට ඇති බව පුරා විද්‍යාත්මක සාධක වලින් හෙළි වී ඇත.ඒ වෙනුවෙන් දළද පූජාවක් ද අතීතයේ සිට පැවතගෙන එන අතර එම පූජාව දෙවැනි වන්නේ මහනුවර දළද පූජාවට පමණී. නමුත් සම්විෂමතා මෙන්ම ආවේණික ලක්ෂණ ද පවතී. ඉහත කරුණු පාදක කොටගෙන මෙම පර්යේෂණය සිදු කිරීම අරමුණ විය. ඒ සඳහා බෙන්තර ගලපාත රජමහා විහාරය සහ එම විහාරස්ථානයට සමීපයේ පිහිටා ඇති සතර රජමහා විහාරස්ථාන ඇසුරු කර ගනිමින් මෙම පර්යේෂණ කර්තව්‍යය සිදු කළෙමි. පර්යේෂණය සඳහා ප්‍රාථමික මූලාශ්‍ර වලට වැඩි ඉඩකඩක් ලබා දෙමින්, බෙන්තර ගලපාත රජමහා විහාරස්ථානවාසී ස්වාමීන් වහන්සේලා, අතීතයේ සිටම පරම්පරාගතව දළද පූජාවට දයක වූ වැඩිහිටියන් තුන්දෙනෙකු හා තරුණයන් දෙදෙනෙකුද සමඟ සම්මුඛ සාකච්ඡාවක යෙදෙමින්, බෙන්තර ගලපාත විහාරයේ ඉතිහාසය පිළිබඳ ලියැවුණු පත පොත මෙන්ම පුවත්පත් ලිපි ආදී ද්විතීයික මුලාශ්‍ර ඇසුරින් බොහෝ ගුණාත්මක තොරතුරු රාශියක් පර්යේෂණය සඳහා යොද ගත්තෙමි. මෙම කාශ්‍යප දළදා පුජාව වෙනුවෙන් සිදු කරනු ලබන දෛනික පිළිවෙත් සියල්ලම චරිත්‍රානුකුලව සිදු කරනු ලැබේ. කාශ්‍යප දළදා වහන්සේ වෙනුවෙන් දින පතාම ආහාරමය පුජාව සිදු වන අතර මේ සඳහා ගම්වාසීන්ගේ දායකත්වය පෙරදැරි කරගෙන සිදු කරනු ලබයි. මෙම ආහාරය පිසීම සඳහා මස් මාංශයෙන් තොරව එළවලු වර්ග තිස් දෙකක් යොදාගනු ලබන අතර නියමිත වූ එළවලු වර්ගද එහි නොමැත.මෙම අහාරය පිසීම සඳහා ගලපාත රජමහ විහාරයේම මුළුතැන් ගෙයි සිදු කරනු ලැබේ. ඒ සඳහා භාවිතා කරනු ලබන ජලය කිසි ලෙසකින්වත් තවත් ප්‍රයෝජනයක් සඳහා යොදා නොගැනීම සිදු කරනු ලැබේ.එපමණක් නොව එම ජලයද එළිමහනට විසි කිරීමද සිදු නොකරනු ඇත. කාශ්‍යප දළදා වහන්සේ වෙනුවෙන් සුදානම් වන අහාර පුජාව රන් පැහැති භාජන තිස් දෙකක පිළියෙළ කොට හේවිසි බෙර මධ්‍යයේ කාශ්‍යප දළදා වහන්සේට පුජා කරනු ලැබේ.මෙය විහාරස්ථානයේ නායක ස්වාමින් වන්සේගේ දැතින්ම සිදු කරනු ඇත. මෙලෙස දින පතාම මහා කාශ්‍යප මහරතන් වහන්සේ වෙනුවෙන් විවිධ පුජාවන් සිදු කරන අතරම සෑම වර්ෂයකම කාශ්‍යප දළදා පුජා පෙරහැර මංගල්‍යය පවත්වනු ලැබේ.මෙය ඉතාම උත්කර්ෂවත් අන්දමින් සිදු කරනු ඇත.මේ සඳහා සුබ දවසක් මෙන්ම දළදා කරඬුව පිටතට වැඩම කරලීම සඳහා සුබ මුහුර්තයක්ද සුදානම් කර ගනු ලැබේ.ඉන් අනතුරුව පෙරහැර කමිටවු සඳහා අදාල වගකීම් නායක ස්වාමින් වහන්සේ විසින් ලබා දෙනු ලැබේ. මෙම පෙරහැර පැවැත්වීමට ප්‍රථමව දින සතක් පිරිත් සජ්ඣායනා කරනු ලැබේ. කාශ්‍යප දළදා පෙරහැර පැවැත්වීමට පෙර දින සතරක් පරිවාර පෙරහැර සතරක්ද බෙන්තොට ග්‍රමය පුර විදී සංචාරය කරන අතර සතර වන දින තුන් වන දින සිට කාශ්‍යප පෙරහැර පැවැත්වෙන දින දක්වාම කාශ්‍යප දළදා වහන්සේ තනි කරනු ලැබේ. කාශ්‍යප පෙරහැර පවත්වන දින පිරිත් සජ්ඣායනා මධ්‍යයේ සුබ මුහුර්තයට දළදා කරඬුව පිටතට ගෙන ජනයාට ප්‍රදර්ශය පිණිස එළිමහනේ ඒ සඳහා සුදානම් කරවන ලද කුටියක වඩම්මව අනතුරුව පෙරහැරේ දළදාව වඩම්මන ඇතුගේ පිට මතට වැඩම කරවනු ඇත.මෙලෙස එදින කාශ්‍යප දළදා පෙරහැර විදී බැස අනතුරුව නැවත ගලපාත රජමහ විහාරයට වඩම්මන අතර වතාවත් සිදු කොට නියමිත තැන නැවත දළදා කරඬුව තැන්පත් කරනු ලැබේ.මෙය තුළ දක්නට ඇති අවේණික ලක්ෂණ බොහොමයක් අන්තර්ගත වන අතර මෙම පුජා විධි තුළ දෙවැනි තැන හිමි වන්නේ මහනුවර බුදුරජාණන් වහන්සේගේ දළදා වහන්සේ වෙනුවෙන් පවත්වන ලද දළදා පුජාවට පමණක් බව කිව යුතුමය.අතීතයේ රජු දවස මිට වඩා වෙනස්ම ආකාරයේ චාරිත්‍ර විධි පැවතී අතර වර්තමානයේ එම චාරිත්‍ර ගිලිහි ඇති බව සඳහා කල යුතුය. මෙම පර්යේෂණය හරහා එම අතීත චාරිත්‍ර විධි ප්‍රචලිත කිරීමත්, රට තුළ මෙහි ඓතිහාසික වැදගත් භාවය ප්‍රචලිත කිරීමත් තුළින් වැළළී යන මෙම ග්‍රාමයේ දළද පූජා චාරිත්‍ර විධීන්ට නැවත පුනර්ජීවයක් ලබා දීමට හැකි වේයැ'යි නිගමනය වේ.

***ප්‍රමුඛ පදඃ*** *පෙරහැර, කරඬුව, ආවේණික, පහන්,පිරිත*

# ශ්‍රී ලාංකේය ගැමි සමාජයේ විශ්වාස පද්ධතියක් වන නිමිතිවල සමාජ භාවිතය හා වර්තමාන තත්ත්වය පිළිබඳ අධ්‍යයනය (පන්නිල ග්‍රාමය ඇසුරෙන්)

එන්. එල්. කරුණාරත්න, එච්. ඩී. එල්. ආර්. හපුතන්ත්‍රී

සමාජ විද්‍යා අධ්‍යනාංශය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

*lochanarandika1@gmail.com*

ලාංකේය ගැමි සමාජයේ ගැමි ජීවිකාව හා බැඳී විශ්වාස පද්ධතින් අතරින් නිමිති ප්‍රධාන තැනක් ගනු ලැබේ. දෛනික ජීවිතයේ අත්දැකීම් පදනම්ව ගැමියන් විසින් නිර්මාණය කරගත් නිමිති, ගැමියාගේ සමාජ ජීවිතය යහපත්ව පවත්වා ගැනීම උදෙසාත්, සමාජ පාලන කාරකයක් ලෙසටත් ආරක්ෂක ක්‍රියාමාර්ගයක් ලෙසත් ගැමි සමාජය තුළ ක්‍රියාත්මක විය. නිමිති යනුවෙන් හඳුන්වන්නේ, යමක් සිදුවීමට පෙර එය සිදුවන බව දක්වන පූර්ව ඉඟියකි. නිමිති, ජ්‍යොතිෂ්‍ය ශාස්ත්‍රය හා ගුප්ත ශාස්ත්‍රය තුළ ද ඇතුළත් වේ. ගැමි සමාජය තුළ නිමිති යන්න කොටස් ත්‍රිත්වයක් දක්වා ඇත. එනම් සුභ නිමිති, අසුභ නිමිති හා බාධා නිමිති යන්නයි. එමෙන්ම විවිධ නිමිති වර්ගද ගැමි සමාජය තුළ ගැබ්ව පවතී. එනම් සත්ත්ව ලෝකය හා සම්බන්ධ නිමිති, නිමිති කාරක පුද්ගලයන්, ස්වභාවික පරිසරය සම්බන්ධ නිමිතින්ය. නිමිති කර්ම ඵලය මත දිගු කාලීන නිමිති හා කෙටි කාලීන නිමිති ලෙස ද වර්ග කරනු ලැබේ. මෙම නිමිති හා බැඳි ගැමි සංස්කෘතිය අදටත් පවතීද, එසේ නොපවතීනම් එයට හේතු මොනවාද, නිමිති ඉපැරණි සමාජීය භාවිතය හා එය අද ගැමි සමාජය තුළ කොතරම් දුරකට වලංගු වේද යන්න පරික්ෂණය මෙහි මූලික අරමුණ විය. මේ සඳහා ඓතිහාසික හා සංසන්දනාත්මක ක්‍රමවේදය භාවිතා කරමින් රත්නපුර දිස්ත්‍රික්කයේ පන්නිල ග්‍රාමය තුළින් නිමිති ක්‍රමය පිළිබඳ අද ගැමි සමාජය තුළ පවතින අදහස් හා සංකල්පයන් අධ්‍යයනය සඳහා එහි ජීවත් වන පවුල් 155 න් පහසුව සඳහා නියදීමේ ක්‍රමය ඔස්සේ තෝරාගත් පවුල් 20 ක් හා එම ග්‍රාමයේ ජ්‍යොතිෂ්‍ය හා ගුප්ත විද්‍යාව පිළිබඳ නම්දරා සිටින පුද්ගලයන් 5 දෙනෙකු පමණ ගම්මානය තුල ජීවත්වන අතර ඒ අතරීන් ඉහත නියදීම් ක්‍රමයම භාවිතා කරමින් පුද්ගලයන් 3 හා සිදුකරන ලද සම්මුඛ සාකච්ඡා තුලින් මෙයට අවශ්‍ය දත්ත රැස්කර ගන්නා ලදි. මෙම පරික්ෂණයට අනුව තහවුරු වූ කරුණක් වන්නේ, වේගයෙන් අද වන විට ග්‍රාමීය ප්‍රදේශ නවීකරණය වූවද අදටත් සුවිශේෂි වූ සංස්කෘතිකාංගයක් ලෙස නිමිති ක්‍රමය දෛනික ගැමි ජීවිතය හා බැඳී පවතින බවයි. නියදියෙන් පවුල් 80% ක අදහස වූයේ පුරාණ නිමිති ක්‍රම පිළිබඳ දැඩි විශ්වාසයක් ඔවුන් දරණ බවයි. එයින් 60% කගේම අදහස වූයේ නිමිති විශ්වාසය තුළින් ඔවුන්ට කෘත්‍යාත්මක බලපෑමක් එල්ලවන බවයි. නමුත් 20% ක අදහස වූයේ මෙම නිමිති ක්‍රමය තුළ විද්‍යාත්මක පදනමක් නොමැති හෙයින් විශ්වාස කළ නොහැකි බවයි. ග්‍රාමිය සමාජයේ උරුමය රැඳි තිබෙන්නේ එදා සිට අද දක්වා පැවත එන්නා වූ ඓතිහාසික සංස්කෘතිකාංගයන්ගේ පැවැත්ම නිසාවෙනි. ඒ අනුව අදටත් ගැමි සමාජය තුළ, සමාජ පාලන කාරකයක් ලෙසත්, සමාජයේ අභිවෘද්ධිය උදෙසාත් මෙම සංස්කෘතිකාංග තවදුරටත් ගැමියා තුළ නොනැසී පැවතීම ලාංකීය ගැමි සංකල්පයයේ පැවැත්ම පිළිබඳ රන් සලකුණකි.

***ප්‍රමුඛ පද:*** *නිමිති, නිමිති වර්ග, ජ්‍යොතිෂ්‍ය ශාස්ත්‍රය, ගැමි සංස්කෘතිය, ගුප්ත ශාස්ත්‍රය*

# ශ්‍රී පාදස්ථානය ආශ්‍රිත ව ගොඩනැගුණු ප්‍රාදේශීය පිළිවෙත්හි වත්මන් ස්වරූපය (කුරුවිට ප්‍රදේශය ඇසුරින්)

බී. ජී. ඒ. ටී. එන්. වික්‍රමරත්න, එස්. සමරසේකර

මානව විද්‍යා අධ්‍යයනාංශය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

*tothanujawickramarathna@gmail.com*

කටවහරින් හා ව්‍යවහාරයෙන් පරම්පරාවෙන් පරම්පරාවට පැමිණෙන සාමූහික ඥාන සම්භාරය ජනශ්‍රැතියයි. ජන ආගම වශයෙන් හැඳින්වෙන්නේ අදාළ සංස්කෘතියෙහි ඉපිද පරම්පරාවෙන් පරම්පරාවට ජනවහරේ පැමිණි ඇදහිලි හා විශ්වාසයි. අනාදිමත් කලක පටන් පැවත එන ප්‍රකට සිද්ධස්ථාන පදනම් කොටගෙන ජනශ්‍රැති බිහිවීම ඕනෑම සමාජයක දැකිය හැකිය. බුදු දහම ආශ්‍රිත ඇදහිලි විශ්වාස මහා සම්ප්‍රධායෙන් මෙන්ම චූල සම්ප්‍රධායෙන්ද පැමිණේ. චූල සම්ප්‍රධාය බොහෝවිට නියෝජනය කරනුයේ ජනශ්‍රැතියයි. ශ්‍රීපාදස්ථානය ඇසුරින් ගොඩනැගුණු ගැමි පිළිවෙත් මේ අතර සුවිශේෂීවේ. ශ්‍රීපාදය ආශ්‍රිත ජනශ්‍රැති මුල් බුදු සමයටත් එපිටට විහිදී ඇත. ඒ අනුව ශ්‍රීපාද වන්දනාව මහා සම්ප්‍රදාය ලෙස මෙන්ම ප්‍රාදේශීය ඇදහිලි ලෙසත් පවතී. ශ්‍රී පාද වන්දනය මහා සම්ප්‍රදායික ඇදහිල්ලක් වශයෙන් ප්‍රසිද්ධ වුවද එහි චූල සම්ප්‍රදාය පිළිබඳ ඇත්තේ අල්ප අවබෝධයකි. මෙම පර්යේෂණයේ අරමුණ වන්නේ ශ්‍රී පාදය ආශ්‍රිතව ඇති ප්‍රාදේශීය පිළිවෙත් හඳුනාගැනීමත් ඒවායෙහි වර්තමාන තත්ත්වය අධ්‍යයනය කිරීමත්ය. මේ පිළිබඳ තොරතුරු අහඹු නියැදිය යටතේ ශ්‍රී පාද වන්දනයේදී *නඩේගුරන්* ලෙස කටයුතු කරන පුද්ගලයන් දස දෙනෙකුගෙන් ලබාගත් අතර ඊට අමතරව අවශ්‍ය තොරතුරු ක්ෂේත්‍ර නිරීක්ෂණය මඟින් ලබාගනු ලැබීය. සමන්දේව ප්‍රතිමාවත් ධාතු කරඬුවත් ශ්‍රී පාදස්ථානයට පෙරහැරින් වැඩමවීමත් සමඟ ශ්‍රීපාද වන්දනා සමය ආරම්භවේ. පතල් කර්මාන්තය ජීවිකාව කරගත්තවුන් ගැරුම්-වට්ටි රැගෙන පෙරහැරේ ගොස් ශ්‍රීපාදය වන්දනා කිරීම මෙම ප්‍රදේශයට ආවේණික වූ පිළිවෙතකි. ශ්‍රීපාද වන්දනයට පෙර *කිළි-ආහාරවලින්* තොරව *පේවීමත්,* පන්සිල් සමාදන්ව සමන් දෙවියන්ට පිං පමුණුවා පඬුරක් ගැටගසා භාරවීමත්, දෙහි-කහ මිශ්‍ර ජලයෙන් ස්නානය කිරීමත්, වන්දනා නඩ සඳහා වැඩිවියට පත්වීමට ආසන්න වයස්වල දැරියන් ඇතුලත්කර නොගැනීමත් අතීතයේ දී වන්දනාකරුවන් සිදුකළහ. නමුත් මෙම තත්ත්වයන් වර්තමානයේදී දැකිය නොහැක. වන්දනාගමන අතරතුරදී තෙරුවනේත් සමන් දෙවියන්ගේත් ආශිර්වාදය ලබාගැනීම, නගින-බසින නඩ එකිනෙකාට ආශිර්වාද කිරීම අරමුණු කොටගෙන කවි-වාගාලාප ගැයීම තවත් සිරිතකි. නමුත් විවිධ වාද්‍ය භාණ්ඩ වාදනය කරමින් ඝෝෂාකාරී ගායනා කරමින් කන්ද තරණය කිරීම වර්තමානයේදී සිදුවේ. සීතගඟුලට ලඟා වූ විට *නඩය* හිස දෙහි ගා සීත ගඟුලෙන් ස්නානය කොට සුදුපිරුවට ඇඳ පන්සිල් සමාදන් වී පඬුරු ගැටගසා නැවතත් ගමන් ආරම්භ කිරීම අතීත පිළිවෙතයි. වර්තමානයේදී ගඟුලෙහි ස්නානය හුදෙක් විනෝදාස්වාදය උදෙසා පමණක් සිදුකරන්නකි. ගෙත්තම්පානට ළඟා වූ විට *කෝඩුකාරයන්* උදෙසා සිදුකරන වත්පිළිවෙත් වර්තමාන පරපුර තුළ සම්පූර්ණයෙන්ම පාහේ දැකිය නොහැකිය. කට වරද්දා නොගැනීමද අතීතයේ පැවති සුවිශේෂී පිළිවෙතකි. මෙහිදී නෑ-බෑ වැනි නිශේධාර්ථවත් වදන් නොපැවසීම ද *කෝඩේ, ගඟුලබානවා, පරඬැල්, සංහිඳේ, සැහැල්ලුව* ආදී සුවිශේෂී වචනද භාවිතා වන්නේ ඉහත කෘත්‍ය සඳහාය. නමුත් වර්තමාන ශ්‍රීපාද වන්දනාකරුවන් තුළ මෙම පිළිවෙත ද දැකිය නොහැකිය. මේ අනුව මෙම පර්යේෂණ පත්‍රිකාව තුළින් අතීත බැතිමතුන් ඉතා ශ්‍රද්ධාවෙන් අනුගමනය කළ ශ්‍රීපාදස්ථානය ආශ්‍රිතව ගොඩනැගුණු ප්‍රාදේශීය පිළිවෙත් කෙමෙන් වියැකෙමින් යන අයුරු පිළිබඳව සංක්ෂිප්තව විග්‍රහවන්නේය.

***ප්‍රමුඛ පද:*** *ශ්‍රීපාදස්ථානය, ප්‍රාදේශීය පිළිවෙත්, නඩේගුරා, නඩය, කෝඩුකාරයා*

# ජන ශාන්තිකර්මයක් ලෙස සන්නියකුම ශාන්තිකර්මය විවරණය කිරීම (සාහිත්‍යමය මූලාශ්‍ර ඇසුරින්)

එච්. එම්. එච්. එම්. හේරත්, එස්. සමරසේකර

මානව විද්‍යා අධ්‍යයනාංශය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

*harshanimenaka201@gmail.com*

ශ්‍රී ලාංකික ගැමි සමාජය තුළ අදෘශ්‍යමාන බලවේග හා බැඳි ශාන්තිකර්ම පවතී. යක්ෂයා, දෙවියා හෝ ග්‍රහයා වෙනුවෙන් යක් තොවිල්, මඩු තෝත්‍ර, බලියාග ලෙස මූලික යාගකර්ම තුනක් වේ. දේශීය ආයුර්වේද යොදා ගන්නා සිංහල ගැමි ශාන්තිකර්මයක් ලෙස සන්නියකුම ශාන්තිකර්මය යෙදී ඇති අයුරු විමසා බැලීම මෙම ලිපියෙන් අපේක්ෂා කෙරේ. මෙම අධ්‍යයනය සඳහා සන්නියකුම ආශ්‍රිත කරුණු ඇතුලත් සාහිත්‍ය මූලාශ්‍ර අධ්‍යයනය කිරීම පර්යේෂණයේ අධ්‍යයන ක්‍රමවේදය විය. සිංහල ගැමි බෞද්ධයන්ගේ ලෞකික ජීවිතයේ ඇතිවන සියලු රෝග, උපද්‍රව දුරු කරවා ගැනීම අරමුණු කර ගනිමින් මෙය සිදු කරයි. සර්වාංග වෙදකම හැදෑරීමේ දී ආයුර්වේදය, ජ්‍යොතිෂය හා ගුප්ත විද්‍යාව යන කොටස් තුන අනිවාර්යෙන් උගත් යුතු බව කියවේ. වෙදමහතා, නැකත්රාළ හා යකදුරා යන ත්‍රිපුද්ගල කාර්යභාරය ඉන් සම්පූර්ණ වේ. සිංහල ගැමියන් ශාන්තිකර්මයක් පැවැත්වීමට හේතු කර ගත්තේ අදෘශ්‍යමාන බලවේගයන් විසින් ඇතිකරවන ලබන රෝග උපද්‍රවයි. දේශීය වෛද්‍ය ක්‍රමය අනුව යම් කිසිවකු රෝගියෙකු බවට පත් වන්නේ තුන්දොස් කිපීමෙන් දෝෂත්‍රය යනුවෙන් දක්වයි. ගැමි ශාන්තිකර්ම බිහිව ඇත්තේ ගැමි විශ්වාස හා ඇදහිලි පදනම් කරගෙන බව පැහැදිලි වේ. වා, පිත්, සෙම් රෝග ඇති කරවන බලවත් යක්ෂයෙක් වන සන්නි යක්ෂයා වටා මෙය ගොඩනැගී ඇති බව සිංහල සමාජයේ දක්නට ඇත. ගැමි ශාන්තිකර්මවල පස් තෙල් ගෑම, හිස තෙල් ආලේපනය, දෙහි ලෙල්ල නියගින් කඩා ආග්‍රහණය කරවීම ආදිය බහුලව යෙදෙන මන්ත්‍ර, කට පැහැදී, කන්නලව්, වැදීම් ආදී නම්වලින් හඳුන්වන ගායන විශේෂ ඇතුළත් වේ. ආතුරයාගේ මනසට එය මහත් අස්වැසිල්ලක් ඇති කරවයි. මෙවැනි අවස්ථා සන්නියකුම ශාන්තිකර්මය පැවැත්වීමේ අවස්ථාවන්හි යක්ෂයින් පුද්ගල ස්වරූපයෙන්, චිත්‍ර හෝ මූර්ති මගින් දැක්වීමේ අවස්ථා ශාන්තිකර්මවල ඇතුළත්ව තිබේ. තවත් විටෙක රෝග අවස්ථා පුද්ගල ස්වරූපයෙන් ඉදිරිපත් කෙරේ. මෙම ලක්ෂණ වඩාත් මතු වන්නේ එහි යක් නැටුම් හා සන්නි නැටුම්වලින් වන අතර, මෙවැනි කාර්යයන් මගින් රෝගාතුරයාගේ මනසෙහි යක්ෂයා තුළ පැවති බිය ක්‍රමයෙන් බැහැර කරවයි. රෝගියාගේ මනසට ගෝචර වන අයුරින් නැටුම් ඉදිරිපත් කරන්නේ පූජා වස්තුවලට අයත් උපත් කතා ගෙනහැර දැක්වීමෙනි. පසුව කෙරෙන නැටුම්වලදී සන්නියට අදාළ රෝගී බව අභින තුළින් මතුකොට ආතුරයාගේ මනසින් ක්‍රමයෙන් රෝග නිවාරණය කිරීම සිදු කරයි. සන්නියකුමේ ඇතුළත් රෝග ලක්ෂණ බොහෝ දුරට දේශීය ආයුර්වේදය සන්නිවලට සමගාමී බවක් දක්වයි. එහි ගැබ්ව ඇත්තේ ගැමි වෛද්‍ය කර්ම, ඇදහිලි හා විශ්වාස වේ. රෝග නිවාරණයේලා සුවිශේෂී වන මෙම ශාන්තිකර්මය තුළ වූ ජන ඇදහිලි හා අභිචාර තුළින් ගැමියා මානසික සුවය අත්පත් කරගත් ආකාරය පිළිබද මෙහි අවධානය යොමු කර තිබේ. මනෝ චිකිත්සන මාධ්‍යයන් ඉතාමත් අනර්ඝ ලෙස ජන සමාජය තුළ භාවිත කළ අයුරු මෙහි දී පසක් වේ.

***ප්‍රමුඛ පදඃ*** *සන්නි යක්ෂයා, රෝග නිවාරණය, මනෝ චිකිත්සනය, දේශීය ආයුර්වේදය*

# කාලි මාතා දෙවඟන ආශ්‍රිත යාතු කර්ම හා පුදපූජා (මුන්නේශ්වරම් හා මෝදර කාලි කෝවිල් ඇසුරෙන්)

ඒ. ඒ. ජේ. ජයසිරි, ඩබ්. එම්. සී. එල්. මධුශංඛ

මානව විද්‍යා අධ්‍යයන අංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

*mcharith121@gmail.com*

විනාශයේ දෙව්දුව වශයෙන් හඳුන්වන කාලි මාතාව විශේෂයෙන් දකුණු ආසියාතික රටවල වන්දනා මානයට පාත්‍ර වනු ලබයි. මැය ශිව දෙවිඳුගේ භාර්යාව ලෙස ද සලකනු ලබයි. කාලි මාතාව සත් කට්ටුවකින් යුක්ත වේ. ශ්‍යාමා, චණ්ඩි, චණ්ඩිකා. භෛරවී ආදී වශයෙන් විවිධ නම් වලින් හඳුන්වනු ලැබේ. දකුණු ආසියාතික රටවල බෙහෙවින් ප්‍රචලිත කාලි සංකල්පය පිළිබඳ සංක්ෂිප්ත විවරණයක් මානව විද්‍යාත්මක දෘෂ්ටිකෝණයෙන් අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ මුඛ්‍ය අරමුණ වූ අතර අනෙකුත් සෙසු අරමුණු බවට පත්වූයේ කාලි සංකල්පයේ වපසරිය හඳුනා ගැනීම, කාලි දේවතාවියක්ද, යක්ෂණියක්ද යන්න අවබෝධ ලබා ගැනීම, කාලි සංකල්පයේ ආගමික සහ සම්බන්ධතාවය හඳුනා ගැනීම සහ කාලිදේව, යක්ෂ සංකල්පය උදෙසා කරනු ලබන පුද පූජා පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම ය. අධ්‍යයන ක්‍රමවේදය පිළිබඳ සැලකීමේදී සහභාගීත්ව නිරීක්ෂණ ක්‍රමවේදය යොදා ගනිමින් හලාවත මුන්නේෂ්වරම් කෝවිල හා මෝදර කෝවිල ආශ්‍රයෙන් දත්ත දායකයින් පනස් දෙනෙකුගෙන් ලබා ගන්නා ලද තොරතුරු මත මෙම අධ්‍යයනය මෙහෙයවන ලදී. තවද මේ හා බැදි ප්‍රාථමික මූලාශ්‍ර මෙන්ම ද්විතීයික මූලාශ්‍රයන් ද පරිශීලනය කරන ලදී. ලබාගත් තොරතුරු විශ්ලේෂණයේදී ගම්‍ය වනු ලබන්නේ මිනිසුන්ගේ ජීවිතය හා බැදි අනේකවිධ කරදර හා කම්කටොලු වලට සහනයක් ලබාගැනීමේ අරමුණින් කාලිමාතාව වන්දනා මාන කරන බවය. මෙහිදී විශේෂයෙන් කාලි මාතාව විපත්ති කරදරවලට පිහිටවන දේවතාවියක් ලෙසට ප්‍රසිද්ධවන අතර, වැරදි කළ සතුරන්ට නොපමාව දඬුවම් ලබාදෙන දේවතාවියක් ලෙස ද ප්‍රසිද්ධය. ඉන්දියාවේ මෙන්ම ලංකාවෙහිද කාලි මාතාව වෙනුවෙන් සතුන් බිලිදීම දක්නට ලැබේ. එහිදී කුකුළන් මෙන්ම එළුවන් බිලිදීම සුලභව දැක ගැනීමට හැක. කාලි මාතාව නිතර පිපාසයෙන් යුක්ත වන බවත් අයගේ මෙම පිපාසය සංසිඳලීමට මෙම සත්ත්වයින්ගේ රුධිරය ප්‍රයෝජනවත් වන බවට මහත් විශ්වාසයක් ඇත. එසේම කාලි මාතාව වෙනුවෙන් දෙහි මාල පූජා කරන අතර එමගින් ද අර්ථ නිරූපණය වන්නේ ඇයගේ පිපාසය සංසිඳලීමට දෙහි යුෂ ද භාවිතා කරන බවය. රතු පැහැති මල්වලින් මෙම දේවතාවිය පිදුම් ලබන අතර ඇය විෂයෙහි විවිධ කැවිලි හා පලතුරු පූජා ආදිය පවත්වනු ලැබේ. කාලි මාතාව හා සම්බන්ධව කටයුතු කරන තේවාව භාර උදවිය මෙන්ම බැතිමතුන් ද රතු හෝ කළු පැහැති වස්ත්‍ර ඇඳීම සිදු කරනු ලබයි. මෙම වස්ත්‍රයන්ගේ වර්ණ හරහා ද නිරූපණය වන්නේ කාලි මාතාව සතු වූ රෞද්‍ර ස්වරූපය මෙන්ම භයංකාර ස්වභාවයයි. බෞද්ධ සාහිත්‍ය මූලාශ්‍රවලට අනුව මැය බුදුන් දවස බණ අසා සෝවාන් ඵලයට පත්ව ඇත. මෙමගින් මැය දේවතාවියක් ලෙස ද හඳුන්වනු ලැබේ. කාලි සංකල්පය දකුණු ආසියාතික රටවල ආගමික විශ්වාස අතර එක් වූ ප්‍රබල සංකල්පයක් බවත් එමෙන්ම කාලි දෙවඟන මිනිසුන්ගේ යහපතට මෙන් අභිවෘද්ධියට පිහිටවන දේවතාවියක් මෙන්ම අයහපත කරන මිනිසුන්ගේ විනාශය නිරූපණය කරන යක්ෂණිය ලෙස ද අර්ථ නිරූපණය වනු ලැබේ.

***ප්‍රමුඛ පද:*** *කාලි මාතා දෙවඟන, විනාශය, යක්ෂණිය, පුද පූජා, ආගමික*

# ශ්‍රී ලාංකේය ගැමි සමාජයේ විශ්වාස පද්ධතියක් වන කෙම් ක්‍රම, අත්බෙහෙත් හා බැඳි අතීත සමාජ භාවිතයන් හා වර්තමාන තත්වය පිළිබඳ අධ්‍යයනය (දිගන්දල ප්‍රදේශය ආශ්‍රයෙන්)

එම්. එල්. පි. එන්. ලියනගේ

ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

*piyunimasha@gmail.com*

ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික වෛද්‍ය ක්‍රමයේ තවමත් ශේෂව පවත්නා අංශ දෙකක් ලෙස අත් බෙහෙත් හා කෙම් ක්‍රම හඳුනා ගත හැකි අතර මේවා බොහෝ විට එකිනෙක හා බැඳී පවතී. මේවායේ අරමුණු එකක් වුවද අත් බෙහෙත්වල පවතින ඖෂධ ගුණවලට අමතරව කෙම් ක්‍රමවල ජෝතිෂ්‍ය, ඇදහලි, ගුප්ත, විශ්වාස වැනි දෑ ඒ හා බැඳි පවතී. කෙම් ක්‍රම යනු ආරක්ෂාව, උගුල යන අරුත් ලබා දෙන වචනයකි. විශේෂයෙන් ම මෙරට කෙම් ක්‍රම සඳහා බුද්ධානුභාවය භාවිතයට ගෙන ඇති අතර පසු කළෙක මන්ත්‍ර එක් වූ විට මන්ත්‍ර කෙම් ක්‍රම බිහිවිය. ඒ සමඟම හෝරාව, නැකත, තිථිය, කරණ ආදිය ඒ හා බැඳි පවතින්නකි. අතීතයේ පැවති මෙම කෙම් ක්‍රමයන් හා බැඳුණු අත් බෙහෙත් පිළිබඳව ද ඒවා අද දක්වා ජන සමාජ ගතව පවතින ආකාරයේ සොයා බැලීමද මෙම අධ්‍යයනයේ අරමුණ විය. මෙම අධ්‍යයනය සඳහා රත්නපුර දිස්ත්‍රික්කයේ කෘෂිකාර්මික ගම්මානයක් වන දිගන්දල ප්‍රදේශය තුළ මෙම සිටින ගෘහ ඒකක 150 න් අහඹු නයිදියක් ඔස්සේ පවුල් 20 හි වැඩිහිටි ජනතාවගෙන් සිදු කරන ලද ප්‍රශ්නාවලි හා සම්මුඛ සාකච්ඡා ඇසුරෙන් දත්ත රැස් කර ගත් අතර එම දත්ත විශ්ලේෂණය කිරිම සඳහා Excel මෘදුකාංගය භාවිත කරන ලදි. මෙහි සමස්තය අධ්‍යයනය කරන විට අධ්‍යයන පිරිසේ වැඩි මතය (80%) වුයේ එම භාවිතයනහී විද්‍යාත්මක පදනමක් නොමැති බවත්, තාක්ෂණික ක්‍රමයන්හි දියුණුවත්, නූතන පරපුර මේ පිළිබඳව අවධානය නොදක්වීමත් හේතුවෙන් පැරණි භාවිතයන 'අභාවයට යන බවයි. නමුත් වැඩිහිටි ආභාසය ලබමින් පසුවන 20% ක පමණ පිරිස එම භාවිතයන් තවමත් අගය කිරීම හා භාවිතයට ගන්නා බව පැහැදිලි විය.මෙහි දි භවබෝග සරුකර ගැනිමට, ලෙඩ රෝග කරදර ආදියේදි පිහිටක්, ආරක්ෂාවක් ලබා ගැනීමට මෙන්ම අචේතනික වස්තුවල පැවැත්මට පවා විවිධ කෙම් ක්‍රම උපයෝගි කරගෙන ඇත. එමෙන්ම අත් බෙහෙත් භාවිතයේදි විවිධ පැළ වර්ග විවිධ වේලාවන්හිදී භාවිතයට ගැනිම යම් යම් දිශාවලට විහිදී ගිය මුල් භාවිතය වැනි විශේෂ ක්‍රමවේදයන් හඳුනාගත හැකි විය. අත් බෙහෙත් හා කෙම් ක්‍රම අතීත සමාජයේ ප්‍රබල ලෙස මුල් බැස ගත්ත ද වර්තමානය වන විට ඒවායේ භාවිතයන් සීමිත වි ඇති බව මෙම අධ්‍යයනයේදී තහවුරු වූ අතර සිමිත පිරිසක් මෙම ක්‍රමවේදයන් දැනුදු භාවිතයට ගනනා බව නිගමනය කළ හැකි විය.

***ප්‍රමුඛ පදඃ*** *කෙම් ක්‍රම, අත් බෙහෙත්, මන්ත්‍ර කෙම්, කෘෂිකාර්මික කෙම් ක්‍රම, වර්තමාන තත්වය*

# Impacts of Religion to Peasants' Life Style

J. A. P. K. Senavirathna

University of Ruhuna

*prabhasenavirathna@gmail.com*

Most of rural people's cognitive orientation is based on their perspective of religion. Therefore, peasant societies also shaped inline with rural religious beliefs. Problem of the research was to identify how religion impact on the cognitive orientation of peasants beliefs (in *Panama* village). Aim of the research was to identify the link between religion and cognitive orientation of peasants and "how religion impact on the cognitive orientation of peasants beliefs". The study focused on remote village '*Panama*' in *Ampara* district of Sri Lanka which is a popular hot spot where the referred type of beliefs has been practiced since several hundred years. Mainly going by the phenomenology methodology which was included 'Case Study' approach for primary data and adopting the qualitative methods as; focused group interviews, observations and narratives given by specially the majority of adult folks out of the total 25 families living in that village, able to find that among a host of 'mythical practices' they are adhered to, villagers of both communities as, the Sinhalese and the Tamils are ardent believers of their religions as Buddhism and Hinduism respectively. In addition, they trust on the almighty powers of the Goddess *'Paththini'* as their one and only 'Guardian Goddess' who is believed to protect the villagers from all types of evils. As cited by villagers, saving them from the 'Tsunami' tragedy in 2004 and the treacherous civil war in which allegations as to committing crimes against humanity were leveled against the Tamil extremist groups is a classic example to that effect. In conclusion able to perceive that with such blessings the villagers got in disguised, their cognitive faith on 'metaphysical' forces has doubled and trebled tempting them to incline more and more towards paying respect to such forces and their respective religions while engaging in so called 'ignorant practices'.

***Keywords:*** *scientific world, non-scientific world, religious practices, magic systems, mythical beliefs*

# ජනශ්‍රැතිකාංගයක් ලෙස උඩුනුවර ප්‍රදේශය තුළ පවතින හෙණකඳ බිසෝ බණ්ඩාර දේවිය පිළිබඳ සටහන් වන මූලාශ්‍ර හා සම්බන්ධ විශ්වාස පිළිබඳ අධ්‍යයනයක්

ඩී. එම්. කේ. ජී. කේ. දිසානායක, ඩබ්. කේ. එම්. විජයරත්න, පී. ඒ. ඒ. එන්. ශ්‍රී ශාන්

ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

*kaushdizz@gmail.com*

ඉතිහාසයේ ඇති සමහරක් සුවිශේෂී චරිත නාමයන් ජනකතා හා අද්භූතජනක කතාපුවත් වලින් ආවරණය වී ඇත. 14 වන සියවසේ ගම්පොළ ආශ්‍රිත ව විසූ වංශවත් මෙන් ම ධනවත් කතක් වූ හෙණකඳ බිසෝ බණ්ඩාර දේවියගේ කතා පුවත ද එවැනි කතා සමඟ මුසු වී ඇත. ගම්පොළ යුගයේ ප්‍රධාන රජ කෙනෙකු වූ iii වන වික්‍රමබාහු රජුගේ මෙහෙසිය වූ හෙණකඳ කුමරිය බෙලි ගෙඩියකින් උපත ලැබූ නපුංසක කතක් බව, රජ බිසවක වූවත් තනිව මාළිගයෙන් පිට වාසය කිරීම, මරණය දෙවන දරු උපතේ දී සිදු වූවාද, හදිසි මරණයක් ද නැතහොත් මරා දැමීමක් ද යන්නට නිශ්චිත පුරාවිද්‍යා සාධක හඳුනාගැනීම අපහසු වී ඇතත් ජනප්‍රවාදගත පුවත් රාශියක් ඇම්බැක්ක දේවාලය හා සම්බන්ධ පැරණි සමාජය තුළ ඇත. අවසානයේ ඛේදනීය ඉරණමකට මුහුණ දුන් මෙතුමිය දෝලාවකින් ගමන් කරමින් සිටියදි හදිසියේ මිය ගොස් සිටීම භූත ක්‍රියාකාරකමක්, ඝාතනයක් ආදී නොයෙකුත් මතිමතාන්තර ඇත. බොහෝ පැරැණ්නන්ට ඇම්බැක්ක දේවාලය හා උඩුනුවර ප්‍රදේශයේ ඇති බෞද්ධ විහාර සමඟ බැඳි අද්භූතජනක කතා පිළිබඳ පැරණි මතකයන් ඇත. කොත්මලේ, උඩුනුවර ප්‍රදේශ ආශ්‍රිතව ස්ථාන නාම නියුක්ත වීම නිසා ද මෙතුමිය ගේ ක්‍රියාකාරකම් බලපා ඇත. නූතන පරම්පරාවට හෙණකඳ බිසෝ බණ්ඩාර දේවිය පිළිබඳ ඇති දැනුම සාපේක්ෂව පහළ අගයක් ගන්නා නිසා මෙතුමිය පිළිබඳව දැනුම පරම්පරාවත් සමඟ වියැකී යාම වැළැක්වීම මෙම පර්යේෂණයේ අරමුණයි. විවිධ මූලාශ්‍ර වල විවිධාකාර නාමවලින් මෙතුමිය හඳුන්වා දී ඇති නිසා මූලික වශයෙන් ජනප්‍රවාදගත තොරතුරු තහවුරු කර ගැනීම පිණිස පුස්තකාල අධ්‍යනයක යොමු වීමට සිදුවිය. ක්ෂේත්‍රයට ගොස් සම්මුඛ සාකච්ඡාවල නිරතවීමෙන් හෙණකඳ බිසෝ බණ්ඩාර දේවිය පිළිබඳව ඇති දැනුම හා ජනප්‍රවාදගත පිළිබඳව සොයා බැලීම්වල නිරත විය. බොහෝමයක් ඇම්බැක්ක දේවාලයෙහි ඇති විචිත්‍රවත් ලී කැටයම් ගැන වර්ණනා කරන නමුත් මෙවන් අනර්ග නිර්මාණයක් වෙනුවෙන් සද්භාවයෙන් යුතුව තම සේසතම පරිත්‍යාග කළ හෙණකඳ බිසෝ බණ්ඩාර දේවිය පිළිබඳව නූතන පරම්පරාව තුළ වන දැනුම අල්ප වේ. ලී කොටයක බහා එවූ කාන්තා මළසිරුරක් මූලික කොට ගෙන සිංහල, මුස්ලිම් ජනතාව බෝතලාපිටිය දේවාලය හා කහටපිටිය මුස්ලිම් දේවාලය කරවූ බවට ඇති ජනප්‍රවාද පිළිබඳව උඩුනුවර සමාජයට යම් දැනුමක් ඇති නමුත් එය මෙතුමියගේ නාමයට බැඳී ඇති බව දන්නේ කිහිපදෙනෙක් පමණි. කෙසේ වෙතත් හෙණකඳ බිසෝ බණ්ඩාර දේවියගේ බෞද්ධ ශාසනික සේවාව නිසා අද්භූතජනක කතා මවමින් මෙතුමිය දේවත්වයට ආරෝපණය කර පූජනීයත්වයට පත් කොට ඇත.

***ප්‍රමුඛ පද:*** *හෙණකඳ බිසෝ බණ්ඩාර, හෙණකඳ බිසෝ, ඇම්බැක්ක, උඩුනුවර*

# ඓතිහාසික කැබිලිත්ත පුදබිම හා බැඳුණු ඇදහිලි, විශ්වාස, පුදපූජා හා චාරිත්‍ර විධි පිළිබඳ මානව විද්‍යාත්මක අධ්‍යයනයක්


ජී. ඒ. ඒ. එන්. ශ්‍රී ශාන්, එච්. එම්. කේ. ජී. දුෂ්මන්ත, ඩබ්ලිව්. කේ. එම්. විජයරත්න

මානව විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

*srishan1119@gmail.com*



සංස්කෘතිය සඳහා වූ ටයිලර්ගේ නිර්වචනයට අනුව ඇදහිලි හා විශ්වාස සමාජීය සත්ත්වයකු වශයෙන් මිනිසා අත්පත් කරගනී. ලාංකේය සමාජය තුළ මෙකී විශ්වාස හා ඇදහිලි සම්බන්ධව ඇත්තේ සාම්ප්‍රදායික ඥාන සම්භාරයකි. එකී දැනුම් වපසරිය තුළ හමුවන සුවිශේෂී සංධිස්ථානයක්; හැරවුම් ලක්ෂ්‍යයක් ලෙස කැබිලිත්ත දේවාලය නම් කළ හැකි ය. මෙම දේවාල භූමිය ඇදහිලි, විශ්වාස හා විවිධ පුදපූජා විධි මගින් අධිස්වාභාවිකත්වයක් ආරෝපණය කරන ලද ස්ථානයකි. කැබිලිත්ත දේවාලය හා සම්බන්ධ විශ්වාස ගොඩනැගෙන්නේ කතරගම දෙවියන් මුල් කරගෙන ය. කැබිලිත්ත දේවාලය හා බැඳුණු ජනප්‍රවාදයන්, විශ්වාසයන් මගින් ගොඩනැගුණු චාරිත්‍රවාරිත්‍ර මොනවා ද යන්න අධ්‍යයනය කිරීම මෙහි මූලික අරමුණ යි. මෙහි දී කැබිලිත්ත ලාංකේය සමාජය තුළ ජනප්‍රිය වීම නිසා එම පුදබිම අවට ප්‍රදේශය වර්තමානයේ සංස්කෘතිකමය වශයෙන් කුමන ආකාරයකට වෙනස් වී ඇත් ද යන්න පර්යේෂණ ගැටලුව ලෙස සඳහන් කළ හැකිය. කැබිලිත්ත පූජා භූමිය තුළ කරන්නට යෙදුණු නිරීක්ෂණය, සහභාගීත්ව නිරීක්ෂණය හා දත්ත දායකයින තිස් දෙනෙකු සමඟ සම්මුඛ සාකච්ඡා පැවැත්වීම යන පර්යේෂණ ක්‍රමවේදයන් උපයෝගී කොටගෙන දත්ත එක් රැස් කරන ලදි. කැබිලිත්ත භූමිය ඓතිහාසික වශයෙන් වැදගත් වන්නේ මෙහි ඇති ගුප්ත වූ හාස්කම් රැසක් හේතුවෙනි. ඕලන්දක්කාරයින් විසින් දේවාල, පන්සල් කොල්ලකමින් සිටි සමයේ දී, කතරගම දේවාලයේ කපුවන්, එහි දේවාභරණ කැබිලිත්ත මහ සියඹලාවෙහි බෙනයෙහි සැඟවූ අතර, මෙහි සිටි කැබිලිත්තේ රාළ නැමැත්තෙකු ඕලන්දක්කාරයින්ගෙන් ඒවා ආරක්ෂා කළ බවත් එම සටනින් මිය ගිය ඔහු අදෘශ්‍යමාන බලවේගයක් ලෙස දේවාල භූමිය ආරක්ෂා කරන බවත් විශ්වාසය යි. ජනප්‍රවාදයේ එන කිසිවෙකුගේ ඇසට නො පෙනෙන දේවාලය, "තළගුලු වෙහෙර" සහ නිල් මානෙල් පැළැස්ස ද මෙම භූමියේ පිහිටා ඇති බව පැරන්නන් පවසයි. කතරගම දෙවියන් භාවනානුයෝගී ව වැඩ වසන භූමියක් ලෙස මෙම දේව අඩවිය හඳුන්වනු ලබයි. මෙම භූමියට අතීතයේ දී හේන් ගොවියන් තම අස්වැන්න නෙලා ලබා ගත් අලුත් භවභෝග ගෙන පුද පූජාවන් තැබීමට පැමිණි අතර වනයේ දඩයම් කිරීමට එන දඩයම්කරුවන් දෙවියන්ට මස්, තළප තබා පුද සත්කාර කළ බවත් පැවසේ. මහකැබිලිත්තේ සියඹලා දේවාලයට මෙගොඩ පිහිටි ගංඉවුරට එන සියලූ දෙනා එතැන නැවතීම සිරිත ය. පළමුව, ගෙනා බඩුමුට්ටු දානය පිළියෙළ කිරීමට සූදානම් කරගනී. ඉන්පසු කුඹුකන් ඔයෙන් දිය නා ගංඉවුරේ වැල්ලේ වලවල් හාරා නො ඉඳුල් දියෙන් මුළුතැන්බත් දානය සකසා ගැනීම සිරිත ය. කෙසේ හෝ වර්තමානය වන විට කැබිලිත්ත පුදබිම ආශ්‍රිත ව ප්‍රමාණාත්මක සංස්කෘතිකමය වෙනසක් සිදු ව ඇති නමුත් එය මෙම සිද්ධස්ථානයේ ඇදහිලි හා විශ්වාස පද්ධතිය අභාවයට ගෙනයාමෙහි ලා හේතු වන බවක් දක්නට නො ලැබේ.



***ප්‍රමුඛ පදඃ*** *කැබිලිත්ත දේවාලය, මහ සියඹලාව, ඇදහිලි, විශ්වාස, ජනප්‍රවාද*

# වලගම්බාහුව ග්‍රාමය ආශ්‍රිතව පවතින සම්ප්‍රදායික කිරි ඉතුරුම් මංගල්‍යය පිළිබඳව අධ්‍යයනයක්

කේ. කේ. පී. එම්. ජයතිලක

පුරාවිද්‍යා අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය

*madarajayathilake@gmail.com*

වැව පිළිබඳව ගැමියා තුළ ඇත්තේ ගෞරවාන්විත හැඟීමකි. වැව යනු අද්භූත බලවේග සඟවාගත් උතුම් ක්ෂේත්‍රයක් ලෙස ගැමියන් විශ්වාස කරයි. ලක්දිව පුරා විවිධ ප්‍රදේශයන් හි ඒ ඒ ප්‍රදේශයට හා ජන සමාජයන්ට ආවේනික වූ විශ්වාස ඇදහිලි හා පුද පූජා දැකගත හැකි ය. ඒ අනුව ශ්‍රී ලාංකේය වාරි සංස්කෘතියේ තිඹිරිගෙය ලෙස සලකන උතුරු මැද පළාතේ නුවරකලාවිය ආශ්‍රිතව දැකගත හැකි වැව් හා බැඳී පූජාවක් ලෙස කිරි ඉතුරුම් මංගල්‍යය ප්‍රධාන තැනක් ගනු ලබයි. මෙම පර්යේෂණයේ දී අනුරාධපුර වලගම්බාහුව ග්‍රාමය ආශ්‍රිතව සිදු කරනු ලබන කිරි ඉතුරුම් මංගල්‍යය පිළිබඳව අධ්‍යනය කරනු ලැබේ. මෙම පර්යේෂණයේ දී කිරි ඉතිරුම් මංගල්‍යය පිළිබඳව ගැමි ජනතාව අතර පවතින විශ්වාසය කෙබඳු ද යන පර්යේෂණ ගැටලුව ප්‍රධාන කරගනිමින් මෙම පූජා මංගල්‍යයෙහි පූජා ක්‍රම, සිරිත් විරිත්, චාරිත්‍ර වාරිත්‍ර හා විශ්වාස පිළිබඳව අධ්‍යනය කිරීම මෙහි අරමුණ වේ. මෙහි දී අධ්‍යයන ක්‍රමවේදය ලෙස සාහිත්‍ය මූලාශ්‍ර අධ්‍යයනය,ගවේෂණ, නිරීක්ෂණ හා වලගම්භාහුව ග්‍රාමයේ ගැමි ජනයා සමඟ සිදුකරන ලද සම්මුඛ සාකච්ඡා යන ක්‍රමවේද භාවිත කරන ලදී. අයියනායක, පුල්ලෙයාර් ඇතුළු දෙවි දේවතාවුන්ගෙන් වැව,ගම් කොටුව, ගව දරුවන්, ගම්වැසියන් ආරක්ෂා කරගැනීමට ආශිර්වාද පතා මෙම මංගල්‍යය සිදු කරනු ලැබේ. සිංහල ජන සමාජය තුළ පමණක් නොව ද්‍රවිඩ ජන සමාජය තුළ ද කිරි ඉතිරවීම සෞභාග්‍යයේ සංකේතය ලෙස සලකයි. කිරි උතුරවා ආරක්ෂාව මෙන්ම වැවට කෘතගුණ සැලකීම අපේක්ෂා කරනු ලැබේ.හොඳින් වැසි ලැබී වැව් පිරියාමෙන් අනතුරුව ගොවිතැන් සිදුකර අස්වැන්නෙන් ලබා ගන්නා ප්‍රථම භාගය දෙවියන් උදෙසා පූජා කරනු ලැබේ. අනුමැතිරාළ විසින් කෝල්මුර කවි කියා දේව කන්නලව් කර උඩැක්කි ගසමින් දෙවියන් උදෙසා පූජා සිදුකරනු ලබයි. යහන් පිළියෙළ කර පේවී කරනු ලබන මෙම මංගල්‍යයේ විශේෂත්වය වනුයේ බවලත් උදවිය හට මෙයට සහභාගී වීමට තහංචි පැනවීමයි. අනුමැතිරාළගේ ප්‍රධානත්වයෙන් වෙල්විදානේ ගේ හා ගැමියන්ගේ සහභාගිත්වයෙන් මෙහි පූජා විධි සිදුකරනු ලැබේ. මෙම ප්‍රදේශය ආශ්‍රිතව කුල ක්‍රමය තවමත් දැකිය හැකි වූවත් ඔවුන් මෙම පූජා මංගල්‍ය සඳහා හේනේ මාමා වැනි පුද්ගලයින් ද සම්බන්ධ කර ගනී. මෙම කිරි ඉතුරුම් මංගල්‍ය ආශ්‍රිත සම්ප්‍රදායික ලක්ෂණ ඇතුලත්ව ඇතත් ඇතැම් සම්ප්‍රදායික ලක්ෂණයන් අභාවයට ගොස් ඇත. වර්තමානය වන විට බොහෝ වැව් ගම්මාන ආශ්‍රිතව මෙබඳු පූජා ක්‍රම දැකගැනීම අපහසු වන අතර ඒවා පිළිබඳව දැනුමැති පුද්ගලයින් සොයා ගැනීම ද දුෂ්කර වේ. මෙම කිරි ඉතුරුම් මංගල්‍ය අනෙකුත් සම්ප්‍රදායික වැව් මංගල්‍ය හා සමානකම් දක්වන අතර ගම් කොටුවටත් වැවටත් තමන්ටත් යහපතක් සිදුවන බවට ගැමියන් අතර තවමත් විශ්වාසයක් පවතින සම්ප්‍රදායික වැව් මංගල්‍යයක් ලෙස නිගමනය කළ හැක.

***ප්‍රමුඛ පද:*** *නුවර කලාවිය, වැව, සම්ප්‍රදායික ඇදහිලි, කිරි ඉතුරුම් මංගල්‍ය, ගැමි ජන ජීවිතය*

# පාරම්පරික විශ්වාස සහ කෙම් ක්‍රම පිළිබඳ අධ්‍යයනයක් (කළුතර දිස්ත්‍රික්කයේ, මිල්ලනිය ප්‍රාදේශීය කොට්ඨාසයේ, පැල්පොල ග්‍රාමය ආශ්‍රයෙනි)

පී. ඒ. පී. රුද්‍රිගෝ , කේ. ටී. ඩී. කේ. ඒ. කේ. තන්ත්‍රිගේ, ඒ. ජේ. රජිත්

ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය, රුහුණ විශ්වවිද්‍යාලය
*apekshaprasadi14@gmail.com*

පාරම්පරික විශ්වාසයන් පදනම් කොටගෙන ගැමි සමාජය තුළ ව්‍යවහාරයට පත්ව ඇති යහපත් ප්‍රතිඵලයක් අපේක්ෂාවෙන් කරනු ලබන්නා වූ එක්තරා ආකාරයක අභිචාර ක්‍රමවේදයක් "කෙම් ක්‍රම" නමින් හඳුන්වනු ලැබේ. කෙම් ක්‍රමවල පදනම අර්ථශුන්‍ය විද්‍යාවක් ලෙස පෙනෙතත් එකී බොහෝ කටයුතුවල අප විසින් හඳුනා නොගත් අත්භූතාර්ථයක් පවතින බව පෙනේ. මෙම අධ්‍යයනයේ මූලික අරමුණ වූයේ පාරම්පරික විශ්වාස පදනම් කොටගෙන ගොඩනැගුණු කෙම් ක්‍රම මොනවාද යන්න හඳුනා ගැනීමයි. එහිදි අධ්‍යයනය කිරීමට යොදාගත් අධ්‍යයනය ප්‍රදේශය ලෙස කළුතර දිස්ත්‍රික්කයේ, මිල්ලනිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පැල්පොල ග්‍රාමය තෝරාගනු ලැබීය. කෙම් ක්‍රම ඉපැරැණි ගැමි සමාජයේ ජනයාගේ විශ්වාසය තුළ කෙතරම් බලපෑමක් කළේ ද, එහි සත්‍ය අසත්‍යතාව කවරාකාර ද යන්න හඳුනා ගැනීම මෙහි පර්යේෂණ ගැටලුවයි. මෙය මානවවංශ විද්‍යාත්මක ප්‍රවේශයකින් සිදුකළ අතර දත්ත රැස් කිරීම සඳහා ප්‍රධාන වශයෙන් ක්ෂේත්‍ර අධ්‍යයන ක්‍රමවේදය භාවිත කළේය. ඒ අනුව අර්ධ ව්‍යුහගත ආකාරයෙන් සම්මුඛ සාකච්ඡා පවත්වා තොරතුරු ලබාගන්නා ලදී. ඒ සඳහා පාරම්පරික වෛද්‍යවරුන් (10) වෘත්තිය වශයෙන් කුඹුරු ගොවිතැන යෙදෙන ගොවි මහත්වරුන් (05) කෙම් ක්‍රම පිළිබඳ දැනුම ඇති අවුරුදු 60 ට වැඩි වැඩිහිටියන් (05) ගෙන් යුතු 20 දෙනෙකුගේ නියදියක් යොදා ගන්නා ලදී. සම්මුඛ සාකච්ඡා වලට අමතරව ක්ෂේත්‍ර නිරීක්ෂණ යොදා ගන්නා ලදී. පාරම්පරික දේශීය වෛද්‍ය විද්‍යාව තුළ කෙම් ක්‍රම සිදුකරන ආකාරය, ගොඩ මඩ ගොවිතැනේ දී කෙම් ක්‍රම සිදුකරන ආකාරය, භාවිත කරන අමුද්‍රව්‍ය, අනුගමනය කරන ක්‍රමවේද හා වර්තමානය වන විට මුහුණ දී ඇති අභියෝග නිරීක්ෂණය කරමින් හා ඡායාරූප ලබා ගනිම සිදු කරන ලදි. කෙම් ක්‍රම සිදු කළ යුතු නිසි ක්‍රමවේදයක් පවතී. ඉන් පරිබාහිරව කිරීමෙන් ප්‍රතිඵල ලබා ගැනීමට අපහසුය. විශේෂයෙන් පාරම්පරික දේශීය වෛද්‍ය විද්‍යාව තුළ, ගොඩ හා මඩ ගොවිතැනේ දී කෘමීන්ගේ උවදුරු පලවාහැරීමට, බෝගවල ඵලදාව වැඩිකර ගැනීමට කෙම් ක්‍රම රාශියක් ඇත. ඉතාමත් ජනප්‍රිය කෙම් ක්‍රමයක් ලෙස පාන්දර කුකුළා හැඬලීමට ප්‍රථමයෙන් අලු බඳුනක් ගෙන කෙතට ගොස් ගොයම් අතරට ඉසීම පෙන්වාදිය හැකිය. මීට අමතරව ඇස් වහ කට වහ දෝෂ දුරු කිරීමට, සිහිනෙන් ඇවිදීම වැළැක්වීමට ආදී විවිධ ක්ෂේත්‍ර අනුව ඇති කෙම් ක්‍රම සංඛ්‍යාත්මක වශයෙන් අති විශාලය. මෙලෙස දක්නට ලැබෙන කෙම් ක්‍රම සියල්ලම පාහේ මුඛ පරම්පරාගතව පවත්වාගෙන ඒම නිසාවෙන් වර්තමානය වන විට අතීතයේ භාවිත වූ වටිනා කෙම් ක්‍රම රාශියක් අභාවයට ගොස් අවසන්ය. එම ඉරණම කෙම් ක්‍රම වලට අත් වූයේ ද ඒවා අනාගත පරපුරට දායාද නොවූයේ ද පටු ආත්මාර්ථය සහ පුහු ගෞරවය මත පදනම් වූ ගුරු මුෂ්ටිය නිසාවෙන් බව නිගමනය කළ හැකිය.

***ප්‍රමුඛ පද:*** *කෙම් ක්‍රම, විශ්වාසය, සම්මුඛ සාකච්ඡා, වෛද, අධ්‍යයනය*

# මෝහිනියඃ පුනර්කථනාත්මක ප්‍රත්‍යවේක්ෂණයක්

එම්. කේ. සී. කේ. රණවීර

සිංහල අධ්‍යයනාංශය, කොළඹ විශ්වවිද්‍යාලය

*kumudukr@yahoo.com*

පුරාවෘත්තයක් මෙන්ම පුරාණෝක්තියක් වශයෙන්ද ප්‍රචලිත මෝහිනිය පිළිබඳ ඓතිහාසික අර්ථකථනය නූතන සාහිත්‍යික නිර්මාණවලට වස්තු විෂයය වී ඇති ආකාරය අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණ පත්‍රිකාවෙහි මූලික අරමුණයි. 'මෝහිනි පුරාවෘත්තයෙහි නූතන සාහිත්‍ය නිරූපණය කෙබඳු ස්වරූප ගනීද?' යන්න ඒ සඳහා භාවිත කරගන්නා පර්යේෂණ ගැටලුවයි. ලාංකික ජනශ්‍රැතික විෂයයෙහි යක්ෂණියක් වශයෙන් ප්‍රචලිත මෝහිනිය පුරුෂයන් මුළා කරවන්නී යන අරුත් සහිතව තරුණයන් කෙරෙහි රති-කාම-ව්‍යාධි පහළ කරවීමෙහිලා ප්‍රකට මදන යකින්නියන්ගේ ප්‍රධාන යක්ෂණිය ලෙස හැඳින් වේ. 'මෝහය' යනු මුළාව යන අරුත්ද පළ කෙරේ. පුරුෂ පක්ෂය කෙරෙහි රෝග උපද්‍රව ඇති කරන්නේ යැයි විශ්වාස කරන 'මෝහිනී යක්ෂණිය', 'සූනියම් යක්ෂණිය' යනුවෙන් ශාන්ති කර්ම ක්ෂේත්‍රයට එක් වී ඇති බව අනුමාන කෙරේ. මහා භාරතයෙහි මෙන්ම සකු හා දේව පුරාණයන්හි 'මෝහිනී' නම් වූ සුරූපී දෙවඟන විෂ්ණුගේ වේෂයකි. ක්ෂීර සාගරය මථනයේදී මතු වූ අමෘතය, අසුරයන්ගෙන් උපක්‍රමශීලීව පැහැර ගෙන සුරයන් අතර බෙදා දීමෙහිලා මූලික වූයේ විෂ්ණු විසින් මවන ලද 'මෝහිනී' නම් දෙවඟන බව පැවසේ. අයියනායක දෙවියන්ගේ මව මෝහිනි ලෙස හැඳින්වෙන අතර, ඇය 'කිරි අම්මා' යනුවෙන්ද හැඳින් වේ. මෙරට ඇතැම් පළාතකදී මෙකී කිරිඅම්මාවරු මෝහිනියගේ අවතාර ලෙසද පිළිගැනේ. පොදුවේ ගත් කළ මෝහිනී යකින්න පුරුෂයන්ට උවදුරු පමුණුවයි. ගොම්මන් වෙලාවන්හි, සිව්මංසලවල, වතුර බසින තැන්වල, ගව පට්ටිවල, පාළු තැන්වල ඇය ගැවසේ. මෝහිනියගේ බැල්මට හසු වූ පිරිමින්ට සිහිනෙන් නිතර ධාතු පහවන බවද, ශරීරය කෘෂ වන බවද පොදු ජනයා විශ්වාස කරන අතර, මෝහිනි ඇතුළු විවිධ ජනශ්‍රැතිගත පුරාණෝක්ති නූතනකරණය සහ ජනප්‍රිය සංස්කෘතිය ආදි විවිධ කරුණු නිසා නව්‍ය වූ විෂයය තල ඔස්සේ ප්‍රතිඅර්ථකථනය වී ඇත. මෝහිනිය පිළිබඳ පුරාණෝක්තිය එසේ නව විෂය පරාස ඔස්සේ විවිධ සාහිත්‍යික නිර්මාණවලදී ප්‍රතිඅර්ථකථනයට ලක්වන බැවින් එය පර්යේෂණාත්මකව සාකච්ඡා කිරීම වැදගත් වේ. ඒ සඳහා අවශ්‍යය ගුණාත්මක සහ ප්‍රමාණාත්මක දත්ත ප්‍රාථමික, ද්වීතීයක සහ තෘතීයක මූලාශ්‍රය ඔස්සේ රැස්කරගන්නා අතර, විස්තරාත්මක ක්‍රමය සහ සාහිත්‍ය න්‍යායික විධික්‍රම ඔස්සේ සාකච්ඡා කිරීමට අපේක්ෂා කෙරේ. මෝහිනි පිළිබඳ පොදුජන විශ්වාසය ලාංකේය ස්ත්‍රියගේ සාමූහික විඥනයෙහි ප්‍රකාශනයක් නිරූපණය වනවා මෙන්ම නූතන සාහිත්‍ය විෂයයෙහි සමාජ, ආර්ථික, සංස්කෘතික, දේශපාලනික යන ක්ෂේතත්‍රයන්හි 'රූපකාත්මක' කියවීමකට ලක්කළ හැකි ජනප්‍රවාදගත පුරාණෝක්තියක් බව අවසානයේදී නිගමනය කළ හැකිය.

***ප්‍රමුඛ පදඃ*** *මෝහිනි, ජන විශ්වාස, සමාජ විඥනය, නව අර්ථකථන, පුරුෂාභියෝග*

# අවුරුදු ජන ක්‍රීඩා හා බැඳි පත්තිනි දේව ඇදහිල්ල පිළිබඳ අධ්‍යයනයක්

කේ. කේ. පී. එම්. ජයතිලක, එස්. ඩී. බොතේජු, ජේ. ඒ. අයි. සංදීපනී, එස්. එම්. හෙට්ටිආරච්චි

පුරාවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

*madarajayathilake@gmail.com*

කලාව යන්න මානව සංස්කෘතිය තුළ වැඩුණු විශේෂිත අංගයක් ලෙස පෙන්වාදිය හැකි ය. මෙය ආධ්‍යාත්මික සංස්කෘතික ක්ෂේත්‍රයක් ලෙස ගත් කල්හි මිනිසා තුළ පවත්නා සිතුම් පැතුම්, ඇදැහිලි විශ්වාස යනාදී සියල්ල ම මේ හා බද්ධ වන බව පෙනී යයි. රටක ජනතාව පිළිබද හදුනාගැනීමට ඔවුන් සතුව පවත්නා කලා ශිල්ප වැදගත් වෙයි. එම ජනතාව සමග අත්‍යන්තයෙන් බැදී පවත්නා ජන ක්‍රීඩා, නාටක, ජන නැටුම් හා ගායනා යන අංගයන්ට හිමිවනුයේ අද්විතීය ස්ථානය කි. මන්ද එකී ජන සමූහයන්ගේ නිර්ව්‍යාජත්වය හා ග්‍රාම්‍යත්වය යථාර්ථවත් කිරීමේ විශිෂ්ට හැකියාව ජන ක්‍රීඩා තුළ මනාව පෝෂණය වී ඇති බැවිනි. අවුරුදු ක්‍රීඩා හා බැදි ජන ක්‍රීඩා අතුරින් විශේෂිත වූ දේව ඇදැහිලි දැකගත හැකි ය. මෙම පර්යේෂණයේ පර්යේෂණ ගැටළුව අවුරුදු ක්‍රීඩා හා බැඳී පත්තිනි දේව ඇදැහිල්ල පිළිබද ව ගැමියා තුළ පවතින විශ්වාසය කෙබදු ද යන්න වන අතර මේ පිළිබඳව ගැමියන් අනුගමනය කරන සිරිත් විරිත්, චාරිත්‍ර වාරිත්‍ර, පුදපූජා පිළිබද අධ්‍යයනය කිරීම මෙහි පර්යේෂණ අරමුණ වෙයි. මෙම පර්යේෂණයේ දී අවුරුදු ක්‍රීඩා හා බැදී පවතින පත්තිනි දේව ඇදැහිල්ල පිළිබද ව අධ්‍යයනය කරනු ලැබේ. මෙහි දී අධ්‍යයන ක්‍රමවේදය ලෙස සාහිත්‍ය මූලාශ්‍ර අධ්‍යයනය, නිරීක්ෂණය හා පාරම්පරිකව මෙම ක්‍රීඩාවන් හි නිරත වන ගැමි ජනයා සමඟ සිදුකරන ලද සම්මුඛ සාකච්ඡා යන ක්‍රමවේද භාවිතා කරන ලදී. පුරාවෘත්තයන්හි දැක්වෙන ආකාරයට පත්තිනි දේව මැණියන් හා පාලඟ කුමරා උදෙසා කරනු ලබන මෙම ක්‍රීඩාවන්හි අරමුණ වනුයේ අස්වනු සරුසාර වී භවභෝග සම්පත් ලබා ගැනීම, ගමට සෙත්පැතීම, වසංගත රෝග වලින් ආරක්ෂා වීම මෙන්ම විනෝදාස්වාදය යි. පත්තිනි දෙවියන් මුල්කරගෙන පවත්වනු ලබන ජන ක්‍රීඩා 12ක් පවතින අතර අං කෙළිය, පොල් කෙළිය ප්‍රධාන තැනක් ගනී. මෙම ක්‍රීඩා දෙවියන්ගේ ක්‍රීඩා ලෙස ද හදුන්වයි. සුභ නැකැත් හෝරා පිළියෙළ කර පේවී යහන් සාදා තෝල්මුර කවි, ආශිර්වාද කවි කියා දේව ආශිර්වාදය ලබාගනිමින් කරන මෙම ජන ක්‍රීඩාවන්ගේ මුඛ්‍ය ලක්ෂණය වන්නේ පූජාර්ථය යි. එය විනෝදාර්ථය අතික්‍රමණය කරමින් සමස්ත ක්‍රීඩාවන් පුරා ම පැතිර පවතින්නකි. ගැමියන්ගේ විශ්වාසය වනුයේ දේව ක්‍රීඩා නිසියාකාරව සංවිධානය වූයේ නැතහොත් මරණයට පවා භාජනය වීමට ඉඩ ඇති බවයි. මෙම ක්‍රීඩාවේ දී පත්තිනි දෙවියන් ද ක්‍රීඩාවට හවුල් වෙතියි විශ්වාසයක් ගැමියන් තුළ පවතී. මෙම ක්‍රීඩාවන් අතීතයේ දී සංස්කෘතික මංගල්‍යක් ලෙස නොකඩවා වාර්ෂිකව පවත්වා ඇතත් වර්තමානය වන විට ජන සමාජය තුළ පවත්නා විවිධ ගැටලු හේතුකොටගෙන කෙමෙන් අභාවයට යාමක් පෙන්නුම් කෙරෙතත් නාගරීකරණයට ලක්නොවූ ග්‍රාමීය සමාජය තුළ අදටත් දැකගත හැකි ය.

***ප්‍රමුඛ පදඃ*** *පත්තිනි ඇදැහිල්ල, අවුරුදු ක්‍රීඩා, ජන ක්‍රීඩා, නැකැත්, සංස්කෘතිය*

# වැදි ජන ශාන්තිකර්මයක් වන කිරිකොරහ නැටීමෙහි කාලානුරූප විචල්‍යතා පිළිබඳ මානව විද්‍යාත්මක අධ්‍යයනයක් (ඌව පළාතේ දඹාන වැදි ජන සමාජය ඇසුරින්)

එස්. ඩබ්ලිව්. පී. කුමාර

*swpkumara84@gmail.com*

ඌව බින්තැන්න ප්‍රදේශයේ වැදි ජනතාව අතීතයෙහි දී කිරිකොරහ නැටීම උත්සව ශ්‍රීයෙන් පවත්වා ඇත්තේ ප්‍රධාන වශයෙන් දඩයම් සාර්ථක කරගැනීම සහ ලෙඩරෝගවලින් ආරක්ෂාවීම සඳහා කන්දෙ යකා සහ බිළිඳු යකා වෙනුවෙනි. වැදි ජන ශාන්තිකර්මයක් වන කිරිකොරහ නැටීමේ කාලානුරූප විචල්‍යතා හඳුනාගැනීම පර්යේෂණයේ මුඛ්‍ය පරමාර්ථය විය. පර්යේෂණයේ කේන්ද්‍රීය ගැටලුව වූයේ වැදි ජන ශාන්තිකර්මයක් වන කිරිකොරහ නැටීමෙහි කාලානුරූප විචල්‍යතා මොනවා ද? යන්නයි. ඌව බින්තැන්න ප්‍රදේශයේ දඹාන ගම්මානය පර්යේෂණ ක්ෂෙත්‍රය ලෙස යොදාගනු ලැබූ අතර වැදි ජන නායකයන් ද ඇතුළත්ව කිරිකොරහ ශාන්තිකර්මයෙහි ප්‍රවීණතාවක් සහිත පුද්ගලයන් 30 දෙනෙකු නියැදියට ඇතුළත් කරගනු ලැබිණ. සහභාගීත්ව නිරීක්ෂණය, ගැඹුරු සම්මුඛ සාකච්ඡා, ඉලක්ක කණ්ඩායම් සාකච්ඡා මඟින් ප්‍රාථමික දත්ත රැස්කරගනු ලැබිණ. වර්තමානයේ වැදි ජනයා හේන් මෑ, ගොඩ වී, වට්ටක්කා, කුරක්කන්, මිරිස්, බටු යනාදී එළවළු සහ ධාන්‍ය වගාකරනු ලබන අතර එම ගොවිතැන් කටයුතු සාර්ථක කරගැනීම සඳහාත් ලෙඩරෝගවලින් තම ගම්වාසීන් ආරක්ෂා කරගැනීම සඳහාත් කිරිකොරහ ශාන්තිකර්මය පවත්වනු ලබයි. ඊට අමතරව කිරිකොරහ ශාන්තිකර්මයක් තම ගමට සිදුකර දෙන මෙන් මහා සමාජයෙන් යම් ඉල්ලීමක් පවතින අවස්ථාවන්හි දී මුදල් අයකිරීම මත බොහෝවිට හයදෙනෙකුගෙන් යුත් වැදි කණ්ඩායමක් ගොස් මුළු ගමටම කිරිකොරහ ශාන්තිකර්මය සිදුකරනු ලබයි. එය හුදෙක් සිදුකරනු ලබන්නේ මූල්‍ය පරමාර්ථයෙනි. එක් ගමකට එවැනි ශාන්තිකර්මයක් සිදුකිරීම සඳහා වර්තමානයේ රු. 50,000.00 ක් වැනි මුදලක් අයකරනු ලබයි. කිරිකොරහ සඳහා වර්තමානයේ මැටි බඳුනක් භාවිත කරනු ලැබුව ද අතීතයේ ලබු කැටේ හෝ පොල්කටුවක් භාවිත කර ඇත. වර්තමානය වනවිට කිරිකොරහ ශාන්තිකර්මය නැටීමේ දී අවශ්‍ය තාල ලබාදීම සඳහා වඳුරු හමක් හෝ රිලා හමක් භාවිත කර සාදාගත් බෙරයක් හෝ දවුලක් භාවිත කළ ද අතීතයේ දී බෙනය සහිත වෙලං කොටයක් ගෙන වෙලං පොලු දෙකකින් එයට ගසමින් කිරිකොරහ නැටීමේ දී අවශ්‍ය තාල ලබා දී ඇත. වර්තමානයේ වුව ද පූජාවට ගන්නා ලද කිරිකොරහේ කිරි යාගය අවසානයේ දී සතුන්ටවත් නොගෙන වලදැමීම සිදුකරනු ලබන්නේ අතීතයේ මෙන් ඊට ගරුකිරීමක් වශයෙනි. වැදි ජන සමාජයේ සශ්‍රීකත්වය, ජන සමාජයේ සාමාජිකයින්ගේ යහපත සහ දඩයම්වල සාර්ථකත්වය සඳහා වර්තමානයේ කිරිකොරහ නැටීම ස්වකීය අනන්‍යතාව ආරක්ෂා කරගනිමින් සිදුකරන බවත් වැදි ජන සාමාජිකයින් නොවන මහා සමාජයේ සාමාජිකයින් උදෙසා ද වර්තමානය වන විට මූල්‍ය පරමාර්ථය ඇතිව කිරිකොරහ ශාන්තිකර්මය පවත්වනු ලබන බවත් නිගමනය කළ හැකිය.

***ප්‍රමුඛ පද:*** *ඌව බින්තැන්න, වැදි ජන සමාජය, කිරිකොරහ ශාන්තිකර්මය*

# නානුමුර මංගල්‍යය පිළිබඳව මානව විද්‍යාත්මක අධ්‍යයනයක්

කේ. ඒ. සී. සී. ආනන්ද, එම්. ආර්. ගුණරත්න

මානව විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

*chamathsame@gmail.com*

අනාදිමත් කාලයක පටන් පූජා චාරිත්‍ර සහ අභිචාර මානව සමාජ තුළ විකාශනය වී ඇත. පූජා චාරිත්‍ර සහ අභිචාර මනුෂ්‍යයා මෙන්ම සංස්කෘතීන් සමඟද ප්‍රබලව බද්ධ වී තිබේ. ඒ අනුව සිංහල සමාජය තුළ ක්‍රියාත්මක වන නානුමුර මංගල්‍යය, ශ්‍රී ලාංකේය සංස්කෘතියට අනුගතව බෞද්ධාගමික පසුබිමක් තුළ කැපී පෙනෙන චාරිත්‍රයක් ලෙස හඳුනාගත හැකිය. නානුමුර මංගල්‍යය තුළින් සිදුවන්නේ ජීවමාන බුදුරදුන් ආනන්ද තෙරුන් වහන්සේ විසින් ස්නානය කරවූ ආකාරය සංකේතවත් කරමින් ත්‍රිවිධ චෛත්‍යයන් නැහැවීමයි. නානුමුර මංගල්‍යය සිංහල සමාජය තුළ ක්‍රියාත්මක වීමට බලපෑ සාධක මොනවාද යන්න මෙම පරියේෂණයේ පර්යේෂණ ගැටලුවයි. පර්යේෂණයේ අරමුණු වන්නේ නානුමුර මංගල්‍යයේ නිෂ්පත්තියට බලපා ඇති සාධක හඳුනා ගැනීම සහ අනෙකුත් බෞද්ධ චාරිත්‍ර අතුරින් නානුමුර මංගල්‍යයට හිමිවන ස්ථානය අවබෝධ කර ගැනීමයි. පර්යේෂණ ගැටලුව අධ්‍යයනය කිරීමේ ප්‍රධාන ක්‍රමවේදය ලෙස පුස්තකාල පරිශීලනය තුළින් ද්විතියික ලිඛිත මූලාශ්‍ර දත්ත පදනම් වූ නමුත් එම කරුණු තහවුරු කර ගැනීමට සම්මුඛ සාකච්ඡා හා ඍජු නිරීක්ෂණ යොදා ගන්නා ලදී. සිංහල බෞද්ධ සමාජය තුළ පවිත්‍රත්වය, පාරිශුද්ධිය හා සශ්‍රීකත්වය මූලික කොට ගනිමින් නානුමුර මංගල්‍යය සිදු කරනු ලබයි. ශාරීරික, උද්දේසික, පාරිභෝගික යන ත්‍රිවිධ චෛත්‍යය මූලික කොට ගනිමින් සිදු කරනු ලබන නානුමුර මංගල්‍යය ගැමියාගේ නොමඳ ගෞරවයට පාත්‍ර වන්නකි. අදෘශ්‍යමාන බලවේග පිළිබඳව නිරන්තරයෙන් විශ්වාස කළ ගැමියා ශාන්ති කර්මයක් වන රිද්දි යාගය තුළ ද නානුමුරය නාට්‍යමය ජවනිකාවක් ලෙස ද යොදා ගෙන ඇත. තවද දෙවොල්මඩු ශාන්ති කර්මය සිදු කිරීමට ප්‍රථමව පේ වූ යකැඳුරන් නානුමුරය හෙවත් තොට මෙට යාම සිදු කරනු ලබයි. එයින් ද නිරූපණය වන්නේ පවිත්‍රත්වය, පාරිශුද්ධිය සහ සශ්‍රීකත්වය යි. සංස්කෘතික වෙනස් වීම අධ්‍යයනය කිරීමේ දී සංස්කෘතික විසරණය සහ සංස්කෘතික සම්පර්කය යන සංකල්ප බොහෝ චාරිත්‍ර නිර්මාණය වීමේ සහ වෙනස් වීමේ යාන්ත්‍රණයක් ලෙස හඳුනා ගත හැකිය. ඒ අනුව ප්‍රාග් බෞද්ධ ලාංකික සමාජය තුළ ක්‍රියාත්මක වූ ශිව ඇදහිල්ල සමඟ නිර්මාණය වී ඇති ශිව ලිංගය නැහැවීමේ චාරිත්‍රය ද, වෘක්ෂ වන්දනාව ද බෞද්ධාගමිකයන් ඇසුරේ නානුමුර මංගල්‍යය ප්‍රභවය ලැබීමට හේතු සාධක විය හැකිය. මන්ද උක්ත චාරිත්‍ර ද්විත්වය හරහාම සාධනය වන්නේ පොදු අරමුණු නිසාවෙනි. හින්දු ජනයා නිර්වස්ත්‍රව පාන්දර යාමයේ ශිව ලිංගය කිරි වලින් නහවීමද බෞද්ධ සංකල්ප සමඟ බද්ධ වීමේදී එකී චාරිත්‍රයට සැළකිය යුතු ශිෂ්ඨත්වයක් ලැබී ඇති බව සාකච්ඡාවට බඳුන් කළ හැකිය. එසේම බෝධිය නැහැවීමේ චාරිත්‍රයෙහි ක්‍රමික විකාශනයක් ලෙස ද නානුමුර මංගල්‍යය සමාජ සංස්කෘතික සාධක පදනම් කර ගනිමින් නිර්මාණය වන්නට ඇතැයි උපකල්පනය කළ හැකිය. ඉහත ප්‍රතිඵල හා සාකච්ඡා මත පදනම් වෙමින් හින්දු ආගමික සංකල්ප, ප්‍රාග් බෞද්ධ වෘක්ෂ වන්දනාව මෙන්ම සිංහල සමාජයේ අගනාකම් පර්යේෂණ ගැටලුව කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා ඇති බව නිගමනය කළ හැකිය.

***ප්‍රමුඛ පද :*** *නානුමුරය, පූජා චාරිත්‍ර, සංස්කෘතික සංකල්ප, සිංහල සමාජය, හින්දු ආගමික සංකල්ප*

# ශ්‍රී ලාංකේය සංස්කෘතිය හා බැඳුණු මෝහිනී සංකල්පය

ඩබ්ලිව්. වී. පී.එච් රණවීර, එච්. පී. ඒ. සුලෝචනා

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

*himalika@sjp.ac.lk*

හොල්මන්, අවතාර, ප්‍රේත හා භූත බලවේග යනු ලොව සැම සමාජයකම ජන විඥ්ඥාණගත ගූඪ විශ්වාසයන්ය. 'මෝහිනී අවතාරය' ද ශ්‍රී ලාංකේය සංස්කෘතියෙහි ප්‍රකට එවැනි එක් ගුප්ත විද්‍යාත්මක සංකල්පයකි. 'මෝහිනී' යන පදය සිත් පහදවන, වශී කරවන කාන්තාව යන අරුතින් යෙදේ. හින්දු පුරාණෝක්තීනට අනුව මෝහිනී යනු විෂ්ණු දෙවියන්ගේ සුවිශේෂී අවතාරයකි. සුර අසුර ගැටුම් අවස්ථාවලදී මෝහිනිය නපුරු අසුරයන් පරාජය කොට සුරයන්ට(දෙවියන්ට) ජය අත් කොට දෙන්නේ සිය රූපශ්‍රීයෙන් ඔවුන් මුළාකොට වසඟයට පත් කරමිනි. එහෙත් දේශීය සන්දර්භය තුළ මෝහිනිය යනු විශේෂයෙන්ම පුරුෂයන් බියට පත් කරවන භයානක භූතාත්මයකි. මෝහිනී සංකල්පය හා බැඳුණු හින්දු ආගමික විශ්වාස හා ලාංකේය ජන විශ්වාස අතර ඇති සම විෂමතා අධ්‍යයනය කිරීමත්, ලාංකේය සංස්කෘතිය තුළ මෝහිනී සංකල්පය විකාශනය වීමට බලපෑ සමාජ සංස්කෘතික සාධක හඳුනා ගැනීමත් මෙම අධ්‍යයනයෙහි මූලික අරමුණු වේ. දේශීය වශයෙන් මෝහිනී සංකල්පය සමාජගත වීමේ දී ඊට හින්දු ආගමික පුරාණෝක්තීන්හි බලපෑමක් පවතී ද? යන්න අධ්‍යයන ගැටලුව විය. මෙය මානවවංශ පර්යේෂණ යටතට ගැනෙන අධ්‍යයනයක් වන අතර, දත්ත විශ්ලේෂණයේදී ගුණාත්මක ක්‍රමවේදය යොදා ගනිමින් උද්ගාමී තර්කන ක්‍රමය යටතේ නිගමනවලට එළඹිණ. මෙහිදී ජනශ්‍රැති අධ්‍යයනය ප්‍රධාන විය. ශ්‍රී ලංකාවේ ප්‍රධාන පළාත් කිහිපයක් ආවරණය වන පරිදි භූත විද්‍යාව පිළිබඳ විශේෂඥයන් සමග සම්මුඛ සාකච්ඡා පැවැත්වීමත්, පුස්තකාල අධ්‍යයනය යටතේ ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය පරිශීලනයත් සිදු කැරිණි. ලාංකේය ජන විශ්වාසයට අනුව මෝහිනිය යනු සුදු වස්ත්‍රයක් හැඳ, දරුවෙකු අත දරා සිටින රූමත් ළඳකි. ඇය මධ්‍යම රාත්‍රියේ සොහොන් පිටි හා පාළු ස්ථානවල සැරිසරන භූත ආත්මයකි. මෝහිනි අවතාරය අභිචාරාත්මක විශ්වාසයක් වශයෙන් ව්‍යාප්ත වෙමින් විවිධ ආකාරයෙන් පොදු ජන විඥ්ඥාණය හා බද්ධ වී තිබේ. නුවර කලාවියෙහි ජනශ්‍රැතියක දැක්වෙන්නේ දරුවෙකු සහිත විවාහක ස්ත්‍රියකට ඇති වූ අසාධාරණයකට එරෙහිව  පලිගැනීම සඳහා මරණින් මතු ඇය නැවත මෝහිනී අවතාරයෙන් උපත ලැබූ බවයි. දේශීය ශාන්තිකර්ම ආශ්‍රිතව ද මෝහිනිය සම්බන්ධ විවිධ කථා ප්‍රවෘත්ති පවතී. මෝහිනිය පිළිබඳ භාරතීය හා ලාංකේය හඳුනාගැනීම ආකෘතිමය වශයෙන් සමානතා ප්‍රකට කළ ද සංකල්පීය වශයෙන් එකිනෙකට පරස්පරය. සිංහල සමාජයෙහි මෝහිනිය යනු දේවත්වය හා සම්බන්ධයක් නොමැති පුරුෂයන් බිය ගන්වන භූත බලවේගයකි. ප්‍රකෘති ලෝකයෙහි කාන්තාවට හසුරවන්නට නොහැකි වූ බලවේගයන් වක්‍රාකාරයෙන් සිය පාලනයට නතු කර ගැනීමක් සඳහා මෝහිනී සංකල්පය ස්ත්‍රී භූතාත්මයක් ලෙස ගොඩනැගී ඇති බව ජනශ්‍රැති අධ්‍යයනයෙන් පැහැදිලි විය. ශ්‍රී ලංකාවෙහි ප්‍රචලිත එය හින්දු ආගමික සන්දර්භයෙන් වියුක්තව දේශීය සමාජ සංස්කෘතික පසුබිමක් තුළ ගොඩනැගුණක් බව අධ්‍යයනයෙන් අනාවරණය විය.

***ප්‍රමුඛ පදඃ*** *ගුප්ත විශ්වාස, හොල්මන්, සූනියම් යක්ෂණිය, ජනශ්‍රැති, පුරාණෝක්ත*

# සම්ප්‍රදායික ගැමි සමාජයේ හේන් ගොවිතැන හා බැඳුනු ඇදහිලි හා විශ්වාස පිළිබඳ මානව විද්‍යාත්මක අධ්‍යයනයක්

ජී. ආර්. එස්. එච්. රණසිංහ, එච්. ජී. එච්. එස්. හද්දැල, ආර්. එම්. සී. එම්. රත්නායක

මානව විද්‍යා අධ්‍යනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

*grshranasinghe@gmail.com*

ලෝකයේ විවිධ ජන සමාජවල මෙන් ම ශ්‍රී ලාංකේය ජන සමාජයේ ද ප්‍රධානම ආර්ථික කටයුත්ත ලෙස කෘෂිකර්මාන්තය ප්‍රමුඛස්ථානයක් ගනියි. එයින් ගොඩ-මඩ ආදී ලෙස කෙරෙන කෘෂිකාර්මික කටයුතුවල ගොඩ ගොවිතැන අතර ලංකාවේ හේන් ගොවිතැනට මුල් තැනක් ලැබේ. හේන් වගාව යනු 'වියළි කාලයේ කැලෑ කැපීම, ගිනි තැබීම, අවම මට්ටමේ බිම් සකස් කිරිමක් තුළින් වර්තමාන කාලයේ බෝග වගා කිරිමෙන් පසේ සරු බව හීන වු විට එනම්, කන්න කිහිපයකින් පසු සිදුකරන කෘෂිකාර්මික කටයුත්තකි'. මෙම වගා කටයුතු සිදු කිරිමේ දී ගොවින් විසින් සම්ප්‍රදායික ඇදහිලි-විශ්වාස උපයුක්ත කරගනු ලබයි. සම්ප්‍රදායික ගැමි ජන සමාජය තුළ පැවති ඇදහිලි විශ්වාසයන් වර්තමාන සමාජය තුළ පවතී ද යන්න පර්යේෂණ ගැටලුව යි. මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ සම්ප්‍රදායික ගැමි සමාජයේ පැවති ඇදහිලි, විශ්වාසයන් අතරින් හේන් ගොවිතැන හා බැඳුණු ඇදහිලි, විශ්වාසයන් මොනවා ද යන්න පිළිබඳව මෙන් ම උපඅරමුණු ලෙස මෙම ඇදහිලි, විශ්වාසයන් වර්තමානයේ ඒ ආකාරයෙන් ම සමාජය තුළ පවතිනවා ද යන්නත් ඒ මගින් ඔවුන් අපේක්ෂිත ප්‍රතිඵල ළඟා කරගැනීමට හැකි වී තිබෙනවා ද යන්න පිළිබඳවත් මානව විද්‍යාත්මක දෘෂ්ටිකෝණයෙන් අධ්‍යයනය කිරිම යි. මෙම පර්යේෂණය සඳහා යොදා ගත් ක්‍රමවේදය වශයෙන් අනුරාධපුර දිස්ත්‍රික්කයේ 'නාවක්කුලම' ගම්මානයේ ජීවත් වන පවුල් 65 ක් අතරින් හේන් වගා කටයුතුවල නියැලෙන පවුල් 15ක් අහඹු නියැදිය ලෙස ගෙන අවිධිමත් සම්මුඛ සාකච්ඡා ක්‍රමය යටතේ දත්ත රැස් කරන ලදි. මෙම අධ්‍යයනය මගින් ලබාගත් දත්ත දෙස අවධානය යොමු කරන්නේ නම්, හේන් වගාවේ දී ගොවිහු ස්වභාවික පරිසරයෙන් වගාවන්ට රැකවරණය පැතී හ. එහි දී ගොවිහු හේනේ වල් කැපීමට පෙර 'බහිරව දෙවියන්ට, පුල්ලෙයාර් දෙවියන්ට' බාරහාර වී අවසර ඉල්ලති. අවිච්චියාගේ හඬ ඇසෙන දිශාව සහ දවස අනුව වගා කටයුතු සිදුකිරිමේ සුදුසු නුසුදුසු බව ගොවිහු තීරණය කරන ලදි. එමෙන් ම වගාවන් වන සතුන්ගෙන් ආරක්ෂා කර ගැනීමට 'පැඟිරි කෙටීම' ත් අලි වැනි සතුන් එළවා දැමීමට අලි එළවීමේ මන්ත්‍ර පවා භාවිතා කරනා බවක් මෙම අධ්‍යයනයෙන් දැන ගැනීමට හැකි විය. මෙම පර්යේෂණය තුළින් අතීත හේන් වගාව ආශ්‍රිත ව පැවතියා වූ ඇදහිලි, විශ්වාස පද්ධතිය වර්තමානය තුළ ඒ ආකාරයෙන් ම පවතිනවා යැයි කිව නො හැකි බවත් යම් දුරකට එය පවතින ආකාරයත්, ඇතැම් විශ්වාසයන් වර්තමානයේ විද්‍යාත්මකව ප්‍රකාශ කරනු ලබන අනාවැකිවල නිවැරදි බවට සාපේක්ෂව (කාලගුණ අනාවැකි) ගැමි සමාජය තුළ පවතිනා මෙම ඇදහිලි විශ්වාස පිළිබඳ නිවැරදි විශ්වාසයක් ගොවියන් අතර පවතින බව මෙම පර්යේෂණය මගින් තහවුරු කර ගැනීමට හැකි විය.

***ප්‍රමුඛ පදඃ*** *හේන් ගොවිතැන, ඇදහිලි-විශ්වාස, සාම්ප්‍රදායික, පැඟිරි කෙටීම, මන්ත්‍ර*

## ජනශ්‍රැතිය, සූනියම් යාගය හා එහි සමාජ මානව විද්‍යාත්මකභාවය

එස්. ඒ. ඩි. එස්. අමරසිංහ, වයි. එම්. එස්. පි. යාපා, පී. පී. ඩි. එස්. බංඩාර, ටැම්පිටියේ පාලිත හිමි

මානව විද්‍යා අධ්‍යනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

*sanjeewanida81492@gmail.com*

ජනශ්‍රැතිය මානව ශිෂ්ටාචාරයේ ඥාන කෝෂ්ඨාගාරය වන අතර එහි ප්‍රභවය මූලෝත්පාදනය වන්නේ සාමූහික උපතකිනි. අනාදිමත් කාලයක සිට මිනිසා ක්‍රමානුකූල චින්තනය පිළිබඳ අභ්‍යාසයකින් ගොඩනගන ලද සාමූහික ඥානය වනාහි පිරමීඩයක් බවට පත් වන්නේ ජනශ්‍රැතියත් සමඟිනි. සිංහල ජන ශාන්ති කර්ම අතර මනා ශික්ෂණයක් සහිත ශාන්ති කර්මයක් වශයෙන් පහතරට ප්‍රදේශයේ පවතින්නා වූ සූනියම් යාගය ප්‍රධාන තැනක් ගනී. සූනියම් යාගය, වින ශාන්තිය ආදී නාමයන්ගෙන් හඳුන්වනු ලබන මෙකී ශාන්ති කර්මයේ දේව ස්වභාවයක්, ශාන්තිමය සුවතාවයක් පෙරදැරිව පවතී.මෙම ශාන්ති කර්මය සිදු කිරීම අධ්‍යයනයට ලක් වූයේ නිරීක්ෂණය සහ සම්මුඛ සාකච්ජාව මගින්ය.ගල්ගමුව සිලඹලෑව ග්‍රාමය ඇසුරින් මෙකී පර්යේෂණය විවරණාත්මක පර්යේෂණ කාණ්ඩය යටතේ සිදු කරන ලදී. ජන විශ්වාසයට අනුව ගවර,තුරග, සූකර ආදී සතුන් පිට නැගී නරලොව ඇවිදීමට වරම් ලබා ඇති සූනියම් යක්ෂයා හෙවත් ඔඩ්ඩි යකා එක් අතකින් පුස්කොලයකින්ද, අනෙක් අතින්  මුගුරකින්ද, ගිනි කබලක්ද දරා සිටින බව කියැවේ. විශේෂත්වය නම් සූනියම් දේවතාවන් විසින් ආතුර පක්ෂය මෙන්ම යකැදුරු පක්ෂයද ආරක්ෂා කරන බැවින් මෙම යාතුකර්මය ආරම්භයේදී ඔහුට ආරාධනා කිරීම සහ දොළ පිදේනි වෙන් කිරීමයි. සූනියම යනු විනය හෙවත් කොඩිවිනය වන අතර කැපුම යනු එම කොඩිවිනය, තුලින් පුද්ගලයා නිදහස් වීමයි. යමෙකු විසින් තවකෙකුට කරනු ලබන සූනියම් සහ කිසිවෙකුගේ මැදිහත්වීමක් නොමැතිව, නොදැනුවත්ව ඇති වන්නා වූ සූනියම් වශයෙන් සූනියම් වර්ග දෙකකි. ඊර්ෂ්‍යා සහගත මානුෂීය හැඟීම්, පළිගැනීමේ අවශ්‍යතා සූනියම් හෙවත් කොඩිවින කිරීමේ ක්‍රියාදාමයට මූලික වේ. එහිදී අදාළ පුද්ගලයාගේ, හිසකෙස්, කඳුළු මෙන්ම මිනී අළු යොදා ගැනීමක් දක්නට ලැබේ. ශාන්ති කර්මය සඳහා නිමවන ලද අටමගල වීදිය ප්‍රමුඛස්ථානයක් ගන්නා අතර සූනියම් වීදිය,යක්ෂයන්ට දොළ පිදේනි පිදීම සඳහා සකස් කරනු ලබන ස්ථානයක් වශයෙන් ප්‍රධාන වේ. සවස 6.00ට පමණ ආරම්භ වන යාගය පළමුවෙන් බුද්ධ වන්දනාව සිදු කරීමෙන් පසු සූනියම් යක්ෂයාටත්, නවග්‍රහයින්ටත්, ඇතුළු අරක්ගෙන සිටින සියළුම කොටස් වලටත් ආරාධනා කරනු ලබයි. අනතුරුව මල් අස්න නැටීම, හත් අඩියට පඬුරු තැබීම, තීන්දු කැපීම, දොළ පිදීම ආදී ක්‍රියාදාමයක් සහිතව ශාන්ති කර්මය අවසන් කරනු ලබයි . ස්වකීය ජන ජීවිතයේ ආරක්ෂාව සහ දියුණුවු සලසා ගැනීම යන කරුණු වෙනුවෙන් වර්ථමානයේදී නෙයෙකුත් තාක්ෂණික ක්‍රම හදුන්වාදී තිබුනද ඇදහලි විශ්වාස කෙම් පහන් ක්‍රම සහිත සූනියම් යාගමය ක්‍රමවේදය භාවිතය පිළිබද වත්මන් පරම්පරාවෙහි සමාජිකයින් නොදැනුවත්ය. ඒ අනුව සාම්ප්‍රධායික සූනියම් යාගමය චාරිත්‍ර අංගයන් හා සම්බන්ධ දැනුම් පද්ධතීන් ක්ෂීන වීම වැළක්වීමේ අරමුණින් විසිරී ඇති මෙම චාරිත්‍රමය අවස්ථා පිළිබද පර්යේෂණ කොට අනාවරණය කර ගන්නා තොරතුරු ආශ්‍රයෙන් පොත්පත්,ලිපි ලේඛණ සකස් කිරිම සහ ඒවා අන්තර්ජාලය වැනි මාධ්‍යයන්ට මුදා හැරීම කලෝචිතය.

***ප්‍රමුඛ පද:*** *දොළ පිදේනි, අටමගල වීදිය, ඔඩ්ඩි යකා, කොඩි විනය, හත් අඩිය*

# සූනියම් ඇදහිල්ල තුළ නිරූපණය වන්නේ යක්ෂයෙක් ද, දේවතාවෙක් ද යන්න පිළිබඳ මානව විද්‍යාත්මක අධ්‍යයනයක්

කේ. ඒ. සී. සී. ආනන්ද, එම්. හිත්තැටියගේ, ඕ. වී. ඒ. ජයනන්ද, පී. ආර්. පී රණසිංහ

මානව විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

*chamathsame@gmail.com*

පුරාතනයේ සිටම අදෘශ්‍යමාන බලවේග පිළිබඳ විශ්වාස කිරීම ගැමි ජනයාගේ සම්ප්‍රදායයි. තරහව, ඊර්ෂ්‍යාව, වෛරය ආදී ස්වභාවික මනෝභාවයන් පදනම් කර ගනිමින් අනවින, කොඩිවින වැනි ගුප්ත ශාස්ත්‍ර ප්‍රභවය ලැබීමත් ව්‍යාප්ත වීමත් සිදුව ඇත. ගුප්ත විද්‍යාත්මක ශූන්‍යකර්මවලට අධිපතීත්වය දරන්නේ සූනියම් අවතාරයයි. ශ්‍රී ලංකාවේ සූනියම් ඇදහිල්ල කෝට්ටේ රාජ්‍ය පාලනය පැවති සමයේ දකුණු ඉන්දියානු සම්භවයක් සහිතව මෙරටට පැමිණි බව පොදු මතයයි. අතීතයේ සිට වර්තමානය දක්වා සූනියම් ඇදහිල්ල අප රටේ නොමඳ විශ්වාසයට බඳුන් වන්නේ හේතු ගණනාවක් මුල්කර ගනිමිනි. ලාංකීය ජන සමාජයේ සූනියම් ඇදහිල්ල තුළ නිරූපණය වන්නේ යක්ෂ සංකල්පයක් ද, නැතහොත් දේව සංකල්පයක් ද, යන්න මෙම පර්යේෂණයේ පර්යේෂණ ගැටලුවයි. පර්යේෂණයේ ක්‍රමවේදය අංශ කිහිපයක් යටතේ සිදු කළ අතර පුස්තකාල පරිශීලනය සහ සම්මුඛ සාකච්ඡා ක්‍රමය උපයෝගී කර ගනු ලැබීය. මෙහිදී බෙන්තර ගුරු පරම්පරා දෙකක් වන පරවාහැර සෝමතිලක සහ පරවාහැර චන්ද්‍රසිරි ගුරු පරම්පරා දෙක සම්මුඛ සාකච්ඡාවට බඳුන් කරන ලදී. ඒ අනුව සූනියම් සංකල්පය ලාංකීය ජන සමාජය තුළ කොතරම් දුරට මුල් බැසගෙන ඇද්ද යන්න සහ සූනියම් යක්ෂයෙක් හෝ දෙවියෙක් ලෙස හැඳින්වීමට පාදක වූ හේතු සාධක විමර්ශනය කිරීම මෙම පර්යේෂණයේ මූලික අරමුණයි. සූනියම් සංකල්පය පිළිබඳව විවිධ මතයන් ගැමි ජන සමාජය තුළ නිර්මාණය වී ඇත. ඒ අනුව සූනියම් අවතාරය අඩමසක් යක්ෂ වේශයෙන් ද, ඉතිරි අඩමස දේවාවේශයෙන් ද, පෙනී සිටිතැ'යි මතයක් පවතී. සිංහල විශ්ව කෝෂයෙහි දැක්වෙන පරිදි අමාවක පසු වූ තැන් සිට එළඹෙන පුර පක්ෂයේ දී සඳ මෝරන අතර, සූනියම් සෞම්‍ය ගතිගුණ වලින් හෙබි දෙවියෙකු ලෙස පෙනී සිටිමින් බැතිමතුන්ගේ කන්නලව් වලට සවන් දෙයි. එමෙන්ම අවපක්ෂයේ දී ඔහු ක්‍රමයෙන් රෞද්‍ර වෙස් ගනී. ගැමි සමාජ වල අතීතයේ මෙන්ම අදටත් සඳ අවපක්ෂය ගත කරන කාලයේදී ගැහැණු තනිව දරට, දියට යාමෙන් වැලකී සිටියේත් අඳුර වැටුණු පසු දරුවන් එළියට පහලියට නොයැවුවේත් සූනියම් යක්ෂයාගේ බැල්ම වැටෙති'යි යන බියෙනි. සූනියම් යක්ෂ අවතාරය මුල්කර ගනිමින් හදිහූනියම්, පිල්ලි වැනි දරුණු ක්‍රියා සිදු කරන අතර සූනියම් දේව සංකල්පය ප්‍රමුඛ ලෙස සාධනය වන්නේ ගම් ආරක්ෂා කිරීමට පැවරුණු ගම්බාර දේව ඇදහිල්ල මුල්කොට ගනිමිනි. සිංහල ජන සමාජය තුළ ඒ ඒ අවශ්‍යතාවන්ට අනුගත වෙමින් යක්ෂ, දේව යන සංකල්ප පදනම් කොට ගනිමින් සූනියම් ඇදහිල්ල ස්ථාපිත වී ඇත. ලාංකීය ජන සමාජයේ සමාජ සංස්කෘතික සාධක සූනියම් සංකල්පය පෝෂණය කිරීමෙහිලා ඉමහත් දායකත්වයක් සපයා ඇති අතර සූනියම් අවතාරය තුළ ඇති යක්ෂ, දේව සංකල්ප හුදෙක් ගැමි ජනයාගේ අවශ්‍යතාවන් පූර්ණය කිරීමෙහිලා ගොඩ නැගුණා වූ ජනශ්‍රැතියේ මහඟු ප්‍රතිඵලයක් ලෙස සමස්ත පර්යේෂණය තුළින් නිගමනය කළ හැකිය.

***ප්‍රමුඛ පද :*** *සූනියම් ඇදහිල්ල, අදෘශ්‍යමාන බලවේග, ගැමි විශ්වාස, කළු අභිචාර, ජනශ්‍රැතිය*

# කිරි ඉතිරවීමේ මංගල්‍යය පිළිබඳ ජනශ්‍රැති විද්‍යාත්මක අධ්‍යයනයක් (පොළොන්නරු පුරවරයේ කොටුවෙල ග්‍රාමය ඇසුරෙන්)

එම්. සී. හෙරත්, ඒ. එම්. දසනායක, එන්. කාන්තිලතා

මානව විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

*tomalki92@gmail.com*

ජනශ්‍රැතිය තුළ අඩංගු වන්නේ අපගේ ගැමියන්ගේ සුන්දරාත්මක අත්දැකීම්ය. ජනශ්‍රැතියක් යනු ඓතිහාසික වශයෙන් අප දන්නා යුගවලටත් පෙර සිට ම මුඛ පරම්පරාවෙන් සහ මනුෂ්‍ය චර්යාවන්ගෙන් පැවත එන පරිපූර්ණ අඛණ්ඩ සංස්කෘතිකාංග සහ සම්ප්‍රදායන් රැසකි. ජනශ්‍රැති අංග රාශියක් පවතින අතර ඉන් අභිචාර ක්‍රමයන්ට හිමිවන්නේ සුවිශේෂී ස්ථානයකි. කොළඹ සිට කිලෝමීටර් 215 දුරින් පිහිටි ග්‍රාමයක් ලෙස කොටුවෙල ග්‍රාමය සඳහන් කළ හැකි ය. පොළොන්නරු පුරවරයේ ජනතාවගේ ප්‍රධාන ජීවිකාව වන්නේ වී ගොවිතැනයි. තම අස්වනු නෙළා ගත් පසු ගොවියා එහි අග්‍ර ඵලයෙන් කිරි ඉතිරවීමේ මංගල්‍යය සිදුකරයි. මෙහි අධ්‍යයන අරමුණ වන්නේ පොළොන්නරු දිස්ත්‍රික්කයේ කොටුවෙල ග්‍රාමය මුල්කරගෙන කිරි ඉතිරීමේ මංගල්‍යය පිළිබඳ ජනශ්‍රැති විද්‍යාත්මකව අධ්‍යයනය කිරීමයි. මෙම අභිචාර ක්‍රමය පිළිබඳ තොරතුරු රැස්කිරීම සඳහා සම්මුඛ සාකච්ඡා ක්‍රමවේදය යොදා ගත් අතර එහිදී දත්ත දායකයන් දස දෙනෙකුගේ දත්ත ඉවහල් කර ගන්නා ලදී. ගම්භාර දෙවියන් ලෙසට පුල්‍යායාර දෙවියන් හෙවත් ගණ දෙවියන් උදෙසා මෙම කිරි ඉතිරවීමේ මංගල්‍යය පවත්වයි. ග්‍රාමයේ සියලුම නිවාසවලින් එකතුකරගන්නා සහල්, පොල්, පළතුරු ආදිය එක්රැස් කර ගනිමින් පිරිමි පාර්ශවය පමණක් එක් වී ග්‍රාමයේ ඇති බක්මී ගසක් යට ඉදි කර පුල්‍යායාර පිළිමය අසල සෑම වසරකම යල, මහ දෙකන්නය අස්වනු නෙළා ගත් පසු කිරි ඉතිරීමේ මංගල්‍යය සිදු කිරීමට ගැමියන් පෙළඹවීම් ඇති අතර, මෙය සිදු කරනු ලබන කාලය වන්නේ යල කන්නයේදී අප්‍රේල් මාසයේ හා මහ කන්නයේදී අගෝස්තු මාසවලදීය. දෙවියන්ට පැලක් බැඳ කන්නලව් කර අග්‍ර කොටස පූජා කරන අතර, කිරිබත්, කැවුම්, පළතුරු ආදිය ග්‍රාමයේ සියලු ම නිවාස වලට ද බෙදාදීම සිරිතකි. දෙවියන් උදෙසා සකසන ආහාර බල්ලන්, පූසන් වැනි සතුන්ට නොදෙන බව අධ්‍යයනයේදී අනාවරණය විය. වර්තමානයේ දී ගොවියා කෙතරම් කාර්යබහුල වුවත් නිසි කලට වැසි ලැබී අස්වනු සරුසාර කර ගැනීම උදෙසා නොකඩවා සෑම කන්නක් පාසාම සිදු කරන අභිචාර ක්‍රමයක් ලෙසට අදට ද මෙය සිදු කරනු දක්නට ලැබෙන අතර, මෙවැනි අභිචාර ක්‍රම අභාවයට යා නොදී මතු පරපුර උදෙසා දායාද කිරීම අත්‍යවශ්‍ය කරුණකි.

***ප්‍රමුඛ පදඃ*** *පුල්ලයාර් දෙවියන්, අභිචාර කන්නලව්, අස්වනු*

# Analysis of the Strategies Used In the Rituals of Ratayakuma by Using Prosperity as a Reflection in the Folk Magic

P. N. Hansani

Department of Archaeology, University of Peradeniya

*nararchi0726@gmail.com*

Among the Sri Lankan folk magic, Ratayakuma or Riddi Yagaya can be considered as a white magic subjected to women. It is performed for the devils represent the low country tradition in Sri Lanka and there are some ritualistic variations in the traditions of Matara and Bentara. The objective of this research paper was to study the illustration of prosperity in the rituals of Ratayakuma as an intangible performing art. The methodology was based on a literature survey to understand the historical legends, methods, offering associated with the Ratayakuma ritual. Secondly, various types of intangible features connected with the ritual were studied. This folk magic can be identified as a traditional method that used for the 'conservation of fetus or as a healing practice for sterile women. It is also utilized to protect the child, better parturition without any disturbance, avoid the accidents and abortions during the pregnancy. Woman is a symbol of prosperity from the past as she was figured with the combination of fortune, luck and fertility. The ritual called *'Kalahak Ven Kirima'* is manifested the intactness through a new pot of flowers, betel. Playing '*Magul Bera'* at *'Kumara Vidiya'* portrays optimism. In the main 'Rata Yakuma', ritual shamans are dressed as a female halcyon. '*Nanumuraya'* is performed for seven queens, culturally seven is considered as a lucky number while showing the prosperity aspect in the white magic. Illustration of woman's bath applying *'Nanu'*, is an imitation to show the purity of women. Wealth is symbolically interpreted by the woman worn jewelries. *'Kapuyakkariya'* shows the fructification to harvesting of cotton and up to the weaving of the cloth. This symbolically demonstrates the idea of prosperity. Lullaby is acted resulting reproduction, which also marks prosperity. It can be concluded that the features of sexuality, wealth, purity, fortune are the underlying symbols of prosperity that are included in the Ratayakuma ritual.

***Key words:*** *ratayakuma, intangible, white magic, prosperity, ritual*

# A Study of Folk Religious Conditions in Pre-Buddhist Ceylon

Rev. M. Deepananda, Rev. G. Dhammadinna, Rev. U. Wimalakiththi, Rev. M. Chandarathana, Rev. A. Dhammananda

Buddhist and Pali University of Sri Lanka

*deepmorawaka@gmail.com*

There were many folk religions all over the world in the earliest days, and generally they were recognized as the inaugural religious beliefs of tribal people. Especially indigenous people had been believing and practicing folk faiths and various kinds of cults in pre-Buddhist Ceylon. It is evident that Sri Lankan indigenous people also had believed numerous folk religions and involved with many aboriginal cults before the arrival of Arahanth Mahinda who arrived in Ceylon as a result of the 3rd Buddhist council. However, the oldest Sri Lankan chronicles have mentioned plenty of evidences regarding the folk religions and cults in pre-Buddhist Ceylon. Herein, basically, I hope to reveal how to realize and practice folk religions in pre-Buddhist Ceylon. The research methodology of the paper is 'Content analysis' based on Primary and secondary sources. Moreover, I have used "Mahavaṃsa" as my main primary source. The Mahavaṃsa is chronicle which gives more information about Sri Lankan history. I have used the book "History of Buddhism in Ceylon" as my main secondary source. Which are explain pre-Buddhist religious and social conditions in Sri Lanka. The Chinese travelling Buddhist monk Hiuen-Tsang who visited Sri Lanka in about seventh century A.D. has cited about how the people practiced religious faiths and cults in early history in Ceylon. He says that the ancient Sinhalese people were addicted in immoral religious beliefs. Herein, 'immoral religious beliefs' denote primitive animistic cults and faiths. Anyhow, the religious beliefs and cults prevailed in pre-Buddhist Sri Lanka society as an aboriginal folk religious beliefs and cults. Most of scholars consider the aboriginal or indigenous religious beliefs of Ceylon were immoral religious beliefs because, there was no systematical and philosophical aspects in them. Primitive people of the country had mainly followed varied old rites and rituals, white and black magic and customs which were included in folk religions. Herein, we can recognize some of folk beliefs prevailed in pre-Buddhist Ceylon such as Worship of demons, Worship of trees, Worship of deities, Ancestor worship, The beliefs of astrology, Worship of natural objects such as rocks, mountains, sun, moon and stars, etc. These folk religions which had been prevailed throughout in pre-Buddhist Ceylon helped to develop the lives of people at that time and some of them prevail in modern society.

***Key words:*** *folk religions, pre-buddhist Ceylon, beliefs, indigenous people*

# FOOD CULTURE

# සංස්කෘතික උත්සව හා සබැඳි ආහාර රටාවන්ගේ විවිධත්වය (චීනය හා ශ්‍රී ලංකාව අතර තුළනාත්මක සන්සන්දනයක්)

එච්. එම්. ආර්. පී. විජේරත්න[1], පී. එම්. එන්. ටී. සමරනායක[2]

[1]හාබින් විශ්වවිද්‍යාලය, චීනය, [2]රුහුණ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

*rpwijerathna@gmail.com*

ලෝකයේ බොහෝ සංස්කෘතික උත්සවයන් ඒවාට ම ආවේණික වූ ආහාර රටාවන්ට උරුමකම් කියයි. සිංහල අලුත් අවුරුද්දල නත්තල තෛපොංගල් අලුත් සහල් මංගල්‍යය දේව දානය ආදී විවිධ විශේෂ උත්සව අවස්ථාවන්වල දී ඒවාට ආවේණික වූ ආහාර රටාවක් ශ්‍රී ලංකාවේ දැක ගත හැකිය. චීනයේ ආහාර සලකන්නේ මිනිසාගේ දිව්‍ය ලෝකය වශයෙනි. ඔවුන්ගේ සෑම සංස්කෘතික උත්සවයක්හිදීම ආහාරවලට ලබාදෙන්නේ සුවිශේෂී ස්ථානයකි. චීනය හා ශ්‍රී ලංකාව අතර සංස්කෘතික උත්සව හා සබැඳි ආහාර රටාවන්ගේ විවිධත්වය පිළිබඳව අවබෝධයක් ලබා ගැනීම මෙම අධ්‍යයනයේ මුඛ්‍ය අරමුණයි. මෙහිදී ප්‍රාථමික හා ද්විතීක දත්ත යොදාගත් අතර ප්‍රාථමික දත්ත ක්‍රමවේදය යටතේ එක් රටකින් සම්මුඛ සාකච්ඡා පහ බැගින් දහයක් උපයෝගී කරගනිමින් ද්විතීක දත්ත සනාථ කරගන්නා ලදී. එහි දී චීන අලුත් අවුරුදු උත්සවය, යුවන්ෂියාවෝ (Yuanxiao), මකර බෝට්ටු, මැද-සරත් සෘතුව, චොන්යන් (Chongyang), ලබා (Laba), වසන්ත උදාව (spring) ආදී උත්සව අවස්ථාවන්හි දී ඒවාට ආවේණික වූ ආහාර වර්ග ලෙස ඩම්ප්ලින් (Dumpling), නියන්ගාවෝ (Niangao), යූ (Fish Braised), ජොන්සි (Zongzi), මූන් කේක් (Moon Cake), චොන්යන් (Chongyang Cake), ලබා (Laba Porridge), භාවිතා කරන බවටත් එම ආහාරයන්ගේ මතුපිට අලංකාරකරණය පිළිබඳව වැඩි අවධානයක් දක්වන බවත් හඳුනාගන්නා ලදී. සිරිත් විරිත් ලෙසට මකර නැටුම, සිංහ නැටුම, සැරසිලි, තෑගිබෝග හුවමාරුව ආදිය අනුගමනය කරයි. එමෙන්ම චීනයේ එක් එක් උත්සව සමයන්ට සමගාමී ව වීදි ආහාර සංස්කෘතියක් ද දැකගත හැකිය. ශ්‍රී ලංකාව සැලකීමේදී සිංහල අලුත් අවුරුදු උත්සවයට සමගාමී ව කිරි බත්, කැවුම්, කොකිස් ආදී වූ ආහාර මෙන්ම අලුත් සහල් මංගල්ලයේ දී ආහාර පිසින රටාවන්ගේ ද වෙනස්කම් රාශියකි. දේව දානය සකස් කිරීමේ දී මුඛවාඩම් බැද, පිරිසිදු වී, සුදුවතින් සැරසී සකස් කරන අතර එම චාරිත්‍ර ප්‍රදේශයෙන් ප්‍රදේශයට වෙනස් වේ. ආහාර ගන්නා ආකාරය සැළකීමේ දී චීනය ඒ සඳහා චොප්සි කූරු (Chopsticks) භාවිතා කරන අතර ලාංකිකයා හස්තය යොදාගනී. ඒ හා සබැඳි අපූර්ව සංස්කෘතියක් ද දෙරටේම ඇති අතර ආහාර ගන්නා ආකාරය අනුව එම පුද්ගලයාගේ චරිත ලක්ෂණ (කිපෙන සුළු, සැහැල්ලු බව) පැවසීමේ ශිල්පයක් ද ඇත. ඒ අනුව දෙරටේ ම සංස්කෘතික උත්සව හා සබැඳි ආහාර රටාවන්ගේ විවිධත්වයක් ඇති බවටත් දිනකට තෙවතාවක් ආහාර ගැනීම, ආහාර වලට ගරු කිරීම ආදියෙන් සමාන වන බවත් මෙම අධ්‍යයනය හරහා සනාථ විය.

***ප්‍රමුඛ පදඃ*** *ආහාර , උත්සවය , චීනය , ආවේණික*

# දකුණු ආසියානු රටවල ආහාර සම්ප්‍රදායන් තුළ දක්නට ලැබෙන විවිධත්වය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

ඩී. ඩී. ඉන්ද්‍රචාපා

පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය

*dilhaniindrachapa@gmail.com*

ආහාර රටාව පිළිබඳ සාකච්ඡා කරන විට දකුණු ආසියානු රටවල විවිධත්වයක් දක්නට ලැබේ. ඉන්දීය ආහාර රටාව තුළ බහුල වශයෙන් කුළුබඩු හා බෙහෙත් වර්ග භාවිත කරයි. එම ආහාරවලින් බොහෝමයක් ශාක මූලික ආහාර වන අතර සාම්ප්‍රදායික ඉන්දීය ආහාර සඳහා මස් වර්ග හා මාළු වර්ග ද විවිධ අයුරින් භාවිත කෙරේ. පකිස්තානයේ ආහාර රටාව මඟින් එරට ඓතිහාසික තත්ත්වය පරාවර්තනය කෙරේ. ඒ තුළ මැදපෙරදිග රටවල ලක්ෂණයන් මිශ්‍ර වී තිබේ. ග්‍රාමීය ප්‍රදේශවල දේශීය අන්තර්ගතයන් සහිතව සකසනු ලබන ආහාර වර්ග දැකගත හැකිය. එමෙන්ම Karahi, Biriyani, Tikka වශයෙන් පළාත් අනුව විශේෂීයකරණය වූ ආහාර රටාවන් විවිධාකාර රසයන්ගෙන් දක්නට ලැබේ. බංගලාදේශයේ පවතින සුවිශේෂී ආහාර සංස්කෘතිය ප්‍රසිද්ධ වී තිබේ. අච්චාරු හා චට්නි, තම්බන ලද බත්, විවිධාකාර එළවළු වර්ග සමඟ ආහාරයට ගනී. එමෙන්ම විවිධ මස් හා මාළු වර්ග බැඳ ආහාරයට ගැනීම එරට සිරිත වේ. එරට ආහාර රටාව තුළ විශේෂීකරණය වූ කුළු බඩු හා රසකාරක අඩංගු වේ. ශ්‍රී ලංකාවේ ආහාර රටාව තුළ ආහාර සංරක්ෂණය පිළිබඳව ද විවිධ ක්‍රම දක්නට ලැබේ. වේලීම, වැලිවලින් වැසීම, පිළිස්සීම, පැණිදැමීම, ඇඹුල් දැමීම, ජාඩි දැමීම හා අච්චාරු ආදිය භාවිත කරයි. නේපාලය, භූතානය හා මාලදිවයින වැනි අනෙක් රටවල ද එම රටවලට ආවේණික වූ ආහාර රටාවක් දක්නට ලැබේ. පර්යේෂණ ගැටලුව වන්නේ දකුණු ආසියානු රටවල ආහාර සම්ප්‍රදායන් තුළ දක්නට ලැබෙන විවිධත්වය කෙබඳු'ද යන්නය. මෙම පර්යේෂණයේ අරමුණ වන්නේ දකුණු ආසියානු රටවල ආහාර සම්ප්‍රදායන් අතර දක්නට ලැබෙන විවිධත්වය අධ්‍යයනය කිරීමයි. මෙම පර්යේෂණයෙහි වැදගත්කම හෙවත් ලැබෙන ප්‍රයෝජනය වන්නේ දකුණු ආසියාතික රටවල ආහාර සංස්කෘතිය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට හැකිවීමයි. පර්යේෂණ ක්‍රමවේදය වූයේ සාහිත්‍ය මූලාශ්‍ර අධ්‍යනයයි. මෙහි නිගමනය වන්නේ දකුණු ආසියානු රටවල සංස්කෘතිය තුළ සුවිශේෂී අංගයක් වන ආහාර සම්ප්‍රදායන් තුළ විවිධත්වයක් දක්නට ලැබෙන අතර ඇතැම් තැනක එකම ආහාර වර්ග අනුව ද ඒවා භාවිතයට ගන්නා සහ සකස්කරන ආකාරය අනුව විවිධත්වයන් ඉස්මතු කරයි.

***ප්‍රමුඛ පද:*** *දකුණු ආසියාව, ආහාර සම්ප්‍රදාය, ශ්‍රී ලංකාව, සංස්කෘතිය, විවිධත්වය*

# උඩරට, මන්දාරම්නුවර සාම්ප්‍රදායික ගැමි ජීවිතය හා සබැඳි ආහාර සංස්කෘතිය

එම්. පි හංසමාලි[1], මන්දාරම්නුවර සුමංගල හිමි[2], ඒ. ඒ. එස්. වර්ණකුලසූරිය[3]

[1]කැළණිය විශ්වවිද්‍යාලය, [2]උපගුරු ප්‍රවචනාකර මූලික පිරිවෙන, මීරිගම, [3]එක්සත් ජාතීන්ගේ සංවිධානය, ශ්‍රී ලංකාව

*piumistperera@gmail.com*

ශ්‍රී ලංකාවේ ගැමි ආහාර සංස්කෘතිය තුළ මෙරටට ආවේණික වූ අස්පර්ශනීය උරුම සාධකයන් ගැබ්ව පවතී. අතීත ගැමියෝ තමා නිෂ්පාදනය කළ ආහාර භුක්තිවිඳි අතර ඔවුන් ආහාර භාවිත කළේ හුදෙක් ස්වකුසගින්න සපුරා ගැනීමට පමණක් ම නොවේ. එනිසා එකී දෛනික ආහාරවේල් අතර බැඳි විවිධ භාවිතාවන් ද ජන ජීවිතය තුළ විය. නුවරඑළිය දිස්ත්‍රික්කයේ හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් උඩරට සාම්ප්‍රදායික ගමක් ලෙස සැළකෙන මන්දාරම්නුවර ග්‍රාමය පදනම් කොට ගෙන එම ගමෙහි ආහාර සංස්කෘතික රටාව අධ්‍යයනය පර්යේෂණ පරමාර්ථය වන අතර එහි දී උඩරට සාම්ප්‍රදායික ගැමි ජීවිතයට ආවේණික ආහාර රටාවන් තවමත් මන්දාරම්නුවර ශේෂව පවතිනවා ද? යන්න සොයා බැලීම පර්යේෂණ අරමුණ විය. ප්‍රාථමික දත්ත දත්ත රැස් කිරීමේ දී සාහිත්‍ය පරිශීලනයත් ද්විතීයක දත්ත රැස් කිරීමේ දී සහභාගීත්ව නිරීක්ෂණ හා සම්මුඛ සාකච්ඡා යන ක්‍රමවේදයන් භාවිත කළ අතර සම්මුඛ සාකච්ඡා සඳහා ගැමියන් 50කගෙන් අහඹු නියැදි ක්‍රමවේදය තුලින් දත්ත රැස් කරන ලදී. මෙම ග්‍රාමයේ ආහාර රටාව තුළ තමන් නිෂ්පාදනය කරන ලද ආහාරයන් සහ ස්වභාවික පරිසරයේ ඉබේ වැඩෙන ශාක වර්ගවලින් ලබා ගන්නා ලද ආහාර වර්ගයන් දෛනික ජීවිතය තුළ පරිභෝජනය කරන බව මූලිකව හඳුනා ගැනුණි. මෙම දෙවර්ගයට ම අදාළව ලබා ගන්නා ආහාර වර්ග තුළින් තක්කඩි, චවුදළු, ඔඩිතාරම්, පුස්නාබු හා දෝහි වැනි තවත් බොහෝ ආවේණික ආහාර වර්ග ගණනාවක් ම වේ. තව ද භුක්ති විඳින විවිධ වූ ත් විශේෂිත වූ ත් ආහාර ගබඩා කර ගැනීමේ දී කුරුණි පෙට්ටි, හැවනි පෙට්ටි, අප්පල්ල, ආඩි වලඳ හා ලුණු පොල් කටුව ඇතුළු තවත් ආහාර ගබඩා කර ගැනීමේ ක්‍රමවේදත් එකී ආහාර වර්ග පිසීමේ දී අනුගමනය කරනු ලබන සාම්ප්‍රදායික ක්‍රම අතර බතේ පානය සඳහා විශාල රොටී සැකසීම, තක්කඩි පිසීමේ දී පිටි සමඟ අල, බෝංචි, පරිප්පු හා කරවල එකට මිශ්‍ර කර පිසීම හා නොයෙක් ආහාර සඳහා නොයෙක් ක්‍රියාපටිපාටියන් මෙන් ම මුළුතැන්ගෙයි එකී ආහාර පිසීමට භාවිත කරන ලද ආම්පන්න අතර හාල් හා මඤ්ඤොක්කා ආදිය කෙටීමට වංගෙඩිය හා මෝල්ගහත්, කුරක්කන් ගල, පාහේ කොරහ, නැඹිලිය, තඹ මුට්ටි, තාච්චි, ඇතිලිය, රාස්පාන, හුන්ඩුව ඇතුළු ආම්පන්න තවමත් මෙම ගමෙහි ශේෂව පවතින බව ඇතුළු සාම්ප්‍රදායික ලක්ෂණ ගණනාවක් ම පර්යේෂණ ප්‍රතිඵල ලෙස අනාවරණය වුණි. ඒ අනුව මන්දාරම්නුවර ගැමි ජීවිතය තුළ සාම්ප්‍රදායික ග්‍රාමීය ලක්ෂණ කැටිකොට ගත් ගැමි පරිසරයට ම ආවේණික වූ ආහාර රටාවක් තවමත් ශේෂව පවතින බව නිගමනය කළ හැකි විය.

***ප්‍රමුඛ පදඃ*** *මන්දාරම්නුවර, ආහාර, සංස්කෘතිය, ගැමියෝ, ආවේණිකත්වය*

# බටහිරකරණයේ ආගමනයත් සමඟ වියැකී යන දේශීය ආහාර සංස්කෘතිය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් (මාතලේ දිස්ත්‍රික්කයේ රත්තොට ග්‍රාමය ඇසුරිනි)

කේ. එල්. ජී. ඩී. එන්. මහේෂිකා, ඩබ්ලිව්. ජී. එස්. ඉමේෂිකා, එස්. ඒ. චතුර මදූෂංක

මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය, රුහුණ විශ්වවිද්‍යාලය

*dilinimaheshika100@gmail.com*

වර්තමානය වනවිට මුලු ලෝකයම පාහේ ගෝලීයකරණයට නතු වෙමින් පවති. මුලු ලෝකය තුළම බටහිරකරණය වූ සංස්කෘතියක් ගොඩනැගීම ගෝලීයකරණයේ මූලික පරමාර්ථය වී ඇත. එවන් තත්ත්වයක් තුළ රටක සංස්කෘතියෙහි පවතින උසස් සාධක වෙනත් සංස්කෘතීන්ගේ ආක්‍රමණ හමුවේ බිඳ වැටීමකට ලක් වේ. ශ්‍රී ලංකාවේ ආහාර සංස්කෘතියටද වර්තමානය තුළ අත්වී ඇත්තේ එම ඉරණමය. මෙම පර්යේෂණය සිදු කිරීමේද, මූලික අරමුණ වූයේ බටහිරකරණයේ ආගමනයත් සමඟ ක්‍රමයෙන් වියැකි යන අපේ දේශීය ආහාර සංස්කෘතියෙහි ඇති වටිනාකම පිළිබඳව පර්යේෂණාත්මක අධ්‍යයනයක් සිදු කිරීමයි. පර්යේෂණයේ අරමුණුමත පදනම් වෙමින් පර්යේෂණයට අවශ්‍ය දත්ත එක්රැස් කිරීම සඳහා පුස්තකාල අධ්‍යයනය, ක්ෂේත්‍රගත අධ්‍යයනය මෙන්ම සම්මුඛ සාකච්ඡා යනාදි ක්‍රමවේදයන් යොදාගනු ලැබීය. මාතලේ දිස්ත්‍රික්කයේ රත්තොට ගම්මානය පර්යේෂණයේ අධ්‍යයන සීමාව විය. දත්ත විශ්ලේෂණයේදී රත්තොට ගම්මානයට ආවේණිකව පවතින දේශීය භෝග වර්ග මොනවාද, නමුත් වර්තමානය තුළ ගම්මානයේ ජනතාව දේශීය භෝග පසෙකලා විදේශීය භෝග වර්ග වගා කිරීමට යොමු වී ඇති හේතු සාධක මොනවාද, සහ එවන් තත්ත්වයක් තුළ ගම්මානයේ ජනතාවට අත්විඳීමට සිදු වී ඇති  අයහපත් ප්‍රතිඵල මොනවාද යනාදි ප්‍රස්තුතයන් ඔස්සේ දත්ත විග්‍රහ වේ. වර්තමානය වනවිට ලාභය ප්‍රමුඛ කර ගනිමින් වැඩි අස්වැන්නක් ලබා ගැනීම සඳහා ගොවීන් විසින් විස රසායනික ද්‍රව්‍ය, කෘමිනාශක වර්ග භාවිතා කරනුයේ කිසිදු දැනුවත්භාවයකින් තොරවය. ප්‍රදේශය තුළ සිදු කළ නිරීක්ෂණය ඔස්සේ පෙනී ගිය ප්‍රධාන කරුණක් නම් අතීතයේ මුං, වී, කුරක්කන්, වැනි දේශීය භෝග වර්ග වගා කර ඇති භූමිවල අද වනවිට ලීක්ස්, ගෝවා, කැරට්, වැනි විදේශීය භෝග වර්ග වගා කර ඇති ආකාරයයි. මෙම විස රසායනික ද්‍රව්‍ය, කෘමිනාශක වර්ග භාවිතයත්, එම ආහාර පරිභෝජනයට ගැනීමත් තුළ ප්‍රදේශයේ බහුතරයක් ජනතාව දරුණු බෝ නොවන රෝග කාරකයන්ට ගොදුරු වී ඇත. තවද එහි ජීවත්වන වත්මන් තරුණ පරපුර ද දේශීය ආහාර නොහඳුනන එහි වටිනාකම නොදත් පිරිසක් බවට අද වනවිට පත් වී ඇත. මේ අනුව සමස්තයක් වශයෙන් ගත්කළ මෙම පර්යේෂණය ඔස්සේ එළඹීමට හැකි වූ නිගමන කිහිපයක් විය. මුදල් හමුවේ ලාභය පරමාර්ථ කොට ගනිමින් කෙටි කාලයකදී වඩා වැඩි අස්වැන්නක් ලබා ගැනීම සඳහා ගොවියන් විදේශීය භෝග වර්ග වගා කිරීමට යොමු වීමත්, කාර්යබහුල ජීවන රටාවක් ගත කරන ජනතාවද ආහාරයට ගනුලබන ආහාරවල පහසුව මිස එහි පවතින පෝෂදායි ගුණය පිළිබඳව සැලකිලිමත්භාවයක් නොදැවීමත්, දේශීය ආහාර සම්බන්ධයෙන් ඔවුන් තුළ පවතින අනවබෝධයත් තුළ නූතනයේ ජනතාව විදේශීය ආහාර අනුභවයට හුරුපුරුදුව සිටී.  එවන් තත්ත්වයක් තුළ දේශීය ආහාර සංස්කෘතිය ශ්‍රී ලාංකිකයන් අතරින් ක්‍රමයෙන් වියැකී යමින් පවතින බව මෙම පර්යේෂණය හරහා එළඹීමට හැකි වූ නිගමන විය.

***ප්‍රමුඛ පදඃ*** *දේශීය ආහාර සංස්කෘතිය, බටහිරකරණය, ගොවි ජනතාව, කෘෂිකාර්මික*

# ඌව සහ සබරගමු පළාත්වල සම්ප්‍රදායික ආහාර සංස්කෘතිය හා සබැඳි ඇදැහිලි විශ්වාස සහ සිරිත් විරිත් පිළිබඳ අධ්‍යයනයක්

ඩී. එස්. බණ්ඩාර

ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය රුහුණ විශ්වවිද්‍යාලය

*zdasanayake7@gmail.com*

පැරණි යුගයේ සිටම මිනිසා සහ ආහාර අතර ඇති සබඳතාව, විවිධත්වයෙන් යුතු ආහාර සංස්කෘතියක් ඇතිවීම කෙරෙහි බලපෑ බව හඳුනාගත හැකිය. එසේ බිහිවූ දේශිය අස්පර්ශනීය උරුමයක් ලෙස සම්ප්‍රදායික ආහාර සංස්කෘතිය වැදගත්වේ. පළාත් වශයෙන් මෙන්ම ප්‍රාදේශිය වශයෙන් ද භූගෝලීය පිහිටීම අතින් ද විවිධ වූ ප්‍රදේශවල සම්ප්‍රදායික ආහාර රටාවේ බොහෝ වෙනස්කම් අධ්‍යයනය කළ හැකිය. ගැමි සමාජ ක්‍රමය තුළ ආහාර වර්ග, ආහාර සකස් කිරීමට යොදාගැනෙන අමුද්‍රව්‍ය, ආහාර සැකසීමේදී භාවිත කරන මෙවලම් අරභයා විවිධාකාරයේ ඇදහිලි විශ්වාස මෙන්ම සිරිත් විරිත් ආදිය දක්නට ලැබේ. ඌව පළාතේ සම්ප්‍රදායික ගම්මාන වන කෙසෙල්පොත, රිදීමාලියැද්ද, තල්කොට සහ සබරගමු පළාතේ ගම්මාන වන මොරතොට, මිල්ලකඩේ, හුණුවල ඇසුරුකර ගනිමින් සිදුකරන ලද මෙම පර්යේෂණයේ ගැටලුව වූයේ ආහාර සංස්කෘතිය හා සබැඳි ඇදහිලි විශ්වාස සහ සිරිත් විරිත් කෙබඳුවේද? යන්නයි. මෙම පර්යේෂණය ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ ක්ෂේත්‍ර අධ්‍යයනය, සම්මුඛ සාකච්ඡා, නිරීක්ෂණ උපයෝගීත්වයෙන් සිදුකෙරුණි. තල්කොට ගමෙන් එක්අයෙකු ද අනෙකුත් ගම්මානවල පුද්ගලයන් පස් දෙනෙකු බැගින් ද සම්මුඛ සාකච්ඡා සඳහා යොදාගැනුණි. ඒ අනුව ඌවේ තෝරාගත් ගම්මානවල දක්නට ලැබෙන ආහාර සංස්කෘතිය ද සබරගමුවේ තෝරාගත් ගම්මාන වල දක්නට ලැබෙන ආහාර සංස්කෘතිය ද පර්යේෂණයට ලක්කර විවිධවූ ඇදහිලි විශ්වාස සහ සිරිත් විරිත් හඳුනාගැනුණි. සබරගමුවේ මෙන් නොව ඌවේ සම්ප්‍රදායික ගම්මානවල ආහාර සමඟ බැඳි විශ්වාස, සිරිත්විරිත් ඔවුනට ආවේණික ස්වරූපයක් පෙන්නුම් කරයි. එමෙන්ම නවීකරණය හමුවේ වුවද එම විශ්වාසයන් කෙරෙන් ඈත්නොවීම විශේෂත්වයකි. සිය ආහාර සංස්කෘතියේ ප්‍රධාන ස්ථානයක් මලගිය ඥාතීන්ට වෙන් කරන මොවුන් දිනපතා මියගිය අයට ආහාර වෙන්කරයි. එය වැද්දන්ගේ නෑ යකුන් පිදීමේ චාරිත්‍රයට සමානකමක් දක්වයි. "මිට හාල්" ලෙස හඳුන්වන සහල්මිටක් දිනපතා වෙන්කිරීම, කුඹුරට ඇඹුල ගෙනයාමේදී අලුපුහුල්, අලුකෙසෙල් වැනි එළවලු නොපිසීම, කිලි සහිත කාන්තාවන් කුඹුරට නොයාම ආදී සුවිශේෂී විශ්වාස, සිරිත් විරිත් රාශියක් විවිධ හේතු මත මොවුන් විසින් ක්‍රියාත්මක කරයි. බ්‍රිතාන්‍ය පාලනයට නතුවීම සමඟ සබරගමුවේ කෘෂිකර්මාන්තය අඩාලවන අතර වාණිජ බෝග වගාව ජනප්‍රියවිය. එය ආහාර සංස්කෘතිය කෙරෙහි යම් බලපෑමක් එල්ල කළද ආහාර පිළිබඳවවූ ජන විශ්වාසයන් බිඳදැමීමට තරම් ප්‍රබල නොවුණි. නමුත් ද්‍රවිඩ ජනාවාස හේතුවෙන් හින්දු ආගමික ඇදහිලි ආහාර සංස්කෘතිය කෙරෙහි බලපෑ බව පැහැදිලිවේ. කෙසේවුවද ආහාර සම්බන්ධව ජන විස්වාස, සිරිත්විරිත් කීපයක් පහත පරිදි දැක්විය හැක. පොල් සම්බෝල අඹරා දෙහි යෙදීමේදී මිරිස් ගලට දෙහි මිරිකා නොදැමීම, බිත්තර හෝ මාංශ නිවසින් බැහැරට ගෙන යාමේදී යකඩ ඇණයක් හෝ දෙහි ගෙඩියක් තබා ගෙන යෑම, අලකොළ මාලුව හැඳි ගෑමේදී කතා නොකිරීම, කරවිල සෝදා කතා නොකර කැපීම, සහල් මුට්ටිය ලිප තබා එයට වැඳීම, අලුත් සහල් මංගල්‍යයේදී සමන් දෙවියන්ට මෙන්ම හින්දු ආගමෙහි වන්දනා කරනු ලබන විෂ්ණු, පත්තිනි, කතරගම දෙවිවරුන්ට අලුත් සහල් පිදීම. මෙවැනි බොහෝ ජන විශ්වාසයන් හා ඒවා ඇතිවීම කෙරෙහි පසුබිම්වූ හේතු බොහොමයක් අධ්‍යයනය කෙරුණි. ප්‍රාදේශිය ආහාර සංස්කෘතිය හා බැඳි ඇදහිලි විශ්වාස හා සිරිත්විරිත්වල විවිධත්වය අධ්‍යයනය කිරීමට මෙන්ම මෙම පාරම්පරික ඥානය උරුමයක් වශයෙන් රැකගැනීමේ අවශ්‍යතාව පෙන්වාදීම කෙරෙහි ද මෙම පර්යේෂණය දායකවේ.

***ප්‍රමුඛ පද:*** *ආහාර, ඇදැහිලි, උරුමය, ඌව, පාරම්පරික ඥානය, සබරගමුව, සිරිත්විරිත්*

# Jaffna 'Odiyal Koozh' a Hidden Treasure of Palmyrah

M. Sivakaran

Home Economics, Faculty of Arts, University of Jaffna, Sri Lanka

*jmenakaj@yahoo.com*

Palmyrah (*Borassusflabellifer*) is a nature's gift to the Northern Province of Sri Lanka and the economical crop gives livelihood to the residents due to its food and nonfood values. Palmyrah tuber (*odiyal*) is an edible shoot and a good source of dietary fiber and calcium for human health. As a backbone of traditional Jaffna cuisine 'Odiyal koozh', a nutritional seafood soup made with palmyrah tuber flour. Traditional foods have nutritional aspects as well as they tie up the childhood memories and heritage. The study was conducted with the objective of recollecting the connection of 'odiyal koozh' with culture. Interviews, demonstrations and group discussions were carried out among local elders who are experts in making 'koozh', staff from restaurants which serve 'koozh' in their menu and immigrants to Europe countries during their visit to Jaffna in the period of July to August 2018 . From the field observations and discussion it was found that the 'koozh', a display of one's culinary skill is not only a food but it fills the gap between the generations.A rich combination of freshly caught fish, prawns, crabs and cuttlefish with the choice of long beans, manioc, chilli, drumstick, leaves, parboiled rice, tamarind, jack seeds odiyal flour is prepared in earthenware. The hot and spicy 'koozh' is served with coconut kernels in natural eco-friendly vessels made from spiky palmyrah leaves called as 'pila' or coconut shells and folded jack leaves are used as spoons.The signature dish of Jaffna gives better nourishment of protein, fiber, minerals and vitamins which gave longevity for the ancestors.The preparation is considered as a center for gathering of relatives and friends to share the culinary tradition. Along with heightening the traditional experience elders said that 'koozh' is a serious killer of cold flu during their childhood.The respondents felt that the tradition is slowly disappearing due to the busy life style and nuclearization of families as 'koozh' is prepared mostly when the immigrants who know the values of heritage visit their home lands. People can taste a delicious bowl of 'koozh' in restaurants but the traditional cultural identity and heritage cannot be purchased with any cost there.

***Keywords***: *odiyal, koozh, palmyrah, Jaffna culture, heritage*

# ජපානයට ම ආවේණික වූ ආහාර සංස්කෘතියේ සුවිශේෂීතාව පිළිබඳ අධ්‍යයනයක්

හිඹිලියාකඩ පදුම හිමි

පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය

*paduma94@gmail.com*

හිරු නැගෙන දේශය නමින් විරුදාවලී ගත් ජපානය, ජපන් ජාතිකයන් විසින් හඳුන්වනු ලබන්නේ නිප්පොන් / නිහොන් යනුවෙනි. පැසිපික් සාගරයෙන් ද බටහිරින් ජපන් මුහුදු තීරයෙන් ද මායිම් ව මෙම සුන්දර දේශය නැගෙනහිර ආසියා මහද්වීපයේ දූන්නක හැඩයෙන් පිහිටා ඇත. ජපානය ප්‍රධාන දූපත් හතරකින් යුක්ත වේ. හොංෂු, හෙක්කයිදෝ, ෂිකොකු හා ක්‍යූෂු යනු එම සිව් දූපත් ය. ජපන් වැසියෝ පැරණි වතාවත් ඉතා ගෞරවයෙන් පිළිගත්හ. මුතුන් මිත්තන් සොයාගත් දේ රැකගැනීම මොවුන්ගේ ප්‍රධාන අරමුණ කි. ආහාර යන්න ජපන් භාෂාවෙන් හැඳින්වෙන්නේ ගොහන් ලෙස ය. මේ වචනයේ නියම තේරුම බත් යන්න නමුත් සෑම ආහාරයකට ම පාහේ මෙම නාමය ඔවුහු භාවිත කරති. මොවුහු මුතුන් මිත්තන්ට බෙහෙවින් ප්‍රේම කළහ. එසේ ම මුතුන් මිත්තන්ට ප්‍රේම කළා පමණක් නොව ඔවුන්ගේ සංස්කෘතියට ද අසීමිත ව ප්‍රේම කළහ. ජපානයේ වාර්ෂික ව සිද්ධ කෙරෙන උත්සව ත්‍රය කි. නි-නමේ, තන්ති-මේ සහ අයි-නමේ යනු ඒවා ය. පළතුරු රස විඳීමේ උත්සවය නි නමේ නම් වේ. දෙවියන් විසින් රස විඳීමේ උත්සවය තන්ති මේ නම් වේ. සත්ත්ව රස විඳීමේ උත්සවය අයි නමේ නම් වේ. මෙසේ ආහාර මූලික කොටගෙන විවිධ උත්සවයන් පවා පැවැත්වීම ජපානය තුළ සිද්ධ වේ. ජපන් වැසියන්ගේ ආහාර සංස්කෘතිය ඉතා විචිත්‍ර ය. ඔවුන්ට ම ආවේණික වූ මෙම ආහාර සංස්කෘතික රටාව පිළිබඳ අධ්‍යයනය කිරීම මෙම අධ්‍යයනය තුළින් සිද්ධ කෙරේ. ජපානයට ම ආවේණික වූ ආහාර සංස්කෘතිය කෙබඳු ද? යන්න මෙම අධ්‍යයනයෙහි අධ්‍යයන ගැටළුව ලෙසින් දක්වනු ලැබේ. තත් කාරණය සාහිත්‍යයික මූලාශ්‍රය යටතේ අධ්‍යයනය කිරීම මෙහි අරමුණ හා වැදගත්කම ලෙසින් දැක්වේ. පර්යේෂණ ක්‍රමවේදය තුළ දී ජපන් ආහාර සංස්කෘතිය පිළිබඳ ලියවී ඇති සාහිත්‍යයික මූලාශ්‍රයයන් අධ්‍යයනය කිරීමෙන් දත්ත සංස්ලේෂණය හා විශ්ලේෂණය කෙරේ. ජපන් ආහාර සංස්කෘතියෙහි පවතින උත්සවය කි, තේ සංග්‍රහ උත්සවය. මෙය සදෝ නාමයෙන් හැඳින්වේ. මෙය දැනුම හා සංවේදී බව ඉතා පුළුල් පරාසයක දිවෙන උසස් කලාව කි. සදෝ මගින් ජීවිතයේ පරමාර්ථ මෙන් ම ස්වභාව ධර්මය අගය කිරීම ද සිද්ධ වේ. තැම්බූ සුදු බත්, මිසෝ, හෂී නම් ලී කෝටුවලින් ආහාර ගැනීම, සුෂී, තෙම්පුරා, හා සෂිමි වැනි ආහාර ද මෙම සංස්කෘතියට ආවේණික ආහාරයන් ය. මෙම කාරණාවන් බාහුල්‍ය වශයෙන් අධ්‍යයනය කිරීම තුළින් ජපන් වැසියන්ට ම ආවේණික වූ ඉතා මනහර ආහාර සංස්කෘතියක් පවතින බව මෙම අධ්‍යයනය අවසන නිගමනය කරනු ලැබේ.

***ප්‍රමුඛ පදඃ*** *අධ්‍යයනය, ආහාර, ආවේණික, ජපානය, සංස්කෘතිය*

# A Case Study of Food Preservation Methods as an Indigenous Food Security Practice in Rural Setting of Sri Lanka

P. D. Wijesekara, A. A. R. Thamodi, C. S. Manage, N. D. Kaggodaarachchi, T. M. S. P. K. Thennakoon

Department of Geography, University of Sri Jayewardenepura

*wijesekarapiyoda@gmail.com*

Food culture refers to the practices, attitudes, and beliefs regarding food while food patterns express identity, values, status, power, artistry and creativity of a community. Food security practices vary among different cultures with the use of ingredients, methods of preparation, preservation techniques, and types of food. The objective is to identify the food preservation practices in an isolated entity. Accordingly, Etanwala village which is an isolated entity was selected as the study area. It is located in Knuckles mountainous region and belongs to Laggala-Pallegama DSD in Matale District, Central Province. Both secondary and primary sources were utilized. Various types of books and articles were referred as secondary sources while twenty respondents (50% of the total households) were selected as primary sources using purposive or the judgment sampling techniques for the convenience of the study. Food security practices are bounded with activities related to agriculture, food preparing and preservation. Accordingly this research mainly focuses only on food preservation practices. Drying, storing, salting and fermentation were identified as the main techniques of food preservation practices among this community. Food drying is carried out in two modes such as smoke drying and sun drying. Majorly left overs of the processed rice, *gorakā*, jack fruit, bread fruit and manioc are dried under the direct sun light and kept on the barn for smoke drying. Rice, finger millet, maize are stored in sacks or traditional rice bin "*Vee bissa*". Lime and yams are kept under the sand to keep away from spoiling agents. Salting is used in preserving lime and fish. Milk from home raised buffaloes is used to prepare curd (fermentation). These traditional food preservation practices have been identified as an Intangible Cultural Heritage (ICH) since different food preservation methods represent different food cultures.

***Key words***: *Food Culture, Food Preservation, Isolated Entity, Intangible Cultural Heritage*

# ජන සම්මතයේ බත් ගස නමින් ව්‍යවහාර වන කොස් ගස ආශ්‍රීතව මෙරට නිර්මාණය වී ඇති ආහාර සංස්කෘතිය

ඩී. ආර්. පී. නයනතරා, ආර්. ඩී. වින්ඩ්සර්, ඩී. එම්. කේ. ජී. කේ. දිසානායක

ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

*kaushdizz@gmail.com*

ජන ව්‍යවහාරයේ කොස් ගස "බත් ගස" හෙරලිය ලෙස ද ඉංග්‍රීසි භාෂාවෙන් jak fruit (*Artocarpus heterophyllus*) ලෙස ද ව්‍යවහාර කෙරෙන කොස් ගස දැනට දකුණු ආසියානු කලාපයේ නිවර්තන පහත් භූමි භාගයන් හී බහුලව දැකගත හැකි ශාකයකි' පුරාවිද්‍යා මූලාශ්‍ර ගත සාධක අනුව මීට වසර 3000- 6000ත් අතර ඉතිහාසයක් ඉන්දියාව අදාළව පවතින අතර මෙරටින් ලැබී ඇති සාහිත්‍යමය සාධක අනුව ක්‍රි පූ 161-137 සමයේ සිට කොස් ශාකයේ ඵලයන්ද එහි පැණි දියරමය පානයක් ලෙස ආහාරයට ගෙන ඇත. මෙම අධ්‍යයනය මගින් කොස් ගස ආශ්‍රය කර ගනිමින් සකසා ගත හැකි විවිධ වූ ආහාර පිළිබදව විමර්ෂණය කිරීම හා එම ආහාර පිළිබද තොරතුරු ඉදිරිපත් කර එම අහාර වර්තමාන සමාජයට හඳුන්වාදීම මෙම අධ්‍යයනයේ අරමුණ වේ. මෙම අධ්‍යයනය ග්‍රාමීය වශයෙන් සිදුකරන ලද ක්ෂේත්‍ර අධ්‍යයන හා මුලාශ්‍ර පදනම් කරගෙන සිදු කරන ලදී. කොස් ගෙඩිය දැනට ලෝකයේ හඳුනාගෙන ඇති විශාලතම ඵලයන්ගෙන් එකක් වන අතර මෙරට ජන ජීවිතය හා සබැඳි කොස් ශාකය ගැමි ජන ජීවිතයට ඉතා සමීප රසවත් ආහාර සංස්කෘතියක් උරුම කර දී ඇත. පොළොස් ඇඹුල උඩරට මෙන් ම පහතරට ජනයා අතර ද ප්‍රසිද්ධ ගැමි ආහාරයක් වන අතර කොස් ඵලයේ ගැට අවස්තාව වේ. පොළොස් මැල්ලුම ද ගැට අවස්තාව ප්‍රයෝජනයට ගැනීමකි. කිරි කොස් මාලුව ඉතා රසවත් ආහාරයක් වන අතර මිරිස් තුනපහ යොදා කොස් ව්‍යංජනය තරමක් සැරට උයනු ලැබේ. කොස් ඵලයේ ව්‍යාප්තියට උපකාර වන බීජ හෙවත් කොස් ඇට යොදාගෙන කලුපොල් මාලුව පිළියෙළ කරයි. එසේම කොස් ඇට තලා කොස් ඇට අග්ගලා කොස් පිටි, රොටි, කොස් ඇට ටොෆි, පිළියෙළ කරනු ලැබේ. ප්‍රාදේශීය වශයෙන් කොස් කොත්තු, පොලොස් කට්ලට්, කොස් මදුලු බයට්, කොස් මදුලු පිරවුම, කොස් ඉරි බැඳුම, ලා කොස් කොළ පපඩම්, ලා කොස් කොළ දළු සම්බෝල, කොස් කොළ තැම්බුම් පානය, කොස් මල් යුෂ පානය, මෙම ශාකයෙන් ආහාර සඳහා යොදා ගන්නා අවස්ථා කිහිපයක් පමණි. මීට අමතරව කොස් අවාරයේ දී කොස් පරිභෝජනය කිරීමේ අරමුණින් අටු කොස්, වැලි කොස් ඇට ලෙස ආහාර කල් තබා ගැනීමේ උපක්‍රම භාවිතා කරනු ලැබේ. මේ අනුව කොස් ගස හා ගැමි සමාජය අතර වෙන් කළ නොහැකි සම්බන්ධතාවක් කාලාන්තරයක් තිස්සේ ගොඩනඟාගෙන ඇති බව මින් පැහැදිලි වේ.

***ප්‍රමුඛ පද:*** *කොස් ගස, කොස්, ආහාර සංස්කෘතිය, උඩරට, පහතරට*

# සබරගමුවේ සාම්ප්‍රදායික ආහාර රටාවේ එන “හත්මාලුව” පිළිබඳ අධ්‍යයනයක් (ඇහැලියගොඩ ප්‍රදේශය ඇසුරින්)

යූ. ආර්. ඒ. පී. රංජිත්[1], එස්. ටී. පී. රුවන්තිකා[2]

[1]ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යනංශය, [2]ආර්ථික විද්‍යා අධ්‍යනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය

*amilprasanna93@gmail.com*

මෙරට පැරණි උරුමයන් ගත් විට ඒවායෙහි කලාව තාක්ෂණය දැනුම සංස්කෘතික හර පද්ධති මෙන්ම ආහාර තාක්ෂණය අතින් ද විස්මයක් පෙන්නුම් කරයි. සොබාදහමට අනුකූල දිවියක් ගත කළ පැරණි හෙළයන් සිය ආහාර රටාවද සකස් කරගනු ලැබුවේ සොබාදහම ආශ්‍රයෙනි. එය පුද්ගල ශරීරයට අහිතකර ආහාර රටාවක් නොවීය. මෙරට විවිධ ප්‍රදේශයන්ට ආවේනික වෙනමම ආහාර සංස්කෘතියක් ද ඒ ඔස්සේ නිර්මාණය වන්නට විය. සිංහල අලුත් අවුරුද්ද යනු එවැනිම ඉතා වැදගත් සංස්කෘතික උරුමයන් එක්තැන්වූ උත්සවයකි. ඒ හා බැඳි ආහාර රටාව මෙන්ම ආහාර සංස්කෘතියත් ඒ වටා බැඳි ආහාර තාක්ෂණයත් පැරණි අස්පෘශ උරුමයේ සාධකයන්ය. එම උරුමයේ දැනට අවිච්ඡින්නව සබරගමුව තුළ පැවත එන එක් විශේෂ ආහාරයක් වශයෙන් අලුත් අවුරුද්ද සඳහා ම පිළියෙල කරන හත්මාලුව නම් වෑංජනය හඳුනාගත හැකිය. හෙළ ආහාර රටාවේ විශ්මය විශද කරන හත්මාලුව වෑංජනය හා සිංහල අලුත් අවුරුද්ද අතර පවතින ජන විශ්වාස කෙබඳුද?, එම ආහාරය සකස් කරන්නේ කෙසේද? යන්න මෙහිදී අධ්‍යයනය කිරීම මෙහි මූලික අරමුණයි. එහිදී සම්මුඛ සාකච්ඡා ක්‍රමවේදය මෙන්ම සාහිත්‍ය මූලාශ්‍ර අධ්‍යයන ක්‍රමවේදය ද දත්ත ඒකරාශි කිරීම සඳහා යොදාගැනිණ. මෙම ආහාරය සබරගමුවේ ග්‍රාමීය ප්‍රදේශවල අදටත් අලුත් අවුරුදු කෑම මේසයට නැතිවම බැරි අංගයකි. සබරගමුවෙන් දුරබැහැර ප්‍රදේශවල මෙම හත්මාලුවට සමාන ආහාරයක් සාදන නමුදු එය දෙවියන්, යක්ෂයන් වෙනුවෙන් සාදන ආහාරයක් ලෙස වෙන්ව ඇත. ඔවුන් සබරගමුවේ හත්මාලුව වෑංජනයට එතරම් ප්‍රිය නොකරයි. නමුත් සබරගමුවේ එය වර්ෂයකට වරක් අලුත් අවුරුදු කෑම මේසය රසවත් කරන ආහාරයකි. ගැමියන් මෙම ආහාරය අලුත් අවුරුද්දට හැර වෙනත් දින වල සෑදීම අසුබ බව පවසයි. එහිදී හත්මාලුව සඳහාම යොදා ගන්නා සුවිශේෂී අමුද්‍රව්‍ය පවතී. එනම්, කජු, කොස් ඇට වට්ටක්කා දලු, අළුකෙසෙල්, වම්බටු, කිරිහැන්ද, කව්පි යනාදියයි. මේ අතරින් කජු, වට්ටක්කා දලු අනිවාර්යවේ. මෙහිදී හත්මාලුව යන නම ලැබී ඇත්තේ ජාති හතක් යොදා පිසින වෑංජනය යන අර්ථයෙනි. මෙය ව්‍යංජනයකට එහාගිය පෝෂ්‍යදායී ආහාරයකි. විවිධ වර්ගයේ එළවළු භාවිතා කරන නිසා කාබෝහයිඩ්‍රේට්, ප්‍රෝටීන්, මේදය, විටමින්, ඛනිජ, තන්තු හා ශාක රසායන ආදී විවිධ පෝෂක කොටස් මේ මගින් ලැබේ. පෝෂණ වෛද්‍ය විශේෂඥයෙකු වන සී. ඩබ්ලිව්. වික්‍රමනායක මහතාට අනුව හත්මාලුව ගර්භනී මව්වරුන්ට පවා සියලු පෝෂණය සපයන ආහාරයකි. තවද තරබාරුව, කොලෙස්ටරෝල් වැඩි බව සහ දියවැඩියා ආදී රෝග ඇති අයට අයහපත් නොවන අඩු වියදම් ආහාරයකි.මෙම සාම්ප්‍රදායික ආහාර රටාව අනාගතයට දායාද කිරීමත් එහි භාවිතය ප්‍රචලිත කිරීමත් සමාජීය මෙන්ම සංස්කෘතික වාශයෙන් ඉතා වැදගත් වේ.

***ප්‍රමුඛ පදඃ*** *සබරගමුව, හත්මාලුව ,සාම්ප්‍රදායික, ආහාර, ආවේණික*

# සාම්ප්‍රදායික ග්‍රාමීය ජන සමාජයෙන් වියැකී යන විකල්ප ආහාර සංස්කෘතිය පිළිබඳ අධ්‍යයනයක් (රිදීමාලියද්ද ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයට අයත් ගම්මාන කිහිපයක් ඇසුරින්)

කේ. එච්. එම්. ආර්. ඩී. මල්කාන්ති

රුහුණ විශ්වවිද්‍යාලය

*rasikamalkanthi1122@gmail.com*

අනාදිමත් කාලයක සිට ශ්‍රී ලංකාවේ ප්‍රධාන ආහාරය වූ "බත්" දිවයිනේ කෘෂිකර්මාන්තය ප්‍රධාන ජීවනෝපාය කරගත් ග්‍රාමීය ජනයා දෛනිකව ආහාරයට ගෙන ඇත. ග්‍රාමීය සමාජයේ ප්‍රධාන ආහාරය වූ බත් වෙනුවට අතීතයේ සිටම විකල්ප ආහාර ද භාවිත කිරීම සිදුවී ඇත. පුරාණ බින්තැන්නට අයත් රිදීමාලියද්ද ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයට අයත් ගම්මාන වන ඇටබේවල, රිදීමාලියද්ද, කන්දේගම, මහගම යන ගම්මාන ඇසුරෙන් මෙම අධ්‍යයනය සිදුකරනු ලැබීය. අතීත ආහාර රටාවේ විකල්ප ආහාර පිළිබඳව වන මෙම අධ්‍යයනය, සාම්ප්‍රදායික ආහාර වියකෙමින් පවතින යුගයක සාම්ප්‍රදායික ග්‍රාමීය ජන සමාජයේ භාවිත කරන විකල්ප ආහාර සංස්කෘතිය පිළිබඳ අතීත මානව අත්දැකීම් හා දැනුම අධ්‍යයනය කිරීම වැදගත් වන අතර රිදීමාලියද්ද ගැමි සමාජයේ ජනයා භාවිත කරන විකල්ප ආහාර පිළිබඳ අධ්‍යයනය කිරීම මෙම මඟින් සිදුවිය. ග්‍රාමීය ජන සමාජයේ ප්‍රධාන ආහාරය වූ බත් වෙනුවට භාවිත කරන විකල්ප ආහාර පිළිබඳ අධ්‍යයනය කිරීම මෙම අධ්‍යයනයේ ප්‍රමුඛ අරමුණ විය. ඒ සඳහා ක්ෂේත්‍ර අධ්‍යයන ක්‍රමවේදය හා මූලාශ්‍ර භාවිතය යටතේ ගුණාත්මක දත්ත රැස්කරගනු ලැබීය. විකල්ප ආහාර ලෙස තණ,වගුරු,සුදුබාල ඉරිඟු,වැඩිමාල් ඉරිඟු,අරලොක්කා අල,මඩු,කටුවල,වැල් අල ආදිය භාවික කර තිබේ. . ස්වාභාවික පරිසරයේ ඉබේ වැඩෙන මඩු පෙතිවලින් සකස් කරන ගිනිපු,රොටී,මඩු ගොටු, මඩු තලප ආදිය මේ අතර වේ. වගුරු ඇට හා තණ ඇටවලින් සකසන විශේෂ බතක් ද ඔවුන් සකස්කරගෙන ආහාරයට ගෙන තිබේ. ඉරිඟු තැම්බීම,පිළිස්සීම,අග්ගලා හා තලප සකස් කිරීම නූතනයේ සිදුවන අතර මෙම විකල්ප ආහාර සකස්කර ගැනීමේදී ඒවායේ පෝෂණ ගුණය, කල්තබාගත යුතු ආකාරය, කල්තැබීමට හේතු, ආහාරයට නුසුදුසු කොටස් ඉවත්කරන ආකාරය පිළිබඳව පාරම්පරික දැනුමක් ග්‍රාමීය ජනයා සතුය. රසායනික පොහොර භාවිතයෙන් තොරව වගාකරන සහ සොබාදහමෙන් ලබාගත හැකි අහාර රසකාරක භාවිතයෙන් තොරව, විකල්ප ආහාර ලෙස වර්තමානයේ පවා භාවිතා කළ හැකි බව මෙම අධ්‍යයනය තුළින් හඳුනාගනු ලැබීය. 1980 දශකයෙන් පසුව මෙම ගම්මානවල සාම්ප්‍රදායික විකල්ප ආහාර සංස්කෘතිය ක්‍රමයෙන් වියැකී ගොස් ඇති අතර ඊට පෙර සමාජයේ ප්‍රජාවගේ ආයු අපේක්ෂාව අවුරුදු 90 සිට 120 දක්වාත් 1980 දශකයට පෙර මෙම ගම්මානවල වකුගඩු රෝගය, දියවැඩියාව,අධිරුධිර පීඩනය ආදි රෝග අතිශය දුර්ලභ බවත් හඳුනාගත හැකි විය. එසේ වීමට හේතුව සාම්ප්‍රදායික විකල්ප ආහාර සංස්කෘතිය බවට වැඩිහිටියන් විශ්වාසකරන බව පැහැදිලි වේ. සාම්ප්‍රදායික ආහාර තාක්ෂණයේ හා භාවිතයේ ඇති පාරම්පරික ඥානයේ වැදගත්කම පිළිබඳව පර්යේෂණ සිදුකිරීම ජාතික වශයෙන් වැදගත් වනු ඇත.

***ප්‍රමුඛ පදඃ*** *ග්‍රාමීය සමාජය, සාම්ප්‍රදායික ආහාර,සාම්ප්‍රදායික ඥානය ,විකල්ප ආහාර,*

# සාහිත්‍ය හා පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර වලින් හෙළිවන පැරණි ලාංකිකයාගේ ආහාර රටාව පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

ඩබ්ලිව්. ඒ. එල්. පී. දිල්හාරා

ඉතිහාස අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

*leshapdilhara@gmail.com*

කෘෂිකාර්මික ජීවන රටාවකට හුරු වූ අතීත ශ්‍රී ලාංකිකයෝ ස්වාභාවික පරිසරයේ සුලභ දෑ මත ස්වකීය පරිභෝජන රටාව සකසා ගත්හ. ඒ අනුව ශාක මෙන්ම සත්ත්ව ආහාර පරිභෝජනයට ද යොමු වූ අතර ප්‍රමුඛත්වය හිමි වූයේ ශාක ආහාරවලටය. මීට වසර 10500 කට පමණ පෙර යුගයේ කිතුල්ගල බෙලි ලෙනේ වාසය කළ ආදි මානවයා පවා ආහාරයට ගෙන ඇත්තේ වල් දෙල් සහ ඇට කෙසෙල් වැනි දෑ ය. ඓතිහාසික යුගය ආරම්භ වන විට වී ගොවිතැන ප්‍රධාන වූයෙන් ඒ මත ගොඩ නැගුණු සමාජයේ ප්‍රධාන ආහාරය වූයේ බත් ය. බත් හැරුණු විට ස්වභාවික පරිසරයෙන් ලබාගත් තවත් බොහෝ දෑ පැරණි ලාංකිකයාගේ ආහාර රටාව තුළ ජනප්‍රියව පැවතුණි. මෙම අධ්‍යයනයේ අරමුණ වූයේ පැරණි ලාංකිකයාගේ ආහාර රටාව කෙසේ සකස් වී තිබුණේ ද යන්න සාහිත්‍ය හා පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය ඇසුරෙන් හඳුනාගැනීමයි. මහාවංසය, සද්ධර්මරත්නාවලිය, රසවාහිනිය, සද්ධර්මාලංකාරය ඇතුළු සාහිත්‍ය මූලාශ්‍රය ද, හෝපිටිගමුව හා එප්පාවල වැනි සෙල්ලිපි ඇසුරෙන් ද දත්ත රැස්කිරීම සිදු කරන ලදී. මූලාශ්‍රයගත සාධක අනුව බත් පැරණි ලාංකිකයාගේ ප්‍රධාන ආහාරය වී ඇත. උඳු, මුං සහ තල වැනි ධාන්‍ය වර්ග ආහාරයට ගත් බව තෝනිගල සෙල්ලිපියෙන් හඳුනාගත හැකි විය. කොඩල, කුකුළල, කටු අල සහ බතල වැනි අල වර්ග පිළිබඳව සද්ධර්මාලංකාරයේ සඳහන්ය. කැකිරි, ලබු, පුහුල් හා වැටකොලු ආදී විවිධ එළවළු වර්ග පිළිබඳව සද්ධර්මරත්නාවලියේ සඳහන් වේ. ව්‍යංජන රසවත් කිරීට කුළුබඩු ද යොදාගෙන ඇත. කිරි පරිභෝජනය හා කැඳ වර්ග පානය කිරීම ද සිරිතක්ව පැවති බව පෙනේ. කෙසෙල්, අඹ, ජම්බු, දොඩම්, උක් හා තැඹිලි ආදිය ද ආහාර වශයෙන් ලබාගත් බව පෙනේ. මස් මාංශ පරිභෝජනය ද එකල පැවතුණි. ආහාර පිසීම බැදුම්, මැල්ලුම්, හොද්ද, ඇඹුල හා නියඹලාව යන ආකාරයන්ට සිදු කොට ඇත. සුවඳ ගිතෙලින් පිසූ මොනර මස් සහ ඇල් සහලින් තැනූ බත් රාජකීයයන් අතර ජනප්‍රිය වී ඇත. කාඩි ඇඹුල, පලා මාලුව සහ නිවුඩු සහලේ බත දුගී ජනයා අතර සුලභව හඳුනාගත හැකිය. මේ අනුව සමාජ තරාතිරම කුමක් වුව ත් පැරණි ලාංකිකයන් කිසිදු අවස්ථාවක කෘත්‍රිම ආහාර පරිභෝජනය නොකළ බව ද ස්වභාවධර්මයේ පවතින දේ පමණක් ඒවායේ පෝෂණ ගුණය ද සුරැකෙන පරිදි සකසාගෙන ආහාරයට ගත් බව ද මෙම පර්යේෂණය ඇසුරෙන් හඳුනාගත හැකි විය. ඒ අනුව පැරණි ලාංකිකයන් සෞඛ්‍යාරක්ෂිත ආහාර රටාවකට හුරුව සිටි බව නිගමනය කළ හැකිය.

***ප්‍රමුඛ පදඃ*** *පැරණි ලක්දිව, ආහාර රටාව, බත්, ධාන්‍ය, ආහාර පරිභෝජනය*

# Traditional Food Behavior of Sinhalese: A Study With Reference to Pandeniya Village

P. D. Wickramage

Department of Sociology, University of Peradeniya

*paviwick15@gmail.com*

Food behavior is influenced by a variety of personal, social, cultural, environmental, and economic factors. Traditional Sinhalese food behavior include food items, attitudes, values and beliefs regarding food, knowledge of food, food safety, food hygiene, ingredients use, preparation, cooking, consuming food as amount eaten or serving sizes that are traditionally passed through generations. The objective of this study was to identify the traditional food behavior of Sinhalese referring to Pandeniya village. A qualitative study was conducted in the Pandeniya village where all the individuals of the village were Sinhalese. 10 respondents were selected through purposive sampling where data collection was done through 10 in-depth interviews and was analyzed thematically.According to the study findings, it was found that food behavior of the villagers has linked with traditional aspects in which include traditional Sinhalese food and beverage items, attitudes, values and beliefs regarding food, ingredients use, preparation, consuming food and social interactions. Villagers have a respect and gratitude towards food. They consider food as a source which makes them stay long and healthy. They also believe that individual should be mindful having food. Villagers identify food as a source of medicine too. Each food item has its own medicinal values and curative powers. They consume variety of traditional food items like *hath maluwa, kalawan mallum* and *kohila kenda*. Hot and cold nature of food is another important aspect where it is considered in order to balance the hot or cold nature of the body. The personal difference in immunization which creates different health conditions was answered through food behavior. Depending on the nature of illness they decide what type of food they should have. Based on this study, it can conclude that most of these traditional food behaviors are healthy and hygienic as well as important in maintain good social relationships This study also depicts the fact that the villagers have possess a sound knowledge on traditional Sinhalese food behavior which they try to pass down to their younger generations. This knowledge was still used by them in day today life which has shaped their food behavior.

***Key words:*** *Traditional food behavior, Sinhalese, Knowledge*

# ජනප්‍රවාද වල සඳහන් වන හෙළයන් සතුව පැවති විමාන තාක්ෂණය පිළිබඳව විමර්ශනාත්මක අධ්‍යයනයක්

සූරියවැව පඤ්ඤාසිරි හිමි

ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය

*pannasirihimi@gmail.com*

ජනශ්‍රැතිය තුළ යක්ෂ ගෝත්‍රිකයන් සතුව විවිධ ශක්තීන් තිබූ බව අනාවරණය වේ. ඒ අතර යන්ත්‍ර, මන්ත්‍ර, ද්වන්ත්‍ර ආදිය ප්‍රධාන වෙයි. ආකාශ විමාන තාක්ෂණය, ගෘහ නිර්මාණ, නගර සැලසුම්කරණය හා වාරි තාක්ෂණය ආදී තාක්ෂණික ක්ෂේත්‍රයන් ගණනාවක් තිබූ බවට සාධක ඇත. මෙහි දී ආකාශ විමාන තාක්ෂණය ප්‍රධාන තැනක් ගනී. මෙම තාක්ෂණය උපයෝගි කරගනිමින් යක්ෂයින් විසින් ආකාශ විමාන හෙවත් පුෂ්පක වැනි යාන නිපදවා ගුවන ජය ගන්නට හෙළයින් සමත්ව ඇත. හෙළයින් සතුව ආකාශ විමාන තාක්ෂණයක් පැවතියේද? යන්න පිළිබඳ අධ්‍යයනය කිරිම පර්යේෂණ ගැටළුවයි. ආකාශ විමාන හෙවත් පුෂ්පක යාන පිළිබඳව සඳහන් වන්නේ රාමායණය තුළ යි. එහි දී හනුමාන් විසින් දුටු පුෂ්පක යානයේ තොරතුරු සඳහන් වෙයි. තව ද විමානය නිපදවීමේ දි මෙන් ම ක්‍රියාත්මක කිරීමේ දි දැන සිටිය යුතු රහස් ත්‍රිත්වයන් අතර එක් අංගයක් වනුයේ මන්ත්‍ර යි. යානය පෙනීමට මෙන් ම නොපෙනීමට හා විරූප කර දැක්වීමට මන්ත්‍ර යොදා ගෙන ඇත. විනාශ කළ නොහැකි යානයක් තැනීමට අවශ්‍ය අමුද්‍රව්‍ය සකසා ඇත්තේ ද මන්ත්‍ර වලින් ය. විමානය පණ ගැන්වීමට පළිඟු උපයෝගි කරගෙන ඇත. වෛමානික ශාස්ත්‍ර ග්‍රන්ථයේ විමාන වර්ග 04ක් සඳහන් වෙයි. ශකුණ විමාන, සුන්දර විමාන, ත්‍රිපුර විමාන, රුක්ම විමාන ආදිය යි. හෙළ භාෂාවට අනුව ගුවන් යානය හඳුන්වන්නේ විමාන ලෙසිනි. දේශිය ජනශ්‍රැතියේ විශ්වාසය වන්නේ මෙවන් යානා 49 ක් හෝ 90 ක් රාවණා රජු සතුව පැවති බව යි. ජන විඥාණය තුළ ගුවන් යානය පිළිබඳ සංකල්පය ජනශ්‍රැතියේ එන කියමන් තුළින් ගම්‍යමාන වේ. ඒ අතර "යකාගේ හැටියටයි විමානේ ", "ගමන බිමන" ආදි කියමන් ප්‍රධාන වේ. විමානයක් නිපදවීමේ දි අනුගමනය කළ යුතු ක්‍රමවේදයන් පිළිබඳ තොරතුරු රාශියක් වෛමානික ශාස්ත්‍ර නැමති ග්‍රන්ථයේ සඳහන් වේ. ජනශ්‍රැතිය තුළ එම ග්‍රන්ථයෙහි තොරතුරු සඳහන් නොවුණත් එම ග්‍රන්ථයේ බොහෝ කරුණු ගැමි ව්‍යවහාරයේ පැවතීම හේතුවෙන් ගුවන් තාක්ෂණය හෙළ භාවිතාවක් බව කිව හැකි ය. ජංග්‍රාම, සෙප්පටමජවිජා, යකාගේ විමානේ, විමානයෙන් බැස එන දෙයියෝ... ආදී වදන් ජනශ්‍රැතියේ පවතී. හෙළ යක්ෂ සෙන්පතිවරුන් බුදුන් හමුවට ආවේ ගුවනින් බව බුද්ධ චරිතයේ සඳහන් වේ. එසේ ම ජනශ්‍රැතියේ සඳහන් වන නොයෙක් දෙවිවරු ගුවනින් හා ගොඩබිමෙන් ගමන් කළ බවට දෙවිවරුන් නිරූපණය වන සිතුවම් පරික්ෂා කිරීමේදි පෙනේ. ජන විශ්වාසයේ එන පරිදි පුෂ්පක යන්ත්‍ර ගොඩබැස් වූ ස්ථාන ලෙස ලංකාවේ සඳහන් "වාරියපොළවල්" හැඳින්විය හැකි ය. තව ද කාලගිරි කන්ද ප්‍රදේශයේ කුඩා ගුවන් යානා පථයක් තිබූ බවට ජනප්‍රවාදයේ සඳහන් වේ. රාවණ කථා නැමති ග්‍රන්ථයේ නොයෙක් ග්‍රාමයන් බිහිවීමට ද පුෂ්පක යානා හේතුවී ඇත. මේ අනුව විමසා බලන විට විශ්වය ජය ගැනීම සඳහා සිව්හෙළ පාලන යුගයේ ගුවන් යානා තාක්ෂණය තිබූ බව සඳහන් කළ හැකි ය.

***ප්‍රමුඛ පද:*** *ආකාශ විමාන, ජනශ්‍රැතිය, රාවණ කථා, වෛමානික ශාස්ත්‍ර, වාරියපොළ*

# TAMIL ABSTRACTS

# தமிழர்களின் கோலாட்டமும் முஸ்லிம்களின் களிகம்பும் ஓர் ஒப்பீட்டு நோக்கு

திருமதி துஷ்யந்தி யூலியன் ஜெயப்பிரகாஷ்

சுவாமி விபுலானந்தா அழகியற் கற்கைகள் நிறுவகம், கிழக்குப் பல்கலைக்கழகம்

தனி மனிதன் இணைவதால் குடும்பம் உருவாகின்றது. குடும்பங்கள் பல இணைவது சமூகமாகிறது. இவ்வாறு ஆன சமூகமே கிராமம் எனப்படுகிறது. அதாவது நிலத்தோடு பிணைக்கப்பட்ட உழைப்பையும் தனக்கென தனியான மொழியையும், சமயத்தையும் அடிப்படைக் கூறுகளாகக் கொண்ட எந்தவொரு குழுவும் அல்லது கூட்டமும் நாட்டுப்புறம் என்று அழைக்கப்படுகிறது. இந்த சமூகத்தினரின் தேவைகளையும் விருப்பங்களையும் நிறைவேற்றும் முகமாக இவர்களுடன் இணைந்ததே நாட்டுப்புற (கிராமிய) நடனமாகும். மனித வாழ்வுடனும் பண்பாட்டு விழுமியத்துடனும் தொழிலுடனும் பின்னிப் பிணைந்து காணப்படுவதே கலை ஆகும். உயிர்களிடத்தில் அன்பு கொண்டு மனிதன் அவைகளை ரசிக்கின்றான். இவ்வாறு ரசிக்கத் தெரிந்த மனிதனின் பிறப்பு முதல் இறப்பு வரை நடனம் “செம்புலப் பெயர் நீர் போல்….” இரண்டறக் கலந்துள்ளது. இது மனிதனை ஆளுமையுடையனவாகவும், புத்தி ஜீவியாகவும், மனித சமூகத்துடனான தொடர்பாடல் பண்பு உள்ளவனாகவும் தொழிலை ஊக்குவிப்பதாகவும் மன அழுத்தத்தை குறைக்கின்ற ஒன்றாகவும் காணப்படுகின்றது. ஏட்டறிவில்லாத கிராமிய மண்வாசனைக்கமைய பரம்பரை பரம்பரையாக தங்கள் பண்பாடு கலை கலாச்சாரம் என்பவற்றையும் பிரதிபலிப்பதே கிராமிய நடனமாகும். இக் கிராமிய நடனமானது நம் நினைவிற்கு எட்டாத காலத்தில் இருந்தே மனித உணர்ச்சிகளின் வெளிப்பாடாக நிலவி வந்துள்ளது. மனித சமூகம் தோன்றியதிலிருந்தே இது காணப்படுகின்றது, வயிற்றுப் பசியைப் போக்க மனிதன் வேலை செய்ய வேண்டிய கட்டாயம் இருந்தது. இவ்வாறு வேலை செய்யும் போது களைத்துப் போகின்றான். அந்த களைப்பைப் போக்கவும் ஓய்வு நேரத்தில் மகிழ்ச்சியாக இருக்கவும் மக்கள் ஆடிப்பாடினர். இவ்வாறாகத் தோற்றம் பெற்றதே கிராமிய நடனமாகும். இது மக்களின் வாழ்வோடும், வழிபாட்டோடும் நெருங்கிய தொடர்பு காணப்படுகின்றது.அந்த வகையில் தமிழர்களின் கிராமிய நடனமான கோலாட்டத்திற்கும், முஸ்லீம்களின் களிகம்பு நடனத்திற்குமிடையேயான ஓர் ஒப்பீட்டாய்வு என்பதே இவ் ஆய்வுக் கட்டுரையாக அமைகின்றது. இதில் கோலாட்டம், களிகம்பு ஆகியவை இரண்டும் ஒரே வகையான கலையாக இருந்தாலும் இவ்விரு கலைகளையும் இரு சமூகத்தினரும் எவ்வாறு எச்சந்தர்ப்பங்களில் ஆடுகின்றனர் என்பதனையும் இக்கலைகளை வெறுமனே பார்ப்பவர்களாகவும் அதன் வரலாறு சமூகப்பாரம்பரியம் என்பவற்றை பேசுபவர்களாகவும் இல்லாமல் இவ்விருகலைகளினதும் வளர்ச்சி, ஆடல்முறை, கலைஞர்களை ஊக்குவிப்பது போன்ற விடயங்களை கண்டறிவதாகவும், இரு வேறுபட்ட இன மக்களால் ஆடப்படுகின்ற கோலாட்டம், களிகம்பு இவற்றுக்கிடையேயான ஒற்றுமை, வேற்றுமைகளைக் கண்டறிவதாகவும், இக் கலை வடிவங்கள் மருவிக் கொண்டு போவதற்கான காரணங்களையும், கலைஞர்களின் நாட்டம் இல்லாமை பற்றிய காரணங்களையும், இதன் தற்கால நிலையும், சமூகத்தில் எதிர்கொள்ளும் சவால்களையும், எதிர்காலத்தில் இந்நடனம் வளர்ச்சி பெறுவதற்கு மேற்கொள்ள வேண்டிய ஆக்கச் செயற்பாடுகளையும் ஊக்குவிப்பதாக இவ் ஆய்வுக் கட்டுரை அமைகின்றது. தமிழ் மக்களிடையே காணப்படும் இக்கலையின் (கோலாட்டம்) ஆடல் முறைகள் அவற்றின் வெளிப்பாடுகள், ஒப்பனை என்பவற்றுடன் முஸ்லீம்களின் களிகம்பு நடனம் ஆடப்படும் முறை அவற்றின் வெளிப்பாடுகள் போன்றவற்றை ஆராயும் தன்மையில் அவற்றின் அடிப்படை விடயமாகத் தென்படுகின்ற பாரம்பரியம், பண்பாடு, மற்றும் தமிழ் மக்களின் மொழிப்பிரயோகம், சமூக வரலாறு மற்றும் இரு இனங்களுக்குமான மொழி, இலக்கியம், பண்பாடு போன்ற தொடர்புகளை நன்கு வெளிக் கொண்டுவருவதும், இவ்விரு நடனங்களுக்கும் இடையிலான வேறுபட்ட பாணி எவ்வாறு அமையும் என்பதை ஆராய்ந்து அறிவதே இக்கட்டுரையின் நோக்கமாக அமைகின்றது.

***திறவுச் சொற்கள்:*** *பண்பாடு, கிராமிய நடனம், மனித சமூகம், கோலாட்டம், களிகம்பு*

# சிலம்பு கூறும் பதினோராடலும், தற்கால வழக்கில் உள்ள கிராமிய நடனங்களும் - ஓர் ஒப்பீடு

C. S. Ranjithkumar

*Swami Vipulananda Institute of Aesthetic Studies, Eastern University, Kallady, Batticaloa*

*csharmilaranjith@gmail.com*

முத்தமிழ் என்ற பாகுபாடு தமிழுக்குரியது. அதுவும் பொருளுடையது என்று இலக்கிய வரலாறு உணர்த்துவது சிலப்பதிகாரம் பற்றிய உரையில் அன்றி நூல் மூலத்திலேயே ஆசிரியர் தம் காலத்து நாட்டில் நிலவிய இசை இலக்கணம், இசைக்கருவி இலக்கணம், நாடக இலக்கணம், பரத இலக்கணம், கவிநய வகைகள் முதலியவற்றை மிக விரிவாக அமைத்திருக்கிறார். இசைக்கலையும், நடனக்கலையும் தமிழ் நாட்டில் தொடர்பு பெற்று வளர்ந்து வந்தமைக்கு இது ஒரு ஆதரமாகும். சிலப்பதிகார அடிச்சுவட்டில் இன்றைய நடனங்களாக தோரிய மடந்தையர் பாடிய வாரப்பாடல் தோடயமங்களமாகவும், நால்வகை வர்ணபூதர் மற்றும் நிலவின்மீது பாடி, ஆடிய நடனமே பஞ்சசந்தி கௌத்துவமாகவும், மாதவி மாயோனை பாடி ஆடிய பெருந்தேவபாணி பதவர்ணமாகவும், திரள் நடையே தில்லானாவாகவும் தற்காலத்தில் ஆடப்பட்டு வருகின்றது. நடனத்தை இன்றைய வழக்கில் தேசி என்றும், மார்க்கம் என்றும் இரண்டாகப் பகுத்து அபிநயங்களையும், ஆடல்களையும் செய்து வருகின்றனர். தேசி என்பது வழக்கினைச் சார்ந்த நடனங்களை தன்னகத்தே உள்ளடக்கமாகக் கொண்டுள்ள நடனமாகும். கிராமியக் கலைத்தன்மையைக் கொண்டிருக்கும். இதற்கு நடன முறைக்குச் சான்றாக உள்ள இலக்கியம் குறவஞ்சி இலக்கியமாகும். சிலப்பதிகாரத்தில் குரவை என்னும் செவ்வியல் நடனம் தற்காலத்தில் கும்மி என்னும் நாட்டுப்புற நடனமாகவும், வேட்டுவ வரி உரைக்கும் வெறியாடல் தற்காலத்தில் சாமி ஆட்டமாகவும், தூண்டில் கூத்து மீனவ நடனமாகவும், ஆடப்பட்டு வருகின்றது. சிலப்பதிகாரத்தில் மாதவி தன் அரங்கேற்றத்தில் நாட்டியமாக ஆடிய ஆடல்கள் கொடுகொட்டி, பாண்டரங்கக்கூத்து, அல்லியக்கூத்து, மற்கூத்து, துடிக்கூத்து, குடைக்கூத்து, குடக்கூத்து, பேடிக்கூத்து, மரக்கால்கூத்து, பாவைக்கூத்து, கடையக்கூத்து என்பனவாகும். இவற்றைத் தற்கால கிராமிய நடனங்களுடன் ஒப்பிட்டு ஆராயும் போது மாதவி ஆடிய குடக்கூத்தே தற்காலக் கரகாட்டம் என அழைக்கப்படுகிறது. மரக்கால் ஆடல் பொய்க்கால் குதிரை ஆட்டமாக நிகழ்ந்து வருகிறது. பாவைக்கூத்தே தற்கால மரப்பாவைக்கூத்து, தோற்பாவைக்கூத்து வடிவங்களில் ஆடப்பட்டு வருகின்றது. துடிக்கூத்தானது மீனவர் நடனமாகவும், கடையக்கூத்து உழத்தியர் நடனமாகவும் வளர்ச்சியடைந்து ஆடப்பட்டு வருகின்றது. மற்கூத்து கேரள மாநிலத்தில் உள்ள களரியில் தற்போதும் ஆடப்பட்டு வருகின்றது. மாதவியினால் ஆடிக்காண்பிக்கப்பட்ட குடைக் கூத்தானது தற்காலத்திலம் திருப்பதியில் புரட்டாதி மாதத்தில் இடம்பெறும் பெருமாள் உற்சவத்தின் போது ஒரு இனத்தை சேர்ந்த மக்கள் கைகளில் குடைகளை ஏந்தியவண்ணம் குதித்து குதித்து ஆடுவதை இன்றும் காண்கின்றோம். பேடி ஆட்டத்தை தழுவிய ஒரு ஆட்டவடிவமாக இன்றும் அறவாண் ஆலயத்தில் அறவாணிகள் ஓர் ஆடலை ஆடிவருகின்றனர். இவ்வாடல்கள் இளங்கோவடிகளின் காலத்திற்கு முன்பே வழக்கில் இருந்திருக்க வேண்டும். இவ்வகையான நடனங்களே தற்கால கிராமிய நடனங்களின் தோற்றுவாயாக அமைந்துள்ளது. சிலப்பதிகாரத்தில் மாதவி ஆடிக்காட்டிய பதினோர் ஆடல்களே தற்கால வழக்கில் உள்ள கிராமிய நடனங்களாகும் என்பதனை இவ்வாய்வுக் கட்டுரையில் விரிவாக ஆராய உள்ளேன்.

***திறவுச் சொற்கள்:*** *பாகுபாடு, அடிச்சுவடு, கடையக்கூத்து, உழத்தியர், துடிக்கூத்து*

# தமிழர் பண்பாட்டில் தேனின் வகிபங்கு ஒரு சமூகவியல் பார்வை

இராமையா அழகுராஜா, மோகன்ராஜ் மனோஜ், ராமசாமி விஜயகுமார்

சமூகவியல் துறை, யாழ்ப்பாண பல்கலைக்கழகம்

*vijaykumar21vine@gmail.com*

பண்பாடு என்பதனை வாழ்வியல் முறை என்று எளிமையாக வரையறுக்கலாம். அவ்வகையில் உலகப் பாரம்பரிய பண்பாடுகளில் தமிழர் பண்பாடும் ஒன்றாகக் காணப்படுகின்றது. அந்தவகையில் தேன் உலகப் பண்பாடுகள் அனைத்திலும் முக்கிய பங்கு வகிக்கும் அதேவேளை தமிழர் பண்பாட்டிலும் காத்திரமான பங்கை வகிக்கின்றது. ஆய்வானது தமிழர் பண்பாட்டில் தேன் சமூக, சமய, பாரம்பரிய மருத்துவம், அழகியல் சார் விடயங்கள், வாழ்வாதாரம் ஆகிய தளங்களில் தேனின் பயன்பாடு தொடர்பில் ஆராய்வதனை நோக்கமாக கொண்டது. ஆய்வானது பண்புசார் ஆய்வாக முன்னெடுக்கப்பட்டது. முதலாம்நிலைத் தரவுகள் ஆழமான நேர்காணல், விடய ஆய்வு, பங்குபற்றும் அவதானம் ஆகிய தரவு சேகரிப்பு கருவிகளின் ஊடாகவும் மற்றும் இரண்டாம்நிலைத் தரவுகள் புத்தகம், பத்திரிகை, ஆய்வு அறிக்கைகள், இணையம் போன்றவற்றின் ஊடாகவும் தரவு சேகரிப்பு மேற்கொள்ளப்பட்டது. இத்தரவுகளானது கருப்பொருள் பகுப்பாய்வுக்கூடாக பகுப்பாய்வுக்கு உட்படுத்தப்பட்டு ஆய்வு முடிவுகள் பெற்றுக்கொள்ளப்பட்டன. தமிழர் பண்பாட்டில் சமூக, சமயத் தளங்களில் தேன் என்பது செல்வாக்கு மிக்கதாக காணப்படுகின்றது. குழந்தை பிறந்தவுடன் பெயர்சூட்டு விழாவின் போது தாய்மாமன் மற்றும் ஏனைய முக்கிய உறவினர்களினால் குழந்தைக்கு தேன் ஊட்டப்பட்டு குழந்தையின் வாழ்க்கை தேனுடன் ஆரம்பிப்பதாக காணப்படுகின்றது. தேன் இந்து சமயத்தின் முக்கிய பிரசாதமான பஞ்சாமிர்தத்தின் (ஐந்து அமிர்தங்கள்) முக்கிய மூலப்பொருளாக காணப்படுகின்றது. விசேடமான வேண்டுதல்கள் அடிப்படையில் தேனாபிஷேகம் செய்யப்படுவது உண்டு. தமிழர் பாரம்பரிய மருத்துவத்தில் ஆராத காயங்களுக்கும், இருமல், சலி போன்ற வியாதிகளுக்கும் மற்றும் குரல் வளத்துக்கும் தேன் இன்றளவும் பயன்படுத்தப்படுகின்றது. இந்து சமயத்தில் இருக்கு வேதத்தில் தேனின் மருத்துவ குணாதிசியங்கள் குறிப்பிடப்பட்டுள்ளது. அழகியல் சார் விடயங்களில் முகப்பொழிவு, உடல் அமைப்பு போன்ற விடயங்களுக்கு பயன்படுத்தப்படுகின்றது. வாழ்வாதாரத்தில் கிழக்கிலங்கையில் உள்ள தமிழர் வேடுவர் சமுதாயத்திலும் முல்லைத்தீவு, கிளிநொச்சி, மன்னார் ஆகிய மாவட்டங்களில் தேனீ வளர்ப்பு, தேன் வியாபாரம் என்பன ஒரு குறிப்பிடத்தக்க வாழ்வாதாரமாக காணப்படுகின்றது. அந்தவகையில் தேன் என்பது ஆரம்ப காலத்தில் உணவுகளை பதப்படுத்தும் விடயம் முதல் இன்று வரை தேன் என்பது சமூக, சமய, பாரம்பரிய மருத்துவம், அழகியல், வாழ்வாதாரம் ஆகிய தளங்களில் முக்கியமான பங்குவகிப்பதாக காணப்படுகின்றது. ஆனாலும் இன்று தேனின் பயன்பாடு குறைந்துவரும் அதேவேளை உலகமயமான வர்த்தகத்தில் தேன் கலப்படமான உற்பத்திப் பொருளாக மாறியுள்ளதன் காரணமாக தூய தேனைப் பெறுவதென்பது சவாலான விடயமாகக் காணப்படுவதால் பாமர மக்கள் தூய தேனை பெறுவதில் பிரச்சினைகளை எதிர்நோக்குகின்றனர். தேனீ வளர்ப்புக்கான பயிற்சிகள் மற்றும் உதவிகளை வழங்கள் ஆகிய விடயங்களின் ஊடாக தேன் உற்பத்தியை மேம்படுத்தலாம். பாரம்பரியமான, மருத்துவ நற்குணமுள்ள, மனித ஆரோக்கியத்தை காக்கும் ஒரு பாரம்பரியமான உணவுப்பொருள் என்றவகையில் தேன் தொடர்பான அதன் முக்கியத்துவத்தை வெளிப்படுத்துவதாக தமிழர் பண்பாட்டில் தேன் என்ற ஆய்வானது அமைகின்றது.

***திறவுச் சொற்கள:*** *பண்பாடு, சமயத் தளங்கள், தேன், பாரம்பரிய மருத்துவம்*

# தமிழர்களுடைய மரணச்சடங்குகளில் வழக்கிழந்து வரும் ஒப்பாரிப்பாடல்கள் (யாழ்ப்பாணத்தை அடிப்படையாகக் கொண்ட ஆய்வு)

அனித்தா சசிகரன்

வரலாற்றுத்துறை, யாழ்ப்பாணப்பல்கலைக்கழகம்

*yaniththaaa@gmail.com*

இலங்கையில் தமிழர்களுடைய பாரம்பரிய பண்பாட்டினை வளம்படுத்திய பிராந்தியங்களில் ஒன்றாக யாழ்ப்பாணம் அடையாளப்படுத்தப்பட்டு வருகின்றது. பண்டுதொட்டு அநுராதபுரத்திற்கு வடக்கே யாழ்ப்பாணம் உள்ளிட்ட வடஇலங்கை பாளி மொழியில் நாகதீபம், தமிழில் நாகநாடு எனத் தனித்து அடையாளப்படுத்தப்பட்டு வந்துள்ளது. இதற்கு இப்பிராந்தியத்தில் தோன்றி வளர்ந்த தனித்துவமான பண்பாடும் ஒரு காரணம் என்பதை வடஇலங்கையில் சிறப்பாக யாழ்ப்பாணத்தில் மேற்கொள்ளப்பட்டு வரும் தொல்லியல் ஆய்வுகள் உறுதி செய்கின்றன. இத்தகைய பாரம்பரிய பண்பாட்டுச் சிறப்புக்களைக் கொண்ட யாழ்ப்பாண மக்களின் வாழ்வியலோடு இரண்டறக்கலந்த பண்பாட்டுக் கூறாக சடங்குகள் காணப்படுகின்றன. சமகாலத்தில் மாறிவரும் புதிய பண்பாட்டுச் சூழலினால் யாழ்ப்பாணத்தின் பாரம்பரிய சடங்குகள், பண்பாட்டுக் கூறுகள், சின்னங்கள், அடையாளங்கள் மாற்றமடைந்தும் மறக்கப்பட்டும் மருவியும் வருகின்றன. மனிதவாழ்க்கை வட்டச்சடங்குகளில் இறுதியாக அமைவது மரணச்சடங்கு அல்லது இறப்புச்சடங்கு ஆகும். யாழ்ப்பாண மக்களின் மரணச்சடங்குகளில் பாரம்பரிய நிகழ்வுகளாக வெள்ளை கட்டுதல், தோரணங்கட்டுதல், தட்டைப்பந்தல் அமைத்து பச்சை ஓலைகளால் வேய்தல், குளிப்பாட்டுதல், பால்வார்த்தல், தீப்பந்தம் பிடித்தல், ஒப்பாரி பாடுதல், வாய்க்கரிசி போடுதல் போன்றன இடம்பெற்று வந்துள்ளன. இவற்றுள் தட்டைப்பந்தல் அமைத்து பச்சை ஓலைகளால் வேய்தல், வெள்ளை கட்டுதல், ஒப்பாரி பாடுதல் போன்றன சமகாலத்தில் வழக்கிழந்து வருகின்றன. இத்தகைய மாறிவரும், வழக்கிழந்து வரும் பண்பாட்டுக் கூறுகளில் முக்கியம்பெற்ற அம்சமாக ஒப்பாரிப்பாடல்கள் காணப்படுகின்றன. இதனால் யாழ்ப்பாணத்தில் மாறிவரும் புதியபண்பாட்டுச் சூழலுக்கான காரணங்களை கண்டறிதல், எமக்குரிய பாரம்பரிய பண்பாட்டுக் கூறாக விளங்கும் ஒப்பாரிப்பாடல்களை வயோதிபப் பெண்களிடம் இருந்து கேட்டு எழுத்துருவாக்கி ஆவணப்படுத்தி பிற்கால சந்ததியினருக்கு வழங்குதல் மற்றும் எதிர்கால சந்ததியினரும் எமது பண்பாட்டினைப் புரிந்து அவற்றைப் பேணுவதற்கான விழிப்புணர்வை ஏற்படுத்துதல் முதலான நோக்கங்களைக் கொண்டதாக இவ்வாய்வு அமைந்துள்ளது. இவ்வாய்வுக்காக முதலாம் நிலைத்தரவுகள், இரண்டாம் நிலைத்தரவுகள் என்ற அடிப்படையில் சான்றுகள், ஆதாரங்கள் எடுத்துக் கொள்ளப்படுகின்றன. முதலாம் நிலைத்தரவுகள் என்ற அடிப்படையில் ஒப்பாரி பற்றிய சொற்பதங்கள், செய்திகள் வரும் இலக்கியங்களான தொல்காப்பியம், புறநானூறு, பன்னிருபாட்டு, தமிழ் அகராதிகள் என்பவற்றை அடிப்படையாகக் கொண்டும், இரண்டாம் நிலைத்தரவுகள் என்ற அடிப்படையில் யாழ்ப்பாணத்தில் மாறிவரும் பண்பாட்டுச் சூழலுக்கான காரணங்கள் மற்றும் ஒப்பாரிப்பாடல்கள் போன்றவை பற்றிக்கூறும் நூல்கள், சஞ்சிகைகள், இணையத்தளங்கள் போன்றவற்றோடு நேர்காணல்கள் ஊடாகவும் தகவல்களை திரட்டி இவ்வாய்வு மேற்கொள்ளப்படும். ஆரம்பகால கட்டங்களில் யாழ்ப்பாணத்தில் மரணவீடுகளில் ஒப்பாரி பாடுதல் என்பது யாழ்ப்பாண மக்களின் மரணச்சடங்குகளில் ஒரு முக்கிய நிகழ்வாகவும், பாரம்பரிய மரபாகவும் இருந்து வந்துள்ளது. யாழ்ப்பாணப் பெண்கள் இறந்தவர்களை நினைத்து, இறைவனை நிந்தித்து, விதியின் கொடுமையை நொந்து, இறந்தவரை நேசித்த விதத்தையும், இறந்தவரின் பெருமையையும் அவருடைய குணநலன்களையும், அவர் பிறரால் போற்றப்பட்ட முறையையும், அவரது இறப்பினால் தனக்கு ஏற்பட்டுள்ள ஏற்படப்போகும் அவல நிலையையும், குடும்பத்தின் நிலையையும் சோக உணர்ச்சியுடன் எதுகை, மோனை, உவமை, பொருளற்ற ஓசைநயம், வர்ணணைகள், வினாவிடைகள் என்ற அடிப்படையில் சோகஉணர்வாகப் பாடிவந்தனர். ஒப்பாரி சொல்லி வாய்விட்டு அழுவது என்பது இவர்களுடைய வாழ்வியலின் முக்கிய பண்பாட்டுக் கூறாக மட்டுமன்றி உளவியல் மருத்துவ முறையாகவும் இருந்து வந்துள்ளது. ஆனால் இன்று ஒப்பாரி பாடுதல் மரபானது யாழ்ப்பாணத்தில் ஒருசில கிராமங்களில் மட்டும் வயோதிபப் பெண்களால் மட்டுமே மிகஅரிதாகப் பாடப்பட்டு வருவதையே அவதானிக்க முடிகின்றது.

***திறவுச் சொற்கள்:*** *யாழ்ப்பாணம், பண்பாடு, ஒப்பாரி, சடங்குகள், பெண்கள்*

# இலங்கையில் தமிழ்க் கத்தோலிக்க நாட்டாரியல் : ஓர் ஆய்வு

J. Harosana

Department of Languages, Sabaragamuwa University of Sri Lanka

*harosana87@gmail.com*

தமிழ்ச் சூழலுடன் இணைந்து கொண்ட ஒவ்வொரு மதமும் தமிழின் உபபண்பாடுகளில் ஒன்றாக மாறிய அதேவேளை தமிழ் மக்கள் மத்தியில் செல்வாக்குப் பெற்றிருந்த மரபு சார்ந்த கூறுகளைத் தத்தமது கருத்துநிலைக்கும் தேவைக்கும் ஏற்ப பயன்படுத்திக் கொண்டன. இந்திய பண்பாட்டுக்கு வெளியிலிருந்து வந்து தமிழ்ச் சூழலுடன் இணைந்து கொண்ட கத்தோலிக்கமும் தனது நோக்கு நிலைக்கும் தேவைக்கும் ஏற்ப சாதாரண பாமர மக்கள் மத்தியில் செல்வாக்குப் பெற்றிருந்த நாட்டாரியல் பண்பாடுகளை உள்வாங்கிக் கொண்டபோது அது கத்தோலிக்க நாட்டாரியலாகத் தமிழில் பரிணாமமெடுத்தது. நாட்டாரியலில் மேற்கத்தேய மதங்களின் முக்கியத்துவமும் வலியுறுத்தப்படுவது அரிதாகவே இடம்பெறுகின்றது. மேற்கத்தேய மதங்களைப் பொறுத்தவரை அவை நாட்டாரியலுக்குப் புறம்பானவை என்ற தவறான கருத்து நிலவுவதுடன் அம்மதங்களின் நாட்டாரியல் அம்சங்கள் ஆராயப்படுவதில்லை. தமிழிலும் கத்தோலிக்க நாட்டாரியல் பற்றிய ஆய்வுகள் குறைவாகவே வந்துள்ளன. ஆ. சிவசுப்பிரமணியம், காரை சுந்தரம்பிள்ளை, அ. சண்முகதாஸ், சு. வித்தியானந்தன், மிராண்டா எஸ். ஏ, ரூபி வலன்ரினா முதலான சிலருடைய ஆய்வுகள் இந்த வகையில் குறிப்பிடத்தக்க ஆய்வுகளாகும். இவை பெரும்பாலும் நாடகம், நாட்டுக் கூத்துப் பற்றிய ஆய்வுகளாக அமைவதுடன் கத்தோலிக்க நாட்டாரியலின் முழுமையைத் தனி அலகாகக் கொண்டு மதிப்பிட முயலவில்லை. அந்தவகையில் இவ்வாய்வு, இலங்கையில் தமிழ்க் கத்தோலிக்க நாட்டாரியலின் காத்திரமிக்க வெளிப்பாடுகள் எவை என்பதை ஆய்வுப் பிரச்சினையாகக் கொண்டு மேற்கொள்ளப்பட்டுள்ளது. இலங்கையில் தமிழ்க் கத்தோலிக்க நாட்டாரியலின் கூறுகளையும் அவற்றின் முக்கியத்துவத்தையும் வெளிக்கொண்டு வருதல் இவ்வாய்வின் நோக்கமாகும். இவ்வாய்வானது கள ஆய்வில் திரட்டிய முதலாம் நிலைத் தரவுகளையும் இரண்டாம் நிலைத் தரவுகளையும் அடிப்படையாகக் கொண்டு, சமூகவியல் மற்றும் மானிடவியல் அணுகுமுறைகளின் வழி பகுத்தாராயப்பட்டுள்ளது. கத்தோலிக்கம் தமிழ்ச் சூழலில் இணைந்து கொண்டபோது தன்னை நிலை நிறுத்திக் கொள்வதற்காகவும் தக்க வைத்துக் கொள்வதற்காகவும் சாதாரண அடிநிலை மக்கள் மத்தியில் செல்வாக்குப் பெற்றிருந்த நாட்டாரியல் கூறுகளைத் தனக்கான ஊடகமாகப் பயன்படுத்திக் கொண்டது. கத்தோலிக்க மரபில் எழுந்த பல படைப்புக்களும் சாதாரண அடிநிலை மக்களை முன்வைத்து எழுந்தவையேயாகும். அவை நாடகங்களாகவும், நாட்டுக் கூத்துக்களாகவும் பல்வேறு கதைப்பாடல்களாகவும் இலக்கியங்களாகவும் இன்னும் பல்வேறு நாட்டாரியல் சார்ந்த அம்சங்களாகவும் வெளிப்படுகின்றன. இன்று தமிழ்க் கத்தோலிக்கர் மத்தியில் வழக்கிலிருக்கும் கூத்துக்கள், வாசப்பு, விலாசம், பாஸ்கு, படைவெட்டு நாடகம் முதலான நாடக மரபுகளும் அவற்றினடியாகப் பிறந்த பாவைக் கூத்தாக ஆடப்படும் உடக்கு பாஸ் எனப்படும் நாட்டாரியல் நாடக வடிவமும் கத்தோலிக்க மகிடிக் கூத்து மரபும் பள்ளு, அம்மானை, குறவஞ்சி முதலான நாட்டாரியல் இலக்கிய வடிவங்களும் புலம்பல்கள், விருத்தங்கள், தெம்மாங்குகள், கதைப்பாடல்கள், பழமொழிகள் முதலான நாட்டார் இலக்கிய வடிவங்களும், இன்னும் தமிழ்க் கத்தோலிக்கரிடத்தில் வழக்கிலிருக்கின்ற சடங்குகள், பழக்கவழக்கங்கள், வழக்காறுகள், நம்பிக்கைகள் உள்ளிட்ட பண்பாட்டு அம்சங்களும் தமிழில் கத்தோலிக்க நாட்டாரியலின் காத்திரம் மிக்க வெளிப்பாடுகள் எனலாம். தமிழ் இந்துக்களுடைதா தமிழ் கத்தோலிக்கருடையதா எனப் பிரித்தறிய முடியாதபடி, கத்தோலிக்கர் வாழ்கின்ற சூழல் பிராந்திய, பண்பாட்டு வாழ்க்கை முறையுடன் இவற்றுள் சில ஒன்றித்தும் உள்ளன.

***திறவுச் சொற்கள்:*** *நாட்டாரியல், தமிழ்க்கத்தோலிக்கம், கத்தோலிக்க நாட்டாரியல், கத்தோலிக்க நாடகமரபு*

# நாட்டார் மரபில் பெரிய எழுத்து நூல்கள்: ஒரு சமூக வரலாற்றியல் ஆய்வு

Mr. M. M. Jayaseelan

Department of Tamil, University of Peradeniya

*jseelanuop@gmail.com*

வெகுசனத் தமிழ்ப் பண்பாட்டில் பெரிய எழுத்துப் பொஸ்தகங்கள் என்ற நூல்கள் இற்றைவரை புழக்கத்தில் உள்ளன. எளிதாக வாசிக்கக் கூடிய வகையில் வழமையான எழுத்துரு அளவிலிருந்து பெரிதாக அச்சிடப்பட்டுள்ள இந்நூல்கள், 19ஆம் நூற்றாண்டின் இறுதியிலும் 20ஆம் நூற்றாண்டின் முற்பகுதியிலும் அதிகமாக அச்சிடப்பட்டுள்ளன. இந்நூல்கள் பிற்காலத்தில் மெல்ல மெல்ல செல்வாக்கிழந்து சென்றாலும் சடங்கு, வழிபாடு என்ற நிலையில் இன்றும் நிலைபெற்றே உள்ளன. இந்நூல்கள் அச்சாக்கம் பெற்ற சமூக வரலாற்றுப் பின்னணியைக் கண்டறிதல் இக்கட்டுரையின் நோக்கமாகும். தமிழில் வெளிவந்துள்ள பெரிய எழுத்து நூல்களையும், அந்நூல்கள் அச்சாக்கம் பெற்ற காலத்துச் சமூக வரலாற்றுத் தகவல்களையும் முதன்மை ஆதாரங்களாகக் கொண்டுள்ள இக்கட்டுரை, உள்ளடக்கப் பகுப்பாய்வு முறைமையில் சமூகவியல் மற்றும் வரலாற்றியல் அணுகுமுறைகளின்வழி பகுப்பாய்வு செய்யப்பட்டுள்ளது. எழுத்துக்களைப் பெரிதாக அச்சிட்டதன் முதன்மை நோக்கம், எளிமையான தொடர்களை வாசிக்கக்கூடிய அளவிளான எழுத்துப் பயிற்சியைப் பெற்ற முதலாம் தலைமுறை வாசிப்பாளர்கள் இலகுவாக வாசிப்பதற்காகும். அத்துடன் தமிழில் அச்சுப் பண்பாடு பரந்தளவில் பரவலாக்கம் பெற்றபோதே இந்நூல்கள் அச்சாக்கம் பெற்றுள்ளதால் அச்சுப்பண்பாட்டின் பரவலாக்கத்துக்கும் இந்நூல்களின் அச்சாக்கத்துக்கும் இடையே நெருங்கிய உறவிருந்திருக்க வேண்டும். அதனால் வாசிப்பு எளிமை மட்டும் இதன் நோக்கமல்ல. அச்சுத் தொழில்நுட்பத்தின் பரவலாக்கம் நூல் உற்பத்தியிலும் நுகர்விலும் முக்கிய மாற்றங்களை ஏற்படுத்தியது. ஒரே நேரத்தில் அதிக பிரதிகள், குறைந்த விலை என்பவற்றால் நூல்களின் பயன்பாட்டு எல்லை விரிவாக்கம் பெற்றது; வாசிப்பு, வாசகர் வட்டத்தில் மாற்றங்கள் ஏற்பட்டன. அதுவரை காலமும் சமூகத்தின் மேற்தளத்தில் வாழ்ந்த ஒரு குறுகிய வட்டத்தில் மட்டும் தேங்கிக் கிடந்த அறிவுச் சொத்துக்கள் சாதாரண மக்களை நோக்கி நகரத்தொடங்கின. அந்நகர்வு மொழி இலக்கியங்களின் பண்பிலும் வாசிப்பு முறைகளிலும் மாற்றங்களை ஏற்படுத்தியது. அதன்போது மேட்டுக்குடியினரின் வாசிப்புத் தேவையை நிறைவு செய்யும் வகையில் செவ்வியல் நூல்களைப் பதிப்பித்தல், புதிய நூல்களை உருவாக்குதல், பத்திரிகை-இதழ்களை வெளியிடுதல் என்பவை இடம்பெற்றன. அதற்குச் சமாந்தரமாக சாதாரண மக்களின் வாசிப்புத் தேவையை நிறைவு செய்யும் வகையிலான செயற்பாடுகளும் முன்னெடுக்கப்பட்டுள்ளன. அவற்றுள் பிரதானமானதாகவே பெரிய எழுத்து நூல்கள் அமைந்துள்ளன. ஆரம்பத்தில் ஐரோப்பியரின் ஏகபோக உரிமையாக இருந்த அச்சுத் தொழில்நுட்பம், 1835ஆம் ஆண்டு முதல் சுதேசிகளும் பயன்படுத்தும் வாய்ப்பு கிடைத்தது. ஆனால், சுதேசிகளில் மேட்டுக்குடியினரே அந்த உரிமையின் மொத்தப் பயனையும் பெற்றுள்ளனர். அம்மேட்டுக்குடியினர் அடித்தட்டு மக்கள் மத்தியில் நிலவிய சமய வழிபாட்டு மரபுகளையும் இலக்கிய வெளிப்பாடுகளையும் நிராகரித்ததோடு அவற்றுக்கு மாறாக தமது வழிபாட்டு மரபுகளையும் இலக்கிய வெளிப்பாடுகளையும் அச்சிட்டுள்ளனர். இந்நிலையிலேயே அச்சுத் தொழில்நுட்பம் சாதாரண மக்களைச் சென்றடைந்தபோது அவர்கள் மேட்டுக்குடி அச்சுப் பண்பாட்டுக்கு மாறான அச்சுப் பண்பாட்டைக் கட்டி எழுப்பியுள்ளனர். அதனாலேயே செவ்வியல் மரபுக்கு மாறாக சாதாரண மக்கள் மத்தியில் தேங்கிக்கிடந்த கதைமரபுகளை அச்சுவாகனம் ஏற்றியுள்ளனர். அதேவேளை அந்நூல்களை நுகரும் முறையும் மேட்டுக்குடி மரபுக்கு மாறாகவே அமைந்துள்ளது. தமிழ்ச் சூழலில் அச்சுப் பண்பாட்டின் பரவலாக்கத்தினால் மேட்டுக்குடி மற்றும் நடுத்தர வர்க்கத்தினரிடையே தனிமையிலும் மௌனமாகவும் வாசித்தல் நிலைபெற்றது. ஆனால், வெகுஜனப் பண்பாட்டின் பெரிய எழுத்து நூல்கள் இற்றைவரை வாய்விட்டு வாசிப்பதாகவும் கூட்டு வாசிப்பாகவுமே இடம்பெற்றுவருகின்றன. எனவே, பெரிய எழுத்து நூல்களானவை வெறுமனே வாசிப்பு எளிமைக்கான நூல்கள் மட்டுமல்ல. அவை மேட்டுமைப் பண்பாட்டுக்கு எதிரான பண்பாட்டு வடிவமாகவும் விளங்கியுள்ளன.

***திறவுச் சொற்கள்:*** *அச்சுப் பண்பாடு, பெரிய எழுத்துப் பொஸ்தகம், வாசிப்பு, வெகுசனம்.*

# மீள்குடியேற்றப்பட்ட மக்களின் சமூக பண்பாட்டு மாற்றங்களும் அதன் தாக்கங்களும்: முசலி பிரதேசத்தின் பண்டாவளிக் கிராமத்தினை மையமாகக் கொண்ட ஒரு சமூகவியல் ஆய்வு

எம். எப். பமீஸ்

சமூகவியல் துறை” யாழ் பல்கலைக்கழகம்

*fawsfamees1@gmail.com*

மீள்குடியேற்றப்பட்ட முஸ்லிம்களது கிராமியப் சமூகப் பண்பாட்டு வாழ்வியல் மாற்றங்களை ஆராய்வதினை மையமாகக் கொண்டதாக ஆய்வுள்ளது. கிராமிய வாழ்வினை அடையாளப்படுத்துவதில் அதிக செல்வாக்குள்ள காரணியாக பண்பாடுசார் சூழல் அமைகிறது. முசலி முஸ்லிம்கள் தனியான கிராமிய கலைப் பண்பாட்டு அம்சங்களை கொண்டவர்களாக வாழ்ந்து வந்ததுடன் நாட்டின் அசாதாரண சூழ்நிலை காரணமாக 1990ம் ஆண்டு இடப்பெயர வேண்டி ஏற்பட்டது. முப்சதாப்த போர் ஒப்பந்தத்தின் பின்னராக மீள்குடியேறிய இச் சூழலில் இவர்களது சமூகக் பண்பாட்டு வாழ்வியல் அம்சங்களினை கண்டறிவதுடன் அவற்றில் ஏற்பட்ட மாற்றங்களை சமூகவியல் நோக்கில் ஆராய்கின்றது. முசலி பிரதேச கிராமிய முஸ்லிம்களின் வாழ்வியல் சடங்குகள், மருத்துவ முறைகள், பாரம்பரிய பொழுது போக்குகள், வாழ்வியல் பிரதான சடங்குகளான பிறப்பு பூப்பெய்தல், சுன்னத்திருமணம், திருமணம், மையத்து அடக்கம் காணப்பட்டதுடன் பாரம்பரிய உணவு முறைகள் மருத்துவ முறைகளும் பொழுது போக்கு சாா்ந்த விளையாட்டுக்கள் ஆண் பெண் சாா்ந்த கூட்டுச் செயற்பாடுகளும் காணப்பட்டதுடன் இவற்றில் மாற்றங்களும் நிகழ்ந்து வந்திருக்கின்றது. இவ்வகையான மாற்றங்களினை வெளிக்கொணா்வதுடன் அதனுடன் செல்வாக்குச் செலுத்தும் காரணிகளைகளையும் குவிமையப்படுத்துகின்றது. இடப்பெயா்வுக்கு முன்னரான திருமண முறையில் மாப்பிள்ளை தேடுதல், கேட்டுப் போடுதல், மோதிரம் அணிவித்தல், மாப்பிள்ளை துருக்கி தொப்பி அணிதல் மற்றும் அவருக்கு குடைபிடித்தல், வெள்ளை விரிப்பு விரித்தல், வாழை மரம் நடல் போன்றவற்றினை கொண்டிருந்ததுடன் கிட்டியத்தல், போனை சுண்டுதல், கண்ணாம்பூச்சி ஒழித்தல் இகிளிததட்டு கொந்தி போன்ற கிராமிய விளையாட்டுக்களும் வைத்திய முறைகளாக ஆயுா் வேதம் இஹோமியோபதி, இஸ்ம் இமை பாா்த்தல், இதாயத்து, மந்திரக வைத்தியம் போன்றனவும் காணப்பட்டன. கூட்டு செயற்பாடுகளாக பெருநாள் விழா கும்மியடித்து மகிழ்தல், கழிகம்பு விளையாட்டு சீராயப்ர்ராணம் வாசித்தல், கிடுகு மேய்தல் போன்றவற்றினையும் குறிப்பிடலாம். ஆகவே மக்கள் நவீனமயமாக்கம் புதிய தலைமுறை முன்னைய சமூக பண்பாட்டு பற்றிய இளையவா்கள் அறியாமை அகதி முகாம்களில் உள்ளுா் பண்பாட்டு கலப்புக்கு உட்பட்டமை இளையவா்கள் பாரம்பரியங்களை புறக்கணித்தல் பூகோளமயமாக்கம் ஏனைய மதத்திற்கு ஒப்பாக கருதுகின்றமை தொழில் நுட்ப உபகரணங்களின் பயன்பாடு போன்றன மாற்றத்திற்கான காரணிகளான உள்ளன. இடப்பெயா்வுக்கு முன்னரும் தற்போதைய நிலையையும் ஒப்பீட்டு முறையில் ஆராய்கின்றது. 22 போ் தெரிவு செய்யப்பட்டு நோ்காணல், கலந்துரையாடல்கள் அவதானிப்பு கருவிகள் மூலம் முதலாம் நிலைத் தரவுகளும் பண்பு சாா்ந்த ஆய்வு நுட்பத்தில் குறியீட்டு ஒப்பீட்டு முறையின் மூலம் பகுப்பாய்வு செய்யப்பட்டது. மேலும் இரண்டாம் நிலைத் தரவுகள் சஞ்சிகைகள், புத்தகங்கள், கட்டுரைகள் முதலானவை பயன்படுத்தப்பட்டன. இறுதியாக இம்மாற்றத்தின் பாதிப்புக்களாக இளையவா் முதியவா் முரண்பாடு உள சமூக ரீதியாக பல்வேறு பாதிப்புக்களை எதிா்கொள்ளுகின்றமை சமய ரீதியான சா்ச்சைகள் என்பன பல ஏற்படுகின்றன. இந்த ஆய்வின் முடிவில் கண்டறியப்பட்டதற்கு ஏற்ப பண்பாட்டு சூழலமைவை வலியுறுத்தல், இளையா்களுக்கு முன்னைய வாழ்வியல் பண்பாடுகளை கற்பித்தல், சமய ரீதியாக ஆகுமாக்கப்பட்டவற்றின் மூலமாக தலைமுறையினரைருக்குடையே ஒன்றிப்பை ஏற்படுத்தல் பாரம்பரிய தொழில்களை மேற்கொள்வதற்கும் மேலும் விருத்தி செய்வதற்கான நடவடிக்கைகளை மேற்கொள்ளல் உட்பட பல்வேறு தீா்வு நுட்பங்களும் பரிந்துரைக்கப்பட்டன.

***திறவுச் சொற்கள்:*** *கிராமியம், கலை, பண்பாடு, வாழ்வியல் மாற்றம்*

# சமூகப் பண்பாட்டியல் நோக்கில் பழமொழிகள்: மரபும் மாற்றமும்

A. Vinothini

Department of Language Studies, the Open University of Sri Lanka

*avino@ou.ac.lk*

நாட்டுப்புறவியலின் ஒரு கூறாக அமையும் பழமொழிகள், ஒரு சமுதாயத்திலே நீண்டகாலமாகப் புழக்கத்தில் இருந்துவரும் அனுபவக் குறிப்புக்கள் ஆகும். ஒரு சமுதாயத்தின் அனுபவ முதிர்ச்சியையும், அறிவுக் கூர்மையையும் எடுத்து விளக்குவதாகவே இப்பழமொழிகள் அமைகின்றன. எடுத்துக்கொண்ட பொருளை சுருக்கமாகவும் தெளிவுடனும் சுவையுடனும் பழமொழிகள் விளங்க வைக்கின்றன. வழக்குமொழியில் வாழ்வியலுக்குப் பொருத்தமாக தொன்றுதொட்டே பொருளைச் சுருங்கிய சொற்களால் செவிக்கு இனிமையாகக்கூறி விளங்கவைக்கும் பெருவழக்குத் தொடர்கள் பழமொழிகள். சமூகப் பண்பாட்டியல் நோக்கில் பழமொழிகளை நோக்கின் இவை உவமை கூறவும், சமூகத்தில் பிழை செய்வோரை நல்வழிப்படுத்தவும், சூழமைவுக்கு ஏற்றவாறு எடுத்தாளவும், சூழமைவை அல்லது பொருளை விளங்க அல்லது விளக்க எனப் பல்வேறு காரணங்களுக்காகப் பயன்படுகின்றன. இவற்றை பொருள் அடிப்படையில் வாழ்வியல், தொழில், இயற்கை, சோதிடம், ஆண்-பெண், கல்வி சார்ந்தவை என்ற வகையில் பலவாறு நோக்கலாம். அந்தவகையிலே, இந்த ஆய்வானது வாழ்வியலுக்குப் பொருத்தமான பழமொழிகள் நடைமுறைக்கு ஒத்துப்போகாத பொருளைக் கொண்டு மாற்றங்கள் பெற்றதனை ஆய்வுப்பிரச்சினையாகக் கொண்டு சமூகப் பண்பாட்டியலில் பழமொழிகளின் மரபினையும் அப்பழமொழிகளில் ஏற்பட்ட கருத்து மாற்றங்களையும் ஆய்வு செய்வதாக அமையும். பிரதானமாக இலக்கியப் பகுப்பாய்வு முறையை அடிப்படையாகக் கொண்டு பழமொழிகள் தொகுப்பு நூல்கள் முதனிலைத் தரவுகளாகவும்; பழமொழிகள் தொடர்பாக வெளிவந்த கட்டுரைகள் இரண்டாம் நிலைத் தரவுகளாகவும் பயன்படுத்தப்பட்டு, முற்றுமுழுதாகப் பண்புசார் ஆய்வாக அமையும். காலாகாலமாகக் கூறப்பட்டு வந்த பழமொழிகளும், அவை தொடர்பான மேலோட்டமான பார்வையும், கருத்தாக்கங்களுமே இதற்கான வலுவான காரணங்களாக அமைகின்றன. பழமொழிகள் சமூகத்தினதும் பண்பாட்டினதும் சுவடாக மட்டுமன்றி, வாழ்க்கையினையும் அவ்வாழ்க்கைக்கு அவசியமான வழிகாட்டல்களையும் எத்துணையளவு நிரூபித்துள்ளது என்பதனை முன்வைப்பது மட்டுமன்றி, வயது – பால்நிலைப் பாகுபாட்டோடு சமுதாயத்திற்கான கருத்தாக்கங்களை தெளிவுபடுத்தல், மனிதவாழ்வியல் கூறுகளைக் காட்டும் பதிவு என்பதனை நிரூபணம் செய்தல், வாய்மொழிப் பாரம்பரியத்தின் பண்பினைத் தெளிவுபடுத்தல் ஆகிய விடயங்களையும் எடுத்துக்காட்டி, பழமொழிகளை முறையாக, செம்மையாகப் கருத்துப் பிறழ்வின்றி பயன்படுத்துவதன் மூலம் வாய்மொழிப் பாரம்பரியமான பழமொழிகளை சமூகப் பண்பாட்டின் சுவடாக நிலைபெறச் செய்யலாம் என்பதனை நோக்காகக் கொண்டதே இவ்வாய்வு ஆகும்.

***திறவுச் சொற்கள்:*** *சமூகப் பண்பாட்டியல், பழமொழிகள், மரபு, வழக்குமொழி, வாழ்வியல்*

# உடப்புப் பிரதேச நாட்டார் மருத்துவம்

S. R. Devakumari

Sabaragamuwa university of Sri Lanka

*dsundararaajan@gmail.com*

புத்தள மாவட்டத்திலுள்ள ஒரு தனித்தமிழ் கிராமமே உடப்புக் கிராமமாகும். இங்கு பெரும்பான்மையினராக இந்துக்களே உள்ளனா். இங்குள்ள மக்கள் இன்றைக்குப் பத்துப் பதினைந்து வருடங்களுக்கு முன்புவரை தங்களுக்கேயுரிய பல தனித்துவப் பண்புகளை யுடையவா்களாக வாழ்ந்துவந்தனா். அவா்களிடத்தில் காணப்பட்ட தனித்துவப் பண்புகளில் ஒன்றே நாட்டார் மருத்துவமுமாகும். எனவே, இக்கிராமத்தில் நாட்டுப்புற மருத்துவத்தின் செல்வாக்கு எவ்வாறு உள்ளது என்பதே இவ்வாய்வின் ஆய்வுப் பிரச்சினையாகவும் நோக்கப்படவுள்ளது. நாட்டாரியல் தொடா்பான நூல்களில் காணப்படும் நாட்டார் மருத்துவம் பற்றிய கட்டுரைகளும், நாட்டார் மருத்துவம் பற்றிய பொதுவான நூல்களுமே இங்கு இலக்கிய மீளாய்வுக்குரியனவாகக் காணப்படுகின்றமையுடன், உடப்புக்கிராமத்தில் இது தொடா்பாக எந்தவித முயற்சியும் இதுவரையில் இடம்பெறவில்லை யென்பது ஆய்விடைவெளியாகவும் காணப்படுகின்றது. இங்கு சேகரிக்கப்பட்ட நாட்டார் மருத்துவ முறைகள், சம்பந்தப்பட்டவா் களுடனான நேரடி உரையாடல்கள் மூலம் பெற்றுக்கொண்ட தரவுகள் என்பன முதலாந்தர ஆய்வு மூலங்களாகவும் நாட்டார் மருத்துவ முறைகள் தொடா்பாக நூல்கள், சஞ்சிகைகள், இணையத்தளம் போன்றவற்றில் வெளிவந்த கட்டுரைகள், ஒளித்தொகுப்பு நாடாக்கள், நூல்கள் போன்றன இரண்டாம் நிலைத்தரவுகளாகவும் பயன்படுத்தப்படுகின்றன. உடப்புக்கிராமம் பற்றிய தெளிவினை ஏனையவா்களும் பெற்றுக்கொள்ளும்படிச் செய்தல், இங்கு நடைமுறையில் இருந்துவந்த நாட்டார் மருத்துவமுறைகளை அடையாளங்காண்டு, ஆரம்ப காலங்களில் அவற்றின் செல்வாக்கு எவ்வாறிருந்தது என்பதைக் கண்டறிதல், இன்றைய சூழ்நிலையில் இக்கிராம மக்களிடத்தில் நாட்டார் மருத்துவமுறைகளின் செல்வாக்கு எவ்வாறுள்ளது என்பதை வெளிக்கொணா்தல், இந்நாட்டார் மருத்துவமுறைகளின் தற்கால நடைமுறைச் சாத்தியங்களை ஆராய்வதோடு, இவற்றின் ஆவணப்படுத்தல், மீட்டுருவாக்கம் செய்தல் என்வற்றின் இன்றியமையாமையினைத் தெளிவுபடுத்தல் போன்றன இவ்வாய்வின் நோக்கங்களாகின்றன.இங்கு களஆய்வு முறையியலும் பகுப்பாய்வுமுறையியலும் பயன்படுத்தப்படு வதோடு, வரலாற்றியல், சமூகப்பண்பாட்டியல், ஒப்பீட்டியல் அணுகுமுறைகளும் பயன்படுத்தப் படுகின்றன. உடப்புக் கிராமத்தில் இற்றைக்குப் பத்துப் பதினைந்து வருடங்களுக்கு முன்பு நாட்டார் மருத்துவமுறையே பெரும்பாலும் இடம்பெற்றுள்ளது. பிரசவத்திலிருந்து அம்மை நோய், நீரிழிவு நோய், வயிற்றுக் கோளாறுகள், மலச்சிக்கல், வாந்திபேதி, குடற்புண் எனப் பெரும்பான்மையான நோய்களுக்கு நாட்டுவைத்திய முறைகளே கையாளப்பட்டுள்ளன. நாகரிக வளா்ச்சியேற்படத் தொடங்கியதன் பிறகு ஆங்கில வைத்திய முறைகளின் அறிமுகத்தின் பிற்பாடு நாட்டார் வைத்திய முறைகள் அருகிவிட்டமையினை அவதானிக்கமுடிகின்றது. தற்காலத்தில் ஆங்கில வைத்திய முறையின் போது சில நோய்களிற்கு அங்கஅவயவங்களுக்குப் பாதிப்பு ஏற்படாதவகையில் சிகிச்சை செய்யமுடியாதுள்ளது. ஆனால், நாட்டுவைத்திய முறையை ஊக்குவிப்பதன் மூலம் இப்பாதிப்புகளிலிருந்து மீளலாம் என்பது இவ்வாய்வின் பயனாக உள்ளது. நவின நாகரிக வளா்சிசியினால் எந்த அளவிற்கு நன்மைகளை அடைகின்றோமோ அந்த அளவிற்கு நோய்களும் பல்கிப்பெருகிக்கொண்டிருக்கும் இக்காலத்தில் சாதாரண நோய் நொடிகளுக்கும், சில ஆபத்தான நோய்களுக்கும் அங்க அவயவங்களுக்கு எந்தவிதப் பாதிப்பும் ஏற்படாத வகையிலும் பக்கவிளைவுகளைக் கொடுக்காதவகையிலும் குணப்படுத்தும் நாட்டார் மருத்துவமுறை மிக்கபயனுடையதாக அமைகின்றது. உடப்புக்கிராம நாட்டார் மருத்துவ முறைகளிலும் இவ்வாறான பல நன்மைகளை அவதானிக்கமுடிகின்றது. எனவே, இங்குள்ள நாட்டார் மருத்துவமுறைகளை ஆவணப்படுத்துவதோடு, அழிந்துவரும் அவற்றை மீட்டுருவாக்கம் செய்வதும் பயனுடையதாக அமையுமென்பதில் சந்தேகமில்லை. மேலும், இதுவரையிலும் இவ்விடயம் தொடா்பான எந்தவித ஆய்வும் இங்கு இடம்பெறவில்லையென்பதனால் எதிா்காலத்தில் இவ்வாறான ஆய்வுகளுக்கு இவ்வாய்வு அடிப்படையாகவும் முன்மாதிரியாகவும் இருக்குமென்பதில் ஐயமில்லை.

***திறவுச் சொற்கள்:*** *உடப்பு, நாட்டார், கரையோரம்*

# ஆகமம்சாரா வழிபாட்டில் பலியிடுதல் - மட்டக்களப்பு தேசத்தை அடிப்படையாகக் கொண்ட ஆய்வு

மேகலா சிவகுமாரன்

இந்துநாகரிகத்துறை, கிழக்குப் பல்கலைக்கழகம்

இயற்கைசார்ந்து வாழ்தலும் வளர்தலும் குறித்து நம் முன்னோர்கள் கொண்ட அணுகுமுறைகளின் வெளிப்பாடாகச் சடங்குகள் அமைந்தன. மனிதன் தான் ஏற்றுக்கொண்ட சமய நம்பிக்கையின் அடிப்படையில் சடங்குகளையும் வழிபாடுகளையும் படைத்தான். இவ்வழிபாட்டு முறைகளில் ஒன்றாய் அமைந்ததே பலியிடுதலாகும். மட்டக்களப்பு தேசத்தில் ஆகமம்சார் வழிபாட்டுமுறையும், ஆகமம் சாராத வழிபாட்டு முறையும் நிலவுகின்றன. இவற்றில் ஆகமம் சாராத வழிபாட்டு முறை செல்வாக்குற்றவையாக கிராமங்கள் தோறும் விரவிக்காணப்படுகின்றன. எனவே இவ்வாய்வானது இப்பிரதேச வாழ்வியலுடன் பிணைந்துள்ள ஆகமம்சாரா வழிபாட்டு முறையில் பலியிடுதல் பற்றியதாய் அமைகின்றது. ஆகமம்சாரா வழிபாட்டில் அசைக்கமுடியாத தெய்வ நம்பிக்கைகளின் நிமிர்த்தம் பலியிடுதல் இடம்பெறுகின்றன. பலி கொடுத்து வணங்கப்படும் தெய்வங்கள் மிகவும் ஆவேசமான இயல்புகளை உடையன. அத்தெய்வங்களுக்குப் பலி கொடுப்பதன் மூலம் அமைதிப்படுத்த முற்படுகின்றனர். அத்தோடு மனிதனது பாவங்களை விலங்குகளுக்கும் பறவைகளுக்கும் மாற்றலாம் என்ற நம்பிக்கையின் பொருட்டும் பலியிடப்படுகின்றது. மட்டக்களப்பு தேசத்தில் பெரும்பாலும் காளி, பெரியதம்பிரான், வீரபத்திரர், பேச்சி, காடேறி, பிரித்தியங்கிரி போன்ற தெய்வங்களுக்கு பலியிடுதல் இடம்பெறுகின்றன. ஆகமம்சாரா வழிபாட்டில் பலியிடுதல் என்பது அசைக்க முடியாத நம்பிக்கையின் நிமித்தம் தெய்வத்தின் சீற்றம் போக்கக் கையாளும் வழிபாட்டு முறை என்பதையும் இன்றைய காலகட்டத்தில் குறியீட்டு முறையில் மேற்கொள்ளப்படுவதையும் இனங்காணல். பகுப்பாய்வு முறையியல், விபரண முறையியல், வரலாற்று முறையியல் என்பன பயன்படுத்தப்படுகின்றன. பலி என்ற சொல்லுக்கு நேர்தல், பயன்விளைத்தல், செழித்தல், மிகுதல், சொல்லுதல் மற்றும் யாகம் முதலியவற்றில் தேவர், பிதிரர் முதலியோருக்கு இடும் பொருட்கள், பலியிடுவதற்குரிய உயிர்கள் எனப் பலவாறு பொருள் கொள்வர். தெய்வங்களுக்கு பலியிடுதல் செய்வதனால் மக்கள் தமக்கு நன்மை உண்டாகும் என்று நம்பி பலியிடுதற் சடங்கினை ஆற்றுகின்றனர். பலியினை நரபலி, உயிர்ப்பலி, பதிலிப்பலி எனப் பாகுபடுத்தி நோக்கலாம். ஆகமம் சாரா வழிபாட்டில் இப்பலிமுறைகள் தொடர்கின்றன. இங்கு வழிபடுவோருக்கும் தெய்வத்திற்குமிடையிலான தொடர்பு நேரிடையானது. தெய்வம் மக்களைக் கட்டுப்படுத்துவது போன்று மக்களும் தெய்வத்தினைக் கட்டுப்படுத்துகின்றனர். பலியிடுதலானது நோய் நீக்கம், மழைவேண்டல், வளப்பெருக்கம் எனப்பல வேண்டுதல்களின் நிமிர்த்தம் அசைக்க முடியாத நம்பிக்கையோடு மேற்கொள்ளப்பட்டு வருகின்றது. உதாரணமாக புன்னைச்சோலைக் காளி கோயிலில் நான்கு மூலைகளிலும் தெய்வங்களை அழைத்து சேவல் பலியிட்ட பின்னரே தீக்குழி மூட்டுகின்றனர். இதனால் அக்கினி கட்டுப்படுத்தப்படுகின்றது. நோய் நீக்கத்திற்காக நோயாளியின் உயிருக்கு பதிலீடாக உயிர்களை நேர்த்தியாக வழங்கலும் இடம்பெறுகின்றது. இவை இவ்வாறிருக்க ஆகமம் சார்ந்த முறையில் குறியீடாக, சில ஆலயங்களில் இரதோற்சவத்தின் போது சேவலின் பூவில் சிறு பகுதியைச் சீவி இரத்தம் காட்டுகின்றனர். சக்கரங்களுக்கிடையில் எலுமிச்சம்பழம் வைத்தல், குடிபுகல், தீட்டுக்கழித்தல் போன்ற வேளைகளில் பூசணிக்காய், எலுமிச்சம்பழம் என்பவற்றில் குங்குமம் பூசி வீதியோரம் வீசுதல் யாவும் பலியிடலின் எச்சமாகவும், பாரம்பரிய முறையாகவும் மேற்கொள்ளப்பட்டு வருகின்றன. இன்றைய சூழ்நிலையில் சட்டங்கள் மற்றும் சமூகக் கட்டுப்பாடுகளின் வழியும் சமூக மதிப்பீட்டு மாற்றங்களின் வழியும் பலியிடுதல் அருகியுள்ளது. இந்நிலையில் குறியீடாகவும், தெய்வக்குற்றமாகி விடுமோ என்ற பயத்தின் நிமித்தமும் பலியிடுதல் இடம்பெற்று வருகின்றது. சில ஆலயங்களில் தெய்வக்குற்றம் ஏற்படுமோ என்ற அச்சத்தின்பால் அதிகாலைப் பொழுதுகளில் மறைவாக மேற்கொண்டும் வருகின்றனர். ஆலயங்களுக்கு அப்பால் துஷ்டதெய்வங்களை விரட்ட களிப்புச்சடங்குகளிலும் பலியிட்டு வருகின்றனர். மட்டக்களப்பில் நகர்ப்புறங்களை அண்டிய ஆகமம்சாரா ஆலயங்கள் சில ஆகம முறைக்குள் உள்வாங்கப்பட்ட வண்ணமுள்ளன. அத்தோடு உயிர்ப்பலி தொடர்பான சட்டவரைபுகளும் தலையெடுக்கின்றன. ஆயினும் மரபுகளின் தொடர்ச்சியாக இன்றும் சேவல்கள் பலியிடப்பட்டு வருகின்றன. எனினும் அறிவியல் யுகத்தில் உயிர்களைப் பலியிட்டு அதன் இரத்த வெள்ளத்தில் அவ்வுயிர்களைப் படைத்த தெய்வம் திருப்தியுறும் என்பதும் அதன்வழியே சுபீட்சமும் நல்கும் என்பதும் வழிபடுவோர்களின் மனநிலை சார்ந்ததே.

***திறவுச் சொற்கள்:*** *ஆகமம், பலி, சடங்கு, பூசாரி, பதிலீட்டுப்பலி*

# சூழலியல் நோக்கில் மலையக நாட்டார் வழிபாடுகள்

திரு. சு. தவச்செல்வன்

Department of Tamil, faculty of Arts, University of Peradeniya

*sthava21@gmail.com*

மலையக நாட்டார் வழிபாடுகளை அடிப்படையாகக் கொண்ட இவ்வாய்வானது மலையக மக்களின் நாட்டார் வழிபாட்டு மரபுக்கும், சூழலுக்கும் இடையிலான இடைவினையுறவின் நுண்பொருண்மைக;டாக சூழலியல் சார் சிந்தனைகளை வெளிபடுத்துவதை நோக்காகக் கொண்டுள்ளது. மலையக நாட்டார் வழிபாட்டு முறைகள் தொடர்பாக இதுவரையில் நிகழ்த்தப்பட்டுள்ள பல்வேறு ஆய்வுகள் களநிலை ஆய்வுகளாகவும் கோட்பாட்டு ரீதியான ஆய்வுகளாகவும் அமைந்திருந்தாலும், கட்டுரையானது அவ்வாய்வுகளிலிருந்து வேறுபட்டு அமைந்துள்ளது. "சூழலியல் நோக்கில் மலையக நாட்டார் வழிபாடுகள்" என்ற தலைப்பிலான இக்கட்டுரை சூழலியல் கோட்பாடுகளையும் சிந்தனைகளையும் அடிப்படையாகக் கொண்டு அமைந்துள்ளது. இருபத்தோராம் நூற்றாண்டில் உலகளாவிய ரீதியில் 'சூழலியம்' என்ற கருத்தியல் தீவிரமாக உணரப்பட்டு வரும் இச்சூழ்நிலையில் "மலையக மக்களின் நாடாரியல் வழிபாட்டு மரபானது, இலங்கையின் மலைநில வெளியின் சூழலியலை பேணிகாக்கும் மரபினையும் மலையக பிரதேசங்களில் வாழுகின்ற மக்களின் பண்பாட்டு அடையாளங்களைப் பேணுவதிலும், கலாசார மரபுகளை தக்கவைப்பதிலும் பெறும் செல்வாக்கு பெற்று அமைந்துள்ளது." தொழிலாளர் சமூகத்தையே பெரும்பான்மையாகக் கொண்டுள்ள மலையகத் தமிழர்களின் நாட்டாரியல்சார் ஆண் தெய்வ வழிபாடுகள், பெண் தெய்வ வழிபாடுகள், தொழில்நிலைப்பட்ட வழிபாடுகள் அனைத்துமே ஆற்றங்கரை, மலையுச்சி, மரத்தடி, கல் ்பிடவுகள், குளம் மற்றும் கிணறுகள், தேயிலைத் தோட்டங்களுக்கு இடையிலுள்ள புல்வெளிகள், வீட்டை அண்மித்த இயற்கைச் சூழல், மலையகப் பிரதேசங்களிலுள்ள காட்டுப்பகுதி மற்றும் காடுகளின் நடுவேயுள்ள நீர்நிலைகள் ஆகிய இயற்கை சூழல் வெளிகளிலேயே இடம்பெறுகின்றன. சூழலியலுடன் இணைந்த இந்த வழிபாடுகள் மலையக தொழிலாளர்களின் சூழலியல்சார் உளவியலையும் அதனுடன் இணைந்த அவர்களது பண்பாட்டுத் தனித்துவங்களையும் புலப்படுத்துகின்றன. சூழலியல் மற்றும் சமூகவியல், மானுடவியல் கோட்பாட்டுப் பார்வைகளில் அமைந்த இவ்வாய்வானது மலையக நாட்டாரியல் வழிபாட்டிற்கும் சூழலுக்கும் இடையிலான இடைவினைகளின் நுண்பொருண்மைகளைக் கண்டறிவதை பிரதான நோக்காக கொண்டுள்ளதோடு, மலையக நாட்டாரியல் வழிபாட்டின் முக்கியத்துவத்தை அறிந்து கொள்ளல், சூழல் பாதுகாப்பிற்கான முன் பிரேரணையாக நாட்டாரியல் வழிபாட்டை முன்மொழிதல், சூழல் - மனிதன் - வழிபாடு ஆகிய பொருண்மைகளின் மானுடவியல் தன்மையை வெளிப்படுத்தல் ஆகிய துணைநிலை நோக்கங்களையும் ஆய்வின் வெளிபாடுகளாக கொண்டமைந்துள்ளது. "இயற்கை வழிபாடென்பது. தமிழர்களின் தொன்மவியல் கலாசாரம்" என்ற தத்துவத்திற்கு மலையகத் தமிழர்களும் அப்பாற்பட்டவர்களல்ல. இயற்கை வழிபாடென்பது இயற்கை மீதான மனிதனின் கரிசனையையும், கலாசார உணர்ச்சியையும் பரதிபலித்து நிற்கும் அம்சமாக வளர்ந்துள்ளமை இங்கு குறிப்பிடத்தக்கதாகும். அந்த வகையில் "உலகின் அனைத்து உயிர்களுக்கும் சூழலே தாய்" என்ற தொடரின் பொருள் இன்று உலகின் சகல முடுக்குகளிலும் உணரப்படும் அதேவேளை தாய் தெய்வ வழிபாட்டின் தொடக்கமும் இங்கிருந்தே தொடங்கியிருக்க வேண்டும் என்றும் சொல்லலாம். இயற்கைக்கும் மனிதனுக்கும் இடையிலான தொடர்பற்றி "இயற்கை மனிதனின் உடலாக இல்லாவிட்டாலும், அது மனிதனின் அனங்காக உடலாக உள்ளது. மனிதன் இயற்கையினால் வாழ்கின்றான். அதாவது அவனது உடல் மற்றும் ஆன்மீக வாழ்வு இயற்கையுடன் இணைந்தது. ஏனெனில் "மனிதர் இயற்கையின் ஒரு பகுதி" என்று எழுதுகிறார் கார்ல்மாக்ஸ். உலகளாவிய ரீதியில் இயற்கை சூழல் மீதான இருப்பு இன்று பெரும் கேள்விக்குறியாய் மாறியுள்ளது. பசுமை வெளி அழிப்பு, உயிர்பல்வகைமையின் ஒழுங்கமைப்பு பிரச்சினை முதலியன மனித இருப்பையும் புவியின் இருப்பையும் அச்சுறுத்தி வரும் இச்சூழலில் மலையக நாட்டார் வழிபாடுகள் 'சூழலியம்' பற்றி முன்வைக்கின்ற காப்புச் சிந்தனைகளின் முன்னோடியாய் அமைகிறது என்று துணிந்து சொல்லலாம்.

***திறவுச் சொற்கள்:*** *சூழலியம், மலையக நாட்டாரியல், மலையக பண்பாடு, இயற்கை வழிபாடு, சூழல் பாதுகாப்பு*

# யாழ்ப்பாண அரசு காலத்தில் சித்தஆயுர்வேத மருத்துவம் ஓர் வரலாற்றுநோக்கு

க. ஜெயதீஸ்வரன்

வரலாற்றுத்துறை, பேராதனைப்பல்கலைக்கழகம்

*jeyathe@gmail.com*

இலங்கைவாழ் தமிழர்களுடைய வரலாற்றில் யாழ்ப்பாண அரசு தோற்றம் பெற்றிருந்த காலமானது எழுச்சிமிக்க காலப்பகுதியாகும். இதற்குக் காரணம் பண்டைக்காலம் முதல் இலங்கை வரலாற்றில் வாழ்ந்துவந்த தமிழர்கள் சிங்கள இனத்திற்கு நிகரான வாழ்வியல் கட்டமைப்பை ஏற்படுத்தியிருந்தாலும் மத்திய காலப்பகுதியில் வடபகுதியில் யாழ்ப்பாணக் குடாநாட்டை மையப்படுத்தியவகையில் அரசமரபு ஒன்று இவர்களிடையே மலர்ச்சியடைந்திருந்தமையாகும். இவ்வரசின் தோற்றம் தொடர்பாக பல்வேறு கருத்து நிலைகள் காணப்பட்டாலும் ஆதாரங்களின் அடிப்படையில் கி.பி 13ஆம் நூற்றாண்டில் தோற்றம் பெற்றிருந்ததென்பது பொதுவான முடிவாக ஏற்றுக்கொள்ளப்படுகின்றது. இவ் அரசு தோற்றம் பெற்றதைத் தொடர்ந்து தமிழர்களது அரசியல், பொருளாதார, சமய, சமூக, கலை, கலாசார மற்றும் அறிவியல் துறைகள் கட்டமைக்கப்பட்டு எழுச்சியடைந்திருந்தன. இந்தவகையிலே இவர்களது அறிவியல்துறையான சித்த ஆயுர்வேத மருத்துவத்துறையும் எழுச்சியடைந்திருந்தது. யாழ்ப்பாண அரசு காலத்தில் சித்த ஆயுர்வேத மருத்துவத்துறை வளர்ச்சியடைந்து காணப்பட்டிருந்தாலும் அதன் வரலாறானது தொன்மையானது என்பதை அவர்களது ஆரம்பகாலக் குடியிருப்பு மையமாக விளங்கிய கந்தரோடையுடன் தொடர்புபடுத்தி யாழ்ப்பாண அரசு கால மருத்துவ நூலான பரராசசேகரம் குறிப்பிடுவதன் மூலம் அறிந்துகொள்ள முடிகின்றது. இவ்வாறான தொன்மையான வரலாறு கொண்ட தமிழர்களது சுதேச மருத்துவத்துறை பல்வேறு காலகட்டங்களுடாக வளர்த்தெடுக்கப்பட்டு யாழ்ப்பாண அரசு காலத்தில் மிகவும் உச்சநிலையில் இருந்ததைக் காணலாம். இதற்குக் காரணம் யாழ்ப்பாண அரசர்கள் மருத்துவத்துறையில் காட்டிய ஆர்வம் ஆகும். குறிப்பாக யாழ்ப்பாண அரசர்களே சிறந்த மருத்துவர்களாக விளங்கியிருப்பதை யாழ்ப்பாண வைபவமாலை, செகராசசேகரம் ஆகியவை குறிப்பிடும் தகவல்களின் மூலம் அறியமுடிகின்றது. இதேவேளை மன்னர்களது ஆதரவுடன் இம்மருத்துவத்துறை சார்ந்த இரு நூல்களான செகராசசேகரம் மற்றும் பரராசசேகரம் ஆகியவை இக்காலத்தில் தோற்றம்பெற்றிருப்பதானது இக்கால மருத்துவத்துறையின் வளர்ச்சிக்குச் சிறந்த எடுத்துக்காட்டாக விளங்குகின்றது. இவ் ஆய்வானது பல்வேறு நோக்கங்களின் அடிப்படையில் முன்னெடுக்கப்படுகின்றது. இதன் பிரதான நோக்கம் யாழ்ப்பாண அரசுகாலத்தில் நிலவியிருந்த சித்த ஆயுர்வேத மருத்துவத்துறையின் சிறப்பை வெளிப்படுத்துவதாக அமைகின்றது. துணை நோக்கங்களாக இவ் அறிவியல் துறையை ஆவணப்படுத்துதல் மற்றும் எதிர்காலச் சந்ததியினர்க்கு கையளித்தல் போன்றவற்றின் அடிப்படையில் முன்னெடுக்கப்படுகின்றது. இவ்வாய்வானது வரலாற்று அணுகுமுறையின் அடிப்படையில் முதலாம்தர மற்றும் இரண்டாம்தர மூலாதாரங்களைப் பயன்படுத்தி மேற்கொள்ளப்படுகின்றது. முதலாம்தர மூலாதாரங்கள் எனும்போது யாழ்ப்பாண அரசு காலம் தொடர்பாகக் கூறும் யாழ்ப்பாண வைபவமாலை, வையாபாடல் ஆகியவையும் இரண்டாம்தர மூலாதாரங்கள் எனும்போது முதலாம்தர மூலாதாரங்களை அடிப்படையாகக் கொண்டு பிற்பட்ட காலத்தில் யாழ்ப்பாண அரசு தொடர்பாக ஆய்வுகளை மேற்கொண்ட அறிஞர்கள் மற்றும் ஆய்வாளர்களது நூல்கள், ஆய்வுக்கட்டுரைகள் ஆகியவையும் இணையத்தளத் தகவல்களும் சேகரிக்கப்பட்டு இவ்வாய்வு மேற்கொள்ளப்படுகின்றது. இவ்வாறாக யாழ்ப்பாண அரசுகாலத்தில் வளர்த்தெடுக்கப்பட்ட சித்தஆயுர்வேத மருத்துவமானது போர்த்துக்கேயர் யாழ்ப்பாண அரசைக் கைப்பற்றியதைத் தொடர்ந்து தனிப்பட்டவர்களது கைகளுக்குச் சென்று பரம்பரை மருத்துவமாக மாற்றம் கண்டது. இவ்வாறான நிலை தொடர்ந்து நீடித்துவந்தாலும் பிரித்தானியர் காலத்தில் அமெரிக்க மிஷனரியான கிரீன் வைத்தியரது மேலைத்தேய வைத்தியத்துறை நடவடிக்கைகளால் சவாலை எதிர்கொண்டது. எனினும் அவ்வாறான சவால்களை எல்லாம் தாண்டி இன்றும் யாழ்ப்பாணத்தவர் மத்தியில் இவ் வைத்திய முறையானது நிலைகொண்டிருப்பதானது சிறப்பம்சமாகும்.

***திறவுச் சொற்கள்:*** *அரசு, மருத்துவம், வைத்தியர்*

# தமிழ் அரச உருவாக்கத்தில் உக்கிரசிங்கமன்னன், மாருதப்புரவீகவல்லி பற்றிய வரலாற்றுக்கதையின் செல்வாக்கு


திருமதி. சிவரூபி சயிதரன்

வரலாற்றுத்துறை யாழ்ப்பாணப் பல்கலைக்கழகம்

*sivaruby17@gmail.com*



ஆசியாவின் தொன்மையான அரச உருவாக்கமானது பெரும்பாலும் வரலாற்றுக் கதைகளுடன் தொடர்ப்புபடுத்தப்பட்டிருப்பது பொதுவானதொரு பண்பாக காணப்படுகின்றது. கௌண்டின்யர், விஜயன், அர்ச்சுனன் கதை மரபுகளுக்கிடையிலான ஒற்றுமைகளுடாக இப்பண்பினை காணமுடிகின்றது. ஆதிகால, இடைக்கால வரலாறு பற்றிய ஆய்வில் ஐதீகங்கள், இதிகாச மரபுகளை அடிப்படையாகக் கொண்ட வரலாற்றுக் கதைகளுக்கு முக்கிய பங்குண்டு. இவற்றில் புனைகதைகள், மிகைப்படுத்தல்கள், இடைச்செருகல்களுடன் கூடிய வரலாற்றுச் சம்பவங்கள் இடம்பெற்றிருந்தாலும், அவை மக்களது வாழ்வியலிலும், பிரதேசம், இனம் பற்றிய வரலாற்று நம்பிக்கையிலும் இரண்டறக் கலந்து விடுவதால் அவற்றைத் தொட்டுணர முடியாத அம்சங்களாகப் பார்க்கப்படுகிறது. இதனால்தான் யுனஸ்கோ போன்ற நிறுவனங்கள் உலக நாடுகளில் காணப்படும் தொட்டுணர முடியாத மரபுரிமை அம்சங்களைக் கண்டறிந்து, ஆவணப்படுத்துவதில் அதிக அக்கறை காட்டி வருகின்றன. தமிழ் மக்களிடையே செல்வாக்கு பெற்றிருக்கின்ற உக்கிரசிங்கமன்னன், மாருதப்புரவீகவல்லி பற்றிய வரலாற்றுக் கதைகளை இலங்கை வரலாறு பற்றி எழுந்த ஏனைய வரலாற்றுக் கதைகளுடன் ஒப்பிட்டு தமிழ் அரசமரபின் தோற்றம் பற்றிய ஆய்வில் அக்கதையின் வகிபாகத்தை மதிப்பீடு செய்வதே இவ்வாய்வின் பிரதான நோக்கமாக அமைவதுடன், இன்னொரு நோக்கமாக உக்கிரசிங்கமன்னன், மாருதப்புரவீகவல்லி கதையில் வரும் வரலாற்றுச் சம்பவங்களினை தொல்லியல் ஆதாரங்களுடன் ஒப்பிட்டு கதையின் உண்மைத் தன்மையை மீளாய்வு செய்வதாகவும் அமைகின்றது. இவ்வாய்வு நோக்கங்களை நிறைவுசெய்வதன் பொருட்டு ஆய்வுடன் தொடர்புடைய வரலாற்றுக் கதைகளினை உள்ளடக்கியுள்ள மூலநூல்களிலிருந்தும், இம்மூலநூல்களினை அடிப்படையாகக் கொண்டெழுந்த இரண்டாம்தர நூல்களிருந்தும் தரவுகள் பெறப்பட்டிருப்பதுடன், இரண்டாம்தர தரவுகள் தொல்லியல் களப்பயணங்கள், நேரடி நேர்காணல் ஊடாகவும் சேகரிக்கப்பட்டுள்ளன. முதல்தர தரவுகள் இரண்டாம்தர தரவுகளுடன் ஒப்பிட்டு ஆராயப்பட்டு அதனை பகுப்பாய்வு செய்வதாகவே இவ்வாய்வு அமைகின்றது. வரலாற்று இலக்கியங்களில் காணப்படும் வரலாற்றுக் கதைகளில் நம்பமுடியாத வரலாற்றுச் செய்திகள் பல காணப்பட்டாலும் புராதன அரச உருவாக்கம், நாகரிக உருவாக்கம், புராதன வரலாற்று மையங்களை கண்டறிவதற்கு அவை துணையாக இருந்து வருவதற்குப் ஆதாரங்கள் காணப்படுகின்றன. அந்தவகையில் வடக்கு, கிழக்கு இலங்கையில் ஏற்பட்ட தமிழ் அரசஉருவாக்கம், நாகரிக வளர்ச்சி பற்றி அறிந்து கொள்வதில் உக்கிரசிங்க மன்னன் மாருதப்புரவீகவல்லி வரலாற்றுக்கதைகளுக்கும் முக்கிய பங்குண்டு. பேராசிரியர் இந்திரபாலா விஜயன் கதையின் அம்சங்களை இலங்கையின் பாளி, சிங்கள வரலாற்றேடுகளில் மட்டுமல்லாது இந்திய, சீனநூல்கள் சிலவற்றிலும், இலங்கைத் தமிழர் வரலாற்றுக்கதைகளில் ஒரு திரிந்த வடிவத்தில் காணப்படுவதாகவும், உக்கிரசிங்கன், மாருதப்புரவீகவல்லி கதை பெரும்பாலும் சிங்கள மக்களிடையே நிலவுகின்ற விஜயமன்னன் பற்றிய கதையை தழுவியதெனவும் குறிப்பிடுகின்றார். உக்கிரசிங்கமன்னன் மாருதப்புரவீகவல்லி கதை மகாவம்சம் என்ற பாளி இலக்கியத்தில் கூறப்படும் விஜயமன்னன் குவேனி கதையின் மாற்று வடிவமாகக் காணப்படுவதனை, விஜயமன்னன் கதையிலே வருகின்ற பாட்டனாகிய சிங்கமே தமிழிழக்கியங்களில் உக்கிரசிங்கனாகவும், பாட்டியாகிய கலிங்கநாட்டுத் தொடர்புடைய வங்கத்து இளவரசி மாருதப்புரவீகவல்லியாகவும், சிங்கத்திற்கும் இளவரசிக்கும் பிறந்த பிள்ளைகளான சிங்கபாகு, சீகவல்லியே உக்கிரசிங்கன் மாருதப்புரவீகவல்லியின் பிள்ளைகளான நரசிங்கராசன் சண்பகாவதியாகவும் உருமாற்றப்பட்டுள்ளதாக கருதமுடியும். இவ்ஐதீகங்கள் கிழக்கிலங்கையிலும் அப்பிரதேசத்திற்கு ஏற்றவாறு மாற்று வடிவம் பெற்றுள்ளதனையும் அவதானிக்கமுடிகின்றது. விஜயமன்னன் வரலாற்றுக்கதையினைப் போன்று உக்கிரசிங்கமன்னன் மாருதப்புரவீகவல்லி கதையும் தமிழர் பிரதேசங்களின் தொன்மையான வரலாற்றினைக் கூற பயன்படுத்தப்பட்டுள்ளதனை கதிரைமலை, கீரிமலை, மாவிட்டபுரம் ஆகிய இடங்களில் இடம்பெற்ற புராதன நாகரிக உருவாக்கம், கதிரமலையை மையமாகக் கொண்ட அரசஉருவாக்கம் என்பன எடுத்துக்காட்டுகின்றன. ஏனைய இடங்களில் முறையான தொல்லியல் ஆய்வுகள் இடம்பெறாத போதும், கந்தரோடையின் தொல்லியல் ஆய்வுகளின் முடிவுகள் இதனை உறுதிப்படுத்த உதவுகின்றதெனலாம்.



***திறவுச் சொற்கள்-*** *வரலாற்றுக்கதைகள், விஜயமன்னன், உக்கிரசிங்கமன்னன், மாருதப்புரவீகவல்லி.*

# ‘பொன்னர் சங்கர் கூத்து ஒரு பெண்ணிலை நோக்கு’

N. Sudarshini

Dept. of Languages, Sabaragamuwa University of Sri Lanka,

*sudarshinins@gmail.com*

வாய்மொழி இலக்கியம் எனக் கூறப்படும் நாட்டார் இலக்கியம் மக்களின் யதார்த்த வாழ்க்கையினை வெளிப்படுத்தும் வரலாற்றுச் சான்றாகவும், அது தோன்றிய குறிப்பிட்ட காலத்திற்குரிய சமுகத்தினது வெளிப்பாட்டுச் சித்திரமாகவும் திகழ்கின்றது. ஒரு குறிப்பிட்ட கூட்டத்தின் ஒட்டுமொத்த உணர்ச்சிகளின் விளைவுகளாக கருதப்படுகின்ற நாட்டார் இலக்கியங்கள் வரலாறு, உளவியல், இலட்சியங்கள் என்பற்றை விபரிக்கும் தன்மையுடையவையாகக் காணப்படுகின்றன. ஆதலால் சமயம் சார்ந்தவையாகவும் கதைத் தொடர்புள்ளவையாகவும் திகழுகின்ற நாட்டுப்புற இலக்கிய வடிவமாகிய கூத்துகளினூடாக அது வெளிப்படுத்தும் சமூகம் பற்றியறிதல் பொருத்தமாய் அமையலாம். இவ்வாறான கூத்துகளில் ‘பொன்னர் சங்கர்’ எனும் கூத்து தமிழகத்திலும் இலங்கையிலும் இன்றும் பயில்நிலையில் காணப்படும் கூத்தாகவும் மக்கள் மத்தியில் பிரபல்யமானதாகவும் திகழ்கின்றது. கூத்து வடிவில் மட்டுமின்றி திரைப்படம் போன்ற பல வடிவங்களில் வெளியிடப்பட்டுள்ள இக்கூத்தானது, தாமரைநாச்சி, நல்லதங்காள், முத்தாயி, பவளாயி, குப்பாயி போன்ற பல பெண் பாத்திரங்களினைக் கொண்டதாகக் காணப்படுகின்றது. ஆதலால் இக்கதாப்பாத்திரங்களின் வழியான ஆய்வு பெண்களின் நிலையினை அறிவதற்குத் துணைசெய்யும். இதனடிப்படையில் பொன்னர் சங்கர் கூத்தில் வெளிப்படும் பெண்களின் வகிபாகம், பெண்ணடக்குமுறை, அதனை எதிர்த்து செயற்படும் விதம் சார்ந்த விடயங்களை இனங்காணுதலைப் பிரதான நோக்காகக் கொண்டு “பொன்னர் சங்கர் கூத்து ஒரு பெண்ணிலை நோக்கு” எனும் தலைப்பில் இவ்வாய்வு முன்னெடுக்கப்படுகின்றது. அண்ணன்மார் சுவாமி கதை, பொன்னர் சங்கர் கூத்து தொடர்பான காணொளிகள், நேர்காணலின் மூலம் பெற்றுக் கொள்ளப்பட்ட தகவல்கள் என்பன முதல்நிலைத் தரவுகளாகவும், இது தொடர்பில் வெளியான ஆய்வுக்கட்டுரைகள், வலைதளப்பதிவுகள், பனுவல்கள் என்பன துணைநிலை ஆய்வு ஆதாரங்களாகவும் காணப்படுகின்றன. விவரண ஆய்வுமுறை, பகுப்பாய்வு முறை ஆகிய ஆய்வுமுறைகளைக் கொண்டு சமூகவியல் அணுகுமுறை, பெண்ணியல் அணுகுமுறை என்பவற்றைக் கொண்டு இக்கூத்து மதிப்பீடு செய்யப்படுகின்றது. பொன்னர் சங்கர் கூத்தில் பெண்கள் பொதுவாக அடிமைப்படுத்தப்பட்டவர்களாகவே வெளிப்படுத்தப்படுகின்றனர். தாமரை பணிப்பெண் போல நடாத்தப்படுவதும், அவள் விரும்பிய வாழ்க்கைத் துணையை தேர்வு செய்யும் உரிமை மறுக்கப்பட்டவளாகவும் அதனை மீறி செயற்பட்ட போது சொத்துகள் எதுவும் பெற்றோர்களால் வழங்கப்படாது விரட்டியடிக்கப்படுபவளாகவும், குறைந்த ஊதியத்திற்கு வேலை செய்பவளாகவும் சித்தரிக்கப்பட்டுள்ளாள். பெண்களை இழிவுபடுத்தும் வகையிலான பல சொற்களும் பயன்படுத்தப்பட்டுள்ளன. மேலும் தாமரை பிள்ளைப் பேறு இல்லாதவளாய் அவமானப்படுத்தப்படுதல், உடன்பிறப்புகள் கல்வி கற்கும் நிலையில் நல்லதங்காள் அதற்கு அனுமதிக்கப்படாமை, அவள் வெளியே சென்று பொழுதுபோக்க அனுமதிக்கப்படாமை, தலையூர்க்காளியால் சிறைபிடிக்கப்பட்டு மீட்கப்பட்ட குப்பாயி சமுதாயத்திற்குப் பயந்து தற்கொலை செய்து கொள்வது, பால்ய விவாகம், திருமணத்திற்குப் பின்னர் கணவன் பின்செல்லல் போன்றன பெண்ணடக்குமுறை சார்ந்த விடயங்களாக வெளிப்படுகின்றன. இவை பெண்களின் இழிவுக்கு உயிரியல், பண்பாட்டு, சமூக ரீதியான பல விடயங்கள் தாக்கம் செலுத்தவல்லன என்பதை வெளிப்படுத்துகின்றன. இருப்பினும் தாமரைநாச்சி தான் விரும்பிய முறைமாமனை பிறரை எதிர்த்து மணம்செய்து வாழ்ந்தமை, தன்முயற்சியின் விளைவால் முன்னேற்றமடைந்தமை என்பன பெண்களுக்குரிய உரிமைச் சிந்தனைகளை எடுத்துரைப்பதாகக் காணப்படுகின்றன. இந்நிலை உளவியல் ரீதியான பெண்ணின் முதிர்வானது அவளது முன்னேற்றத்திற்கு துணைசெய்யும் என்பதை வெளிப்படுத்தி நிற்கின்றது. பொன்னரும் சங்கரும் படுகளத்திற் கிடக்கும் போது மனைவியர் காப்பாற்றச் செல்லாது தமது நிலைப்பாட்டை வெளிப்படுத்தியமை, அண்ணன்களைக் காப்பாற்ற தங்கைத் துணிவுடன் சென்றமை, அமரநிலையடையாது அவளுக்கு இறை அந்தஸ்து கிட்டியமை என்பன பண்பாட்டுப் பெண்ணிலையை போற்றும் வகையில் காணப்பட்ட போதும் தன்னம்பிக்கையின் வழி விடுதலை பெற வழிகூறும் தன்னிகரற்ற பெண் பாத்திரங்களின் இணைப்பாய் பெண்விடுதலைக்கருத்துகளை வெளிப்படுத்துகிறது பொன்னர் சங்கர் கூத்து.

***திறவுச் சொற்கள்:*** *பொன்னர் சங்கர் கூத்தில் பெண்கள், நல்லதங்காள், தாமரைநாச்சி, நிகழ்த்துக்கலையில் பெண்ணிலை*